# අභිධර්ම ප්‍රදීපිකා

(දෙවන කාණ්ඩය)

# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

(දෙවන කාණ්ඩය)

අමරදාස රත්නපාල

තායිවානයේ තායිපේ එක්සත් සමුහ බෞද්ධ අධ්‍යාපන පදනමේ ප්‍රධාන අනුශාසක, තායිවානයේ තායිපේ ශ්‍රී රතනජෝති ථෙරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති, තායිවානයේ ප්‍රධාන සංඝනායක රත්මලාන ශ්‍රී විජයාරාමවාසි, බණ්ඩාරගම වීදාගම ධර්ම චක්‍ර ළමා පදනමේ සහ ලියෙන් සිං ළදරු පාසලේ නිර්මාතෘ, ත්‍රිපිටකවේදී ධර්ම කීර්ති ශ්‍රී බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි, මෙම දහම් පොත තායිවානයේ එක්සත් සමුහ බෞද්ධ අධ්‍යාපන පදනම මගින් මුද්‍රණය කරවා ශ්‍රී ලංකාවට පරිත්‍යාග කරන ලදි.

**ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම**
**විදාගම,**
**බණ්ඩාරගම**


Printed for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website:http://www.budaedu.org
Mobile Web: m.budaedu.org
**This book is strictly for free distribution, it is not to be sold.**
**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

# පෙරවදන

අභිධර්මයෙහි එන්නේ පරමාර්ථ ධර්ම සතරෙකි. සත්ත්වසන්තානයෙහි පහළ වන තාක් සිත් **චිත්ත පරමාර්ථ** වශයෙනුත්, හැම සිත්හි ලැබිය හැකි තාක් හොඳ - නොහොඳ ගුණ විශෙෂයන් **චෛතසික පරමාර්ථ** වශයෙනුත්, මේ චිත්ත චෛතසික නම්වූ නාම ධර්මයනට ආධාර වූ ශරීරයෙහි ලැබිය හැකි තාක් ද්‍රව්‍ය සමූහය **රූප පරමාර්ථ** වශයෙනුත්, මේ නාමරූප හෙවත් පංචස්කන්ධ සංඛ්‍යාත සත්ත්වයාම පිළිබඳ වුවත් චිත්ත චෛතසිකයන් හා සම්ප්‍රයෝග ලක්ෂණයෙන්වත්, රූපයන් හා කලාප බන්ධන වශයෙන්වත් කිසිකලෙකත් නොබැඳෙන බැවින් ඒකාන්ත කෙවල (තනි) ධර්මයක් වූ ද, සෝවාන් ආදී සතර මඟින් දක්නාතෙක් ප්‍රත්‍යක්ෂයෙන් නො පෙනෙනත් නිත්‍යව නොවෙනස්ව පවත්නා වූ නිර්වාණ ධර්මය **නිර්වාණ පරමාර්ථ** වශයෙනුත් අභිධර්මයෙහි අඩුන්වාදී ඇත. අභිධර්මපිටකයට අයත් සප්තප්‍රකරණයෙහි ම එන්නේ මේ සතර පරමාර්ථ පිළිබඳ විස්තර ය.

ආභිධර්මිකයන්ගේ ආදරගෞරවාදරයට බඳුන් වූ **අභිධර්මාර්ථ සංග්‍රහය** නම්වූ ග්‍රන්ථරත්නයට දිඹුලාගල මහා කස්සප සඟරජ මාහිමිපාණන්ගේ ශිෂ්‍ය සාගරමති සාරිපුත්ත ස්වාමීන්ද්‍රයන් විසින් ඉතා ව්‍යක්ත ලෙස සැපැයුණු සන්නයක් ඇත. මේ හැර මේ ග්‍රන්ථය සඳහා ලියැවුණු ටීකා සන්න හා පරිවාර ග්‍රන්ථයෝ ද බොහෝ වෙති.

උගතුන්ගේ සිතැද ගත් මේ අභිධර්මාර්ථ සංග්‍රහය ම අනුව යමින් **අමරදාස රත්නපාල දෙස්තර මහත්මා** විසින් මහත් වෑයෙමකින් සපයා ඇති මේ **අභිධර්මාර්ථ ප්‍රදීපිකා** නම්වූ ග්‍රන්ථයෙහි අභිධර්ම කාරණා ඉතා විසිතුරුවත්, විසදවත් ලියා ඇති බව කිය යුතු ය.

කාණ්ඩ සතරෙකින් හා දෙදහසකට අධික පිටු ගණනකින් යුතුව මෙතරම් විස්තර විභාග සහිතව ලියැවුණු මේ සා විශාල අනෙක් අභිධර්මග්‍රන්ථයක් මෙතෙක් මේ රටෙහි ලියැවී නැතිසේ ය.

නවීනයනට මෙන් ම ප්‍රවීණයනට ද මේ ග්‍රන්ථය බෙහෙවින් උපකාර වනුවා පමණක් නොව මෙය ජනකාන්ත ද වනුවා ඇත. වෛද්‍යවෘත්තියෙහි යෙදෙන ගම්මනේ මෙබඳු වටනා ග්‍රන්ථයක් ලියා බෞද්ධ ධර්ම සාහිත්‍යය පෝෂණය කිරීම ගැන කවුරුනුත් රත්නපාල මහතාට කෘතඥ විය යුතු බව කියනු කැමැත්තෙමි.

පියදස්සි ස්ථවිර

1964 ජූලි 8 වැනිදා
බම්බලපිටියේ
වජිරාරාමයේ දී ය.

# හැඳින්වීම

**අභිධර්මාර්ථ ප්‍රදීපිකා** නම් වූ මේ පොත අභිධර්මාර්ථ සංග්‍රහය අනුව යමින් සම්පාදනය කරන ලද්දකි. අභිධර්ම පිටකයට අයත් සප්තප්‍රකරණයන්හි ඇතුළු වූ ධර්මාර්ථයන් පිඩුකොට ත්‍රිපිටකධර අනුරුද්ධ සවාමින්ද්‍රයන් වහන්සේ විසින් සම්පාදිත **අභිධර්මාර්ථ සංග්‍රහය** නම් ග්‍රන්ථය බොහෝ කාලෙක සිට අභිධර්මය උගන්නවුනට මහෝපකාරී විය. බුදුරජාණන් වහන්සේ විසින් දෙසිත ත්‍රිපිටක ධර්මයෙහි සඳහන්වන ධර්මාර්ථයන් මනාව වටහාගැනීමට පරමාර්ථ ධර්ම පිළිබඳ සාමාන්‍ය දැනීමක්වත් තිබිය යුතුය. මෝහයෙන් මඩනාලද පුහුදුන් සිත් සතන් මිථ්‍යාමත වලින් මුදවා පිරිසුදු සම්‍යග් දෘෂ්ටියෙහි යොදවා ගැනීම ධර්මඥානයෙන්ම කළ යුත්තෙකි. කුසලාකුසල ධර්මයන් හැඳින එහි ඉෂ්ටා'නිෂ්ට විපාකයන් දැනගැනීමටත් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මාවබෝධය පිණිස වැඩිය යුතු සමථ විදර්ශනා භාවනානුයෝගයටත් ඉවහල්වන ධර්ම සමූහය අභිධර්මාර්ථ සංග්‍රහයෙහි ඇතුලත් වේ එබැවින් ධර්මය ඉගෙනීමෙහි කැමැත්ත ඇති, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් තියුණු කර ගැනීමට උත්සාහ දරන සත්පුරුෂයන්හට අභිධර්මාර්ථ සංග්‍රහය වැනි අන් ග්‍රන්ථයක් නැතැයි කිව යුතුය.

පෙර ධර්ම විනයධර උතුමන් විසින් ඉතා ගෞරවයෙන් ආචාර්‍ය්‍ය පරම්පරානුගත විධි නොසික්මවා තම සිසුන් පිරිසුදු ශීලයෙහි පිහිටුවා ධර්මඥානය ලබාදීමෙන් පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති ශාසනය රැකගත් බව ශාසන ඉතිහාසයෙන් හෙළිවේ. පසු කාලෙක විදෙශයෙන් පැමිණි අන්‍ය ලබ්ධිකයන්ගේ නපුරු බලපෑම් නිසාත් වෙනත් නොයෙක් අවහිරකම් නිසාත් පිරිහෙන්නට ගිය මේ සසුන, කලින් කල පහළවූ ගිහි පැවිදි උතුමන්ගේ උත්සාහයෙන්, අතුරුදහන් වන්නට ඉඩ නොදී රැකගත් හෙයින් අදත් සැදැහැතියන්හට දහම් ඉගෙනීමටත් පිළිවෙත් පිරීමටත් ඉඩ ඇත්තේමය. නුවණත්, ශ්‍රද්ධාවත්, උත්සාහයත්

ඇතොත් භික්ෂූන් වහන්සේට දහම් ඉගෙන පිළිවෙත් පිරීමට එතරම් අවහිරයක් නම් නැත. එහෙත් එවැනි භාග්‍යයක් නැතිව නොයෙක් දුෂ්කරතා මධ්‍යයෙහි රැකිරක්ෂා ගේ දොර වැඩ කටයුතු ආදියෙහි යෙදී සිටින සැදැහැවත් ගිහි පින්වතුන්හට වරින්වර නොයෙක් මාතෘකායෙන් කැරෙන ධර්ම දේශනා හැර පිළිවෙළින් ධර්මය ඉගෙනීමට ක්‍රමයක් නැති හෙයින් පින්පව් හැඳින ගැනීමට පවා නොහැකිව ඔවුන් ශ්‍රද්ධාදි ගුණයන්ගෙන් පිරිහෙමින් ලෝකයේ නාන් දෙසින් ගලා එන මිථ්‍යා මතවලට ඇබ්බැහි වෙමින් ධර්මයට පිටුපායන්නා සේ පෙනෙන්නට ඇත.

භාග්‍යයකට මෙන් මෑතෙක සිට ධර්මධර ස්වාමින් වහන්සේලා සහ උගත් ගිහි උතුමන් විසින්ද ධර්මය උගත්තවුන්ගේ ප්‍රයෝජනය පිණිස හෙළ බසින් දහම් පත් පොත් මුද්‍රණය කරවා පළකර හැරීමත් ධර්ම පඞ්ක්ති පැවැත්වීමත් නිසා ගිහි පින්වතුන්හට ධර්මය උගෙනීමට මගක් සැලසී ඇතිබව සඳහන් කළයුතුය.

මෙයට දසවසකට පමණ පෙර කොළඹ තරුණ බෞද්ධ සමිතියේ එවකට ප්‍රධාන ලේකම් ධුරය දැරූ සී. වී. පෙරේරා මහත්මාටද ධර්ම පඞ්ක්තියක් ඇරඹීමේ ආවශ්‍යකතාවය වැටහී අපට ආරාධනා කෙළෙන් වර්ෂ 1954 ක් වූ මැයි මස 3 වන දින කොළඹ තරුණ බෞද්ධ සමිති ශාලාවේදී **"පරමාර්ථ ධර්ම පඞ්ක්තිය"** නමින් ධර්ම පඞ්ක්තියක් අරඹා එතැන් සිට අද වන තෙක් නොකඩවා සති පතා එම ධර්ම පඞ්ක්ති පවත්වාගෙන යමි. අභිධර්මාර්ථ සංග්‍රහය අනුව යමින් එහි ඇතුළු ධර්මයන් හැකිතාක් ලිහිල් බසින් විස්තර කරදීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ ඒ ධර්ම කොටස් එම ආකාරයෙන්ම මුද්‍රණය කොට පළකළහොත් ලක්දිව නොයෙක් පළාත්වල සිටින පින්වතුනටද ඉන් මහත්සේ ඵල ලැබිය හැකි බව බොහෝ දෙනාගේ අදහස වූයෙන් එම පාඩම් මුද්‍රණය කොට ධර්මදූතයක් වශයෙන් නොමිලයේ බෙදා හැරීමට සී. වී. පෙරේරා මහත්මාම ඉදිරිපත් විය. කටයුතු අධික

දුෂ්කර කාලයක් වූයේ වී නමුත් බොහෝ දෙනාට වන ධර්ම ලාභය සලකා ධර්ම පත්‍රිකා ලියා දීමට භාර ගෙන අවකාශ ඇති පරිදි එය කර දුනිමි. සුළු වශයෙන් කිරීමට අදහස් කළ කටයුත්ත විස්තර ඇතිව ධර්මය උගෙනීමට කැමති පින්වතුන් ඇතිබව දැනගන්නට ලැබුන හෙයින් අපට ඇති අනවකාශයත් ප්‍රකාශක භවතුන්හට දරන්නට සිදුවන වියදමත් නොසලකා ධර්ම ලාභයම සලකා පිටු දෙදහසකට අධිකවූ ප්‍රමාණයක් ලියා මුද්‍රණය කරවා නොමිලයේ බෙදා හරින්නට හැකි විය. මේ පත්‍රිකා පිළිවෙළින් මුද්‍රණය කරවා බෙදා හරින්නට සී. ටී. පෙරේරා මහත්මා දැරූ උත්සාහයත් වියදම් කළ ප්‍රමාණයත් බොහෝය. මේ ධර්ම දානමය පුණ්‍ය කර්මයෙහි ඇති වැදගත් කම වටහාගත් වෙනත් සැදැහැවතුන් විසින්ද නොයෙක් වර මුදල් පරිත්‍යාග කිරීම් ආදියෙන් ඒ මහත්මාට අනුබල දුන් බවද සතුටින් සඳහන් කළ යුතුය. පිටු 500 කින් පමණ යුත් අවසාන පරිච්ඡේදය කොළඹ තරුණ බෞද්ධ සමිතියේ පාලක මණ්ඩලය භාර ගෙන ඒ සමිතියේ වියදමින් මුද්‍රණය කරවා දීම මේ සත් කාර්‍යයට විශේෂ රුකුලක් විය.

වර්ෂ 1959 දී ආරම්භ කළ **"පරමාර්ථ ධර්ම පත්‍රිකා"** සියල්ල මුද්‍රණය කිරීමත් බෙදා හැරීමත් පුරා අවුරුදු සතරක් මුළුල්ලේම සිදු විය. එක් වරකට මුද්‍රණය කළ හැකි වූයේ පත්‍රිකා සීමා සහිත ප්‍රමාණයක් බැවින් පසුව මේ ධර්මය උගන්නට අදහස් කළ පින්වතුන්හට මුල් පරිච්ඡේද ලබා ගැනීමට නොහැකිවූයෙන් නැවතත් එය මුද්‍රණය කරවා දෙන ලෙස නොයෙක් පළාත්වලින් ආරාධනා ලදිමි. එහෙයිනි මේ පොත මෙසේ මුද්‍රණය කරවන්නට සිදුවූයේ.

අභිධර්මාර්ථ සංග්‍රහය අනුව යමින් එහි එන ධර්මයන් පිළිබඳ විස්තර විවරණයක් මෙහි ඇතුළත් කළ හෙයින් මේ පොතට **"අභිධර්මාර්ථ ප්‍රදීපිකා"** යන නම යෙදුවෙමු. අභිධර්මාර්ථ සංග්‍රහ පාලියත්, එහි භාවයත් ඒ ඒ පරිච්ඡේද වලට මුලින් යොදා ඇත. කාණ්ඩ සතරක් හැටියට පළ වන මේ ග්‍රන්ථයෙහි පළමු කාණ්ඩයෙහි **චිත්ත සංග්‍රහ**

**විභාග** නම් වූ ප්‍රථම පරිච්ඡේදයද, **චෛතසික සංග්‍රහ විභාග** නම් වූ ද්විතීය පරිච්ඡේදයද, **ප්‍රකීර්ණක සංග්‍රහ විභාග** නම් වූ තෘතීය පරිච්ඡේදයද, **වීථි සංග්‍රහ විභාග** නම් වූ චතුර්ථ පරිච්ඡේදය ද, **වීථිමුක්ත සංග්‍රහ විභාග** නම් වූ පඤ්චම පරිච්ඡේදය ද ඇතුළත් වේ. දෙවන කාණ්ඩයෙහි **රූප සංග්‍රහ විභාග** නම් වූ ෂට්ඨම පරිච්ඡේදය සහ **සමුච්චය සංග්‍රහ විභාග** නම් වූ සප්තම පරිච්ඡේදයද, තුන්වන කාණ්ඩයෙහි **ප්‍රත්‍යය සංග්‍රහ විභාග** නම් වූ අෂ්ටම පරිච්ඡේදයද, සතරවන කාණ්ඩයෙහි **කර්මස්ථාන විභාග** නම් වූ නවවන පරිච්ඡේදයද ඇතුළත් වේ.

මේ පොත ලිවීමේදී **විශුද්ධි මාර්ගය, අත්ථසාලිනී** නම් වූ **දම්සඟුණු අටුවාව, විභංග අටුවාව** ආදි අභිධර්මග්‍රන්ථ උපයෝගී කරගත් බව සඳහන් කරනු කැමැත්තෙමි.

විශේෂයෙන් පාලි භාෂාවෙහි වැඩි දැනීමක් නැති පින්වතුන්ගේ ප්‍රයෝජනය සලකා මේ ධර්ම විවරණය හැකිතාක් ලිහිල් බසින් ලියා ඇති බවත් පෙළ අටුවාවන්හි එන පාලිපාඨ මෙහි නොයෙදූ බවත් සලකනු මැනවි.

මේ පොත හදාරන භවතුනට අභිධර්මය පිළිබඳ යම් කිසි දැනීමක් ඇති කර ගත හැකි වූයේ නම් එයම අපගේ වෑයමේ ප්‍රතිඵලයක් හැටියට සලකමි.

මෙබඳු ග්‍රන්ථයක් ලියන්නට තරම් අවශ්‍ය මූලික ශාස්ත්‍ර ඥානයත්, ධර්ම ඥානයත් ජීවිතයේ මුල් අවධියේම මට ලබා දුන් මා ගුරුදෙව් **දන්ගෙදර සිරි සරණපාල මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ** සහ ධර්ම සාකච්ඡා-දියෙන් මට පිහිට වූ **පැලෑණේ සිරි වජිරඤාණ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත්** නමස්කාරපූර්ව කෘතඥතායෙන් සිහිකොට පින් දෙමි. එසේම නැසීගිය මා දෙමාපිය ගුරුවරාදීන්ටද මෙහි පින් අනුමෝදන් කරවමි.

පෙර වදනක් ලියා දෙමින් මට අනුග්‍රහ කළ වජිරාරාම වාසි **පියදස්සි** හිමිපාණන්ට ද, සෝදුපත් බලා දුන් පින්-වතුන්ට හා ප්‍රකාශක භවතුන්ට ද කෘතඥ වෙමි.

**සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා!**

**අමරදාස රත්නපාල**

## පටුන

### රූප සංග්‍රහ විභාග නම්වූ ප්‍රථම පරිච්ඡේදය

සිටුව


| | |
|---|---|
| පාළිය | 1 |
| භාවය | 9 |
| **අටවිසි රූපයන්ගේ එකොළොස් ආකාර බෙදීම** | 17 |
| **මහා භූත රූප** | 20 |
| පඨවි | 21 |
| ආපො | 22 |
| තෙජෝ | 23 |
| වායො | 24 |
| **ප්‍රසාද රූප** | 26 |
| චක්ඛු | 26 |
| සොත | 29 |
| ඝාණ | 30 |
| ජිව්හා | 31 |
| කාය | 31 |
| **ගොචර රූප** | |
| වර්ණ රූප | 33 |
| ශබ්ද | 35 |
| ගන්ධ | 37 |
| රස | 38 |
| පොට්ඨබ්බ | 40 |
| **භාවරූපමය** | 41 |
| **හදය වත්ථු රූපය** | 43 |
| **ජීවිතින්ද්‍රිය රූපය** | 47 |
| **ආහාර රූපය** | 49 |

| | පිටුව |
|---|---|
| **පරිච්ඡෙද රූපය** | 53 |
| **විඤ්ඤත්තිමය** | 55 |
| කාය විඤ්ඤත්ති | 55 |
| වචී විඤ්ඤත්ති | 57 |
| **විකාර රූප** | 58 |
| ලහුතා | 59 |
| මුදුතා | 59 |
| කම්මඤ්ඤතා | 60 |
| **ලක්ෂණ රූප** | 61 |
| **රූපයෙහි ආයුෂය** | 63 |
| **රූපයන්ගේ නිෂ්පන්න අනිෂ්පන්නාදි භෙදය** | 64 |
| **රූප සමුට්ඨාන** | 73 |
| කම්ම සමුට්ඨාන රූප | 73 |
| චිත්ත සමුට්ඨාන රූප | 76 |
| උතු සමුට්ඨාන රූප | 84 |
| ආහාර සමුට්ඨාන රූප | 89 |
| **රූප කලාප** | 96 |
| **රූප කලාපයන්ගේ වැඩීම හා හානිය** | 101 |
| **රූප ප්‍රවෘත්ති ක්‍රමය** | 101 |
| **නිර්වාණය** | 112 |
| **සමුච්චය සංග්‍රහ විභාග නම්වූ සප්තම පරිච්ඡෙදය** | 131 |
| පාළිය | 131 |
| භාවය | 137 |
| **සමුච්චය සංග්‍රහ විභාගය** | 145 |
| **අකුසල සංග්‍රහය** | 147 |
| ආශ්‍රව | 147 |
| ඕඝ | 150 |

පිටුව


| | |
|---|---|
| යෝග | 152 |
| ග්‍රන්ථ | 153 |
| උපාදාන | 154 |
| නීවරණ | 157 |
| අනුශය | 170 |
| සංයෝජන | 175 |
| ක්ලේශ | 181 |
| **මිශ්‍රක සංග්‍රහය** | 186 |
| හේතු ධර්ම | 186 |
| ධ්‍යානාඞ්ග | 189 |
| මාර්ගාඞ්ග | 191 |
| ඉන්ද්‍රිය | 200 |
| බල | 209 |
| අධිපති | 211 |
| ආහාර | 213 |
| **බොධිපාක්ෂික සංග්‍රහය** | 216 |
| **සතර සතිපට්ඨාන** | 217 |
| කායානුපස්සනා | 222 |
| වේදනානුපස්සනා | 241 |
| චිත්තානුපස්සනා | 247 |
| ධම්මානුපස්සනා | 250 |
| නීවරණයන්ගේ වශයෙන් | 250 |
| උපාදානස්කන්ධයන්ගේ වශයෙන් | 257 |
| ආයතනයන්ගේ වශයෙන් | 258 |
| බොධ්‍යාඞ්ග ධර්මයන්ගේ වශයෙන් | 260 |
| චතුරාර්ය සත්‍ය ධර්මයන්ගේ වශයෙන් | 276 |
| **සතර සම්මප්පධාන ධර්ම** | 282 |

| | පිටුව |
|---|---|
| සතර ඍද්ධිපාද ධර්ම | 301 |
| පඤ්ච ඉන්ද්‍රිය ධර්ම | 308 |
| පඤ්ච බල ධර්ම | 311 |
| සප්තබොධ්‍යාඞ්ග ධර්ම | 312 |
| අෂ්ට ආර්‍ය්‍ය මාර්‍ගාඞ්ග ධර්ම | 325 |
| සර්ව සංග්‍රහය | 331 |
| පඤ්චස්කන්ධ | 331 |
| රූපස්කන්ධය | 334 |
| වෙදනාස්කන්ධය | 348 |
| සඤ්ඤාස්කන්ධය | 361 |
| සංස්කාරස්කන්ධය | 368 |
| විඥානස්කන්ධය | 374 |
| පඤ්චස්කන්ධයන්ගේ ෂොඩශ භෙදය | 379 |
| පඤ්ච උපාදානස්කන්ධ | 414 |
| ආයතන | 415 |
| ධාතු | 428 |
| චතුරාර්‍ය්‍යසත්‍යධර්ම | 471 |
| දෙශනා ක්‍රමය | 481 |
| අන්තර්ගත ධර්ම | 483 |
| දුඃඛාර්‍ය්‍ය සත්‍යය | 495 |
| දුඃඛ සමුදයාර්‍ය්‍ය සත්‍යය | 520 |
| දුඃඛ නිරොධාර්‍ය්‍ය සත්‍යය | 524 |
| දුඃඛ නිරොධ ගාමිණී ප්‍රතිපදා ආර්‍ය්‍යසත්‍යය | 527 |

# අභිධම්මත්ථ සඞ්ගහො

## ඡට්ඨො පරිච්ඡෙදො

## රූපසඞ්ගහ විභාගො

1. එත්තාවතා විභත්තාහි - සප්පභෙදප්පවත්තිකා,
චිත්තචෙතසිකා ධම්මා - රූපංදානි පවුච්චති.

2. සමුද්දෙසා විභාගාච - සමුට්ඨානා කලාපතො
පවත්තික්කමතො චෙති - පඤ්චධා තත්ථ සඞ්ගහො.

3. චත්තාරි මහාභූතානි, චතුණ්ණංච මහාභූතානං උපාදාය රූපංති දුවිධමෙපෙතං රූපං එකාදසවිධෙන සඞ්ගහං ගච්ඡති.

4. කථං? පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු භූතරූපං නාම

5. චක්ඛු, සොතං, ඝාණං, ජිව්හා, කායො පසාදරූපං නාම

6. රූපං, සද්දො ගන්ධො රසො ආපොධාතු විවජ්ජිතං භූතත්තය සඞ්ඛාතං පොට්ඨබ්බං ගොචර රූපං නාම.

7. ඉත්ථත්තං පුරිසත්තං භාවරූපං නාම

8. හදය වත්ථු හදයරූපං නාම

9. ජීවිතින්ද්‍රියං ජීවිතරූපං නාම

10. කබලීකාරො ආහාරො ආහාරරූපං නාම

11. ඉතිච අට්ඨාරස විධම්පෙතං රූපං සභාවරූපං සලක්ඛණ රූපං නිප්ඵන්න රූපං රූප රූපං සම්මසන රූපං තිච සඞ්ඛං ගච්ඡති.

12. ආකාසධාතු පරිච්ඡෙද රූපං නාම

13. කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති විඤ්ඤත්ති රූපං නාම

14. රූපස්ස ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා විඤ්ඤත්ති ද්වයං විකාර රූපං නාම

15. රූපස්ස උපචයො, සන්තති, ජරතා, අනිච්චතා ලක්ඛණ රූපං නාම

16. ජාතිරූප මෙව පනෙත්ථ උපචය සන්තති නාමෙන පවුච්චතීති එකාදසවිධම්පෙතං රූපං අට්ඨවීසතිවිධං හොති. සරූපවසෙන කථං.

17. භූතප්පසාද විසයා – භාවො හදය මිච්චපි
ජීවිතාහාර රූපෙහි – අට්ඨාරස විධං තථා.
පරිච්ඡෙදො ච විඤ්ඤත්ති – විකාරො ලක්ඛණං තිච
අනිප්ඵන්නා දස චෙති – අට්ඨවීස විධං භවෙ.

**අයමෙත්ථ රූප සමුද්දෙසො.**

18. සබ්බඤ්ච පනෙතං රූපං අහේතුකං සප්පච්චයං සාසවං සඞ්ඛතං ලොකියං කාමාවචරං අනාරම්මණං අප්පහාතබ්බමෙවාති එකවිධම්පි 'අජ්ඣත්තික බාහිරාදිවසෙන බහුධා භෙදං ගච්ඡති.

19. කථං? පසාද සඞ්ඛාතං පඤ්චවිධංපි අජ්ඣත්තික රූපං නාම ඉතරං බාහිර රූපං.

20. පසාද හදය සඞ්ඛාතං ඡබ්බිධම්පි වත්ථු රූපං නාම, ඉතරං අවත්ථු රූපං

21. පසාද විඤ්ඤත්ති සඞ්ඛාතං සත්තවිධම්පි ද්වාර රූපං නාම, ඉතරං අද්වාර රූපං.

22. පසාද භාව ජීවිත සඞ්ඛාතං අට්ඨවිධම්පි ඉන්ද්‍රිය රූපං නාම, ඉතරං අනින්ද්‍රිය රූපං.

23. පසාද විසය සඞ්ඛාතං ද්වාදසවිධම්පි ඔළාරික රූපං සන්තිකෙ රූපං, සප්පටිඝරූපඤ්ච, ඉතරං සුඛුම රූපං, දූරෙ රූපං අප්පටිඝරූපඤ්ච.

24. කම්මජං උපාදින්න රූපං ඉතරං අනුපාදින්න රූපං.

25 රූපායතනං සනිදස්සන රූපං, ඉතරං අනිදස්සන රූපං

26. චක්ඛාදිද්වයං අසම්පත්ත වසෙන, ඝාණාදිත්තයං සම්පත්ත වසෙනාති පඤ්චවිධම්පි ගොචරග්ගාහික රූපං නාම. ඉතරං අගොචරග්ගාහික රූපං.

27. වණ්ණො, ගන්ධො, රසො, ඕජා භූතචතුක්කඤ්චෙති අට්ඨවිධම්පි අවිනිබ්භොග රූපං, ඉතරං විනිබ්භොග රූපං.

28. ඉච්චෙවමට්ඨවීසති - විධම්පිච විචක්ඛණා
අජ්ඣත්තිකාදිභෙදෙන - විභජන්ති යථාරහං

**අයමෙත්ථ රූප විභාගො.**

---

29. කම්මං චිත්තං උතු ආහාරොචෙති චත්තාරි රූප සමුට්ඨානි නාම.

30. තත්ථ කාමාවචරං රූපාවචරං චෙති පඤ්චවීසති විධම්පි කුසලාකුසලකම්මමභිසඞ්ඛතං අජ්ඣත්තික සන්තානෙ කම්මසමුට්ඨාන රූපං පටිසන්ධිමුපාදාය ඛණෙ ඛණෙ සමුට්ඨාපෙති.

31. ආරුප්පවිපාක ද්විපඤ්චවිඤ්ඤාණ වජ්ජිතං පඤ්චසත්තති විධම්පි චිත්තං චිත්තසමුට්ඨාන රූපං පඨමභවඞ්ගමුපාදාය ජායන්තමෙව සමුට්ඨාපෙති.

32. තත්ථ අප්පනා ජවනං ඉරියාපථම්පි සන්නාමෙති.

33. වොට්ඨපන කාමාවචර ජවනාභිඤ්ඤා පන විඤ්ඤත්තිම්පි සමුට්ඨාපෙන්ති.

34. සොමනස්ස ජවනානි පනෙත්ථ තෙරස හසනම්පි ජනෙන්ති.

35. සීතුණ්හොතුසමඤ්ඤාතා තෙජොධාතු ඨිතිප්පත්තාව උතුසමුට්ඨානරූපං අජ්ඣත්තංච බහිද්ධාච යථාරහං සමුට්ඨාපෙති.

36. ඔජා සඞ්ඛාතො ආහාරො ආහාරසමුට්ඨානරූපං අජ්ඣොහරණකාලෙ ඨානප්පත්තොව සමුට්ඨාපෙති.

37. තත්ථ හදය ඉන්ද්‍රිය රූපානි කම්මජානෙව.

38. විඤ්ඤත්තිද්වයං චිත්තජමෙව.

39. සද්දො චිත්තොතුජො

40. ලහුතාදිත්තයං උතුචිත්තාහාරෙහි සම්භොති.

41. අවිනිබ්භොගරූපානි චෙව ආකාසධාතුච චතූහි සම්භූතානි.

42. ලක්ඛණ රූපානි න කුතොචි ජායන්ති.

43. අට්ඨාරස පණ්ණරස - තෙරස ද්වාදසාති ච
කම්මචිත්තොතුකාහාර - ජානිහොන්ති යථාක්කමං.
ජායමානාදි රූපානං - සභාවත්තාහි කෙවලං
ලක්ඛණානි න ජායන්ති - කෙහිචීති පකාසිතං.

**අයමෙත්ථ රූපසමුට්ඨාන නයො.**

---

44. එකුප්පාදා එකනිරොධා එකනිස්සයා සහවුත්තිනො එකවීසති රූපකලාපා නාම.

45. තත්‍ථ ජීවිතං අවිනිබ්භොග රූපඤ්ච චක්ඛුනා සහ චක්ඛුදසකන්ති පවුච්චති. තථා සොතාදීහි සද්ධිං සොතදසකං, ඝාණදසකං, ජිව්හාදසකං, කායදසකං, ඉත්ථිභාවදසකං, පුම්භාවදසකං, වත්ථුදසකඤ්චෙති යථාක්කමං යොජෙතබ්බං. අවිනිබ්භොග රූපමෙව ජීවිතෙන සහ ජීවිතනවකන්ති පවුච්චති. ඉමෙ නව කම්ම සමුට්ඨාන කලාපා.

46. අවිනිබ්භොග රූපං පන සුද්ධට්ඨකං තදෙව කායවිඤ්ඤත්තියා සහ කායවිඤ්ඤත්ති නවකං, වචීවිඤ්ඤත්ති සද්දෙහි ච සහ වචීවිඤ්ඤත්තිදසකං, ලහුතාදීහි සද්ධිං ලහුතාදෙකාදසකං, කායවිඤ්ඤත්ති ලහුතාදිද්වාදසකං, වචීවිඤ්ඤත්ති සද්දලහුතාදිතෙරසකං චෙති ඡ චිත්ත සමුට්ඨාන කලාපා.

47. සුද්ධට්ඨකං, සද්ද නවකං ලහුතාදෙකාදසකං, සද්දලහුතාදිද්වාදසකං චෙති චත්තාරො, උතුසමුට්ඨාන කලාපා.

48. සුද්ධට්ඨකං, ලහුතාදෙකාදසකං චෙති ද්වෙ ආහාර සමුට්ඨාන කලාපා.

49. තත්‍ථ සුද්ධට්ඨකං, සද්ද නවකං චෙති ද්වෙ උතුසමුට්ඨාන කලාපා බහිද්ධාපි ලබ්භන්ති, අවසෙසා පන සබ්බෙපි අජ්ඣත්තිකමෙවාති.

50. කම්ම චිත්තොතුකාහාර - සමුට්ඨානා යථාක්කමං
නවඡ චතුරො ද්වෙති - කලාපා එකවීසති.
කලාපානං පරිච්ඡෙද ලක්ඛණත්තා විචක්ඛණා,
න කලාපඞ්ග මිච්චාහු - ආකාසං ලක්ඛණානි ච.

## අයමෙත්‍ථ කලාප යොජනා.

---

51. සබ්බානිපි පනෙතානි රූපානි කාමලොකෙ යථාරහං අනූනානි පවත්තියං උපලබ්භන්ති.

52. පටිසන්ධියං පන සංසෙදජානංචෙව ඔපපාතිකානංච චක්ඛු සොත ඝාණ ජිව්හා කාය භාව වත්ථු දසක සඞ්ඛාතානි සත්ත දසකානි පාතුභවන්ති උක්කට්ඨ වසෙන, ඔමකවසෙන පන චක්ඛු සොත ඝාණ භාව දසකානි කදාචිපි නලබ්භන්ති, තස්මා තෙසං වසෙන කලාපානි වෙදිතබ්බා.

53. ගබ්භසෙය්‍යක සත්තානං පන කාය, භාව, වත්ථු දසක සඞ්ඛාතානි තීණි දසකානි පාතුභවන්ති, තත්ථාපි භාවදසකං කදාචි න ලබ්භති, තතොපරං පවත්ති කාලෙ කමෙන චක්ඛුදසකාදීනිච පාතුභවන්ති.

54. ඉච්චෙවං පටිසන්ධිමුපාදාය කම්මසමුට්ඨානා, දුතිය චිත්තමුපාදාය චිත්ත සමුට්ඨානා ඨිතිකාලමුපාදාය උතු-සමුට්ඨානා, ඔජාඵරණමුපාදාය ආහාරසමුට්ඨානා චෙති චතුසමුට්ඨාන රූපකලාපසන්තති කාමලොකෙ දීපජාලවිය නදීසොතොවියච යාවතායුකමබ්බොච්ඡින්නා පවත්තන්ති.

55. මරණකාලෙපන චුතිචිත්තොපරි සත්තරසම චිත්තස්ස ඨිති කාලමුපාදාය කම්මජරූපානි නුප්පජ්ජන්ති. පුරෙතර මුප්පන්නානිච කම්මජරූපානි චුතිචිත්ත සමකාල මෙව පවත්තිත්වා නිරුජ්ඣන්ති, තතො පරං චිත්තජාහාරජ රූපඤ්ච වොච්ඡිජ්ජති. තතොපරං උතුසමුට්ඨාන රූප පරම්පරායාව මතකලෙබරං සඞ්ඛාය පවත්තන්ති.

56. ඉච්චෙවං මතසත්තානං - පුනදෙවභවන්තරෙ
පටිසන්ධිමුපාදාය – තථා රූපං පවත්තති.

57. රූපලොකෙ පන ඝාන, ජිව්හා, කාය භාවදසකා-නිච ආහාරජ කලාපානිච නලබ්භන්ති, තස්මා තෙසං පටිසන්ධිකාලෙ චක්ඛු, සොත, වත්ථු වසෙනතීණි දසකානි, ජීවිත නවකං චෙති චත්තාරො කම්මසමුට්ඨාන කලාපා පවත්තියං චිත්තොතු සමුට්ඨානාච ලබ්භන්ති.

58. අසඤ්ඤසත්තානං පන චක්ඛු සොත වත්ථු සද්දාපි නලබ්භන්ති, තථා සබ්බානිපි චිත්තජ රූපානි, තස්මා තෙසං පටිසන්ධි කාලෙ ජීවිතනවකමෙව පවත්තියංච සද්දවජ්ජිතං උතුසමුට්ඨාන රූපං අතිරිච්චතීති.

59. ඉච්චෙවං කාම රූපාසඤ්ඤි සඞ්ඛාතෙසු ඨානෙසු පටිසන්ධිපවත්ති වසෙන දුවිධා රූපප්පවත්ති වෙදිතබ්බා.

60. අට්ඨවීසති කාමෙසු - හොන්ති තෙවීස රූපිසු
සත්තරසෙව, සඤ්ඤීනං - ආරුප්පෙ නත්ථි කිඤ්චිපි.
සද්දො විකාරො ජරතා - මරණඤ්චොප පත්තියං
නලබ්භන්ති පවත්තෙතු - නකිඤ්චිපි නලබ්භති.

**අයමෙත්ථ රූපප්පවත්තික්කමො.**

61. නිබ්බානං පන ලොකුත්තර සඞ්ඛාතං චතුමග්ග ඤාණෙන සච්ඡිකාතබ්බං මග්ගඵලානමාලම්බනභූතං වාන සඞ්ඛාතාය තණ්හාය නික්ඛන්තත්තා නිබ්බානන්ති පවුච්චති.

62. තදෙතං සභාවතො එකවිධම්පි සඋපාදිසෙස නිබ්බානධාතු අනුපාදිසෙස නිබ්බානධාතු චෙති දුවිධං හොති කාරණපරියායෙන.

63. තථා සුඤ්ඤතං අනිමිත්තං අප්පණිහිතං චෙති තිවිධං හොති ආකාර භෙදෙන.

64. පදමච්චුත මච්චන්තං - අසඞ්ඛත මනුත්තරං
නිබ්බාණමිති භාසන්ති - වානමුත්තා මහෙසයො
ඉතිචිත්තං චෙතසිකං - රූපං නිබ්බාන මිච්චපි
පරමත්ථං පකාසෙන්ති - චතුධාව තථාගතා.

**ඉති අභිධම්මත්ථ සඞ්ගහෙ රූප සඞ්ගහවිභාගො නාම ඡට්ඨො පරිච්ඡෙදො.**

# අභිධර්මාර්ථ සඞ්ග්‍රහය.

## ෂෂ්ඨම පරිච්ඡේදය

## රූප සඞ්ග්‍රහ විභාගය

(භාවය)

1. මෙපමණක්වූ ප්‍රභෙද ප්‍රවෘත්ති සහිතවූ චිත්ත චෛතසික ධර්මයෝ බෙදා දක්වන ලදහ. දැන් රූපය කියනු ලැබේ.

2. සමුද්දෙස වශයෙන්ද, විභාග වශයෙන්ද සමුට්ඨාන වශයෙන්ද, කලාප වශයෙන්ද, පවත්තික්කම වශයෙන්දැයි එහි සංග්‍රහය පස් ආකාරයකින් වේ.

3. සතර මහා භූතයෝය, සතරමහා භූතයන් නිසා පවත්නා රූපයෝ යයි මේ දෙවැදෑරුම් රූපය එකොළොස් ආකාරයකින් සංග්‍රහයට යයි.

4. කෙසේද? පඨවිධාතුව, ආපොධාතුව, තෙජෝධාතුව, වායොධාතුව භූතරූප නම් වේ.

5. චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය ප්‍රසාදරූප නම් වේ.

6. රූපය, ශබ්දය, ගන්ධය, රසය ආපොධාතු වර්ජිත භූතත්‍රය සඞ්ඛ්‍යාත පොට්ඨබ්බයද ගොචර රූප නම් වේ.

7. ස්ත්‍රී බවද, පුරුෂ බවද භාවරූප නම් වේ.

8. හෘදය වස්තුව හදයරූප නම් වේ.

9. ජීවිතින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය රූපය නම්.

10. කබලීකාර ආහාරය ආහාර රූප නම්.

11. මෙසේ අටළොස් විධිවූ මේ රූපය, ස්වභාවරූපය, ස්වලක්ෂණරූපය, නිෂ්පන්නරූපය, රූපරූපය, සම්මසන රූපය යයි ව්‍යවහාරයට පැමිණේ.

12. ආකාශ ධාතුව පරිච්ඡේද රූපය නම් වේ.

13. කායවිඤ්ඤත්තිය හා වචීවිඤ්ඤත්තිය විඤ්ඤත්ති රූප නම් වේ.

14 රූපයාගේ සැහැල්ලු බව, මොළොක් බව හා කර්මයට අනුකූලබව විකාර රූප නම් වේ.

15 රූපයාගේ උපචයද, සන්තතියද, ජරතාවද අනිත්‍යතාවයද ලක්ෂණරූප නම් වේ.

16. මෙහි ජාතිරූපයම උපචය සන්තති නාමයෙන් කියනු ලැබේ. මෙසේ එකොළොස් විධවූ රූපය අටවිසි වැදෑරුම් වේ. ස්වරූප වශයෙන් කෙසේද?

17. භූත ප්‍රසාද, විෂය, භාව, හදය යන රූපය ජීවිත ආහාර රූපයන් හා අටළොස් විධ වේ. එසේම පරිච්ඡේද විඤ්ඤත්ති, විකාර, ලක්ෂණ යන අනිෂ්පන්න දසය දැයි අටවිසි වැදෑරුම් වේ.

**මෙය මෙහි රූප සමුද්දේසයයි.**

---

18. මේ සියළු රූපය අහේතුකය, ප්‍රත්‍යය සහිතය, ආශ්‍රව සහිතය, සඞ්ඛතය, ලෞකිකය, කාමාවචරය, අනාරම්මණය, පහනොකළ යුතුය. මෙසේ එකවිධවූවද අධ්‍යාත්මික බාහිරාදි වශයෙන් බොහෝවූ භෙදයට යයි.

19. කෙසේද? ප්‍රසාද සඞ්ඛ්‍යාතවූ පඤ්චවිධ රූපය අධ්‍යාත්මිකරූප නම්. ඉතිරි රූප බාහිරරූප නම්.

20. ප්‍රසාද හදය සඞ්ඛ්‍යාතවූ ෂඩ්විධරූපය වස්තුරූප නම්. ඉතිරිරූප අවස්තුරූප නම්.

21. ප්‍රසාද-විඤ්ඤත්ති සඞ්ඛ්‍යාතවූ සත්විධරූපය ද්වාර රූප නම්. ඉතිරිරූප අද්වාරරූප නම් වෙති.

22. ප්‍රසාද, භාව, ජීවිත සඞ්ඛ්‍යාත අෂ්ටවිධරූප ඉන්ද්‍රිය රූප නම්. ඉතිරි රූප අනින්ද්‍රියරූප නම්.

23. ප්‍රසාද විෂය සඞ්ඛ්‍යාතවූ ද්වාදශවිධරූප ඖදාරික රූප, සන්තිකෙරූප, සප්පටිඝරූප නම් වේ. ඉතිරි රූප, සුඛුමරූප, දූරෙරූප, අප්පටිඝ රූප නම්.

24. කර්මජ රූප උපාදින්න රූප නම්. ඉතිරි රූප අනුපාදින්න රූප නම්.

25. රූපායතනය සනිදස්සන රූප නම්. ඉතිරි රූප අනිදස්සන රූපනම්.

26. චක්ඛාදිවය අසම්ප්‍රාප්ත වශයෙන්ද, ඝාණාදිත්‍රය සම්ප්‍රාප්ත වශයෙන්ද යන පඤ්චවිධ රූප ගොචරග්‍රාහික රූපනම් ඉතිරි රූප අගොචර ග්‍රාහික රූප නම්.

27. වර්ණය, ගන්ධය, රසය, ඕජාවය, භූතරූප සතර යන අෂ්ටවිධ රූපයෝ අවිනිබ්භොග රූප නම්. ඉතිරි රූප විනිබ්භොග රූප නම්.

28. මෙසේ අටවිසිවැදෑරුම් රූපය අධ්‍යාත්මිකාදී භෙදයෙන් නුවණැත්තෝ සුදුසු පරිදි බෙදත්.

**මෙය මෙහි රූප විභාගය නම්.**

---

29. කර්ම, චිත්ත, ඍතු ආහාර යන මේ සතර රූප සමුට්ඨාන නම් වේ.

30. එහි කාමාවචර රූපාවචර යන පස්විසි කුසලා කුසල කර්මය අධ්‍යාත්ම සන්තානයෙහි කම්මසමුට්ඨාන රූපය, ප්‍රතිසන්ධි සිතෙහි උත්පාදක්ෂණයෙහි සිට ක්ෂණයක් ක්ෂණයක් පාසා උපදවයි.

31. අරූපවිපාක හා දෙපස් විඤ්ඤාණයන් හැර ඉතිරි පන්සැත්තෑසිත් ප්‍රතිසන්ධි සිතට අනතුරුව ප්‍රථමභාවඞ්ග යාගේ උත්පාදක්ෂණයෙහි පටන් චිත්ත සමුට්ඨාන රූප උපදවයි.

32. ඔවුන් අතුරෙන් අපීණාජවනය ඉරියාපථයද පවත්වයි.

33. වොට්ඨපන, කාමාවචර ජවන අභිඥාවෝ විඥප්තියද උපදවත්.

34. එයින් තෙළෙස් සොම්නස් ජවනය සිනහවද උපදවත්.

35. ශීතොෂ්ණසඞ්ඛ්‍යාතවූ තොජොධාතුව ස්ථිතිප්‍රාප්තවූ කල්හි උතුසමුට්ඨාන රූපය අධ්‍යාත්මසන්තානයෙහිද බාහිර සන්තානයෙහිද සුදුසු පරිදි උපදවයි.

36. ඕජාසඞ්ඛ්‍යාතවූ ආහාරය අනුභව කරන කාලයෙහි ස්ථිතියට පැමිණියේම ආහාර සමුට්ඨාන රූප උපදවයි.

37. එහි හදය ඉන්ද්‍රිය රූපයෝ කර්මජ රූපයෝමය.

38. විඥප්තිරූප දෙක චිත්තජමය.

39. ශබ්දය චිත්ත ඍතු දෙකෙනි.

40. ලහුතාදිත්‍රය ඍතු, චිත්ත, ආහාරයන්ගෙන් හට ගනී.

41. අවිනිර්භොගරූප හා ආකාසධාතුවද චතුසමුට්ඨානිකය.

42. ලක්ෂණරූපයෝ මේ කිසිවකින් හටනොගනිත්.

43 කම්ම, චිත්ත, ඍතු, ආහාරයන්ගෙන් හටගන්නා රූපයෝ පිළිවෙළින් අටළොසක්ද, පසළොසක්ද; තෙළෙසක්ද, දොළොසක්ද වෙති. ඉපදීම් ආදිය රූපයන්ගේ ස්වභාවයන් වූ බැවින් ලක්ෂණරූපයෝ මේ කිසිවකින් නූපදිත්යයි කියනලදී.

**මෙය මෙහි රූපසමුට්ඨාන ක්‍රමයයි.**

---

44 එකට උපදින, එකට නිරුද්ධවන, සමාන නිශ්‍රය ඇති එකට පවත්නා එක්විස්ස රූපකලාප නම් වෙත්.

45. එහි ජීවිතරූපයද අවිනිබ්භොගරූපද චක්‍ෂුප්‍රසාදය සමග චක්ඛුදසකය යයි කියනු ලැබේ. එසේම සොත ප්‍රසාදීන් හා සමග සොතදසකයද, ඝාණදසකයද, ජිව්හා දසකයද, කායදසකයද, ඉත්‍ථිභාව දසකයද, පුම්භාවදසක යද, වස්තුදසකය දැයි මෙසේ පිළිවෙළින් යෙදිය යුතු. අවිනිබ්භොග රූපයට ජීවිත රූපය සමග ජීවිත නවක යයි කියනු ලැබේ. මේ නවය කම්ජ රූපකලාපයෝ වෙත්.

46. අවිනිබ්භොගරූප සුද්ධාෂ්ටක නමි. එයම කාය විඥප්තිය සමග කායවිඥප්ති නවකය නමි. වචී විඥප්තිය හා ශබ්දයන් සමග වචීවිඥප්තිදසකය නමි. ලහුතාදීන් සමග ලහුතාදී එකාදසකය, කායවිඥප්ති ලහුතාදි ද්වාදසකය, වචීවිඥප්ති සද්දලහුතාදි තෙරසකයද යන මේ සය චිත්තසමුට්ඨාන රූපකලාපයෝ නම් වෙත්.

47 සුද්ධාෂ්ටකය, ශබ්දනවකය, ලහුතාදි එකාදසකය, ශබ්දලහුතාදී ද්වාදසකය යන මේ සතර ඍතුසමුට්ඨාන රූප කලාපයෝ ය.

48. සුද්ධාෂ්ටකය, ලහුතාදී එකාදසකය යන දෙක ආහාර සමුට්ඨාන කලාපයෝ ය.

49. එහි සුද්ධාෂ්ටකය, ශබ්දනවකය යන උතුසමුට්ඨාන කලාප දෙක බාහිර සන්තානයෙහිද ලැබෙති. ඉතිරි සියල්ලම අධ්‍යාත්මිකවම ලැබෙති.

50. කම්ම, චිත්ත, ඍතු, ආහාර සමුට්ඨානයෝ පිළිවෙලින් නව දෙනෙක, සදෙනෙක, සිව් දෙනෙක, දෙදෙනෙකැයි එක්විස්සෙක් වෙති. ආකාසධාතුවත් ලක්ෂණ රූපයෝත් කලාපයන්ගේ පිරිසිඳීම හා ලක්ෂණද වූ බැවින් කලාපාඞ්ග නොවෙත් යයි විචක්ෂණයෝ කියති.

**මෙය මෙහි කලාපයෝජනායි.**

---

51. ඒ සියලු රූපයෝ කාමලෝකයෙහිදී ප්‍රවෘත්ති කාලයෙහි නොඅඩුවම සුදුසු පරිදි ලැබෙති.

52. ප්‍රතිසන්ධි කාලයේදී සංසේදජයන්ට හා ඕපපාතික යන්ටද චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, භාව, වත්ථු දසක සඞ්ඛ්‍යාතවූ සප්තදසකයෝ උත්කෘෂ්ට වශයෙන් පහළ වෙත්. ඕමක වශයෙන් වනාහි චක්ඛු, සොත, ඝාණ, භාව දසකයෝ ඇතැම් විටෙක නොලැබෙත්. එහෙයින් ඔවුන්ගේ වශයෙන් කලාප හානිය දතයුතු.

53. ගර්භසෙය්‍යක සත්ත්වයන්ට වනාහි කාය, භාව, වත්ථුදසක සඞ්ඛ්‍යාත දසකයෝ තිදෙනෙක් පහළ වෙත්. එහිද භාවදසකය ඇතැම් විටෙක නොලැබේ. ඉන්පසු ප්‍රවෘත්ති කාලයෙහි පිළිවෙලින් චක්ඛුදසකාදීහු පහළවෙත්.

54. මෙසේ පටිසන්ධිචිත්තයාගේ උත්පාදක්ෂණයෙහි පටන් කර්මජ රූපයෝද, දෙවෙනි සිතෙහි උත්පාදක්ෂණයෙහි පටන් චිත්තජරූපයෝද, ප්‍රතිසන්ධි සිතෙහි ස්ථිතික්ෂණයෙහි පටන් ඍතුජ රූපයෝද ආහාරඕජාව ශරීරයෙහි පැතිරෙන කාලයෙහි පටන් ආහාරජ රූපයෝද, මෙසේ චතුසමුට්ඨානික රූපකලාප සන්තතිය කාමලොකයෙහි පහන් දැල්ලක් මෙන්ද ගඞ්ගාජලප්‍රවාහයක් මෙන්ද ආයු ඇතිතෙක් නොසිඳී පවතී.

55. මරණාසන්න කාලයෙහි චුති චිත්තයට පූර්වයෙහි වූ සතළොස්වන චිත්තයාගේ ස්ථිති කාලයෙහි පටන් කර්මජ රූපයෝ නූපදිත් එයට පෙර උපන් කර්මජ රූපයෝද චුති චිත්තය හා සමකාලය දක්වාම පැවත නිරුද්ධ වෙත්. ඉන්පසු චිත්තජ ආහාරජ රූපද සිඳෙත්. ඉන්පසු ඍතුජ රූප පරම්පරාව මෘත කලේබරය වශයෙන් පවතී.

56. මෙසේ මළාවූ සත්ත්වයන්ට නැවතත් භවාන්තරයෙහි ප්‍රතිසන්ධියෙහි පටන් එසේම රූපය පවතී.

57. රූපලෝකයෙහි ඝ්‍රාණ, ජිව්හා, කාය, භාව දසකයෝද ආහාරජ කලාපයෝද නොලැබෙත්. එහෙයින් ඔවුන්ගේ ප්‍රතිසන්ධි කාලයෙහි චක්ඛු, සෝත, වත්ථු වශයෙන් දසක තුනක්ද, ජීවිත නවකයද යන කම්ම සමුට්ඨාන කලාපද ප්‍රවෘත්ති කාලයෙහි චිත්තජ ඍතුජ කලාපයෝද ලැබෙත්.

58. අසඤ්ඤසත්ත්වයන්ට චක්ඛු, සෝත, වත්ථු, ශබ්දයෝද නොලැබෙත්. එසේම චිත්තජ රූපයෝද නොලැබෙත්. එහෙයින් ඔවුන්ගේ ප්‍රතිසන්ධි කාලයෙහි ජීවිත නවකයම ලැබේ. ප්‍රවෘත්ති කාලයෙහිද ශබ්දය හැර ඍතුජ රූපයද ඉතිරි වෙයි.

59. මෙසේ කාම රූප අසංඥී සඞ්ඛ්‍යාතවූ තුන් තන්හි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති වශයෙන් දෙවැදෑරුම් රූප ප්‍රවෘත්තිය දතයුතු.

60. කාමලෝකයෙහි රූප විසි අටෙක්ද, රූප ලෝකයෙහි තෙවිස්සක්ද අසඤ්ඤීන්ට රූප සතළොසක්ද වෙත්. අරූප ලෝකයෙහි කිසිදු රූපයක් නැත. ශබ්දය, විකාරරූප, ජරතාද අනිච්චතා රූපද උත්පත්ති කාලයෙහි නොලැබෙත්. ප්‍රවෘත්ති කාලයෙහි කිසිදු රූපයක් නොලැබෙන්නේ නොවේ.

**මෙය මෙහි රූප ප්‍රවෘත්ති ක්‍රමයයි**

---

61. ලෝකෝත්තර සඞ්ඛ්‍යාතවූ නිර්වාණය වනාහි සතර මග නුවණින් ප්‍රත්‍යක්‍ෂ කළ යුත්තේය. මාර්ග ඵලයන්ට අරමුණු වන්නාවූ එය වාන සඞ්ඛ්‍යාතවූ තෘෂ්ණාවෙන් නික්මුණු බැවින් නිබ්බාණ යයි කියනු ලැබේ.

62. ඒ මේ නිර්වාණය සවභාව වශයෙන් එකවිධ වුවද ස උපාදිසෙස නිර්වාණ ධාතුව, අනුපාදිසෙස නිර්වාණ ධාතුව යයි කාරණ පරියායෙන් දෙවැදෑරුම් වේ.

63. එසේම සුඤ්ඤතය, අනිමිත්තය, අප්පණිහිතය යන ආකාර භේදයෙන්ද ත්‍රිවිධ වෙයි.

64. චුති රහිතවූ, අන්තය ඉක්මවූ, ප්‍රත්‍යයෙන් සකස් නොකරන ලද්දාවූ නිරුත්තරවූ ශාන්ත පදය නිර්වාණයයි බුදුවරයෝ වදාරණ සේක. මෙසේ තථාගත වරයෝ චිත්තයද, චෛතසිකයද, රූපයද, නිබ්බාණයද යයි පරමාර්ථය සතර ආකාරයෙකින් වදාරත්.

**මෙසේ අභිධර්මාර්ථ සඞ්ග්‍රහයෙහි රූප සඞ්ග්‍රහ විභාග නම්වූ ෂෂ්ඨම පරිච්ඡේදය නිමි.**

---

# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

## ෂෂ්ඨම පරිච්ඡේදය

## රූපසංග්‍රහ විභාගය

**චිත්ත, චෛතසික, රූප, නිර්වාණ** යන සතර පරමාර්ථ ධර්මයන් අතුරෙන් **චිත්ත, චෛතසික** පරමාර්ථයෝ යට දක්වනලදී. මෙතැන් සිට **රූප** පරමාර්ථයන් විස්තර කරණු ලැබේ.

ඇසත්, ඇසට පෙනෙන්නාවූ මහ පොළොව, කඳු, පර්වත, ගල්, වැලි, ගස්, වැල් ආදිය හා මහා සමුද්‍ර, ගංගා, පොකුණු. ඇළ, දොළ, සඳ, හිරු, තරු ආදියත්, කණත්, කණින් අසනු ලබන්නාවූ අහස ගිගුරුම්, වායු චලන ආදියෙන් නිකුත්වන ශබ්දයෝ ද, සණ්ඨාර, බෙර, වීණා ආදියෙන් හා මනුෂ්‍යාදි සත්ත්වයන් විසින් නිකුත් කරණ නානාවිධ ශබ්දයෝ ද, නාසයත් නාසයෙන් ආඝ්‍රාණය කරණු ලබන්නාවූ සුගන්ධ දුර්ගන්ධාදී නොයෙක් ගන්ධයෝ ද, දිවත්, දිවෙන් දැන විඳින්නාවූ මිහිරි තික්තාදි නොයෙක් රසයෝ ද, කයත්, කයින් ස්පර්ශ කරණු ලබන්නාවූ සැප-වත්වූ ද, දුක් සහිතවූ ද නොයෙක් ස්පර්ශයෝ ද, යනාදී යම් පමණ වස්තු සමූහයක් වේ නම්, මේ සියල්ලම නොයෙක් ප්‍රත්‍යයන් නිසා හටගන්නාවූ ශක්ති සමූහයකගේ විකාර සවභාවයකි. ශීත - උෂ්ණාදි විරුද්ධ ප්‍රත්‍යයන් නිසා විපරීත භාවයට ප්‍රකටව පැමිණෙන්නාවූ මේ ශක්ති විශෙෂය හෙවත් ධර්ම සමූහය **රූප** නම් වේ. ද්‍රව්‍යයන් පිළිබඳ වූ

සූක්ෂ්ම වූ පරමාර්ථ රූපයෝ ඇස් කන්, නාසාදියෙන් දතහැකි නොවේ එය නුවණින් ම අවබොධ කටයුතු ඉතා සියුම් වූ ශක්ති විශෙෂයෝ යි.

මේ රූප ධර්මයෝ තෙමේම ප්‍රත්‍යයක් නොමැතිව පහළ නොවන්නාහ. **කර්ම, චිත්ත, ඍතු, ආහාර** යන සතර ප්‍රත්‍යයන්ගෙන්ම හටගන්නාහු වෙත්. එසේ හට-ගන්නාවූ රූප ධර්මයෝ සදහටම නොබිඳී පවත්නෝ ද නොවෙයි. රූපයට ද **උප්පාද, ඨිති, භඞ්ග** යන අවස්ථා තුනෙක් ඇත. රූපයාගේ පරමායුෂය චිත්තක්ෂණ සත-ළොසකි, හෙවත් ක්‍ෂුද්‍ර චිත්තක්ෂණ එක් පණසකි එයින් පළමුවෙනි ක්‍ෂුද්‍ර චිත්තක්ෂණය, රූපයාගේ **උප්පාදය** වෙයි. පනස්එක්වන ක්‍ෂුද්‍ර චිත්තක්ෂණය රූපයාගේ **භඞ්ග අවස්ථාව** යි. ඒ දෙක අතර රූපය පවත්නා ක්‍ෂුද්‍ර චිත්තක්ෂණ සතළිස් නවය (49), රූපයාගේ **ඨිති අවස්ථාව** වේ. යම් ප්‍රත්‍යයකින් යම් රූපයක් හටගන්නේ නම්, ඒ ප්‍රත්‍යය ඒ ආකාරයෙන්ම පවත්නාතාක් කල්, පළමු උපදවන ලද රූපයට සමාන වූ රූප සන්තතියක් හෙවත් රූප පරම්ප-රාවක් ඒ ප්‍රත්‍ය කරණකොටගෙන පහළ වන්නේය. යම් හෙයකින් ප්‍රත්‍ය වෙනස්වීනම් එයින් උපදවනු ලබන රූපයෝ ද වෙනස් වේ. බොහෝසෙයින් මේ වෙනස්වීම ඇතිවන්නේ ශීතොෂ්ණාදි විරුද්ධ ප්‍රත්‍යයන් කරණකොට ගෙණය. සමවූ ඍතු ගුණය පවත්නා කල්හි ඒ ඒ වස්තූන් එක් ආකාරයකටම පවත්නා බව ඇසට පෙනෙන්නේ, එම වස්තුවේ රූපයන් පහළ කළාවූ ප්‍රත්‍යය නොවෙනස්ව පවත්නා හෙයින් සමාන රූප පරම්පරාවක් ඇතිකරවන නිසාය. යම්හෙයකින් තෙජෝ ධාතුව අධික වූ ගින්න ඒ වස්තුවට ලංවූ කල්හි ඒ වස්තුවේ ආකාරය වෙනස්වී ඒ වස්තුව දැවී පිළිස්සී ගොස් අළු බවට පත්වන බව පෙනේ. ඍතු හෙතුවෙන් පළමු රූප පරම්පරාව වෙනස්කොට අන්‍ය ආකාරයෙන් රූප පහළ කළ බැවින් එසේ වන බව දතයුතුයි.

රූප සියල්ල විසි අටෙකි (28). එයින් සතරක් **මහා භූත රූපයෝය.** ඉතිරි සූවිසි (24) රූපයෝ මේ සතර මහා භූතයන් නිසා පවත්නා **උපාදාය රූපයෝ** යි.

මේ අටවිසි රූපයෝ එකොළොස් ආකාරයකින් සංග්‍රහ වේ. ඒ මෙසේ යි:—

| | | |
|---|---|---|
| **1. මහා භූත රූප** | **4** | **1. පඨවි ධාතුව**<br>**2. ආපො ධාතුව**<br>**3. තෙජො ධාතුව**<br>**4. වායො ධාතුව** |
| **2. ප්‍රසාද රූප** | **5** | **5. චක්ඛුප්‍රසාද රූපය**<br>**6. සොතප්‍රසාද රූපය**<br>**7. ඝාණප්‍රසාද රූපය**<br>**8. ජිව්හා ප්‍රසාද රූපය**<br>**9. කායප්‍රසාද රූපය** |
| **3. ගොචර රූප** | **4** | **10. රූප (වර්ණය)**<br>**11. ශබ්ද**<br>**12. ගන්ධ**<br>**13. රස**<br>**ඵොට්ඨබ්බය** (පඨවි, තෙජෝ, වායෝ යන ධාතු තුනය. මහා භූත රූපවලට ඇතුළත් වන හෙයින් මෙහිදී නැවත නොගැණේ) |
| **4. භාව රූප** | **2** | **14. ස්ත්‍රීභාව රූපය**<br>**15. පුරුෂභාව රූපය** |
| **5. හදය වත්ථු රූපය** | **1** | **16. හදය රූපය** |
| **6. ජීවිතෙන්ද්‍රිය** | **1** | **17. ජීවිත රූපය** |
| **7. කබලීකාරාහාරය** | **1** | **18. ආහාර රූපය** |
| **8. ආකාශ ධාතුව** | **1** | **19. පරිච්ඡේද රූපය** |

| | | | |
|---|---|---|---|
| 9. විඤ්ඤත්ති රූප | 2 | 20. | කායවිඤ්ඤත්ති රූපය |
| | | 21. | වචී විඤ්ඤත්ති රූපය |
| 10. විකාර රූප | 3 | 22. | ලහුතා රූපය |
| | | 23. | මුදුතා රූපය |
| | | 24 | කම්මඤ්ඤතා රූපය |
| 11. ලක්ෂණ රූප | 4 | 25. | උපචය රූපය |
| | | 26. | සන්තති රූපය |
| | | 27. | ජරතා රූපය |
| | | 28. | අනිච්චතා රූපය |

## භූත රූප

**පඨවි ධාතු, ආපො ධාතු, තෙජො ධාතු, වායො ධාතු** යයි මහා භූත රූප සතරෙකි.

යොදුන් ගණන් දිග පුළුල ආනන්‍දාදී මත්ස්‍යයෝද, රාහු අසුරාදී අසුරයෝද, මහාකාල, නන්‍දෝපනන්‍දාදී නාගයෝද යන සවිඤ්ඤාණකවූ ද, මහාමේරු පර්වත, මහාසමුද්‍ර, මහා පෘථිවි ආදී අවිඤ්ඤාණක වූ ද භූතයන් මහත්ව පහළ කරවන හෙයින් මේ ධාතු සතරට මහා භූත ය යි ව්‍යවහාර කරණු ලැබේ.

තවද ඉන්‍ද්‍රජාලිකයන්ට මහා භූත ය යි කියති. ඔව්හු, රන් රිදී නොවන්නාවූ වස්තු රන් රිදී කොට පෙන්වත්. එසේම මේ මහා භූතයෝද එක් එක් ආකාරයකට මිශ්‍ර වී රන් රිදී මුතු මැණික් ආදී නොයෙක් වර්ණයට පැමිණ මනුෂ්‍යාදීන්ගේ ඉන්‍ද්‍රියයන් මුළාකරවති. එහෙයින්ද පඨවි ආදී ධාතු සතරට මහා භූත යයි කියති.

තවද, හිමාල වනාදියෙහි වාසය කරන්නාවූ චණ්ඩක යක්ෂණීන්ටද, භූතය යි කියති. ඒ යක්ෂණීහු පුරුෂයන් දුටුකල ලක්ෂණවූ සොළොස් හැවිරිදි වයස්වූ ස්ත්‍රී රූප මවා ඒ පුරුෂයන් පොළඹවා, කැමැති ස්ථානයකට ගෙන ගොස් මස්

ලේ අනුභව කරති එසේම මේ සතර මහා භූතයෝ තුමූ ස්ත්‍රීන්ගේ සිත් ගන්නා පුරුෂ රූපයන්ද, පුරුෂයන්ගේ සිත් ගන්නා ස්ත්‍රී රූපද යනාදිය මවා මහත්වූ විපතට පමුණුවන්නාහු වෙති. එහෙයින්ද මේ ධාතු සතරට මහා භූතය යි කියනු ලැබේ.

තවද මේ භූතයෝ නොතිල් පැහැය තිල්පැහැය මෙන්ද, රතු නොවූ දෙය රතු වශයෙන්ද යනාදි විකාර ස්වභාවයන් දක්වති.

තවද කෑම් බීම් ඇඳීම් පැළඳීම් ආදි මහත්වූ ප්‍රත්‍යයෙන් පරිහරණය කටයුතු බැවින්ද මහාභූත යයි කියනු ලැබේ.

තවද උපාදින්න වූ ද, අනුපාදින්නවූ ද සියලු මහා භූතයෝ විකාර ස්වභාවයට පත්වන බැවින්ද මහාභූත නම් වේ.

තවද මහත්වූ ව්‍යායාමයෙන් පරිග්‍රහණය කළයුතු හෙයින්ද මහා භූත යයි කියනු ලැබේ.

## පඨවි ධාතුව

යම් දෙයක සාකීශ හෙවත් කැකුළු බවෙක්, තද බවෙක්, රළු බවෙක් ඇත්තේද, සහජාත ධර්මයන්ගේ පිහිටීමට උපකාරවේද, ඒ ස්වභාවයට පඨවි යයි කියති. තමාගේ ස්වභාවය දරන, උසුලන හෙයින්ද, මූලස්වභාවය වූ හෙයින් ආත්මයෙන් ශූන්‍යවූ, සත්ත්වයෙක් නොවන හෙයින්ද ධාතු නම් වේ.

රූප කලාප ඝණව පිහිටි කල්හි සාකීශ ගතියද, තද ගතියද, බර බවද ප්‍රකට වේ. රූප කලාප ඝණ නොවී ආකාශ ධාතුව අධිකව පවත්නා කල්හි, මොළොක් බවද, සිනිඳු බවද, සැහැල්ලු බවද දැනෙන්නේය මේ තද බවත්, මොළොක් බවත්, බර බවත්, සැහැල්ලු බවත් පඨවි ධාතුමය.

ව්‍යවහාරයෙහි **පඨවිය** සතරාකාර වේ. එනම්:-

1. **සසම්භාර පඨවි.** වර්ණාදි සෙසු රූපයන් සමග මිශ්‍රවූ ගස් ගල් ආදියට අධාරවූ මේ මහා පොළොව ආදියට **සසම්භාර පඨවි** ය යි කියති.

2. **ආරම්මණ පඨවි.** භාවනාවට අරමුණුවන්නාවූ පඨවි **කසිණාදිය** **ආරම්මණ පඨවි** නම් වේ.

3. **සම්මති පඨවි.** පඨවි කසිණය වඩා බඹලොව පහළවූවන්හට පඨවි දෙවියෝ ය යි සම්මතවූ හෙයින් ඔවුහු **සම්මත පඨවි** නම් වේ.

4. **ලක්ඛණ පඨවි.** අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ, කර්මජවූ හෝ කර්මජ නොවූ හෝ, යම් කර්කශ බවෙක්, තද බවෙක්, රළු බවෙක්, වේද එය පඨවිධාතු හෙවත් **ලක්ඛණ පඨවි** නම් වේ.

පඨවි ධාතුහුගේ **ලක්ෂණය** කර්කශ බව ය. සහජාත රූප පිහිටන බව එහි **කෘත්‍ය වේ.**

## ආපෝ ධාතු

රූපයන් ගේ වෙන් නොවීම හෝ සම්ප්‍රකාරයෙන් බැඳීම හෝ කරවන්නාවූ සවභාවයද, ඇලෙන, වැගිරෙන, පැතිරෙන, සවභාවයද, **ආපොධාතු** නම්. සත්ත්ව, ජීව නොවූ, සෑම දෙයකම ඇත්තාවූද ද්‍රව සවභාවය හෙවත් ස්නෙහත්වය. **ආපොධාතුව යි.**

**ආපෝ** සතරාකාර වේ.

1. **සසම්භාර ආප.** නොයෙක් වර්ණාදියෙන් මිශ්‍රවූ, ගංගා, සමුද්‍රාදියෙහි ජලයට **සසම්භාර ආප** යයි කියති.

2. **ආරම්මණ ආප.** භාවනාවට අරමුණු වන්නාවූ ආපො කසිණ නිමිත්ත, **ආරම්මණ ආප** නම්.

3. **සම්මත ආප.** ආපෝ කසිණය වඩා බඹලොව උපන්න වුන්ට සම්මතයෙන් **ආපො දෙව** යයි කියති.

4. **ලක්‍ෂණ ආප.** යම් ආප් ගතියෙක්, ස්නෙහ ගතියක්, රූපයන්ගේ බන්ධන ස්වභාවයක් වේද, එය **ලක්‍ෂණ ආප** නම්.

**ආපොධාතුහුගේ ලක්‍ෂණය** ද්‍රව බව හෝ වැගිරෙන බව ය. **කෘත්‍යය** සහජාත රූපයන් බැඳීමය, විසිර යා නොදීමය. ආපෝ ධාතුව ස්පර්ශකළ නොහැකි වේ ජලය, අතට දැනෙන්නේ එහි ඇති **පඨවි තෙජො වායෝ ධාතු** නිසාමය.

## තෙජො ධාතු

උණුසුම් ස්වභාවය, ශීතල ස්වභාවය, දිලිසෙන ස්වභාවය, තියුණු ගතිය, පරිපාචකත්වය, **තෙජො ධාතු** නම්. තෙජෝ ධාතුව සහජාත හෙවත් එවකට හටගත් ඉතිරි ධාතු පාලනය කරයි. පඨවි ධාතුහුගේ තද බව අඩු වැඩි කරන්නේත්, ආපෝ ධාතුහුගේ වැගිරෙන ස්වභාවය අඩු වැඩි කරන්නේත්, වායෝ ධාතුහුගේ වේගය අඩු වැඩි කරන්නේත් **තෙජො ධාතුම ය.** අළුත් අළුත් රූප කාලප ඇතිකිරීමෙන් ගස් වැල් ආදී වස්තූන්ද, සත්ත්ව ශරීරද වර්ධනය කොට ශක්ති සම්පන්න කරන්නේත් තෙජෝ ධාතුවයි. එහි දිරවීමත්, දුබල කිරීමත් නැසීමත් ඇතිවන්නේ තෙජෝ ධාතුව නිසාම ය. තවද, **තෙජොධාතුව** යම් යම් වස්තූන්ගේ පැහැය හෙවත් වර්ණය අඩු වැඩි කිරීමද, වෙනස් කිරීමද ඇති කරයි. සෑම රූප කලාපයකම තෙජෝ ධාතු ඇති හෙයින් ඒවායින් අලුත් අලුත් රූප කලාප උපදවනු ලැබේ. සත්ත්ව ශරීරය ක්‍රමයෙන් වැඩී ශක්තිමත් වන්නේත්, එයට පසුව ක්‍රමයෙන් දුබල වන්නේත් තෙජෝ ධාතුහුගේ පැසවීමේ ස්වභාවය කාරණ කොට ගෙණය.

**තෙජය** සතරාකාර වේ.

1. **සසම්භාර තෙජය.** ගින්න **සසම්භාර තෙජයයි.**

2. **ආරම්මණ තේජය.** භාවනා අරමුණක් වූ **තේජෝ කසිණය ආරම්මණ තේජය** නම් වේ.

3. **සම්මත තේජය.** තේජෝ කසිණය වඩා බඹලොව උපන්නවුන්හට සම්මතයෙන් තේජෝ දෙවියයි කියති.

4. **ලක්ඛණ තේජය.** අධ්‍යාත්මිකවූ හෝ, බාහිරවූ හෝ, කර්මජවූ හෝ **කර්මජ** නොවූ හෝ, යම් තේජෝ ගතියක්, උෂ්ණ ගතියක් වේ නම්, එය තේජෝ ධාතු නම්වූ **ලක්ඛණ තේජෝ** නම්.

**තේජෝ ධාතුවේ ලක්ෂණය** උෂ්ණත්වය යි. එහි **කෘත්‍යය** පරිපාචකත්වය හෙවත් පැසවීමයි. ශීතෝෂ්ණ ස්වභාවයම **තේජෝ ධාතුව** වේ.

**වායෝ ධාතු**

පිරවීම, පිම්බීම, සෙලවීම කරවන ස්වභාවය **වායෝ ධාතු** නම්. ආපෝ ධාතුව හා බැඳී එහි ගැලී සිට පඨවි ධාතුවට හැකිලෙන්නට ඉඩ නොදී පිම්බීමෙන් හා රුකුල් දීමෙන් රඳවාගැනීම වායෝ ධාතුව විසින් කරනු ලබන්නකි. මේ වායෝ ධාතුවේ සෙලවන ලක්ෂණයක්ද තිබේ. වායෝ ධාතුව අධිකවූ සුලඟ සැහැල්ලු බැවින් නිතරම සෙලවෙයි.

**වායුවද** සතරාකාර වේ:-

1. **සසම්භාර වායුව.** එනම් වාතය යි.

2. **ආරම්මණ වායුව.** භාවනා අරමුණක් වශයෙන් ගන්නාවූ වායෝ කසිණය යි.

3. **සම්මත වායුව.** වායු කසිණය වඩා බඹලොව උපන් පුද්ගලයන්ට සම්මතයෙන් වායුදෙව යයි කියති.

**4 ලක්‍ෂණ වායුව.** යම් වායු ගතියක්, පිපෙන බවෙක්වේ නම් අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ උපාදින්නවූ හෝ අනුපාදින්නවූ හෝ යම් ධාතුවෙක් වේ නම් එය වායෝධාතුව හෙවත් ලක්‍ෂණ වායුව නම්.

වායුවේ ලක්‍ෂණය විත්ථම්භනයයි එහි ඝාතනය සැලෙන බවයි සහජාත රූප නොවැටෙන සේ උසුලා සිටින්නේ වායෝ ධාතුව බව දත යුතුයි.

මේ මහාභූත හෙවත් ශක්තීන් සතර දෙනා තනි තනිවමම නොව එකටම බැඳී එක් කලාපයකටම ඇතුළත්ව, එකවර ඉපිද, ඔවුනොවුන්ට උපකාර වෙමින්, චිත්තක්ෂණ සතළොසක්ම ආයුවළඳා එකවරම නිරුද්ධ වන්නාහ.

එක් මහා භූතයෙක් ඉතිරි භූත තුනටද, ඒ තුන ඉතිරි එකටද, දෙකක් ඉතිරි දෙකටද, ඉතිරි දෙක අනිත් දෙකටද නිශ්‍රය වෙමින් පවතී.

මෙසේ එකිනෙකට බැඳී ගිලගෙන, වැළඳගෙන පහළ වන්නාවූ රූප කලාපයන් මහත් රාශියක් එකතුවීමෙන් පරමාණු සෑදේ එවැනි පරමාණු බොහෝ ගණනක් එක්වීමෙන් ගල්, වැලි, පස්, දිය, සුළං ආදිය හටගනී. මේ රූප කලාපයන්ගේ සංයෝගයේ හැටියට එයින් සෑදෙන ද්‍රව්‍යයන්ද වෙනස් වන්නේය.

මේ ධාතු සතර සෑම දෙයකම ඇත්තේ එකම ප්‍රමාණය කටම නොවේ. **පඨවි ධාතුව** අධික වූ කල්හි තද ගතිය අධික වේ. **ආපෝ ධාතුව** අධික වූ කල්හි දිය ගතිය අධික වේ. **තේජෝ ධාතුව** අධික වූ කල්හි උෂ්ණත්වය අධික වේ. **වායෝ ධාතුව** අධිකවූ කල්හි සැලෙන සවභාවය අධික වේ. එක් කලාපයක එක් ධාතුවක් උත්සන්නවී ඉතිරි ධාතු තුන හීන විය හැකියි. ධාතු දෙකක් උත්සන්නවී ඉතිරි ධාතු දෙක හීන විය හැකියි. ධාතු තුනක් උත්-සන්නවී ඉතිරි ධාතුව හීන විය හැකියි. මේ ආදී නොයෙක්

ආකාරයෙන් ධාතු සංයෝගය ඇති කල්හි එයින් හටගන්නා ද්‍රව්‍යයන්ගේ ආකාරයද, වර්ණයද, සටහනද, රසයද, කෘත්‍යයන්ද වෙනස්වේ.

## ප්‍රසාද රූප

කර්මයෙන් ජනිතවූ හෙවත් යම් කුසලාකුසල ජනක කර්මයක් නිසා හටගන්නාවූ රූප කලාපයකට අයත් රූපයන්ගේ ඔපගතියක් හෙවත් ප්‍රසන්න භාවයක් ඇති කරවන යම් රූප ධර්මයක් වේනම්, එය **ප්‍රසාද රූප** නම්. ධාතූන්ගේ ඔපය ඇතිකර වීමට සෘතු චිත්ත, ආහාර යන ප්‍රත්‍යයන්ට ශක්තියක් නැත. කර්මයෙන්ම හටගත් රූපයන් සමගම, එම රූප කලාපයටම ඇතුළත්ව උපදිමින්, එම රූපයන්ගේ විශෙෂ ඔප ගතියක් ඇති කිරීමේ ශක්තිය කර්මයෙන්ම ඉපිද විය යුතුයි ශරීරයෙහි ඒ ඒ තන්හි කර්ම ශක්තියෙන් හටගන්නාවූ **ප්‍රසාද රූපයෝ** පස් දෙනෙකි. එනම්:-

1. **චක්ඛු ප්‍රසාද රූපය**
2. **සොත ප්‍රසාද රූපය**
3. **ඝාණ ප්‍රසාද රූපය**
4. **ජිව්හා ප්‍රසාද රූපය**
5. **කාය ප්‍රසාද රූපය**

මේ ප්‍රසාද රූප, තමා හා එක්ව හටගත් හෙවත් සහජාත රූපයන්ට **ඉන්ද්‍රිය** හෙවත් අධිපති භාවය දක්වන හෙයින් මේ පසට **ඉන්ද්‍රියෝ** යයි කියති.

## චක්ඛු ප්‍රසාද රූපය

දැකීමට උපකාර වන්නේ **චක්ඛුවයි.** මේ දැකීම නුවණින්ම දක්නා කල්හි එයට **නුවණැසින්** හෙවත් ප්‍රඥාචක්ෂුෂයෙන් දකී යයි කියති. මේ ප්‍රඥාචක්ෂුව **බුද්ධ චක්ඛු, සමන්ත චක්ඛු, ඤාණ චක්ඛු, දිබ්බ චක්ඛු, ධම්ම චක්ඛු** යයි පඤ්චවිධ වේ. රූපයන් දැකීමට උපකාර

වන්නාවූ මාංශ චක්ෂුවක් හෙවත් මසැසක්ද ඇත්තේය. ඒ මාංශ චක්ෂුවද **සසම්භාර චක්ඛු, ප්‍රසාද චක්ඛු** යයි විවිධ වේ.

ඇස් ගුහාගෙහි පිහිටි මේ මාංස **පිණ්ඩය** යයි සලකන **සසම්භාර චක්ඛුව** සංක්ෂෙපයෙන් තුදුස් සම්භාරයකින් යුක්ත වේ. ඒ තුදුස නම්:-

| | | | |
|---|---|---|---|
| **1. පඨවි** | **5. වණ්ණ** | **9. සම්භව** | **13. කාය ප්‍රසාද** |
| **2. ආපො** | **6. ගන්ධ** | **10. සණ්ඨාන** | **14. චක්ඛු ප්‍රසාද** |
| **3. තෙජො** | **7. රස** | **11. ජීවිත** | |
| **4. වායො** | **8. ඕජා** | **12. භාව** | |

සැකෙවින් තුදුසක්වූ මේ සම්භාරයෝ විස්තර වශයෙන් සුසාළිසෙකි. ඒ මෙසේයි.

**කම්ම, චිත්ත, ඍතු, ආහාර,** යන සතර ආකාරයෙන් ලැබෙන **මහා භූත සතරක්** **වණ්ණ, ගන්ධ, රස, ඕජා, සම්භව සණ්ඨාන** යන දස දෙනාගේ වශයෙන් සතළිසක් හා කම්ජවූ **ජීවිත, භාව, කාය ප්‍රසාද, චක්ෂු ප්‍රසාද,** යන සතරත් සමග සුසාළිස් සම්භාරයෙක් වෙති.

මේ සසම්භාර චක්ඛුව ඇසුරු කොට ගෙණ පවත්නා දෘෂ්ටි මණ්ඩලයෙහි සිව් සතකින් යුක්තවූ එක්තරා කුඩා ප්‍රදෙශයෙක්හි කර්මයෙන් හටගත්තාවූ රූප කලාපයන්ට ඇතුළත්ව, ඉදිරියෙහි ඇති රූපයන්ගේ ඡායාව වැද ගැනීමට සමත්වූ මහා භූත රූපයන්ගේ යම් ඔපයක් වේද, එයට **චක්ඛු ප්‍රසාදය** යයි කියනු ලැබේ. චක්ෂු ප්‍රසාද සහිතවූ රූප කලාප සමූහය ප්‍රමාණයෙන් උකුණු හිසකට සමානකර තිබේ. මතුමත්තෙහි තබන ලද පුළුන් පෙද සතෙක්හි වක් කරණ ලද තෙල් බිඳක් සේ, දෘෂ්ටි මණ්ඩලයෙහි පිහිටි මේ කුඩා ප්‍රදෙශයෙහි ඇත්තාවූ, පටල සතක පැතිරී පවත්නාවූ මේ චක්ඛු ප්‍රසාද රූපයෝ, **දැරීමය, බැඳීමය, මිහි කිරීමය,**

**සැළිමය** යන සතර කෘත්‍යයක් ඇති, එහිම පැතිර සිටි **පඨවි, ආපො, තෙජො, වායො** යන සතර මහා භූතයන් විසින් උවටැන් කරන ලදුව, **වණ්ණ, ගන්ධ, රස, ඕජා** වන් විසින් පිරිවරණ ලදුව, **සෘතු, චිත්ත, ආහාරයන්** විසින් උපසථම්භ කරණ ලදුව, **ජීවිතෙන්ද්‍රිය** විසින් රක්නා ලදුව, **චක්ඛු විඥ්ඥාණ** සිත් දෙකට වස්තු භාවයද, **ආවජ්ජන සම්පටිච්ඡන, සන්තීරණ, ජවන, තදාලම්බණ**යන්ට වාර භාවයද සිද්ධ කරමින්ම හට ගන්නේය.

කර්මජවූ **චක්ඛු ප්‍රසාද රූපය** තනිවම පහළ නොවන්නේය. **පඨවි, ආපො, තෙජො, වායො,** යන මහා භූත රූප සතරක්, **වණ්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතෙන්ද්‍රිය** යන උපාදාය රූප පසක් යන රූප නවයක් සමග එකම කලාපයකට ඇතුළත්වම උපදී. මෙයට **චක්ඛු දසක කලාපය** යයි කියති.

මේ රූපයාගේ ආයුෂයද **චිත්තක්ෂණ** සතොළොසකි. චක්ඛු ප්‍රසාද රූපය, පළමුවරට ශරීරයෙහි පහළවූ තැන් සිට සෑම සිතකම උප්පාද, ඨිති, භඞ්ග යන තුන් අවස්ථාවන්හිම චක්ඛු දසක රූප කලාපයට ඇතුළත්ව පහළ වන්නේය. එක් සිතක උප්පාදක්ෂණයේදී පහළවූ රූප කලාපය එයට සත ළොස්වන චිත්තයාගේ භඞ්ගක්ෂණය හා සමගම නිරුද්ධ වේ. ඒ රූප කලාපය නිරුද්ධ වන කල්හි එම රූප කලාපයත් සමග චක්ඛු දසක කලාපයෝ එක් පණසක් (51) පහළවී ඇත්තේය. සියලුම කර්මජ රූපයෝ චුති චිත්තයාගේ භඞ්ගක්ෂණයේදීම නිරුද්ධවන බැවින් චුතියට චිත්තක්ෂණ සතොළොසක් තිබියදී අවසාන කර්මජ රූප කලාපයාගේ උප්පාදය වන බව දත යුතුයි.

මේ **චක්ඛු ප්‍රසාද රූපය** රූපාලම්බණයාගේ හෙවත් වර්ණයාගේ ගැටීමට සුදුසුවන සේ, රූපයන්ගේ ප්‍රසාදය හෝ රූප දැකීමෙහි කැමැත්ත මුල්කොට ඇති තෘෂ්ණාවෙන් යුත් කර්මයාගේ ශක්තියෙන් නිපන් මහා භූතයන්ගේ ප්‍රසාදය

**ලක්ෂණ** කොට ඇත්තේය. රූපාලම්බණයෙහි විඤ්ඤාණය ඇදගැනීම එහි **කෘත්‍යය** හෙවත් **රසය** වේ. චක්ඛුවිඤ්ඤාණයට ආධාර භාවය එහි **වැටහෙන ආකාරය** හෙවත් **පච්චුපට්ඨානය** වේ. දක්නා කැමැත්ත නිදාන කොට ඇති කර්මජ භූත ආසන්න කාරණය හෙවත් **පදට්ඨානය** වෙයි.

## ශ්‍රොතප්‍රසාද රූපය

ශබ්දය අසන්නේ හෝ මෙයින් ශබ්දය අසන්නුයි යන අර්ථයෙන් **ශ්‍රොත** නම් වේ. මේ **ශ්‍රොතයද** ද **සසම්භාර ශ්‍රොතය, පසාද ශ්‍රොතය** යයි දෙවැදෑරුම් වේ. **සසම්භාර සොතය** නම් **කන** යි. සසම්භාර සොත බිලය හෙවත් කන් සිදුර තුළ තඹවන් රෝමයෙන් ගැවසීගත් ඇඟිලි මුදුවකට බඳු සටහන් ඇති පෙදෙසෙහි සතර මහා භූතයන් විසින් උවටැන් කරණ ලදුව, සෘතු චිත්ත ආහාරයන් විසින් උපස්ථම්භ කරණ ලදුව, ජීවිතෙන්ද්‍රිය විසින් පාලනය කරන ලදුව, වර්ණ ගන්ධාදීන් විසින් පිරිවරණ ලදුව, සොත විඤ්ඤාණාදි සිත්වලට වස්තු හා ද්වාරභාවය සිද්ධ කරන්නාවූ කර්මජ වූ සතර මහා භූතයන්ගේ ඕපය හෙවත් ප්‍රසාදය, සොතප්‍රසාද රූපය නම් වේ.

ශබ්දායතනය හෙවත් ශබ්ද රූපයාගේ ගැටීමට සුදුසු වූ මහා භූතයන්ගේ ප්‍රසාදය හෝ ශබ්ද ඇසීමේ කැමැත්ත නිදානකොට පැවති කර්මජ භූතයන්ගේ ප්‍රසාදය **ලක්ෂණ** කොට ඇත්තේය. ශබ්දාලම්බනයෙහි විඤ්ඤාණය ඇදගැනීම හෙවත් ශබ්ද විඳගැනීම එහි **කෘත්‍යය** හෙවත් **රසය** වේ. සොතවිඤ්ඤාණයට ආධාර භාවය එහි **වැටහෙන ආකාරය** හෙවත් **පච්චුපට්ඨානය** වේ. ශබ්ද අසනු කැමැත්ත නිදාන කොට ඇති කර්මජ භූත එහි **ආසන්න කාරණය** හෙවත් **පදට්ඨානය** නම් වේ.

මේ සොතප්‍රසාද රූපයෝ ද තනිවම නූපදී චක්ඛුප්‍රසාද රූපය මෙන් කර්මජ වූ පඨවි, ආපො, තෙජෝ, වායො වර්ණ ගන්ධ, රස, ඕජා, ජීවිතෙන්ද්‍රිය යන රූප නවයන් සමග සොත දසක කලාපයක් වශයෙන්ම උපදී. සොත දසක කලාප

පළමු වරට ශරීරයෙහි පහළවූ තැන් සිට සෑම කුඩා චිත්තක්ෂ-**ණයක්** පාසාම, මේ සොත දසක රූප **කලාපයෝ** හටගෙන චිත්තක්ෂණ සතළොසකින් නිරුඬ වෙති. පළමු කී පරිදි සොත දසක **කලාපයෝ** ද, **එක් පණසක්** සෑම කල්හිම ශරීරයෙහි ඇති බව සැළකිය යුතුයි. **එසින් එක් කලාපයක්** උප්පාද අවස්ථාවේද එකක් භඞ්ග අවස්ථාවේද, ඒ අතරවූ සතළිස් නවය ඨිතියෙහිද පවතී.

## ඝාණ ප්‍රසාද රූපය

ගන්ධය ආඝ්‍රාණය කරන්නේ හෝ මෙයින් ගන්ධය ආඝ්‍රාණය කරන්නුයි යන අර්ථයෙන් **ඝාණ** නම් වේ.

මේ **ඝාණය ද සසම්භාර ඝාණය, ප්‍රසාද ඝාණය** යයි විවිධ වේ. **සසම්භාර ඝාණය** නම් නාසය යි. සසම්භාර ඝාණය හෙවත් නාසය තුළ **එළුකුරයක** සටහන් ඇති පෙදෙසෙහි පඨවි ආදි සතර මහා භූතයන් විසින් උපට්ඨම්භ කරන ලදුව, සෘතු, චිත්ත, ආහාරයන් විසින් **උපස්ථම්භ** කරණ ලදුව, ජීවිතෙන්ද්‍රිය විසින් රක්ෂා කරණ ලදුව වර්ණ ගන්ධාදීන් විසින් **පිරිවරණ** ලදුව, ඝාණ විඥ්ඥාණාදි සිත්වලට වස්තු හා ද්වාර භාවය **සිද්ධකරන්නාවූ කර්මජවූ** සතර මහා භූතයන්ගේ ඕපය හෙවත් ප්‍රසාදය **ඝාණ ප්‍රසාද රූප** නම් වේ.

ගන්ධාලම්බනයාගේ ගැටීමට හෙවත් ගන්ධ ස්පර්ශයට සුදුසු මහා භූතයන්ගේ ප්‍රසාදය හෝ ගන්ධාඝ්‍රාණය කිරීමේ කැමැත්ත නිදාන කොට ඇති කර්මජ භූතයන්ගේ ප්‍රසාදය **ලක්ෂණ** කොට ඇත්තේය. ගන්ධාලම්බණයෙහි විඥ්ඥාණය ඇදගැනීම නැතහොත් ගඳ සුවඳ විඳ ගැනීම එහි **කෘත්‍යය** හෙවත් **රසය** වේ. ඝාණ විඥ්ඥාණයට ආධාර භාවය එහි **වැටහෙන ආකාරය** හෙවත් **පච්චුපට්ඨානය** වේ. ගන්ධාඝ්‍රාණය කැමැත්ත නිදාන කොට ඇති කර්මජ භූත එහි **අසන්න කාරණය** හෙවත් **පදට්ඨානය** වේ.

මේ ඝ්‍රාණ ප්‍රසාද රූපයෝ ද පඨවි, ආපො, තෙජෝ, වායෝ වණ්ණ, ගන්ධ, රස ඕජා, ජීවිතෙන්ද්‍රිය යන **කර්මජ** රූප නවයක් සමග ඝ්‍රාණ දසක කලාපයක් වශයෙන්ම පවත්නෝය.

## ජිව්හා ප්‍රසාදය

ජීවිතය කැඳවන්නේ යන අර්ථයෙන් **ජිව්හා** නම් වේ. මෙයද **සසම්භාර ජිව්හා** ය, **ප්‍රසාද ජිව්හා** ය යි ද්විවිධ වේ.

**සසම්භාර ජිව්හා** නම් දිවයි. සසම්භාර ජිව්හය හෙවත් දිව මැද මතුපිට උපුල්පතෙක අගට බඳු සටහනක් ඇති පෙදෙසෙහි පඨවි ආදි සතර මහා භූතයන් විසින් උපවටැන් කරණ ලදුව, ඍතු චිත්ත ආහාරයන් විසින් උපස්ථම්භ කරණ ලදුව, ජීවිතෙන්ද්‍රිය විසින් රක්‍ෂා කරණ ලදුව, වණ්ණ ගන්ධාදීන් විසින් පිරිවරණ ලදුව, ජිව්හා විඤ්ඤාණාදි සිත්වලට වස්තු සහ ද්වාර භාවය සිද්ධකරන්නාවූ **කර්මජ**වූ සතර මහා භූතයන්ගේ ඕජය හෙවත් ප්‍රසාදය, **ජිව්හා ප්‍රසාද රූපය** නම් වේ.

රසාලම්බණයෙහි ගැටීමට හෙවත් රසාස්වාදයට සුදුසුවූ කර්මයෙන් නිපන් මහා භූතයන්ගේ ප්‍රසාදය **ලක්‍ෂණකොට** ඇත්තේය. රසාලම්බණයෙහි විඤ්ඤාණය ඇදගැනීම හෙවත් රස විඳ ගැනීම එහි **කෘත්‍යය** හෙවත් **රසය** වේ. ජිව්හා විඤ්ඤාණයට ආධාරවීම **වැටහෙන ආකාරය** හෙවත් **පච්චුපට්ඨානය** වේ. රසාස්වාදන කැමැත්ත නිදානකොට ඇති කර්මජ භූත එහි **ආසන්න කාරණය** හෙවත් **පදට්ඨානය**වේ.

ආහාර පානාදියෙහි රසය එහි ස්පර්ශවූ කල්හි ජිව්හා විඤ්ඤාණය උපදී. මෙයද අතීතූත් ප්‍රසාද රූප මෙන්, ජිව්හා දසක කලාපයට ඇතුළත්වම හටගනී.

## කාය ප්‍රසාද රූපය

ලාමකවූ කෙස් ලොම් නිය දත් ආදී ශරීරාවයවයන්ට හෝ පාප ධර්මයන්ට උත්පත්ති ස්ථාන වන අර්ථයෙන් **කාය** නම් වේ. මේ **කායද සසම්භාර කාය, ප්‍රසාද කාය** යයි ද්විවිධ වේ.

**සසම්භාර කාය** නම් ශරීරයයි. සසම්භාර කයෙහි හෙවත් ශරීරයෙහි කර්මජ තෙජොධාතු නොහොත් ජඨරාග්නිය පවත්නා ස්ථානය හා කෙස් ලොම් නිය අග සහ වියලි සමද හැර, සෙසු සියළුම ශරීරයෙහි කපු පුළුන් පෙදක වත්කළ තලතෙලක් සේ පැතිර පවත්නාවූද, පඨවි ආදි සතර මහා භූතයන් විසින් උවටැන් කරණ ලදුව, ඍතු චිත්ත ආහාරයන් විසින් උපස්ථම්භ කරණ ලදුව, ජීවිතෙන්‍ද්‍රිය විසින් රක්‍ෂාකරණ ලදුව, වර්‍ණගන්‍ධාදීන් විසින් පිරිවරණ ලදුව කාය විඥානාදී සිත්වලට වස්තු හා ද්වාර භාවය සිදු කරන්නාවූ, කර්මජවූ සතර මහා භූතයන්ගේ ඕපය හෙවත් ප්‍රසාදය **කාය ප්‍රසාද රූපය** නම් වේ.

ස්පර්ශාලම්බණයාගේ හෙවත් පඨවි, තෙජො, වායො යන මහා භූතත්‍රයාගේ ගැටීමට යොග්‍යවූ මහා භූතයන්ගේ පැහැදීම හෝ ස්පර්ශ තෘෂ්ණාව නිදාන කොට ඇති කර්මජ භූතයන්ගේ ප්‍රසාදය **ලක්‍ෂණ** කොට ඇත්තේය. ස්පර්ශාලම්බණයෙහි විඥානය ඇදගැනීම හෙවත් පහස විඳ ගැනීම එහි **කෘත්‍යය** හෙවත් **රසය** වේ. කාය විඥානයට ආධාර භාවය එහි **වැටහෙන ආකාරය** හෙවත් **පච්චුපට්ඨානය**වේ. ස්පර්ශ තෘෂ්ණාවෙන් යුත් කර්මයෙන් නිපන් මහා භූත **ආසන්න කාරණය** හෙවත් පදට්ඨානය වේ.

මෙයද අතිකුත් ප්‍රසාද රූප මෙන් කාය දසක කලාපයට ඇතුළත්වම පහළවේ.

## ගොචර රූප හෙවත් විෂය රූප

**චක්‍ඛු විඥාණ, සොත විඥාණ, ඝාණ විඥාණ ජිව්හා විඥාණ, කාය විඥාණ** යන පඤ්ච විඥාණ යන්ට විෂය වන හෙවත් ගොචර වන **රූප, ශබ්ද, ගන්‍ධ, රස පොට්ඨබ්බ** යන රූපයෝ **ගොචර රූප** හෙවත් **විෂය රූප** නම් වේ.

## රූපය

චක්ඛුර්විඤ්ඤාණයට ගොචර වන හෙවත් ඇසින් දක්ක යුතුවූ සතර මහා භූතයන් නිසා පවත්නාවූ, උපාදාය රූපයක්වූ, නීල, පීත, ලෝහිත, ඕදාත ආදි වශයෙන් ප්‍රභෙද ඇත්තාවූ **වර්ණය** හෙවත් පැහැය **රූපය** නම් වේ.

රූපාලම්බණය චක්ඛුප්‍රසාද රූපයෙහි ගැටීම **ලක්ෂණ** කොට ඇත්තේය. චක්ඛුවිඤ්ඤාණයට අරමුණුවීම නොහොත් ආලම්බණවීමේ ගුණය **කෘත්‍ය** කොට ඇත්තේය. චක්ඛු විඤ්ඤාණයට ගොචර භාවයෙන් **වැටහෙන ස්වභාවය** ඇත්තේය. සතර මහා භූත **ආසන්න කාරණය** කොට ඇත්තේය.

පඨවි, ආපො, තෙජෝ, වායො යන සතරමහා භූතයෝ එකිනෙකට බැඳී රූප කලාපයක් වශයෙන් පහළවන සෑම කල්හිම, ඒ මහා භූතයන්ගේම එක්තරා වර්ණයක් හෙවත් පැහැයක්ද, ඒ සමගම, එම කලාපයටම ඇතුළත්ව පහළ වන්නේය. එයට **වර්ණ ධාතුව** යයි කියනු ලැබේ. මෙසේ පහළවන්නාවූ වර්ණ රූපයෝ එකිනෙකට වෙනස් වේ. සංයෝග වන්නාවූ භූතරූපයන්ගේ වෙනස් බව කරණකොට ගෙන වර්ණයෝද වෙනස් වන්නාහ. සත්‍ය වශයෙන් වර්ණ ධාතුවය යි කියනුයේ එක් එක් රූප කලාපයකටම අයත් ධාතුන්ගේ වර්ණයට ය. ඇසට හමුවන්නා වූ වර්ණය වනාහි නොයෙක් දහස් ගණන් රූප කලාපයන්ට ඇතුළත්වූ නොයෙක් දහස් ගණන් වර්ණයන්ගේ මිශ්‍රණයක් මිස, සත්‍ය වශයෙන් වෙන් වෙන්ව පහළවූ වර්ණ ධාතු නොවෙති.

ඇතැම් වර්ණ ධාතු ඉතා දුබලය. ඇතැම් වර්ණයෝ ඉතා ප්‍රකටය. දුබලවූ වර්ණ ධාතු ඇති රූප කලාපයන්ගෙන් සෑදුනු ද්‍රව්‍යයන් ඇසටද නොපෙනේ. සුළඟෙහිද වර්ණයක් ඇත. නමුත් ඒ වර්ණ ඉතා මද බැවින් ඇසට නොපෙනේ. ඉතා

වර්ණවත් වූ ද්‍රව්‍යද, දුරසිට බලන්නාවූ කල්හි එක් ආකාරය කින්ද, ළඟ සිට බලන කල්හි අන් ආකාරයකින් ද, බලවත් ආලෝකය ඇති කල්හි තවත් ආකාරයකින්ද, මන්දවූ ආලෝකය ඇතිකල්හි අන්‍යාකාරයකින්ද, යනාදි වශයෙන් එකම ද්‍රව්‍යය නොයෙක් ආකාරයෙන් නොයෙක් දෙනාහට පෙනෙන්නේය. නමුත් සත්‍යවූ වර්ණය මසැසට නොපෙනේ.

චක්ඛු විඤ්ඤාණය හටගැනීමේදී පිටත තිබෙන්නාවූ රූපාලම්බණයාගේ හෙවත් වර්ණයාගේ ඡායාව පමණක් චක්ඛුප්‍රසාදයෙහි ගැටෙන්නේය. රූපාලම්බණය චක්ඛු ප්‍රාසාදය හා ගැටීමක් නො වන්නේය ය. එබැවින් චක්ඛු ප්‍රසාදය **අසම්ප්‍රාප්ත විෂය ග්‍රාහක** නම් වේ.

යොදුන් දහස් ගණන් ඈත පිහිටි චන්ද්‍ර, සූර්‍ය්‍ය, තාරකාදී රූපාලම්බණ අරමුණු කරන හෙයින් ද, විශාල වූ පර්වතාදිය අරමුණු කරන හෙයින්ද, ඇසෙහි ගෑ අඳුන් ආදිය හා ඇසෙහි හැපුනු දූය නොදක්නා හෙයින්ද, චක්ෂුප්‍රසාදය අසම්ප්‍රාප්තාලම්බණයෙහි විඥානෝත්පාදනයට හේතුවන බව දතයුතුයි.

ආලෝකයෙන් උපකාර ලබන ලද රූපාලම්බණයාගේ ඡායාව චක්ඛු ප්‍රාසාදය හා ගැටෙන්නේ ය. ඇතැම් රූප කලාපයන්ගේ තෙජෝ ධාතු අධික හෙයින් දිලිසෙන බවක් හෙවත් බබලන සවභාවයක් දක්වයි. ඇතැම්විට ආලෝකයක්ද නිකුත්වෙයි. අන්ධකාර ස්ථානයෙක්හි තබනලද ඇතැම් මාණික්‍යයන්ගෙන් ද ආලෝකය නිකුත්වේ. එවිට එම ආලෝකයේ උපකාරයෙන් එම ද්‍රව්‍යය පමණක් නොව අවට ද්‍රව්‍යයන්ද දැකීමට හැකිවේ. එසේ ආලෝකයක් නැති කල්හි ද්‍රව්‍යයන්ගේ වර්ණය ප්‍රකට නොවන බැවින් ඇසට නොපෙනේ. කර්ම, චිත්ත, ඍතු ආහාර යන සතර ප්‍රත්‍යයෙන්ම වර්ණය උපදවනු ලැබේ.

**ශබ්දය**

සෝත විඥ්ඥාණයට ගොචර වන හෙවත් කනින් ඇසිය යුතු වූ, සතර මහා භූතයන් නිසා, උපාදාය රූපයක් වශයෙන් පහළවන්නාවූ යම් රූපයක් වේ නම් එය **ශබ්ද රූප** යයි.

**ශබ්ද රූපය,** සෝත ප්‍රසාදයෙහි ගැටීම **ලක්‍ෂණ** කොට ඇත්තේය. සෝත විඥ්ඥාණයට විෂය වීම **කෘත්‍යය** කොට ඇත්තේය. සෝත විඥ්ඥාණයට ගොදුරුවීම වැටහෙන **ස්වභාවය** හෙවත් **පච්චුපට්ඨානය** වේ සතර මහාභූත **පදට්ඨානය** හෙවත් **ආසන්න කාරණය** කොට ඇත්තේය.

ශබ්ද රූපයෝ තනි තනිවම හට නොගනිත්. සෑම කල්හිම රූපකලාපයකට ඇතුළත්වම පහළ වේ. **චිත්ත සමුට්ඨාන** වශයෙන් හෙවත් කථාකිරීමට සිතක් උපන් කල්හි ඒ සිතින් උපදවනලද වායුව, හඬ උපදවන තැන්වල ගැටීමෙන් කථා ශබ්දය උපදී. එය සුද්ධාෂ්ටකයක්, ශබ්දය සහ වාග්විඥ්ඥප්තිය සහිතව, වාග්විඥ්ඥප්ති දසක කලාපයට ඇතුළත්ව හෝ, ලහුතා, මුදුතා, කම්මඥ්ඥතා නම් වූ විකාර රූපයනුත් සමඟ උපදනා කල්හි වාග්විඥ්ඥප්ති, ශබ්ද ලහුතාදී ත්‍රයෝදසක කලාපයකට ඇතුළත්ව හෝ උපදී. **ඍතුසමුට්ඨාන** වශයෙන් ශබ්දය පහළවන කල්හි ශබ්ද නවක කලාපයක් වශයෙන් හෝ ශබ්ද ලහුතාදී ද්වාදසක කලාපයක් වශයෙන් හෝ උපදී.

මේ ශබ්දයෝ, මහා භූතයන් හෙවත් රූපකලාපයන් ඔවුනොවුන් හා ගැටීමෙන් ද, එකට බැඳී පැවැති රූප කලාපයන්ගේ වෙන්වීමෙන්ද හටගන්නේය. බෙර ශබ්ද, ඝණ්ඨාර ශබ්ද, කථා ශබ්දාදිය, භූතයන්ගේ ගැටීමෙන් සිදුවන්නේය. දර පැළීම්, වෙඩි පිපිරීම්, භාජන බිඳීම් ආදියෙන් නැගෙන ශබ්දයෝ භූතපිණ්ඩයන්ගේ වෙන්වීම කරණකොටගෙණ නැගෙන ශබ්දයෝ යි.

කවර හේතුවකින් හෝ කවර ස්ථානයක හෝ උපදින්නාවූ ශබ්ද රූපයන්ට චිත්තක්ෂණ සතොළොසකට වඩා ආයුෂ නැති හෙයින් ඒ ඒ ශබ්ද රූපයෝ උපන් තැනදීම නිරුද්ධවන්නාහ. එබැවින් ශබ්ද රූපයකට, එය හටගත් තැනින් අන් තැනකට යාමටවත්, අන් තැනක පිහිටි සොතප්‍රසාදයෙහි ගැටීමටවත් නුපුළුවන. රූපාලම්බනය පහළවූ තැනම සිටියදී එහි ඡායාව ආලොකයේ උපකාරයෙන් චක්ඛුප්‍රසාද රූපයෙහි ගැටී චක්ඛුවිඤ්ඤාණය උපදින්නාක් මෙන්, මේ ශබ්දාලම්බනයාගේ ශබ්ද ඡායාව පමණක් විවරාකාශය ඇතිකල්හිම සොතප්‍රසාදය හා ගැටීමෙන් සොත විඤ්ඤාණය හටගන්නේය. ඒ හෙයින්ම සොතවිඤ්ඤාණයෝ ශබ්ද රූපයන්ගේ අසම්ප්‍රාප්ත විෂයග්‍රාහක භාවයෙන්ම පහළවන බව කියනලදී. යම් ස්ථානයක හටගන්නාවූ ශබ්ද රූපයෝ ඉතා බලවත් වේද, නැතහොත් විදුලි වේගය ආදී ඍතුජ හේතුවකින් බලවත් කරණ ලද්දේ වේද, ඒ ශබ්ද ඡායාවෝ ඉතා ඈත සිට අසන්නන්ගේ සොතප්‍රසාදයෙහි ගැටීමෙන් ශබ්ද ඇසීමට ශක්තිය ලැබෙන්නේය. සාමාන්‍යයෙන් රූප ඡායාවකට භිත්ති ආදිවූ ඝණවූ වස්තුවක් විනිවිද යාමට නොහැකිවූ නමුත්, ශබ්ද ඡායාවන්ට සමහර ඝණවූ වස්තු විනිවිද යාමට ශක්තියක් ඇත්තේය. යම් හේතුවකින් කන් බිල වැසීමෙන් හෝ අවහිර වීමෙන් ස්වාභාවිකවූ ශබ්ද ඇසීමට නොහැකිවූවත්, සොතප්‍රසාද රූපයෝ පහළ වන්නේනම්, යන්ත්‍රෝපකරණ මාර්ගයෙන් හෙවත් ඍතුජ බලයෙන් කණ අසල වූ හිස්කබල උපකාරකොටගෙණ ඒ ශබ්ද ඇසිය හැකි වේ. විවරාකාශය නැති තන්හි ශබ්ද ඇසීමක් නොවන්නේය. එහෙයින්ම සොත විඤ්ඤාණයාගේ හටගැනීමට ශබ්දාලම්බනයත්, විවරාකාශයත් නොපිරිහුණු සොතප්‍රසාදයත් අවශ්‍ය බව දක්වන ලදී. විවරාකාශය යයි කී කල්හි ඇසට නොපෙනෙන්නාවූ, ඉතා සියුම් රූප පිණ්ඩයන් සහිතවූ ආකාශය බව දතයුතුයි. රූප පිණ්ඩයන් නැති ආකාශයෙහි ශබ්ද ඡායාවෝ නොපැතිරෙන්නේය.

මේ ශබ්ද ඡායාවෝ පැතිරෙන කල්හි, එහි වේගයට අනුව, ආකාශයෙහි ඇත්තාවූ රූප පිණ්ඩයන්ගේ චලනයවීම හේතුකොටගෙණ තරංග ස්වභාවයක් දක්වයි. මේ තරංග ස්වභාවය දක්වන්නේ රූප පිණ්ඩයන්ගේ දිවීමකින් නොව, සිටි තැනම සිට චලනය වීමෙනි. සිටීමට උපකාර වන්නේ පඨවි ධාතුවයි. චලනය කිරීම ඇතිකරවන්නේ එහි වායෝ ධාතුවයි. ඈත අහස්හි බලවත් වායු වේගය හෙවත් ඍතු භේදය කාරණකොටගෙණ, හටගන්නාවූ විදුලි ආලෝකය සහ අහස් ගිගුරුම් ශබ්දයෝ ද, එකක්ෂණිකව හටගන්නාහුය. නමුත් විදුලි ආලෝකය පිළිබඳවූ වර්ණ ඡායාව ඇසට හමුවී ස්වල්ප වේලාවක් ගතවීමෙන් අහස් ගිගුරුම් ශබ්දයෝ ඇසෙත්. එයින් හඟවනු ලබන්නේ වර්ණ ඡායාව චක්ෂුප්‍රසාදය හා ගැටීමට ගතවන්නේ ඉතාමත්ම ස්වල්ප කාලයක් බවත් ශබ්ද රූපයන්ගේ ශබ්ද ඡායාවෝ පැතිරීමට එයට වැඩි වේලාවක් ගතවන බවත්ය.

### ගන්ධය

ඝ්‍රාණ විඥ්ඥාණයට ගොචරවන හෙවත් නැහැයෙන් ආඝ්‍රාණය කළයුතු සතර මහා භූතයන් නිසා පවත්නාවූ උපාදාය රූපයක්වූ සුගඳ දුගඳ ආදී වශයෙන් ප්‍රභේද ඇත්තාවූ යම් රූප ධර්මයක් වේ ද එය **ගන්ධ රූපය** නම්.

**ගන්ධ රූපය** ඝ්‍රාණප්‍රසාදයෙහි ගැටීම **ලක්ෂණ** කොට ඇත්තේය. ඝ්‍රාණවිඥ්ඥාණයට විෂය වීම **කෘත්‍යය** කොට ඇත්තේය. එයටම ගොචරවීම **පච්චුපට්ඨානය** හෙවත් වැටහෙන ආකාරය වේ. සතරමහා භූත එහි **පදට්ඨානය** වේ.

සතර මහා භූතයන්ගේ සංයෝගය කාරණකොටගෙණ සෑම රූප කාලයකම යම් වර්ණයක් පහළවන්නේ වේ ද, එමෙන්ම ඒ මහා භූතයන් සූචනය කරවන හෙවත් ප්‍රකාශ කරන්නාවූ **ගන්ධ රූපයක් ද** ඒ සමගම පහළවන්නේය. ඉතා මඳවූ ගන්ධ රූපයෝ ඝ්‍රාණ විඥ්ඥාණයට නොදැනේ. ගන්ධ රූප ප්‍රබලව ඇත්තාවූ ඇතැම් වස්තූන්ගේ ගන්ධය ඉතා ප්‍රකට වේ. ඝ්‍රාණ විඥ්ඥාණයට විෂය වන්නේ ඒ ඒ

මිශ්‍රවූ ගන්ධයකි. ගන්ධාධික රූපකලාප ඇති වස්තුවකින්, ඍතු ගුණය කාරණකොටගෙණ, නවනවත් ගන්ධාධික රූපකලාපයන් හටගෙන, භූත පරම්පරා වශයෙන් ඒ වස්තුව හාත්පස පැතිර යන්නේය. මෙසේ පරම්පරා වශයෙන් හටගත්තාවූ ගන්ධාධික රූපකලාපයෝ ඝ්‍රාණ ප්‍රසාද වස්තුව හා ගැටීමෙන් ගන්ධය දැනගන්නාවූ ඝ්‍රාණ විඥානය පහළවේ. එබැවින් නාසයට දැනෙන ගන්ධය නාසිකාව තුළම හටගත් ගන්ධාලම්බණයක්ම වේ. මේ ගන්ධයද, පළමුවෙන් ගන්ධය නිකුත්කළ වස්තුවෙහි ඇති ගන්ධයට සමානය. එහෙයින් ඝ්‍රාණ විඥානයෝ ගන්ධ රූපයන්ගේ සම්ප්‍රාප්ත විෂය ග්‍රාහක භාවයෙන් හටගන්නා බව කියන ලදී. ගන්ධාධික රූප කලාපයන් ඇති වස්තුවක් මනාකොට වසා තබන ලද්දේ වේ ද, වායුව එයින් පිටවීමට හෝ- එයට ඇතුල්වීමට හෝ අවකාශ නැත්තේ වේ ද, එකල්හි ඒ වස්තුවෙහි ඇති ගන්ධය පිටතට නො දැනේ. එබැවින් ගන්ධය දැනගැනීමට හෙවත් ඝ්‍රාණ විඥානය පහළවීමට වායො ධාතුවෙන් උපනිශ්‍රය ලැබිය යුතු වේ. එමෙන්ම කොපමණ ගන්ධ රූපයෝ නාසිකාජිද්‍රය තුළ හටගත්තෝවීනමුත් ඝ්‍රාණප්‍රසාදයාගේ පිරිහීමක් වී තිබේනම් ඝ්‍රාණ විඥානය හටනොගනී.

කම්ම, චිත්ත, ඍතු, ආහාර යන සතර ප්‍රත්‍යයෙන්ම ගන්ධ රූපයෝ උපදවනු ලැබෙත්.

## රසය

ජිව්හා විඥානයට ගොචර වන, ජිව්හා විඥානයෙන් ආස්වාදනය කළයුතු හෙවත් දිවින් විඳගතයුතු වූ, සතර මහා භූතයන් නිසා පවත්නාවූ, උපාදය රූපයක් වූ මීහුරු, තික්ත, ඇඹුල් ආදීවූ ප්‍රභෙද ඇති යම් රූප ධර්මයක් වේ ද, එයට **රසය** යයි කියනු ලැබේ.

**රසාලම්බණය** ජිව්හා ප්‍රසාදයෙහි ගැටීම **ලක්ෂණ** කොට ඇත්තේය. ජිව්හා විඥානයට ගොචරවීම එහි **කෘත්‍යය** වේ.

ජිව්හා විඤ්ඤාණයාගේ පැවැත්මට ස්ථාන භාවය වැටහෙන ආකාරය හෙවත් **පච්චුපට්ඨානය** වේ. සතරමහා භූත **පදට්ඨානය** වේ

දිවෙහි ඇති කායප්‍රසාදයෙහි උපදනා කාය විඤ්ඤාණයට ආහාරපානාදියෙහි තද බව, මොළොක් බව උණුසුම් බව සිසිල් බව ආදිය දැනෙතත්, එහි රසය දැනෙන්නේ දිවෙහි ඇති ජිව්හා ප්‍රසාදය නිසා උපදනා ජිව්හා විඤ්ඤාණයට ය.

කම්ම, චිත්ත, ඍතු, ආහාර යන සතර ප්‍රත්‍යයෙන්ම උපදවනු ලබන පඨවි, ආපො, තෙජෝ, වායො යන සතරමහා භූතයන් ඇති රූප කලාපයෙක් වේ නම්, ඒ මහා භූතයන්ගේ එක්තරා රසයක් ද එම කලාපයටම ඇතුළත්ව පහළ වන්නේය. ඇතැම් වස්තූන් පිළිබඳ වූ රූපකලාපයන්ට අයත් රස රූපයෝ ඉතා දුබල බැවින් ඒ වස්තූන්ගේ රසයක් දිවට නොදැනේ. රන්, රිදී, මුතු, මැණික්, සුලං ආදියෙහි ඇති රසයෝ ඉතා දුර්වලය. එහි ඇති ආපො ගතිය හෙවත් තෙත් ගතියද ඉතා මදය. තෙත් ගතිය ඇති වස්තූන්ගේ රසය ප්‍රකට බැවින් පහසුවෙන් දිවට දැනෙන්නේය. තෙත් ගතියෙන් තොර වූ, තද වූ, ඝණ වූ වස්තුවක් දිවෙහි ගැටුණු කල්හි කාය විඤ්ඤාණයක් මිස, රසය දැනගන්නා ජිව්හා විඤ්ඤාණයක් නූපදී. නමුත් ඒ කාරණයෙන් ඒ වස්තුවෙහි රසයක් නැතැයි නොකිය-යුතු යි. ඒ ඒ රූපකලාපයන්ට අයත් භූතයන්ගේ සංයෝගය අනුව ද රසය වෙනස් වේ. තිත්ත රසය, මිහිරි රසය, ලුණු රසය, ඇඹුල් රසය, කසට රසය, කටුක රසය, යනාදී වශයෙන් රසයෝ නොයෙක් ආකාර වේ.

ජිව්හා විඤ්ඤාණයද රස රූපයන්ගේ සම්ප්‍රාප්ත විෂයග්‍රාහක භාවයෙන් හටගන්නා බව දතයුතු යි. රස රූපයෝම ජිව්හා ප්‍රසාදයෙහි ගැටීමෙන් ජිව්හා විඤ්ඤාණය පහළවන බැවිනි.

## ඵොට්ඨබ්බය

කාය විඤ්ඤාණයට ගොචර වන, කාය විඤ්ඤාණයෙන් ම දතයුතු, ආපො ධාතුව වර්ජිතකොට ඇති පඨවි, තෙජො, වායො යන මහා භූතත්‍රයට **ඵොට්ඨබ්බය** යයි කියනු ලැබේ.

**ඵොට්ඨබ්බය** කාය ප්‍රසාදයෙහි ගැටීම **ලක්ෂණ** කොට ඇත්තේය. කාය විඤ්ඤාණයට විෂය වීම එහි **කෘත්‍යය** වේ. කාය විඤ්ඤාණයට ගොචරවීම වැටහෙන ආකාරය හෙවත් **පච්චුපට්ඨානය** වේ. ආපො වර්ජිත භූතත්‍රයම ආසන්න කාරණය හෙවත් **පදට්ඨානය** වේ.

කාය විඤ්ඤාණයට ගොචර වන බැවින්, **ඵොට්ඨබ්බය** ගොචර රූපයක් වශයෙන් දක්වා ඇතත්, රූප, ශබ්ද, ගන්ධ, රස යන ඉතිරි ගොචර රූප මෙන් උපාදාය රූපයක් නොව ආපොවර්ජිත භූතත්‍රයම බව දත යුතුයි. ආපො ධාතුව මහා භූතයක් වන නමුත්, ඉතා සියුම් වූ ද, ඇතුළට ඇදගන්නා ස්වභාවයක් වන බැවින්, යම්කිසිවක් හා නොගැටෙන්නේය. ආපෝ ධාතුව අධිකවූ ජලය ස්පර්ශ කරණ කල්හි, කායප්‍රසාදය හා ගැටෙන්නේ පඨවි, තෙජො, වායෝ යන ධාතු තුනමය. එයිනුත් පඨවි, තෙජෝ යන ධාතු දෙක වඩාත් ප්‍රකටය. පඨවි, තෙජෝ, වායො යන ධාතුත්‍රයම එකවර කයෙහි හැපෙන්නේ වීනමුත් එක් කාය විඤ්ඤාණයක් හටගැනීමට හේතුවන්නේ එයින් එක් ධාතුවක් පමණය. එයද රූපකලාපයන්ගේ වඩා උත්සන්නව පවත්නා පඨවි ධාතුව හෝ තෙජො ධාතුව හෝ වියයුතුයි. එමෙන්ම යම් වස්තුවක පඨවි ගුණයක් හෝ තෙජෝ ගුණයක් හෝ බලාපොරොත්තුවෙන් ස්පර්ශ කරන්නේ නම්, බලාපොරොත්තු වන්නාවූ ඒ ධාතුවම කාය විඤ්ඤාණයට වැටහෙන්නේ ය. තද බවක් හෝ මොළොක් බවක් හෝ වැටහෙන්නේ පඨවි ධාතුස්පර්ශය විඳගැනීමෙනි. උෂ්ණ බව හෝ සීතල බව දැනෙන්නේ තෙජෝ ධාතු ස්පර්ශයෙනි. ස්පර්ශ කරන්නාහුගේ ශරීරයෙහි උෂ්ණයට, ස්පර්ශ කරන දෑයෙහි උෂ්ණය අධිකවූ

කල උෂ්ණය යයි ද, එයට අඩු වූ කල සීතල යයි ද දැනීම වේ. තෙජො ධාතුහුගේ ඌනත්වය හෙවත් මඳ බව සීතල නම් වේ. ශීත, උෂ්ණ දෙකම එකවර නොදැනේ.

**ඵොට්ඨබ්බය** කායප්‍රසාදය හා ගැටීමෙන්ම කාය විඤ්ඤාණය පහළවන බැවින් එය සම්පත්ත විෂයග්‍රාහක බව දතයුතු යි.

### භාවරූප

මහා භූතයන් විසින් ඇතිකරවන ලද සත්ත්ව ශරීරයෙහි ස්ත්‍රී පුරුෂ වශයෙන් දෙපරිද්දෙකින් වෙන්කොට දක්වීමට කර්මයෙන් නිපන් යම් රූප ධර්මයක් උපකාරවේද, එය භාව **රූප** නම්.

භාවරූප දෙකෙකි. **ස්ත්‍රී** භාව **රූපය** හෙවත් **ඉත්ථින්ද්‍රිය** සහ **පුරුෂ** භාව **රූපය** හෙවත් **පුරුෂින්ද්‍රිය** යන භාවරූප දෙකය.

**මේ** ස්ත්‍රිය යන ශබ්ද බුද්ධි ඇතිවීමට යම් **කර්මජරූපයක්** උපකාරීවේද ස්ත්‍රිය පිළිබඳවූ යම් **ලිඞ්ගයෙක්, නිමිත්තයෙක්, කෘත්‍යයෙක්, ආකල්පයෙක්, ස්ත්‍රීත්වයක්, ස්ත්‍රී බවෙක්** වේද, එය **ඉත්ථින්ද්‍රිය** හෙවත් **ස්ත්‍රී** භාවරූප නම් වේ.

**ස්ත්‍රී ලිඞ්ගය** නම් ස්ත්‍රී බව හඟවන්නාවූ ප්‍රධානාඞ්ගවූ සටහනයි. වටවූ උකුළු හා මෘදු අත්පා ආදිය ඇති බවය. **ස්ත්‍රී නිමිත්ත** නම් අනුරාගාදිය අඟවන කථා ආදිය හා ස්තනාදී ස්ත්‍රී බව හඟවන අවවශෂ හෙවත් කුඩා සටහනය. හිසකේ ගැටගැසීම, හදයෙහි ලොම නැති බව, රැවුල් නැති බව ආදියයි. **ස්ත්‍රී කෘත්‍යය** නම් මැහුම්, ගෙතුම්, පිසීම් ආදිය ද ළදරු කල පටන් කුළු ආදීයෙන් ක්‍රීඩා කිරීමය යනාදිය යි. **ස්ත්‍රී ආකල්පය** නම් ස්ත්‍රීන්ගේ ගමනාදී ආකාරය යි.

මේ පුරුෂයා යයි ශබ්ද බුද්ධීන්ට කාරණා බව **ලක්ෂණ** කොට ඇති, පුරුෂයා යයි ප්‍රකාශවීම **කෘත්‍ය කොට** ඇති, පුරුෂ ලිඞ්ගය, පුරුෂ නිමිත්තය, පුරුෂ කෘත්‍යය, පුරුෂ ආකල්පය යන මොවුන්ට කාරණා භාවය වැටහෙන ආකාරය හෙවත් **පච්චුපට්ඨානය** කොට ඇති, යම් පුරුෂත්වයක්, පුරුෂ භාවයක් වත්තේ ද, එය **පුරුෂින්ද්‍රිය** හෙවත් **පුරුෂ භාව රූප** නම් වේ. පුරුෂයින්ගේ අත්, පා, මුහුණු ආදිය මහත්ය. දැලි රැවුල් හා හදය ලොම ඇත්තේය. ඇඳුම් අඳනා ආකාරයද, ගමන් ආදියද, කුඩා කල පටන් කරණ ක්‍රීඩාද වෙනස්ය. කය වෙහෙසා කරණ කැපීම්, කෙටීම්, බර ඉසිලීම් ආදීවූ පුරුෂ කෘත්‍යයෝ ඇත්තාහ..

ස්ත්‍රී පුරුෂ භාවය ප්‍රකාශ කිරීමෙහිදී, අධිපති භාවය දක්වන හෙයින් මේ රූපවයට ඉන්ද්‍රිය නාමය ව්‍යවහාර කරණු ලැබේ.

මේ භාව රූප දෙක කර්මයෙන්ම හටගන්නා රූපයෝ යි. එකම සන්තානයෙහි එකවර මේ භාවරූප දෙකම නො-පවත්නේය. ප්‍රතිසන්ධික්ෂණයේදී හෙවත් ප්‍රතිසන්ධි චිත්තයා ගේ උප්පාදක්ෂණයේදීම මේ භාවරූපය පහළවේ. එතැන් සිට පටිසන්ධි චිත්තයාගේ ඨිති භඞ්ග යන අවස්ථා දෙක්හිද, අනතුරුව පහළවන්නාවූ සියළුම චිත්තයන්ගේ උප්පාද ඨිති භඞ්ග යන තුන් අවස්ථාවන්හිද, ප්‍රතිසන්ධි බීජයෙහි පහළවූ භාවරූප පරම්පරා වශයෙන් ජනක කර්මශක්තිය හේතුකොට ගෙණ පහළ වෙමින් ලිඞ්ග, නිමිත්ත, කෘත්‍යය, ආකල්ප ආදී වශයෙන් පසු පසුව ප්‍රකට වන්නේය. ආදි කල්පිකයන්ට ප්‍රතිසන්ධියේදී භාවරූප පහළ නොවේ. ඔවුන්ට ප්‍රවෘත්ති කාලයේදී පූර්වකර්මානුභාවයෙන් භාවරූපයෝ පහළවෙත්.

ස්ත්‍රීන් කෙරෙහි පවත්නා තෘෂ්ණාව සහිතවූ කර්මයෙන් ප්‍රතිසන්ධිය ගෙන දෙන්නාවූ කල්හි, ප්‍රතිසන්ධියත් සමගම ස්ත්‍රී භාව රූප පහළවේ. එමෙන්ම පුරුෂයන් කෙරෙහි පවත්නා තණ්හා සහගත කර්මයෙන් ප්‍රතිසන්ධි විපාක ගෙන දෙන කල්හි, ප්‍රතිසන්ධි චිත්තයත් සමගම පුරුෂ භාව රූප පහළවේ.

ප්‍රතිසන්ධි චිත්තයෙහි ස්ත්‍රී පුරුෂාදී භේදයක් නැතත්, පෙර භවයන්හි ස්ත්‍රී පුරුෂයන් පිළිබඳවූ තෘෂ්ණාවගේ හේතුවෙන් පටිසන්ධික්ෂණයේදී ස්ත්‍රී පුරුෂ භාව රූප උපදී. යම්කිසි විශෙෂ ප්‍රාර්ථනා ශක්තියකින් හෝ බලවත් අකුසල කර්මය කින් හෝ වෙනස් නොවූයේ නම්, ස්ත්‍රීහු ස්ත්‍රීත්වමද, පුරුෂයෝ පුරුෂයත්වමද උපදිත්.

උභතොබ්‍යඤ්ජනකයාහට පළමුව ඇතිවන්නේ එක් ලිඞ්ගාදියක් පමණය. පසුව එය අතුරුදන්වී අන්‍ය ලිඞ්ගාදිය පහළවේ.

ලිඞ්ග පරිවර්තනයද වන්නේ කර්ම බලයෙනි. පුරුෂ ලිඞ්ගය අතුරුදන්වී ස්ත්‍රී ලිඞ්ගය පහළවන්නේ ලිඞ්ග පරිවර්තනයට හේතුවූ බලවත් අකුසල කර්මයකිනි එබැවින් ජන්ම කර්ම ශක්තිය දුබලවූ කල්හි ජන්ම කර්මයෙන් නිපන් පුරුෂ භාව රූප පරම්පරාවද දුබලවී ක්‍රමයෙන් නිරුද්ධ වේ. ඉන්පසු පහළවන්නේ ස්ත්‍රී භාව රූප පරම්පරාවකි. මෙ ස්ත්‍රී භාව රූපයන් හටගන්නා කල්හි ක්‍රමයෙන් පිරිහුණු පුරුෂ ලිඞ්ගාදිය වෙනුවට ස්ත්‍රී ලිඞ්ගාදිය පහළ වන්නේය.

නපුංසකයන්ට පටිසන්ධික්ෂණයේදී මේ භාව රූප පහළ නොවේ.

මේ භාව රූපයෝ තනි තනිවම හට නොගනිත් මහා භූත රූප සතරත්, වර්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතෙන්ද්‍රිය යන උපාදාය රූපත් සමග භාව රූපය, භාව දසක කලාපයකට ඇතුළත්ව උපදී ස්ත්‍රී භාවයක් ලබන්නාවූ කල්හි ස්ත්‍රී භාව දසක කලාපද, පුරුෂ භාවයක් ලබන්නාවූ කල්හි පුරුෂ භාව දසක කලාපද, පටිසන්ධි චිත්තක්ෂණයේදී පටන් පහළ වන්නේය. මෙසේ පහළවන්නාවූ භාව රූප කලාපයෝ ශරීරයෙහි සෑම තන්හිම පැතිර පවත්නා බව දක්වා ඇත.

**හදය වත්ථු රූපය**

මනො ධාතු, මනො විඤ්ඤාණ ධාතුන්ට නිශ්‍රයවීම ලක්ෂණ කොට ඇති, ඒ ධාතුමයට ආධාරවීම කෘත්‍ය කොට

ඇති, එය දැරීම් **පච්චුපට්ඨානය** හෙවත් වැටහෙන ආකාරය කොට ඇති යම් රූප ධර්මයක් වේද, එය **හදයවත්ථු රූපය** නම් වේ.

යම් රූපයක් කාරණ කොට ගෙණ සත්ත්වයෝ අත්ථ හෝ අනත්ථ හෝ හදත්ද, පූරත්ද, එයට **හදය** යයි කියනු ලැබේ. චිත්ත චෛතසිකයන්ගේ ඉපදීමට ස්ථානවන බැවින් **වත්ථු** නම් වේ. එබැවින් හදය රූපයම **හදය වත්ථු** නම් වේ.

විඤ්ඤාණ ධාතු අතුරෙන් **චක්ඛු විඤ්ඤාණ** ධාතුව චක්ඛු ප්‍රසාද වස්තුවෙහිද, **සොත විඤ්ඤාණ ධාතුව,** සොත ප්‍රසාද වස්තුවෙහිද, **ඝාණ විඤ්ඤාණ ධාතුව,** ඝාණ ප්‍රසාද වස්තු වෙහිද **ජිව්හා විඤ්ඤාණ ධාතුව,** ජිව්හා ප්‍රසාද වස්තුවෙහිද, **කාය විඤ්ඤාණ ධාතුව,** කාය ප්‍රසාද වස්තුවෙහි ද, **මනො ධාතු සහ මනො විඤ්ඤාණ ධාතු** හදය වස්තුවෙහිද උපදී. පඤ්චවොකාර භවයෙහි මෙසේ ප්‍රසාද වස්තු ඇසුරු කොට ගෙණ සිත් පහළවන නමුත්, චතුවොකාර භවයෙහි හෙවත් සතර අරූප තලයන්හි රූප නැති හෙයින් අවස්තුවකව උපදී. පඤ්චවොකාර භවයෙහි සත්ත්වයෙකු උපදනා කල්හි, ප්‍රතිසන්ධි චිත්තයත් සමගම එය හා බැඳී එයටම නිශ්‍රය වෙමින් හදය වත්ථු රූපයද පහළවේ.

හදය වත්ථු රූපය පහළවන කල්හි තනිවම නොව, පඨවි, ආපො, තෙජො, වායො යන සතර මහා භූතයන් හා වණ්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතෙන්ද්‍රිය යන උපාදාය රූපයනුත් සමග වස්තු දසක කලාපයකට ඇතුළත්ව පහළවේ. මනුෂ්‍යාදී සත්ත්වයන් කෙරෙහි උපදනා කල්හි, පටිසන්ධි-ක්ෂණයේදී වස්තු දසක කලාපය පහළවී, අනතුරුව සෑම කුඩා චිත්තක්ෂණයක් පාසාම කලාප පරම්පරාවන් ඇතිවී ක්‍රමයෙන් ශරීරය වැඩුණු පසු, හෘදය මාංස පිණ්ඩයතුල පවත්නා පිරිසිදු ලෙය ඇසුරු කරමින් පහළවේ. හදය මාංස පිණ්ඩයද, අන්‍යවූ ශරීරාවයවයන් මෙන්, කම්ම, චිත්ත, ඍතු ආහාර යන සතර ප්‍රත්‍යයන් ගෙන් නිපන් රූප කලාපාදී නොයෙක් සම්භාරයන්ගෙන් යුක්තය.

මේ වස්තු දසක කලාපයෝ එම හදය මාංස පිණ්ඩයෙහි නොව එහි කොෂයතුල පවත්නා පිරිසිදු ලෙය ඇසුරු කරමින් පවතී. හදය මාංස පිණ්ඩයතුළ, ඇති හදය කොෂ යෙහි ලෙය වැඩි වේලාවක් රඳා නොපවත්නේය. බාහිර ශරීරයෙන් පැමිණෙන ලෙය හෘදය කොෂාභ්‍යන්තරයට පැමිණීමත් සමගම එහි තිබුන ලෙය හෘදයෙන් පිටවී ශරීරාවයවයන් කරා ගමන් කරන්නේය. එබැවින් වස්තු දසක කලාපයෝ හදය කොෂාභ්‍යන්තරයෙහි ඉතා ස්වල්ප වේලාවක් පවත්නා ලෙය ඇසුරු කොටගෙනම පවතී. ඒ වස්තු රූප කලාපයන්ට හදය කොෂයෙන් පිටත්ව යන ලෙය සමග ශරීරයෙහි අන් තැනකට යාමට නුපුළුවන. චිත්තක්ෂණ සතළොසකින් ඒ රූප කලාපයෝ නිරුද්ධ වන හෙයිනි. එබැවින් ප්‍රතිසන්ධික්ෂණයේ පටන්ම, මනො ධාතු, මනො විඤ්ඤාණ ධාතු යන සිත් සමූහය මේ හදය වස්තු රූප ඇසුරු කරමින්ම ඉපිද එහිම නිරුද්ධවන බවත්, ශරීරයෙහි අන්තැනෙක්හි මනොධාතු, මනො-විඤ්ඤාණ ධාතු නූපදනා බවත් දතයුතුයි.

නවීන විද්‍යාමතධාරී ඇතැම් අය මේ සිත් හදය වස්තුවෙහි නොව මොළයෙහි උපදනා බව දක්වීමට ප්‍රයත්න දරති. සියළුම ශරීරාවයවයන්ගේ සම්බන්ධයක් ඒකාන්තයෙන්ම පවත්නා බව සත්‍යයකි. ධමනි ශිරා, ස්නායු, පෙශී, අස්ථි පටකාදී නොයෙක් මාර්ගයන්ගෙන් මේ සම්බන්ධය ඇතිකරණු ලැබේ. ශරීර පොෂණය පිණිස ලෙය උපකාරවන්නාක් මෙන්ද, කය ඍජුව පිහිටුවා නැගීමට අස්ථි, මාංශාදිය උපකාර වන්නාක් මෙන්ද, ශරීරාවයවයන්ගේ ප්‍රාණවත් භාවය රැක ගැනීමටත්, ඉරියව් ආදිය පැවැත්වීමටත් මොළය අතිශයින්ම උපකාරී වේ. මව් කුස හෝනා ළදරුවාගේ මොළය සෑදීමට කලලරූප අවස්ථාවේ සිට එක්තරා කාලයක් ගතවන්නේය. ඇතැම් විටෙක, මව් කුසින් බිහිවන්නාවූ ළදරුවන් අතර මොළය ස්වල්පයක්වත් සෑදී නැති, පණ ඇති ළදරුවන් ද දක්නා ලැබේ. නමුත් ඒ ළදරුවෝ

වැඩිවේලාවක් මව්කුසින් පිටතදී ජීවත් නොවේ. හෘදය කෝෂය, පෙනහැලි ආදිවූ, ජීවත්වීමට අවශ්‍යවූ ප්‍රධානාඞ්ග-යන් ක්‍රියා කරවීමට මොළයේ උපකාරය ලැබිය යුතු බැවින් එය නැති කල්හි මව් කුසින් පිටතදී ජීවත්වීමට නොහැකි වේ. නමුත් එතෙක්කල් එනම් නවමසක් පමණ ඒ ළදරුවා මව්කුස ජීවත්වූ බැවින්, ඒ කාලය තුල භවඞ්ග සිත් ආදිය පහලවූයේ එවකට සෑදී නැති මොළයෙහි නොව පටිසන්ධික්ෂණයේදී හටගත් හදය වස්තු රූප පරම්පරාව ඇසුරු කොට ගෙන බව සැළකිය යුතුයි. මොළයෙහි කාය විඤ්ඤාණයන් පහළ වෙතත්, මනො ධාතු මනො විඤ්ඤාණධාතු පහළවීමට අවකාශයක් නැත මොළය දුබලවූ කල්හි ශරීරාවයවයන්ද දුබලවී මෙන් ක්‍රියා ශක්තියද හීනවේ. චක්ඛු ප්‍රසාදය දුබලවූ කල්හි චක්ඛු විඤ්ඤාණයන්ගේ ඉපදීමද හීනවේ. එසේම අනිකුත් ප්‍රසාද වස්තූන්ගේ දුබලත්වය කාරණ කොට ගෙණ ඒ ඒ විඤ්ඤාණයන්ගේ පහළවීමද ක්‍රමයෙන් පිරිහේ. හෘදය මාංස පිණ්ඩය දුබලවීමෙන් මනො ධාතු මනො විඤ්ඤාණ ධාතූන්ගේ පහළවීම ක්‍රමයෙන් පිරිහී හදය මාංස පිණ්ඩය ක්‍රියා විරහිතවීමෙන් මේ භවයට අයත් නාම රූප ධර්මයන්ගේ නිරුද්ධවීම හෙවත් මරණය සිදු වන්නේය. එහෙයින්, මොළය, ශරීරාවයවයන් රැක-ගැනීමට හා ක්‍රියාකරවීමට උපකාරවන අවයවයක් වූවද, මනො ධාතු මනො විඤ්ඤාණ ධාතූන්ගේ පහළවීමට වස්තුවක් නොවන බව සැළකිය යුතුයි.

පිරිසිදු වාතය ආශ්‍රය කරමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නාවූ කල්හි එම පිරිසිදු වාතය පෙනහැලිවලට ඇතුල්වී, එහිදී හමුවන අපිරිසිදු ලෙය හා මිශ්‍රවීමෙන් ලෙය පිරිසිදු කිරීමට උපකාර වන්නේය. පිරිසිදු ලෙය රක්තවර්ණය. අපිරිසිදු ලෙය දුර්වර්ණය. ලෙය පිරිසිදු වීම හෝ අපිරිසිදු වීම හෝ අනුව එහි වර්ණයද වෙනස් වන්නේය. ස්වාභාවිකව ක්‍රියා කරන්නාවූ නීරෝගී හෘදය මංස පිණ්ඩයත්, පෙණහැලිත් කාරණ කොට ගෙන

ශරීරයෙහි ලෙය ගමනාගමනය කිරීමද ආශ්වාස ප්‍රශ්වාස කිරීමද වන බැවින් එහි යම්කිසි වරදක් හෝ වෙනසක් හෝ ඇතිවීනම් ඒ වෙනස ලේවලද දක්නා ලැබේ. මේ ප්‍රධාන අවයවයන්ගේ ක්‍රියාවන් පාලනය කරනු ලබන්නේ මොළයෙහි උපකාරයෙනි සත්ත්වයාහට යම් යම් ඉෂ්ටවූ හෝ අනිෂ්ටවූ හෝ අරමුණක් හමුවූ කල්හි රාග, ද්වෙෂ, මොහාදී නොයෙක් අකුසල චෙතනා හෝ කුසල පක්‍ෂයෙහි ශ්‍රද්ධාදී චෙතනා හෝ පහළ වීමට අවකාශ ඇත්තේය. එසේ පහළ වන්නාවූ චෙතනා ශක්තිය කාරණකොටගෙණ ඒ ඒ සිත්වලින් උපදවනු ලබන චිත්තජ රූපයන්ගේ ශක්තියෙන් ශරීරාවයවයන්හි ක්‍රියා ශක්තියද වෙනස් වන්නේය. චිත්තජ වායෝ ධාතුව බලවත් ලෙස පහළ කිරීමෙන් ක්‍රියා වේගය ද බලවත් වන්නේය. මොළය උපකාර වන්නේ මෙසේ උපදවන ලද චිත්තජ වායො ධාතුවෙන් ප්‍රයෝජනය ගැනීමට ය. ක්‍රොධයක් හෝ භයක් ඇතිවූ කල්හි ඇතිවන දෞර්මනස්‍ය කාරණකොටගෙණ ලෙය කලු වර්ණ වීමෙන් ශරීරයද දුර්වර්ණ වේ. ප්‍රීතියත්, ශ්‍රද්ධාවත් ප්‍රේමයත් ඇතිවූ කල්හි රක්තවර්ණ පැහැයක් ඇතිවන්නේය. ශොකයක් ඇතිවූ කල්හි ශරීරය විගලි සවභාවයක් දක්-වන්නේය. උපෙක්‍ෂා වූ කල්හි පහන් තලතෙලක් බඳු වර්ණයක් ඇතිවන්නේත් මේ ක්‍රමයෙන් බව සිතිය යුතුයි.

පරචිත්ත විජානනඥානය උපදවා ගෙන පරසිත් බලන්නාවූ කල්හි හෘදය කොෂාභ්‍යන්තරයෙහි පවත්නා ලේ ධාතුවෙහි වර්ණය බලා, ඔහුට උපන් සිත රාග, ද්වෙෂ, මොහ, විතර්කාදිය සහිත බව හෝ රහිත බව හෝ දැන ගන්නේය.

## ජීවිතෙන්ද්‍රිය රූපය

කර්මජ වූ සහජාත රූපයන් හෙවත් තමා හා එක්ව උපන් රූපයන් පිළිබඳ වූ, නැවැතිය නොදී ඉදිරියට යවන, වඩන සවභාවය වූ ආයුව ද, ස්ථාපන සවභාවය හෙවත් මැලවිය නොදී තගා සිටුවන සවභාවය වූ ඨිතිය ද, යැපීම සළසන සවභාවය ද, මතුමත්තෙහි පවත්වන සවභාවය ද,

රක්නා සවභාවය ද, පණපොවන සවභාවය ද, පණගැන් විමෙහි අධිපති හෙවත් ඉන්‍ද්‍රිය භාවය දක්වන සවභාවය ද ඇති යම් රූප ධර්මයක් වේ ද, එය **ජීවිතෙන්ද්‍රිය රූප** නම් වේ.

මේ **රූප ජීවිතෙන්ද්‍රිය,** ඒ ඒ කර්මජ රූපකලාපයන්හි තමා හා එක්ම උපන් භූත රූප හා උපාදාය රූපයනුත් පාලනය කිරීම **ලක්‍ෂණ** කොට ඇත්තේය. සහජාත රූපයන් පැවැත්වීම **කෘත්‍යය** කොට ඇත්තේය. ඔවුන් මැලවිය නොදී නගා සිටුවීම වැටහෙන ආකාරය හෙවත් **පච්චුපට්ඨානය** වේ. තමා විසින් පැවැත්විය යුතු සහජාත රූපයන්ම **පදට්ඨාන** හෙවත් ආසන්න කාරණය කොට ඇත්තේය.

තවද, සෑම කර්මජ රූපකලාපයක් පාසාම, උපාදාය රූපයක් වශයෙන් සහජව බැඳී, මහා භූත රූපයන් හා වර්ණ ගන්ධාදි අනෙක් උපාදාය රූපයනුත් පණපොවමින්, එයට සම්බන්ධය ඇති චිත්තජ, සෘතුජ, ආහාරජ වූ අන්‍ය කලාපයන්ට අයත් රූපයන් ද මැලවිය නොදී නගාසිටුවමින්, තෙමේත් රැකෙමින් රූපසන්තතිය මතු මතුයෙහි පරම්පරා වශයෙන් මේ ආත්ම භාවයෙහි චුතිය දක්වාත් වැටෙන්නට නොදී පවත්වාගෙන යාමෙහිද, මැලවිය නොදී නගා සිටුවීමෙහිද, පාලනය කිරීමෙහිද, අධිපති භාවය උසුලන රූප ධර්මයක් බවද සැලකිය යුතුයි. අන්‍ය මවක් ප්‍රසව කළ දරුවන් කිරි මවක් විසින් කිරිපොවා ඇති දැඩි කරන්නා සේ, කර්ම ප්‍රත්‍ය යෙන් පහළවන රූප කලාපයන්හි පමණක් ලැබෙමින්, එම රූප කලාපයට අයත් රූපයනුත් පාලනය කරමින්, ජීවත් කරවමින් මරණය දක්වා සන්තති වශයෙන් කර්මජ රූප කලාපයන් පවත්වා ගෙනයාමට උපකාර වන්නේය. **කර්මය** නම් අතීතයෙහි කරනලද ප්‍රතිසන්ධි ජනක කුසලා කුසල කර්මය යි. මේ භවයෙහිදී කර්මජ රූපකලාපයන් ඉපැද්මට හේතුවූ පූර්වජාතියෙහි කරන ලද කර්මය ඒ භවයේදීම නිරුද්ධ විය. එබැවින් කර්මජ රූපයන්ගේ ජනක ප්‍රත්‍යය නැතිවූ හෙයින් එයින්ම නිපදවන ලද ජීවිතෙන්ද්‍රියයාගේ ශක්ති යෙන් ඒ රූපයෝ පවත්නාහු වෙත්.

චිත්ත සෘතු, ආහාර යන ත්‍රිවිධ ප්‍රත්‍යයෙන් උපදවන ලද රූප කලාපයන්ගේ ජනක ප්‍රත්‍ය වූ චිත්ත, සෘතු ආහාරයන් විද්‍යමාන බැවින් ඒ රූපයන්ගේ ජීවත් වීමට අන්‍ය වූ ජීවිතෙන්ද්‍රියකින් ප්‍රයෝජනයක් නැත්තේය.

ජනක කර්මයාගේ ශක්තිය පවත්නා තාක් කල් මේ ජීවිතෙන්ද්‍රිය රූපයද සෑම කර්මජ රූප කලාපයකටම ඇතුළත්ව උපදිමින්, ඒ කර්මජ රූපයන් පාලනය කරමින්, චුතිය දක්වාම සන්තති වශයෙන් පවත්නා බව දතයුතුයි.

මේ ජීවිතෙන්ද්‍රියයද, සහජ වූ රූපයන්ගේ නිරුද්ධියත් සමගම නිරුද්ධ වන්නේ වී නමුත්, කර්මජ රූප පරම්පරාව රැකීමය, යැපීමය, ජීවත් වීමය, සිටුවීමය, පිහිටුවීමය යනාදී කෘත්‍ය සිද්ධ කිරීමට සමත් වේ.

එහෙයින් චුතිය දක්වා කර්මජ රූපකලාපයන් සන්තති වශයෙන් නොසිඳ පවත්නා බව සැළකිය යුතුයි.

### ආහාර හෙවත් ඕජා රූපය

ඵලය ඇතිකරවන්නාවූ ද, ගෙනදෙන්නාවූ ද ආහරණය කරන්නාවූ ද විශෙෂ හේතූන්ට **ආහාරයෝ** යයි කියනු ලැබේ. මේ **ආහාරයෝ** සතර දෙනෙකි.

එනම් :–

1. **ඵස්සාහාරය**
2. **මනෝසඤ්චෙතනාහාරය**
3. **විඤ්ඤාණාහාරය**
4. **කබලීකාරාහාරය**

**ස්පර්ශය** හෙවත් **ඵස්ස චෛතසිකය** සත්ත්වයන්ගේ පැවැත්මට උවමනා වේදනා ආහරණය කරන හෙවත් ගෙන දෙන විශෙෂ හේතුවක් වන හෙයින් එයට **ඵස්සා-හාරය** යයි කියනු ලැබේ.

**සංඛාර** නම් වූ කුසලාකුසල සඞ්ඛ්‍යාත චේතනාව හෙවත් **චේතනා චෛතසිකය**, ප්‍රතිසන්ධි විඥ්ඥාණය ආහරණය කරන හෙවත් ගෙනදෙන විශෙෂ හේතුවක් වන බැවින් එයට **මනොසඤ්චේතනාහාරය** යයි කියනු ලැබේ.

**ප්‍රතිසන්ධි විඥ්ඥාණය** හෙවත් ප්‍රතිසන්ධි සිත, නාමරූප ධර්මයන් ආහරණය කරණ බැවින් එයට **විඥ්ඥාණාහාරය** යයි කියනු ලැබේ.

මේ ත්‍රිවිධ ආහාරයෝ ම **නාම** ධර්මයෝ යි.

**කබල** නම් වූ බත් ආදිය පිඬු පිඬු කොට අනුභව කරණ හෙයින් ද, **ඕජට්ඨමක රූපය** උපදවන හෙවත් ආහරණය කරණ හෙයින්ද **කබලීකාරාහාරය** නම් වූ මේ රූපය, අටවිසි රූපයන්ට ඇතුළත් වූ **ඕජා** සඞ්ඛ්‍යාත **ආහාර රූප** යයි. එබැවින් **කබලීකාරාහාරය** යයි කී කල්හි **සවත්ථුක ඕජාව** හෙවත් බත් පිඬු ආදියත්, එහි ඇති ඕජාව හෙවත් රස ධාතුවත් ඇතුළත් වන බව දතයුතු යි. **වත්ථු** හෙවත් බත් පිඬු ආදියෙන් පරිශ්‍රය හෙවත් කර්මජ තේජස දුරුකරන්නේය. **ඕජාව** රූප පාලනය කරන්නේය. ආමාශය තුළ ඕදනාදීය නැති කල්හි පාචකාග්නිය හෙවත් කර්ම තේජස උත්සන්න වීමෙන් බඩගින්න හටගනී. එවිට බත් පිඬු ආදී ආහාරයක් මුඛයට ඇතුල් කල කල්හි එම ආහාරය දත්වලින් සපා, මුඛගත බෙට හෙවත් කෙළ සමග මිශ්‍රවී ගිලීමට සුදුසු පිණ්ඩයක් මෙන් කොට අන්නශ්‍රොතයට ඇතුල්වී ක්‍රමයෙන් ආමාශය කරා ගෙණයනු ලැබේ. එහිදී ආමාශයික යූෂ යත් හා මිශ්‍රණය වීමෙන් උත්සන්න වූ තේජසය නිවී හෙවත් බඩ ගින්න නිවී ඒ තේජසින් ආහාරය දිරවීමට ආරම්භ වන්නේය. මෙසේ තෙජසයෙන් ද අනුබල ලැබ බෙට හා ආමාශයික යූෂයන් කරණකොටගෙණ දිරීමට පත් කරණ ලද ආහාර පිණ්ඩයන් ආන්ත්‍රයන්ට ඇතුල්වී ක්‍රමයෙන් ගුද මග කරා ගමන් කරන්නේය. මෙසේ පැසවන ලද ආහාරයන්ගේ ඕජාව හෙවත් රසය, ශරීරයෙහි පාලනයට සුදුසු වූ ආහාරජ රූප

කලාප සන්තතිය උපදවා, ලේ ධාතුව සමග මිශ්‍රවී නොයෙක් ශරීරාවයවයන් කරා පමුණුවා පෙනහැල්ලේ උපකාරයෙන් ලබන ලද පිරිසිදු වායුව හා සම්මිශ්‍රණ වීමෙන් වඩාත් පිරිසිදු වී ශරීරාවයවයන්ට අතුළු වන්නේය.. මේ ඕජාවට **බාහිර ඕජාව** යයි කියනු ලැබේ. මේ බාහිර ඕජාවන්ගෙන් රුකුල් ලැබීමෙන් කර්මජ රූපකලාපාදීන්ට අයත් අධ්‍යාත්මික ඕජා රූපයන්ගේ පැවැත්ම වන්නේය. අධ්‍යාත්මික ඕජාවත්, බාහිර ඕජාවත් යන දෙදෙනාගේ ම සම්බන්ධය හෙවත් උපකාරය නැති කල්හි රූපකලාපයන්ගේ හට ගැනීමට සහ පැවැත්මට බාධා පැමිණෙන්නේය. ආහාරය නැති කල්හි ශරීරය දිරීමත්, අප්‍රාණික වීමත් ඇතිවන්නේ මේ හේතුවෙන් බව සැලකිය යුතුයි.

මව් කුසයෙහි වසන සත්ත්වයා හට කබලීකාරාහාර ඕජාවන් ලැබෙන්නේ මවගේ මාගීයෙනි. මව කබලීකාරාහාර නොගත්තේවීනම් මවගේ ශරීරය පමණක් නොව මව් කුස වැදහෝනා ළදරුවා ද විනාශයට පත් වන්නේය.

මේ ආහාරය මුඛයෙහි බහා වැළඳීමෙන් හෝ, ශරීරයෙහි ආලේප කිරීමෙන් හෝ සම් මස් විද ඇතුල් කිරීමෙන් හෝ අන් ක්‍රමයකින් ශරීරගත කිරීමෙන් හෝ ශරීරය පොෂණය වන්නේය.

අනුභව කරන්නාවූ ආහාරයන් අතුරෙන් ඕදරික ආහාරයන්හි ඕජාව සවල්පය. ගිතෙල් ආදී සිනිදු ආහාර යන්හි ඕජාව බලවත් ය. සවල්ප වූ ඕජාව ඇති ආහාර ගැනීමෙන් පසු වහාම බඩගින්න ඇතිවන්නේත් බලවත්වූ ඕජාව ඇති ආහාර ගැනීමෙන් පසු බොහෝ වේලා ගින්න හට නොගන්නේත් ඕජාවන්ගේ වෙනස කරණ කොට ගෙණ ය.

ආහාර වශයෙන් ගණු ලබන්නාවූ බත් පිඩු ආදිය ඕජා අධික වූ ඍතුජ රූපකලාප සමූහයක් බවත්, ඒ ඒ රූප කලාපයෝ චිත්තක්ෂණ සතලොසකට වඩා නො පවත්නා

බවත්, පිඬු පිඬු කොට මුඛයෙහි තබන්නාවූ ද, මුඛයෙන් අන්නශ්‍රොත, ආමාශ, ආන්ත්‍රාදීන්හි පැසව පැසවමින් ගමන් කරන්නාවූ ආහාර පිණ්ඩයන් ද සතළොස් චිත්තක්ෂණයකට ආයු ඇති රූප කලාප සන්තතියක්ම බවත්, එයින් උපදවනු ලබන්නාවූ ද, ලෙය සමග මිශ්‍රවී ශරීරාවයවයන් කරා ගමන් කරන්නාවූ ද ඕජා අධික රූප කලාපයෝ එබඳුම රූප කලාප සන්තතියක් ම බවත් කබලීකාරාහාරය නැති කල්හි නිරුද්ධ වන්නේත් මේ ආහාරජ රූපකලාප සන්තතියම බවත් මතක තබා ගත යුතුයි.

**කබලීකාරාහාරය** ඕජාව **ලක්ෂණ** කොට ඇත්තේය. ඕජටඨමක රූප පැවැත්වීම **කෘත්‍ය** කොට ඇත්තේය. ඕජටඨමක රූප ඉපදීම් වශයෙන් රූප කායයට රැකුල් දීම **පච්චුපට්ඨානය** හෙවත් **වැටහෙන ආකාරය** වේ පිඬු කොට හෙවත් කබල කබල කොට අනුභව කළයුතු වස්තු **ආසන්න කාරණය** හෙවත් **පදට්ඨානය** වේ.

තවද, ගල් ආදිය ගිල දිරවා ගන්නාවූ කිඹුලන්ගේ ආහාරය ඉතා ඖදාරිකය. කිඹුලන්ගේ ආහාරයට වඩා සර්පාදීන් කන්නාවූ මොනරුන්ගේ ආහාරය සියුම් ය. මොනරුන්ගේ ආහාරයට වඩා අං, ඇට. කටු ආදිය අනුභව කරන්නාවූ වලසුන්ගේ ආහාරය සියුම් ය. වලසුන්ගේ ආහාරයට වඩා ගස්වල අතු කොල ආදිය කන්නාවූ ඇතුන්ගේ ආහාරය සියුම් ය. ඇතුන්ගේ ආහාරයට වඩා නොයෙක් ගස්වල කොල පොතු ආදිය බුදින්නාවූ ගෝන මුව ආදීන්ගේ ආහාරය සියුම්ය. ගෝන මුව ආදීන්ගේ ආහාරයට වඩා තණ පත් අනුභව කරන්නාවූ ගවයන්ගේ ආහාරය සිනිඳුය. ගවයන්ගේ ආහාරයට වඩා සාවුන්ගේ ආහාරය ද, සාවුන්ගේ ආහාරයට වඩා පක්ෂීන්ගේ ආහාරය ද, පක්ෂීන්ගේ ආහාරයට වඩා ප්‍රත්‍යන්තවාසීන්ගේ ආහාරය ද, ඔවුන්ගේ ආහාරයට වඩා ගම්හි වසන්නන්ගේ ආහාරය ද, ඔවුන්ගේ ආහාරයට වඩා රාජරාජ මහාමාත්‍යයන් ගේ ආහාරය ද, ඔවුන්ගේ ආහාරයට වඩා සක්විති රජුන්ගේ

ආහාරය ද, ඔවුන්ගේ ආහාරයට වඩා භූමාට දෙවියන්ගේ ආහාරය ද, ඔවුන්ගේ ආහාරයට වඩා චාතුම්මහාරාජික දෙවියන්ගේ ආහාරය ද, ඔවුන්ගේ ආහාරයට වඩා මනු මත්තෙහි දෙවියන්ගේ ආහාර ද සියුම් වන බව දක්වා තිබේ.

මෙහි දක්වන ලද **භූත රූප, ප්‍රසාද රූප, ගොචර රූප, භාව රූප, හදය රූපය, ජීවිත රූපය** සහ **ආහාර රූපය** යන අටළොස් රූපයෝ කක්ඛලාදීවූ තමතමා පිළිබඳ වූ සවභාවයෙන්ම හෙවත් ලකෂණයන් ගෙන්ම යුක්ත වන බැවින් **සවභාව රූප** නම් වෙත් උත්පාදාදී වූ ද, අනිත්‍යාදී වූ ද ලකෂණයන්ගෙන් යුක්ත බැවින් **සලකෂණ රූප ද** වෙත්. තම තමන් උපදවන කර්මාදි ප්‍රත්‍යයෙන්ම උපදවනු ලබන බැවින් **නිෂ්පන්න රූප** නම් වෙත්. නිෂ්පන්නීංශ වශයෙන්ම රූප්පන හෙවත් විනාශයට පත්වන ලකෂණ ඇති හෙයින් **රූපරූප** නම් වෙත්. යොගාවචරයන් හට අනිත්‍යාදී ත්‍රිලකෂණ වශයෙන් සම්මශීනය කිරීමට යොග්‍ය වන බැවින් **සම්මශීන රූප** නම් වෙත්. එබැවින් මේ අටළොස් රූපයන්ට **සවභාව රූප** යයි ද, **සලකෂණ රූප** යයි ද, **නිෂ්පන්න රූප** යයි ද, **රූප රූප** යයි ද, **සම්මශීන රූප** යයි ද ව්‍යවහාර කරණු ලැබේ.

## පරිච්ඡේද රූපය හෙවත් ආකාශ ධාතුව

රූප හටගන්නා කල්හි තනි තනිවම නොව රූප කලාප හෙවත් සමූහ වශයෙන් එකට බැඳී හටගන්නා බවත් එසේ වෙන් වෙන්ව හටගන්නාවූ රූප කලාප සමූහයක් එකතු වීමෙන් නොයෙක් ද්‍රව්‍යයන් සෑදෙන බවත් යට දක්වන ලදී. මෙසේ හටගන්නාවූ ද්‍රව්‍යයෝ එකිනෙකට වෙන්වම පවත්නා මෙන්ම ද්‍රව්‍යයන් බවට පැමිණි රූප කලාපයෝ ද එකිනෙකට වෙන්වම පවතී. එහෙයින් රූප කලාප වෙන් කරන්නාවූ හෙවත් රූප කලාප දෙකකට අතර කිසිවක් නැති හිස් සවභාවයක්

තිබිය යුතුයි. එසේ වෙන් වීමක් නොමැති නම් රූප කලාපයන්ගේ වෙන්වීමක්ද නොවන්නේය. එබැවින් ඒ ඒ රූප කලාප හෝ ද්‍රව්‍ය සම්භාර හෝ වෙන් වෙන්ව ප්‍රකාශ කරන්නාවූ හෝ ඔවුන්ගෙන් තමා ම පිරිසිඳීම ලබන්නේ හෝ රූපයන්ගේ පිරිසිඳීම් මාත්‍රය හෝ වේ නම් එයට **ආකාශය** යයි කියනු ලැබේ. එයම සත්වයෙක් පුද්ගලයෙක් ජීවිතයක් නොවන බැවින් **ධාතු** නම් වේ. එබැවින් **ආකාශ ධාතු** යන නාමය වේ. රූපකලාපයන් වෙන්කොට හෙවත් පරිච්ඡේද කොට දක්වන හෙයින් **පරිච්ඡේද රූප** නමුදු වේ. මෙය පඨවි, ආපො, තෙජො වායෝ ආදී වශයෙන් දක්වනලද රූපයන් මෙන් එකාන්ත ලක්ෂණ ඇති, රූප කලාපවලට ඇතුලත් වූ පරමාර්ථ ධර්මයක් නොවෙතත් එයින් වෙන් කරනු ලබන්නාවූ රූපකලාපයන්ගේ උත්පාදයත් සමග පහළවී චිත්තක්ෂණ සතළොසකින් ඇත් වන්නාවූ ඒ රූපකලාපයන්ගේ නිරුද්ධයත් සමගම අභාවයට පත්වන්නා සේ ඇතිවන බැවින් වෙන් වූ රූප ධර්මයක් හැටියට සලකනු ලැබේ.

ආකාශ ධාතුවෙන් පිරිසිඳින ලද ඒ ඒ රූපකලාප අන්‍ය කලාප හා මිශ්‍ර නොවී, මේ කලාපය මෙයින් උඩය, යටය, සරසය යනාදී වශයෙන් පිරිසිඳීම මෙහි සවභාවයයි.

ආකාශ ධාතුව රූප පරිච්ඡේදය **ලක්ෂණ** කොට ඇත්තේය. රූප කලාපයන්ගේ දැක්වීම හෙවත් ප්‍රකාශ කිරීම එහි **කෘත්‍යය** වේ. රූපයන්ගේ පරිච්ඡේද මාත්‍රය හෙවත් සීමාව **වැටහෙන ආකාරය** වේ. පිරිසිඳින ලද රූපයන් ආසන්න කාරණ කොට ඇත්තේය.

ආකාශය, නොගැටෙන බව, විවරය, සතර මහා භූතයන්ගෙන් සපර්ශ නොවන බව ආකාශ ධාතුව නම වන්නේය.

**අජටාකාශය, රූප පරිච්ඡේදාකාශය** යයි ආකාශය දෙපරිද්දෙකින් දක්වනු ලැබේ. සතර මහා භූතයන්ගේ ස්පර්ශයක් නොවන තැන හෙවත් ද්‍රව්‍යයන් නැති තැන **අජටාකාශය** නම්වේ. රූපකලාපයන්ගේ අතර, **රූප පරිච්ඡේදාකාශය** වේ මේ පොළොව මතුවෙහි ආකාශය ලෙස සලකන පෙදෙස වායුවෙන් පිරී තිබේ. වායුව නම් වායෝ ධාතුව අධික රූපකලාප සමූහයකි. එබැවින් අපට පෙනෙන අහස රූපකලාපයන්ගෙන් සිස් තැනක් නොවේ, එබැවින් අජටාකාශය යයි කියයුත්තේ වායු, ආලෝක. ශීතොෂ්ණාදි කිසිවක් නැති පෙදෙසට ය.

## විඤ්ඤත්ති රූප

සත්ත්වයෝ, තම තමන්ට පහළවන්නාවූ යම් යම් අදහස් අනුන්ට හඟවනු කැමැති කල්හි, යම් ශරීරාවයව-යන්ගේ සැළීමකින් හෝ සැලෙන ස්වභාවයකින් හෝ මුවින් නිකුත් කරන්නාවූ ශබ්දයකින් හෝ අදහස් හඟවත්ද එසේම අනුන් විසින් ද යම් සත්ත්වයෙකුගේ සැලෙන්නාවූ ශරීරාවයවයන් දැක හෝ මුවින් නිකුත්වන ශබ්දානුසාර-යෙන් හෝ ඔහුගේ අදහස් දැනගනීද, එයට **විඤ්ඤත්ති රූපය** යි කියනු ලැබේ එසේ හෙයින් **කාය විඤ්ඤත්ති වචී විඤ්ඤත්ති** යයි විඤ්ඤත්ති දෙවැදෑරුම් වේ.

## කාය විඤ්ඤත්ති

ඉදිරියට යාම ආපසු ඊම, අත් පා දිගහැරීම, හැකිළීම යනාදි කායික ක්‍රියාවන් පවත්වන්නාවූ, සිත නිසා පැවැති වායො ධාතුව හා එක්ව හටගන්නාවූ, රූප කායට රුකුල් දීමෙන් සැළීම් පිහිටුවීම් ආදි ඒ ඒ ක්‍රියාවන් උපදවන්නාවූ ආකාර විශෙෂය **කාය විඤ්ඤත්ති** නම් වේ යෑම් ඊම් ආදී ක්‍රියාවක් කරණ කල්හි, සැලෙන්නාවූ ශරීරාඞ්ගයන් දැක, පිටත සිටින්නවුන් හට, මොහු හිදින්නේය, සිටින්නේය, වටපිට බලන්නේය, මේ මේ කරුණු හඟවන්නේය යනාදී දැනීමක් ඇතිවන්නේ මේ **කාය විඤ්ඤත්තිය** හේතුකොට ගෙණය. එය වායො ධාතුව අධික චිත්තජ මහා භූතයන්ගේ

ශක්තියෙන් ම සිදුවන්නේය. ශරීරාවයවයන්ගේ සැලීම විඥප්තිය නොවන බවත්, ඒ සැලීම කරන්නාවූ චිත්තජ වායො ධාතු අධික මහා භූතයන්ගේ විකාරයම විඥප්තිය බවත් දත යුතුයි.

යම් පුද්ගලයෙකු හට ඇවිදිම්යි අදහසක් උපන් කල්හි කෙසේ ඇවිදිම්ද, කවර තැනෙක්හි, කවර දිසාවක් බලං යන්නෙම්ද යනාදි වශයෙන් සිතමින් චිත්ත වීථි රාශියක් ඇතිවන්නේ වීනමුත් එයින් ඇවිදීමක් නොවන්නේය. ඇවිදීමක් ඇතිවන්නට නම් පළමුකොට එක් පාදයක් ඔසවා ඉදිරියට යවා ඉදිරි පාදය පොළොවෙහි පිහිටුවා, දෙවෙනි පාදය ද එසේම ඔසවා පළමු පාදයට ඉදිරියෙන් පිහිටුවා ගෙන මේ ක්‍රමයෙන් පාදයන් ක්‍රියා කළයුතුවේ. මේ ක්‍රියාවන් සිදුකිරීමට විශෙෂ ශක්තියක් ඇතිවිය යුතුයි. එසේ විශෙෂ ශක්තියක් නැති කල්හි ඇවිදීමක් නොවන්නේය. මේ විශෙෂ ශක්තිය ඒ පුද්ගලයන් හට ඇතිවූ අදහස් අනුව ඒ සිත්වලින්ම ඉපිදවිය යුතු ශක්තියකි. ක්‍රියා කරවන්නට අදහස් කළ ශරීරාවයවයන්, රෝගාබාධයකින් හෝ, අනතුරකින් හෝ, මොළය හා සම්බන්ධය නැතිවීමෙන් හෝ, මොළයෙහි දෙෂයකින් හෝ, දුබල නොවී පවතී නම් තම සන්තානයෙහි උපන් ඒ චිත්තයන්ගේ ශක්තියෙන් චිත්තජ වායො ධාතුව අධික රූප කලාපයන් ඒ ඒ ශරීරාවයවයන්හි උපදවනු ලැබේ. එසේ උපදවනු ලබන්නාවූ ඒ වායො ධාතු අධික රූප කලාප සන්තතිය උපකාර කොටගෙණ ඒ ඒ අවයවයන් සැලෙන්නට ද, අදහස් කළ පරිද්දෙන් ඉදිරියට පමුණුවන්නටද පටන්ගනී. මේ උපදවනු ලබන චිත්තජ වායො ධාතුන් ඇතිතාක් කල් ඒ ඒ ශරීරාඞ්ගයන් ක්‍රියා කරන්නේය. ගමන නතර කිරීමට අදහසක් උපන් කල්හි පළමු ගමනට උවමනා වූ ශරීරාඞ්ග යන්හි උපදවන ලද චිත්තජ වායො ධාතු සන්තතිය නැවතී ඒ වෙනුවට සිටීමට හෝ හිඳීමට හෝ, කැමැති යම් ඉරියව්වකට උපකාරවන ශරීරාඞ්ගයන්හි වායො ධාතුව උපදවන්නට පටන්ගන්නේය.

එවිට ඔහුගේ ගමන නතරවී සිටීම හෝ හිඳීම හෝ වන්නේය. මෙසේ ශරීරය පිළිබඳවූ සෑම ක්‍රියාවක්ම චිත්තජ වායො ධාතු අධික රූප කලාපයන්ගේ ඉපැද්-මෙන්ම කළයුතු වේ. එබැවින් **කාය විඤ්ඤත්තිය** යයි කියනු ලබන්නේ තම අදහස් හැඟවීම පිණිස චිත්තජ වායො ධාතු අධික රූප කලාපයන් නිසා සැලෙන්නාවූ ශරීරාඞ්ගයන් කරණකොටගෙණ දතයුතු රූපයකි.

## වචී විඤ්ඤත්ති රූපය

සත්ත්වයෝ තම අදහස ශබ්දානුසාරයෙන් අනුන් හට දැන්වීමට කැමැති කල්හි ඒ සමගම උපදින්නාවූ චිත්තයන්ගේ ශක්තිය කරණකොට ගෙණ පඨවි, ආපො, තෙජො, වායො, වණ්ණ, ගන්ධ, රස, ඕජා යන සුද්ධාෂ්ටක රූප කලාපයන් සමගම, එම භූත රූපයන්ගේ සංඝට්ටනයෙන් ශබ්ද රූපය ද උපදවා, මෙරමා හට තම අදහස හඟවන්නට ප්‍රත්‍යවූ යම් විකාර ස්වභාවයක් පහළවේ නම් එය **වචී විඤ්ඤත්ති රූපය** නම් වේ. මේ **වචී විඤ්ඤත්ති රූපය** කරණකොටගෙණ අන්‍යයෝ ද තම අදහස් දැනගනිත්. මේ රූපය සිතින්ම උපදවනු මිස අන් ක්‍රමයකින් ඉපදවිය නොහැකිය. මේ සමග උපදනා ශබ්ද රූපයට සමාන ශබ්ද රූපයෝ ඍතු ශක්තියෙන් ඉපදවිය හැකි වේ. යම් පුද්ගලයෙක් තම අදහස මෙසේ වචී විඤ්ඤත්ති රූපයන්ගේ උපකාරයෙන් ප්‍රකාශ කරණ ලද්දේ වේද, එම ශබ්ද රූපය සහිත වූ සුද්ධාෂ්ටක රූප කලාපයන්ට සමාන රූප කලාපයෝ රේඩියෝ ග්‍රැමපෝන් ආදී වූ යන්ත්‍ර වලින් ද ඍතුජ රූප කලාප වශයෙන් නැවත නැවතත් ප්‍රකාශ කරවන්නට හැකි වන්නේය. නමුත් එහි වචී විඤ්ඤත්ති රූපයෝ නැත.

**වචී විඤ්ඤත්ති රූපය** වනාහි එක් චිත්තක්ෂණයකට ආයුෂය ඇති රූපයකි. ඒ සමගම උපදනා අනිකුත් චිත්තජ රූපයෝ චිත්තක්ෂණ සතළොසක් ආයු වළඳති. ඒ රූප කලාපය උපදවන ලද සිතෙහි නිරුද්ධයත් සමගම වචී

විඤ්ඤත්ති රූපයෝ ද නිරුද්ධ වෙති. ශබ්ද රූපය සහිත වූ ඉතිරි රූපයෝ සතළොස් චිත්තක්ෂණයම ආයු වළඳ ශබ්ද ප්‍රකාශකොට නිරුද්ධ වන්නාහ.

මෙසේ තම අදහස හැඟවීමට වචන ප්‍රකාශ කරණ කල්හි ඒ සිත්වලින්ම උපදවනු ලබන චිත්තජ වායෝ ධාතුව අධික රූප කලාපයන් ගල තළය පටන් දෙතොල් දක්වා ඒ ඒ ශබ්දයන් ඉපදවීමට හැකිවන සේ ඒ ඒ තැන්වල උපදවා ආශ්වාස ප්‍රශ්වාස වායුවත් උපකාර කොටගෙණ උවමනා ශබ්ද හෙවත් වචන නිකුත් කරන්නේය. වචනයකට ඇතුළත් ඒ ඒ අක්ෂරයන් හෙවත් ශබ්දයන් නොයෙක් තැන්වල ඉතා ශීඝ්‍රව උපදවනු ලබන හෙයින් එක් වරට නිකුත්වන වචනයන් මෙන් අන්‍යයන්ට ඇසෙන්නේය. ඔවුන්ගේ ශ්‍රොතප්‍රසාදය හා සපගී වන්නාවූ මේ ශබ්දයෝ එයට පෙරත් අසා පුරුදු ඇත්නම්, ශබ්දය නිකුත් කළ පුද්ගලයා විසින් හඟවනු ලබන අදහස දැනගත හැකි වේ.

එබැවින් මේ වචී විඤ්ඤත්තිය, වාග් විශෙෂ ජනක චිත්තජ පඨවි ධාතුහුගේ අක්ෂරොත්පත්ති ස්ථානොපගත කර්මජ රූපයන් හා ගැටීම ප්‍රත්‍යකොට ඇති ආකාර විශෙෂයක් බව දක්වන ලදී.

## විකාර රූප

විශෙෂ වූ කාරය හෙවත් ආකාරය දක්වන රූපයෝ **විකාර රූප** නම් වෙත්. විකාර රූප තුනෙකි.

එනම්:-
1. **ලහුතා රූපය**
2. **මුදුතා රූපය**
3. **කම්මඤ්ඤතා රූපය**

**කාය විඤ්ඤත්ති වචී විඤ්ඤත්ති** යන රූපවය ද මෙයට ඇතුළත් කළ කල්හි විකාර රූප පසෙකි. එහි විස්තර යට දක්වන ලදී.

## ලහුතා රූපය

යම් රූපයක්හුගේ හෙවත් රූපයක් බළිබඳව සැහැල්ලු බවක්, සැහැල්ලු බව දැනීමක්, නො බර බවක් වේද එය රූපයාගේ ලහුතා බව හෙවත් **ලහුතා රූපය** නම් වේ.

ස්වාභාවිකව සමවූ ඍතු, චිත්ත, ආහාරාදිය සෙවුනා කල ශරීරය නීරොගීව පවත්නා බව දැනේ. නමුත් නොමනා හැසිරීම, ශරීරය වෙහෙසීම, සිත් තැවීම, නිදි අඩු බව, ශරීරය විෂ වීම, ශීතොෂ්ණ දෙකින් පෙළීම, ආහාර නොගැනීම හෝ ගැනීම නොමනා අපථ්‍ය ආහාර ගැනීම හෝ පමණට වඩා ආහාර ගැනීම හෝ ඇතිකල්හි ශරීරයේ ස්වභාවික නීරොගී බව නැතිවී බර බව දැනේ එයට පිළියම් වශයෙන් සුදුසු ආහාර පානාදිය හෝ ඖෂධාදිය හෝ ගැනීමෙන් එම බර බව දුරුකොට ශරීරයෙහි සැහැල්ලු බවක් හෙවත් නීරොගි බවක් ඇතිකර ගැනීමට හැකිවේ. ශරීරයෙහි බර බව ඇතිවන්නේ අසප්පාය සේවනය නිසා හටගත් පඨවි ආපො ආදී ධාතූන්ගේ උත්සන්න වීම හේතුකොටගෙණය. සප්පාය සෙවුන කල්හි බර බව දුරු කිරීමට උපකාර වන සේ ලහුතා රූප සහිත වූ රූප කලාපයන් පහළවීමෙන් සැහැල්ලු බවත්, අනලස බවත් ක්‍රියාකරවීමට පහසු බවත් දැනේ. ශරීරයෙහි ලැහැල්ලු බව වැටහෙන්නේ මේ ලහුතා රූප අධික රූප කලාපයන්ගේ පහළවීමෙනි.

## මුදුතා රූපය

යම් රූපයක්හුගේ හෙවත් රූපයක් පිළිබඳව මොළොක් බවක් මෘදු බවක්, නො තද බවක්, නො රළු බවක් හෝ ලිහිල් බවක් වේද එය රූපයාගේ මුදුතා බව හෙවත් **මුදුතා රූපය** නම් වේ.

අසප්පාය ඍතු චිත්ත, ආහාරාදියෙන් හෝ නොමනා හැසිරීම් ආදියෙන් හෝ ශරීරයෙහි හටගන්නා ධාතූන්ගේ වෙනස්වීම නිසා ශරීරය තද බවට හෙවත් රළු බවට පත්

වන්නේය. එවිට සප්පාය සෘතු, ආහාර, ඖෂධාදිය සේවනය කිරීමෙන් එම තද බව දුරුවී, මදින ලද හෙවත් පදම් කළ සමක් මෙන් මෘදු බවට පත් වේ. ආපො ධාතුව හීන වූ ද, පඨවි ධාතුව අධික වූද රූපකලාපයන්ගේ පහළ වීමෙන් හටගන්නාවූ මේ තද බව සුදුසු පිළියම් කිරීම කරණ කොට ගෙණ පහළ වන්නාවූ **මුදුතා රූප** අධික රූප-**කලාපයන්** නිසා දුරුවී ශරීරයෙහි මොළොක් බවක් ඇති කරවන්නේය.

## කම්මඤ්ඤතා රූපය

යම් රූපයක්හුගේ හෙවත් රූපයක් පිළිබඳව කර්මණ්‍ය බවක්, වැඩෙහි යෙදවිය හැකි බවක්, ක්‍රියාවන්ට යෝග්‍ය බවක් වේද, එය රූපයාගේ කම්මඤ්ඤතා බව හෙවත් **කම්මඤ්ඤතා රූපය** නම් වේ.

අසප්පාය සෘතු, චිත්ත, ආහාරාදිය සේවනය කිරීමෙන් ශරීරයෙහි නොයෙක් ආබාධ ඇතිවී අකර්මණ්‍ය භාවයට හෙවත් වැඩට අයෝග්‍ය බවට පත්වේ. එවිට සප්පාය සෘතු ආහාරාදිය සේවනය කිරීමෙන් අකර්මණ්‍ය භාවය දුරුවී නැවත කර්මණ්‍ය භාවයට පත්වන්නේය. කම්මඤ්ඤතා රූප අධික රූප කලාපයන්ගේ පහළවීමෙන් මනාකොට සකස් කරණ ලද සවර්ණයක් මෙන්, ශරීරය කර්මණ්‍ය බවට හෙවත් කටයුත්තට යෝග්‍ය බවට, අනුකූල බවට පත් වන්නේය.

**කම්ම, චිත්ත, සෘතු, ආහාර** යන සතර ප්‍රත්‍යයෙන් හටගන්නා රූප කලාපයන් අතුරෙන් කර්මජ රූපකලාපයන් හැර, චිත්තජ, සෘතුජ, ආහාරජ යන ත්‍රිවිධ රූපකලාපයන්හි මේ විකාර රූප ඇතිවන්නට අවකාශ තිබේ. එසේ හටගන්නා කල **ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා** යන විකාර රූප තුනම එකවර, එකම රූපකලාපයෙහි ඇතුළත්ව පහළවනු මිස වෙන් වෙන්ව හට නොගනී. ශරීරයෙහි ඇතිවන්නාවූ බර බව දුරු කොට සැහැල්ලු බව ඇති කරවන කල්හි ලහුතා රූපය බලවත් වී මුදුතා, කම්මඤ්ඤතා යන රූප වයට

වඩා ප්‍රකටව දැනෙන්නේය. එමෙන්ම තද බව දුරු කොට මෘදු බව ඇති කරවන කල්හි මුදුතා රූපය බලවත්වී ලහුතා, කම්මඤ්ඤතා යන රූප වයට වඩා ප්‍රකටව දැනෙන්නේය. අකර්මණ්‍ය භාවය පහකොට කර්මණ්‍ය භාවය ඇති කරවන කල්හි කම්මඤ්ඤතා රූපය බලවත්වී ලහුතා මුදුතා යන රූප වයට වඩා ප්‍රකටව දැනෙන්නේය.

## ලක්ෂණ රූප

ලක්ෂණ රූප සතරෙකි. එනම් :

1. උපචය රූප
2. සන්තති රූප
3. ජරතා රූප
4. අනිච්චතා රූප

රූපයන් පිළිබඳව ඒ ඒ ක්‍රියාවන් හෙවත් අවස්ථාවන් හැඳින ගැනීමට උපකාරවන උත්පාදාදී ලක්ෂණයන්ගෙන් යුක්ත රූප ලක්ෂණ රූප නම් වේ.

සියළුම රූප කලාපයන්ට ඉපදීමය හෙවත් උත්පාදය, දිරීමය හෙවත් ජරාවය, බිඳීමය හෙවත් භඞ්ගය යයි අවස්ථා තුනෙක් ඇත්තේය.

කර්මජ රූපයන් පිළිබඳ වූ උත්පාදය දෙයාකාර වේ. ගබ්භසෙය්‍යක හෙවත් මව් කුස පිළිසිඳ ගන්නා සත්ත්වයන් හට පටිසන්ධික්ෂණයෙහිම කාය දසක, භාව දසක, වත්ථු දසක යයි රූප කලාප තුනක් පහළ වේ. මෙය පළමු උත්පාදය හෙවත් ප්‍රථමයෙන් උපදින රූපයෝය. මෙසේ උපදනා රූප කලාපයන් මතුයෙහි නවත් බොහෝ රූප කලාපයන්ගේ උත්පාදය හෙවත් පහළවීම ඇතිවන නිසා සත්ත්වයාගේ වැඩීම ඇතිවේ. මෙය මතු මත්තෙහි වැඩෙන රූපයෝයි. මෙසේ මතු මත්තෙහි වැඩෙන්නාවූ රූප කලාපයෝ වක්ඛු දසක, සෝත දසක, ඝාණ දසක, ජිව්හා දසක යන සතර රූප කලාපයන්ගේ පහළවීමෙන්

සම්පූර්ණ වන්නේ ය. මනුෂ්‍යයන්ට වනාහි පටිසන්ධියේ සිට එකොළොස්වන සති අන්තයේදී හෙවත් සත් සැත්තෑ වන දිනය වන විට මෙකී සතර රූප **කලාපයන්ගේ** පහළවීමත් සමගම ඒ සත්ත්ව සන්තානයෙහි ඇතිවිය යුතු රූප පරම්පරා සියල්ලම වැඩී අවසන් වේ. මන්දායුෂ්ක යනවත් ස්වල්ප කලක් ජීවත්වන්නාවූ සත්ත්වයන්ට සම්පූර්ණ ආයතන ඇතිවීමට එ පමණ කලක් ගත නො වේ.

මෙසේ පළමුකොට පහළවන්නාවූ **කාය දසක, භාව දසක, වස්තු දසක** යන රූප කලාපයන්ගේ උත්පාදයත්, එම රූපයන් මතුයෙහි වැඩෙන්නාවූ **චක්ඛු දසක, ශෝත දසක, ඝාණ දසක, ජිව්හා දසක** යන සතර රූප කලාපයන්ගේ වැඩීම අවසන් වන තෙක් වැඩෙන්නාවූ රූපයන්ගේ උත්පාදයත් **උපචය රූප** නම් වෙත්. **සංසේදජ, ඕපපාතික** යන සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධික්ෂණයෙහි ඒ ඒ සත්ත්වයන්ට ඇතිවන ආයතන සම්පූර්ණව පහළවන බැවින් රූපයන් පිළිබඳ පළමු ඉපදීමත්, මතු **මතුයෙහි** වැඩෙන රූපත් එයම වන්නේය. එබැවින් **උපචය රූපය** යයි කී කල්හි මෙකී රූපයන්ගේ උත්පාද අවස්ථාව හෙවත් උත්පාද **ලක්ෂණය** ඇති රූපය බව දත යුතුයි.

සත්ත්ව ශරීරයෙක්හි ඇතිවිය යුතු රූප පරම්පරා සියල්ලම වැඩී අවසන් වූ පසු ඒ ශරීරයාගේ පැවැත්ම ඇතිකරවනු පිණිස, නිරුද්ධ වන්නාවූ රූප කලාපයන් වෙනුවට සන්තතිය **කඩ** නොකොට, අභිනව රූප කලාප නිරන්තරයෙන්ම පහළ **වන්නේය**. මෙසේ සන්තතිය නොබිඳ පවත්නා රූපයන්ගේ උත්පාද ලක්ෂණය ඇති රූපයන්ට **සන්තති රූප** යයි කියනු ලැබේ.

මෙසේ පළමුව හටගන්නාවූ ද, මතු මතුයෙහි වැඩෙන්නා වූ ද **උපචය රූප**යන්ට හා සන්තතිය බිඳිය නොදී හටගන්නා වූ සන්තති රූපයන්ට ද **ජාති රූප** යයි කියන ලදී.

**චිත්තජ, ඍතුජ, ආහාරජ** රූපයන් පිළිබඳව පළමු පහළවීම සහ වැඩීම වශයෙන් ඇතිවන රූප **උපචය රූප** වශයෙන් ද, පැවැත්මේදී නැවත නැවතත් උපදින්නාවූ රූප කලාපයන්ගේ උත්පාදය **සන්තති රූප** වශයෙන්ද සැළකිය යුතුයි

රූප කලාපයාගේ උත්පාදයෙන් පසු ඒ රූපයෝ ක්‍රම-යෙන් දිරීමට පත්වේ. මෙය සැම රූපයන්ටම සාධාරණ ලක්‍ෂණයක් බව දතයුතු. නො දිරන්නාවූ රූපයක් නම් නැත රූප කලාපයෝ ඇසට නොපෙනෙන බැවින් එහි උත්පාදයත්, ජරාවත් නොපෙනේ. මෙසේ දිරීම් ලක්‍ෂණය ඇති රූපයට **ජරතා රූපය** යයි කියති. කුඩා කාල-යේදී ශරීරයාගේ වැඩීම ප්‍රකට බැවින් දිරීම අප්‍රකට වේ. නමුත් ශරීරය වැඩි අවසන් වූ පසු දිරීම ප්‍රකට වන්නට ආරම්භ වේ. හිස කෙස් පැසීම, දත් වැටීම, ඇඟ රැලි වැටීම යනාදියෙන් ජරාව තදින් බල පවත්නා බව අව-බෝධ වේ. හිසකෙස් පැසීම් ආදිය දිරීමම නොව දිරීම ඇතිවූ බව පළකරවන එක්තරා ලක්‍ෂණයෙකි. රූපයාගේ ආයුෂ කාලයෙන් එනම් සතළොස් චිත්තක්‍ෂණය හෙවත් කුඩා චිත්තක්‍ෂණ එක්පනසෙන් පළමුවෙනි කුඩා චිත්ත-ක්‍ෂණය ඒ රූපයාගේ උත්පාදය හෙවත් **උපචය රූපය** නම් වේ. දෙවෙනි කුඩා චිත්තක්‍ෂණය පටන් පනස්වන චිත්තක්‍ෂණය දක්වා දිරීමට පැමිණි කාලය බැවින් ඒ කුඩා චිත්තක්‍ෂණය එකුන් පනස **ජරතා රූපයා** ගේ ආයුෂය වේ. මෙසේ දිරා අවසන් වන්නේ පනස් එක්වන කුඩා චිත්තක්‍ෂණයේදී ය එතැන්හිදී රූපයාගේ භඞ්ගය හෙවත් නිරුද්ධය ඇතිවේ එබැවින් පනස්එක්වන චිත්තක්‍ෂණයට පැමිණි රූපය **අනිච්චතා රූපය** බව දත යුතුයි.

### රූපයෙහි ආයුෂය

අටවිසි රූපයන් අතුරෙන් **විඤ්ඤත්ති රූප දෙක** සහ **ලක්‍ෂණ රූප සතර** හැර ඉතිරි දෙවිසි රූපයන්ගේ ආයුෂය චිත්තක්‍ෂණ සතළොසකි හෙවත් කුඩා චිත්තක්‍ෂණ එක් පනසෙකි.

**විඤ්ඤත්ති රූපයන්**ගේ ආයුෂය එක් චිත්තක්ෂණයකි හෙවත් කුඩා චිත්තක්ෂණ තුනෙකි.

**උපචය, සන්තති, අනිච්චතා** යන රූපයන්ගේ ආයුෂය එක් කුඩා චිත්තක්ෂණයකි.

**ජරතා රූපයා** ගේ ආයුෂය කුඩා චිත්තක්ෂණ එකුන් පනසෙකි (49).

## රූප විභාගය

**නිෂ්පන්න රූප, අනිෂ්පන්න රූප** යයි රූපයෝ විවිධ වේ. එයින් **නිෂ්පන්න රූපයෝ** නාම් කර්මාදී ප්‍රත්‍යයන් ගෙන් නිපදවන ලද රූපයෝ යි. කර්මාදි ප්‍රත්‍යයන් ගෙන් නූපදවන ලද රූපයෝ **අනිෂ්පන්න රූපයෝයි.** නිෂ්පන්න රූපයෝ අටළොසකි. අනිෂ්පන්න රූපයෝ දස දෙනෙකි නිෂ්පන්න රූපයන්ට **සවභාව රූප** යයි ද, **සලක්ෂණ රූප** යයි ද, **රූපරූප** යයි ද, **සම්මසීන රූප** යයි ද, ව්‍යවහාර කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| **නිෂ්පන්න රූප** | **18** | **අනිෂ්පන්න රූප** | **10** |
| **මහා භූත රූප සතර** | **4** | **පරිච්ඡේද රූපය (ආකාශ ධාතුව)** | **1** |
| **පඨවි ධාතුව** | | **විඤ්ඤත්ති රූප දෙක** | **2** |
| **ආපො ධාතුව** | | **කාය විඤ්ඤත්ති රූපය** | |
| **තෙජො ධාතුව** | | **වාග් විඤ්ඤත්ති රූපය** | |
| **වායො ධාතුව** | | | |
| **ප්‍රසාද රූප පස** | **5** | **විකාර රූප තුන** | **3** |
| **චක්‍ෂු ප්‍රසාද රූපය** | | **ලහුතා රූපය** | |
| **ශ්‍රොත ප්‍රසාද රූපය** | | **මුදුතා රූපය** | |
| **ඝ්‍රාණ ප්‍රසාද රූපය** | | **කම්මඤ්ඤතා රූපය** | |
| **ජිව්හා ප්‍රසාද රූපය** | | | |
| **කාය ප්‍රසාද රූපය** | | | |

**ගොචර රූප සතර 4**
**රූපය (වර්ණය)**
**ශබ්ද රූපය**
**ගන්ධ රූපය**
**රස රූපය**

**භාව රූප දෙක 2**
**ස්ත්‍රීභාව රූපය**
**පුරුෂ භාව රූපය**

**හදය වස්තු රූපය 1**
**ජීවිතෙන්ද්‍රිය රූපය 1**
**කබලීකාරාහාර රූපය 1**

**ලක්ෂණ රූප සතර 4**
**උපචය රූපය**
**සන්තති රූපය**
**ජරතා රූපය**
**අනිච්චතා රූපය**

සියළුම රූපයෝ ලක්ෂණ අටෙකින් එකවිධ වේ.

එනම්. **1. අහෙතුක**
**2. සප්පච්චය**
**3. සාසව**
**4. සඞ්ඛත**
**5. ලෞකික**
**6. කාමාවචර**
**7. අනාරම්මණ**
**8. අප්පහාතබ්බ**

**1. අහේතුක බව.** නාම ධර්මයන්වූ චිත්ත චෛතසික ධර්මයන් අරමුණෙහි සවිරව පිහිටීමට උපකාරවන හේතු ධර්ම සයකි. එනම්.

| | |
|---|---|
| **1. ලෝභ** | **4. අලෝභ** |
| **2. දෝෂ** | **5. අදෝෂ** |
| **3. මෝහ** | **6. අමෝහ** |

අටවිසි රූපයන්හි මේ හේතු ධර්ම එකක්වත් යෙදී නැති බැවින් සියළුම රූපයෝ අහේතුක බව කියන ලදී.

**2. සප්පච්චය** බව. රූපයන්හි සම්ප්‍රයුක්ත හේතු ධර්මයන් නැතත්, ඔව්හු **කම්ම, චිත්ත, ඍතු, ආහාර** යන සතර ප්‍රත්‍යයන් අතුරෙන් යම්කිසි ප්‍රත්‍යයකින් හටගන්නාහු වෙත්. එහෙයින් රූපයෝ ප්‍රත්‍ය සහිත බැවින් **සප්පච්චය** යයි කියනු ලැබේ.

**3. සාසව බව**. කාමාදී කෙලශයන්ට අශ්‍රවයෝ යයි කියති රූප ධර්ම, තමාම අරහයා උපන් ආශ්‍රව සහිත බැවින් **සාසව** යයි කියන ලදී.

**4. සඞ්ඛත බව.** ප්‍රත්‍යයෙන් නිපදවනු ලබන සියල්ල **සඞ්ඛතය. නිර්වාණ ධර්මය** පමණක් ප්‍රත්‍යයෙන් හටගත් ධර්මයක් නොවන බැවින් **අසඞ්ඛතය.** අනිකුත් සියළුම රූපාරූප ධර්ම ප්‍රත්‍යයෙන්ම හටගන්නා බැවින් සඞ්ඛතය. එහෙයින් රූපයෝ සඞ්ඛත **ධර්ම** බව දතයුතුයි.

**5. ලෞකික** බව. නවලොකොත්තර ධර්ම හැර සෙසු සියල්ල උපාදානස්කන්ධ සඞ්ඛ්‍යාත ලොකයෙහි ඇතුළත්ය. රූප ධර්මයෝද උපාදානස්කන්ධයක් වන බැවින් **ලෞකිකය**.

**6. කාමාවචර බව.** කාම භූමියට අයිති, කාමයෙහි ඇතුළත්වූ කාමතෘෂ්ණාවට උපකාරවන ධර්ම සියල්ලම කාමාවචර ධර්මයෝයි. රූපයද කාම ධර්මයක් වන බැවින් **කාමාවචරය.**

**7. අනාරම්මණ බව. චිත්ත** චෛතසික සඞ්ඛ්‍යාත නාම ධර්මයෝ අරමුණක් එල්බගෙණම පහළවන ධර්මයෝ යි. නමුත් රූප ධර්ම එවැනි අරමුණු නොගන්නා බැවින් අනාරම්මණය.

**8. අප්පහාතබ්බ** බව. තදඞ්ග, විෂ්කම්භණ සමුච්ඡෙදාදි වශයෙන් ප්‍රහීණ කළයුතු ධර්මයෝ පහාතබ්බ ධර්මයෝ යි. එනම්: කෙලශයෝ යි. රූපයෝ පහකළයුතු ධර්ම නොවෙති.

පහකල සූත්‍රයේ රූපයන් පිළිබඳවූ යම් ඡන්දයෙක්, රාගයෙක්, නන්දියෙක්, තෘෂ්ණාවෙක් වේ නම් එයයි. රූප තණ්හාව නැති කල කල්හි රූපයද ප්‍රහීණවූයේ වෙයි.

තවද, රූපයෝ නොයෙක් ආකාරයෙන් විවිධ වේ.

1. **අජ්ඣත්තික රූප** හා **බාහිර රූප**
2. **වත්‍ථු රූප** හා **අවත්‍ථු රූප**
3. **ද්වාර රූප** හා **අද්වාර රූප**
4. **ඉන්ද්‍රිය රූප** හා **අනින්ද්‍රිය රූප**
5. **ඕළාරික රූප** හා **සූක්ෂ්ම රූප**
6. **උපාදින්න රූප** හා **අනුපාදින්න රූප**
7. **සනිදස්සන රූප** හා **අනිදස්සන රූප**
8. **ගොචරග්ගාහික රූප** හා **අගොචරග්ගාහික රූප**
9. **අවිනිබ්භොග රූප** හා **විනිබ්භොග රූප**

**1. අජ්ඣත්තික රූප හා බාහිර රූප.**

**අජ්ඣත්තික රූප** පසෙකි. එනම්.

1. **චක්ඛු ප්‍රසාද රූපය.**
2. **සොත ප්‍රසාද රූපය.**
3. **ඝාණ ප්‍රසාද රූපය.**
4. **ජිව්හා ප්‍රසාද රූපය.**
5. **කාය ප්‍රසාද රූපය.**

ඉතිරි තෙවිසි (23) රූපයෝ **බාහිර රූප** නම් වෙත්.

ඒ ඒ පුද්ගලයන් ගේ සන්තානයන්ට ඇතුළත් වූ ධර්ම **අජ්ඣත්තික ධර්ම** නම් වේ. අධ්‍යාත්මක ආයතනයන් අතුරෙන් නාම ධර්මයක් වූ මනස හැර ඉතිරි ආයතන පස අධ්‍යාත්මක රූප ධර්මයෝයි. ඒ පිළිබඳව උපදනා මමත්වය, තෘෂ්ණාව ඉතා මහත්ය. අන්‍ය රූප පිළිබඳව එතරම් දැඩි තෘෂ්ණාවක් නැති නිසා එයට **බාහිර රූප** යයි කියනු ලැබේ.

**2. වස්තු රූප හා අවස්තු රූප**

චිත්ත චෛතසික ධර්මයන්ගේ වාසයට, හටගැනීමට, පැවැත්මට ස්ථාන වන රූප **වස්තු රූප** නම් වෙත්.

එවැනි වස්තු රූප සයකි එනම්:

1. **චක්ඛු ප්‍රසාද රූපය.**
2. **සෝත ප්‍රසාද රූපය.**
3. **ඝාන ප්‍රසාද රූපය.**
4. **ජිව්හා ප්‍රසාද රූපය.**
5. **කාය ප්‍රසාද රූපය.**
6. **හදය රූපය.**

ඉතිරි දෙවිසි (22) රූපයෝ **අවස්තු රූප** නම් වෙත්

මෙකී රූප සය විඤ්ඤාණාදීන්ට නිඃශ්‍රය වන බැවින් වස්තු රූපයයි ව්‍යවහාර වේ අවස්තු රූපයන්හි නාම ධර්මයන් ගේ වාසයක් නැත.

**3. ද්වාර රූප සහ අද්වාර රූප.**

**ද්වාර රූප සතෙකි.** එනම්:

1. **චක්ඛු ප්‍රසාද රූපය**
2. **සෝත ප්‍රසාද රූපය**
3. **ඝාණ ප්‍රසාද රූපය**
4. **ජිව්හා ප්‍රසාද රූපය**
5. **කාය ප්‍රසාද රූපය**
6. **කාය විඤ්ඤත්ති රූපය**
7. **වචී විඤ්ඤත්ති රූපය**

ඉතිරි එක් විසි (21) රූපයෝ **අද්වාර රූප** නම් වේ. **පඤ්ච විඤ්ඤාණාදී වීථි සිත් හා කාය වාග් කර්මයන් පවත්නා** ස්ථානයන්ට ද්වාරයයි කියනු ලැබේ. **උත්පත්ති ද්වාර, කර්ම ද්වාර** යයි ද්වාර විවිධ වේ. එයින් **උත්පත්ති ද්වාර** යයි

කියනු ලබන්නේ පඤ්ච ප්‍රසාද රූපයන්ටය. **කාය විඤ්ඤත්ති වචී විඤ්ඤත්ති** යන රූප වය කාය වාග් කර්ම පවත්නා ස්ථාන බැවින් එයට කර්මද්වාර යයි කියති.

## 4. ඉන්ද්‍රිය රූප සහ අනින්ද්‍රිය රූප

අධිපති භාවය දක්වන්නාවූ රූපයෝ ඉන්ද්‍රිය රූප නම් වේ ඉන්ද්‍රිය රූප අට දෙනෙකි. එනම්:

1. **චක්ඛු ප්‍රසාද රූපය**
2. **සෝත ප්‍රසාද රූපය**
3. **ඝාණ ප්‍රසාද රූපය**
4. **ජිව්හා ප්‍රසාද රූපය**
5. **කාය ප්‍රසාද රූපය**
6. **ස්ත්‍රී භාව රූපය**
7. **පුරුෂ භාව රූපය**
8. **ජීවිතින්ද්‍රිය රූපය**

ඉතිරි විසි (20) රූපයෝ අනින්ද්‍රිය රූපයෝයි. චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ කාය විඤ්ඤාණ යන පඤ්ච විඤ්ඤාණයන් කෙරෙහි අධිපති භාවය දක්වන හෙයින් පඤ්ච ප්‍රසාද රූපයන්ට ඉන්ද්‍රිය රූපයයි කියති එමෙන්ම ස්ත්‍රී ලිඞ්ග පුරුෂ ලිඞ්ග ආදියෙහි අධිපති භාවය දක්වන්නාවූ භාව රූපයන්ද ඉන්ද්‍රිය රූපයන්ටම ඇතුලත්වේ. ජීවිත රූපය කර්මජරූපයන්ගේ පාලනයට හේතුවන හෙයින් එයද ඉන්ද්‍රිය රූපයකි.

## 5. ඖදාරික රූප හා සූක්ෂම රූප

ප්‍රකෘතියෙන්ම ථූල බැවින්ද ඔවුනොවුන් ඖදාරිකව ගැටෙන බැවින්ද **ඖදාරික රූප** නම් වේ. එවැනි රූප දොළොසකි.

එනම්:

1. **චක්ඛු ප්‍රසාද රූපය**
2. **සෝත ප්‍රසාද රූපය**
3. **ඝාණ ප්‍රසාද රූපය**
4. **ජිව්හා ප්‍රසාද රූපය**
5. **කාය ප්‍රසාද රූපය**
6. **රූපය (වර්ණ රූපය)**
7. **ශබ්ද රූපය**
8. **ගන්ධ රූපය**
9. **රස රූපය**
10. **පඨවි ධාතුව** }
11. **තේජෝ ධාතුව** } **පොට්ඨබ්බය**
12. **වායො ධාතුව** }

ඉතිරි සොළොස් (16) රූපයෝ සූක්ෂම රූප නම් වෙත් ආපො ධාතුව, භාවරූපවය, හදය රූපය, ජීවිතෙන්ද්‍රිය රූපය ආහාර රූපය, පරිච්ඡෙද රූපය, **විඤ්ඤත්ති** රූපවය, විකාර රූප තුනය, ලක්ෂණ රූප සතරය යන රූප සොළොස ඉතා සියුම් වූ ද, නොසැපෙන රූප බැවින් එයට **සූක්ෂම රූප** යයි කියනු ලැබේ **ඖදාරික රූපයෝ** දුර පිහිටි නමුත් වහා ආසන්නයට හෙවත් ළඟට ගන්නට හැකි වන බැවින් එයට **සන්තිකරූප** යයි ද කියති. **සූක්ෂම රූපයෝ** එසේ ආසන්නයට පහසුවෙන් ගත නොහැකි බැවින් **දූරෙ රූප** නම් වේ එමෙන්ම ඖදාරික රූපයෝ එකිනෙකට තදින් හැපෙන රූප බැවින් එයට **සප්පටිඝ රූප** යයි ද නමෙකි. සූක්ෂම රූපයෝ එසේ නොවන හෙයින් **අප්පටිඝ රූප** නම් වේ.

## 6. උපාදින්න රූප සහ අනුපාදින්න රූප.

**තණ්හා, දිට්ඨි** වශයෙන් තදින් අල්වා ගනු ලබන්නාවූද සත්ත්ව සන්තානයෙහි සැම කල්හිම පවතින්නාවූද, කර්මයෙන් ජනිත හෙවත් කර්මජ රූපයෝ **උපාදින්න රූප** නම් වෙත්.

**කම්මජ** හෙවත් **උපාදින්න රූපයෝ** අටළොසකි. එනම්:

| | | |
|---|---|---|
| හදය රූපය | | 1 |
| පසාද රූප පස<br>භාව රූප දෙක<br>ජීවිත රූපය | ඉන්ද්‍රිය රූප අට | 8 |
| පඨවි, ආපො, තෙජො, වායො<br>වණ්ණ, ගන්ධ, රස, ඕජා | අවිනිබ්භොග රූප අට | 8 |
| පරිච්ඡේද රූපය | | 1 |
| | | 18 |

කම්මජ රූප හැර චිත්ත, ඍතු ආහාර යන ත්‍රිවිධ ප්‍රත්‍යයෙන් ජනිත රූපයෝ අනුපාදින්න රූප නම් වේ.

**7. සනිදස්සන රූප සහ අනිදස්සන රූප.**

චක්ෂුර් විඥානයෙන් හෙවත් ඇසින් දක්ක යුතු රූපායතනය නම් වූ වර්ණ රූපය **සනිදස්සන රූපය** නම් වේ. සෙසු සත් විසි (27) රූපයෝ ඇසින් නොදක්ක හැකි බැවින් **අනිදස්සන රූප** නම් වේ.

**8. ගෝචරග්ගාහික රූප සහ අගොචරග්ගාහික රූප**

ගොදුරු ගන්නා රූපයෝ **ගොචරග්ගාහික රූපයෝයි.** ගොචරග්ගාහික රූපයෝ පස් දෙනෙකි. එනම්:

1. **චක්ඛු ප්‍රසාද රූපය**
2. **සොත ප්‍රසාද රූපය**
3. **ඝාණ ප්‍රසාද රූපය**
4. **ජිව්හා ප්‍රසාද රූපය**
5. **කාය ප්‍රසාද රූපය**

මේ පඤ්ච ප්‍රසාද රූපයන් විසින් ගනු ලබන ගොදුරු නම් රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ යන විෂය රූපයෝයි. අනිකුත් තෙවිසි (23) රූපයෝ මෙසේ ගොදුරු නොගන්නා බැවින් **අගොචරග්ගාහික රූප** නම් වේ.

ගොදුරු ගැනීමේදී චක්ඛුප්‍රසාද රූපය, ආලෝකය ඇති කල්හි, පිටත තිබෙන්නාවූ රූපය ප්‍රසාද වස්තුවෙහි නොහැපී චක්ෂුර් විඥානය ඉපදීමට වස්තු භාවයෙන් උපකාර වන්නේය. එමෙන්ම සොත ප්‍රසාද රූපයද විවරාකාශය ඇතිකල්හිප්‍රසාද වස්තුවෙහි නොහැපී ශබ්ද ශ්‍රවණය පිණිස හෙවත් සෝත විඤ්ඤාණය ඉපැද්මට උපකාර වන්නේ ය. එබැවින් චක්ඛු සොත යන මේ ප්‍රසාද රූප දෙක **අසම්පත්ත ගොචරග්ගාහික රූප** නම් වෙත්. ඉතිරි රූප එනම් ඝාණ ජිව්හා, කාය යන ප්‍රසාද රූප තුන ගන්ධ, රස, පොට්ඨබ්බ යන ගොදුරු ගැනීමේදී එකිනෙකට හැපීමෙන් ඝාණ විඤ්ඤාණාදිය ඉපැදමට උපකාර වන්නේය. නොසැපුනු කල්හි ගොදුරු ගැනීමට අසමත්වේ. එබැවින් ඝාණ; ජිව්හා, කාය යන ප්‍රසාද රූප තුන **සම්පත්ත ගොචරග්ගාහික රූප** නම් වේ.

**9. අවිනිබ්භොග රූප සහ විනිබ්භොග රූප.**

| | |
|---|---|
| **1. පඨවි ධාතුව** | **5. වර්ණ රූපය** |
| **2. ආපො ධාතුව** | **6. ගන්ධ රූපය** |
| **3. තෙජෝ ධාතුව** | **7. රස රූපය** |
| **4. වායො ධාතුව** | **8. ඕජා රූපය** |

මේ රූප අට කිසි කලෙකත් ඔවුනොවුන්ගෙන් වෙන් කළ නොහැකි වේ. එකම කලාපයක් වශයෙන් සෑම කල්හිම එකවරම පහලවනු මිස වෙන් වෙන්ව පහල නොවේ. එබැවින් ඒ රූපයන්ට අවිනිබ්භොග රූපයයි කියති. සුද්ධාෂ්ඨක රූප කලාපය යයි කී කල්හි මේ රූප අටෙන් යුක්ත රූප කලාපය බව දත යුතුයි. සෙසු රූපයෝ උපදනා කල්හි මේ සුද්ධාෂ්ඨක කලාපයකට ඇතුළත්ව උපදී. වෙන් කළ හැකි රූප වන බැවින් එයට **විනිබ්භොග රූප** යයි කියනු ලැබේ.

## රූප සමුට්ඨාන

රූප උපදවන්නාවූ හේතු සතරෙකි. එනම්:

**1. කම්ම**

**2. චිත්ත**

**3. ඍතු**

**4. ආහාර**

**කර්‍මයෙන්** උපදවන්නා වූ රූප **කම්ම සමුට්ඨාන රූප** ය යි ද, **චිත්තයෙන්** උපදවන්නා වූ රූප **චිත්ත සමුට්ඨාන රූප** ය යි ද **ඍතුවෙන්** උපදවන්නා වූ රූප **ඍතු සමුට්ඨාන රූප** ය යි ද **ආහාරයෙන්** උපදවන්නා වූ රූප **ආහාර සමුට්ඨාන රූප** ය යි ද ව්‍යවහාර කරණු ලැබේ.

## කම්ම සමුට්ඨාන රූප

මෙහි **කම්ම** යනු නානාක්‍ෂණික **කුසලාකුසල චේතනාවට** නමෙකි. නානක්‍ෂණිකයන්නෙන් සහජාත නොවන පූර්‍වජන්මයෙහි සිද්ධ වූ චෙතනාව බව දත යුතුයි.

**කර්‍මජ** හෙවත් **කටත්තාරූපයන්** උපදවන චෙතනාවෝ පස්විස්සකි (25) එනම්:

| | |
|---|---|
| අකුසල චේතනා දොළොසය | 12 |
| කාමාවචර කුසල චේතනා අටය | 8 |
| රූපාවචර කුසල චේතනා පසය | 5 |
| | 25 |

මෙ කුසලාකුසල කර්‍මයන් සිද්ධ කරන්නා වූ කල්හි හෙවත් කර්‍මසිත් පහළවන්නාවූ කල්හි, එම **වර්‍තමාන චේතනාවට** එකෙණෙහිම අභිනව **කර්‍මජ රූපයන්** ඇති කිරීමට සත්ත්‍ව සන්තානයෙහි අවකාශයක් නැත්තේය. එම **කර්‍ම චේතනාව** නිරුද්ධවූ පසු, කොපමණ කල් ගතවී හෝ අවකාශලත් අවස්ථාවක **කර්‍මජ රූප** උපදවනු

ලැබේ. එසේ කටත්තා රූප උපදවන කර්මයෝ පළමු කොට ප්‍රතිසන්ධි විපාකය ගෙනදී ඉක්බිතිව රූප උපදවත්. එබැවින් අභිසංස්කරණය කරණ ලද කර්මයෝ හෙවත් මතු විපාක හා රූප ලැබෙන හැටියට සකස් කරණලද කර්මයෝම, පටිසන්ධි විපාක ගෙනදී, එම පටිසන්ධි චිත්තයාගේ පටන් චුති චිත්තක්ෂණයට පූර්වයෙහි සතළොස්වන චිත්ත ක්ෂණයාගේ උප්පාදක්ෂණය දක්වා, එක් එක් චිත්තයාගේ **උප්පාද, ඨිති, භඞ්ග** යන **ක්ෂණත්‍රයෙහිම** කර්මජ රූප නිපදවන බව දතයුතුයි. ඒ සන්තානයෙහි අන්තිමට පහළවන කර්මජ රූපයෝ, චුති චිත්තක්ෂණයාගේ භඞ්ගය හා සමගම නිරුද්ධ වන්නාහ. උද්ධච්ච සම්ප්‍රයුක්ත අකුසල චේතනාවටද, කර්මජ රූප උපදවාලීමට ශක්තිය ඇතත් පටිසන්ධි විපාක ගෙන නොදෙන හෙයින් කර්මජ රූප ඉපදවීමට අවකාශයක් නො ලැබෙන බව දත යුතුයි. අරූපාවචර කුසල චෙතනාවන්ට ප්‍රතිසන්ධි විපාක ගෙනදිය හැකි නමුත්, රූප විරාගය පිණිස ධ්‍යාන වඩා අරූපාවචර භූමියෙහි ප්‍රතිසන්ධිය ලබන බැවින් රූප නූපදවයි. තවද පටිසන්ධි විපාක හා කටත්තා රූපයන් උපදවන ශක්තියක් ලෝකෝත්තර චිත්තයන්ට නැත.

අටවිසි රූපයන් අතුරෙන් **පසාද රූප පසක්, භාවරූප දෙකක්, හදය රූපයක්, ජීවිතෙන්ද්‍රිය රූපයක්** ඒකාන්තයෙන්ම කර්මයෙන් නිපදවනු ලබන රූපයෝ යි. මේ රූප නවය අන්‍ය ප්‍රත්‍යයකින් ඉපදවිය නො හැකි වේ මේ රූප නවය හැර කර්මශක්තියෙන් අනේකාන්ත වශයෙන් **අවිනිබ්භොග රූප අටක්, පරිච්ඡෙද රූපයක්** යන නවවිධ රූපයන් උපදනු ලැබේ.

සෑම කර්මජ රූප කලාපයකම **ජීවිතෙන්ද්‍රිය රූපය** විද්‍යමාන වේ. ලෝකයෙහි අංකුරය උපදවන්නාවූ සියලු බීජ ජාතීහුම, අංකුරය උපදවා විනාශවීයාම ලෝකස්වභාව ධර්මයක් බැවින් කුසලා කුසල කර්ම සඞ්ඛ්‍යාත බීජයද, ප්‍රති- සන්ධි නාමස්කන්ධ කටත්තා රූපයන් උපදවා නිරුද්ධවී

යත්තේය. ජනිත කළ කර්මය නිරුද්ධවූ පසු ඒ කර්මජ රූප කලාපයන්ගේ පාලනයට යම්කිසි ශක්තියක් නොමැති නම් ඒ රූප කලාපයන්ගේ හට ගැනීමක් නොවන්නේය. ළදරුවා ප්‍රසූත කළ මව් නැසුනු පසු කිරිමවක් විසින් ඒ ළදරුවා පොෂණය කරන්නාක් මෙන් ඒ ජනක කර්ම ශක්තියෙන් ඇතිකරණ ලද ජීවිතෙන්ද්‍රිය රූප පරම්පරාව සෑම කර්මජ රූප කලාපයක් පාලනය කරමින් පවත්නේය. චිත්ත, ඍතු, ආහාර යන ත්‍රිවිධ ප්‍රත්‍යයෙන් උපදවන ලද රූප කලාපයන්ගේ ජීවත්වීමට ඒ ඒ ප්‍රත්‍යයන් විද්‍යමාන බැවින් ඒ ත්‍රිවිධ කලාපයන්ගේ පාලනයට නොහොත් ජීවත්වීමට ජීවිතෙන්ද්‍රියයෙන් ප්‍රයොජනයක් නැත්තේය. මේ කියන ලද්දේ කර්මයාගේ ජනක ප්‍රත්‍යතාවයයි. මේ හැර එක් චෙතනාවක් හෙවත් කර්මයක් අන්‍ය ක්‍රමයකින් නොහොත් චිත්ත, ඍතු, ආහාරාදි ප්‍රත්‍යයෙන් හටගන්නාවූ රූපයන්ට **උපස්ථම්භන** වශයෙන් හා **අනුපාලක** වශයෙන්ද ප්‍රත්‍ය වන්නේය **උපස්ථම්භන ප්‍රත්‍යය** යනු යම්කිසි ධර්මයකට අනුබල දෙන, බලවත් කරවන ප්‍රත්‍යය. **අනුපාලක ප්‍රත්‍යය** යනු යම්කිසි ධර්ම සන්තතියක් ආරක්ෂාකරන ප්‍රත්‍යය.

කුසල කර්ම විපාක වශයෙන් ප්‍රසන්නවූ ශරීරාවයවයන් හා මිහිරි කට හඬ ආදිය ලැබෙන කල්හි, කුසල කර්මය උපස්ථම්භන වශයෙන් හා අනුපාලක වශයෙන් උපකාරවී ඍතුජ චිත්තජ ආහාරජ රූප කලාපයන් සොභාමත් කරවන්නේය. කර්ම ප්‍රත්‍යයට පමණක් ශරීරයාගේ ශොභාමත් බව ඇතිකරදිය නොහැකිවේ. චිත්තජාදි ප්‍රත්‍යයෙන්ද එය කළ නොහැකි. කර්ම ප්‍රත්‍යයෙන් උපස්ථම්භනය හා පාලනය ලැබූ චිත්තජාදි ප්‍රත්‍යයන්ගෙන් හටගත් රූපයෝම එය සිද්ධ කරන්නාහ. තවද කර්ම ප්‍රත්‍යයෙන් නිපදවන ලද රූප කලාපයෙහි අන්තර්ගත තේජෝ ධාතුව හෙවත් ඍතුව, ඒ ධාතුහුගේ ස්ථිතික්ෂණයේදී පටන් ඍතුජ රූප කලාපයෝ උපදවමින් පරම්පරා සතරක්

හෝ පහක් පමණ පවත්නේය. එ මෙන්ම එහි ඇති ඕජා රූපයෝද, බාහිර ඕජා රූපයන් හා සංසර්ගය ඇති කල්හි ආහාරජ රූප පරම්පරා උපදවන්නාහුය.

පටිසන්ධි චිත්තයාගේ උප්පාදක්ෂණය පටන් සෑම කුඩා චිත්තක්ෂණයක් පාසාම කර්මජ රූප කලාපයෝ තිදෙනා බැගින් උපදවන්නාහ. මේ රූප කලාපයන්ට සතළොස් චිත්තක්ෂණයක් ආයු ඇති බැවින් සතළොස් වන චිත්තක්ෂණයාගේ භඞ්ග අවස්ථාවේදී කර්මජ රූප කලාපයෝ (51 × 3=153) එක්සිය තෙපනසක් විද්‍යමාන වන්නේය. මෙසේ සත් සැත්තෑ වන දින රාත්‍රිය දක්වා කර්මජ කලාප එක්සිය තෙපනස බැගින් ශරීරයෙහි නිතර පවතී. සත් සත්තෑවන දින රාත්‍රියෙහි චක්ඛු, සොත, ඝාණ, ජිව්හා යන දසක කලාප සතර පහළවන බැවින් එතැන් සිට එක් කුඩා චිත්තක්ෂණයක් පාසා කර්මජ කලාපයෝ සත් දෙනා බැගින් පහළවන හෙයින් ශරීරයෙහි පවත්නා කර්මජ රූප කලාපයෝ (51 × 7=357) තුන්සිය සත්පනසක් ම වන්නේය මෙසේ උපදින්නාවූ කර්මජ රූප කලාපයන්ගේ හටගැනීම චුතියට සතළොස්වන චිත්තක්ෂණයට පූර්වයෙහිදී නතරවන්නේය. චුතියට පෙර සතළොස් වන චිත්තක්ෂණයේ උප්පාද අවස්ථාවේදී පහළවන්නාවූ අවසාන කර්මජ කලාපයෝ සත් (7) දෙන චුති චිත්තක්ෂණයේ භඞ්ගයත් සමග නිරුද්ධ වන්නාහ.

මෙහි දක්වන ලද්දේ නොපිරිහුණු පරිපූර්ණ ඉන්ද්‍රියන් ඇති ගබ්භ සෙය්‍යක සත්ත්ව සන්තානයෙහි පහළවන රූපයෝයි. ඉන්ද්‍රිය විකලත්වය ඇති කල්හි ඒ ඒ ඉන්ද්‍රියයන් සඳහා හටගන්නා කර්මජ කලාප හට නොගන්නා බව දත යුතුයි.

### චිත්ත සමුට්ඨාන රූප

කර්ම සංඛ්‍යාත චේතනාවට මෙන් ඇතැම් චිත්තයන්ටද රූප උපදවන ශක්තියක් තිබේ. මෙහි චිත්තය යයි කී කල්හි සසම්ප්‍රයුක්ත සිත හෙවත් චෛතසික ධර්මයන්ගේ

සහයෝගය ලත් සිත බව දත යුතුයි. සිතක් පිළිබඳව උප්පාද, ඨිති භඞ්ග යන තුන් අවස්ථා අතුරෙන් උප්පාද අවස්ථාව බලවත්ය. එබැවින් සිතින් උපදවනු ලබන රූපයෝ එහි උප්පාද අවස්ථාවේදීම උපදී. ඨිති භඞ්ග අවස්ථාවන්හි රූප ඉපදවීමට ශක්තියක් නැත. කර්මය නිරුද්ධවූ පසු එහි රූප උපදනා ශක්තිය ඇති නමුත් සිත්වලට ඔවුන්ගේ නිරුද්ධයෙන් පසු රූප ඉපදවිය නොහැකිය.

අසූ නවයක් (89) සිත් අතුරෙන් **දෙපස් විඤ්ඤාණ යන්මද අරූපාවචර විපාක සිත් සතරමද** යන තුදුස් (14) චිත්තයන් හැර ඉතිරි සිත් පන් සැත්තෑවට (75) චිත්තජ රූප ඉපදවිය හැකිය. එසින් උපදවන රූපයෝ පසළොසකි. (15) එනම්:

| | |
|---|---|
| අවිනිබ්භොග රූප | 8 |
| පරිච්ඡේද රූපය | 1 |
| ශබ්ද රූපය | 1 |
| විකාර රූප තුනය | 3 |
| විඤ්ඤත්ති රූප දෙකය | 2 |
| | 15 |

මේ පසළොස් රූපයන් අතුරෙන් **විඤ්ඤත්තිමය** ඒකාන්ත වශයෙන්ද ඉතිරි තෙළෙස් (13) රූපයෝ අනේ-කාන්ත වශයෙන්ද උපදවනු ලැබේ

රූප ඉපදවිය හැකි පන්සැත්තෑ චිත්තයන් අතුරෙන් **ප්‍රතිසන්ධි චිත්තයද, අරූපී බ්‍රහ්මයන්ගේ චිත්තයෝද රහතන්වහන්සේගේ චුති චිත්තයද** රූප නුපදවති.

සතර අරූපධ්‍යාන ලබනු පිණිස කර්මස්ථාන භාවනා කරන්නාවූ යෝගාවචර තෙම, රූපය ඇති කල්හි සියළු දුක්ඛයන්ට භාජන වන බැවින්ද, සාමාන්‍යයෙන් කාය-විඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති දෙකෙන් හටගන්නාවූ සියළු

කාය කර්ම වචී **කර්මයෝ** රූපයෙන්ම හටගන්නාහුයයි, රූපයෙන් වෙන්වූ භූමියක් **ලබනු** පිණිස අරූපධ්‍යාන උපදවන්නේය. මෙසේ අරූපාවචර ධ්‍යාන වඩා රූප නැත්තාවූ අරූප භූමියෙහි උපදවන හෙයින් **අරූපාවචර විපාක සිත් සතර** රූප **ජනක** නොවන්නේය. එහි රූප ඉපදවීමට තැනක් නැති හෙයිනි.

දෙපස් විඤ්ඤාණයෝ ඉතා දුබලය. එහි යෙදෙන චෛතසිකයෝ නම් සබ්බචිත්ත සාධාරණ චෛතසික සත් දෙනා පමණය. **හේතු සහ ධ්‍යානාඞ්ග නැති හෙයින් රූප ඉපදවීමට ශක්තියක් නැත** ධ්‍යානාඞ්ගයෝ රූප ඉපදවීමෙහි විශෙෂ හේතු ලෙස සලකනු ලැබේ. ධ්‍යානාඞ්ගයෝ **නම් විතක්ක, විචාර, පීති, එකග්ගතා සොමනස්ස, දොමනස්ස, උපෙක්ෂා** යන චෛතසිකයෝය. ඒපඤ්ච විඤ්ඤාණයන්හි යෙදෙන චෛතසිකයෝ නම් **ඵස්ස, වෙදනා, සඤ්ඤා, චෙතනා, ඒකග්ගතා ජීවිතෙන්ද්‍රිය, මනසිකාරය** යන සබ්බචිත්ත සාධාරණයෝයි. සුඛසහගත කායවිඤ්ඤාණයෙහි සුඛ ධ්‍යානාඞ්ගයද දුක්ඛසහගත කාය විඤ්ඤාණයෙහි යෙදෙන දුක්ඛ සඞ්ඛ්‍යාත අකුසල ධ්‍යානාඞ්ගයද, සිත් සියල්ලෙහිම යෙදෙන එකග්ගතා ධ්‍යානාඞ්ගයද මේ විඤ්ඤාණයෝ දස දෙනා කෙරෙහි ඇතුළත් බව පෙනෙතත්, ධ්‍යානාඞ්ගයෝ නොයෙදෙන බැවින් රූප ඉපදවීමේ ශක්තියක් නැතැයි දක්වා තිබෙන්නේ කවර හේතුවක් නිසාදැයි සැක කළ හැකියි. **සුඛ, දුක්ඛ, පීති, එකග්ගතා ආදී චෛතසිකයෝ විතර්කය පසුකොට ඇතිකල්හිම ධ්‍යානාඞ්ග නම් වෙති.** මේ දෙපස් විඤ්ඤාණයන්හි ඇත්තාවූ සුඛාදී ධර්මයෝ විතර්ක සම්ප්‍රයුක්ත නොවන හෙයින් හෙවත් ඒ චෛතසිකයන් සමග විතර්ක චෛතසිකය නොයෙදෙන හෙයින් එයට ධ්‍යානාඞ්ග යයි නො කියති.

**පටිසන්ධි චිත්තය** වනාහි එක් භවයක පහළවන්නාවූ පළමුවෙනි සිතය. පෙර ආත්ම භාවයෙහිදී ජාති, ජරා

ව්‍යාධි මරණ, සෝක, පරිදෙව, දුක්ඛ, දෝමනස්ස, උපායාසාදි දැඩි දුක්ඛයන්ට ගොදුරු වෙමින් වස්තු දුර්වලතා ඉන්ද්‍රිය දුර්වලතා ආදියෙන් පීඩිතව සිටින කල්හි කම්ම, කම්ම නිමිති, ගති නිමිති යන ත්‍රිවිධ ආරම්මණයන්ගෙන් එකක් අරමුණු කොට ගෙන පහළවන්නාවූ මරණාසන්න ජවන් පසකින් යුත් අවසාන චිත්ත වීථිය කෙළවරෙහි ඇතිවන චුති චිත්ත-යෙන් ඒ භවය අත්හැර ආගන්තුග වශයෙන් අළුත් භවයකට පැමිණීමේදී පළමුව හටගන්නාවූ මේ ප්‍රතිසන්ධි චිත්තය ඉතා දුර්වලය. ඒ හා සමග උපදනා කාය දසක භාව දසක, වස්තු දසක යන ත්‍රිවිධ කර්මජ රූප කලාපයන්ට අයත් රූපයෝද දුර්වලය. එබැවින් දුර්වලවූ හෘදය වස්තු රූපය නිඃශ්‍රය කොට උපදින්නාවූ පටිසන්ධි චිත්තයට, රූප ඉපදවීමේ ශක්තියක් නැත්තේය. රූපය බලවත්වන්නේ එහි උප්පාදක්ෂණයේ නොව ඨිතික්ෂණයේදී ය.

චිත්තජ රූපයන් ඉපදවීමට පූර්ව චිත්තයෙන් ලැබෙන්-නාවූ ආසෙවන ප්‍රත්‍යය බලවත් උපකාරයකි එසේ පූර්ව චිත්තයෙන් ආසෙවන ප්‍රත්‍ය ලැබෙන්නේ චිත්තයාගේ උප්පාදක්ෂණයට මුත් ඨිති භඞ්ගක්ෂණයන්ට නොවේ. එහෙයින් චිත්තජ රූප ඉපදවීමට ශක්තිය ඇත්තේත් චිත්තයාගේ උප්පාදක්ෂණයට මුත් ඨිති භඞ්ග ක්ෂණයන්ට නොවේ. වස්තු දුර්වලතාවය, සිත අළුත් භවයෙහි මනාකොට නොපිහිටීමය, ප්‍රත්‍යයන්ගේ දුර්වලත්වය, ආගන්තුකත්වය යනාදී කරුණු නිසා ප්‍රතිසන්ධි චිත්තය රූප ඉපදවීමට නොසමත්වේ.

අරූපි සත්ත්ව සන්තානයෙහි රූප නැති හෙයින්, ඔවුන්ට උපදනා සිත් වලින් රූප නූපදවනු ලැබේ.

රහතන්වහන්සේගේ චුති චිත්තයද රූප ඉපදවීමට අසමත්ය. අවිද්‍යා තෘෂ්ණා මුල් සිඳ දැමූ, අතිශාන්තවූ සන්තානයෙක්හි පහළවන්නාවූ ද, වස්තුරූප පරම්පරාවෙහි අවසාන මොහොතවූ ද, එකෙණෙහිම නිරුද්ධ වන්නාවූ ද, අතිශයින් දුර්වල වූ ඒ සිතටද රූප ඉපදවීමේ ශක්තියක් නැත්තේය.

ප්‍රතිසන්ධි චිත්තය රූප ජනක නොවන නමුත් ඒ සිතම ඒ භවයෙහි වසනතාක් කල් මුලුල්ලෙහි භවාඞ්ග වශයෙන් පවත්නා කල්හි, චිත්තජ රූප උපදවන්නේය. එබැවින් පටිසන්ධි චිත්තයට අනතුරුව පහළවන්නාවූ පළමුවෙනි භවාඞ්ග චිත්තයාගේ උප්පාදක්ෂණයේ පටන් සෑම රූප ජනක චිත්තයන්ගේ උප්පාදක්ෂණයන්හි චිත්තජ රූප උපදවනු ලැබේ.

භවාඞ්ග චිත්තයෝ ඉතා දුර්වලය එහි අරමුණ පටිසන්ධි චිත්තයාගේ අරමුණ හෙවත් පූර්වභවයෙන් ගත් අරමුණෙක්ය. මේ භවයෙහි උපදනා අතිකුත් සිත් අතුරෙන් චුතිචිත්තයට හැර අන් සිතකට එය අරමුණු නොවේ. දුබලවූ භවාඞ්ග සිත්වලින් උපදවන්නාවූ රූපයෝද ඉතා දුබලය ශරීරය ක්‍රියාකරවීම සෙලවීම, ඉරියව් දැරීම යනාදියට උවමනා රූප ඉපදවීමට නුපුලුවන. භවාඞ්ක සිත් අධිකව පවත්නා නිද, සිටින කාලයෙහි හෙවත් නිඳ පවත්නා මොහොතෙහි ශරීරය සෘජුව තබා ගැනීමට නොහැකිවන්නේ ඒ හෙයිනි.

අභිඥ බවට පැමිණි රූපාවචර පඤ්චමධ්‍යාන කුසල ක්‍රියා දෙසිත හැර සවිසි (26) අර්පණාජවනයෝ රූප ඉපදවීම පමණක් නොව ඉරියව් වලටද උපසථම්භනය කරන්නේය. ගමන විඤ්ඤත්තියෙහි ඇතුලත් බැවින් මෙහි ගත යුත්තේ හිඳීම, සිටීම සහ නිදීම යන තුන් ඉරියව්ය.

අර්පණා ජවනයෝ නම්;:

| | |
|---|---|
| රූපාවචර කුසලක්‍රියා සිත් | 10 |
| අරූපාවචර කුසලක්‍රියා සිත් | 8 |
| ලොකෝත්තර මාර්ගඵල සිත් | 8 |
| | 26 |

**අර්පණා ජවන් සිත්** විඤ්ඤත්ති නූපදවති
වොට්ඨපන හෙවත් මනොද්වාරාවජ්ජන සිතය 1
**එකුන්තිස් කාමාවචර ජවනයෝ-**

| | | |
|---|---|---|
| අකුසල් සිත් | 12 | |
| මහා කුසල ක්‍රියා | 16 | 29 |
| හසිතුප්පාදය | 1 | |

අභිඥ කුසලක්‍රියා සිත් 2

32

යන දෙතිස් චිත්තයෝ කාය වාග් විඤ්ඤත්ති උපදවන්නාහ.

**කාමාවචර ජවන්** අතුරෙන් සිනහ උපදවන්නාවූ සිත් තෙළෙසකි. (13) එනම්-

| | |
|---|---|
| සොමනස්ස අකුසල් සිත් | 4 |
| සොමනස්ස කුසල ක්‍රියා සිත් | 8 |
| හසිතුප්පාද සිතය | 1 |
| | 13 |

මේ තෙළෙස් චිත්තයන් අතුරෙන් **පෘථග්ජනයෝ** සොමනස්ස කුසලාකුසල සිත් 8 න් ද, **ශෛක්ෂයෝ** එනම් නොරහත් ආර්ය පුද්ගලයෝ සොමනස්ස දිට්ඨිගත විප්‍රයුක්ත දෙසිතය, සොමනස්ස කුසල් සිත් සතරය යන සිත් සයෙන් ද (6), **රහත්හු** සොම්නස් ක්‍රියා සිත් පසෙන්ද (5), **බුදුහු** සොමනස්ස ඤාණසම්ප්‍රයුක්ත ක්‍රියා දෙසිතෙන්ද සිනහ පහළ කරති. හසිතොත්පාදය බුදු පසේබුදු මහ රහත් යන ආර්යයන්ටම ලැබෙන්නේයයි ඇතැම් ආචාර්යයෝ කියති. බුදුවරයන්ට හසිතොත්පාදය උපදනා කල්හි ඤාණය පසු පස්සෙහි ගමන් කරණ බවද, අවශෙෂ රහතුන්ට ඤාණවිප්‍රයුක්තවද, උපදනා බව දක්වති ආචාර්යවාද කෙසේ වෙතත් සම්ඥ බුදුවරයෝ ඤාණසම්ප්‍රයුක්ත සිතින් සිනහ පහළ කරන බව පිළිගත යුතුයි.

හැඬීම ඇතිකරවන්නේ දෝෂමූල ජවන් සිත් දෙකෙනි. චිත්තජ ශබ්ද රූපය, වාග් විඤ්ඤත්ති රූපයත් සමගම, තම අදහස් ශබ්දානුසාරයෙන් මෙරමාහට දන්වනු කැමති කල්හි උපදවනු ලැබේ. උදරවාත ශබ්දයද, ඇතැම්විට නිදන කල්හි ශරීරයෙහි ඇතිවන වෙනත් ශබ්දයෝද චිත්තජ ශබ්ද නොව සෘතුජ ශබ්දයන් බව සැලකිය යුතුයි.

විඤ්ඤත්ති රූපවලය ලැබෙන සියලු තැන්හිම ඊර්යාපථයද ලැබෙන්නේය. අවිනිර්භෝග ශුද්ධාෂ්ටකරූප කලාපයෙහි පඨවි ධාතුව වෙන්කොට ගන්නා කල්හි අවශේෂ රූප ධර්ම සප්තකයද ලැබෙන්නාක් මෙන්, විඤ්ඤත්ති රූපය හා ඊර්යාපථයද, වෙන් නොකොට හැක්කේයි. එහෙත් ඊර්යාපථ උපදනා හැම කල්හිම විඤ්ඤත්ති රූපයන්ගේද හටගැනීමක් නොවන බව දතයුතුයි.

එමෙන්ම සිනහ උපදවන හැම සිතක්ම සෞමනස්ස සහගත සිතක් විය යුතුයි නමුත් හැම සෞම්නස් සිතින්ම සිනහ පහළකළ නොහැකි වේ.

අසූනවයක් චිත්තයන් වෙන් වෙන් වශයෙන් බෙදා රූප ඉපදවීම දක්වන්නාවූ තන්හි, **කර්මජ රූපය, චිත්තජරූපය, විඤ්ඤත්ති රූපය, ඊර්යාපථය, සිනාහසීමය** යන පසක්ම උපදවන්නාවූ චිත්තයෝ අට දෙනෙක, රූප සතරක් උපදවන්නාවූ චිත්තයෝ විසිදෙදෙනෙක, රූප තුනක් උපදවන්නාවූ චිත්තයෝ පස්දෙනෙක, රූප දෙකක් උපදවන්නාවූ චිත්තයෝ සූතිස් (34) දෙනෙක, එක් රූපයක් පමණක් උපදවන්නාවූ චිත්තයෝ සදෙනෙක, රූප නූපදවන චිත්තයෝ තුදුසෙක (14)

එය මෙසේ දතයුතුයි:–

| | සිත් | | | උපදවක රූප | | | |
|---|---|---|---|---|---|---|---|
| | නාමය | ගණන | [illegible] | චිත්තජ | විඥප්ති | ඊර්යාපථ | සිනහ සිම |
| 1 | ලොභමූල සොම්නස් සිත් | 4 | + | + | + | + | + |
| 2 | ලොභ මූල උපෙක්ඛා සිත් | 4 | + | + | + | + | — |
| 3 | දෙෂමූල සහ මෝහ මූල සිත් | 4 | + | + | + | × | — |
| 4 | දෙපස්විඤ්ඤාණ සහ අරූපවිපාක සිත් | 14 | — | — | — | — | — |
| 5 | මනොධාතු ත්‍රිකය (සම්පටිච්ඡන - 2 + පඤ්චවාරාවජ්ජන සිත | 3 | — | + | — | — | — |
| 6 | සන්තීරණ ත්‍රිකය | 3 | — | + | — | — | — |
| 7 | වොට්ඨපන සිත | 1 | — | + | + | + | — |
| 8 | හසිතුප්පාදය | 1 | — | + | + | + | + |
| 9 | සොම්නස් මහා කුසල් | 4 | + | + | + | + | + |
| 10 | උපෙක්ඛා මහා කුසල් | 4 | + | + | + | + | — |
| 11 | කාමාවචර මහා විපාක | 8 | — | + | — | + | — |
| 12 | සොම්නස් මහා ක්‍රියා | 4 | — | + | + | + | + |
| 13 | උපෙක්ඛා මහා ක්‍රියා | 4 | — | + | + | + | — |
| 14 | රූපාවචර කුසල් සිත් | 5 | + | + | + | + | — |
| 15 | රූපාවචර විපාක සිත් | 5 | — | + | — | + | — |
| 16 | රූපාවචර ක්‍රියා සිත් | 5 | — | + | — | + | — |
| 17 | අරූපාවචර කුසල ක්‍රියා | 8 | — | + | — | + | — |
| 18 | ලොකොත්තර මාර්ග ඵල | 8 | — | + | — | + | — |

මෙසේ හටගන්නාවූ චිත්තජ රූපයෝ පටිසන්ධි චිත්තයට අනතුරුව පහළ වන්නාවූ පළමුවෙනි භාවඞ්ග චිත්තයාගේ උප්පාදක්ෂණයේ සිට සෑම රූපජනක චිත්තයන්ගේ උප්පාදක්ෂණයේදී එක් එක් චිත්තජරූප කලාපයක් වශයෙන් උපදී සතළොස් චිත්තක්ෂණයකට ආයුෂය ඇති රූප බැවින් ශරීරයෙහි සෑම කල්හිම සමාන්‍ය වශයෙන් චිත්තජ රූප කලාප සතළොසක් (17) තිබිය යුතුයි. නමුත් පඤ්ච වාරික චිත්තවීථි උපදනා කල්හි පඤ්ච විඤ්ඤාණයන් අතුරෙන් එක් සිතක් උපදින හෙයින් එහි රූප ජනක ශක්තිය නොමැති බැවින් එකක් අඩුවී රූප කලාප සොළොසක් වන්නේය. මේ ක්‍රමයෙන් ශරීරයෙහි නිතර පවත්නා චිත්තජ රූපයන්ගේ සංඛ්‍යාව සොළොසක් හෝ සතළොසක් බව දතයුතුයි. චූතියට පසුවත් චිත්තක්ෂණ සොළොසක් පමණ අවසාන චිත්තජ රූපයෝ ජීවත්වෙති.

තවද චිත්තජ රූප කලාපයෙහි ඇති තෙජෝ ධාතුවත් චිත්ත පච්චය උතු සමුට්ඨාන රූප කලාපයක් ඉපදවීමට සමත් වන්නේය. ඒ තෙජෝ ධාතු ස්ථිතිප්‍රාප්ත කල්හි ඍතුජ රූප උපදවන්නාහ. මෙසේ ඍතුජ රූප කලාප පරම්පරා වශයෙන් දෙකක් හෝ තුනක් එක් චිත්තජ රූප කලාපයක් නිසා උපදින බව දතයුතුයි.

එමෙන්ම චිත්තජ රූප කලාපයෙහි ඇති ඕජා රූපසද බාහිර ඕජාව හා සංසර්ගය ඇති කල්හි චිත්තපච්චය ආහාර සමුට්ඨාන රූප කලාප පරම්පරා දෙකක් හෝ තුනක් උපදවන්නේය.

## උතු සමුට්ඨාන රූප

ඍතුව නම් ශීතෝෂ්ණ සඞ්ඛ්‍යාත තෙජෝ ධාතුවය. කම්ම, චිත්ත, ඍතු, ආහාර යන සතර ප්‍රත්‍යයෙන්ම නිපදවනු ලබන සියලුම රූප කලාපයන්හි තෙජෝ ධාතුව තිබේ. සියලු අවකාශ ලෝකයද නොයෙක් සත්ත්ව ශරීරයන් ඇති කිරීම් වශයෙන් සියලු සත්ත්ව ලෝකයද, ගස් මුල් ආදිය

ඇති කිරීම වශයෙන් සියලු **සංස්කාර ලෝකයද** පහළ කරවන උදකරවන ධර්මයක් බැවින් තේජෝ ධාතුවට **උතු** හෙවින් **සෘතු** යයි කියනු ලැබේ. මේ තේජෝ ධාතුවට නොයෙක් රූපයන් ඉපදවීමට ශක්තිය තිබේ. සෘතුවෙන් උපදවනු ලබන රූපයෝ තෙළෙසකි (13).

| | |
|---|---|
| අවිනිබ්භොග රූප | 8 |
| පරිච්ඡෙද රූප | 1 |
| ශබ්ද රූප | 1 |
| විකාර රූප | 3 |
| | 13 |

**සෘතුව** හෙවත් තෙජෝධාතුව රූප ධර්මයක් බැවින් එහි උප්පාදක්ෂණය දුර්වලය. එබැවින් තෙජෝ ධාතුහුගේ උප්පාදක්ෂණයේදී එයට සෘතුජ රූප ඉපදවිය නොහැකිය. ස්ථිතික්ෂණයට පැමිණි කල්හි තෙජෝ ධාතුව රූප උපදවන්නේය. භඞ්ගක්ෂණයේදීද රූප ඉපැද්මට ශක්තියක් නැත. සෘතුජ රූප කලාප අධ්‍යාත්ම බාහිර සන්තානයන්හි සුදුසු පරිද්දෙන් ලැබේ.

සත්ත්ව ශරීරයෙක්හි ඇත්තාවූ ඇට, මස්, ලේ නහර ආදීවූ සැම අවයවයෝද, ඇඳුම්, පැළඳුම්, යාන වාහන ආහාර යනාදීවූ සියලු පරිභොග වස්තූන්ද ගස්, ගල්, ගඞ්ගා, සමුද්‍ර, ඉර, සඳ, තරු, ආදීවූ සියලු කුදුම්භන් දෙයද සෘතුජ රූප වලින් ගහනය.

සෘතුජ රූප කලාපයෝ චතුර්විධ වේ. එනම්:

1 **කම්මපච්චය උතුසමුට්ඨාන රූප**
2 **චිත්ත පච්චය උතුසමුට්ඨාන රූප**
3 **උතු පච්චය උතුසමුට්ඨාන රූප**
4 **ආහාර පච්චය උතුසමුට්ඨාන රූප**

1 **කම්ම පච්චය උතුසමුට්ඨාන රූපයෝ** සත්ත්ව ශරීරයෙක්හි ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදය හා එකක්ෂණිකව

පහළවන්නාවූ කාය දසක, භාව දසක, වස්තු දසක යන ත්‍රිවිධ කර්මජ රූප කලාපයන්හි අන්තර්ගත තෙජෝධාතු තිදෙන ස්ථිති ප්‍රාප්ත කල්හි හෙවත් ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිති අවස්ථාවේදී බාහිර ඍතුජ රූපයෙන් උපස්ථම්භ ලැබීමෙන් එක් එක් ඍතුජ රූප කලාපය බැගින් උපද වන්නේය. ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිති ක්ෂණයේදී පහළවූ ත්‍රිවිධ දසක කලාපයන්හි අන්තර්ගත තෙජෝ ධාතු තිදෙනම ඒ සිතෙහි භඞ්ගක්ෂණයේදී ස්ථිතිප්‍රාප්ත වන බැවින් ඍතුජ රූප කලාප තිදෙනෙක් උපදවන්නේය. මේ ක්‍රමයෙන් ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිති ක්ෂණයේ සිට සෑම කුඩා චිත්තක්ෂණයක් පාසාම **කම්ම පච්චය ඍතුසමුට්ඨාන රූප** කලාප තුන තුන බැගින් උපදවනු ලැබේ. මෙසේ උපදින්නාවූ රූප කලාපයෝ සතළොස් චිත්තක්ෂණයක් ගතවී නිරුද්ධ වන්නාහ. ප්‍රතිසන්ධියේ පටන් සතළොස් චිත්තක්ෂණයක් ගතවී අටළොස් වන චිත්තක්ෂණයාගේ උත්පාද අවස්ථාව පැමිණෙන කල්හි, කම්ම පච්චය ඍතු සමුට්ඨාන රූප කලාපයෝ එක්සිය පනස් තිදෙනෙක් (153) පහළවී ඇත්තාහ. එතැන් සිට සැත්තෑසත් (77) වන දින රාත්‍රියෙහි **චක්ඛු, ඝෝත, ඝාණ, ජිව්හා** යන සතර දසක කලාපයන්ගේ පහළවීම දක්වා මෙසේ කම්ම පච්චය ඍතු සමුට්ඨාන රූප කලාපයෝ එක්සිය තෙපනසක් ශරීරයෙහි පවත්නාහ. චක්ඛු ආදී සතර කලාපයන් පහළවූ තැන් සිට එක් කුඩා චිත්තක්ෂණයකදී කර්මජ රූප කලාප සතක් එනම් කාය, භාව, වස්තු, චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, යනාදී වශයෙන් පහළවීමෙන් එක් කුඩා චිත්තක්ෂණයෙක්හි පවත්නා කර්මජ රූප කලාපයෝ (51 × 7 = 357) තුන්සිය සත් පනසෙක් වෙති. මේ තුන් සිය සත්පනස් කර්මජ රූප කලාපයන්හි ඇත්තාවූ තෙජෝධාතු තුන්සිය සත්පනසම ස්ථිති ප්‍රාප්ත කල්හි එක් එක් කම් පච්චය ඍතු සමුට්ඨාන රූප කලාපය බැගින් උපදවන බව දතයුතුයි. මෙපමණක් නොව මෙසේ උපදවනු ලබන්නාවූ සෑම කම්මපච්චය ඍතු සමුට්ඨාන රූප

කලාපයකම අන්තර්ගත තෙජෝ ධාතුව ස්ථිති ප්‍රාප්ත කල්හි නැවතත් ඍතු සමුට්ඨාන රූපකලාපයක් උපදවන්නේය. ඒ රූප කලාපයෙහි තෙජෝ ධාතු තොමෝ නැවතත් ඍතු සමුට්ඨාන රූප කලාපයක් උපදවයි මෙසේ එක් කර්මජ රූප කලාපයක් නිසා ඍතුජ රූප පරම්පරා සතරක් හෝ පසක් උපදින බව සැලකිය යුතුයි.

2 **චිත්ත පච්චය ඍතුසමුට්ඨාන රූපය** පටිසන්ධි චිත්තයට අනතුරුව පහළවන ප්‍රථම රූප ජනක භවාඞ්ග චිත්තයාගේ උප්පාදක්ෂණයේදී උපදින ප්‍රථම චිත්තජ රූප කලාපය ස්ථිති ප්‍රාප්තවූ කල්හි හෙවත් පළමුවෙනි භවාඞ්ග සිතෙහි ස්ථිති අවස්ථාවේදී එම චිත්තජ රූප කලාපයට ඇතුළත් තෙජෝ ධාතුව **චිත්ත පච්චය ඍතුසමුට්ඨාන රූප කලා-පයක්** උපදවන්නේය. එතැන් පටන් සෑම චිත්තජ රූප කලාපයකම ඇති තෙජෝ ධාතු තොමෝ ස්ථිති ප්‍රාප්ත කල්හි **චිත්තපච්චය ඍතුසමුට්ඨාන රූප** උපදවමින් චිත්තක්ෂණ සතළොසක් ආයු වළඳ නිරුද්ධ වන්නේය. එබැවින් සෑම කල්හිම චිත්ත පච්චය ඍතු සමුට්ඨාන රූප කලාපයෝ සතොළොස් දෙනෙක් සිටිය යුතුයි. විපස්සනා විශුද්ධඥාණයන් උපදනා කල්හි චිත්තජ රූප නූපදින බැවින් ඒ අවස්ථාවන්හි එක් රූපකලාපයක් අඩුවේ. එවිට ශරීරයෙහි ඇති වන්නේ චිත්ත පච්චය ඍතු සමුට්ඨාන රූප කලාප සොළොසකි. එබැවින් ශරීරයෙහි නිරන්තර යෙන්ම චිත්ත පච්චය ඍතු සමුට්ඨාන රූප කලාපයෝ සොළොසක් හෝ සතළොසක් පවත්නා බව දතයුතුයි. මෙසේ උපදවනු ලබන එක් චිත්තපච්චය ඍතු සමුට්ඨාන රූප කලාපයක ඇති තෙජෝ ධාතුව ස්ථිති ප්‍රාප්ත කල්හි නැවතත් ඍතුජ රූප කලාපයක් උපදවයි. මෙසේ එක් චිත්තජ රූප කලාපයක් නිසා ඍතුජ රූප කලාප පරම්පරා දෙකක් හෝ තුනක් ඇතිවන බව සැලකිය යුතුයි. කර්මජ රූප ඉපදීම චුතියට සතළොස්වන චිත්තක්ෂ-ණයට පෙර නතරවන නමුත් චිත්තජ රූපයෝ චුති චිත්තය දක්වාම උපදී. එබැවින් අවසාන චිත්ත පච්චය

උතු සමුට්ඨාන රූපයෝ නිරුද්ධ වන්නේ චුති චිත්තයට චිත්තක්ෂණ පසළොසක් හෝ සොළොසක් පමණ ගත විමෙනි.

3 **උතුපච්චය උතු සමුට්ඨාන රූප** සෑම ඍතුජ රූප කලාපයකම ඇත්තාවූ තෙජෝ ධාතුහු ස්ථිති ප්‍රාප්ත කල්හි ඍතුජ රූප කලාපයන් උපදවන්නාහ. එක් ඍතුජ රූප කලාපයක් නිසා ඇතිවන්නාවූ ඍතුජ රූප කලාපයන්ගේ සඞ්ඛ්‍යාව නියම කළ නො හැකි වේ. එක් තැනෙක්හි එක වර පවත්නා උතු පච්චය උතුජ රූප කලාපයෝ එක් පනසෙකි (51).

4. **ආහාරපච්චය උතුසමුට්ඨාන රූප.** සෑම ආහාරජ රූප කලාපයකම ඇත්තාවූ තෙජෝ ධාතුහු ස්ථිති ප්‍රාප්ත කල්හි එක් එක් ඍතුජ රූප කලාපය බැගින් උපදවන්නේය. එසේ උපදවන ඍතුජ රූපයන්ට ආහාරපච්චයඋතුසමුට්ඨාන රූපයයි කියති. එක් ආහාරජ රූප කලාපයක් නිසා උතු සමුට්ඨාන රූප කලාපයෝ දහයක් හෝ දෙළසක් පමණ උපදවනු ලැබේ. සත්ත්ව ශරීරයෙහි එක් තැනෙක පවත්නා **ආහාර පච්චය උතු සමුට්ඨාන රූපයන්ගේ** සඞ්ඛ්‍යාවද එක පනසෙකි (51). ආහාර පච්චය උතුසමුට්ඨාන රූපයෝ චුති චිත්තයට පසු නූපදනා හෙයින් චුති චිත්තයෙන් චිත්තක්ෂණ සොළොසක් සතළොසක් පමණ ගතවන තුරු ඒ රූප පරම්පරා පැවත නිරුද්ධ වෙති. ඍතුජ ශබ්ද රූපසද ඍතුජ රූප කලාපයන්ගේම සංඝට්ටනයෙන් ඇතිවන බව සැලකිය යුතුයි. එයට අවිඤ්ඤාණක ශබ්ද රූපයයිද කියනු ලැබේ.

සත්ත්වයාගේ මරණයෙන් පසු මෘත ශරීරයෙහි ඉතුරු වන්නේ ඍතුජ රූපයෝ පමණය. මළ සිරුරෙහි කර්මජ, චිත්තජ, ආහාරජ, රූපයන්ගේ පහළවීමක් නොවන්නේමය.

## ආහාර සමුට්ඨාන රූප

**ආහාරය** යනු **ඕජා** රූපයට නමෙකි. ඕජාව අටවැනි කොට ඇති රූපාදීහු එලවත්නුයි **ආහාර** නම්වේ. **කබලී-කාරාහාරය, ඵස්සාහාරය, මනොසඤ්චෙතනාහාරය, විඤ්ඤාණාහාරය,** යන චතුර්විධ ආහාරයන් අතුරෙන් **කබලිකාරාහාරය** ඕජඃට්ඨමක රූප උපදවන රූප ධර්මයකි.

**කම්ම, චිත්ත, සෘතු, ආහාර,** යන සතර ප්‍රත්‍යයෙන්ම උපදවනු ලබන සෑම රූප කලාපයකම **ඕජා රූපය** ඇත්තේය.

මේ **ඕජාව**

1. **අධ්‍යාත්මගත ඕජාය**
2. **බාහිරගත ඕජායයි** ද්විවිධ වේ

සත්ත්ව සන්තානය පිළිබඳ වූ කර්ම සමුට්ඨානාදි වශයෙන් චතුර්විධවූ රූප කලාපයන්ට ඇතුළත් ඕජා රූපය **අධ්‍යාත්මගත ඕජා** නම් වේ.

**අසිත, පීත, ඛායිත, සායිත** වශයෙන් චතුර්විධවූ සෘතුජ රූප කලාපයන්ටම ඇතුලත් ඕජා රූපය **බාහිරගත ඕජා** නම් වේ.

ඕජාව රූප ධර්මයක් බැවින්, එහි බලවත්වූ ස්ථිතික්ෂණ යේදී මිස, උප්පාද, භඞ්ග යන ක්ෂණවයෙහිදී රූප නූපදවන්නේය. එහෙත් **අධ්‍යාත්මගත ඕජාව** සහ **බාහිරගත ඕජාව** යන ද්විවිධ ඕජාවන්ගේම සංසර්ග වශයෙන් ලබන ලද උපස්ථම්භ ඇත්තේම **ආහාරජ රූප** උපදවයි. එබැවින් ආහාර වශයෙන් බත් පිඬු ආදිය අනුභව කරන කාලයෙහි ආහාරජ රූප උපදවනු ලබන බව දක්වන ලදි.

සත්ත්වසන්තානයෙහි පැතිරෙවන්නාවූ අධ්‍යාත්මගත ඕජාව ආහාරපානාදියෙන් ලබන ලද ඕජාවන්ගේ උපකාරය නැති කල්හි ආහාරජ රූප නූපදවයි. අධ්‍යාත්මික සන්තානයෙහි විද්‍යමානවූ **කර්මජ කලාපයෙහි ඕජාවය,**

චිත්තජ කලාපයෙහි ඕජාවය, උතුජ කලාපයෙහි ඕජාවය යන ත්‍රිවිධාකාර වූ ඕජා රූපයෝ තම තමාගේ ඨිති කාලයට පැමිණි කල්හි අධ්‍යාත්මික සන්තානයෙහිම බහිද්ධා ඕජාව ලැබීමෙන් ඒ ඕජාව ශරීරයෙහි පැතිර ගිය කල්හිම ආහාර සමුට්ඨාන රූප උපදවත්. කර්මජ රූපාදිය හටනොගන්නා මළ සිරුරට කොපමණ ආහාරපානාදිය ඇතුළත් කළත්, ආහාරජ රූපයෝ නූපදිත්. ගස් වැල් ආදිය වැඩීමටද ආහාර උවමනාවේ. පොහොර ආදිය දැමූ කල්හි එය උරා ගැනීමෙන් ගස් වැල් ජාතීහු වර්ධනය වන්නේය. නමුත් ඒ වැඩෙන්නේ ආහාරජ රූපයන්ගේ පහළවීමෙන් නොව සෘතුජ රූප කලාපයන්ගේ පරම්පරාවෝ වැඩීමෙන්ය. ජීවත්වන සත්ත්ව ශරීරයක මිස අන් තැනෙක ආහාරජ රූපයන්ගේ හටගැනීමක් නැත්තේමය. අනුභව කරණ කාලය යයි කී කල්හි, මුඛයෙන් ආහාර පානාදිය ශරීරගත කිරීම පමණක් නොව, සම්, මස්, ලේ නහර, ආමාශ, ආන්ත්‍ර, ආදීන්ට ඇතුල් කරනු ලබන පෝෂ්‍ය දියක රස ද්‍රව්‍යයන්ද ගත යුතුයි. ඒ සියල්ලම බාහිරගත ඕජා සඞ්ඛ්‍යාවට ඇතුළත් වන හෙයිනි.

සත්ත්ව ශරීරයෙහි සෑම තැනකම අධ්‍යාත්මගත ඕජා රූපයෝ ඇත්තාහ. ආහාර පානාදිය ගන්නා කල්හි ඕජා අධික බාහිර ඍතුජ කලාපයෝ ශරීර ගතවී ලේධාතුව හා මිශ්‍රව ශරීරයෙහි සෑම තන්හිම පැතිර යයි. මෙසේ පැතිර පවත්නා කල්හි අධ්‍යාත්මගත බාහිරගත ඕජාවන්ගේ සංසග්ග ඇති වීමෙන් ආහාරජ රූප හටගෙන ඒ ඒ රූප පරම්පරාවන් ගේ නොපිරිහීමටත් වර්ධනයටත් උපකාර වන්නේය. ශරීරයෙහි යම් තැනක මේ ආහාරජ රූපයෝ හටනොගන්නේ නම් ඒ ස්ථානයෙහි වැඩීම හා රූප පරම්පරාවන්ගේ පැවැත්ම දුබලවී ක්‍රියා ශක්තියද හීන වන්නේය. රූප පරම්පරාවන්ගේ පැවැත්මට බාධා පමුණුවන්නාවූද, ශරීරයට අහිතවූද අධික ශීතෝෂ්ණාදිය ඇති කරවන්නාවූද රූප පරම්පරාවන් විනාශ කරවන්නාවූද ආහාරපාන ඖෂධාදිය ගත් කල්හි ශරීරයෙහි

ස්වාභාවික ගතිය වෙනස්වී ශරීරයාගේ පැවැත්මට නො ගැලපෙන විෂ සඞ්ඛ්‍යාත රූප කලාපයන් හටගෙන මරණය පවා සිද්ධ කරවන්නේය. ශරීරය විෂ කරවන රූපයෝ, ආහාරජ රූප නොව, ආහාරජ රූප වෙනුවට හටගන්නාවූ ඍතුජ රූප කලාපයෝය

මව විසින් ගනුලබන ආහාර පානාදියෙන් පිළිසෙලවූ ආහාරජ රූප පරම්පරාව මව් ගැබෙහි වැඩෙන ළදරුවාගේ පෝෂණය පිණිස උපකාර වෙමින් ළදරුවාගේ අධ්‍යාත්ම ගත ඕජා රූපයන් හා සංසර්ගය ඇතිවීමෙන් ආහාරජ රූප උපදවා අධ්‍යාත්මගත රූප පරම්පරාවන්ගේ වර්ධනය ඇති කරවන්නේය.

ඕජාවෙන් හෙවත් ආහාරජ වශයෙන් උපදවනු ලබන රූපයෝ දොළොසෙකි.

එනම්:–

| | |
|---|---|
| අවිනිබ්භොග රූප | 8 |
| පරිච්ඡේද රූප | 1 |
| විකාර රූප | 3 |
| | 12 |

රූප කලාප වශයෙන් ශුද්ධාෂ්ටක කලාපයත්. ලහුතාදී ඒකා දසක කලාපයත් යන කලාප වශ උපදවනු ලැබේ.

තවද කම්ම, චිත්ත, ඍතු ආහාර යන සතර ප්‍රත්‍ය යෙන්ම උපදනා රූප කලාපයන්හි අන්තර්ගත ඕජා රූපයෝ ආහාර සමුට්ඨාන ර.ප උපදවන හෙයින් ආහාර සමුට්ඨාන රූපයෝ සතරාකාර වේ. එනම්.

1. **කම්ම පච්චය ආහාර සමුට්ඨාන රූප**
2. **චිත්ත පච්චය ආහාර සමුට්ඨාන රූප**
3. **උතු පච්චය ආහාර සමුට්ඨාන රූප**
4. **ආහාර පච්චය ආහාර සමුට්ඨාන රූප**

1. **කම්ම පච්චය ආහාර සමුට්ඨාන රූප.** කර්මජ රූප කලාපයන්හි ඇත්තාවූ ඕජා රූපයෝ බාහිරගත ඕජාවන්ගේ සංසර්ගය ලැබී එහි ස්ථිතික්ෂණයේදී එක් එක් කම්ම පච්චය ආහාර සමුට්ඨාන රූප කලාපය බැගින් උපදවන්නෝය.

ඕජා ඵරණයෙහි පටන් සත්ත්ව ශරීරයෙක්හි එක්වර පවත්නා කර්මජ රූප කලාපයෝ තුන්සිය සත්පනසෙහි (375) අන්තර්ගත ඕජා රූපයෝ තුන්සිය සත් පනසම කම්මපච්චය ආහාර සමුට්ඨාන රූප කලාපය බැගින් උපදවන හෙයින් තුන්සිය සත්පනස් කම්මපච්චය ආහාර සමුට්ඨාන රූප කලාපයන් ශරීරයෙහි විද්‍යමානවේ. චුති චිත්තයට පූර්වයෙහි සතලොස් වන චිත්තක්ෂණයේ උප්පාදක්ෂණයෙන් පසු කර්මජ කලාපයන්ගේ හටගැනීමක් නොවන හෙයින් අවසාන වරට කම්ම පච්චය ආහාර සමුට්ඨාන රූප උපදවනු ලබන්නෝ චුති චිත්තයට පූර්ව සතලොස් වන සිතෙහි උප්පාදක්ෂණයේදී හටගත් කර්මජ රූප කලාප සතෙහි ඕජා රූපයෝය. ඒ රූපයෝ ස්ථිති ප්‍රාප්ත කල්හි හෙවත් ඒ චිත්තයාගේ ස්ථිතික්ෂණයේදී අන්තිම කම්ම පච්චය ආහාර සමුට්ඨාන රූප කලාප සත උපදවන්නෝය එයට පසුව පැමිණෙන භඞ්ගක්ෂණයේ සිට අභිනව කම්ම පච්චය ආහාර සමුට්ඨාන රූපයෝ නූපදින හෙයින් ක්‍රමයෙන් රූප සත බැගින් එක් ක්‍ෂුද්‍ර චිත්තක්ෂණයක් පාසා අඩුවී ගොස් චුති චිත්තයාගේ භඞ්ගක්ෂණයේදී කම්ම පච්චය ආහාර සමුට්ඨානරූප තුදුසක් (14) ඉතිරි වන්නේය. ඒ තුදුසම එයට අනතුරු ක්‍ෂුද්‍ර චිත්තක්ෂණ දෙකක් පමණ ගතවීමේදී නිරුද්ධ වන්නාහ.

මෙසේ එක් කර්මජ ඕජා රූපයක් විසින් උපදවනු ලබන ආහාරජ රූපකලාපයට අයත් ඕජා රූපය නැවතත් ආහාරජ රූප කලාපයක් උපදවන්නේය. මේ ක්‍රමයෙන් එක් කර්මජ රූප කලාපයක් නිසා ඇතිවන්නාවූ ආහාරජ රූප පරම්පරාවෝ සතරක් හෝ පසක් වන්නේය.

**2. චිත්තපච්චය ආහාර සමුට්ඨාන රූප.** චිත්තජ රූප කලාපයන්හි ඇතුළත් ඕජා රූපයෝ ස්ථිති ප්‍රාප්ත කල්හි බාහිරගත ඕජාවන්ගේ සංසර්ගය ලැබීමෙන් එක් එක් චිත්ත පච්චය ආහාර සමුට්ඨාන රූප කලාපය බැගින් උපදවත්. එබැවින් සෑම මොහොතක් පාසාම ශරීරයෙහි පවත්නා සොළොසක් හෝ සතළොසක් පමණ වූ චිත්තජ රූප කලාප යන්හි අනාගත ඕජා රූප සොළොස හෝ සතළොස නිසා චිත්ත පච්චය ආහාර සමුට්ඨාන රූප කලාප සොළොසක් හෝ සතළොසක් ශරීරයෙහි නිතර පවත්නා බව සැලකිය යුතුයි මේ රූපයෝ චුතියට පසුවත් චිත්තක්ෂණ සොළො සක් පමණ ගතවී නිරුද්ධ වන්නාහ. එක් චිත්තජ රූප කලාපයක් විසින් මෙසේ උපදවනු ලබන ආහාරජ රූප පරම්පරා දෙකක් හෝ තුනක් පමණ වන්නේය.

**3. උතු පච්චය ආහාර සමුට්ඨාන රූප.** අධ්‍යාත්ම සන්තානයෙහි හටගන්නා වූ ඍතුජ රූප කලාපයන්හි ඇත්තා වූ ඕජා රූපයෝ ද ස්ථිති ප්‍රාප්ත කල්හි බාහිරගත ඕජාවන් හා සංසර්ගය ඇතිවීමෙන් උතුපච්චය ආහාර සමුට්ඨාන රූප කලාපය බැගින් උපදවත්. ශරීරයෙහි ඇත්තා වූ අනන්ත අප්‍රමාණ උතුජ රූප කලාපයන් අතුරෙන් එක් ස්ථානයෙක්හි එක් වර පවත්නා උතුජ රූප කලාපයෝ එක් පනසෙකි (51) එබැවින් එක් ස්ථාන- යක එක්වර තිබිය යුතු උතුපච්චය ආහාර සමුට්ඨාන රූප කලාපයෝ එක් පණසක් වන්නේය. මේ රූප කලාප පරම්පරාවන්ගේ අවසානය චුතිචිත්තයට සතළොස් චිත්තක්ෂණයකට පසු සිද්ධ වන්නේය. එක් උතුජ කලාප යක් නිසා ආහාරජ රූප පරම්පරා දසයක් හෝ දොළොසක් පමණ ඇති වන්නේය.

**4. ආහාර පච්චය ආහාර සමුට්ඨාන රූප.** කබලීකාරා හාර හෙවත් ආහාර වශයෙන් ගන්නාවූ බාහිර ඍතුජ රූප කලාපයන්හි ඇතුළත් ඕජා රූපයෝ ස්ථිති ප්‍රාප්ත කල්හි අධ්‍යාත්ම සන්තානයෙහිදී ආහාර පච්චය ආහාර සමුට්ඨාන රූප කලාපය බැගින් උපදවත්. ශරීරයෙහි එක් ස්ථානයක

එක්වර පවත්නා බාහිර ඕජාවෝ එක් පනසක් බැවින් එයින් උපදවනු ලබන ආහාර පච්චය ආහාර සමුට්ඨාන රූපයෝ එක් පනසක් (51) ම වන්නේය. ඒ පරම්පරා-වන්ගේ නිරුද්ධයද චුතියට චිත්තක්ෂණ සතළොසක් පමණ පසුව සිද්ධවන්නේය. එක් බාහිර ඕජා රූපයක් නිසා ආහාරජරූප පරම්පරා එකක් හෝ දෙකක් ඇති වන්නේය.

අටවිසි රූපයන් අතුරෙන් **කම්ම, ඍතු, චිත්ත, ආහාර** යන සතර ප්‍රත්‍යයෙන්ම උපදවන රූප නවයකි.

| | | | |
|---|---|---|---|
| 1 | **පඨවිධාතු** | 5 | **වර්ණරූපය** |
| 2 | **ආපොධාතු** | 6 | **ගන්ධ රූපය** |
| 3 | **තෙජොධාතු** | 7 | **රස රූපය** |
| 4 | **වායොධාතු** | 8 | **ඕජා රූපය** |
| 9 | **පරිච්ඡේද රූපය** | | |

ප්‍රත්‍යය තුනකින්- එනම් **චිත්ත, ඍතු, ආහාර** යන ත්‍රිවිධ ප්‍රත්‍යයෙන් උපදවන රූප තුනකි. එනම්

1 **ලඝුතා රූපය**
2 **මුදුතා රූපය**
3 **කම්මඤ්ඤතා රූපය**

ප්‍රත්‍යය දෙකකින්- **එනම් චිත්ත, ඍතු** යන දෙකින් උපදවන රූප එකකි. එනම් ශබ්ද රූපයයි.

එක් ප්‍රත්‍යයකින් පමණක් උපදවනු රූපයෝ එකොළොස් දෙනෙකි. එනම් කර්මප්‍රත්‍යයෙන් උපදනා රූප **නවයෙකි.**

| | | | |
|---|---|---|---|
| 1 | **චක්ඛුප්‍රසාද රූපය** | 5 | **කාය ප්‍රසාද රූපය** |
| 2 | **සොත ප්‍රසාද රූපය** | 6 | **ස්ත්‍රීභාව රූපය** |
| 3 | **ඝාණප්‍රසාද රූපය** | 7 | **පුරුෂභාව රූපය** |
| 4 | **ජිව්හා ප්‍රසාද රූපය** | 8 | **හදය රූපය** |
| 9 | **ජීවිතෙන්ද්‍රිය රූපය** | | |

චිත්ත ප්‍රත්‍යයෝ උපදවන රූප දෙකෙකි.

1 **කායවිඤ්ඤත්ති රූපය**
2 **වචී විඤ්ඤත්ති රූපය**

එකම ප්‍රත්‍යයකින්වත් නූපදවන රූපයෝ සතර දෙනෙකි.

1 **උපචය රූපය**
2 **සන්තති රූපය**
3 **ජරතා රූපය**
4 **අනිච්චතා රූපය**

මේ රූපයෝ සතර දෙන අතිකුත් රූපයන්ගේ **ලක්ෂණ** බැවින් අසුවල් ප්‍රත්‍යයෙන් උපන්නෝයයි කිව නොහැකිය.

**කම්ජ රූපයෝ** අටලොස් දෙනෙකි. (18) එයින් රූප නවයක් **ඒකාන්ත කම්ජය.** ඒ නවදෙනා අන් ප්‍රත්‍යයකින් ඉපදවිය හැකි නොවේ ඉතිරි නව දෙනා **අනෙකාන්තය** අන්‍ය ප්‍රත්‍යයන්ගෙන්ද ඉපදවිය හැකි හෙයිනි.

| **ඒකාන්ත කම්ජ රූප** | **අනෙකාන්ත කම්ජ රූප** |
|---|---|
| 1 චක්ඛු ප්‍රසාද රූපය | 1 පඨවි ධාතුව |
| 2 සොත ප්‍රසාද රූපය | 2 ආපො ධාතුව |
| 3 ඝාණ ප්‍රසාද රූපය | 3 තෙජො ධාතුව |
| 4 ජිව්හා ප්‍රසාද රූපය | 4 වායො ධාතුව |
| 5 කාය ප්‍රසාද රූපය | 5 වර්ණ රූපය |
| 6 ස්ත්‍රීභාව රූපය | 6 ගන්ධ රූපය |
| 7 පුරුෂභාව රූපය | 7 රස රූපය |
| 8 ජීවිතෙන්ද්‍රිය රූපය | 8 ඕජා රූපය |
| 9 හදයවත්ථු රූපය | 9 පරිච්ඡේද රූපය |

චිත්තජ රූපයෝ පසළොස් දෙනෙකි. (15) එයින් රූප දෙකක් ඒකාන්ත චිත්තජ රූපයෝය. ඉතිරි තෙළෙස් රූපයෝ අනෙකාන්ත චිත්තජ රූපයෝයි.

| ඒකාන්ත චිත්තජරූප | අනෙකාන්තචිත්තජ රූප | |
|---|---|---|
| 1 කායවිඤ්ඤත්ති රූපය | 1 අවිනිබ්භොග රූප | 8 |
| 2 වචී විඤ්ඤත්ති රූපය | 2 පරිච්ඡෙද රූපය | 1 |
| | 3 ශබ්ද රූපය | 1 |
| | 4 විකාර රූප | 3 |
| | | 13 |

ඍතුජ රූපයෝ තෙළෙසකි (13). එනම්:-

| | |
|---|---|
| අවිනිබ්භොග රූප අටය | 8 |
| පරිච්ඡෙද රූපය | 1 |
| ශබ්ද රූපය | 1 |
| විකාර රූප තුනය | 3 |
| | 13 |

ආහාරජ රූපයෝ දොළොසකි (12). එනම්:-

| | |
|---|---|
| අවිනිබ්භොග රූප අටය | 8 |
| පරිච්ඡෙද රූපය | 1 |
| විකාර රූප තුනය | 3 |
| | 12 |

(රූප විභාග සටහන 129 වන පිටුවෙහි පළවේ)

## රූප කලාප

රූප උපදනා කල්හි තනිතනිවම නූපදී. ඔවුනොවුන් එකිනෙකට බැඳී රූප පිණ්ඩ හෙවත් කලාප වශයෙන් උපදී. යම් සිතක යෙදෙන්නාවූ චෛතසික ධර්මයන් හා සිතත් එකොත්පාද, එකනිරොධ, එකාලම්බණ, එකවත්ථුක යයි සතර සම්ප්‍රයොග ලක්ෂණයකින් යුක්ත වන්නාක් මෙන් එකි එකී රූප කලාපයන්හි යෙදෙන්නාවූ රූප ධර්මයෝද, එකට උපදීමය, එකට නිරුද්ධවීමය. පඨවි ධාතු ආදීවූ එක් වස්තුවක් නිශ්‍රය කර ගැනීමය. චක්ෂුරාදී එක් වස්තුවක් හා පැවතීම ඇති බවය. යන ලක්ෂණ සතරකින් යුක්ත වන්නේය.

**කම්ම, චිත්ත, ඍතු, ආහාර** යන සතර ප්‍රත්‍යයෙන්ම රූප උපදවන කල්හි පඨවි, ආපො, තෙජෝ, වායො යන භූත චතුස්කයද වණ්ණ, ගන්ධ, රස, ඕජා යන උපාදාය රූප නම් වූ වණ්ණ චතුස්කයද සෑම රූප කලාපයකම නොඅඩුවම පහල වන්නාහ. මෙසේ කලාප වශයෙන් උපදනා කල්හි ඒ රූපයෝ ඉදිරිපසු නොවී එකක්ෂණිකව හටගෙණ නිරුද්ධ වන්නාවූ කල්හිද ඉදිරිපසු නොවී එකක්ෂණිකව නිරුද්ධ වෙත්. එක් මහා භූතයෙක් අවශෙෂ භූතත්‍රයට ආධාර හෙවත් නිශ්‍රය වෙයි. ඒ මහා භූතයෝ තුන්දෙන අවශෙෂ භූතයට නිශ්‍රය ස්ථාන වෙයි. මේ සතර මහා භූතයන්ගෙන් අන්‍යවූ උපාදාය රූපයෝ මහාභූතයන් නිශ්‍රය කොටගෙණ පවත්නාහු වෙත්. මෙසේ එකිනෙකට නොයෙක් අයුරින් බැඳී පවත්නාවූ රූප කලාපයෝ එක් විස්ස (21) කි

එක්ව උපදින්නාවූ රූපයන්ගේ සඞ්ඛ්‍යාව අනුව සලකන කල්හි–

| | | | |
|---|---|---|---|
| 1 | **අෂ්ටක කලාප එකක්ද** | 1 | |
| 2 | **නවක කලාප තුනක්ද** | 3 | |
| 3 | **දසක කලාප නවයක්ද** | 9 | |
| 4 | **එකාදසක කලාප එකක්ද** | 1 | |
| 5 | **ද්වා දසක කලාප දෙකක්ද** | 2 | |
| 6 | **තෙරසක කලාප එකක්ද** | 1 | වෙත්. |

**1 අෂ්ටක කලාපය: පඨවි, ආපො, තෙජෝ, වායො, වණ්ණ, ගන්ධ, රස, ඕජා** යන අවිනිර්භොග රූප අටෙන් යුත් කලාපයයි. අෂ්ටක කලාපයෝ චිත්ත සමුට්ඨාන වශයෙන්ද, ඍතු සමුට්ඨාන වශයෙන්ද, ආහාර සමුට්ඨාන වශයෙන්ද උපදිත්.

**2 නවක කලාප තුන**

1 **ජීවිත නවක කලාපය**– අවිනිර්භොග රූප අටත්, ජීවිතෙන්ද්‍රිය රූපයත්ය. මෙය කම්ම සමුට්ඨාන රූප කලාපයකි.

2 **කාය විඤ්ඤත්ති නවක කලාපය**. අවිනිබ්භෝග රූප අටත් කාය විඤ්ඤත්ති රූපයත්ය. මෙය චිත්ත සමුට්ඨාන රූප කලාපයකි.

3 **ශබ්ද නවක කලාපය**. අවිනිබ්භෝග රූප අටත් ශබ්ද රූපයත්ය. මෙය උතු සමුට්ඨාන රූප කලාපයකි.

**3 දසක කලාප නවය.**

1 **චක්ඛු දසක කලාපය**. අවිනිබ්භෝග රූප අටත් ජීවිතෙන්ද්‍රිය රූපයත්, චක්ඛු ප්‍රසාද රූපයත්ය. මෙය කම්ම සමුට්ඨාන රූප කලාපයකි.

2 **සෝත දසක කලාපය.** අවිනිබ්භෝග රූප අටත් ජීවිතෙන්ද්‍රිය රූපයත්, සෝත ප්‍රසාද රූපයත්ය. මෙයද කම්ම සමුට්ඨාන රූප කලාපයකි.

3 **ඝාණ දසක කලාපය.** අවිනිබ්භෝග රූප අටත් ජීවිතෙන්ද්‍රිය රූපයත්, ඝාණ ප්‍රසාද රූපයත්ය. මෙයද කම්ම සමුට්ඨාන රූප කලාපයකි.

4 **ජිව්හා දසක කලාපය.** අවිනිබ්භෝග රූප අටත්, ජීවිතෙන්ද්‍රිය රූපයත්, ජිව්හා ප්‍රසාද රූපයත්ය. මෙයද කම්ම සමුට්ඨාන රූප කලාපයකි.

5 **කාය දසක කලාපය**. අවිනිබ්භෝග රූප අටත් ජීවිතෙන්ද්‍රිය රූපයත්, කාය ප්‍රසාද රූපයත්ය. මෙයද කම්ම සමුට්ඨාන රූප කලාපයකි.

6 **ස්ත්‍රීභාව දසක කලාපය.** අවිනිබ්භෝග රූප අටත්; ජීවිතෙන්ද්‍රිය රූපයත්, ස්ත්‍රීභාව රූපයත්ය. මෙයද කම්ම සමුට්ඨාන රූප කලාපයකි.

7 **පුරුෂභාව දසක කලාපය.** අවිනිබ්භෝග රූප අටත්, ජීවිතෙන්ද්‍රිය රූපයත්, පුරුෂභාව රූපයත්ය. මෙයද කම්ම සමුට්ඨාන රූප කලාපයකි.

8 **වත්ථුදසක කලාපය**. අවිනිබ්භොග රූප අටත් ජීවිතෙන්ද්‍රිය රූපයත්, හදය වත්ථු රූපයත්ය. මෙයද කම්ම සමුට්ඨාන රූප කලාපයකි,

9 **වාග් විඤ්ඤත්තිදසක කලාපය.** අවිනිබ්භොග රූප අටත්, ශබ්ද රූපයත්, වාග් විඤ්ඤත්ති රූපයත්ය. මෙය චිත්ත සමුට්ඨාන රූප කලාපයකි.

4 **එකා දසක කලාපය**. අවිනිබ්භොග රූප අටත්, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා යන විකාර රූප තුනත්ය. මේ කලාපය චිත්ත සමුට්ඨාන වශයෙන්ද ඍතු සමුට්ඨාන වශයෙන්ද, ආහාර සමුට්ඨාන වශයෙන්ද උපද-වනු ලැබේ. එයට **ලහුතා දෙකා දසක කලාපය** යයි ද කියති.

5 **මාදසක කලාප දෙක.**

1 **කායවිඤ්ඤත්ති ලහුතාදි මාදසක කලාපය**. අවිනිබ්භොග රූප අටත්, කායවිඤ්ඤත්ති රූපයත්, ලහුතා මුදුතා, කම්මඤ්ඤතා යන විකාර රූප තුනත්ය. මෙය චිත්ත සමුට්ඨාන රූප කලාපයකි.

2 **ශබ්ද ලහුතාදි මාදසක කලාපය**. අවිනිබ්භොග රූප අටත්, ශබ්ද රූපයත්, ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන විකාර රූප තුනත්ය. මෙය උතු සමුට්ඨාන රූප කලාපයකි.

6 **තෙරසක කලාපය.** අවිනිබ්භොග රූප අටත්, ශබ්ද රූපයත්; වාග් විඤ්ඤත්ති රූපයත්, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා යන විකාර රූප තුනත්ය. මෙය චිත්ත සමුට්ඨාන රූප කලාපයකි. **වාග් විඤ්ඤත්ති ශබ්දලහුතාදි ත්‍රයො දසක කලාපය** යයිද එයටම නමෙකි.

තවද, රූප හට ගැනීමේ හේතු හෙවත් රූප සමුට්ඨාන වශයෙන් රූප කලාපයෝ එක් විස්සකි. (21)

| | | |
|---|---|---|
| 1 | කම්ම සමුට්ඨාන රූප කලාප නවයකි | 9 |
| 2 | චිත්තසමුට්ඨාන රූප කලාප සයකි | 6 |
| 3 | උතු සමුට්ඨාන රූප කලාප සතරෙකි | 4 |
| 4 | ආහාර සමුට්ඨාන රූප කලාප දෙකකි | 2 |
| | | 21 |

**1 කම්ම සමුට්ඨාන රූප කලාප නවය**

1 චක්ඛු දසක කලාපය
2 සොත දසක කලාපය
3 ඝාණ දසක කලාපය
4 ජිව්හා දසක කලාපය
5 කාය දසක කලාපය
6 ස්ත්‍රීභාව දසක කලාපය
7 පුරුෂභාව දසක කලාපය
8 වස්තු දසක කලාපය
9 ජීවිත නවක කලාපය

**2 චිත්ත සමුට්ඨාන රූප කලාප සය**

1 ශුද්ධාෂ්ටක කලාපය
2 කායවිඥප්ති නවක කලාපය
3 වාග් විඥප්ති දසක කලාපය
4 ලඝුතාදි එකා දසක කලාපය
5 කායවිඥප්ති ලඝුතාදි ද්වාදසක කලාපය
6 වාග්විඥප්ති ශබ්ද ලඝුතාදි ත්‍රයොදසක කලාපය

**3 උතු සමුට්ඨාන රූප කලාප සතර**

1 ශුද්ධාෂ්ටක කලාපය
2 ශබ්ද නවක කලාපය
3 ලඝුතාදි එකා දසක කලාපය
4 ශබ්ද ලඝුතාදි ද්වාදසක කලාපය

## 4 ආහාර සමුට්ඨාන රූප කලාප දෙක

1 ශුද්ධාෂ්ටක කලාපය
2 ලහුතාදි එකාදසක කලාපය

මේ එක් විසි රූප කලාපයන් අතුරෙන් ඌතු සමුට්ඨාන ශබ්ද නවක කලාපයත්, ශුද්ධාෂ්ටක කලාපයත් අධ්‍යාත්ම බාහිර සන්තාන දෙක්හිම ලැබෙත්. සෙසු එකුන් විසි (19) කලාපයෝ අධ්‍යාත්ම සන්තානයෙහි පමණක් ලැබේ.

ආකාශ ධාතුව හෙවත් පරිච්ඡේද රූපය, රූප කලාපයන්ගේ පරිච්ඡේද මාත්‍රයක් බැවින්ද, ලක්‍ෂණ රූප සතර රූප කලාපයන්ගේ ලක්‍ෂණ මාත්‍රයක් බැවින්ද රූප කලාපයන්ගේ අඞ්ගභාවයට නොපැමිණෙන හෙයින්ද රූප කලාපවලට නොගැනේ.

## රූප කලාපයන්ගේ වැඩීම හා හානිය

පටිසන්ධික්‍ෂණයේ පටන් කර්මජාදි රූප කලාපයන්ගේ වැඩීමත් චක්ඛු දසක, සොත දසක, ඝාණ දසක, ජිව්හා දසක යන සතර කර්මජ කලාපයන්ගේ පහළ වීමෙන් පසු කර්මජ රූපාදිය වැඩෙන ක්‍රමයත්, ඕජා ඵරණයෙන් පසු ආහාරජ රූපයන්ගේ වැඩීමත් මරණය හෙවත් චුති චිත්තය දක්වා ක්‍රමයෙන් කර්මජ රූපාදීන්ගේ හානියත් මේ සටහනින් දක්වනු ලැබේ. මෙහි මරණාසන්න චිත්තවීථිය වශයෙන් දක්වා තිබෙන්නේ චක්ඛුවාරික වීථියකි. (පිටු 130)

## රූප ප්‍රවෘත්ති ක්‍රමය

**කාමලෝක, රූප ලෝක, අරූපලෝක** යයි ලෝක තුන් වැදෑරුම් වේ. සතර අරූප ලෝකයන්හි කිසිදු රූපයක් නැත. එහි සත්ත්වයන්ට ඇත්තේ සතර නාමස්කන්ධය පමණය. රූප පහළවන්නාවූ ලෝක අතුරෙන් **කාම ලෝකයයි** ව්‍යවහාර කරනු ලබන්නේ **සතර අපාය,**

**මිනිස්ලොව, සදෙව් ලොව** යන එකොළොස් කාම භූමියටය. **රූප ලොකය** නම් බ්‍රහ්මපාරිසජ්ජාදි සොළොස් බ්‍රහ්ම භූමියය.

**සත්ත්වයන් ඇතිවීමේ ක්‍රම සතරෙකි** එනම්:

1 **අණ්ඩජ**
2 **ජලාබුජ**
3 **සංසෙදජ**
4 **ඕපපාතික**

**මෙයටම අණ්ඩජ** යොනිය, ජලාබුජ යොනිය, සංසෙදජ යොනිය, ඕපපාතික යොනිය යයිද කියනු ලැබේ.

අණ්ඩයෙන් හෙවත් බිජුවටින් උපදින්නෝ **අණ්ඩජයෝයි.** ඔවුහු අණ්ඩකොෂය බිඳගෙන උපදිත්. පක්ෂි, සර්පාදී සත්ත්වයෝයි.

ජලාබුයෙන් උපදින සත්ත්වයෝ **ජලාබුජයෝයි**. ඔව්හු වස්ති කොෂය බිඳගෙන උපදිත්. ජලසඞ්ඛ්‍යාත කලල රූපය වසන්නේය යන අර්ථයෙන් **ජලාබු** නම්වේ. වැදූමස යනුද මෙයටම නමෙකි. මනුෂ්‍ය, ඇත්, අස්, ගවාදී සත්ත්වයෝයි.

සංසෙදයෙන් උපදින්නෝ **සංසෙදජයෝය.** සංසෙදය නම් දිය සීරාව ඇති තෙත්වූ ස්ථානයයි. අපිරිසිදු තැන්වූ කුණු මසෙහි හෝ කුණු මිනියෙහි හෝ කුණු හෝජනයෙහි හෝ ගවර වළෙක හෝ උපදින සත්ත්වයෝද, පිරිසිදු තැන්වූ පියුම් මල් එල ආදියෙහි උපදින සත්ත්වයෝද, සංසෙදජ යෝනියට ඇතුළත් වේ. එනම් මැසි මදුරු ආදී සත්ත්වයෝයි.

අණ්ඩජ, ජලාබුජ, සංසෙදජ යන තුන් ආකාරයෙන්ම වෙනස් වූ සම්පූර්ණ වූ අඞ්ග ප්‍රත්‍යඞ්ග ඇතිව පහළ වන්නෝ ඕපපාතිකයෝයි. දිව්‍ය බ්‍රහ්මයෝද, අපාගත තිරිසන්හුද ඇතැම් මනුෂ්‍යයෝද ඇතැම් විනිපාතිකයෝද, ඕපපාතික යෝනියට ඇතුළත් වේ.

මේ සතර විධ ප්‍රතිසන්ධි අතුරෙන් **ඕපපාතිකව** පහළ වන සත්ත්වයෝ නම්:-

**නිරයගත සත්ත්වයෝය**
**නිජ්ඣාම ප්‍රේතයෝය**
**සදෙව් ලොව වසන දෙවියෝය**
**රූපී බ්‍රහ්මයෝය**

**අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික** යන සතරාකාරයෙන්ම උපදින සත්ත්වයෝ නම්:-

**තිරශ්චීනයෝය**
**සෙසු ප්‍රේතයෝය**
**අසුරයෝය**
**මනුෂ්‍යයෝය**
**භූමට්ඨ දෙවියෝය**

තවද,

**1 පරිපූර්ණ ඉන්ද්‍රිය ඇති සත්ත්වයෝය**
**2 අපරිපූර්ණ ඉන්ද්‍රිය ඇති සත්ත්වයෝය**

යයි සත්ත්වයෝ. දෙවැදෑරුම් වේ.

ඉන්ද්‍රියයන් නොඅඩුව සම්පූර්ණව උපදින සත්ත්වයෝ **පරිපූර්ණ ඉන්ද්‍රිය ඇති සත්ත්වයෝය.**

ඉන්ද්‍රියයන් අඩුව හෙවත් අසම්පූර්ණව උපදින සත්ත්වයෝ **අපරිපූර්ණ ඉන්ද්‍රිය ඇති සත්ත්වයෝය.**
**රූප ප්‍රවෘත්ති ක්‍රම** දෙකකි.

**1 ප්‍රතිසන්ධි ක්‍රමය** හෙවත් උත්පත්තික්ෂණයේදී රූප පවත්නා පිළිවෙලය.

**2 ප්‍රවෘත්ති ක්‍රමය** හෙවත් පවත්නා **කාල**යෙහි රූප ප්‍රවෘත්තියයි.

රූප වශයෙන් අටවිසි රූපයෝද, කලාප වශයෙන් එක් විසි රූප කලාපයෝද කාම ධාතුවෙහි හෙවත් කාම ලෝක යෙහි සුදුසු පරිදි ප්‍රවෘත්ති කාලයෙහි ලැබෙන්නාහ.

අනුපාදින්නක සන්තානයෙහි නොහොත් පෘථුවි පර්වත ගඞ්ගා සමුද්‍රාදී සියලු තන්හි උතුජ සුද්ධාෂ්ටක කලාපය හා උතුජ ශබ්ද නවක කලාපයද ලැබෙන්නාහ. උපාදින්නක සන්තානයෙහි මේ සියල්ලම ලැබෙති.

කාම ධාතුවෙහි පරිපූර්ණ ආයතන ඇති සත්ත්වයන්ට මේ එක්විසි රූප කලාපයෝ නොඅඩුවම ලැබෙත්. එසේද වුවත් ස්ත්‍රීන්ට පුරුෂභාව රූපයද, පුරුෂයින්ට ස්ත්‍රීභාව රූපයද, නපුංසකයින්ට භාව රූප දෙකමද අන්ධයින්ට චක්ඛු ප්‍රසාද රූපයද, බිහිරන්ට සොත ප්‍රසාද රූපයද, යනාදී වශයෙන් රූපයන්ගේ ලැබීම අඩු වන්නේය. එබැවින් කාම භවයෙහි උපදනා ස්ත්‍රියෙක් වී නම් පුරුෂභාව කලාපය හැර විසි කලාපයක්ද, පුරුෂයෙක් වී නම් ස්ත්‍රී භාව කලාපය හැර විසි කලාපයක්ද, ආදිකල්පික සත්ත්ව යන්ට කාම රාගය ඉපදීම දක්වා භාවකලාපවය හැර එකුන්විසි (19) කලාපයෙක්ද, ජාති නපුංසක, ජාතිපණ්ඩක, උභතොබ්‍යඤ්ජනක සත්ත්වයන්ටද භාවකලාපවයම නොලැබෙන හෙයින් එකුන්විසි (19) කලාපයෙක්ද ලැබේ.

**සංසෙදජ සත්ත්වයෝ** ප්‍රතිසන්ධි කාලයේදීම පරිපූර්ණ ඉන්ද්‍රියයන් ඇතිවම උපදින නමුත් ඔවුන්ගේ අඞ්ග ප්‍රත්‍යඞ්ග පසු පසුවම ක්‍රමයෙන් වැඩේ.

**ඕපපාතිකයෝ** වනාහි පරිපූර්ණ ඉන්ද්‍රියයන් හා අඞ්ග ප්‍රත්‍යඞ්ග ඇතිවම උපදිත්. පසුව අඞ්ග ප්‍රත්‍යඞ්ගයන්ගේ වැඩීමක් නොවන්නේය.

**සංසෙදජ හා ඕපපාතික සත්ත්වයන්ට** ප්‍රතිසන්ධි-ක්ෂණයේදී උත්කෘෂ්ට වශයෙන්, කාමභවයෙහිදී

1 **චක්ඛු දසක කලාපය**
2 **සොත දසක කලාපය**

3 **ඝාණ දසක කලාපය**

4 **ජිව්හා දසක කලාපය**

5 **කාය දසක කලාපය**

6 **භාව දසක කලාපය**

7 **වත්ථු දසක කලාපය**

යන සප්ත කලාපයෝම ලැබෙත්.

සුගතියෙහි මහානුභාව කුසල කර්මයකින් උපදනා **ඕපපාතිකයන්** හට ඉන්ද්‍රිය විපරීතයක් නොවන්නේය. ඉන්ද්‍රිය විපරීතය ඇතිවන්නේ සුගතියෙහි උපදනා සංසේදජ සත්වය. ඔවුන්ට ඇතැම්විට

1 **චක්ඛු දසක කලාපය**

2 **සොත දසක කලාපය**

3 **ඝාණ දසක කලාපය**

4 **භාව දසක කලාපය**

යන සතර දසක කලාපයෝ නොලැබෙන්නාහ.

දුගතියෙහි, සංසේදජ, ඕපපාතික යන දෙපක්ෂයටම චක්ඛු දසක කලාපය, සොත දසක කලාපය, භාව දසක කලාපය යන ත්‍රිවිධ කලාපයන්ගේ නොලැබීම් ඇතැම් විටෙක වන්නේය. ඝාණ ප්‍රසාදය නොලැබෙන දුගති ඕපපාතික සත්වයෙක් නැත්තේය. නමුත් ඇතැම් විටෙක දුගති සංසෙදජ සත්වයන්ට ඝාණ ප්‍රසාදය නොලැබෙන්නේය. කාම භවයෙහි කිසිම සත්වයෙකුට ජිව්හා විකලතාවයක් නම් නොලැබෙන්නේය.

### ගබ්භසෙය්‍යක සත්වයෝ

ගර්භයෙහි හෙවත් මව් කුසෙහි පිළිසිඳ ගන්නා සත්වයෝ **ගබ්භසෙය්‍යකයෝයි. අණ්ඩජ, ජලාබුජ** යන සත්ව කොටස් දෙකම එයට ඇතුළත් වේ.

අඞ්ග විකලත්වයක් නැති ගබ්භසෙය්‍යක සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි චිත්තයෙහි **උප්පාදක්ෂණය** හා **ඒකක්ෂණිකව, කාය දසක කලාපය,** භාව **දසක කලාපය, වත්‍ථු දසක කලාපය** යන දසක කලාපත්‍රය පහළ වන්නාහ. මේ රූප කලාපයෝ තිදෙනාහට **කලලරූපය** යයි ද ව්‍යවහාර කරනු ලැබේ. මේ කලාපත්‍රය ප්‍රතිසන්ධියගත් පුද්ගලයාගේ ජනක කර්ම ශක්තියෙන්ම ජනිත කර්මජ රූප කලාපයන් මිස, මව් පිය සන්තානයන්හි හටගත් කම්ම, චිත්ත, සෘතු ආහාර යන සතර ප්‍රත්‍යයෙන් උපදවන ලද රූප කලාප නොවන බව දතයුතුයි. මව්පියන් සම්බන්ධ වූ ඕම්බ ශුක්‍රාණුන්ගේ සංසේචනය කරණකොට ගෙන හටගන්නා වූ රූප පිණ්ඩයක් ඇසුරු කොට ගෙන හෙවත් භූමිකොට ගෙන පහළ වන්නා වූ මේ ත්‍රිවිධ කර්මජ රූප කලාප සඞ්ඛ්‍යාතවූ **කලල රූපය,** අන්‍යවූ බොහෝ රූප කලාපයන්ගේ පහළවීමෙන් ක්‍රමයෙන් වැඩෙන්නේය. මෙය සත්ත්ව සන්තානයෙහි රූපයන්ගේ පළමු හට ගැනීම හෙවත් ප්‍රථම උත්පාදය වන්නේය.

මතු මතුයෙහි හෙවත් ප්‍රවෘත්ති කාලයෙහි අභිනවයෙන් වැඩෙන්නාවූ රූපයෝ නම්:-

ප්‍රතිසන්ධි චිත්තයාගේ ඨිතිභඞ්ග යන ක්ෂණයන්හි පහළ වන කම්ම සමුට්ඨාන රූප කලාපද,

එයට අනතුරුව සෑම චිත්තක්ෂණයක් පාසාම, උප්පාද ඨිති භඞ්ග යන තුන් අවස්ථාවන්හිම සන්තති වශයෙන් නොබිඳී පහළ වන්නාවූ **කම්ම සමුට්ඨාන රූපකලාප** සන්තතියද

දෙවන සිතෙහි හෙවත් ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුව පහළ වන්නාවූ ප්‍රථම භවඞ්ග චිත්තයාගේ පටන් සෑම රූප ජනක චිත්තයන්ගේම උප්පාදක්ෂණයන්හි පහළ වන්නාවූ **චිත්තසමුට්ඨාන රූප කලාප** සන්තතියද

ප්‍රතිසන්ධි චිත්තයාගේ උප්පාදක්ෂණය හා එකක්ෂණිකව පහළවූ **කර්මජ** රූප කලාපත්‍රයෙහි ඇත්තාවූ තෙජෝ ධාතුහු තිදෙන ඨිති **කාලයට** පැමිණි තැන් සිට, එනම් ප්‍රතිසන්ධි චිත්තයාගේ ඨිතික්ෂණයේ සිට සෑම කුඩා චිත්තක්ෂණයක් පාසාම පච්ඡා ජාත ප්‍රත්‍යලැබීමෙන් උපදවන්නාවූ **කම්ම පච්චය උතුජ රූප කලාප** සන්තතියද

ප්‍රථම භවඞ්ග චිත්තයාගේ උප්පාදක්ෂණයේදී හටගත් චිත්ත සමුට්ඨාන රූපකලාපයට ඇතුළත් තෙජෝ ධාතුව ඝටිති ප්‍රාප්ත වූ කල්හි හෙවත් ප්‍රථම භවඞ්ග චිත්තයාගේ ඨිතික්ෂණයේ සිට සෑම චිත්තසමුට්ඨාන රූප කලාපයකට ඇතුළත් තෙජෝ ධාතූන් විසින් ඨිති ප්‍රාප්ත කල්හි උපදවනු ලබන **චිත්තපච්චය උතු සමුට්ඨාන රූප කලාප** සන්තතියද

ප්‍රතිසන්ධි චිත්තයාගේ ඝටිතික්ෂණයේ සිට සෑම කුඩා චිත්තක්ෂණයක් පාසාම බාහිර ඍතුවෙන් උපදවනු ලබන **උතුපච්චය උතු සමුට්ඨාන රූප කලාප** සන්තතියද

සත් සැත්තෑ (77) වන දින රාත්‍රියෙහි, චක්ඛුදසක, සෝත දසක, ඝාණ දසක, ජිව්හා දසක යන සතර දසක කලාපයන් පහළවූ තැන් සිට, සෑම කුඩා චිත්තක්ෂණයක් පාසාම පහළවන්නාවූ කායදසක, භාව දසක, වත්ථුදසක, චක්ඛු දසක, සෝත දසක, ඝාණ දසක, ජිව්හා දසක, යන **සප්තවිධ කම්ම සමුට්ඨාන රූප කලාප** සන්තතියද

එයට අනතුරුව, එම සප්තවිධ කර්මජ කලාපයන්ට ඇතුළත් තෙජෝ ධාතුහු ඝටිති ප්‍රාප්ත කල්හි උපදවන්නාවූ **කම්ම පච්චය උතුසමුට්ඨාන රූප කලාප** සන්තතියද

ආහාර සඞ්ඛ්‍යාත බාහිර ඕජාව, අධ්‍යාත්මගත ඕජාවත් හා සංසර්ගය ඇතිවන අවස්ථාවේ සිට කම්ම සමුට්ඨාන රූප කලාපයන්හි ඇතුළත් ඕජා රූපයන් විසින් සෑම කුඩා චිත්තක්ෂණයක් පාසාම උපදවනු ලබන **කම්ම පච්චය ආහාර සමුට්ඨාන රූප කලාප** සන්තතියද

එමෙන්ම, සෑම චිත්ත සමුට්ඨාන රූප කලාපයකටම ඇතුළත් ඕජා රූපයන් විසින් උපදවනු ලබන **චිත්ත පච්චය ආහාර සමුට්ඨාන රූප කලාප** සන්තතියද

ඍතු සමුට්ඨාන රූප කලාපයන්හි අතුළත් ඕජා රූපයන් විසින් සෑම කුඩා චිත්තක්ෂණයක් පාසාම බාහිර ඕජා හා සංසර්ගය ඇති කල්හි උපදවනු ලබන **ඍතු පච්චය ආහාර සමුට්ඨාන රූප කලාප** සන්තතියද

ආහාර සමුට්ඨාන රූප කලාපයන්හි අන්තර්ගත තේජෝ ධාතූහු විසින් සෑම කුඩා චිත්තක්ෂණයක් පාසාම උපදවනු ලබන **ආහාර පච්චය ඍතු සමුට්ඨාන රූප කලාප** සන්තතියද

බාහිර ඕජා රූපයන් විසින් සෑම කුඩා චිත්තක්ෂණයක් පාසාම උපදවනු ලබන **ආහාර පච්චය ආහාර සමුට්ඨාන රූප කලාප** සන්තතියද

යන මෙකී රූප කලාපයෝ සන්තති වශයෙන් කාම ලෝකයෙහි දීප ජාලාවක් මෙන්ද, ගංගා ස්‍රෝතසක් මෙන්ද ආයු ඇතිතාක් නොසිඳී පවත්නේය.

ගර්භයෙහි හෝනා ළදරුවාහට බාහිර ඕජා වශයෙන් ලැබෙන්නේ මෑණියන් විසින් අනුභවකළ ආහාර පානාදි-යෙහි ඕජාවෝය. මුල් කාලයේදී ගර්භ කෝෂයෙහි අන්තශ්ඡදයෙහි ඇති ලේ ධාතුවෙන්ද, වැදෑමහ පෙකෙණි වැල ආදිය වැඩුණු පසු එහි ඇති ලේ නහර ආදියෙහි උපකාරයෙන්ද, ශරීර පෝෂණය පිණිස උවමනා ඕජාවෝ උපදවාගනු ලැබේ.

ප්‍රතිසන්ධියෙහි පටන් මෙසේ ක්‍රමයෙන් වැඩෙන්නාවූ රූපකාය, මනුෂ්‍ය ඇසට නොපෙණෙන කලලරූප අවස්ථාව සිට සතියක් ඉක්මගිය කල්හි අර්බුද අවස්ථාවට පැමිණෙන්නේය. එය මස් සේදූ ජලයක් බඳුයයි උපමා කොට ඇත්තේය. අර්බුද අවස්ථාවේ සිට සතියක් ඉක්ම

ගිය කල්හි දියවුනු ඊයම් බිංදුවක් බඳුවූ පේසි අවස්ථාවට පැමිණෙන්නේය. පෙසී අවස්ථාවේ සිට සතියක් ඉක්ම යාමෙන් කිකිලි බිජුවක් බඳු ආකාර ඇති ඝණ අවස්ථාවට පත්වන්නේය. ඝණ රූපයට සතියක් ඉක්ම ගිය කල්හි පසාඛ අවස්ථාවට පැමිණේ. එහිදී දෙඅත් දෙපා හිස ආදිය පිණිස වෙන් වූ පිළක සමූහයකින් යුක්ත වන්නේය. සවන සතිය සිට කෙසාදිය හැදෙන්නේය. මෙසේ අභ්‍යන්තර වශයෙන් හෝ බාහිර වශයෙන් හෝ උපද්‍රවාදීන්ගෙන් පීඩිත නොවී වැඩෙන්නා වූ කුඩා ළදරුවාහට එකොළොස්වන සතිය අවසන් වීමේදී නොහොත් සත්සැත්තෑ (77) වන දින රාත්‍රියේදි චක්ඛු දසක, සෝත දසක, ඝාණ දසක, ජිව්හා දසක, යන සතර කම්ජ කලාපයන්ගේ පහළ වීමෙන් ඒ සත්ත්ව සන්තානයෙහි පහළ විය හැකි රූප කලාප සමූහය සම්පූර්ණ වන්නේය.

මෙතැන් පටන් ඒ සත්ත්ව සන්තානයෙහි යට දක්වන ලද කම්ජ, චිත්තජ, ඍතුජ, ආහාරජ රූප කලාප සමූහය සන්තති වශයෙන් නොබිඳී සම්මුති මරණය හෙවත් චුතිය දක්වා පවත්නේය.

මෙසේ සතර ප්‍රත්‍යයෙන් උපදවනු ලබන රූපකලාපයන් අතුරෙන් කම්ජ රූපකලාපයෝ වනාහි, චුති චිත්තය පටන් ආපසු ගිණූ කල්හි සතළොස්වන චිත්තක්ෂණයාගේ උප්පාදක්ෂණය දක්වා හටගන්නාහ. එයට අනතුරුව කම්ජ රූප කලාපයන්ගේ හටගැනීමක් නොවන්නේය. චුතියට පූර්ව සතළොස් වන චිත්තක්ෂණයාගේ උප්පාදක්ෂණයේදී පහළවූ අවසාන කම්ජ රූප කලාපයෝ චුතිචිත්තයාගේ නිරුද්ධයත් සමග නිරුද්ධ වන්නේය. චිත්තජ හා ආහාරජ රූප කලාපයෝ චුති චිත්තය දක්වා උපදවනු ලබන බැවින්, චුති චිත්තයට චිත්තක්ෂණ සොළොසක් පමණ ගතවී නිරුද්ධ වන්නාහ. චුති චිත්තයාගේ නිරුද්ධයෙන් පසු මෘත ශරීර බවට පත්වූ රූප කායයෙහි පහළ වන්නේ උතු සමුට්ඨාන රූප පරම්පරාවෝ පමණය.

## රූප ලෝකයෙහි රූප ප්‍රවෘත්තිය

කාමරාගය දුරුකරනු පිණිස කරන ලද භාවනා බලයෙන් උපදවාගන්නා ලද ධ්‍යානයන්ගේ විපාක වශයෙන් රූපාවචර බ්‍රහ්ම ලෝකයන්හි ඕපපාතිකව පහළ වන්නාවූ, රූපි බ්‍රහ්මයින්ට, කාමරාග නිදාන කොට ඇති, කර්මයෙන් උපදවනු ලබන ඝ්‍රාණ දසක කලාපයෝද, ජිව්හා දසක කලාපයෝද, කාය දසක කලාපයෝද භාවදසක කලාප යෝද, නොලැබෙන්නාහ. තවද, බ්‍රහ්මයෝ ආහාර නොවළඳනා හෙයින්, ඔවුන්ගේ සන්තානයන්හි ආහාරසමුට්ඨාන රූපයෝ නූපදී.

රූපි බ්‍රහ්මයින්ට ප්‍රතිසන්ධි කාලයේදී චක්ඛු දසක, සෝත දසක, වත්‍ථු දසක, යන ත්‍රිවිධ දසක කලාපයෝද, ජීවිත නවක කලාපයද යන කම්ම සමුට්ඨාන රූප කලාප සතර පමණක් ලැබෙන්නේය. ප්‍රවෘත්ති කාලයේදී චිත්ත සමුට්ඨාන කලාප හා උතුසමුට්ඨාන කලාපයන්ද ලැබෙන්නේය. අසඤ්ඤ සත්ත්වයෙහි ප්‍රතිසන්ධි කාලයේදී ලැබෙන්නේ කම්ම සමුට්ඨාන ජීවිත නවක රූප කලාප පමණය. චක්ඛු දසක, සෝත දසක, ඝාණ දසක, ජිව්හා දසක, කාය දසක, භාව දසක වත්‍ථු දසක යන සප්ත විධ කර්මජ කලාපයෝ නොලැබෙන්නාහ. නාමස්කන්ධය නැති බැවින් චිත්තසමුට්ඨාන රූපයන්ගේ හටගැනීමක් නැත්තේය. ආහාර නොගත හැකි බැවින් ආහාර සමුට්ඨාන රූපයෝත් නැත. ප්‍රවෘත්ති කාලයෙහි උතුසමුට්ඨාන රූප අතුරෙන් ශබ්ද නවක කලාපයත් ශබ්ද ලහුතාදී ද්වාදසක කලාපයත් යන කලාපදෙක හැර ඉතිරි උතු සමුට්ඨාන ශුද්ධාෂ්ටක කලාපයත් ලහුතාදී ඒකාදසක කලාප යත් ලැබෙන්නාහ.

රූප වශයෙන් සළකන කල්හි කාම ලෝකයෙහි අටවිසි රූපයෝම ලැබෙත්.

**රූපී බ්‍රහ්මයන්ට වනාහි රූප පසක් නොලැබේ.**

එනම්:-

**1 ඝාණ ප්‍රසාද රූපය**
**2 ජිව්හා ප්‍රසාද රූපය**
**3 කාය ප්‍රසාද රූපය**
**4 ස්ත්‍රී භාව රූපය**
**5 පුරුෂභාව රූපය**

ඉතිරි තෙවිසි (23) රූපයෝ ලැබෙත්.

**අසඤ්ඤසත්තයෙහි** රූප එකොළොසක් නොලැබේ. එනම්:-

| | |
|---|---|
| පසාද රූප පස | 5 |
| ශබ්ද රූපය | 1 |
| භාව රූපවය | 2 |
| විඤ්ඤත්ති රූපවය | 2 |
| හදය වස්තු රූපය | 1 |
| | 11 |

ඉතිරි රූප සතළොස ලැබේ. එනම්:-

| | |
|---|---|
| **ජීවිත නවකය** | 9 |
| **ලහුතාදි ත්‍රය** | 3 |
| **ලක්ඛණ රූප සතර** | 4 |
| **පරිච්ඡේද රූපය** | 1 |
| | 17 |

අරූප ලොකයන්හි කිසිදු රූපයක් නොලැබේ. ප්‍රතිසන්ධියේදී සියලුම සත්ත්වයන්ට නොලැබෙන රූප නවයකි. එනම්:-

| | |
|---|---|
| ශබ්ද රූපය | 1 |
| විකාර රූප පස | 5 |
| සන්තති රූපය | 1 |
| ජරතා රූපය | 1 |
| අනිච්චතා රූපය | 1 |
| | 9 |

මව් කුසින් බිහිවන කාලයේදී විඤ්ඤත්තිවය හා ලහුතාදී ත්‍රය යන රූප පස ජාතිමත් වෘෂභයාය පශ්චිම භවික බෝධි සත්ත්වයෝය යන දෙදෙනා හැර අන් කිසිවෙකුට නොලැබෙන්නේයයි දක්වා තිබේ. මහ බෝසතාණෝ මව් කුසින් බිහිව මහපොළොවෙහි පිහිටීම හා සමග ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන රූපත්‍රය සහ කාය විඤ්ඤත්ති වචී විඤ්ඤත්ති යන විඤ්ඤත්ති රූපවයද එකවිට පහලව උත්තර දිසාභිමුඛව සප්ත පද වීතිහාරයක් ගොස් **"අග්ගො හමස්මි ලෝකස්ස"** යනාදීන් අභීත සිංහනාද කළ සේක.

ගවයන් දහසකට නායකව උපදනා ගව ශ්‍රේෂ්ඨයාද එමෙනැයි දක්වා තිබේ.

## නිර්වාණය

සතර පරමාර්ථ ධර්මයන් අතුරෙන් **චිත්ත, චෛතසික රූප** යන ත්‍රිවිධ පරමාර්ථයන් යට දක්වන ලදී. සතරවන පරමාර්ථ ධර්මය වූ **නිර්වාණ පරමාර්ථය,** එක් එක් සන්තානයක් පිළිබඳව සියළු සංස්කාර ධර්මයන් නැවත නූපදනා පරිදි සංසිඳීමෙන් පැමිණිය යුතු වූ ද, වෙදයිත සුඛ හෙවත් සුඛ වෙදනාවගේ වශයෙන් කායද්වාරයෙන් හෝ මනොද්වාරයෙන් හෝ විඳිය නොහැකි වූ ද, ඉතාම උසස් සැපය නම් වූ ව්‍යුපසම සුඛ සඞ්ඛ්‍යාත ලොකොත්තර ධර්මයකි.

**දුක්ඛ ආර්ය සත්‍යය, දුක්ඛසමුදය ආර්ය සත්‍යය, දුක්ඛ නිරොධ ආර්ය සත්‍යය, දුක්ඛ නිරොධගාමිනී පටිපදා ආර්ය සත්‍යය** යන චතුස්සත්‍යයන් අතුරෙන්, **දුක්ඛනිරොධ ආර්ය සත්‍ය** නම් වූ **නිර්වාණ ධර්මය, සොවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත්** යන සතර වැදෑරුම් ආර්ය මාර්ගඥනයෙන් ම **"සච්ඡිකාතබ්බ"** හෙවත් ප්‍රත්‍යක්ෂ කිරීම් වශයෙන් පැමිණිය යුතු වූ, ලඟාවිය යුතු වූ ධර්මයක් මිස, අමුතුවෙන් ඉපදවිය යුතු වූ ධර්මයක් නොවේ. ඉතා

ගැඹුරු වූ ද, දුකසේ අවබෝධ කටයුතු වූ ද, ශාන්ත වූ ද, ප්‍රණීත වූ ද, ධර්මශ්‍රවණයෙන් මුත් ස්වබුද්ධිමාත්‍ර තර්ක ශාස්ත්‍රයන්ගේ බලයෙන් දැනගත නොහැකි වූ ද, ධර්මාන්තර විභාග වශයෙන් ඉතා සියුම් වූ ද, මේ පරමාර්ථ ධර්මය කල්‍යාණ පෘථග්ජනයන් විසින් **අනුබෝධඥාන** නම් වූ අනුමේය බුද්ධියෙන්ම දැනගත යුතු වේ.

**අනුබෝධඥානය, ප්‍රතිවේධඥානය** යන දෙවදෑරුම් වූ සත්‍යඥානයන් අතුරෙන් **අනුබෝධඥානය** නම් පූර්වභාග ප්‍රතිපත්ති සමයෙහි බණ ඇසීම, ඇසූ බණ නුවණින් විමසීම යන ආදී වශයෙන් චතුස්සත්‍යය එක වරට නොව නානාක්ෂණිකව හෙවත් එකී එකී සත්‍යයෙහි එකී එකී වරට නොයෙක් ඇසිල්ලෙහි ලැබෙන්නාවූ **ලෞකික** වූ **ඥානය යි. ප්‍රතිවේධ ඥානය** නම් චතුස්සත්‍යයම එක ඇසිල්ලෙහි අවබෝධ කරන්නා වූ, සෝවාන් ආදි සතර ආර්ය මාර්ගයන් හා එක්ව යෙදුනාවූ, **ලෝකෝත්තර** වූ **ඥානය** වේ. එබැවින් නිර්වාණ ධර්මය කෙබඳු ධර්මයක් දැයි ස්වල්ප වශයෙන්වත් දැනගැනීමට කැමැති කල්‍යාණ පෘථග්ජනයන් විසින් මේ ආත්මභාවයේදීම **ප්‍රතිවේධ ඥානය** ලබාගැනීම කෙසේ වෙතත්, **අනුබෝධ ඥානය** වත් උපදවාගැනීමට උත්සාහ දැරිය යුතුයි.

චතුස්සත්‍යයන් පිළිබඳව ස්වල්පමාත්‍ර වූ ඥානයක් ඇතිකර ගැනීමට පළමුව, නාම රූප ධර්මයන් ගැන මනා අවබෝධයක් ඇතිකර ගතයුතු වේ **නිර්වාණ ධර්මය,** ඒ ඒ පුද්ගල සන්තානයන් හෙවත් පඤ්චස්කන්ධයන් හා මිශ්‍ර බවක් නැති නමුත්, ඒ හා පිළිබඳකම් ඇත්තක් බැවිනුත් නාම රූප ධර්මයන්ගේ අනුත්පාද නිරෝධයෙන් නිවණට පැමිණිය යුතු බැවිනුත්, දුක යයි ප්‍රකාශ කරණු ලබන්නේත් මේ නාමරූප ධර්ම සන්තතියට බැවිනුත්, දුක් ඉපැද්මට හේතුවන අවිද්‍යා තණ්හා, දිට්ඨි ආදී කෙලශයනුත් හටගන්නේ මේ නාමරූප ධර්මයන් පිළිබඳව බැවිනුත්, ඒ පිළිබඳව ඉතා පිරිසිදු දැනීමක් ඇතිකරගැනීම අවශ්‍ය වේ.

එවැනි ධර්ම ඥානයක් නැති පුද්ගලයෙකුට නිර්වාණ ධර්මය අවබෝධ කරගැනීම කෙසේ වෙතත් ඒ ගැන නතු පහදා දීම ද අති දුෂ්කරය.

**නිස්සරණට්ඨ** නම් වූ භව දුක්ඛයෙන් නොහොත් සංසාර දුකින් නික්මීම ය, **විවෙකට්ඨ** නම් වූ සමුදය සඞ්ඛ්‍යාත තෘෂ්ණාදි කෙලශයන් කෙරෙන් විවේකය හෙවත් වෙන් වූ බවය, **අසඞ්ඛතට්ඨ** නම් වූ ප්‍රත්‍යයෙන් හට නොගත් බවය, **අමතට්ඨ** නම් වූ මරණයක් නැති බවය යන සතර අර්ථ කෙනෙක් මේ **දුක්ඛ නිරෝධය** පිළිබඳව ඇත්තාහ. මේ සතර අර්ථයෝම **තථ්‍යහ** හෙවත් එම ස්වභාවමම ඇත්තාහ. **අවිතථය** හෙවත් ඒ කී පරිද්දෙන් නොවන්නක් නොවන්නේය. සැබෑවය, නිබොරුය. **අනඤ්ඤථය** හෙවත් ඒ කී පරිද්දෙන් අන්‍ය වූ ආකාරයකින් නොවන්නේය.

නිර්වාණයාගේ, සසර දුකින් නික්මීම නම්වූ **නිස්සරණාර්ථය** දැනගනු කැමැති වූ ද, සංසාර දුකින් මිදෙනු කැමැති වූ ද, පුද්ගලයා විසින් සංසාරය පිළිබඳවත් එහි දුක පිළිබඳවත් මනා අවබෝධයක් ඇතිකරගත යුතු වේ.

**සංසාරය** යනු අනාදිමත් කාලයක සිට ජාතියෙන් ජාතියට මැරීම් ඉපදීම් වශයෙන් නැවත නැවත යාම හෙවත් මුලක් නැති කාලයක සිට ක්ෂණයක් ක්ෂණයක් පාසා බිඳෙමින් නැවත නැවතත් සන්තතිය හෙවත් පරම්පරාව නොසිඳ උපදිමින්, කිසි කලෙක සහමුලින් සුන්වීමකට නොපැමිණ, පිරනිවන්පෑම දක්වා පැවත එන නාමරූපස්කන්ධයන්ගේ හෙවත් පස්වැදෑරුම් ස්කන්ධයන්ගේ සන්තතිය හෙවත් පරම්පරාව ය.

**සතර නාමස්කන්ධ** සඞ්ඛ්‍යාත වූ චිත්ත චෛතසික ධර්මයෝ එක් චිත්තක්ෂණයක් ඇතුළතම ඉපිද බිඳී යන ස්වභාව ඇත්තාහ. **රූපස්කන්ධ** සඞ්ඛ්‍යාත අටවිසි රූපයන් අතුරෙන් ඇතැම් රූපයෝ එක් කුඩා චිත්තක්ෂණයක්

ඇතුළතද, ඇතැම් රූපයෝ කුඩා චිත්තක්ෂණ තුනක් ඇතුළතද, ඇතැම් රූපයෝ සතළොස් චිත්තක්ෂණයක් ඇතුළතද ඉපිද පැවැත, බිඳී යන්නාහ. සතළොස් චිත්තක්ෂණයකට වඩා ආයුෂය ඇති **එකම** රූප ධර්මයක් **වත්, එක්** චිත්තක්ෂණයකට වඩා ආයුෂය ඇති **එකම** නාම ධර්මයක්වත් නැත්තේය. මේ නාමරූප ධර්මයෝ ඔවුනොවුන් නොයෙක් ආකාරයෙන් බැඳී, සූවිසි වැදෑරුම් ප්‍රත්‍යයන්ගේ වශයෙන් ඔවුනොවුන්ට උපකාර වෙමින් පවතී. මෙසේ ක්ෂණ මාත්‍රයෙන් ඉපිද, සිට, බිඳී යන නාමරූප ධර්ම සමූහයාගේ සන්තතිය හෝ, පස්වැදෑරුම් උපාදානස්කන්ධයන්ගේ සන්තතිය හෝ අටළොස් වැදෑරුම් නාමරූප ධාතූන්ගේ සන්තතිය හෝ දොළොස්වැදෑරුම් ආයතනයන්ගේ සන්තතිය හෝ වැල නොකැඩී, සහමුලින් නොසිඳී, ක්ෂණයක් ක්ෂණයක් පාසා බිඳෙමින්, අනුක්‍රමයෙන් පැවැත එන පරම්පරාවන් බැවින් **අනිත්‍යය.** එහෙයින් භය එළවන බැවින් **දුඃඛය,** ආත්මසාරාදියෙන් තොර හෙයින් **අනාත්මය.** මෙපරිද්දෙන් සියලු සංස්කාර ධර්මයන් **අනිත්‍ය, දුඃඛ, අනාත්ම** වශයෙන් දක්නාවූ ද, ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ඇති බව ය, බොධිසම්භාරයන් පුරා මුහුකළ නුවණ ඇති බවය, දෙව් මිනිස් ආදී අත්බැවක් ලැබීමය, පෙර ආත්මභාවයන්හි දාන, සීලාදී පින්කම් කොට පුරුදු කරණලද සමථවිදර්ශනා භාවනා ඇති බවය, පරතොඝොෂ ප්‍රත්‍යය ලැබීමය යනාදි වශයෙන් ඉහාත්මභාවයේදී නිවන් පසක් කරගැණීම සඳහා ඇතිවිය යුතු හෙතු සම්පත් ආදියෙන් සම්පූර්ණ වූ පුද්ගලයා විසින්ම නිර්වාණ ධර්මය ප්‍රත්‍යක්ෂ කරණු මිස අන් ක්‍රමයකින් නිවන් පසක් කළ නොහැකි වේ.

**කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා** ආදි වශයෙන් දක්වන ලද්දාවූ නොහොත් පුනර්භවය හෙවත් නැවත නැවත සසරෙහි සත්ත්වයාගේ ඉපදීම ඇතිකරන්නාවූද, සතුටුවන නොහොත් ඇලෙන රාගය හා එකී භාවයට ගියාවූ ද, ඒ ඒ උපන් ආත්ම භාවයන්හි හෝ රූප

ශබ්දාදී ආරම්මණයන්හි ඇලෙන්නාවූ ද, රැහැණකින් බඳින්නා සේ සත්ත්වයන් බඳින පඤ්චකාම ගුණික රාග සඞ්ඛ්‍යාත **තෘෂ්ණාව ද** භව ප්‍රාර්ථනා වශයෙන් උපන් ශාස්වත දෘෂ්ටිය සමග පැවති රූපාරූප රාග ධ්‍යාන නිකාන්ති සඞ්ඛ්‍යාත **භවතෘෂ්ණාව ද**, සත්ත්වයන් මරණයට පත්වූකල, ඉන්පසු උත්පත්තියක් නැත යන උච්ඡේද දෘෂ්ටිය සමග පවත්නා **විභව තෘෂ්ණාවද** යනාදි වශයෙන් දක්වන ලද සියළු තෘෂ්ණාවන්ගේ හා ඒ සමග හටගන්නාවූ අනිකුත් කෙලශ ධර්මයන්ගේද, භූමිලබ්ධ ක්ලෙශයන්ගේ ද සමුද්ඝාත වශයෙන් නිරවශෙෂයෙන් මාර්ග සඞ්ඛ්‍යාත විරාගයෙන් යම් නිරුද්ධ කිරීමක් වේද, නොහොත් නිරවශෙෂ ප්‍රහාණියක් හෝ නිරවශෙෂ නිරොධයක් හෝ අනුත්පාද නිරොධයක් හෝ වේද, යම් ආලය ඇරීමක් වේ ද සර්වාකාරයෙන් ඉතිරියක් නොකොට ආලයාගේ දුරලීමක් වේද, ඒ ආලයාගේ මිදීමක් වේද, නොඇල්මක් වේ ද, එයට **දුක්ඛ නිරොධය** හෙවත් පරමාර්ථ වශයෙන් **නිර්වාණ** යයි කියනු ලැබේ.

**අසඞ්ඛත** බව නිර්වාණයාගේ විශෙෂ ලක්ෂණයකි. **අසඞ්ඛත** යනු ප්‍රත්‍යයකින් හට නොගත් බවය. ලෞකිකවූ, සියලුම ආධ්‍යාත්ම බාහිර සන්තානයන්හි හටගන්නා වූ නාම රූප ධර්ම වනාහි, අවිද්‍යාදි ප්‍රත්‍යයෙකින් හෝ ශීතොෂ්ණ සඞ්ඛ්‍යාත සෘතු ප්‍රත්‍යයකින් හෝ හටගන්නා බැවින් **සඞ්ඛතය**. **නිර්වාණ ධර්මයාගේ** හටගැනීමට එවැනි ප්‍රත්‍යයක් උපකාර නොවන බැවින් **අසඞ්ඛතය** මෙසේ අසඞ්ඛත ධර්මයක් වන බැවින් නිර්වාණයට උත්පාදයක් හෝ ජරාවක් හෝ මරණයක් හෝ නැත්තේය **අමතවර** යයි කියනුයේ ඒ හෙයිනි.

තවද, **නිර්වාණ ධර්මය**, වේදනාදිය මෙන් හෙතු ප්‍රත්‍යය සඞ්ඛ්‍යාත කාරණයන්ගේ එක්වීමෙන් නොනිපන් හෙයින්ද, යම් දිනෙක උත්පාද අවස්ථාවකින් නූපන් බැවින් ද, **අජාතය**. ඉබේම, කරුණු නැතිව නොනිපන් හෙයින්

**අභූතය.** මෙසේ **අජාත, අභූත** වන හෙයින් යම් **කාරණ**-යකින් නොකළ හෙයින්ද, දෙවි බඹුන් ආදි යම් කිසි ඊශ්වරයෙකු විසින් නොමවනලද හෙයින් ද, **අකෘතය.** රූපාදි සඞ්ඛත ධර්මයන්ට මෙන් **ජාත, භූත කෘත** භාවය නැති හෙයින් ද, නොයෙක් හේතු ප්‍රත්‍යයන්ගෙන් පිළියෙළ නො කැරුණු හෙයින් ද **අසඞ්ඛතය**.

**සංසිඳවීම** නිරෝධයාගේ ප්‍රධාන **ලක්ෂණය වේ.** රාග ද්වේෂ මෝහාදි ක්ලේශයන් ක්ෂය කිරීමෙන් සියලු දුක් සංසිඳුවන්නේ ය. එහෙයින් වේදනාවන් පමණක් නොව සියලුම සංස්කාර ධර්මයන් නැවත නූපදනා පරිදි සංසිඳීමෙන් ව්‍යපසම සුඛ සඞ්ඛ්‍යාත නිර්වාණ ධාතුවට පැමිණිය යුතු වේ. ච්‍යුත නොවීම හෙවත් නොගිලිහෙන බව නිර්වාණයාගේ **සම්පත්තියද, කෘත්‍යයද** වේ අවිකාරි බවද, වෙනස් නොවන බවද නිර්වාණයාගේ **කෘත්‍යය** වන්නේය. **රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ,** යන පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත නිමිත්තයෙන් වෙන්වූ බවද, රාගාදි නිමිති නැති බව ද, ශරීරයක් නැති බවද නිර්වාණයාගේ **වැටහෙන ආකාරය** වේ.

සතර ආර්ය මාර්ගඥානයෙන්ම ප්‍රත්‍යක්ෂකිරීම් වශයෙන් අවබොධ කළ යුතු මේ **නිර්වාණ ධර්මය අනන්තය.** පටන් ගැනීම් අවසන්වීම් ආදි වශයෙන් කෙළවර නැති හෙයින්ද නිර්වාණය අනන්තය. ඉන්ද්‍රිය බද්ධවූ ස්කන්ධ සන්තතීන් හෙවත් ලෝක ව්‍යවහාර වශයෙන් ඒ ඒ සත්ත්වයන් පිළිබඳවම නිවණ හෙවත් දුක්ඛ නිරෝධය වන බැවින් කොතෙක් දෙනා නිවණට පැමිණියත්, එයින් නිර්වාණයාගේ පිරීමක් හෝ අඩුවීමක් හෝ නොවන්නේය. සත්ත්ව විෂය අප්‍රමාණ බැවින් අසුවල් දිශාවෙහි හෝ අසුවල් ප්‍රදේශයෙහි තිබේ යයි හෝ නියම කිරීම් වශයෙන් නොදැක්විය හැකි බැවින් නිවණ **අප්‍රමාණද** වේ.

ගිනි ඒකාන්තයෙන්ම ඇත්තාවූම හෙවත් විද්‍යමානවූ වස්තුවකි. නමුත් අසුවල් දිශාවෙහි හෝ අසුවල් දේශයෙහි

හෝ තිබේයයි කියනොහැකිය. ගිනි හටගන්වන යම් යම් මාර්ග ඇත්නම්, ඒ ඒ මගින් ඇත්තාවූම ගින්න ප්‍රකාශයට පැමිනෙන්නේ ය. එමෙන්ම, සත්ත්ව සන්තානයෙහි ශීල සමාධි ප්‍රඥා ආදිය වැඩීම් වශයෙන්, මධ්‍යම ප්‍රතිපදායෙන් නිත්‍යයෙන් විද්‍යමානවූම නිර්වාණයට ප්‍රත්‍යක්ෂ කිරීම් වශයෙන් පැමිණෙනු මිස, අමුතුවෙන් ඉපැද්විය යුත්තක් නොවන්නේ ය. සැමතන්හි පවත්නා ගිනි එකම ගින්න මුත්, වෙන වෙන ගිනියයි නොකිය යුතුවාක් මෙන්, කොපමණ දෙනා නිවන් පසක් කළත්, ඒ පසක් කරණු ලබන්නේ නොයෙක් නිවන් නොව එකම නිවණ යයි කිව යුතු යි.

මේ **නිර්වාණ ධර්මය**, අති සූක්ෂම වූ ව්‍යපසම සඞ්ඛ්‍යාත සුඛස්වයකි. අනුන්ගෙන් අසාගත් පමණකින් එහි තත්ත්වය නොදත හැකිවේ. තමා විසින්ම, තමාගේ නුවණැසින්ම දක්කයුතු වූ ද, **සාන්දෘෂ්ටික** ධර්මයකි. ලෞකික පෘථග්-ජනයාහට ස්වකීය ඥානයෙන් නිවණෙහි තතු **දැක** ගැනීම ඉතා දුෂ්කරය. එබැවින් නිර්වාණය **අනිදස්සනය.**

සැම **කර්මස්ථාන** මාර්ගයකින්ම නිවණට පැමිණිය හැකි බැවින් හැම පැත්තෙන්ම පැමිණීමට තොට ඇතියයි කියන ලදි.

ලෝකයෙහි ඇතිවන්නාවූ **පඨවි, ආපො, තෙජෝ, වායො** යන සතර මහා භූතයෝ එහි නැත. එහෙයින් උපාදය රූපයන්ද නැත්තේමය භූතොපාදය රූපයන් විසින් සකස් කරණු ලබන, දික්වූද, කෙටිවූද, කුඩාවූද, මහත්වූද, සුභවූද, අසුභවූද වස්තූහු එහි නැත. ශීල, සමාධි, ප්‍රඥා ආදිය වැඩීම් වශයෙන් මධ්‍යම ප්‍රතිපදායෙන්ම එයට පැමිණ, සංසාර සඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධ සන්තානය නම්වූ **නාම රූප** දෙකම ඉතිරි නැතිවම නිරුද්ධ කරණු ලබන්නේය. **දුක්ඛ දුක්ඛය, විපරිනාම දුක්ඛය, සංඛාර**

**දුක්ඛය, පටිච්ඡන්න දුක්ඛය, අපටිච්ඡන්න දුක්ඛය, පරියාය දුක්ඛය, නිප්පරියාය දුක්ඛය** යනාදි වශයෙන් දක්වන ලද්දාවූ සියළු දුක් විඳින්නාවූ නාමස්කන්ධසන්තතිය හෙවත් අනාදිමත් කාලයක් සිඳී සිඳී බිඳී බිඳී, වැල නොකැඩී පැවත ආ චිත්ත පරම්පරාවන්ගේ අන්තිම විඤ්ඤාණයාගේ නිරෝධයෙන් නිවනට පැමිණ අනුපාදිශෙෂ වශයෙන් ඉතිරියක් නැතිවම නාම රූප සියල්ලම නිරුද්ධ වන්නේය.

**නිර්වාණය අසම්මිශ්‍රය**. නාමරූපයන් එකිනෙකට බැඳී මිශ්‍ර භාවයෙන් පවත්නාක් මෙන්, නිර්වාණයාගේ, ඔවුන් හා මිශ්‍රභාවයක් නැත. මෙසේ ස්කන්ධ සන්තානය හා මිශ්‍රභාවයක් නැතත්, හුදකලාවම ඇතත්, ස්කන්ධ සන්තානය හා පිළිබඳ කම් ඇත්තක්ව, පඤ්චස්කන්ධය ඇසුරුකොටගෙනම ඇත්තේය. එසේ දක්වන ලද්දේ යොගාවචරයා විසින් මධ්‍යම ප්‍රතිපදායෙන් රහත් බවට පැමිණ, මේ ස්කන්ධ සන්තානය නම් වූ සංසාරයෙන් මිදී ඒ කේවල ධර්ම මාත්‍රය වී එයින් සංසාර මුක්තිය ලබා ගන්නා හෙයිනි. රහත් බවට පැමිණීමත් සමගම, ක්‍ෂය කළ ආශ්‍රව ඇති හෙයින් ක්ෂීණාශ්‍රව නම්වූ ඒ අයවීයන් වහන්සේ, **සඋපාදිසෙස වශයෙන්ද** පිරිනිවීමෙන් හෙවත් කායයාගේ **භෙදයෙන් අනුපාදිසෙස** වශයෙන්ද **නිවණට** පැමිණෙන්නේ ය, හෙවත් **ධර්මිසථ** වන්නේය. නැවතත් දෙව බ්‍රහ්මාදි සත්ත්ව සඞ්ඛ්‍යාවට කිසි කලෙකත් නො පැමිනෙන්නේය.

සත්ත්වයායයි පරමාර්ථ වශයෙන් කිවයුතු යම්කිසිවක් ලෝකයේ අවිද්‍යමානය. රූප ශබ්දාදි කාමයන් අරමුණු කොටගෙන සත්ත්වයෝ දුක් සැප විඳින්නාහු යයි කී කල්හි සත්‍ය වශයෙන් එසේ විඳින පුද්ගලයෙක් හෝ සත්ත්ව-යෙක් හෝ නැත්තේම ය. රූපයක් අරමුණු කොටගෙණ චක්ෂුර් විඥානය උපදී. පරමාර්ථ වශයෙන් රූපය යනු යම්කිසි ප්‍රත්‍යයකින් හටගෙන චිත්තක්ෂණ සතළොසකින්

නිරුද්ධ වන්නාවූ රූප කලාපයකට අයත් වර්ණ රූපයකි. චක්ෂුර් විඥානය යනු රූප දක්නා එක්තරා සිතකි. එයද ප්‍රත්‍යයකින් හටගත් නාම ධර්මයකි. එහි ආයුෂය රූපයාගේ ආයුෂයෙන් සතළොසකින් එක් කොටසකි. ක්ෂණයක් ක්ෂණයක් පාසා ඉපිද බිඳී යන නාම ධර්ම පරම්පරාවට අයත් එක් ධර්මයකි. ඒ සිත උපදින්නේ චක්ෂු ප්‍රසාද වස්තුව ඇසුරුකොට ගෙණය. චක්ෂු ප්‍රසාද වස්තුවද, සතර ප්‍රත්‍යයෙන්ම හටගත් රූප කලාප පරම්පරා සමූහයකින් පිරිවරණ ලද්දාවූ සතළොස් චිත්තක්ෂණයකට වඩා ආයුෂය නොවලඳන්නාවූ රූප ධර්මයකි. දුක්වූ හෝ සැපවූ හෝ විඳීම නම්, අරමුණු රසය විඳින්නාවූ ඒ සිත හා එක්ව උපන් වේදනා චෛතසිකය වේ. එයද එක් චිත්තක්ෂණයක් ආයු වළඳා සිතත් සමගම එක ක්ෂණිකව නිරුද්ධ වන්නේය. මේ හැර දුක් හෝ සැප හෝ විඳින්නාවූ සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ ආත්මයක් හෝ කොතැන්හිවත් විද්‍යමාන නො වේ. මෙසේ ක්ෂණයක් පාසා ඉපිද නිරුද්ධ වන්නාවූ, නිත්‍ය නොවූ වස්තුවක හෝ ධර්මයක නිත්‍ය වූ සැපතක් ඇති නොවන්නේ ය. ඒ සන්තානයෙහි ඇති-වන්නේ ඒකාන්තයෙන්ම දුක්මය. කාරකයෙක් හෝ වේදකයෙක් හෝ අවිද්‍යමානය. නාම රූප ධර්මයන්ගේ විකාර ස්වභාවයක් මිස අන් කිසිවක් නැත. නමුත් ක්‍රියාවක්ද දුකක්ද ඇත්තේමය.

භවයෙක්හි ඉපදීම හෙවත් ස්කන්ධයන් ගේ පහළවීම දුකය. උපන්නාවූ ස්කන්ධ සන්තානයෙහි හටගන්නේත් දුක්මය. අධ්‍යාත්ම බාහිර සන්තාන වශයෙන් ගත්කල්හිද දුක්මය. ජරා, ව්‍යාධි මරණාදි අනෙකවිධ දුකඛයන්ට භාජනවන්නේත් ස්කන්ධ පඤ්චකයෝමය. භවයෙන් භවයට පැමිණීමේදී හටගන්නේත් දුක් උපදවන්නාවූ ස්කන්ධයෝමය. මේ ස්කන්ධයන්ගෙන් යම් මිදීමක් වේද? ස්කන්ධ පරම්පරාවන්ගේ නැවත හටගැනීමක් නොවන්-නේද, එකල්හි දුකඛයන්ගෙන් මිදීමක් වන්නේය.

දුක්ඛයන්ගේ නැවත හටගැනීමක් නොවන්නේය. යම් කලෙක මේ ස්කන්ධයන්ගේ අනුත්පාද නිරෝධයක් වේද, එයම දුක් සංසිඳීමෙන් පැමිණෙන ව්‍යපසම සුඛය වන්නේය. නැවත දුක්ඛස්කන්ධයන්ගේ හටගැනීමක් කවර කලෙකවත් නොවන්නේද, එහෙයින්ම දුක් සන්සිඳීමෙන් පැමිණෙන ශාන්ත සුඛය කවර කලෙකවත් නැති නොවන්නේය. දුක්ඛ ස්කන්ධයෝ නැතිකල්හි ජාති ජරා මරණාදියක් නැති හෙයින් ව්‍යපසම සුඛභාවයෙහි ජාති ජරා මරණාදියක් ද නැත්තේය. එබැවින් එක් එක් සන්තානයක් පිළිබඳවූ යම්තාක් අතීතවූද, වර්තමානවූද, දුක්ඛස්කන්ධයන්ගේ යම් අසෙස නිරෝධයෙක් වේද, හෙවත් නැවත ඒ සන්තානයෙහි නූපදනා පරිද්දෙන් නිරුද්ධ කිරීමක් වේද, එය නිවණට පැමිණීම යයි දත යුතුයි.

නිර්වාණ ධාතුවෙහි පඨවි ආදි රූප ධර්මයක් හෝ විඤ්ඤාණාදී නාම ධර්මයක් හෝ නැත. රූප ධර්ම නිරුද්ධවී විඤ්ඤාණය පමණක් ඉතුරු වී නම්, වේදනාව සිත හා එක්ව උපදනා චෛතසිකයක් බැවින්, වේදනාව ඉතිරි වන්නේය. එකල්හි නාම රූප ධර්මයන්ගේ අශෙෂ නිරෝධයක් නොවන්නේය. එයට නිර්වාණ යයි කියයුතු නොවේ සියලු දුකින් මිදීමක් නොවන හෙයිනි. එබැවින් විඤ්ඤාණයන් සහිතවූ සියලුම නාම රූප ධර්මයන්ගේ නිරෝධය නිර්වාණය නම් වන්නේය. එක් එක් සන්තානයක් පිළිබඳව මෙසේ ඇතිවන්නාවූ දුක්ඛ නිරෝධය හෙවත් ස්කන්ධයන්ගේ අභාවය ඇති කල්හි ඇසින් තබා අන් මගෙකින්වත් දැකිය හැකි වස්තුවක් නැත්තේය. අනාදිමත් කාලයක සිට පැවත ආ ස්කන්ධ සන්තතීන් ගේ අභාවයම ප්‍රකට වන්නේය. එබැවින් නිර්වාණයෙහි සූන්‍ය බවෙක් දක්වන්නේ නම්, සසර පහළ කරවන ස්කන්ධයන්ගෙන්ද සියලු සංසාර දුක්ඛයන්ගෙන්ද, විපරිනාම දුක්ඛ සංඛාර දුක්ඛ සඞ්ඛ්‍යාත සියලු වේදයිත සුඛයන්ගෙන්ද සූන්‍ය බවම කිවයුතුවේ. එහෙයින්ම, නිර්වාණ ධර්මය නිත්‍යවූද ශාන්තවූද,

විඳීමක් නැත්තාවූද, ජාති ජරා මරණාදියෙන් මිදීම් සඞ්ඛ්‍යාත පරම සුඛයක් බවම ප්‍රකට වන්නේය.

වෙදයිත සුඛය නම්වූ විඳින සැපය, විඳිනු ලබන්නාවූ සත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ පරමාර්ථ වශයෙන් නැත්තේ වී නම් නොවිඳින්නාවූ ව්‍යුපසම සුඛය විඳින්නෙක් කෙසේ සොයාගත හැකිද? නොහැක්කේමය.

ලෝකය හා සම්බන්ධවූ හෙවත් ලෝකයට අයත් නාම රූප ස්කන්ධාදියක් නැතිවූද, ඇසින් නො දත හැකිවූ ද නවීන විද්‍යා ශාස්ත්‍ර තර්ක ආදීන්ගේ උපකාරයෙන් සොයාගත නො හැකිවූද, විඳින්නාවූ සත්වයෙක් හෝ පුද්ගලයෙක් නැති හෙයින්ද අන්මගෙකින් හෝ එහි තතු ප්‍රකාශ කළ නොහැකි හෙයින් නිවණ කිසිවක් නැති හිස් දෙයක් ය්‍යෙහෝයි ධර්මය නොවැටහුණු පෘථග්ජනයන් හට සැක උපදින්නේමය.

**නිර්වාණ ධර්මය** තර්කානුසාරයෙන් හෙවත් තර්කයෙන් විවෙචනය කොට නිරණයකට පැමිණිය හැකි දෙයක් නොවන නිසා **"අතර්කාවචර"** යයි දෙශනා කොට තිබේ. තර්ක ශාස්ත්‍රාදිය වනාහි ලෝකයෙහි යම් යම් අර්ථයන් මැන නිරණය කරගැනීමට විද්‍යාඥයින් විසින් උපදවා ගන්නාලද උපකරණයෙකි. එයිනුදු සැම ලෞකික දෙයක් වුවත් මැනගත නොහැකි වේ. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශාදීහු ඇස්, කන්, නාස, දිව කය යන ඉන්ද්‍රියයන් විසින්ම දැනගත යුතු වේ. රූපයන් ඇස්වලින් මිස දිවකන් නාසාදියෙන් නොදත හැකි වේ. කවර කලෙකවත් රූප නුදුටු ජාති අන්ධයාහට රූපයන් පිළිබඳව කොපමණ විස්තර කළත්, ඒ රූපයන්ගේ සැටි ඔහට කිසිලෙසකින් වත් වටහාගත නොහැකි වේ. එයට පෙර සවල්ප වශයෙන්වත් රූප දුක පුරුද්දක් ඇති පුද්ගල යෙකුට නම්, ඒ අනුව සවල්පමාත්‍ර දැනීමක් ලබාගැනීමට හැකි වන්නේය. මෙසේ ලෞකික වූ බොහෝ අර්ථයන් ලෞකික තර්ක-ශාස්ත්‍රානුසාරයෙන් වටහාගත නොහැකිනම්, මේ ලෝක යට අයත් නැති ලොකොත්තර ධර්මයක් වූ නිර්වාණ ධර්මය

ඒ මගින් කිසිසේත් වටහාගත හැකි නොවේමය. ඒ ලෝකෝත්තරවූ නිර්වාණ ධර්මය, ලෝකෝත්තරවූ ප්‍රඥා චක්ෂුසින් තම තමන් විසින්ම ප්‍රත්‍යක්ෂ වශයෙන් දැක තීරණය කටයුතු වේ, නාම රූප ආදී ස්කන්ධයෝද, ඇසින් දත හැකි සියලු වස්තූන්ද, නවීන විද්‍යා ශාස්ත්‍රයන්ට ගොදුරුවන්නාවූ සෑම දෙයක්ද, සියලු වේදනාවෝද සඞ්ඛත ධර්ම වනහෙයින් අනිත්‍යය, දුකය, අනාත්මය යනාදී වශයෙන් ප්‍රතිවේධ ඥානයකින් අවබෝධ කර නොගෙන නිර්වාණයාගේ තත්වය වටහාගත නොහැකිවේ එබැවින් නිර්වාණය කෙබඳු ධර්මයක්දැයි දැනගැනීමට කැමැති සැදැහැති-යන් විසින් තර්කශාස්ත්‍රාදිය පසෙක තබා පළමුකොට නාම රූප ධර්මයන් පිළිබඳව මනා අවබෝධයක් ඇතිකරගත යුතු වේ.

එපමණක් නොව ලෝකයෙහි නුවණැතියන් **ආගම සිද්ධිය, න්‍යාය සිද්ධිය, අනුමාන සිද්ධිය** යන ක්‍රමයෙන්ද, නිවන් ඇති බව අවබෝධ කරගැනීමට උත්සාහ දරත්.

**ආගම සිද්ධි** යනු බුදුරජාණන් වහන්සේ විසින්ද, නිවන් පසක් කළ ආර්‍ය්‍යයන් වහන්සේලා විසින්ද, නිර්වාණය ඒකාන්තයෙන්ම විද්‍යමාන ධර්මයක් වශයෙන් නොයෙක්වර නොයෙක් තන්හි දක්වා වදාළ හෙයින් අවිවාදයෙන් පිළිගත යුතුයයි තීරණයකට පැමිණීමය.

**න්‍යාය සිද්ධි** යනු යුක්ති දැක්වීමෙන් හෙවත් නිවන් නම් වූ ධර්මයක් නැත්නම් සතර මාර්ගයන් හා සතර ඵලයන්ද නැත්තේය සතර මාර්ග ඵලයෝ නැත්නම් ආර්‍ය්‍යයෝ ද නැත තමුන් නිවන් අවබෝධකළ බුදු පසේ බුදු මහරහත්හු ඇතිබවට නොයෙක් කරුණු ඉතිහාසාදියෙන් මනාකොට දැක්විය හැකි බැවින්ද නිවන විද්‍යමාන ධර්මයක් යයි තීරණයකට පැමිණීමය

**අනුමාන සිද්ධි** යනු තම තමන් විසින් ප්‍රත්‍යක්ෂ වශයෙන් දත් දෙයකට සමාන කොට බලා, ප්‍රත්‍යක්ෂ

නොකළ දෙය සම්බන්ධව නිරණයකට පැමිණීමය. දුක් ඇති කල්හි දුකට ප්‍රතිපක්ෂවූ සැපතක් ද ඇතිවිය යුතුය. අඳුර ඇති කල්හි, එයට ප්‍රතිපක්ෂවූ ආලෝකයක්ද ඇතිවිය යුතුය. එමෙන්ම ජාති, ජරා, මරණාදියෙන් සකස්වූ සසරක් ඇත්නම් එයට හාත්පසින්ම ප්‍රතිපක්ෂවූ, ජාති, ජරා, මරණාදියක් නැති නිවණකුත් ඇතිවිය යුතුය, යනා ආදි ක්‍රමයෙන් නිර්වාණය හිස් දෙයක් නොව විද්‍යමානවූ ශාන්ත සුඛ සඞ්ඛ්‍යාත ලෝකෝත්තර ධර්මයක්ම බව අනුබෝධ ඥානයෙන් වටහා ගන්නේය.

**නිර්වාණ ධර්මය** සාන්ති ලක්ෂණයෙන් එකක්වුවද, එයට පැමිණීමේ ආකාර වශයෙන් දෙයාකාර වේ. එනම්.

1. **සෝපාදිසෙස නිර්වාණ ධාතුව**
2. **අනුපාදිසෙස නිර්වාණ ධාතුව**

**1. සෝපාදිසෙස නිර්වාණ ධාතුව.** තණ්හා දිට්ඨි ආදි වශයෙන් දැඩිකොට අල්වාගනු ලබන්නේය යන අර්ථයෙන් උපාදි නම් වූ පඤ්චස්කන්ධය ශෙෂ කොට හෝ උපාදිය නිරව ශෙෂ නොකොට හෝ කර්මකෙලශ ප්‍රහීණ කිරීම සෝපාදිසෙස නිර්වාණ ධාතුවට පැමිණීම වේ. අතීත් එලසථ ආයර්යන් වහන්සේයි මෙයට **කෙලශ පරිනිර්වාණය** යයි ද, **දිට්ඨ ධම්ම නිබ්බාණ** යයි ද කියනු ලැබේ.

2. **අනුපාදිසෙස නිර්වාණ ධාතුව.** උපාදි නම් වූ නාම රූප සකන්ධයන් ගේ නිරෝධයෙන් හෙවත් රහතන් වහන්සේ ගේ පරිනිර්වාණයෙන් අනුපාදිසෙස නිර්වාණ ධාතුවට පැමිණෙන්නේය. කෙලශ ප්‍රහීණයෙන් පසු ඉතිරිව තිබූ සියලු සකන්ධයෝ ද නිරුද්ධ වූහ. සංසාර මුක්තිය හෙවත් සසරින් මිදීම සම්පූර්ණ විය මෙයට **ස්කන්ධ පරිනිර්වාණය** යයි ද, **සම්පරායික නිබ්බාණ** යයි ද කියන ලදී.

තවද නිර්වාණ ධාතුවට පැමිණීමේ ක්‍රම වශයෙන් නිර්වාණය ත්‍රිවිධ වේ.

**1. සුඤ්ඤත නිර්වාණ ධාතුව**
**2. අනිමිත්ත නිර්වාණ ධාතුව**
**3. අප්පණිහිත නිර්වාණ ධාතුව**

මාර්ගඵලාධිගමයට පූර්වයෙහි විදර්ශනා වඩන්නාවූ පුද්ගලයාගේ විදර්ශනාඥානයත් මස්තකප්‍රාප්ත වන කල්හි, ඔහට **අනිත්‍ය, දුක්ඛ, අනාත්ම,** යන ත්‍රිලක්ෂණයන් අතුරෙන් එක් ලක්ෂණයක් අනිකුත් ලක්ෂණ වලට වඩා ප්‍රකටව වැටහීමෙන් නිර්වාණාවබෝධය වන්නේය.

1. **සුඤ්ඤත නිර්වාණ ධාතුව**. මාර්ග චිත්ත වීථියෙහි උපදනා **පරිකර්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ** සඞ්ඛ්‍යාත වූ පූර්වභාග ප්‍රතිපදාවන් අතුරෙන් අනුලෝම චිත්තයට, නිර්වාණ ධර්මය, ආරම්මණ වශයෙන් ද, සම්ප්‍රයෝග වශයෙන් ද රාග, ද්වේෂ, මෝහාදීන්ගෙන් ශූන්‍ය බව හෙවත් නිර්වාණය, සියලු කෙලෙසුන්ගෙන් හිස්වූ බවද ප්‍රකටව වැටහෙන්නේය. සඞ්ඛත ධර්මයන් විසින් සත්ත්ව සන්තානය නිතර පෙළනා බවත්, ශාන්ත සුඛය වළක්වන බවත්, නිර්වාණ ධර්මය අසඞ්ඛත බවත්, එබඳු පලිබෝධයන්ගෙන් ශූන්‍ය බවත් අවබෝධ වන්නේය එකල්හි ඔහට සියලු සංස්කාර ධර්මයන්ගේ ශූන්‍ය බව වැටහීමෙන් අනාත්ම ලක්ෂණය හෙවත් ආත්මය යයි ගැනීමට කිසිවක් නැතැයි වැටහී නිර්වාණාවබෝධය වන්නේය එවිට ඒ අනුලෝම චිත්තය හා එක්ව යෙදුනාවූ ප්‍රඥා චෛතසිකය **සුඤ්ඤතානුපස්සනා විමොක්ෂ මුඛය** කියාද, එම චිත්තවීථියෙහි උපන් මාර්ගයට **සුඤ්ඤත මාර්ගය** යයි ද, එයට අනතුරු උපදනා ඵලයට **සුඤ්ඤත ඵලය** යයි ද, ඒ මාර්ගඵලයන්ට අරමුණු වන්නාවූ නිර්වාණයට **සුඤ්ඤත නිර්වාණය** යයි ද කියනු ලැබේ.

2. **අනිමිත්ත නිර්වාණ ධාතුව.** මාර්ග චිත්ත වීථියෙහි පහළවන්නාවූ අනුලෝම චිත්තයට නිර්වාණය, රාගාදි නිමිති රහිත බව ප්‍රකටව වැටහෙන කල්හි හෙවත් සඞ්ඛත ධර්මයෝ නිමිත්ත සහිතය. සංසාරයාගේ පැවැත්මට නොහොත් ජාතියෙන් ජාතියට ඉපදීම් මැරීම් වශයෙන්

පැමිණවීමට මුල් වන රාගාදි කෙලෙශයන්ට ද, ජරා මරණාදීන්ට ද, සියලු දුක්ඛයන්ට ද වස්තු වන්නේය. අනිත්‍ය වූ නාම රූප ධර්මයන්ගේ පැවැත්මට මුල් වූ රාගාදි නිමිත්ත රහිත බැවින් නිර්වාණය ශාන්තය, යනාදී වශයෙන් අනිත්‍ය **ලක්ෂණය** ද, **නිර්වාණය** නිමිත්ත රහිත බවද, වැටහෙන්නාවූ අනුලොම සිත හා එක්ව යෙදුනාවූ ප්‍රඥා චෛතසිකය **අනිමිත්තානුපස්සනා විමොක්ෂ මුඛය** යයි ද එයට අනතුරුව පහලවන මාර්ග ඵලයන්ට **අනිමිත්ත මාර්ගය** හා **අනිමිත්ත ඵලය** යයි ද ඒ මාර්ග ඵලයන්ට අරමුණු වන්නාවූ නිර්වාණය **අනිමිත්ත නිර්වාණය** යයි ද කියනු ලැබේ.

3 **අප්‍රණිහිත නිර්වාණ ධාතුව** මාර්ග චිත්ත වීථියෙහි පහල වන්නාවූ අනුලොම සිත්වලට දුක්ඛ **ලක්ෂණය** ප්‍රකටව වැටහෙන කල්හි, සඞ්ඛත ධර්මයෝ ප්‍රණිධි හෙවත් ප්‍රාර්ථනා සහිතය. සසර වසන්නාක් දෙව් මිනිස් දෙගතියෙහි සැප පමණක් නොව අපා දුකට ද පත්වන්නේය. මේ සියල්ලටම හේතු වන්නේ තෘෂ්ණා **ප්‍රණිධිය** ය. නිර්වාණ ධර්මය එවැනි ප්‍රණිධි රහිතය රාගාදීන් කෙරෙන් මිදුණේද වේ. සියලු දුක් සංසිඳුවන බැවින් **නිර්වාණය** අප්‍රණිහිතය යයි මෙසේ වැටහෙන්නේය. එකල්හි එම අනුලොම චිත්තය හා එක්ව යෙදුනාවූ ප්‍රඥා චෛතසිකයට **අප්‍රණිහිතානුපස්සනා විමොක්ෂ** මුඛය යයි ද, එයට අනතුරුව උපදනා මාර්ග ඵලයන්ට **අප්‍රණිහිත මාර්ගය** සහ **අප්‍රණිහිත ඵලය** යයිද ඒ මාර්ගඵලයන්ට අරමුණු වන්නාවූ නිර්වාණයට **අප්‍රණිහිත නිර්වාණ ධාතුව** යයි ද කියනු ලැබේ.

අනාදිමත් කාලයක් මුලුල්ලෙහි පරම්පරාව නොසිඳී පැවත එන, එක් එක් සන්තානයක් පිළිබඳ වූ නාමරූප සන්තතීන්ගේ හෙවත් දුක්ඛස්කන්ධයන්ගේ නිරොධය නම්වූ නිවණට පැමිණීම එක් වරකින් නොව පස්වරකින් සිදු වන්නේය.

පළමුවරට නිවණට පැමිණීම වන්නේ සෝවාන් මාර්ගාවස්ථාවේ දී ය. සෝවාන් මාර්ගයට පැමිණීමත් සමගම මතු සතර අපායෙහි පහළකරවන ස්කන්ධයෝද සත්වරකට මතුයෙහි කාමසුගතියෙහි උපදින්නට තිබෙන ස්කන්ධයෝද අනුත්පාද වශයෙන් නිරුද්ධ වන්නාහ. එබැවින් සතර අපයෙහි ඉපදීමත් කාම සුගතියෙහි සත්වරකට වඩා ඉපදීමත් නොවන්නේය. මෙසේ ආර්‍ය්‍ය භාවයට නො පැමිණ පෘථග්ජන භාවයෙහිම සිටින පුද්ගල සන්තාන යක සුගති දුගති දෙක්හි ඉපදවිය හැකි ස්කන්ධ සමූහයා හා සසඳා බලන කල්හි අති විශාල ස්කන්ධ සංඛ්‍යාවක් පළමුවරට නිවනට පැමිණීමේදීම නිරුද්ධ වූ බව ප්‍රත්‍යක්ෂ වේ ඒ ආර්‍ය්‍ය පුද්ගල සන්තානයෙහි ඉතිරිව ඇත්තේ කාම සුගතියෙහි සත්වරකට නොවැඩි කාලයක් ඉපිදවිය හැකි ස්කන්ධයෝ පමණය.

දෙවෙනි වරට නිවණට පැමිණීම වන්නේ සකෘදාගාමි මාර්ගාවස්ථාවේදීය. සකෘදාගාමි මාර්ගයට පැමිණීමත් සමගම ජාති සතකට සීමාවී තිබූ ස්කන්ධයන්ගෙන් එක් භවයකදී ඉපිද විය හැකි ස්කන්ධයෝ හැර අතිකුත් ජාති සයකට අයත් ස්කන්ධ සමූහයෝද නිරුද්ධ වන්නාහ. එබැවින් මතු මාර්ගඵලයන්ට නොපැමිණියේ නම් එක් වරකට වඩා කාම සුගතියෙහි උත්පත්තියක් නොවන්නේය.

තුන්වෙනි වරට නිවනට පැමිණීම වන්නේ අනාගාමි මාර්ගාවස්ථාවේදීය. අනාගාමි මාර්ගයට පැමිණීමත් සමගම කාමභවයෙහි එක්වරකට සීමාවූ ස්කන්ධයෝ ද නිරුද්ධ වන්නාහ. හෙතෙමේ, අර්හත් ඵලයට නොපැමිණියේ නම් මරණින් මතු කාම භවයෙන් මිදී සුද්ධාවාස බ්‍රහ්ම තලයන්හි ඉපිද එහිදී රහත්ව පිරිනිවීම වන්නේය.

සතරවන වරට නිවණට පැමිණීම වන්නේ අර්හත් මාර්ගාවස්ථාවේදීය. රහත්වීමත් සමගම රූපාරූප භවයන්හි පහළ වීමට තිබූ ස්කන්ධයෝ ද නිරුද්ධ වන්නාහ. එබැවින් ඒ අත්බැවෙන් පසු මතු භවයක් උපදවන්නට ස්කන්ධයෝ නැති හෙයින් අනාගත භවයක පහළවීමක් නොවන්නේය.

ඒ සන්තානයෙහි ඉතිරිව ඇත්තේ අතීත හේතුවෙන් හටගත්තාවූ වර්තමාන භවයට අයත් ස්කන්ධයෝ පමණය. සෝපාදිසෙස නිර්වාණධාතුවට පැමිණියේද වේ.

පස්වනවරට නිවණට පැමිණීම වන්නේ රහතන් වහන්සේගේ ස්කන්ධ පරිනිර්වාණයේදීය. එතැන්හිදී ශේෂව තිබූ වර්තමාන භවයට අයත් සියළුම ස්කන්ධයෝ නිරුද්ධ වන්නාහ. අනුපාදිසෙස නිර්වාණ ධාතුවට පැමිණියේ වේ.

රහතන්වහන්සේ, ස්කන්ධ පරිනිර්වාණයට පෙර කෙළ ලක්ෂ ගණන් සමාපත්තීන්ට සමවැද ඉක්බිතිව පහළ වන්නාවූ කාමාවචර ක්‍රියා ජවනයන්ගෙන් යුත් මරණාසන්න චිත්ත වීථියේ කෙළවරදී පිරිනිවන් පානසේක. ඒ අවසාන චිත්ත වීථිය, තදරම්මණ භවඞ්ගයට අනතුරුව චුතිය වන මනොද්වාරික චිත්ත වීථියක් වේ නම්, භවඞ්ග චලන, භවඞ්ගුපච්ඡේද, මනොද්වාරාවජ්ජනය යන සිත්වලට අනතුරුව, ත්‍රෛභූමික සංස්කාරයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්මාදී වශයෙන් ගනුලබන අරමුණෙහි එල්බගෙන පහළවන්නාවූ කාමාවචර ක්‍රියා ජවන් සිතක් පිළිවෙළින් පස්වරක් ඉපිද නිරුද්ධවූ කල්හි, එයට අනතුරුව පහළ වන්නාවූ තදරම්මණ දෙසිතෙන් පසු චුති චිත්තය පහළ වන්නේය. මතුභවය පහළකරවන්නාවූ ප්‍රතිසන්ධි බීජයන්ගේ ක්ෂය කිරීම, අර්හත් මාර්ග ඥානයෙන් සිදුවූ බැවින් චුති චිත්තයට අනතුරුව නොරහත් පුද්ගල සන්තාන යන්හි පහළවන්නාවූ පටිසන්ධි චිත්තය, රහතන් වහන්සේගේ චුති චිත්තයට අනතුරුව පහළ නොවන්නේය චුති චිත්තයාගේ නිරුද්ධය හා සමගම සසර පැවත ආවාවූ ඒ සන්තානය පිළිබඳවූ සියලු නාම රූප සන්තතීන්ගේ නිරුද්ධය සිදුවූ බැවින් දුක්ඛනිරොධ නම්වූ නිර්වාණ ධාතුවට පැමිණ, ජාති, ජරා, මරණාදියක් නැත්තාවූ ශාන්තවූ ව්‍යපසම සඞ්ඛ්‍යාත නිත්‍ය සැපතට පත් වන්නේය.

# රූප විභාගය

| | කම්මජ | චිත්තජ | සෘතුජ | ආහාරජ | නිෂ්පන්න | අනිෂ්පන්න | අජ්ඣත්තික | බාහිර | වත්ථු | අවත්ථු | ද්වාර | අද්වාර | ඉන්ද්‍රිය | අනින්ද්‍රිය | ඖදාරික | සුඛුම | උපාදින්න | අනුපාදින්න | සනිදර්ශන | අනිදර්ශන | ගොචරගාහික | අගොචරගාහික | අවිනිබ්භොග | විනිබ්භොග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භූත රූප | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 1 පඨවි | + | + | + | + | + | — | — | + | — | + | — | + | — | + | + | — | + | — | — | + | — | + | + | — |
| 2 ආපෝ | + | + | + | + | + | — | — | + | — | + | — | + | — | + | — | + | + | — | — | + | — | + | + | — |
| 3 තේජෝ | + | + | + | + | + | — | — | + | — | + | — | + | — | + | + | — | + | — | — | + | — | + | + | — |
| 4 වායෝ | + | + | + | + | + | — | — | + | — | + | — | + | — | + | + | — | + | — | — | + | — | + | + | — |
| ප්‍රසාද රූප | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 5 චක්ඛු | + * | — | — | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | — | + | + | — | — | + |
| 6 සෝත | + * | — | — | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | — | + | + | — | — | + |
| 7 ඝාණ | + * | — | — | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | — | + | + | — | — | + |
| 8 ජිව්හා | + * | — | — | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | — | + | + | — | — | + |
| 9 කාය | + * | — | — | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | — | + | + | — | — | + |
| ගෝචර රූප | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 10 රූප | + | + | + | + | + | — | — | + | — | + | — | + | — | + | + | — | + | — | + | — | — | + | + | — |
| 11 ශබ්ද | — | + | + | — | + | — | — | + | — | + | — | + | — | + | + | — | — | + | — | + | — | + | — | + |
| 12 ගන්ධ | + | + | + | + | + | — | — | + | — | + | — | + | — | + | + | — | + | — | — | + | — | + | + | — |
| 13 රස | + | + | + | + | + | — | — | + | — | + | — | + | — | + | + | — | + | — | — | + | — | + | + | — |
| භාව රූප | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 14 ස්ත්‍රීභාව | + * | — | — | — | + | — | — | + | — | + | — | + | + | — | — | + | + | — | — | + | — | + | — | + |
| 15 පුරුෂභාව | + * | — | — | — | + | — | — | + | — | + | — | + | + | — | — | + | + | — | — | + | — | + | — | + |
| හදය රූප | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 16 හදයවත්ථු | + * | — | — | — | + | — | — | + | + | — | — | + | — | + | — | + | + | — | — | + | — | + | — | + |
| ජීවිත රූප | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 17 ජීවිතෙන්ද්‍රිය | + * | — | — | — | + | — | — | + | — | + | — | + | + | — | — | + | + | — | — | + | — | + | — | + |
| ආහාර රූපය | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 18 ඕජා | + | + | + | + | + | — | — | + | — | + | — | + | — | + | — | + | + | — | — | + | — | + | + | — |
| ආකාශ ධාතුව | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 19 පරිච්ඡේද | + | + | + | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | + | — | — | + | — | + | — | + |
| විඥප්තිරූප | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 20 කායවිඥප්ති | — | + * | — | — | — | + | — | + | — | + | + | — | — | + | — | + | — | + | — | + | — | + | — | + |
| 21 වචීවිඥප්ති | — | + * | — | — | — | + | — | + | — | + | + | — | — | + | — | + | — | + | — | + | — | + | — | + |
| විකාර රූප | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 22 ලහුතා | — | + | + | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + |
| 23 මුදුතා | — | + | + | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + |
| 24 කම්මඤ්ඤතා | — | + | + | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + |
| ලක්ෂණ රූප | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 25 උපචය | — | — | — | — | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + |
| 26 සන්තති | — | — | — | — | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + |
| 27 ජරතා | — | — | — | — | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + |
| 28 අනිච්චතා | — | — | — | — | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + | — | + |
| | 18 | 15 | 13 | 12 | 18 | 10 | 5 | 23 | 6 | 22 | 7 | 21 | 8 | 20 | 12 | 16 | 18 | 10 | 1 | 27 | 5 | 23 | 8 | 20 |

* මේ සලකුණෙන් ඒකාන්ත ප්‍රත්‍ය දක්වන ලදී

# රූප වෘද්ධි හා හානි ක්‍රමය

| චිත්තක්ෂණ | ක්ෂුද්‍ර චිත්තක්ෂණ | චිත්තය | රූප වෘද්ධිය: ප්‍රතිසන්ධියේ සිට වෘද්ධිය | | | | | චිත්තය | රූප වෘද්ධිය: චක්ෂුරාදි ප්‍රසාදයන්ගේ පහළවීමෙන් පසු වෘද්ධිය | | | | | | | | | | චිත්තය | රූප හානිය: චුතියට පෙර 17 වන චිත්තක්ෂණයේ සිට රූප හානිය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | කම්මජ රූපකලාප | කම්මපච්චය උතුජ | චිත්තජ රූපකලාප | චිත්තපච්චය උතුජ | උතුපච්චය උතුජ | | කම්මජ රූපකලාප | කම්මපච්චය උතුජ | කම්මපච්චය ආහාරජ | චිත්තජ රූපකලාප | චිත්තපච්චය උතුජ | චිත්තපච්චය ආහාරජ | උතුපච්චය උතුජ | උතුපච්චය ආහාරජ | ආහාරපච්චය උතුජ | ආහාරපච්චය ආහාරජ | | කම්මජ රූපකලාප | කම්මපච්චය උතුජ | කම්මපච්චය ආහාරජ | චිත්තජ රූපකලාප | චිත්තපච්චය උතුජ | චිත්තපච්චය ආහාරජ | උතුපච්චය උතුජ | උතුපච්චය ආහාරජ | ආහාරපච්චය උතුජ | ආහාරපච්චය ආහාරජ |
| | උප්පාද | | 3 | 0 | 0 | 0 | 0 | | 157 | 153 | 3 | 17 | 17 | 0 | 51 | 0 | 0 | 1 | | 357 | 357 | 357 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| 1 | ඨිති | පටි | 6 | 3 | 0 | 0 | 1 | තී | 161 | 157 | 10 | 17 | 17 | 1 | 51 | 1 | 1 | 2 | භ | 357 | 357 | 357 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 9 | 6 | 0 | 0 | 2 | | 165 | 161 | 17 | 17 | 17 | 1 | 51 | 2 | 2 | 3 | | 357 | 357 | 357 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 12 | 9 | 1 | 0 | 3 | | 169 | 165 | 24 | 17 | 17 | 1 | 51 | 3 | 3 | 4 | | 357 | 357 | 357 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| 2 | ඨිති | භ | 15 | 12 | 1 | 1 | 4 | න | 173 | 169 | 31 | 17 | 17 | 2 | 51 | 4 | 4 | 5 | භ | 357 | 357 | 357 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 18 | 15 | 1 | 1 | 5 | | 177 | 173 | 38 | 17 | 17 | 2 | 51 | 5 | 5 | 6 | | 357 | 357 | 357 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 21 | 18 | 2 | 1 | 6 | | 181 | 177 | 45 | 17 | 17 | 2 | 51 | 6 | 6 | 7 | 1 | 357 | 357 | 357 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| 3 | ඨිති | භ | 24 | 21 | 2 | 2 | 7 | ද | 185 | 181 | 52 | 17 | 17 | 3 | 51 | 7 | 7 | 8 | ත | 350 | 357 | 357 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 27 | 24 | 2 | 2 | 8 | | 189 | 185 | 59 | 17 | 17 | 3 | 51 | 8 | 8 | 9 | | 343 | 350 | 350 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 30 | 27 | 3 | 2 | 9 | | 193 | 189 | 66 | 17 | 17 | 3 | 51 | 9 | 9 | 10 | 2 | 336 | 343 | 343 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| 4 | ඨිති | භ | 33 | 30 | 3 | 3 | 10 | ම | 197 | 193 | 73 | 17 | 17 | 4 | 51 | 10 | 10 | 11 | තී | 329 | 336 | 336 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 36 | 33 | 3 | 3 | 11 | | 201 | 197 | 80 | 17 | 17 | 4 | 51 | 11 | 11 | 12 | | 322 | 329 | 329 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 39 | 36 | 4 | 3 | 12 | | 205 | 201 | 87 | 17 | 17 | 4 | 51 | 12 | 12 | 13 | 3 | 315 | 322 | 322 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| 5 | ඨිති | භ | 42 | 39 | 4 | 4 | 13 | ජ | 209 | 205 | 94 | 17 | 17 | 5 | 51 | 13 | 13 | 14 | න | 308 | 315 | 315 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 45 | 42 | 4 | 4 | 14 | | 213 | 209 | 101 | 17 | 17 | 5 | 51 | 14 | 14 | 15 | | 301 | 308 | 308 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 48 | 45 | 5 | 4 | 15 | | 217 | 213 | 108 | 17 | 17 | 5 | 51 | 15 | 15 | 16 | 4 | 294 | 301 | 301 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| 6 | ඨිති | භ | 51 | 48 | 5 | 5 | 16 | ජ | 221 | 217 | 115 | 17 | 17 | 6 | 51 | 16 | 16 | 17 | ද | 287 | 294 | 294 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 54 | 51 | 5 | 5 | 17 | | 225 | 221 | 122 | 17 | 17 | 6 | 51 | 17 | 17 | 18 | | 280 | 287 | 287 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 57 | 54 | 6 | 5 | 18 | | 229 | 225 | 129 | 17 | 17 | 6 | 51 | 18 | 18 | 19 | 5 | 273 | 280 | 280 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| 7 | ඨිති | භ | 60 | 57 | 6 | 6 | 19 | ජ | 233 | 229 | 136 | 17 | 17 | 7 | 51 | 19 | 19 | 20 | ප | 266 | 273 | 273 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 63 | 60 | 6 | 6 | 20 | | 237 | 233 | 143 | 17 | 17 | 7 | 51 | 20 | 20 | 21 | | 259 | 266 | 266 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 66 | 63 | 7 | 6 | 21 | | 241 | 237 | 150 | 17 | 17 | 7 | 51 | 21 | 21 | 22 | 6 | 252 | 259 | 259 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| 8 | ඨිති | භ | 69 | 66 | 7 | 7 | 22 | ජ | 245 | 241 | 157 | 17 | 17 | 8 | 51 | 22 | 22 | 23 | ච | 245 | 252 | 252 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 72 | 69 | 7 | 7 | 23 | | 249 | 245 | 164 | 17 | 17 | 8 | 51 | 23 | 23 | 24 | | 238 | 245 | 245 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 75 | 72 | 8 | 7 | 24 | | 253 | 249 | 171 | 17 | 17 | 8 | 51 | 24 | 24 | 25 | 7 | 231 | 238 | 238 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| 9 | ඨිති | භ | 73 | 75 | 8 | 8 | 25 | ජ | 257 | 253 | 178 | 17 | 17 | 9 | 51 | 25 | 25 | 26 | සං | 224 | 231 | 231 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 81 | 78 | 8 | 8 | 26 | | 261 | 257 | 185 | 17 | 17 | 9 | 51 | 26 | 26 | 27 | | 217 | 224 | 224 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 84 | 81 | 9 | 8 | 27 | | 265 | 261 | 192 | 17 | 17 | 9 | 51 | 27 | 27 | 28 | 8 | 210 | 217 | 217 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| 10 | ඨිති | භ | 87 | 84 | 9 | 9 | 28 | ජ | 269 | 265 | 199 | 17 | 17 | 10 | 51 | 28 | 28 | 29 | ණ | 203 | 210 | 210 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 90 | 87 | 9 | 9 | 29 | | 273 | 269 | 206 | 17 | 17 | 10 | 51 | 29 | 29 | 30 | | 196 | 203 | 203 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 93 | 90 | 10 | 9 | 30 | | 277 | 273 | 213 | 17 | 17 | 10 | 51 | 30 | 30 | 31 | 9 | 189 | 196 | 196 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| 11 | ඨිති | භ | 96 | 93 | 10 | 10 | 31 | ජ | 281 | 277 | 220 | 17 | 17 | 11 | 51 | 31 | 31 | 32 | වො | 182 | 189 | 189 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 99 | 96 | 10 | 10 | 32 | | 285 | 281 | 227 | 17 | 17 | 11 | 51 | 32 | 32 | 33 | | 175 | 182 | 182 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 102 | 99 | 11 | 10 | 33 | | 289 | 285 | 234 | 17 | 17 | 11 | 51 | 33 | 33 | 34 | 10 | 168 | 175 | 175 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| 12 | ඨිති | භ | 105 | 102 | 11 | 11 | 34 | ත | 293 | 289 | 241 | 17 | 17 | 12 | 51 | 34 | 34 | 35 | ජ | 161 | 168 | 168 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 108 | 105 | 11 | 11 | 35 | | 297 | 293 | 248 | 17 | 17 | 12 | 51 | 35 | 35 | 36 | | 154 | 161 | 161 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 111 | 108 | 12 | 11 | 36 | | 301 | 297 | 255 | 17 | 17 | 12 | 51 | 36 | 36 | 37 | 11 | 147 | 154 | 154 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| 13 | ඨිති | භ | 114 | 111 | 12 | 12 | 37 | ත | 305 | 301 | 262 | 17 | 17 | 13 | 51 | 37 | 37 | 38 | ජ | 140 | 147 | 147 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 117 | 114 | 12 | 12 | 38 | | 309 | 305 | 269 | 17 | 17 | 13 | 51 | 38 | 38 | 39 | | 133 | 140 | 140 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 120 | 117 | 13 | 12 | 39 | | 313 | 309 | 276 | 17 | 17 | 13 | 51 | 39 | 39 | 40 | 12 | 126 | 133 | 133 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| 14 | ඨිති | භ | 123 | 120 | 13 | 13 | 40 | භ | 317 | 313 | 283 | 17 | 17 | 14 | 51 | 40 | 40 | 41 | ජ | 119 | 126 | 126 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 126 | 123 | 13 | 13 | 41 | | 321 | 317 | 290 | 17 | 17 | 14 | 51 | 41 | 41 | 42 | | 112 | 119 | 119 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 129 | 126 | 14 | 13 | 42 | | 325 | 321 | 297 | 17 | 17 | 14 | 51 | 42 | 42 | 43 | 13 | 105 | 112 | 112 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| 15 | ඨිති | භ | 132 | 129 | 14 | 14 | 43 | භ | 329 | 325 | 304 | 17 | 17 | 15 | 51 | 43 | 43 | 44 | ජ | 98 | 105 | 105 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 135 | 132 | 14 | 14 | 44 | | 333 | 329 | 311 | 17 | 17 | 15 | 51 | 44 | 44 | 45 | | 91 | 98 | 98 | 16 | 16 | 16 | 51 | 61 | 51 | 51 |
| | උප්පාද | | 138 | 135 | 15 | 14 | 45 | | 337 | 333 | 318 | 17 | 17 | 15 | 51 | 45 | 45 | 46 | 14 | 84 | 91 | 91 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| 16 | ඨිති | භ | 141 | 138 | 15 | 15 | 46 | භ | 341 | 337 | 325 | 17 | 17 | 16 | 51 | 46 | 46 | 47 | ජ | 77 | 84 | 84 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 144 | 141 | 15 | 15 | 47 | | 345 | 341 | 332 | 17 | 17 | 16 | 51 | 47 | 47 | 48 | | 70 | 77 | 77 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 147 | 144 | 16 | 15 | 48 | | 349 | 345 | 339 | 17 | 17 | 16 | 51 | 48 | 48 | 49 | 15 | 63 | 70 | 70 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| 17 | ඨිති | භ | 150 | 147 | 16 | 16 | 49 | භ | 353 | 349 | 346 | 17 | 17 | 17 | 51 | 49 | 49 | 50 | ත | 56 | 63 | 63 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 153 | 150 | 16 | 16 | 50 | | 357 | 353 | 353 | 17 | 17 | 17 | 51 | 50 | 50 | 51 | | 49 | 56 | 56 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 153 | 153 | 17 | 16 | 51 | | 357 | 357 | 357 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 | 16 | 42 | 49 | 49 | 16 | 16 | 16 | 51 | 61 | 51 | 51 |
| 18 | ඨිති | භ | 153 | 153 | 17 | 17 | 51 | භ | 357 | 357 | 357 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 | ත | 35 | 42 | 42 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 153 | 153 | 17 | 17 | 51 | | 357 | 357 | 357 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 | | 28 | 35 | 35 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | උප්පාද | | 153 | 153 | 17 | 17 | 51 | | 357 | 357 | 357 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 | 17 | 21 | 28 | 28 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| 19 | ඨිති | භ | 153 | 153 | 17 | 17 | 51 | භ | 357 | 357 | 357 | 17 | 17 | 17 | 51 | 51 | 51 | 51 | චු | 14 | 21 | 21 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |
| | භඞ්ග | | 153 | 153 | 17 | 17 | 51 | | 357 | 357 | 357 | 11 | 17 | 17 | 51 | 51 | 51 | 51 | | 7 | 14 | 14 | 16 | 16 | 16 | 51 | 51 | 51 | 51 |

# අභිධම්මත්ථ සඞ්ගහො

## සත්තමො පරිච්ඡෙදො

## සමුච්චය සඞ්ගහ විභාගො

1. ද්වාසත්තති විධා වුත්තා - වත්ථුධම්මා සලක්ඛණා
තෙසන්දානි යථායොගං - පවක්ඛාමි සමුච්චයං.

2. අකුසලසඞ්ගහො, මිස්සකසඞ්ගහො, බොධිපක්ඛිය සඞ්ගහො, සබ්බසඞ්ගහො, චෙති සමුච්චය සඞ්ගහො චතුබ්බිධො වෙදිතබ්බො.

3. කථං? අකුසල සඞ්ගහෙ තාව චත්තාරො ආසවා කාමාසවො, භවාසවො, දිට්ඨාසවො, අවිජ්ජාසවො

4. චත්තාරො ඔඝා, කාමොඝො, භවොඝො, දිට්ඨොඝො, අවිජ්ජොඝො

5. චත්තාරො යොගා, කාමයොගො, භවයොගො, දිට්ඨියොගො, අවිජ්ජායොගො

6. චත්තාරො ගන්ථා. අභිජ්ඣාකායගන්ථො, ව්‍යාපාදො-කායගන්ථො, සීලබ්බත පරාමාසො කායගන්ථො, ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො.

7. චත්තාරි උපාදානානි. කාමුපාදානං, දිට්ඨුපාදානං, සීලබ්බතුපාදානං, අත්තවාදුපාදානං.

8. ඡ නීවරණානි කාමච්ඡන්දනීවරණං, ව්‍යාපාද-නීවරණං, ථිනමිද්ධනීවරණං, උද්ධච්චකුක්කුච්චනීවරණං, විචිකිච්ඡානීවරණං, අවිජ්ජානීවරණං.

9. සත්තානුසයා. කාමරාගානුසයො, භවරාගානු-සයො, පටිඝානුසයො, මානානුසයො, දිට්ඨානුසයො, විචිකිච්ඡානුසයො, අවිජ්ජානුසයො.

10. දසසංයොජනානි. කාමරාග සංයොජනං, රූප-රාගසංයොජනං, අරූපරාගසංයොජනං, පටිඝසංයොජනං, මානසංයොජනං, දිට්ඨිසංයොජනං, සීලබ්බත පරාමාස-සංයොජනං, විචිකිච්ඡාසංයොජනං, උද්ධච්චසංයොජනං, අවිජ්ජාසංයොජනං සුත්තන්තෙ.

11. අපරානි දසසංයොජනානි. කාමරාගසංයොජනං, භවරාගසංයොජනං, පටිඝසංයොජනං, මානසංයොජනං, දිට්ඨිසංයොජනං, සීලබ්බත පරාමාසසංයොජනං, විචිකිච්ඡා සංයොජනං, ඉස්සාසංයොජනං, මච්ඡරියසංයොජනං, අවිජ්ජාසංයොජනං අභිධම්මෙ.

12. දස කිලෙසා. ලොභො, දොසො, මොහො, මානො, දිට්ඨි, විචිකිච්ඡා, ථිනං, උද්ධච්චං, අහිරිකං, අනොත්තප්පං.

13. ආසවාදීසු පනෙත්ථ කාමභවනාමෙන තබ්බත්ථුකා තණ්හා අධිප්පෙතා, සීලබ්බත පරාමාසො, ඉදංසච්චාභි-නිවෙසො, අත්තවාදෙති ච තථා පවත්තං දිට්ඨිගතමෙව පවුච්චති.

14. ආසවොඝාච යොගාච – තයො ගන්ථාච වත්ථුතො
උපාදානා දුවෙ වුත්තා – අට්ඨනීවරණා සියුං
ඡළෙවානුසයා හොන්ති – නව සංයොජනා මතා
කිලෙසා දස වුත්තොයං – නවධා පාප සඞ්ගහො.

15. මිස්සක සඞ්ගහෙ ඡ හෙතූ. ලොභො, දොසො, මොහො, අලොභො, අදොසො, අමොහො.

16. සත්තඣානඞ්ගානි. විතක්කො, විචාරො, පීති, එකග්ගතා, සොමනස්සං, දොමනස්සං, උපෙක්ඛා.

17. ද්වාදස මග්ගඞ්ගානි. සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්පො, සම්මා වාචා, සම්මාකම්මන්තො, සම්මා ආජීවො, සම්මා වායාමො, සම්මාසති, සම්මාසමාධි, මිච්ඡාදිට්ඨි, මිච්ඡා සඞ්කප්පො, මිච්ඡාවායාමො, මිච්ඡාසමාධි.

18. ද්වාවීසතින්ද්‍රියානි. චක්ඛුන්ද්‍රියං, සොතින්ද්‍රියං, ඝාණින්ද්‍රියං, ජිව්හින්ද්‍රියං, කායින්ද්‍රියං, ඉත්ථින්ද්‍රියං, පුරිසින්ද්‍රියං, ජීවිතින්ද්‍රියං, මනින්ද්‍රියං, සුඛින්ද්‍රියං, දුක්ඛින්ද්‍රියං, සොමනස්සින්ද්‍රියං, දොමනස්සින්ද්‍රියං, උපෙක්ඛින්ද්‍රියං, සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං, අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියං, අඤ්ඤින්ද්‍රියං, අඤ්ඤාතාවින්ද්‍රියං.

19. නවබලානි. සද්ධාබලං, විරියබලං, සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං, හිරිබලං, ඔත්තප්පබලං, අහිරිකබලං අනොත්තප්පබලං.

20. චත්තාරො අධිපති. ඡන්දාධිපති, චිත්තාධිපති, විරියාධිපති, වීමංසාධිපති.

21. චත්තාරො ආහාරා. කබලීකාරො ආහාරො, ඵස්සො දුතියො, මනොසඤ්චෙතනා තතියො, විඤ්ඤාණං චතුත්ථං.

22. ඉන්ද්‍රියෙසු පනෙත්ථ සොතාපත්තිමග්ගඤාණං අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියං, අරහත්තඵලඤාණං අඤ්ඤාතාවින්ද්‍රියං. මජ්ඣෙ ඡ ඤාණානි අඤ්ඤින්ද්‍රියානීති වුච්චන්ති. ජීවිතින්ද්‍රියංච රූපාරූපවසෙන දුවිධං හොති.

23. ද්විපඤ්ච විඤ්ඤාණෙසු. ඣානඞ්ගානි, අවිරියෙසු බලානි, අහෙතුකෙසු මග්ගඞ්ගානි න ලබ්භන්ති.

24. තථා විචිකිච්ඡා චිත්තෙ එකග්ගතා මග්ගින්ද්‍රිය බලභාවං න ගච්ඡති.

25. ද්විහෙතුක තිහෙතුක ජවනෙසේවව යථාසම්භවං අධිපති එකොව ලබ්භති.

26. ඡ හෙතු පඤ්චඣානඞ්ගා – මග්ගඞ්ගා නව වත්ථුතො
සොළසින්ද්‍රිය ධම්මා ච – බලධම්මා නවෙරිතා.
චත්තාරොධිපතී වුත්තා – තථාහාරාති සත්තධා
කුසලාදි සමාකිණ්ණො – වුත්තො මිස්සක සඞ්ගහො.

27. බොධිපක්ඛිය සඞ්ගහෙ චත්තාරො සතිපට්ඨානා. කායානුපස්සනා සතිපට්ඨානං, වෙදනානුපස්සනා සතිපට්ඨානං, චිත්තානුපස්සනා සතිපට්ඨානං, ධම්මානුපස්සනා සතිපට්ඨානං.

28. චත්තාරො සම්මප්පධානා. උප්පන්නානං පාපකානං ධම්මානං පහානාය වායාමො, අනුප්පන්නානං පාපකානං ධම්මානං අනුප්පාදාය වායාමො, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය වායාමො, උප්පන්නානං කුසලානං ධම්මානං භිය්‍යොභාවාය වායාමො.

29. චත්තාරො ඉද්ධිප්පාදා. ඡන්දිද්ධිප්පාදො, චිත්තිද්ධිප්පාදො, විරියිද්ධිප්පාදො, වීමංසිද්ධිප්පාදො.

30. පඤ්චින්ද්‍රියානි. සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං.

31. පඤ්ච බලානි. සද්ධාබලං, විරියබලං, සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං.

32. සත්ත බොජ්ඣඞ්ගා. සතිසම්බොජ්ඣඞ්ගො, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, විරියසම්බොජ්ඣඞ්ගො, පීතිසම්බොජ්ඣඞ්ගො, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, සමාධිසම්බොජ්ඣඞ්ගො, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

33. අට්ඨමග්ගඞ්ගානි. සම්මාදිට්ඨි, සම්මා සඞ්කප්පො, සම්මාවාචා, සම්මා කම්මන්තො, සම්මා ආජීවො, සම්මා වායාමො, සම්මාසති, සම්මා සමාධි.

34. එත්ථ පන චත්තාරො සතිපට්ඨානානි එකාවසති පවුච්චති.

35. තථා චත්තාරො සම්මප්පධානානිච සම්මාවායමො.

36. ඡන්දෙ චිත්තමුපෙක්ඛාච - සද්ධාපස්සද්ධි පීතියො
සම්මාදිට්ඨිච සඞ්කප්පො - වායාමො විරතිත්තයං
සම්මාසති සමාධීති - චුද්දසෙතෙ සභාවතො
සත්තතිංසප්පභෙදෙන - සත්තධා තත්ථ සඞ්ගහො.

37. සඞ්කප්ප පස්සද්ධිච පීතුපෙක්ඛා -
ඡන්දොච චිත්තං විරතිත්තයංච
නවෙකට්ඨානා විරියං නවට්ඨ -
සතී සමාධි චතුපඤ්ච පඤ්ඤා.
සද්ධා දුඨානුත්තමසත්තතිංස -
ධම්මානමෙසො පවරො විභාගො

38. සබ්බලොකුත්තරෙ හොන්ති - නවා සඞ්කප්ප පීතියො
ලොකියෙපි යථායොගං - ඡබ්බිසුද්ධිප්පවත්තියං.

39. සබ්බසඞ්ගහෙ පඤ්චක්ඛන්ධා රූපක්ඛන්ධො වෙද-නාක්ඛන්ධො සඤ්ඤක්ඛන්ධො, සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤ-ණක්ඛන්ධො.

40. පඤ්චුපාදානක්ඛන්ධා. රූපූපාදානක්ඛන්ධො වෙදනූපා-දානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤණූපාදානක්ඛන්ධො.

41. ද්වාදසායතනානි. චක්ඛායතනං සොතායතනං ඝාණායතනං, ජිව්හායතනං කායායතනං මනායතනං, රූපායතනං, සද්දායතනං, ගන්ධායතනං, රසායතනං, ඵොට්ඨබ්බායතනං, ධම්මායතනං.

42. අට්ඨාරස ධාතුයො, චක්ඛු ධාතු, සොතධාතු, ඝාණධාතු, ජිව්හා ධාතු, කාය ධාතු, රූප ධාතු, සද්ද

ධාතු, ගන්ධ ධාතු, රස ධාතු, ඵොට්ඨබ්බ ධාතු, චක්ඛු විඤ්ඤාණධාතු, සොත විඤ්ඤාණධාතු, ඝාණ විඤ්ඤාණධාතු, ජිව්හා විඤ්ඤාණධාතු, කාය විඤ්ඤාණධාතු, මනො ධාතු, මනො විඤ්ඤාණධාතු, ධම්මධාතු

43. චත්තාරි අරියසච්චානි. දුක්ඛං අරියසච්චං, දුක්ඛ සමුදයං අරියසච්චං, දුක්ඛ නිරොධං අරියසච්චං, දුක්ඛ නිරොධගාමිනිපටිපදා අරියසච්චං.

44 එත්ථ පන චෙතසික, සුඛුමරූප, නිබ්බාන වසෙන එකූනසත්තති ධම්මා ධම්මායතනං, ධම්මධාතු තිච සඞ්ඛං ගච්ඡන්ති.

45. මනායතනමෙව සත්තවිඤ්ඤාණධාතුවසෙන භිජ්ජති.

46. රූපඤ්ච වෙදනා සඤ්ඤා, – සෙසචෙතසිකා තථා
විඤ්ඤාණ මිති පඤ්චෙතෙ පඤ්චක්ඛන්ධාති භාසිතා.

47. පඤ්චුපාදානක්ඛන්ධාති – තථා තෙභූමකා මතා.
භෙදාභාවෙන නිබ්බානං – ඛන්ධ සඞ්ගහ නිස්සටං.

48. ද්වාරාලම්බන භෙදෙන – භවන්තායතනානි ච
ද්වාරාලම්බත දුප්පන්නා – පරියායෙන ධාතුයො,

49. දුක්ඛං තෙභූමකංවට්ටං – තණ්හා සමුදයො භවෙ
නිරොධොනාම නිබ්බානං – මග්ගො
ලොකුත්තරො මතො.

50. මග්ගයුත්තා ඵලං චෙව – චතුසච්ච විනිස්සටා,
ඉති පඤ්චප්පභෙදෙන – පවුත්තො සබ්බසඞ්ගහො,

**ඉති අභිධම්මත්ථසඞ්ගහෙ සමුච්චය සඞ්ගහ විභාගොනාම සත්තමො පරිච්ඡෙදො**

# අභිධර්මාර්ථ සංග්‍රහය

## සප්තම පරිච්ඡේදය

## සමුච්චය සඞ්ග්‍රහ විභාගය

(භාවය)

1. ලක්ෂණ සහිත වූ ඒකාන්ත පරමාර්ථස්වභාව ධර්මයෝ දෙසැත්තෑවක් යට කියන ලදහ. දැන් ඔවුන්ගේ සමුච්චය සඞ්ග්‍රහය යෙදෙන පරිදි කියමි.

2. අකුසල සඞ්ග්‍රහය, මිශ්‍රක සඞ්ග්‍රහය, බොධි පාක්ෂික සඞ්ග්‍රහය, සර්ව සඞ්ග්‍රහය යි චතුර්විධවූ සමුච්චය සඞ්ග්‍රහය දත යුතුය.

3. කෙසේද? අකුසල සඞ්ග්‍රහයෙහි ආශ්‍රවයෝ සතර දෙනෙකි. කාමාශ්‍රව, භවාශ්‍රව දිට්ඨාශ්‍රව, අවිජ්ජාශ්‍රව, කියායි.

4. ඕඝයෝ සතර දෙනෙකි. එනම් කාමෞඝ භවෞඝ දිට්ඨෞඝ, අවිජ්ජෞඝ.

5. යොගයෝ සතර දෙනෙකි. එනම් කාමයෝග, භවයෝග, දිට්ඨියොග, අවිජ්ජායොග.

6. ග්‍රන්ථයෝ සතර දෙනෙකි. අභිධ්‍යාකාය ග්‍රන්ථය, ව්‍යාපාදකාය ග්‍රන්ථය, සීලබ්බත පරාමාස කායග්‍රන්ථය ඉදං සච්චාභිනිවෙස කාය ග්‍රන්ථය.

7. උපාදානයෝ සතර දෙනෙකි. කාමූපාදාන, දිට්ඨු-පාදාන, සීලබ්බතුපාදාන, අත්තවාදූපාදාන.

8 නීවරණයෝ සදෙනෙකි කාමච්ඡන්ද නීවරණය, ව්‍යාපාද නීවරණය, ථිනමිද්ධ නීවරණය, උද්ධච්චකුක්කුච්ච නීවරණය. විචිකිච්ඡා නීවරණය, අවිජ්ජා නීවරණය,

9. අනුසයෝ සත්දෙනෙකි. කාමරාගානුසය, භවරාගානුසය, පටිඝානුසය, මානානුසය, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය, අවිජ්ජානුසය.

10. සංයොජනයෝ දසදෙනෙකි. කාමරාග සංයොජනය, රූපරාග සංයොජනය, අරූපරාගසංයොජනය, පටිඝසංයොජනය, මානසංයොජනය, දිට්ඨිසංයොජනය, සීලබ්බත පරාමාස සංයොජනය, විචිකිච්ඡාසංයොජනය, උද්ධච්ච සංයොජනය, අවිජ්ජා සංයොජනය, මෙය සූත්‍රාන්තක්‍රමයයි.

11. අනිකුදු සංයෝජනයෝ දසදෙනෙකි. කාමරාග සංයොජනය, භවරාග සංයොජනය, පටිඝසංයොජනය, මානසංයොජනය, දිට්ඨිසංයොජනය, සීලබ්බත පරාමාස සංයොජනය, විචිකිච්ඡා සංයොජනය, ඉස්සා සංයොජනය, මච්ඡරිය සංයොජනය, අවිජ්ජා සංයොජනය, මෙය අභි-ධර්මයෙහි ආක්‍රමයයි.

12. කෙලශයෝ දසදෙනෙකි. ලොභ, ද්වෙෂ, මොහ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්පය,

13. මෙහි ආශ්‍රවාදීන් අතුරෙන් කාම නාමයෙන් හා භවනාමයෙන්ද, කාමය හා භවය අරමුණු කරණ තෘෂ්ණාව අභිමතයි. සීලබ්බතපරාමාසය, ඉදං සච්චාභි නිවෙසය, අත්තවාදය යන්නෙහිද ඒ ඒ ආකාරයෙන් පවත්නා දිට්ඨි චෛතසිකයම කියනු ලැබේ.

14. පරමාර්ථ ස්වභාව වශයෙන් ආශ්‍රව, ඕඝ, යොග, ග්‍රන්ථ යන ධර්මයෝ තිදෙන බැගින් වෙති. උපාදානයෝ දෙදෙනෙක, නීවරණයෝ අටදෙනෙකි. අනුසය ධර්මයෝ සදෙනෙකි. සංයෝජනයෝ නව දෙනෙකි. කෙලශයෝ දසදෙනෙකි. මෙසේ නව ආකාරයකින් සංග්‍රහවේත්.

15. මිශ්‍රක සඞ්ග්‍රහයෙහි හේතූහු සදෙනෙකි. ලොභය ද්වේෂය, මොහය, අලොභය, අද්වේෂය, අමොහය.

16. ධ්‍යානාඞ්ගයෝ සත් දෙනෙකි. විතර්කය, විචාරය, ප්‍රීතිය, ඒකාග්‍රතාවය, සොමනස්සය, දෞමනස්සය උපෙක්ඛාය.

17. මාර්ගාඞ්ගයෝ දොළොසෙකි. සම්මාදිට්ඨිය සම්මා සඞ්කප්පය සම්මාවාචාය සම්මාකම්මන්තය සම්මා ආජීවය සම්මාවායාමය සම්මාසතිය සම්මාසමාධිය මිච්ඡාදිට්ඨිය මිච්ඡාසඞ්කප්පය මිච්ඡාවායාමය මිච්ඡාසමාධිය.

18. ඉන්ද්‍රියයෝ දෙවිස්සෙකි. චක්ඛුන්ද්‍රිය සොතින්ද්‍රිය ඝාණින්ද්‍රිය ජිව්හින්ද්‍රිය කායින්ද්‍රිය ඉත්ථින්ද්‍රිය පුරුසින්ද්‍රිය ජීවිතින්ද්‍රිය මනින්ද්‍රිය සුඛින්ද්‍රිය දුක්ඛින්ද්‍රිය සොමනස්සින්ද්‍රිය දෞමනස්සින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය සද්ධින්ද්‍රිය විරින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය, අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවින්ද්‍රිය.

19. බලධර්මයෝ නවදෙනෙකි. සද්ධා බලය, විරිය බලය, සති බලය, සමාධි බලය, පඤ්ඤා බලය, හිරි බලය, ඔත්තප්ප බලය, අහිරික බලය, අනොත්තප්ප බලය.

20. අධිපති ධර්ම සතරෙකි. ඡන්දාධිපති, චිත්තාධිපති, විරියාධිපති, වීමංසාධිපති.

21. ආහාරයෝ සිව් දෙනෙකි. කබලීකාරාහාරය, දෙවැනිවූ ඵස්සාහාරය, තුන් වැනිවූ මනොසඤ්චෙතනාහාරය, සිව්වැනිවූ විඤ්ඤාණාහාරය.

22. මෙහි ඉන්ද්‍රියයන් අතුරෙන් සෝවාන් මගනුවණ, අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය යයිද, අග්‍රඵල නුවණ අඤ්ඤාතාවින්ද්‍රිය යයිද, මධ්‍යයෙහිවූ ඥාණ සය අඤ්ඤින්ද්‍රිය යයිද කියනු ලැබෙත්. ජීවිතින්ද්‍රියද රූපජීවිතින්ද්‍රිය, අරූජීවිතින්ද්‍රිය යයි දෙවැදෑරුම් වෙත්.

23. දෙපස්විඤ්ඤාණයන්හි ධ්‍යානාඞ්ගයෝද, අවිරිය සිත්හි බලධර්මයෝද, අහේතුක චිත්තයන්හි මාර්ගාඞ්ගයෝද නොලැබෙත්.

24. එසේම විචිකිච්ඡා සිත්හි එකාග්‍රතාවය, මාර්ග, ඉන්ද්‍රිය, බල භාවයට නො පැමිණේ.

25. ද්විහේතුක ත්‍රිහේතුක ජවනයන්හිම එකම අධිපති ධර්මයෙක් සම්භවන පරිදි ලැබේ.

26. පරමාර්ථස්වභාව වශයෙන් හේතු සයෙකි. ධ්‍යානාඞ්ග පසෙකි. මාර්ගාඞ්ග නවයෙකි. ඉන්ද්‍රිය ධර්ම සොළොසෙකි. බල ධර්ම නවයෙකැයි කියන ලදහ. අධිපතිහු සිව් දෙනෙකැයිද, එසේම ආහාරයෝ සිව් දෙනෙකැයිද මෙසේ කුසලාදියෙන් සමාකීර්ණවූ මිශ්‍රක සඞ්ග්‍රහය සත් ආකාරයකින් කියන ලදී.

27. බෝධිපක්ඛිය සඞ්ග්‍රහයෙහි සතිපට්ඨාන සතරෙකි. කායානුපස්සනා සතිපට්ඨානය, වේදනානුපස්සනා සතිපට්ඨානය, චිත්තානුපස්සනා සතිපට්ඨානය, ධම්මානුපස්සනා සතිපට්ඨානය.

28. සම්‍යක්ප්‍රධානයෝ සතර දෙනෙකි. උපන් අකුසල ධර්මයන්ගේ පහකිරීම පිණිස ව්‍යායාමය, නූපන් අකුසල ධර්මයන්ගේ නො ඉපදීම පිණිස ව්‍යායාමය, නූපන් කුසල ධර්මයන්ගේ ඉපදීම පිණිස ව්‍යායාමය, උපන් කුසල ධර්මයන්ගේ වැඩීම පිණිස ව්‍යායාමය.

29. ඉද්ධිපාද සතරෙකි. ඡන්දිද්ධිපාදය, චිත්තිද්ධිපාදය, විරියිද්ධිපාදය, වීමංසිද්ධි පාදය.

30. ඉන්ද්‍රිය ධර්ම පස් දෙනෙකි. සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය.

31. බල ධර්ම පස්දෙනෙකි. සද්ධාබලය, විරියබලය, සති බලය, සමාධිබලය, පඤ්ඤා බලය.

32 බොජ්ඣඞ්ග ධර්ම සත් දෙනෙකි. සති සම්බොජ්ඣඞ්ගය, ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය, විරිය සම්බොජ්ඣඞ්ගය, පීති සම්බොජ්ඣඞ්ගය, පස්සද්ධි සම්බොජ්ඣ-ඞ්ගය, සමාධි සම්බොජ්ඣඞ්ගය, උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය.

33. මාර්ගාඞ්ගයෝ අට දෙනෙකි සම්මාදිට්ඨිය, සම්මා සඞ්කප්පය, සම්මා වාචාය, සම්මාකම්මන්තය, සම්මාආජීවය, සම්මා වායාමය, සම්මා සතිය, සම්මා සමාධිය.

34. මෙහි සතර සතිපට්ඨානයෝ එකම සම්මා සතිය යයි කියනු ලැබේ.

35. එසේම සතර සම්මප්පධානයෝ සම්මා වායාමය මැයි.

36. ඡන්ද, චිත්ත, තත්‍රමජ්ඣත්ත උපෙක්ඛාව, සද්ධා, පස්සද්ධි, පීති, සම්මා දිට්ඨි, සම්මා සඞ්කප්ප, සම්මා වායාම, විරතිත්‍රයද, සම්මා සතිය, සම්මා සමාධිය යයි පරමාර්ථ ස්වභාව වශයෙන් බොධි පාක්ෂික ධර්මයෝ තුදුසෙක් වෙති. එහි සඞ්ග්‍රය සත් වැදෑරුම් වේ.

37. සඞ්කප්ප, පස්සද්ධි, පීති, උපෙක්ඛා, ඡන්ද, චිත්ත, විරතිත්‍රය යන නවය එක් තැනෙකද, විරිය නව තැනෙකද, සතිය අට තැනෙකද, සමාධිය සිව් තැනෙකද, ප්‍රඥව පස් තැනෙකද, ශ්‍රද්ධාව දෙ තැනකද ලැබෙති මෙය උතුම්වූ සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන්ගේ ප්‍රවරවූ විභාගයයි.

38. මේ සියලු ධර්මයෝ ලොකොත්තර සිත්හි ලැබෙත්. සඞ්කප්ප පීති දෙදෙන ඇතැම් ලොකොත්තර සිත්හි නොලැබෙති. ෂඩ්විශුද්ධීන් ඇති කල්හි ලෞකික චිත්ත-යන්හි සුදුසු පරිදි යෙදෙති.

39. සර්වසඞ්ග්‍රහයෙහි ස්කන්ධයෝ පස් දෙනෙකි. රූපස්කන්ධය, වේදනාස්කන්ධය, සංඥාස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥානස්කන්ධය.

40. උපාදානස්කන්ධයෝ පස් දෙනෙකි. රූපූපාදානස්කන්ධය, වේදනූපාදානස්කන්ධය, සඤ්ඤූපාදානස්කන්ධය, සඞ්ඛාරූපාදානස්කන්ධය, විඤ්ඤාණූපාදානස්කන්ධය.

41. ආයතනයෝ දොළොසෙකි. චක්ඛායතනය, සෝතායතනය, ඝාණායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය, රූපායතනය, සද්දායතනය, ගන්ධායතනය, රසායතනය, පොට්ඨබ්බායතනය, ධම්මායතනය.

42. ධාතූහු අටළොසෙකි. චක්ඛුධාතු, සෝතධාතු, ඝාණධාතු, ජිව්හාධාතු, කායධාතු, රූපධාතු, සද්දධාතු, ගන්ධධාතු, රසධාතු, පොට්ඨබ්බධාතු, චක්ඛුවිඤ්ඤාණධාතු, සෝතවිඤ්ඤාණධාතු, ඝාණවිඤ්ඤාණධාතු, ජිව්හාවිඤ්ඤාණ ධාතු, කායවිඤ්ඤාණධාතු මනෝධාතු, මනෝවිඤ්ඤාණ ධාතු, ධම්මධාතු.

43. ආර්‍ය්‍යසත්‍යයෝ සතරෙකි. දුක්ඛාර්‍ය්‍යසත්‍යය, දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය, දුක්ඛනිරෝධාර්‍ය්‍යසත්‍යය, දුක්ඛ-නිරෝධගාමිනීප්‍රතිපදාආර්‍ය්‍යසත්‍යය.

44. මෙහි චෛතසික සුඛුමරූප, නිර්වාණ වශයෙන් එකූන්සැත්තෑධර්මයෝ ධර්මායතනයයිද ධම්මධාතු යයි ද සංඛ්‍යාවට යෙත්.

45. මනායතනයම සප්තවිඤ්ඤාණධාතු වශයෙන් බෙදෙන්නේය.

46. රූපයද, වේදනා, සංඥාචෛතසිකද, සෙසු-චෛතසිකද, විඤ්ඤාණයද යන මේ පස්දෙන පඤ්චස්කන්ධයෝයයි කියන ලදහ.

47. ත්‍රෛභූමික වූ රූප, වේදනා, සඤ්ඤා, සඞ්ඛාර විඤ්ඤාණයෝ පඤ්චුපාදානස්කන්ධයෝයයි දත්තාලදහ. නිවණ භෙද නැතිහෙයින් ස්කන්ධසංග්‍රහයෙන් වෙන්කරණ ලදී.

48. චාර ආලම්බන භෙදයෙන් ආයතන දොළොසෙක් වෙති. චාරාලම්බනයන්ගේද, ඔවුන් නිසා හටගත් විඤ්ඤාණයන්ගේ ද ක්‍රමයෙන් ධාතූහු අටළොසෙකි.

49 ත්‍රෛභූමික වෘත්තය දුක්ඛසත්‍යයනම්. තෘෂ්ණාව සමුදය සත්‍යය නම්. නිර්වාණය නිරොධසත්‍යය නම්. ලොකොත්තර වූ මාර්ගාඞ්ගයෝ මාර්ග සත්‍යයයි දතයුතු.

50. මාර්ග සිත් හා සම්ප්‍රයුක්තවූ ද ඵල සිත් හා සම්ප්‍ර-යුක්ත වූ ද ධර්මයෝ චතුස්සත්‍යයෙන් විනිර්මුක්තයහ. මෙසේ පසඳව ප්‍රභෙදයෙන් සර්‍ව සංග්‍රහය කියන ලදී.

**මෙසේ අභිධර්මාර්ථ සඞ්ග්‍රහයෙහි සමුච්චය සඞ්ග්‍රහ විභාගය නම් වූ සප්තම පරිච්ඡේදය නිමි.**

# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

## සප්තම පරිච්ඡේදය

## සමුච්චය සංග්‍රහ විභාගය

**චිත්ත, චෛතසික, රූප, නිබ්බාණ** යන සතර පරමාර්ථ ධර්මයෝ, ස්වභාව ලක්ෂණ වශයෙන් හෙවත් ස්වරූපයෙන් වෙන් වෙන් කොට ගත හැකිවූ **වස්තු ධර්ම** වශයෙන් ගත් කල්හි දෙසැත්තෑ වස්තු ධර්ම කොනොක් වෙති. ඒ දෙසැත්තෑ වස්තු ධර්ම පිළිබඳ සමුච්චය හෙවත් සම්පිණ්ඩනය දැක්වීම, සමුච්චය සංග්‍රහ නම් වේ.

දෙසැත්තෑ වස්තු ධර්මයෝ නම්

| | |
|---|---|
| **චිත්තය** | **1** |
| **චෛතසික** | **52** |
| **රූප** | **18** |
| **නිර්වාණය** | **1** |
| | 72 |

අසූනව වැදෑරුම් වූ හෝ එක්සිය විසිඑක් වැදෑරුම් වූ හෝ යම් තාක් චිත්තයෝ වෙත්නම්, ඒ සියලුම **සිත් ආරම්මණ විජානන ලක්ෂණයෙන් එක් වැදෑරුම් වන හෙයින්** චිත්ත පරමාර්ථය එක් වස්තු ධර්මයක් ලෙස සලකනු ලැබේ.

දෙපනස් චෛතසික ධර්මයෝ **ඵුසන, වෙදයිත** ආදි වශයෙන් වෙන් වෙන් වූ අන්‍යොන්‍ය විරුද්ධ ලක්‍ෂණ ඇති හෙයින් වස්තු ධර්ම දෙපනසක් වෙත්.

අට විසි රූප ධර්මයන් අතුරෙන් අටළොස් නිෂ්පන්න රූපයෝ ඔවුනොවුන්ට විරුද්ධ ලක්‍ෂණ ඇති හෙයින් වස්තු ධර්ම අටළොසක්ම වන්නාහ අනිෂ්පන්න රූපයෝ දසදෙනා නිෂ්පන්න රූපයන්ගේම විකෘති ස්වභාව ඇති රූපයන් බැවින් නිෂ්පන්න රූපයන්ටම ඇතුළත් වේ

ශාන්ති ලක්‍ෂණය ඇති හෙයින් නිර්වාණයද එක් වස්තු ධර්මයකි. විද්‍යමාන වූ වස්තු ධර්මයක් වශයෙන් නිර්වාණය මාර්ග ඵල සිත් වලින් අරමුණු කරනු ලබන්නේ ය. ඒකාන්ත ලක්‍ෂණ ඇති ධර්මයක් නොවේ නම් අරමුණක් වශයෙන් නොගත හැකි වේ.

ත්‍රිපිටකයෙහි වදාළ සියලුම ධර්මයෝ මේ දෙසැත්තෑ වස්තු ධර්මයන්ටම ඇතුළත්වේ. මේ වස්තු ධර්ම සතර සංග්‍රහයක් වශයෙන් විස්තර කරනු ලැබේ.

සතර සංග්‍රහයෝ නම්:-

1. **අකුසල සංග්‍රහය**
2. **මිශ්‍රක සංග්‍රහය**
3. **බොධි පාක්‍ෂික සංග්‍රහය**
4. **සර්ව සංග්‍රහය**

ඒකාන්ත අකුසලයන් වශයෙන් දක්වන ලද අකුසල ධර්මයන්ගේ **ආශ්‍රවාදි** වශයෙන් සංග්‍රහය **අකුසල සංග්‍රහය** නම් වේ.

කුසල, අකුසල, අව්‍යාකෘත වශයෙන් මිශ්‍රයන්ගේ **හේතු** ආදි වශයෙන් සංග්‍රහය **මිශ්‍රක සංග්‍රහය** වේ.

සතර මාර්ගඥාන නම්වූ බොධි පක්‍ෂයට ඇතුළත් වූ සත්තිස් ධර්මයන්ගේ සතිපට්ඨානාදි වශයෙන් සංග්‍රහය **බොධිපාක්‍ෂික සංග්‍රහය** නම් වේ.

සියලුම පරමාර්ථ ධර්මයන්ගේ ස්කන්ධ, ධාතු ආයතනාදි වශයෙන් සංග්‍රහය **සර්ව සංග්‍රහය** නම් වේ.

## අකුසල සංග්‍රහය

අකුසල සංග්‍රහය නව ප්‍රකාරයකින් සංග්‍රහ වේ.

ඒ නවය නම්:-

1. **ආශ්‍රව සතරය**
2. **ඕඝ සතරය**
3. **යෝග සතරය**
4. **ග්‍රන්ථ සතරය**
5. **උපාදාන සතරය**
6. **නීවරණ සයය**
7. **අනුසය සතය**
8. **සංයෝජන දසය**
9. **ක්ලේශ දසය**

### ආශ්‍රව ධර්ම

ස්වභාව ධර්ම වශයෙන් සෝවාන් මාර්ග චිත්තයට පෙරටුව උපදනාවූ ගොත්‍රභූ සිත දක්වාද, අවකාශ හෙවත් භූමි වශයෙන් නෛවසඤ්ඤානාසඤ්ඤායතන සඞ්ඛ්‍යාත භවාග්‍රය දක්වාද, පැවැත්ම වන හෙයින් ද, සිහි නමැති අගුලු නොහෙළන ලද්දාවූ චක්ෂු ආදී දොරටුවලින්, සිදුරුවූ කළයකින් වැගිරෙන දියක් මෙන්ද, ව්‍රණ මුඛයෙන් වැගිරෙන ලේ සැරව මෙන්ද, ශ්‍රාවය වන හෙයින්ද සසර දුක ප්‍රසව කරවන හෙයින්ද, සුරාපානය කළාවූ සත්ත්වයෝ තුමූ ප්‍රකෘති ස්වභාවය හැර උමතුවත්මෙන් සියලු දුශ්චරිතයන්හි හැසිරෙත් ද, එපරිද්දෙන්ම සත්ත්වයා මත් කරවන හෙයින්ද, නොයෙක්වර පෙරාගත් සුරාවකට බඳුවූද යම් අකුසල ධර්ම කෙනෙක් වෙත්ද එයට **ආශ්‍රව ධර්මයෝ** යයි කියනු ලැබේ.

**ආශ්‍රව ධර්මයෝ** සතර දෙනෙකි. එනම්:

1. **කාමාශ්‍රව**
2. **භවාශ්‍රව**
3. **දිට්ඨාශ්‍රව**
4. **අවිජ්ජාශ්‍රව**

**කාමාශ්‍රව** යනු **කාමරාගයට** නමෙකි. **කාම** යන්නෙන් සියලුම කාමාවචර ධර්ම සඞ්ඛ්‍යාත **වස්තුකාමයෝද**, ඒ වස්තු කාමයන් අරමුණු කොට පවත්නා **කාමතෘෂ්ණාවද** ගත යුතුයි. **රූපකාම, ශබ්දකාම, ගන්ධකාම, රසකාම, ස්පෘෂ්ටව්‍යකාම** යන පඤ්චකාමයන්හි ඇලුනාවූ සත්ත්වයෝ උමතුවූවන්මෙන් කාමයන්හි ඇලී ගැලී වාසය කිරීමෙන් සතර අපා දුක්ඛයට පමුණුවනු ලැබෙත්. පස්කම් සැපතෙහි ලොල්වූ පුද්ගල තෙමේ සතුන් මැරීම්, සොරකම් කිරීම් කාමයෙහි වරදවා හැසිරීම්, මත්පැන් පානය කිරීම් ආදිකොට ඇති නොයෙක් දුශ්චරිතයන්හි හැසි-රෙමින්, මෙලොවින්ද පිරිහී මරණින් මතු සතර අපා දුකින්ද නොමිදෙන්නේය. එබැවින් අවීචි මහ නිරය කෙළවර කොට ඇති මහා දුකට ක්‍රමයෙන් පමුණුවන්නාවූ ආශ්‍රවයක් බඳු හෙයින් **කාමාශ්‍රව** නම් වේ. මෙය ලොභ චෛතසිකය වේ.

**භවාශ්‍රව** යනු **භවරාගය** හෙවත් **රූපා රූප රාගයයි.** මෙහිදී රූපාවචර අරූපාවචර කුසල ධර්ම නම්වූ **කර්මභවයද** එහි විපාක වශයෙන් ලැබෙන්නාවූ රූපා රූප **උත්පත්ති භවයද** ගත යුතුයි. **මේ** විවිධ භවය අරමුණුකොට පවත්නා **තෘෂ්ණාව සත්ත්වයා** මත්කොට සසරින් මිදීමට ඉඩ නොදෙන හෙයින් **භවාශ්‍රවය** යයි කියන ලදී. කාමභවයෙහි ආදීනව දුටු පුද්ගලතෙමේ, එයින් මිදෙනු කැමතිව, රූපාරූපා භවයන්හි පවත්නා සැපත සලකා සමථ භාවනාවඩා ධ්‍යාන උපදවා රූපාරූප ලොකයන්ට පැමිණිකල නිත්‍යවූ සුඛය ඇත්තාවූද, සුභවූද, නිත්‍යාත්ම භාවයක් ලැබෙන්නේයයි මුළාවී එහි නිකාන්තිය හෙවත් තෘෂ්ණාව උපදවා ගන්නේය.

එහි මහා කල්ප ගණන් ආයු වළඳා නැවතත් කාම භවයට පැමිණ සතර අපා දුක්ඛයන්ටද පැමිණෙන්නේය. එබැවින් භවරාගය සත්ත්වයන් මත් කොට සසරෙහිම රඳවා ගන්නා හෙයින් **භවාශ්‍රව** නම් වන්නේය. මෙයද ලෝභ චෛතසිකය වේ.

**දිට්ඨාශ්‍රවය** යනු **මිථ්‍යාදෘෂ්ටියයි.** ශාස්වත දෘෂ්ටි උච්ඡේද දෘෂ්ටි යනාදි වශයෙන් දක්වන ලද දෙසැටක් මිථ්‍යාදෘෂ්ටීන්ට ඇතුළත්වූ යම් පමණ වැරදි දෘෂ්ටි වේනම් එය වැළඳ ගත්තාවූ පුද්ගලයෝ එයින් මත්වීම කරණකොට ගෙන සතර අපා දුක්ඛයන්ට භාජනවෙමින් සසරම රඳවා ගන්නා හෙයින් මිථ්‍යාදෘෂ්ටියට **දිට්ඨාශ්‍රවය** යයි කියනු ලැබේ. කාම සම්පත් ආදිය විඳිනු කැමැති පුද්ගල තෙමේ එහි ආදීනව වටහාගත නොහැකිව සඳාකාලික ආත්ම භාවයක් ලබාගැනීම පිණිස හෝ මරණින් මතු භවයක් නැත, මේ භවයේදීම කාම සම්පත් සිත්වූ පරිද්දෙන් විඳ මියයාම යෙහෙකැයි සිතා හෝ, කර්ම, කර්ම ඵල ආදිය විශ්වාස නොකොට මිථ්‍යාදෘෂ්ටිය වැළඳගෙන අප්‍රමාණ දුක් විඳින්නේය. අප්‍රමාණ වූ සංසාර දුක්ඛයන්ට පමුණුවන හෙයින් මිථ්‍යාදෘෂ්ටිය ආශ්‍රවයක් වැනිය. මෙය දිට්ඨි චෛතසිකය වේ.

**අවිජ්ජාශ්‍රව** යනු **අවිද්‍යාවයි.** චතුස්සත්‍යය, පූර්වාන්තය, අපරාන්තය, පූර්වාපරාන්තය, පටිච්චසමුප්පාදය යන අටතැන්හි මුළාවීම හෙවත් නොදැනීම **අවිජ්ජා** නම් වන්නේය. මෙයම සත්ත්වයා උමතු කරවන හෙයින්ද අප්‍රමාණ සංසාර දුක්ඛයන්ට පමුණුවන හෙයින්ද **අවිජ්ජාශ්‍රව** යයි කියනු ලැබේ. සියළුම අකුසල ධර්මයන්ට මූලික හේතුව වූ මේ අවිද්‍යාව මුල් සිඳ දමනතාක් කල් සසරින් එතරවීමක් නොවන්නේය. මෝහයෙන් මුළාවූ පුද්ගලයා ධර්මය අධර්මය ලෙසද, අධර්මය ධර්මය ලෙසද, අනිත්‍ය වූ ධර්මයන් නිත්‍ය වශයෙන්ද අසුභය සුභ වශයෙන් ද, දුක සැපතක් වශයෙන් ද, අනාත්මය ආත්ම වශයෙන් ද, වරදවා ගෙන පිළිපදිමින්, ප්‍රාණඝාතය,

අදත්තාදානය, **කාමමිථ්‍යාචාරය** යනාදිය නිවැරැදිකොට සලකා **නොයෙක් දුශ්චරිතයන්හි** හැසිරෙමින් අනර්ථයම සාදාගන්නේය. මෙය මෝහ චෛතසිකය වේ.

මේ ආශ්‍රව ධර්මයෝ සතරදෙනා ධර්ම වශයෙන් සළකන කල්හි **ලෝභ, දිට්ඨි, මෝහ** යන චෛතසික ධර්ම තුනක් වන්නේය මේ ආශ්‍රව ධර්ම සතර හැර, මාන ආදිවූ අනිකුත් අකුසල ධර්මයන්ද, භවාග්‍රය හා ගොත්‍රභූ සිත දක්වා පවතින නමුත්, ප්‍රධාන වශයෙන් මේ ආශ්‍රව ධර්මයෝ අනිකුත් අකුසල යන්ට වඩා ආශ්‍රව වශයෙන් සත්ත්වයා කෙරෙහි බල පවත්නා හෙයින් ආශ්‍රව ධර්ම සතරක් කොට දක්වා තිබෙන බව දතයුතුයි.

ආශ්‍රව ධර්මයන් අතුරෙන් **දිට්ඨාශ්‍රවය**, සෝවාන් මග නුවණින්ද, **කාමාශ්‍රවය** අනාගාමි මග නුවණින් ද, **භවාශ්‍රවය** සහ **අවිජ්ජාශ්‍රවය** අර්හත් මග නුවණින් ද, සමුච්ඡෙද වශයෙන් ප්‍රාහාණය කටයුතු වේ.

## ඕඝ ධර්ම

මහත්වූ ගඞ්ගා ජලයෙක්හි වැටුනාවූ යම් කිසි ද්‍රව්‍යයක්, **ඕඝ** නම් වූ එහි සැඩ පහර හා පවත්නාවූ දිය සුළියට අසු වී, ගඞ්ගාවෙන් සමුද්‍රයට වැද, ඒ සමුද්‍ර මධ්‍යයෙහිවූ දිය සුළියෙන් යටකොටගෙන සමුද්‍ර **පත්**ලෙහි ගසන්නාක්මෙන්, සත්ත්වයා සංසාර සාගරයෙහි **පත්**ලට බඳුවූ අවීචිමහනිරය සීමාකොට ඇති අපායෙහි ඇද හෙළා, දුකට පත් කරන්නාවූ, සැඩ **පහරක් බඳුවූ අකුසල** ධර්මයන්ට **ඕඝ ධර්මයෝ** යයි කියනු ලැබේ.

තව ද, ගඞ්ගා තරණය කිරීම පිණිස ගඞ්ගාවට බැසගත් පුද්ගලයා, එහි සැඩ පහරට අසුවූවහොත්, එයින් මිදීම ඉතා දුකසේ කටයුතු හෙයින් මේ ඕඝ ධර්මයන්ගෙන් පෙළෙණු ලබන සත්ත්වයෝ ද, ඉතා දුකසේ සසරින් එතරවිය යුතු වේ.

**ඕඝ ධර්මයෝ** ද සතර දෙනෙක් වෙති එනම්:-

1. **කාමෞඝ**
2. **භවෞඝ**
3. **දිට්ඨෞඝ**
4. **අවිජ්ජෞඝ**

**කාමෞඝ** - කාම සම්පත්තියෙන් මත්වූ පුද්ගලතෙමේ පච්කම්කොට කාම රාග නමැති සැඩපහරට අසුවී මිනිස් ලොවින් චුතව සතර අපායයන්හි අප්‍රමාණ දුක් විඳින්නේය. කාමෞඝ නමැති සැඩපහරට අසුනොවී එයින් මිදෙනු කැමැති පුද්ගලතෙමේ, නාම රූප ධර්මයන් ඉගෙණ සංස්කාර ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දැකීම සඳහා සමථ විදර්ශනා වඩා ඉතා දුකසේ මිදිය යුතුවේ.

**භවෞඝ** - භව රාගයෙන් හෙවත් රූපාරූප භවයන්හි තෘෂ්ණාවෙන් මත්වූ පුද්ගල තෙමේ, සමථ භාවනාකොට ධ්‍යාන වඩා රූපාවචර අරූපාවචර ලොකයන්හි මහා කල්ප ගණන් බ්‍රහ්ම සම්පත් විඳ නැවතත් කාමභූමියට වැද, නිර්වාණාවබෝධය සඳහා පිරිය යුතු පිළිවෙත් නො පුරණලද හෙයින් සංසාර දුක්ඛයටම පත්වන්නේය. එබැවින් භවරාගයට භවෞඝය යයි ද කියනු ලැබේ.

**දිට්ඨෞඝ** - මිථ්‍යාදෘෂ්ටිය වැළඳගත් සත්ත්වයෝ, නුවණ යයි සිතා අනුවණ කමින්, නිවාරුදියයි සළකා ප්‍රාණ-ඝාතාදිය කොට, බලි බිලි යාග හෝමාදිය පවත්වා, මොක්ෂය ලැබීම පිණිස දෙවි බඹුන් පුද, සාදකාලික සුද්ධ ආත්මය හා එක්වනු පිණිස අත්තකිලමථානුයොග කාම සුඛල්ලිකානුයොග යනාදී සාවද්‍ය ප්‍රතිපත්තින්හි යෙදී අනන්තවූ සසර දුක්ඛයන් පමුණුවාගන්නාහු වෙත්. සද්ධර්මශ්‍රවණය, ඇසූ දහම නුවණින් මෙනෙහි කිරීම, කල්‍යාණ මිත්‍ර සේවනය ආදිය උපකාර කොට ගෙණ යහපත්වූ මධ්‍යම ප්‍රතිපදායෙහි යෙදී ප්‍රඥව වඩා දිට්ඨෞඝ යෙන් මිදිය යුත්තේය.

**අවිජ්ජෝඝ** – පුණ්‍යාභිසංඛාර, අපුණ්‍යාභිසංඛාර ආනෙඤ්ජාභි සංඛාර යනාදි වශයෙන් දක්වන ලද්දා වූ සියලුම සංඛාර ධර්මයන්ට මූලික හේතුව වූ අවිද්‍යාව හෙවත් මෝහය සත්ත්වයාහට සසරින් ගැලවිය නොදී නොයෙක් දුක්ඛයන්ට පමුණුවන හෙයින් අවිජ්ජෝඝ යයි කියනු ලැබේ. සියලුම අකුසල් සිත්හි සම්ප්‍රයුක්ත ධර්ම-යක් වශයෙන් යෙදෙන්නාවූ මේ මෝහ චෛතසිකය අර්හත් මාර්ගඥනයෙන් සමුච්ඡේද ප්‍රහාණයෙන් නසනතුරු සත්ත්වයා නොයෙක් ලෙසින් පෙළනු ලබන්නේය. කාම රාග භව රාගාදිය උපදින්නේත් අවිද්‍යාව නිසාමය. අමෝහ නමැති ප්‍රඥව වඩා ගැනීමෙන්ම එය දුරු කට යුත්තේය.

## යොග ධර්ම

ගව ආදි සිව්පාවුන් රථයෙහි යොදා බඳින්නාවූ රැහැනක් වැනි හෙයින්ද සංසාරගත සත්ත්වයා භව නමැති රථයෙහි යොදන හෙයින්ද; ආලම්බණයෙන් වියොගවීමක් වත්, දුකින් වියොගවීමක්වත් විය නො දෙන හෙයින්ද, **යොග** නම් වන්නේය

**යොග ධර්මයෝ** සතර දෙනෙකි එනම්:–

1. **කාමයොග**
2. **භවයොග**
3. **දිට්ඨියොග**
4. **අවිජ්ජායොග**

කාමරාගය නම් වූ **කාමයොගය ද,** භවරාගය නම්වූ **භවයොගය ද,** මිථ්‍යා දෘෂ්ටිය නම් වූ **දිට්ඨියොගය ද,** අවිද්‍යාව නම් වූ **අවිජ්ජායොගය ද** යන සතර යොග ධර්ම-යන්ට අසු වූ සත්ත්වයන් භව යන්ත්‍රයෙහිම යොදවමින් සසරින් මිදිය නොහෙන පරිද්දෙන් බැඳ තබා දුක් පමුණු-වන්නේය. එසින් මිදෙනු කැමැති පුද්ගලයන් විසින් දහම් ඉගෙණ, මනා පිළිවෙතෙහි පිහිටා සමථ විදර්ශනා

භාවනා වඩා නිවන් පතා දානාදි පින්කම් කොට මාර්ග උපදවා ඉතා දුකසේ සසරින් මිදීම කටයුතු වේ. මේ සතර යොග ධර්මයන් අතුරෙන් දිට්ඨි යොගය, සෝවාන් මග නුවණින්ද, කාමයොගය, අනාගාමි මග නුවණින් ද, භවයොගය හා අවිජ්ජායෝගය අර්හත් මග ඥුවණින්ද දුරු කට යුත්තේය.

## ග්‍රන්ථ ධර්ම

ගොතන්නෝ හෙවත් ගැටගසන්නෝ **ග්‍රන්ථයෝයි.** නාමකයෙන් රූප කායද, වර්තමාන කයෙන් අනාගත කායද ගොතන්නෝ හෙවත් වෙන්විය නොදී එක්කොට බඳින්නාවූ ධර්මයෝ **ග්‍රන්ථ ධර්මයෝයි.**

**ග්‍රන්ථ ධර්ම** සතරෙකි. එනම්:-

1. **අභිජ්ඣා කාය ග්‍රන්ථය**
2. **ව්‍යාපාද කාය ග්‍රන්ථය**
3. **සීලබ්බත පරාමාස කාය ග්‍රන්ථය**
4. **ඉදං සච්චාභිනිවෙස කාය ග්‍රන්ථය**

**1. අභිජ්ඣා කාය ග්‍රන්ථය** – **අභිජ්ඣා** යනු දැඩි ලොභයට නමෙකි කාම රාග, රූප රාග, අරූප රාග යන සියලු තෘෂ්ණාවෝ කාමරූප ධර්මයන්ද, අතීත වර්තමාන අනාගත භවයන්ද, වෙන්විය නොහැකි පරිද්දෙන් එකිනෙකට බැඳ තබන හෙයින් කාය ග්‍රන්ථයක් වන්නේය. දාන, සීලාදී පින්කම් කොට, නෛෂ්ක්‍රම්‍ය වඩා සමථ විදර්ශනා භාවනාවෙහි යෙදී වාසය කිරීමෙන් අවිද්‍යාව ක්‍රමයෙන් තුනී කොට අර්හත් මග නුවණින් සමුච්ඡෙද වශයෙන් ප්‍රහාණය කටයුතු වේ.

**2. ව්‍යාපාද කාය ග්‍රන්ථය** – ව්‍යාපාදය නම් වූ අන් සත්ත්ව යෙකුගේ විනාශය කාමැතිවන බව, ද්වේෂමූල දෞර්මනස් සහගත පටිඝ සම්ප්‍රයුක්ත සිතින් සිදුවන්නාවූ අකුසල කර්මයකි. හෙතෙමේ ඒ ව්‍යාපාද අකුසල කර්මය

කරණ කොටගෙන මරණින් මතු සතර අපායයන්හි ඉපිද අප්‍රමාණ දුක් විඳින්නේය. මෙසේ දුගති භවයෙන් දුගති භවයට පමුණුවන්නාවූ ද ඒ ඒ භවයන්හි නාමස්කන්ධ හා රූපස්කන්ධ එකිනෙකට බැඳ තබන හෙයින්ද ව්‍යාපාදය කාය ග්‍රන්ථයක් වන්නේය. ව්‍යාපාද කාය ග්‍රන්ථයෙන් මිදෙනු කැමැති පුද්ගල තෙමේ මෛත්‍රී භාවනාදිය වඩා ධ්‍යාන උපදවා විෂ්කම්භණ වශයෙන් එය ප්‍රහීන කරන්නේය. සමථ විදර්ශනා වඩන්නාවූ පුද්ගලතෙමේ අනාගාමි මාර්ගය උපදවා සමුච්ඡේද වශයෙන් ව්‍යාපාදය නසන්නේය.

**3. සීලබ්බත පරාමාස කාය ග්‍රන්ථය** – මෝක්ෂ මාර්ගය යයි වරදවා පිළිගන්නාවූ පුද්ගලතෙමේ ගෝසීල, ගෝව්‍රත ආදී දුක් සහිතවූ නොයෙක් සීලව්‍රතයන්හි යෙදී වාසය කොට, මෙලොවදීත් දැඩි දුක් විඳ සසරෙහිම රැඳෙන්නේය. මොහුගේ මේ මිථ්‍යා දෘෂ්ටිය පවත්නා තාක් කල් නිර්වාණාව බෝධියක් නම් නොවන්නේය. විදසුන් වඩා සෝවාන් මග නුවණින්ම මේ සීලබ්බත පරාමාස නම්වූ කාය ග්‍රන්ථය සමුච්ඡේද වශයෙන් නැසිය යුතුවේ. චෛතසික ධර්මයන් අතුරෙන් මෙය දිට්ඨි චෛතසිකය නම් වේ.

**4. ඉදං සච්චාභිනිවේස කාය ග්‍රන්ථය** – මෙය සත්‍යය ය, අන්‍යවූ මාර්ගයෝ සත්‍ය නොවන්නාහ යනාදි වශයෙන් මිථ්‍යාභිනිවේසය හෙවත් වරදවා ගත් දෘෂ්ටිය ඉදං සච්චාභිනිවේසය නම් වේ. මේ මිථ්‍යා දෘෂ්ටිය කරණ කොට ගෙණ ඒ ඒ භවයන්හි උපදවමින්, නාම රූපාදීන් එකිනෙකට බැඳ තබමින් සත්වයා සසරෙහි ම රඳවා ගන්නා හෙයින් කාය ග්‍රන්ථයක් වන්නේය. ඉදං සච්චාභිනිවේස කාය ග්‍රන්ථය සෝවාන් මග නුවණින් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය වන්නේය.

## උපාදාන

නාගයෙකු විසින් මැඩියකු අල්වාගනු ලබන්නාක් මෙන් අරමුණ අත්නොහැර දැඩිකොට අල්වා ගැණීම **උපාදානය**

නම් වේ. තෘෂ්ණාවෙන් මඩනා ලද පුද්ගලතෙමේ රූප ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම යන සයාකාර අරමුණු තදින් අල්වා ගන්නේය.

**උපාදානයෝ** සතර දෙනෙකි එනම්.

1. **කාමූපාදාන**
2. **දිට්ඨූපාදාන**
3. **සීලබ්බතූපාදාන**
4. **අත්තවාදූපාදාන**

**1. කාමූපාදාන** - පඤ්චකාමයෙහි යම් කාමච්ඡන්දයක් වේද, හෙවත් රූපාදී අරමුණෙහි දුර්වල ඇලීමක් වේද, යම් කාමරාගයක් වේද හෙවත් රූපාදියෙහි බලවත් ඇලීමක් වේද, යම් කාම සමෘද්ධියක් වේද, යම් කාම තෘෂ්ණාවක් වේද, යම් කාම ස්නේහයක් වේද, යම් කාම පරිළාහයක් වේද, යම් කාම මූර්ඡාවක් වේද මෙය **කාමූපාදාන** නම් වේ. රූපාදි සාරම්මණයන්හි හටගන්නාවූ එක්සිය අටක් ප්‍රභෙද ඇති තෘෂ්ණාවගේ දැඩිබව කාමූපාදාන යයි දතයුතු.

සියලුම ලෞකික ධර්මයන් වස්තුකාම වශයෙන් කාමයයි ගත්කල්හි රූප රාග අරූප රාගයෝද කාමූපාදානයෙහි ඇතුලත්වේ.

කාමූපාදානයන් විසින් මඩනාලද සත්ත්වයා කර්මභවය උත්පත්තිභවය යන දෙවැදෑරුම් භවයෙන් නොමිදෙන්නේය. කාමූපාදානයාගේ නිරොධය තෘෂ්ණා නිරොධයෙන්ම වන්නේය. මෙය ලොභ චෛතසිකය වේ.

**2. දිට්ඨූපාදාන** - දුන් දෙයෙහි විපාක නැත්තේය. යනාදී වූ දසවස්තුකවූ යම් මිථ්‍යාදෘෂ්ටියෙක් වේද, යම් විපරීත ග්‍රහණයක් වේද මෙය **දිට්ඨූපාදාන නම්.** සීලබ්බත අත්තවාද යන දෘෂ්ටි හැර ඉතිරි මිථ්‍යා දෘෂ්ටීන් මෙයට ඇතුලත්වන්නාහ. මෙය දිට්ඨි චෛතසිකය වේ.

3\. **සීලබ්බතුපාදාන**- සීලයෙන්ම පිරිසිදු වන්නේය, ව්‍රතයෙන්ම පිරිසිදු වන්නේය, සීලව්‍රත දෙකින්ම පිරිසිදු වන්නේය යනාදී වශයෙන් යම් දෘෂ්ටියක් වේද, යම් විපරීත ග්‍රහණයක් වේද, මෙය **සීලබ්බතුපාදාන** නම්. මෙහි **සීල** යන්නෙන් සංසාර මුක්තියට මාර්ග නොවූ ගෝ කුක්කුර ආදීන්ගේ ඒ ඒ ප්‍රකෘති සවභාව නම් වූ චාරිත්‍ර සීලයද, **ව්‍රත** යන්නෙන් ඒ ඒ සාවද්‍ය සීලයන් සමාදන්ව ගන්නා ලද පිළිවෙතද ගතයුතුයි. ඒ මිථ්‍යා ග්‍රහණය දැඩිකොට පවත්නා කල්හි **සීලබ්බතුපාදාන** නම් වන්නේය. මෙයද දිට්ඨි චෛතසිකය වේ.

4\. **අත්තවාදුපාදානය**- ආර්‍ය ධර්මයෙහි දක්‍ෂ නොවූ, ආර්‍ය ධර්මයෙහි නොහික්මුණාවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන පඤ්චස්කන්ධයන් සතරාකාරයෙන් ආත්ම වශයෙන් ගන්නේවේද එය අත්තවාදුපාදාන නම් වේ. මෙසේ විසි ආකාරවන්නාවූ මිථ්‍යා දෘෂ්ටි හෙවත් අත්තවාදුපාදානයෝ නම්

1. රූපය ආත්මය ය
2. තමා රූපවත්ය
3. තමා කෙරෙහි රූපය පිහිටියේය.
4. රූපයෙහි තමා පිහිටියේය
5. වේදනාව ආත්මයය
6. තමා වේදනාවූ යෙහිය
7. තමා කෙරෙහි වේදනාව පිහිටියේය
8. වේදනාවෙහි තමා පිහිටියේය
9. සංඥාව ආත්මය ය
10. තමා සංඥාවත්ය
11. තමා කෙරෙහි සංඥාව පිහිටියේය
12. සංඥාවෙහි තමා පිහිටියේය
13. සංස්කාරයන් ආත්මයය
14. තමා සංස්කාරවත්ය
15. තමා කෙරෙහි සංස්කාරයෝ පිහිටියාහුය

16. සංස්කාරයන්හි තමා පිහිටියේය.
17. විඤ්ඤාණය ආත්මයය
18. තමා විඤ්ඤාණ වත්ය
19. තමා කෙරෙහි විඤ්ඤාණය පිහිටියේය
20. විඤ්ඤාණයෙහි තමා පිහිටියේය.

මේ විංශති වස්තුකවූ සක්කාය දෘෂ්ටිය අත්තවාදුපාදානය යයි කියනු ලැබේ.

වස්තු සැපයීමට ඇතිවන ආශාව තණ්හා වශයෙන්ද, ලද වස්තුවෙහි පවත්නා ලොභය උපාදාන වශයෙන්ද සැළකිය යුතුයි.

මේ සතරවැදෑරුම් උපාදානයන් අතුරෙන් **දිට්ඨුපාදාන, සීලබ්බතුපාදාන, අත්තවාදුපාදාන** යන උපාදානයෝ තිදෙන සොවාන් මග නුවණින් ද **කාමුපාදානයට** රූපාරූපා රාග ඇතුලත්වන හෙයින් අර්හත් මග නුවණින්ද සමුච්ඡේද වශයෙන් ප්‍රහීණ කරනු ලැබේ.

## නීවරණ ධර්ම

ධ්‍යානාදී වූ කුසල ධර්මයන් හා නිවණ අරමුණු කරන්නට නොදී මුවා කරන්නා වූ ද, නොහොත් නිවන් මග අවුරන්නා වූද ධර්මයෝ **නිවරණ ධර්මයෝ යි.**

**නීවරණ ධර්මයෝ** සදෙනෙකි එනම්:

1. **කාමච්ඡන්ද නීවරණය**
2. **ව්‍යාපාද නීවරණය**
3. **ථිනමිද්ධ නීවරණය**
4. **උද්ධච්ච කුක්කුච්ච නීවරණය**
5. **විචිකිච්ඡා නීවරණය**
6. **අවිජ්ජා නීවරණය**

## කාමච්ඡන්ද නීවරණය

**රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ** සංඛ්‍යාත පඤ්චකාමයන්හි යම් කාම සංඛ්‍යාත ඇල්මක් වේද, සතුටු වීමක් වේද, තෘෂ්ණාවෙක් වේද, ස්නෙහයක් වේද පරිලාහයක් හෙවත් දැවිල්ලක් වේද, කාමමූර්ඡාවක් වේද, මේ මාගේයයි දැඩිකොට ගන්නාවූ කාමයන් ගිලගැනීමක් වේද එයට **කාමච්ඡන්ද නීවරණය** යයි කියනු ලැබේ චෛතසික ධර්මයන් අතුරෙන් මෙය **ලෝභ** චෛතසිකය වේ.

ස්වභාව වශයෙන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, අසුභයයි ඇති සැටි නොගෙන නිත්‍ය, සුඛ, ආත්ම, සුභ වශයෙන් වරදවා නිමිත්තාරම්මණ ගැනීම, නූපන් කාමච්ඡන්ද නීවරණයාගේ ඉපදීමටත්, මතු මත්තෙහි වැඩි පැවතීමටත් කාරණාවන හේතු ප්‍රත්‍යයෝවෙති. කාමච්ඡන්දයෙහි එල්ලී වාසය කරන්නහුගේ රාගාදි ක්ලෙශයන් වර්ධනය වීමෙන් දිව්‍ය, මනුෂ්‍ය, බ්‍රහ්ම නිර්වාණාදී සියලු සම්පත් ආවරණය වන්නේය. යොනිසොමනසිකාරයෙන් හෙවත් නුවණින් යථා තත්වයෙන් ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, අසුභ වශයෙන් දැකීම කාමච්ඡන්ද නීවරණයාගේ ප්‍රහාණය පිණිස පවත්නේය.

සමාධිය වළක්වන්නාවූ කාමච්ඡන්දය දුරුකිරීම පිණිස ධර්ම සයක් උපකාරවේ. එනම්:

1. අසුභාරම්මණයාගේ ඉගෙණීමද,
2 අසුභ භාවනායෙහි නැවත නැවත යෙදීමද,
3. චක්ෂුරාදී ඉන්ද්‍රියන්හි වසන ලද දොර ඇති බවය,
4. භොජනයෙහි පමණ දැන වැළදීමය.
5. කල්‍යාණ මිත්‍රයන් සේවනය කිරීමය
7. සප්පාය කථා හෙවත් යහපත් කාලොචිත කථා ඇති බවය.

ඒකාග්‍රතා ශක්තිය වැඩීමෙන්, දියුණුවීමෙන් කාමච්ඡන්දය ක්‍රමයෙන් දුරුවන්නේය.

මේ කාමච්ඡන්දය දුරුනොකොට ධ්‍යාන මාර්ග ඵලයන් කිසිසේත් ලැබිය නොහැකිවේ. තදඞ්ග විෂ්කම්භන, සමුච්ඡෙදාදි වශයෙන් කාමච්ඡන්ද නීවරණය දුරුකිරීම කාමාවචර කුසල ධ්‍යාන, මාර්ග ඵල චිත්තයන්ගේ ශක්තියෙන් කටයුතු වේ. අනාගාමි මග නුවණින් කාමභවයෙහි රඳවන්නාවූ කාමච්ඡන්දය සමුච්ඡෙද වශයෙන් ප්‍රහාණය වන්නේ ය.

## ව්‍යාපාද නීවරණය

නව ආඝාත වස්තූන් අරමුණුකොට ගෙණ යම් වෛරයක්. අස්ථාන ආඝාතයක් උපදීද චිත්තයාගේ එබඳුවූ සිත නැසීම් ස්වභාවයවූ යම් ආඝාතයෙක්, ප්‍රතිඝාතයෙක් හෝ අරමුණු පෙරළීම් ස්වභාවයයි කියන ලද ප්‍රතිඝයක් හෝ වේද යම් විරෝධයක් හෝ ප්‍රතිවිරෝධයක් හෝ වේ ද කොපයක් හෝ සම්ප්‍රකොපයක් හෝ වේ ද, යම් ද්වේෂයක් හෝ දූෂි ද්වේෂයක් හෝ හාත්පස දූෂි වූ ද්වේෂයක් හෝ වේ ද, චිත්තයාගේ යම් විපර්‍ය්‍යාසයක්, පෙරළීමක්, පෙරළීම් ආකාරයක්, සිත දූෂ්‍ය වීමක්; ක්‍රොධයක්, කිපීම් ආකාරයක්, කිපීම් බවක් හෝ ද්වේෂාකාරයක්, සැඩබවක්, කෲරත්වයක් වේ ද, එයට ව්‍යාපාද නීවරණයයි කියනු ලැබේ.

**නව ආඝාතවස්තූහු** නම්:

1. මට අනර්ථයක් කෙළේය.
2. දැනුදු අනර්ථයක් කරයි.
3. අනාගතයෙහිද අනර්ථයක්ම කරන්නේය.
4. මගේ ප්‍රියමනාපවූ හිතවතාහට අනර්ථයක් කෙළේය.
5. දැනුදු ඔහුට අනර්ථයක් කරයි.
6. අනාගතයෙහිද ඔහුට අනර්ථයක්ම කරන්නේය.
7. මාගේ, අමනාපවූ, විරුද්ධකාරයාහට අර්ථයක්ම කෙළේය.

8. දූනුදු ඔහුට අනර්ථයක්ම කරයි.
9. අනාගතයෙහිද ඔහුට අනර්ථයක්ම කරන්නේය යනුයි.

අන්‍ය **සත්ත්වයෙක්** වීමය, ඔහු නසම් යි පැවැති ක්‍රොධ චේතනාවය යන අඞ්ග දෙක සම්පූර්ණ වූ කල්හි ව්‍යාපාද අකුසලය කර්මපථ බවට පැමිණේ. අනුන් නසින්වායි සිතීම ධ්‍යානාදිය හා ස්වර්ග මොක්ෂ සම්පත් වළක්වන නිවරණ ධර්මයකි.

මෙත් සිත වැඩීමෙන් ව්‍යාපාද නිවරණය තදඞ්ග වශයෙන්ද, ධ්‍යානාදිය ඉපදවීමෙන් විෂ්කම්භණ වශයෙන් ද ප්‍රහීන කළ හැකි නමුත්, ව්‍යාපාදයාගේ සමුච්ඡේද ප්‍රහාණය අනාගාමි මාර්ග ඥානයෙන්ම සිදුවිය යුතුයි.

**ව්‍යාපාද නිවරණය** නැති කිරීමට උපකාරවන ධර්ම සයකි. එනම්:

1. මෛත්‍රිය වැඩීමට අවශ්‍ය කරුණු ඉගෙණීම
2. මෛත්‍රී භාවනානු යොගය
3. තමන් හා අනුන් යන දෙපක්ෂය සම්බන්ධව විපාක දෙන්නාවූ පූර්ව කර්ම ගැන මෙනෙහි කිරීම
4. ප්‍රත්‍යවෙක්ෂා කිරීමේ බහුලතාවය
5. කල්‍යාණ මිත්‍රයන් ඇතිබවය
6. සප්පාය කථා හෙවත් කාලොචිත යහපත් කථා ඇති බවය.

## ථින මිද්ධ නීවරණය

**ථිනය** සහ **මිද්ධය** යන පාප ධර්ම දෙක එක් කොට ගත් කල්හි **ථින මිද්ධ** නම් වේ. මේ පාප ධර්ම ධ්‍යාන සහ මොක් ආදිය වළක්වන හෙයින් එය නීවරණ ධර්මයක් ද වන්නේය.

අසූනවයක් හෝ එක්සිය විසි එකක් ප්‍රභෙද ඇති චිත්තයාගේ හෙවත් විඥානස්කන්ධයාගේ යම් රොගී බවක්, අකර්මණ්‍ය බවක්, ඉරියව් ඉසිලිය නොහැකිව සිතෙහි එල්බීමක්, දූඩියේ එල්බීමක්, හැකිලීමක්, හැකිලීම් ආකාරයක්, හැකිලීම්, බවක් වේද එයට **ථින** යයි කියනු ලැබේ.

දෙපනස් චෛතසික කායයාගේ යම් රෝගි බවක්, අකර්මණ්‍ය බවක්, අඳුරු කිරීමක්, හාත්පස අඳුරු කිරීමක්, අභ්‍යන්තරය ආවරණය කිරීමක් අකර්මණ්‍ය භාවයෙන් හිංසා කිරීමක්, නිදනාකාරයක්, නිදන බවක් වේද, එයට **මිද්ධ** යයි කියනු ලැබේ.

එබැවින් චිත්ත චෛතසික ධර්මයන්ගේ යම් ගිලන් බවක්, අලස බවක්, මලානික බවක් වේද එය **ථීන මිද්ධ නීවරණය** නම් වේ. මේ පාප ධර්ම දෙක යෙදෙන කල්හි එකටම, සසඞ්ඛාර අකුසල් සිත් පසෙහි යෙදෙමින් 'කුසල' ධර්මයන් ආවරණය කරන හෙයින් නීවරණ ධර්මයක් වන්නේය. මේ ථීන මිද්ධය, සිත වසා සිටින්නාවූ ද, සත්ත්වයා අන්ධ කරන්නාවූද, ප්‍රඥා චක්ෂුව වසන්නාවූ ද, ප්‍රඥාව නිරුද්ධ කරන්නාවූ ද සසර දික්කරන්නාවූ ද, අකුසල ධර්මයකි. ධ්‍යාන මාර්ග ඵලයන්ට ප්‍රතිපක්ෂවූ මේ නීවරණ ධර්මය උටයා්න වීර්‍ය්‍යයෙන්ම මැඩිය යුත්තේය.

ගින්නට ඇතුල්වූ කුකුල් පියාපතක් හැකිලී යන්නේ යම්සේද, එමෙන්ම ථීන මිද්ධ දෙකෙන් පෙළෙනු ලබන කල්හි චිත්ත චෛතසිකයන්ගේ හැකිලීම කාරණ කොට ගෙණ අලස භාවය, අකර්මණ්‍ය භාවය, අප්‍රාණික භාවය ප්‍රකට වන්නේය.

**නාම මිද්ධය, රූප මිද්ධය** යයි මිද්ධයෝ දෙදෙනෙකි. එයින් නාම මිද්ධය යයි කියනු ලබන්නේ අකුසල ධර්මයක්වූ මිද්ධ චෛතසිකයටය **රූප මිද්ධය** යනු රූප ධර්මයන්ගේ මැලි බව නොහොත් හැකිලීමය. නිදිමත ශරීරයාගේ බර ගතිය යනාදිය ඇතිවන්නේ රූප මිද්ධය නිසාය. නීවරණ ධර්මයක් වශයෙන් සලකනු ලබන්නේ නාම මිද්ධය නම් වූ මිද්ධ චෛතසිකය බව දතයුතුයි.

මේ **ථීන, මිද්ධ** යන චෛතසික දෙදෙනා එක්කොට ගෙණ එකම නීවරණ ධර්මයක් ලෙස දැක්විමට හේතුව නම් ඒ ධර්ම දෙදෙනාගේ කෘත්‍ය, ප්‍රත්‍ය, සහ ප්‍රතිපක්ෂ ධර්මයන් සමාන බැවිනි. ථීනයෙහි කෘත්‍යය ලීනභාවය හෙවත් හැකිලෙන බවය. මිද්ධියාගේ කෘත්‍යයද එයමය. ථීනයෙහි ප්‍රත්‍යය වඩාත් මැලි බව හා කය නැමෙන බවය. මිද්ධයාගේ ද එයමය. ථිනයාගේ ප්‍රතිපක්ෂ ධර්මය වීර්‍ය්‍යයයි. මිද්ධයාගේ ද එයමය. මේ දෙදෙනාම උපදනා කල්හි එකටම, එක සිතෙහිම උපදී. මේ ආදී කරුණු නිසා ථීන මිද්ධ දෙදෙනා එක් නීවරණ ධර්මයක් ලෙස සළකනු ලැබේ.

උකටලී බවය, කය අලස බවය කය නොනැමෙන බවය, බත්මදය හෙවත් භොජන මූර්ඡාය, භොජන පරිළාහය, සිත සැඟවෙන සවභාවය යනාදී කරුණු හේතුකොට ගෙණ චිත්ත චෛතසිකයන්ගේ නුනුවණ බවත්, අඥාන බවත් ඇතිවන්නේය. එසේ ඇතිවන කල්හි පාපාරම්මණයන්හි සිත බැදී පවතින නිසා, කිසිකලෙකත් සිත එකඟ කිරීමක් හෝ, ධ්‍යාන මාර්ග ඵලාධිගමයක් හෝ ලබාගත නොහැකි වේ. අයොනිසෝ මනසිකාරය බහුලව පවත්නාහට වඩවඩාත් ථිනමිද්ධය උපදින්නේය.

ථීන මිද්ධ නීවරණයාගේ ප්‍රහාණයට කරුණු සයක් උපකාරවේ. එනම්:-

1. **"අතිභොජනෙ නිමිත්තගගාහ"** නම්වූ පමණ දැන ආහාර අනුභව කොට හෙවත් පමණ දැන වැළදීම සඞ්ඛ්‍යාත භොජනයෙහි නිමිත්ත ග්‍රහණය ද,

2. **"ඉරියාපථ සමපරිවත්තනතා"** නම් වූ යම් ඉරියව්ව කින් කල්යවන කල නිදිමත පැමිණියේ වීනම් එයින් අන්‍යවූ ඉරියව්වකට සිත කය පෙරළා වාසය කිරීමද,

3. **"ආලොක සඤ්ඤා මනසිකාර"** නම් වූ සූර්‍ය්‍යා-ලොක, චන්‍ද්‍රාලොක, ප්‍රදීපාලොක යනාදිය සිහිකිරීමද,

4. **"අබ්භොකාස වාසො"** අභ්‍යවකාශයෙහි හෙවත් එළිමහනෙහි වාසය කිරීම ද,

5. **"කල්‍යාණ මිත්තතා"** නම් වූ කල්‍යාණ මිත්‍ර සේවනය ඇති බවද,

6. **"සප්පාය කථා"** නම් වූ තැනට නිසි අර්ථවත් කථා ඇති බවය.

මේ නීවරණ ධර්මය, කාමාවචර කුසල, ධ්‍යානාදිය උපදවන කල්හි තදඞ්ග විෂ්කම්භණ වශයෙන්ද, අර්හත් මග නුවණින් සමුච්ඡේද වශයෙන් ද ප්‍රහීණ වන්නේය.

## උද්ධච්ච කුක්කුච්ච නීවරණය

උද්ධච්චය සහ **කුක්කුච්චය** යන පාප ධර්ම දෙක එක් කොට ගත් කල්හි උද්ධච්ච කුක්කුච්ච නම් වන්නේය. කුසල, ධ්‍යාන, මාර්ග ඵලාදිය වළක්වන හෙයින් එය නීවරණ ධර්මයක් ද වන්නේය.

චිත්තයාගේ යම් නොසන්සුන් බවක් වේද විසිරියාමක් වේද, සිත පිළිබඳ වූ යම් නොසන්සිදීමක් වේද, චිත්ත-යාගේ යම් සෙලවෙන ස්වභාවක් වේද, එයට උද්ධච්චය යයි කියනු ලැබේ.

කැප නැති වස්තුවෙහි කැපය යන සංඥා ඇතිබවය, කැප වස්තුවෙහි අකැපය යන සංඥා ඇති බවය. වරදෙහි නිවරද යන සංඥා ඇති බවය යනාදිය කරණ කොට ගෙණ යම් කුකුසක් හෙවත් තැවීමක් වේද කුකුස් කරණ ආකාරයක්, ස්වභාවයක් වේද, යම් විපිළිසර බවක් වේද, සිත පිළිබඳව යම් විලෙඛයක් හෙවත් ඉරි ගැසීම්

ආකාරයක් වේද, එයට **කුක්කුච්චය** යයි කියනු ලැබේ. මේ දෙදෙනා සම්බන්ධවූ කල්හි **උද්ධච්ච කුක්කුච්ච** නීවරණය වන්නේය.

**උද්ධච්චය** වනාහි සුළං වැදීමෙන් සෙලවෙමින් පවත්නා ජලතලාවක් මෙන් නො සන්සිඳීම ලක්‍ෂණ කොට ඇත්තේය. සුළඟින් වැනෙන ධ්වජ පතාකයක් මෙන් නිශ්චලව නොසිටීම කෘත්‍ය කොට ඇත්තේය. ගලකින් ගසන ලදුව, විසිරෙන අළු සමූහයක් මෙන් දඟලන බව, නලියන බව වැටහීම් කොට ඇත්තේය. අයෝනි-සොමනසිකාරය ආසන්න කාරණාකොට ඇත්තේය.

**කුක්කුච්චය** වනාහි කළ නොකළ පව් පින් ගැන සොක කිරීම ලක්‍ෂණ කොට ඇත්තේය. පසුතැවීම් කෘත්‍ය කොට ඇත්තේය. විපිළිසර බව වැටහීම් ආකාරය කොට ඇත්තේය. කළ නොකළ සුචරිත දුශ්චරිතයන් ආසන්න කාරණා කොට ඇත්තේය.

මේ ධර්ම දෙදෙනා කෘත්‍ය, ප්‍රත්‍ය, විපක්‍ෂ ධර්මයන්ගේ වශයෙන් සමාන හෙයින් එක් නීවරණයක් කොට දක්වා තිබේ. මේ දෙදෙනාගේම කෘත්‍ය අව්‍යුපසමනයයි. සිත්හි නිශ්චලභාවය පහකොට සිත කම්පා කරවන ධර්ම හෙයින් සමාන කෘත්‍ය ඇත්තේය. අතීතයෙහි වූ ව්‍යසනයන් කල්පනා කිරීමෙන් උපදනා ධර්මයන් බැවින් සමාන ප්‍රත්‍ය ඇත්තේය. සමථය මේ දෙදෙනාගේම විපක්‍ෂ ධර්මයවේ.

චිත්තයාගේ නොසන්සුන් භාවය ඇති කල්හි, නුනුව-ණින් මෙනෙහි කිරීම හේතු කොට ගෙණ උද්ධච්ච කුක්කුච්චයාගේ හටගැනීම වන්නේය. සමාධි සඞ්ඛ්‍යාතවූ සිත පිළිබඳ ව්‍යුපසමනය හෙවත් සංසිඳීම ඇති කල්හි නුවණින් මෙනෙහි කිරීම හේතු කොට ගෙන මේ උද්ධච්ච කුක්කුච්චයාගේ ප්‍රහාණය වන්නේය.

තවද උද්ධච්ච කුක්කුච්ච නීවරණයාගේ ප්‍රහාණය පිණිස ධර්මසයක් උපකාර වන්නේය.

එනම්:-

**1.** "**බහුස්සුතතා**" නම් වූ බහුශෘත භාවය හෙවත් දහම් ඇසූ පිරූ තැන් ඇති බවය,

**2.** "**පරිපුච්ඡකතා**" නම් වූ පරිපුච්ඡක බව හෙවත් කැප අකැප යනාදිය පිළිබඳව විචාරීම බහුල කොට ඇති බවය,

**3.** "**විනයෙපකතඤ්ඤුතා**" නම් වූ විනයෙහි ඉතා හොඳ පුරුද්දක් ඇති බවය,

**4.** "**වුද්ධසෙවිතා**" නම් වූ ඥාණ වෘද්ධ, තපොවෘද්ධ, වයො වෘද්ධාදිවූ වෘද්ධයන් සේවනය කිරීම,

**5.** "**කල්‍යාණ මිත්තතා**" නම් වූ කල්‍යාණ මිත්‍රයන් ඇති බවය,

**6.** "**සප්පායකථා**" නම් වූ තැනට තිසි අර්ථවත් කථා ඇති බවය.

මේ අකුසල් දෙදෙනා අතුරෙන් කුක්කුච්චය අනාගාමි මග නුවණින්ද, උද්ධච්චය අර්හත් මග නුවණින්ද සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කළයුතු වේ.

## විචිකිච්ඡා නීවරණය

මොහමූල විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතෙහි යෙදෙන්නාවූ විචිකිච්ඡා චෛතසිකය, කුසලයන් හා ධ්‍යාන මාර්ග ඵලාදියද වළක්වන හෙයින් නීවරණ ධර්මයක් වන්නේය.

ශාස්තෘන් වහන්සේ කෙරෙහිද,
නවලොකොත්තර ධර්මය කෙරෙහිද,
අෂ්ටාර්‍යපුද්ගල මහා සංඝ රත්නය කෙරෙහිද,
ප්‍රතිපත්ති ශික්ෂාවෙහිද,

පූර්වාන්තය හෙවත් පෙර භවය පිළිබඳව ද,
අපරාන්තය හෙවත් අනාගත භවය පිළිබඳව ද,
පුබ්බාපරාන්ත නම් වූ අතීතානාගත භවයන් පිළිබඳවද,
හෙතු ඵල ධර්ම සඞ්ඛ්‍යාත පටිච්චසමුප්පාද ධර්මයෙහිද,

යම් බඳු වූ කාංසාවක්, කාංසාකාරයක්, විමතියක් විචිකිත්සාවක්, විවිධ බවක්, දෙමඟක්, සැකයක්, නොයෙක් ආකාර ගැනීමක්, සැපීමක්, හාත්පස ගැටීමක්, සිතෙහි නොබැස ගැන්මක්, නොපිහිටීමක්, සිතෙහි ඉරිතැලීම් ආකාරයක් හෝ වේද එයට විචිකිච්ඡාව යයි කියනු ලැබේ.

මේ විචිකිච්ඡා තොමෝ සැකය ලක්‍ෂණකොට ඇත්තීය, කම්පාවීම කෘත්‍යකොට ඇත්තීය, නිශ්චය නොකිරීම වැටහෙන ආකාරය වේ. නුනුවණින් මෙනෙහි කිරීම ආසන්න කාරණා කොට ඇත්තීය.

නීවරණ විචිකිච්ඡාවය ප්‍රතිරූපක විචිකිච්ඡාවය යයි විචිකිච්ඡාව දෙවැදෑරුම් වේ. බුද්ධාදි අට තැන්හි සැකය නිවරණ විචිකිච්ඡා නම් වේ. නොදත් කරුණක් සම්බන්ධව ඇතිවන සැකය ප්‍රතිරූපක විචිකිච්ඡාව වේ. ඒ විචිකිච්ඡාව අකුසලයක් නොවන්නට ද පිළිවන එය චිත්ත වීථි රාශියකින් සිදුවන එක්තරා ක්‍රියාවකි.

අරමුණ පිළිබඳව අවිනිශ්චිත භාවය එහි ප්‍රකට ලක්‍ෂණය වේ.

උපාය මනසිකාරය හෙවත් නිසි මගින් කලපනා කිරීම නම් වූ යොනිසො මනසිකාරය කරණකොටගෙණ මේ විචිකිච්ඡා නීවරණය ප්‍රහාණය වන්නේය.

ධර්ම සයක් මේ විචිකිච්ඡා නීවරණයාගේ ප්‍රහාණය පිණිස උපකාර වන්නේය. එනම්:-

1. **"බහුස්සුතතා"** නම් වූ බහුශ්‍රැත භාවය හෙවත් බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව ය,

2. **"පරිපුච්ඡකථා"** නම්වූ බෙහෙවින් ප්‍රශ්න කිරීමෙන් හෙවත් පිළිවිචාරීමෙන් කරුණු විමසීමය,

3. **"විනයෙපකතඤ්ඤුතා"** නම් වූ විනයෙහි ප්‍රගුණ බවය හෙවත් ශික්ෂාවෙහි මනා පළපුරුදු ඇති බවය,

4. **"අධිමොක්ඛ බහුලතා"** නම් වූ අධිමොක්ෂය බහුල බව හෙවත් බුද්ධාදි රත්නත්‍රයෙහි බැසගත් නොසෙල්වෙන සපිර ශ්‍රද්ධාවෙන් යෙදී සිටින බව ය,

5. **"කල්‍යාණමිත්තතා"** නම් වූ කල්‍යාණ මිත්‍රයන් ඇති බවය,

6. **"සප්පාය කථා"** නම් වූ තැනට තිසි යහපත් කථා ඇති බව ය

මෙ විචිකිච්ඡා නීවරණ ධර්මය සොවාන් මග නුවණින් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කටයුතු වේ.

## අවිද්‍යා නීවරණය

දුක්ඛාර්‍ය්‍යසත්‍යයෙහි ද, දුක්ඛ සමුදයාර්‍ය්‍ය සත්‍යයෙහි ද දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යයෙහි ද, දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යයෙහි ද, අතීතස්කන්ධාදීන් පිළිබඳවද අනාගත ස්කන්ධාදීන් පිළිබඳව ද, අතීතානාගත ස්කන්ධාදීන් පිළිබඳව ද, හෙතුඵල ධර්ම හෙවත් පටිච්ච සමුප්පාද ධර්මයන් පිළිබඳවද, යම්බඳුවූ නොදැනීමක්, නොදැකීමක්, ධර්මාභිමුඛව ගොස් නොදැනීමක්, අනුරූප පරිදි නොදැනීමක්, අවබොධ නොවීමක්, ප්‍රතිවෙධ වශයෙන් නො දැනීමක්, අනිත්‍යාදි වශයෙන් ධර්මයන් සංග්‍රහ නොකිරීමක්, සමව නොබැලීමක් ධර්ම සවභාවය අනුව නොබැලීමක්, කුසලාකුසලාදි ධර්මයන්ගේ සවභාවය ප්‍රත්‍යක්ෂකර නො ගැනීමක් චිත්ත සන්තානය කිලිටි වීමක්, බාලබවක්, මනාකොට

ප්‍රකාරයෙන් නොදැනීමක්, මුළාවක්, බලවත් මුළාවක්, හාත්පසින් මුළාවක්, අනුවණ කමක්, අවිද්‍යා නමැති සැඩ පාරක්, සංසාරයෙහි යොදවන්නාවූ සවභාවයක්, අවිද්‍යානුසයක් හෙවත් අවිද්‍යාව නොනැසී මතු මත්තෙහි ලුහුබඳිමින් ශක්තිමත්ව සැඟවී සිටින අවස්ථාවක්, අවිද්‍යාපරියුට්ඨානයක් හෙවත් සන්තානයෙහි නැගී සිටින අවස්ථාවක්, අවිද්‍යා නමැති අගුලක්, මෝහය නමැති අකුසල මූලයක් හෝ වේ ද එයට **අවිද්‍යානීවරණය** යයි කියනු ලැබේ. ඉහත දක්වන ලද දුක්ඛාර්‍ය සත්‍යාදිවූ අටතැන් ප්‍රධාන කොට ඇති සියලුම ධර්මයන්, ඇත්තාවූ සවභාවයෙන් නොදැනීම, මුළාවීම අවිද්‍යා-නීවරණය බව දතයුතුයි. සියලුම අකුසලයන්ටද මුල්වූ මේ **අවිද්‍යාව** හෙවත් **මෝහය** උපදනාතාක්කල් කුසල චිත්තයක්වත් නූපදී. අවිද්‍යාව සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කරනු ලබන්නේ අර්හත් මාර්ග ඥානයෙනි. උපායෙහි දක්ෂ පෘථග්ජනයන් විසින් සත්ත්වඝාතනාදි අකුසලයන් කරණ කල්හි නොයෙක් උපායයන් යොදමින් ප්‍රඥාවගේ මුහුණු-වරින් ඒ ඒ අකුසල ක්‍රියාවන්හි දක්ෂ බව පෙන්වතත් එය ප්‍රඥාව නොව අවිද්‍යාව ම බව දතයුතුයි.

ආලෝකය උදාවන කල්හි අන්ධකාරය පහව යන්නාක් මෙන් ප්‍රඥාලෝකය ඇතිකල්හි අවිද්‍යාන්ධකාරය නැතිවී යන්නේය.

අවිද්‍යා නීවරණයාගේ ප්‍රහාණයට උපකාරවන ධර්මයෝ සත්දෙනෙකි:- එනම්

1. **"පරිපුච්ඡකතා"** නම් වූ ස්කන්ධ, ධාතු ආයතන, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මාර්ගාඞ්ග ධ්‍යාන සමථ විදර්ශනා ආදීන් පිළිබඳව ප්‍රශ්න නැවත නැවත විචාරණ සවභාවය ඇති බවය,

2. **"වත්ථුවිසදකිරියතා"** නම් වූ අධ්‍යාත්ම, බාහිර වස්තූන්ගේ පිරිසිදු බවය,

3. **"ඉන්ද්‍රිය සමත්ත පටිපාදනතා"** නම් වූ ශ්‍රද්ධා වීර්‍ය්‍ය සති සමාධි ප්‍රඥා ආදී ඉන්ද්‍රියයන් සමකොට පැවැත්වීමය.

4. **"දුප්පඤ්ඤ පුග්ගල පරිවජ්ජනතා"** නම් වූ ස්කන්ධ ධාතු ආයතනාදි ධර්‍මයන් කෙරෙහි බැසගත් නුවණ නැත්තවුන් ආශ්‍රය නො කිරීම.

5. **"පඤ්ඤවන්ත පුග්ගල සෙවනතා"** නම් වූ ස්කන්ධ, ධාතු, ආයතනාදි ධර්‍මයන් මනාව දත් ප්‍රඥාවන්ත පුද්ගලයන් ඇසුරු කිරීමය.

6. **"ගම්භීරඤාණචරිය පච්චවෙක්ඛණතා"** නම් වූ ගාම්භීරවූ, ස්කන්ධ, ධාතු, ආයතනාදී ධර්‍මයන් පිළිබඳව පවත්නාවූ ගම්භීර ඥාණයාගේ ප්‍රභෙද ප්‍රත්‍යවෙක්ෂා කිරීමය,

7. **"තදධිමුත්තතා"** නම් වූ ප්‍රඥාව ඇතිකරගැනීමට නැමුණු සිත් ඇති බවය

ලෞකික ප්‍රඥාවගේ වර්ධනයට උපකාරවන නිරවද්‍ය ශිල්ප, ශාස්ත්‍ර, කර්මාන්ත, භාෂා ආදියද, අවිද්‍යා නීවරණය දුරුකර ගැනීමට උපකාර වන්නේය.

නීවරණ ධර්‍ම වශයෙන් සයක් වූව ද, චෛතසික ධර්‍ම වශයෙන් අෂ්ට ධර්‍ම කෙනෙක් වන්නේය: එනම්-

**කාමච්ඡන්දනීවරණය** - ලොභ චෛතසිකය යි
**ව්‍යාපාද නීවරණය** - ද්වෙෂ චෛතසිකය යි
**ථිනමිද්ධ නීවරණය** - **ථින** චෛතසිකය සහ **මිද්ධ** චෛතසිකය යි
**උද්ධච්චකුක්කුච්ච නීවරණය** - **උද්ධච්ච** චෛතසිකය සහ **කුක්කුච්ච** චෛතසිකයය යි
**විචිකිච්ඡා නීවරණය** - **විචිකිච්ඡා** චෛතසිකය යි
**අවිද්‍යානීවරණය** - **මොහ** චෛතසිකය යි

## අනුසය ධර්ම

**අනුසයෝ** නම්, අනුරූප කාරණයක් ඇති කල්හි උපදින්නාවූද, නොනැසී මතු මත්තෙහි ලුහු බඳිමින් ශක්තිමත් බවට පැමිණ, මාර්ගඥනයෙන් ප්‍රහීණ කරණ තාක් කල්, අවස්ථා පැමිණි කල්හි හෙවත් සුදුසු අරමුණක් ලත් කල්හි නැවත නැවතත් ඉපදීමට සුදුසු බව ඇති අකුසල ධර්මයෝ හි

**අනුසය ධර්මයෝ** සත්දෙනෙකි එනම්;-

1. **කාමරාගානුසය**
2. භවරාගානුසය
3. **පටිඝානුසය**
4. **මානානුසය**
5. **දිට්ඨානුසය**
6. **විචිකිච්ඡානුසය**
7. **අවිජ්ජානුසය**

කෙලශයන් පිළිබඳව අවස්ථා තුනෙක් පවතී, එනම්:-

1. **අනුසය අවස්ථාව**
2. **පර්‍ය්‍යුත්ථාන අවස්ථාව**
3. **ව්‍යතික්‍රම අවස්ථාව**

අනුසය අවස්ථාව මාර්ගඥනයෙන් නොනසලනලද කෙලශයෝ ජවන්සිත් සමග සම්ප්‍රයුක්ත වශයෙන් නොයෙදී අනුරූප කාරණයක් හෙවත් නැගී සිටීමට සුදුසු අවස්ථාව පැමිණි විට උපදින්නට ශක්තිය ඇතිව පසු පසුයෙහි ලුහු බඳින්නාක්මෙන් සන්තානය නො හැර සැඟවී සිටින්නාක් මෙන් පවත්නා අවස්ථාව **අනුසය අවස්ථාව** නම් වේ.

**පර්‍ය්‍යුත්ථාන අවස්ථාව.** අරමුණක් ලැබුණු කල්හි ක්ලෙශයෝ ජවන් සිත්හි සම්ප්‍රයුක්තව උපදනා අවස්ථාව **පර්‍ය්‍යුත්ථාන අවස්ථාව** නම් වේ.

**ව්‍යතික්‍රම අවස්ථාව.** උත්සන්න බවට හෙවත් බලවත් බවට පැමිණි ක්ලේශයෝ චිත්තජවායොධාතුන් උපදවා කාය විඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූප උපදවමින්, කායාඞ්ග, වාචාඞ්ග චලනය කරවන අවස්ථාව **ව්‍යතික්‍රම අවස්ථාව** නම් වේ.

**කාමරාගානුසය.** රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ සඞ්ඛ්‍යාත පඤ්ච කාමයෙහි ඇලීම නම් වූ කාමරාගය හෙවත් කාම තණ්හාව, සත්ත්ව සන්තානයෙහි ජවන් සිත්හි සම්ප්‍රයුක්ත වශයෙන් හෙවත් පර්යුත්ථාන වශයෙන් හෝ ව්‍යතික්‍රම වශයෙන් හෝ නොයෙදෙන කල්හි, අනාගාමි මාර්ග ඥානයෙන්, සමුච්ඡේද වශයෙන් ප්‍රහීණ කරන තාක් කල්, ඒ සත්ත්ව සන්තානය අත්නොහැර පසුපසුයෙහි ලුහු බඳින්නාක්මෙන්ද, අවස්ථාව බලා නැඟී සිටින්නට ශක්ති සම්පන්නව සැඟවී සිටින්නාක්මෙන්ද පවත්නා කල්හි එයට **කාමරාගානුසය** යයි කියනු ලැබේ.

දාන සීලාදි කුසල කර්මයන්හි යෙදී සිටින කල්හි ද, තමා නො දැනුවත්වම අනුසය වශයෙන් පවත්නා මේ කාමරාගය අවස්ථාවක් පැමිණිකල්හි නැග එන්නේය. දානාදි පින්කම් කොට දෙව් මිනිස් සැප ආදි නොයෙක් කාම සම්පත් ප්‍රාර්ථනා කරනු ලබන්නේත් මේ කාම-රාගානුසය සත්ත්ව සන්තානය අත් නොහැර පවත්නා හෙයිනි. මේ කාමරාගය, විෂ්කම්භණ වශයෙන් ප්‍රහීණ නො කොට කලෙකටවත් කාමභවයෙන් මිදීමට නොහැකි වේ. එබැවින් සමථ භාවනා වැඩීමෙන් කාම අරමුණුවලින් සිත මුදවාගෙන චිත්තෛකාග්‍රතාවයක් ඇතිකරගැනීම කාමරාගය දුරුකරගැනීමට උපකාරයක් වන්නේය.

**භවරාගානුසය.** භවරාග නම් වූ, රූපා රූප භවයන්හි ඇලීමද, රූපා රූප ධ්‍යාන නිකාන්තියද, නොහොත් භවතෘෂ්ණාව අනුසය වශයෙන්ද පවත්නා ධර්මයක් බැවින් එයට **භවරාගානුසය** යයි කියනු ලැබේ.

කාමයන්හි ආදීනව දැක එයින් මිදෙනු කැමැති පුද්ගල තෙමේද, රූපාරූප ධ්‍යාන වඩා ඒ ධ්‍යාන සැපතම අපෙක්‍ෂා කරමින් එහි ඇලෙමින් වාසය කරනු ලබන්නේ භවරාගය අනුසය වශයෙන් පවත්නා හෙයිනි. හෙතෙමේ මරණින් මතු නොපිරිහුනු ධ්‍යාන ඇත්තේ, රූපා රූප තලයන්හි ඉපිද එහිද ඉතා දීර්ඝ කාලයක් බ්‍රහ්ම සම්පත්තියෙහි ඇලෙමින් වාසය කරන්නේය. එයින් චුතවූ හෙතෙම නැවතත් කාම භවයට පැමිණ සංසාර දුක්ඛයට භාජන වන්නේය. අර්හත් මාර්ගඥානයෙන් භවරාගය සමුච්ඡේද වශයෙන් ප්‍රහීණ කරණතාක් කල් අනුසය වශයෙන් සත්ත්ව සන්තානය අත්නොහැර පවතී.

මේ **කාමරාගානුසයත්, භවරාගානුසයත්** ලෝභ **චෛතසිකයම වේ.**

3. **පටිඝානුසය. පටිඝය** හෙවත් **වෛෂයද** අනුසය වශයෙන් පවත්නා **ධර්මයකි.** මෙය ද්වේෂ මූල දෙසිතෙහි යෙදෙන ද්වේෂ චෛතසිකය වේ. **අනිෂ්ට** අරමුණක් ලැබුන කල්හි අනුසය වශයෙන් පවත්නා මේ පටිඝය නැග එන්නේය. කුසල් කරන්නාවූ කල්හිද මාන, ඉස්සා, මච්ඡරිය ආදි අකුසල චේතනා මතුවී කුසල චිත්තයන් පිරිවරා ගෙණ කුසලයට බාධා කරන්නේය. සැඟවී සිටින සර්පයෙකු මෙන් අවස්ථා ලත් කල්හි නැග විත් මහත් අනර්ථ සාදන්නේය. මේ පටිඝානුසය අනාගාමි මග නුවණින් සමුච්ඡේද වශයෙන් ප්‍රහීණ කරණ තාක් කල් ඒ සන්තාන-යෙහි පහළ වීමට ශක්තිය ඇතිව සන්තානය අත්නොහැර පවත්නේය.

4. **මානානුසය.** මානයද සත්ත්ව සන්තානය අත් නොහැර සුදුසු අරමුණක් ලත් කල්හි නැග සිටීමට ශක්ති ඇතිව, සැඟවී සිටින්නාක් මෙන් පවතින ධර්මයක් වන හෙයින් එයට මානානුසය යයි කියනු ලැබේ. මෙය ලෝභ මූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත් සතරෙහි යෙදෙන අකුසල චෛතසිකයකි. බොහෝ සෙයින් තමා නොදැනුවත්වම

මේ මානය මතුවී සිත කිළිටි කරන්නේය. ශ්‍රෙය මානය, සදිසමානය, හීනමානය යනාදි වශයෙන් නොයෙක් ප්‍රභෙද ඇති මේ මානය තමාගේ ධනය, කුලය, ගුණය, සීලය, ශ්‍රැණය යනාදි කරුණු නිසා ඇතිවන්නේය. අනුන් පින්කම් කරණු බලා, ඔවුන්ට වඩා උසස් ලෙස තමාගේ පින්කම සකස් කරන්නට සිත් ඇති වන්නේත් බොහෝසෙයින් මේ අනුශය වශයෙන් පවත්නා මානය කාරණකොට ගෙණය මේ මානය සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කරණු ලබන්නේ අර්හත් මාර්ගඥනයෙන් ය.

**5. දිට්ඨානුසය,** ශාස්වත දෘෂ්ටිය, උච්ඡේද දෘෂ්ටිය, නාස්තික දෘෂ්ටිය, අහේතුක දෘෂ්ටිය, අකිරිය දෘෂ්ටිය යනාදි වශයෙන් දක්වනලද අනෙකප්‍රකාර මිථ්‍යාදෘෂ්ටීහු සොවාන් මග නුවණින් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කරණතාක් කල් ඒ සන්තානය අත්නොහැර, ශක්තිමත්ව, ලුහුබඳිමින් අවස්ථාව පැමිණි විට නැගී එන්නා වූ අකුසල ධර්මයක් බැවින් එයට **දිට්ඨානුසය** යයි කියනු ලැබේ. ධර්මයන් පිළිබඳ වූ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලක්ෂණයන් මුවා කරන්නාවූ ද, අරමුණු ගැනීමේදී නිත්‍ය, සුභ, සුඛ, ආත්ම වශයෙන් ගැනීම කරවන්නාවූ ද. මේ මිථ්‍යාදෘෂ්ටිය සත්ත්ව සන්තානය දූෂ්‍ය කරවමින්, ලුහුබඳිමින්, සසරින් ගැලවිය නොදී එහිම රඳවමින් පවත්නා බලවත් පාප ධර්මයකි.

**6. විචිකිච්ඡානුසය** බුද්ධාදි අටතැන්හි සැකය හෙවත් අවිනිශ්චිත භාවය යයි කියනලද විචිකිච්ඡාව, ධර්මය නොවැටහීම හේතුකොටගෙණ, මුළා වූ සන්තානයෙක්හි, ශක්ති සම්පන්නව, පසුපසෙහි ලුහුබඳිමින් පවත්නාවූ ද, අවස්ථාවක් හෙවත් සුදුසු අරමුණක් ලත් විටෙක, මතුවන්නට ශක්තිය ඇතිව පවත්නා අනුසය ධර්මයෙකි. සොවාන් මාර්ගඥනයෙන්, එය සමුච්ඡේද වශයෙන් ප්‍රහීණ කරණතාක් කල් සත්ත්ව සන්තානය අත්නොහරින්නේය. පිරිසිදු ධර්මඥනයෙන් තොරව නවීන විද්‍යාවන්ට අනුව තර්ක කිරීමෙන්, බුදුරජානන් වහන්සේගේ

සර්වඥතාඥානය පිළිබඳවත් දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් පිළිබඳවත් අපායයන් හා දිව්‍ය බ්‍රහ්ම ලොකයන් පිළිබඳවත් යම් යම් ධර්මාර්ථයන් පිළිබඳවත් සැක උපදවාගෙන මහත් වූ අනර්ථය සාදා ගන්නේත් මේ විචිකිච්ඡානුසය නිසාය. ධර්මය පිළිබඳ වූ බහුශ්‍රැත භාවයත් ධර්මය නිතර නිතර විචාරා ඉගෙණීමත් විචිකිච්ඡාව දුරුකර ගැණීමට උපකාර වන්නේය.

## අවිජ්ජානුසය

සියලුම අකුසලයන්ට මූල හේතුවක් වූ මොහය හෙවත් අවිද්‍යාව අර්හත් මාර්ගඥානයෙන් ප්‍රහීණ කරණතාක් කල් අනුසය වශයෙන් සත්ත්ව සන්තානය අත්නොහැර පවත්නා හෙයින් අවිජ්ජානුසය යයි කියනු ලැබේ.

මේ අවිද්‍යාව, සැම කුසලයකට ම බාධා පමුණුවනා හෙයින් ද, සත්‍යය වසා සිටිමින් ධර්මාවබොධය වළක්වනා හෙයින් ද, සසරින් එතරවිය නොදී සත්ත්ව සන්තානය අත් නොහැර පසුපසුයෙහි ලුහුබඳිමින් සසර පවත්නා හෙයින් ද පටිච්ච සමුප්පාද දෙශනායෙහි ප්‍රධානකොට දෙශනා කරණ ලදී. නාම රූප ධර්මයන් පිළිබඳවත්, නාම රූප ධර්මයන්ගේ උප්පාදය, නිරොධය, එහි ආශ්වාදය, ආදිනවය සහ නිශ්ශරණය, තත්වූ පරිද්දෙන් නොවැටහීමත් මේ අවිද්‍යාව හේතුකොටගෙණම වන්නේය.

මේ අවිද්‍යාවට පූර්ව කෙළවරක් නැත්තේය. මහා සාගරය යම් කලෙක වියලේ ද, විනාශවේද, මහා මේරු පර්වතය යම් කලෙක දැවේද, විනාශ වේද, නැතිවේද, මේ මහා පොළොව යම් කලෙක දැවේද, විනාශවේද, නැතිවේද, එබඳු කාලයක් ඒකාන්තයෙන්ම පැමිණෙන නමුත්, සසර සැරිසරන්නාවූද, අවිද්‍යාව විසින් පෙළණු ලබන්නා වූ ද සත්ත්වයාගේ කෙළවරක් හෝ දුක්ඛයාගේ කෙළවර වීමක් හෝ නොදක්නේය.

මේ අවිද්‍යාව ප්‍රඥාවගේ වැඩීමෙන්ම දුරුකටයුත්තේ ය.

අනුසය ධර්ම සතක් වූවද වස්තු ධර්ම වශයෙන් ගත්කල්හි ධර්ම සයක් වන්නේ ය. එනම් **ලොභ, ද්වේෂ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, මෝහ** යන චෛතසිකයෝ සදෙනාය.

### සංයෝජන

සත්ත්වයන් භව යන්ත්‍රයෙහි හෙවත් සංසාරයෙහි **සංයෝජනීය වස්තූන්** හා බැඳීමට උපකාරවන අකුසල ධර්මයෝ **සංයෝජනයෝයි. සංයෝජනීය වස්තූහු** නම් රූපාදි ආරම්මණයෝ යි මේ ආරම්මණයන් නුවණුවතින් ගන්නා පුද්ගලයාහට, එම සන්තානයෙහි පහළවන්නාවූ ලෝභ, මෝහ, ද්වේෂ, මාන, දිට්ඨි ආදිවූ අකුසල ධර්මයෝ, නොයෙක් දුක් පමුණුවමින්, සසරින් එතරවිය නොදී සසරෙහිම බැඳ තබන හෙයින් සංයෝජන යයි කියනු ලැබේ. රැහැනින් බඳනාලද ගවයා රැහැනින් මිදෙන තෙක් නිදහසක් නොලබන්නාක් මෙන් මේ සංයෝජන ධර්මයන්ගෙන් බඳනා ලද සත්ත්වතෙමේ සසරින් නොමි-දෙන්නේය.

**සංයෝජනයෝ** දස දෙනෙකි. එය ද **සූත්‍රාන්තික ක්‍රමය, අභිධර්ම ක්‍රමය** යයි වෙවිධ වේ.

**සූත්‍රාන්තික ක්‍රමය** අනුව දස සංයෝජනයෝ නම්:-

1. **කාමරාග සංයෝජනය**
2. **රූප රාග සංයෝජනය**
3. **අරූප රාග සංයෝජනය**
4. **පටිඝ සංයෝජනය**
5. **මාන සංයෝජනය**
6. **දිට්ඨි සංයෝජනය**
7. **සීලබ්බත පරාමාස සංයෝජනය**
8. **විචිකිච්ඡා සංයෝජනය**
9. **උද්ධච්ච සංයෝජනය**
10. **අවිජ්ජා සංයෝජනය**

**1. කාම රාග සංයෝජනය.** සත්ත්වයන් සංසාරයෙහි කාම වස්තූන් හෙවත් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්‍පෘෂ්ටව්‍ය සංඛ්‍යාත කාම ධර්මයන් හා බැඳ තැබීමට උපකාරවන, කාමයන් පිළිබඳවූ යම් තෘෂ්ණාවක් හෝ ඇලීමක් හෝ, රාගයක් හෝ සතුටුවීමක් හෝ වේ ද, එයට **කාමරාග සංයෝජනය** යයි කියනු ලැබේ. මේ කාම වස්තූන් සුභ වශයෙන් හෝ, සැප වශයෙන් හෝ සාර වශයෙන් හෝ ගන්නා පුද්ගලයාහට එම කාම වස්තූන්හි වැඩි වැඩියක්ම තෘෂ්ණාව දියුණුවන්නේය. මෙසේ වැඩෙන්නාවූ තෘෂ්ණාව, ඒ සන්තානය අත්නොහරිමින් මරණින් මත්තෙහි ද කාමභූමියෙහිම පහළකරවන්නේය. කාම භූමියෙන් මිදෙනු කැමති පුද්ගලතෙමේ නෛෂ්ක්‍රම්‍ය සංකල්පය හෙවත් කාමයන්ගෙන් නික්මීමේ කල්පනාව ක්‍රමයෙන් දියුණු කොටගෙණ, භාවනානුයෝගීව සමථයන් වඩා කාමරාගය තදඞ්ග විෂ්කම්භණාදි වශයෙන් දුරුකොට ධ්‍යාන උපදවා කාම භූමියෙන් එතරව රූපාවචර අරූපා-වචර බ්‍රහ්ම ලෝකයන්හි පහළවන්නේ ය.

කාමලෝක, රූපලෝක, අරූපලෝක යන ත්‍රිවිධ ලෝකයන් අතුරෙන් රූපා රූප ලෝකයන්ට යටින් පිහිටි කාම භූමියම භජනය කරන හෙයින් මේ කාමරාගය **ඔරම්භාගිය සංයෝජනයක්** ද වන්නේය. චෛතසික ධර්ම අතුරෙන් **ලෝභ** චෛතසිකය වේ.

කාමරාග සංයෝජනය අනාගාමි මග නුවණින් සමුච්ඡෙද වශයෙන් ප්‍රහීණ කටයුතු වේ.

**2. රූප රාග සංයෝජනය.** කාම භවය දුක් සහිත බව වටහාගත් පුද්ගලතෙමේ එයින් එතරවනු කැමතිව, සමථ භාවනා වඩා රූපාවචර ධ්‍යාන උපදවා මහද්ගත කුසල් රැස් කොට එහි විපාක වශයෙන් ලැබෙන්නා වූ රූපාවචර බ්‍රහ්ම සම්පත් අපේක්ෂා කරමින් එහි තෘෂ්ණාව උපදවා ගන්නේය.

මෙසේ රූපාවචර ධ්‍යාන කුසල විපාකයන් පිළිබඳව ඇතිවන්නා වූ තෘෂ්ණා තොමෝ **රූප රාගය** නම් වේ. ඒ රූප රාගයද සත්ත්වයා සසරෙහිම රඳවා ගන්නා බැවින් සංයෝජනයක්ද වන්නේය කාම භූමියෙන් මතුයෙහි පිහිටි රූපාවචර භූමිය භජනය කරන හෙයින් රූප රාග සංයෝජනය **උද්ධංභාගිය** සංයෝජනයක් ලෙස සලකනු ලැබේ. මෙයද **ලෝභ** චෛතසිකයයි මේ රූප රාග සංයෝජනය අර්හත් මාර්ග ඥානයෙන් සමුච්ඡේද වශයෙන් ප්‍රහීණ කට යුතු වේ.

**3. අරූප රාග සංයෝජනය** - අරූප ධ්‍යාන කුසලයන් රැස්කිරීම සහ එහි විපාකයන් විඳීම පිළිබඳව පහළවන්නා වූ යම් තෘෂ්ණාවක් වේද, එය **අරූප රාගය නම්** වේ. මෙයද සත්ත්වයා සසර බැඳ තබන සංයෝජන ධර්මයකි. කාම භූමියෙන් මතුයෙහි පිහිටි අරූප තලයන් භජනය කරන හෙයින් **උද්ධංභාගිය** සංයෝජනයක් ද වන්නේය. මෙයද **ලෝභ චෛතසික** යකි. අරූප රාග සංයෝජනය සමුච්ඡේද වශයෙන් ප්‍රහීණ කරණු ලබන්නේ අර්හත් මාර්ග ඥානයෙනි.

**4. පටිඝ සංයෝජනය.** අනිෂ්ට වූ ද, නොකැමැති වූ ද කාම අරමුණු හමුවූ කල්හි, පටිඝය උපදී. එය ක්‍රමයෙන් දියුණුවීමෙන් ව්‍යාපාදය ඇතිවී එහි විපාක වශයෙන් අනර්ථ යක්ම සිදුවන්නේය. ඔහුට ඇතිවන්නාවූ දෙෂමූල පටිඝ සම්ප්‍රයුක්ත අකුසල ජවනයන් ගේ විපාක වශයෙන් සතර අපා දුකටද පැමිණ, නැවත නැවතත් උපදින්නාවූ පටිසය කරණකොට ගෙණ අපාදුකින් මිදීම ඉතා දුෂ්කර වන්නේය. එබැවින් මේ ව්‍යාපාදය හෙවත් පටිඝය සත්ත්වයා සසරෙහිම බැඳ තබන රැහැනක් වැනි හෙයින් එයට පටිඝ සංයෝජනය යයි කියනු ලැබේ කාම භූමියෙන් මිදිය නොදී එහිම රඳවා ගන්නාවූද, කාම භූමිය භජනය කරන්නාවූ ද, ඒ පටිඝ සංයෝජනය ඕරංභාගිය සංයෝජනයක්ද වන්නේය. මෙය

චෛතසික ධර්මයන් අතුරෙන් වෙෂ චෛතසිකය වේ. පටිඝ සංයෝජනය අනාගාමි මාර්ග ඥානයෙන් සමුච්ඡේද වශයෙන් ප්‍රහීණ කරණු ලැබේ.

**5. මාන සංයෝජනය. මානය,** ලොභමූල දිට්ඨිගත විප්‍රයුක්ත සිත්හි යෙදෙන අකුසල චෛතසික ධර්මයකි. රහත් මග නුවණින් සමුච්ඡේද වශයෙන් ප්‍රහීණ කරණ තාක් කල් සත්ත්ව සන්තානයෙහි අනුසය වශයෙන්ද පවතී. කාමභූමියෙන් මතුයෙහි පිහිටි රූපාරූප භූමි භජනය කරන හෙයින් **උද්ධංභාගිය** සංයෝජනයක් ද වන්නේය.

**6. දිට්ඨි සංයෝජනය** – සක්කායදිට්ඨි ආදි වශයෙන්ද නාස්තික අහේතුක, අකිරිය ආදී වශයෙන්ද, ශාස්වත උච්ඡේද දී වශයෙන්ද නම්නාක් මිථ්‍යා දෘෂ්ටි වේද, ඒ සියලුම දෘෂ්ටීහු සත්ත්වයා සසරට බැඳ තබන අකුසල ධර්ම බැවින් එයට **දිට්ඨි සංයෝජනය** යයි කියනු ලැබේ. මේ **දිට්ඨිය** සත්ත්ව සන්තානයෙහි බලපවත්නාතුරු සසරින් එතරවීමක් හෙවත් මාර්ග ඵලාධිගමයක් නොවන්නේය. ලොභමූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත්හි යෙදෙන මේ අකුසල ධර්මය සොවාන් මාර්ග ඥානයෙන් ප්‍රහීණ කටයුත්තේය. මේ දිට්ඨි සංයෝජනය කාම භූමිය භජනය කරන හෙයින් ඔරංභාගිය සංයෝජනයක් ද වන්නේය.

**7. සීලබ්බත පරාමාස සංයෝජනය** – නිර්වාණ මාර්ගය අවුරන්නාවූද, මිථ්‍යා දෘෂ්ටිය කරණ කොට ගෙණ පහළ වන්නාවූද බාහිර සීලව්‍රතයන් පිළිගත්තා වූ පුද්ගල තෙමේ, මූළාවූයේ, ඒ සීලව්‍රතයන්ගෙන් බඳනාලදුව සසරින් එතරවිය නොහැකිව කාමභූමියෙහිම රැඳී අනෙකවිධ දුක්ඛයන්ට භාජනවන්නේය. දිට්ඨි චෛතසිකයම වූ මේ අකුසල ධර්මය සොවාන් මාර්ග ඥානයෙන් සමුච්ඡේද වශයෙන් ප්‍රහීණ කළයුතු වේ. මෙයද ඔරංභාගිය සංයෝජනයකි.

**8. විචිකිච්ඡා සංයොජනය** - බුද්ධාදි අටතැන්හි පවත්නා සැකය නම් වූ **විචිකිච්ඡා** ව ද, සත්ත්වයා සසරටම බැඳ තබන අකුසල ධර්මයකි. මෙයද සෝවාන් මග නුවණින් සමුච්ඡේද වශයෙන් ප්‍රහීණ කටයුතු වේ. එතෙක් කාම භූමියෙහිම රඳවා ගන්න හෙයින් විචිකිච්ඡා සංයොජනය ඔරම්භාගිය සංයෝජනයක්ද වන්නේය.

**9. උද්ධච්ච සංයොජනය** - මොහමූල උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත්හි යෙදෙන මෙම අකුසල ධර්මයද රහත් මග නුවණින් ප්‍රහීණ කරනතුරු සංයොජන ධර්මයක් වශයෙන් පවතී. එය රූපා රූප භූමි භජනය කරන හෙයින් උද්ධංභාගිය සංයොජනයක් වශයෙන් සළකණු ලැබේ.

**10. අවිජ්ජා සංයොජනය** - සියලුම අකුසල් සිත්හි සම්ප්‍රයුක්ත ධර්මයක් වශයෙන් යෙදෙන්නාවූද, අකුසල මූලයක්වූද, මේ මොහය හෙවත් අවිද්‍යාව අර්හත් මාර්ගඥානයෙන් සමුච්ඡේද වශයෙන් ප්‍රහීණ කරණ තුරු සත්ත්වයාට සසරින් මිදිය නොදී සසරෙහිම බැඳ තබන්නේය. තුනී කරණ ලද හෙවත් යටපත් කරණ ලද අවිද්‍යාව ඇති පුද්ගලයා රූපා රූප භූමියට ඇදගන්නා හෙයින් එය උද්ධංභාගිය සංයොජනයක්ද වේ.

සූත්‍රාන්තික ක්‍රමය වශයෙන් දක්වන ලද මේ සංයොජන දසදෙනා පරමාර්ථ ධර්ම වශයෙන් සළකණු ලබන කල්හි ධර්මයෝ සත් දෙනෙකි. එනම්:-

**ලොභ, දෙෂ, මාන, දිට්ඨි, විචිකිච්ඡා උද්ධච්ච, මොහ** යන අකුසල චෛතසික සතය.

තවද මේ දස සංයෝජනයන් අතුරෙන් පස් දෙනෙක් **ඔරංභාගිය** වශයෙන්ද පස්දෙනෙක් **උද්ධංභාගිය** වශයෙන්ද දක්වනු ලැබේ.

**ඕරම්භාගිය සංයෝජන** පස නම්:-

1. **සක්කාය දිට්ඨි සංයෝජනය**
2. **විචිකිච්ඡා සංයෝජනය**
3. **සීලබ්බත පරාමාස සංයෝජනය**
4. **කාමරාග සංයෝජනය**
5. **ව්‍යාපාදය හෙවත් පටිඝ සංයෝජනය**

**උද්ධම්භාගිය සංයෝජන** පස නම්:-

1 **රූප රාග සංයෝජනය**
2. **අරූප රාග සංයෝජනය**
3. **මාන සංයෝජනය**
4. **උද්ධච්ච සංයෝජනය**
5. **අවිජ්ජා සංයෝජනය**

මෙසින් **ඕරම්භාගිය සංයෝජනයෝ,** දික්වූ රැහැනකින් දිගෙලිකර ගාල්කණුවෙක බැඳ තබනලද ගවයෙකු මෙන් සත්ත්වයා එකොළොස් කාම භූමියෙහි මිස එයින් පිටතට යන්නට නොදී කාම භූමියෙහි බැඳ තබන්නාහ.

**උද්ධම්භාගිය සංයෝජනයෝ** වනාහි ගාල්කණුවෙන් මුදා රැහැන් සමග හරනාලද ගවයන් මෙන් කාම භූමියෙන් ඈත්ව රූපාරූප භූමියෙහි හැසිරීම කරවන්නාහ.

තවද **සක්කාය දිට්ඨි විචිකිච්ඡා, සීලබ්බතපරාමාස** යන සංයෝජන තිදෙන සෝවාන් මාර්ගඥානයෙන් ද, **කාමරාග ව්‍යාපාද** යන සංයෝජන දෙක අනාගාමි මාර්ග ඥානයෙන්ද, ඉතිරි පස අර්හත් මගනුවණින්ද සමුච්ඡේද වශයෙන් ප්‍රහීණ කරණු ලැබේ.

**අභිධර්ම ක්‍රමය** අනුව දස සංයෝජනයෝ නම්:-

1. **කාමරාග සංයෝජනය**
2. භාවරාග **සංයෝජනය**
3. **පටිඝ සංයෝජනය**
4. **මාන සංයෝජනය**
5. **දිට්ඨි සංයෝජනය**
6. **සීලබ්බත පරාමාස සංයෝජනය**
7. **විචිකිච්ඡා සංයෝජනය**
8. **ඉස්සා සංයෝජනය**
9. **මච්ඡරිය සංයෝජනය**
10. **අවිජ්ජා සංයෝජනය**

**මෙහි** භවරාග යන්නෙන් **රූප රාග, අරූප රාග** දෙකම **එකක්** කොට ගන්නාලදී.

**ඉස්සා සංයෝජනය** යනු ද්වේෂ මූල සිත්හි යෙදෙන **ඉස්සා** නම් වූ අකුසල චෛතසිකයයි. අනුන්ගේ **සම්පත්** ආදිය නොරුස්නා ස්වභාවයයි.

**මච්ඡරිය සංයෝජන යන්නෙන්** ද්වේෂමූල **සිත්හිම** යෙදෙන මච්ඡරිය චෛතසිකය ගත යුතුයි.

මේ මච්ඡරිය හෙවත් මසුරු බව **ආවාස මච්ඡරිය, කුල මච්ඡරිය,** ලාභ **මච්ඡරිය,** වණ්ණ **මච්ඡරිය, ධම්ම මච්ඡරිය** යනාදි වශයෙන් නොයෙක් ප්‍රකාර වේ.

මේ ක්‍රමය අනුව පරමාර්ථ ධර්මයෝ අටදෙනෙකි. එනම්:- ලෝභ, **ද්වේෂ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ඉස්සා, මච්ඡරිය,** මෝහ යන අටයි.

### ක්ලේශයෝ

සත්ත්වයන් කිලුටු කරන, තැවීම කරන, පෙලන කෙලෙසන ධර්මයෝ **ක්ලේශයෝ යි.** මොවුන් කරණ කොට ගෙන සිත කිලුටු වෙයි, තැවෙයි, පීඩා කරණු

ලැබෙයි හෝ තුමූම කිලුටු වෙත්නුයි හෝ සම්ප්‍රයුක්ත ධර්මයන් කිලුටු කෙරෙත්නුයි හෝ **ක්ලේශ** නම්. **දූ**ති ගින්නෙන් දර සහ භාජන දවනු ලබත්තේ යම්සේද, එමෙන්ම දිලිසෙන ගිනි අඟුරු වැනි මේ කෙලශ ධර්මයන් විසින් දර වැනි ඵස්සාදි සම්ප්‍රයුක්ත ධර්මයන් සහ බඳුන් වැනි කෙලෙස් සහිතවූ පුද්ගලයාද හාත්පසින්ම දවනු ලබන්නේය.

මෙසේ කෙලශ සඞ්ඛ්‍යාවට ගණිනු ලබන අකුසල ධර්මයෝ දස දෙනෙකි. එනම්:-

1. **ලොභ**
2. **දොස**
3. **මොහ**
4. **මාන**
5. **දිට්ඨි**
6. **විචිකිච්ඡා**
7. **ථීන**
8. **උද්ධච්ච**
9. **අහිරික**
10. **අනොත්තප්ප** යන අකුසල චෛතසිකයෝ යි.

ප්‍රකෘති භවඞ්ග චිත්තය ඉතා පිරිසිදුය. යම් භවයක උපදනා පුද්ගලයෙකුහට ප්‍රතිසන්ධික්ෂණයේදී උපදනා ප්‍රතිසන්ධි විපාක චිත්තය කාමසොභන විපාක සිත් අටය, අහෙතුක ප්‍රතිසන්ධිය ගෙන දෙන්නාවූ උපෙක්ඛා සන්තීරණ දෙය මහග්ගත විපාක නවය යන එකුන්විසි විපාක චිත්ත යන්ගෙන් එකක්ම විය යුතුය භවඞ්ග කෘත්‍ය සිද්ධ කර මින් චුතිය දක්වාත් සන්තතිය නොබිඳී පවතින්නේත් ඒ සිත්මය. එසිත් එකම සිතෙක්හිවත් අකුසල චෛත-සිකයෝ නූපදී. එහෙයින් ඒ සිත් අකුසල ධර්මයන්ගෙන් මිදුන හෙයින් පිරිසිදුය. රූප ශබ්දාදි කාම අරමුණෙක්

හමුවූ කල්හි එය නුණුවනින් ගැනීමෙන් මෝහය කරණ කොට ගෙන ලෝභ ද්වේෂාදි පාපචේතනා පහළවන්නේය. එකල්හි පිරිසිදුවූ භවාංග චිත්තය බිඳී අකුසල ජවන් වීථි උපදී. එම අකුසල් සිත්හි යෙදෙන්නාවූ මේ ක්ලේශ ධර්මයෝ එම සන්තානය කිලුටු කරමින් නොයෙක් පීඩා පමුණුවන්නාහ. එබැවින් තුදුස් අකුසල චෛතසිකයන් අතුරෙන් මේ ලෝභ ද්වේෂාදී දසදෙනා ඒකාන්ත වශයෙන්ම සත්ත්ව සන්තානය කෙලෙසන බැවින් **ක්ලේශයෝ** යයි දක්වන ලදී.

මේ දසවිධ ක්ලේශ ධර්මයන් අතුරෙන් **දිට්ඨි විචිකිච්ඡා** යන දෙදෙන සෝවාන් මාර්ග ඥානයෙන්ද, **ද්වේෂය** අනාගාමි මාර්ග ඥානයෙන්ද, **ලෝභ, මෝහ, මාන, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප** යන සත අර්හත් මාර්ගඥානයෙන්ද සමුච්ඡේද වශයෙන් ප්‍රහීණ කටයුතු වේ.

ආසව, ඕඝ, යෝග, ග්‍රන්ථ, උපාදාන, නීවරණ. අනුසය, සංයෝජන, කිලෙස වශයෙන් නවවිධවූ මේ අකුසල සංග්‍රහයෙහි, ඒකාන්ත අකුසල වශයෙන් සමානවූ ධර්මයන්ගේ සංග්‍රහය දක්වනලද බැව් සැලකිය යුතුයි.

එයින්ද, ආසව, ඕඝ, යෝග, ග්‍රන්ථ වශයෙන් අකුසල චෛතසික තුන බැගින්ද, උපාදාන වශයෙන් චෛතසික දෙකක්ද, නීවරණ වශයෙන් චෛතසික අටක්ද, අනුසය වශයෙන් සයක්ද, සංයෝජන වශයෙන් නවයක්ද, කිලෙස වශයෙන් දසයක්ද ඇතුළත් වේ.

අකුසල චෛතසික ධර්මයන්ගේ වශයෙන් සළකන කල්හි

මෝහය – ආසව, ඕඝ, යෝග, නීවරණ, අනුසය, සංයෝජන සහ කිලෙස වශයෙන්ද,

අහිරිකය – කිලෙසයක් වශයෙන්ද,

අනොත්තප්පය – කිලෙසයක් වශයෙන් ද,

උද්ධච්චය - නීවරණ, සංයෝජන, ක්ලේශ වශයෙන්ද,

ලෝභය - ආසව, ඕඝ, යෝග, ග්‍රන්ථ, උපාදාන, නීවරණ, අනුසය, සංයෝජන සහ ක්ලේශ වශයෙන් ද,

දිට්ඨිය - ආසව, ඕඝ, යෝග, ග්‍රන්ථ, උපාදාන, අනුසය, සංයෝජන, ක්ලේශ වශයෙන් ද,

මානය - අනුසය, සංයෝජන, ක්ලේශ වශයෙන් ද,

ද්වේෂය - ග්‍රන්ථ, නීවරණ, අනුසය, සංයෝජන, ක්ලේශ වශයෙන් ද,

ඉස්සා - සංයෝජන වශයෙන්ද,

මච්ඡරිය - සංයෝජන වශයෙන් ද,

කුක්කුච්චය - නීවරණ වශයෙන් ද,

ථිනය - නීවරණ, ක්ලේශ වශයෙන් ද,

මිද්ධය - නීවරණ වශයෙන් ද,

විචිකිච්ඡාව - නීවරණ, අනුසය, සංයෝජන, ක්ලේශ වශයෙන් ද දක්වන ලදී.

## අකුසල සංග්‍රහය

| අකුසල චෛතසික | ආසව | ඕඝ | යෝග | ගන්ථ | උපාදාන | නීවරණ | අනුසය | සංයෝජන | කිලෙස | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. මෝහ | + | + | + | — | — | + | + | + | + | 7 |
| 2. අහිරික | — | — | — | — | — | — | — | — | + | 1 |
| 3 අනොත්තප්ප | — | — | — | — | — | — | — | — | + | 1 |
| 4 උද්ධච්ච | — | — | — | — | — | + | — | + | + | 3 |
| 5. ලෝභ | + | + | + | + | + | + | + | + | + | 9 |
| 6. දිට්ඨි | + | + | + | + | + | — | + | + | + | 8 |
| 7. මාන | — | — | — | — | — | — | + | + | + | 3 |
| 8. දෝස | — | — | — | + | — | + | + | + | + | 5 |
| 9. ඉස්සා | — | — | — | — | — | — | — | + | — | 1 |
| 10. මච්ඡරිය | — | — | — | — | — | — | — | + | — | 1 |
| 11. කුක්කුච්ච | — | — | — | — | — | + | — | — | — | 1 |
| 12. ථීන | — | — | — | — | — | + | — | — | + | 2 |
| 13. මිද්ධ | — | — | — | — | — | + | — | — | — | 1 |
| 14. විචිකිච්ඡා | — | — | — | — | — | + | + | + | + | 4 |
| එකතුව | 3 | 3 | 3 | 3 | 2 | 8 | 6 | 6 | 10 | |

# මිශ්‍රක සංග්‍රහය

කුසල අකුසල අව්‍යාකෘත වශයෙන් මිශ්‍රයන්ගේ සංග්‍රහය මිශ්‍රක සංග්‍රහය නම් වේ. එය සත් ප්‍රකාරයකින් සංග්‍රහ වේ. එනම්:-

1. හෙතු ධර්ම සය
2. ධ්‍යානාඞ්ග සත
3. මාර්ගාඞ්ග දොළොස
4. ඉන්ද්‍රිය දෙවිස්ස
5. බල ධර්ම නවය
6. අධිපති ධර්ම සතර
7. ආහාර සතර

## හෙතු ධර්ම

තමා හා එක්ව හටගත්තාවූ හෙවත් සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ සපිරව පිහිටන බව සිද්ධ කරන ධර්මයෝ මූලාර්ථයෙන් හෙතු ධර්ම නම් වෙත්. (මේ පිළිබඳ විස්තරය හෙතු සංග්‍රහයෙහි දක්වන ලදී.)

හෙතු ධර්ම සයකි. එනම්.-

1. ලොභය
2. දොසය
3. මොහය
4. අලොභය
5. අදොසය
6. අමොහය

මේ සවැදෑරුම් ධර්මයන් අතුරෙන් ලොභ, දොස මොහ යන හෙතුහු තිදෙන දොළොස් අකුසලයන්ගේ මූල සඞ්ඛ්‍යාත අකුසල හෙතුහු නම් වෙත්. අලොභ, අදොස, අමොහ යන හෙතුහු තිදෙනා අතුරෙන් එක් විසි කුසල් සිත්හි සම්ප්‍රයුක්තවූ හෙතුහු කුසල හෙතුහු නම් වෙත්. විපාක ක්‍රියා සිත් සමග යෙදුනාවූ හෙතුහු අව්‍යාකෘත හෙතුහු නම් වෙත්.

සරු පොළොවෙහි රෝපණය කරණලද සරු බීජයක් කරණ කොටගෙණ හටගත්තාවූ යහපත්ව මුල් බැසගත්තාවූ වෘක්ෂයක්හුගේ මූලයන්ගේ අනුසාරයෙන් පෘථිවි ඕජා රසය ඇදගනිමින් ශාඛාවන්හි මල් ඵලාදිය උපදවන්නේ යම්සේද, එමෙන්ම පූර්ව ජාතියෙහි කළා වූ ත්‍රිහෙතුක ඥාන සම්ප්‍රයුක්ත කුසල කර්මය හෙතුකොට ගෙන යහපත්වූ සෘතුවෙහි පහළවූ බිජුවටින් කාම සුගතියෙහි උපදවනලද ත්‍රිහෙතුක ඥාන සම්ප්‍රයුක්ත මහා විපාක නමැති වෘක්ෂයාගේ අලොභ අදෙස අමොහ නමැති මූලානුසාරයෙන් නොයෙක් උපභොග පරිභොග සම්පත් හා මහත්වූ ගුණ නුවණ නමැති මල් ඵල ආදිය උපදවනු ලැබේ. මේ හෙතු ධර්මයන් නිසා ඒ පුද්ගල සන්තානයෙහි හටගන්නා වූ සහෙතුක චිත්තය, සහෙතුක චිත්තජ රූපය, සහෙතුක ප්‍රතිසන්ධි කර්මජ රූපය යනාදිවූ ධර්මයෝ ඒ වෘක්ෂයාගේ ශාඛා ඵල මල් ආදියට සමාන වෙත්. මෙසේ විශෙෂ ආනිශංසාදිය හෙවත් ගතිසම්පත්තිය උපදවනු ලබන්නේ පෙර භවයෙහි ඒ මහා කුසලය කරන්නා වූ කාලයෙහි හෙවත් ජවනක්ෂණයේදී, අලොභ, අදෙස, අමොහ නම්වූ හෙතු තුන්දෙනෙක්ද, ඒ භවයෙහි චුතික්ෂණයේදී අලොභ, අදෙස යන හෙතු දෙකක්ද, මේ භවයෙහි ප්‍රතිසන්ධික්ෂණයේදී අලොභ, අදෙස, අමොහ යන හෙතු තුනෙක්දැයි මෙසේ හේතු අටකින් සමන්විත වූ හෙයිනි.

බුදු, පසේ බුදු, මහරහත්, සක්විතිරජ ආදිවූ මහෙශාක්‍ය මනුෂ්‍ය යන්ගේ හා දෙවියන්ගේද ප්‍රතිසන්ධි නමැති වෘක්ෂයෙහි රසතලය දක්වා බැසගත්තාවූ මහත්වූ මූලයන් අටදෙනෙකුට බඳු වූ හෙතු ධර්ම අටකින් යුක්තවූ හෙයින් ඒ පුද්ගලයන්ගේ ප්‍රතිසන්ධි විපාකයෙන් නොයෙක් ආශ්චර්‍ය්‍ය අද්භූත විපාකානිශංස උපදවනු ලැබේ. සිදුහත් කුමරුගේ ප්‍රතිසන්ධි චිත්ත නමැති වෘක්ෂයාගේ රසතලය දක්වා බැසගත්තාවූ මූලයන් අටදෙනාගේ අනුසාරයෙන්, සර්වඥතාඥානයද, දෙතිස් මහා පුරුෂ ලක්ෂණ, අසීත්‍යානුව්‍යඤ්ජනාදියෙන් යුක්තවූ ධර්ම කාය, රූපකාය සඞ්ඛ්‍යාත වූ විපාකානිශංස

හා පන්දහසක් හවුරුදු මුලුල්ලෙහි දෙව් බඹුන්ගෙන් ලබන අනන්තප්‍රමාණවූද පූජා සත්කාර නමැති විපාකානිශංස යෝද ලැබෙත්.

ද්විහේතුක ලාමක කුසල කර්මයාගේ ආනුභාවයෙන් උපෙක්ඛා සහගත සන්තීරණ නමැති අහේතුක විපාකයෙන් ප්‍රතිසන්ධි ගත්තාවූ, පුද්ගල තෙමේ, හීනදීන මනුෂ්‍යයෙක්ව උපදී ඒ දුර්වල ප්‍රතිසන්ධිය නමැති වෘක්ෂයෙහි හේතු ධර්ම නැති හෙයින් තම තමන්ගේ සාපිපාසා සංසිඳවීමට පවා සුදුසු ප්‍රත්‍යයන් නැති හෙයින් අනුන්ගේ දාස බවට හෝ පැමිණ දුකසේ ජීවිකාව කෙරෙයි. දුර්වලවූ ද්විහේතුක කුසල කර්මයාගේ විපාකය වශයෙන් මෙසේ දුක් ගෙනදෙන්නාවූ කාමසුගතියෙකි, හීනවූ ආත්මභාවයක් උපදවන්නේ නම් අකුසල කර්මයා ගේ අනිෂ්ට විපාකය ගැන කියනුම කවරේද? කාම සුගතියක් නම් ඔහට කිසිකලෙකත් නොලැබෙන්නේය. ඔහුට ලැබෙන්නේ භයානක දුක් උපදවන්නාවූ දුගති අහේතුක ප්‍රතිසන්ධියෙක්මය.

අකුසල හේතු තුන අතුරෙන් මෝහය දොළොස් අකුසල් සිත්හි ඒකාන්තයෙන්ම ලැබෙන්නේය. ලෝභ මූල සිත් අටෙහි ලෝභ මෝහ යන හේතු දෙකද, ද්වේෂ මූල දෙසිතෙහි ද්වේෂ මෝහ යන හේතු දෙකද, මෝහ මූල දෙසිතෙහි මෝහය පමණක්ද ලැබේ.

කුසල හේතු අතුරෙන් අලෝභ, අද්වේෂ යන හේතු දෙදෙනා සැම කුසල් සිතකම ලැබේ. අමෝහය, ඥාණ සම්ප්‍රයුක්ත කාමාවචර කුසල විපාක ක්‍රියාසිත් දොළොසෙහිද සියලුම මහග්ගත ලෝකෝත්තර සිත්වලද ලැබේ.

අටළොස් අහේතුක චිත්තයන්හි මේ හේතු කිසිවෙක් නැත. එහෙයින් එම සිත් වාතානුසාරයෙන් ඔබමොබ සැහැකිවූ දිය සෙවෙල් බඳු උපමා ඇත්තේය.

## ධ්‍යානාඞ්ග

ධ්‍යානාඞ්ගයෝ සත් දෙනෙකි. එනම්

1. විතක්කය
2. විචාරය
3. ප්‍රීතිය
4. එකග්ගතාය
5. සොමනස්සය
6. දොමනස්සය
7. උපෙක්ෂාය යන ධර්මයෝ සත්දෙනය.

"ඣාන" ශබ්දයාගේ විග්‍රහ අර්ථ දෙකෙකි පච්චනීක ධර්ම හෙවත් ප්‍රතිපක්ෂවූ පංචනීවරණාදි ධර්මයන් දවන අර්ථයෙන්ද ධ්‍යාන නම් වේ එසේම ආරම්මණ උපනිජ්ඣායන හෙවත් අරමුණ ලංකොට බලන අර්ථයෙන්ද ධ්‍යාන නම් වේ. ධ්‍යානයාගේ අඞ්ග ධ්‍යානාඞ්ග නමි.

මේ ධර්මයෝ සත්දෙනා කුසලා කුසල අව්‍යාකෘත යන සිත්හි යෙදෙත්. එහෙත් ඒ හැම සිත්හිම යෙදෙන මේ ධර්මයන්ට ධ්‍යානාඞ්ග යයි නොකියත්, "විතක්ක පච්ඡිමකං ඣානාඞ්ගං" යයි දක්වා ඇති හෙයින් මේ ධර්මයෝ විතර්කය පශ්චිම කොට ඇති කල්හිම ධ්‍යානාඞ්ගයෝ යයි ව්‍යවහාර කෙරෙත්. එබැවින් දෙපස් විඤ්ඤාණාදි සිත්හි හෙවත් විතර්කය රහිත සිත්හි යෙදුනාවූ එකග්ගතා උපෙක්ෂාදි ධර්මයන්ට ධ්‍යානාඞ්ගයෝ යයි නොකියත්.

මේ ධ්‍යානාඞ්ගයන් අතුරෙන් සොමනස්ස, දොමනස්ස, උපෙක්ෂා යන තුන්දෙනා එකම වේදනා චෛතසිකය බව දත යුතු මෙයින් දොමනස්සය එකාන්ත අකුසල ධ්‍යානාඞ්ග යකි ඉතිරි ධ්‍යානාඞ්ග සය කුසලා කුසල අව්‍යාකෘත ධ්‍යානාඞ්ගයෝ වෙත්.

මහග්ගත ලොකොත්තර සිත්හි යෙදුනාවූ ධ්‍යානාඞ්ගයෝ නීවරණ ධර්මයන් දවන අර්ථයෙන් හා අරමුණ ලංකොට බලන අර්ථයෙන්ද ධ්‍යානාඞ්ගයෝ නම් වෙත්.

රූපාවචර ප්‍රථම ධ්‍යාන කුසල චිත්තයෙහි යෙදුනාවූ ධ්‍යානාඞ්ගයෝ පස්දෙනා පංචනීවරණ ධර්මයන් විෂ්කම්භන ප්‍රහාණ වශයෙන් නසන හෙයින්ද, ධ්‍යානාලම්බණ නම්වූ කසිණ ප්‍රතිභාග නිමිත්තාලම්බණය ලංකොට බලනාර්ථයෙන්ද ධ්‍යානාඞ්ග නම් වෙත්. මහග්ගත ලොකොත්තර සිත්හි මේ කෘත්‍ය දෙකම එකක්ෂණයෙහිම සිද්ධවන බව දතයුතු.

අකුසල් සිත් අතුරෙන් සොමනස්ස දිට්ඨිගත සම්ප්‍රයුක්ත හා විප්‍රයුක්ත සිත් සතරෙහි යෙදුනාවූ විචාර, පීති, එකග්ගතා සොමනස්ස යන ධර්මයෝ විතර්කය පශ්චිම කොට ඇති බැවින්, එසේ උපදනා ඒ ධර්මයන්ට අකුසල ධ්‍යානාඞ්ගයෝ යයි කියති.

දෙසමූල දෞමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත දෙසිත්හි යෙදුනාවූ විචාර, ඒකග්ගතා, දෞමනස්ස යන ධර්මයෝ විතර්කය පශ්චිම කොට ඇති බැවින් අකුසල ධ්‍යානාඞ්ග නම් වෙත්.

උපෙක්ෂා සහගත අකුසල් සිත් සයෙහි යෙදුනාවූ විචාර එකග්ගතා, උපෙක්ඛා යන ධර්මයෝද විතර්කය පශ්චිම් කොට ඇති හෙයින් අකුසල ධ්‍යානාඞ්ග නම් වෙත්.

මෙසේ අකුසල් සිත්හි උපදනා විතක්ක, විචාර, පීති, එකග්ගතා, සොමනස්ස දෞමනස්ස, උපෙක්ඛා යන ධ්‍යානාඞ්ගයෝ ආරම්මණූපනිජ්ඣානාර්ථයෙන් හෙවත් අරමුණු ලංකොට බලනාර්ථයෙන්ම පමණක් ධ්‍යානාඞ්ග නම් වෙත්. එහි ප්‍රතිපක්ෂ ධර්මයන් දවන අර්ථයක් නොලැබේ.

ඒ ඒ කාමාවචර කුසල් සිත්හි යෙදුනාවූ විචාර පීති එකග්ගතා, සොමනස්ස, උපෙක්ඛා යන ධර්මයෝ විතර්කය පශ්චිම කොට ඇති බැවින් කුසල ධ්‍යානාඞ්ග නම් වෙත්.

එමෙන්ම විපාක ක්‍රියා සිත්හි යෙදුනාවූ මේ ධර්මයෝද විතර්කය පශ්චිම කොට ඇති කල්හි අව්‍යාකෘත ධ්‍යානාඞ්ග නම් වෙත්.

## මාර්ගාඞ්ග

දුගති, සුගති, නිර්වාණ යන ත්‍රිවිධ දිසාවන්ට පමුණු-වන්නෝ මාර්ගයෝ යි. ඒ මාර්ගයාගේ අවයව හෙවත් කොටස්, මාර්ගාඞ්ග නම් වෙත්.

1. සම්ම දිට්ඨි
2. සම්මා සඞ්කප්ප
3. සම්මා වාචා
4. සම්මා කම්මන්ත
5. සම්මා ආජීව
6. සම්මා වායාම
7. සම්මා සති
8. සම්මා සමාධි
9. මිච්ඡා දිට්ඨි
10. මිච්ඡා සඞ්කප්ප
11. මිච්ඡා වායාම
12. මිච්ඡා සමාධි

## දුගති මාර්ගාඞ්ග

මේ දොළොස් මාර්ගාඞ්ගයන් අතුරෙන් මිච්ඡා දිට්ඨි, මිච්ඡා සඞ්කප්ප, මිච්ඡා වායාම, මිච්ඡා සමාධි යන සතර දෙනා ඒකාන්ත දුගති මාර්ගාඞ්ගයෝයි. දොළොස් අකුසල චිත්තයන්හි යෙදෙන්නාවූ මේ ධර්මයෝ සතරදෙනා අපායට පමුණුවන්නාවූ මාර්ගයාගේ අඞ්ග වන බැවින් හෝ අපායට ගෙනයන්නාවූ නැවකට බඳුවූ හෙයින් හෝ අකුසල මාර්ගාඞ්ග හෙවත් දුගති මාර්ගාඞ්ග නම් වෙති.

මිච්ඡාදිට්ඨිය - ශාස්වත, උච්ඡේදාදි වශයෙන් හෝ නාස්තික, අහේතුක, අකිරිය ආදි වශයෙන් හෝ දක්වන ලද සියලුම වැරදි දෘෂ්ටිහු මිථ්‍යා දෘෂ්ටි නම් වෙත්. අනිත්‍යාදි ධර්ම සවභාවයට ප්‍රතිපක්ෂවූයේ නිත්‍යාදි වශයෙන්

දකිනුයි හෝ තෙමේම වරදවා දකිනුයි හෝ වරදවා දැකීම් මාත්‍රය හෝ මිථ්‍යාදිට්ඨි නම්. එය නුනුවණින් ගැනීම **ලක්ෂණ** කොට ඇත්තේය. **දැඩිකොට** අල්වා ගැනීම කෘත්‍යකොට ඇත්තේය. අයථා ක්‍රමයෙන් මෙනෙහි කිරීම වැටහෙන ආකාරය වේ. බුද්ධාදී ආර්යයන් නොදක්නා කැමැත්ත ආසන්න කාරණය වේ

මිථ්‍යාදිට්ඨිය – ලොභමූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත අකුසල් සිත් සතරෙහි යෙදෙන දිට්ඨි චෛතසිකය වේ. අන්‍යවූ අකුසල් සිත් අටෙහි නො යෙදේ. මේ අකුසල මාර්ගාඞ්ගය, සත්ත්වයා මරණින් මතු ඒකාන්තයෙන්ම සතර අපායටම පමුණුවන බලවත් අකුසල ධර්මයාගේ හෙවත් දුගති මාර්ගයාගේ අඞ්ගයකි. සම්‍යග්දෘෂ්ටිය උපදවා ගැණීමෙන් එය නැසිය යුතු වේ.

**මිථ්‍යාසඞ්කප්පස**:- **කාම විතර්ක, ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්ක** වශයෙන් ප්‍රභෙද ඇති මේ විතර්ක චෛතසිකය අකුසල් සිත්හි යෙදෙන කල්හි, එය දුගතියට පමුණුවන මාර්ගයාගේ අඞ්ගයක්ද වන බැවින් එයට දුගති මාර්ගාඞ්ගයක් යයි කියනු ලැබේ.

**කාමරාගය** හෙවත් **කාමතෘෂ්ණාව** වැඩීමට උපකාර වන්නාවූද, කාමයන් පිළිබඳව ඇතිවන්නාවූ යම් වැරදි කල්පනාවක් හෙවත් විතර්කයක් වේද එය **කාමවිතර්ක** නම්. මෙය **නෙක්ඛම්ම සඞ්කප්පය** වැඩීමෙන්ම දුරුකට යුතු වේ.

**පටිඝය** නොහොත් **ව්‍යාපාදය** දියුණුවීමට උපකාර වන්නාවූ පටිඝ‍යාගේ වැඩීමක් වේද, නොකැමැති අරමුණක් පිළිබඳව වැරදිවූ අයහපත් කල්පනාවෙක් හෝ විතර්කයක් වේද එය **ව්‍යාපාද විතර්ක** නම්. මෙය මෛත්‍රිය හෙවත් **අව්‍යාපාද සඞ්කප්පය** වැඩීමෙන් දුරුකටයුතු වේ

**විහිංසාව** වැඩීමට උපකාරවන්නාවූ හෙවත් මෙරමාහට හිංසා කිරීම පිණිස හේතුවන යම් වැරදි කල්පනාවක් හෙවත් අයහපත් විතර්කයක් වේද එය **විහිංසා විතර්ක** නම්. කරුණා ගුණය නොහොත් අවිහිංසා සඞ්කල්පය වැඩීමෙන් එය දුරු කටයුතු වේ.

මේ **මිච්ඡා සඞ්කප්පය** දෙළොස් අකුසල් සිත්හි විතර්ක චෛතසිකය වශයෙන් යෙදෙමින්, ප්‍රාණඝාතාදි අකුසල කර්මයන්ට අනුබල දෙමින් සත්ත්වයා සතර අපායට පමුණුවන මාර්ගයාගේ අඞ්ගයක් වන බැවින් දුගති මාර්ගාඞ්ග යක් වේ.

**මිච්ඡාවායාමය**: සම්‍යග් ව්‍යායාමයට ප්‍රතිපක්ෂවූ අයහ පත් වීර්ය **මිච්ඡා ව්‍යායාමය** නම් වේ. ප්‍රාණඝාතාදි අකුසල කර්ම පථයන් සිද්ධ කරන්නාවූ කල්හි ඒ අයහපත් ක්‍රියාව සමෘද්ධ කරගැනීමට යම් උත්සාහයක්, වීර්යයක් උපදවන්නේ නම් එයට මිච්ඡා වායාම යයි කියති. දෙළොස් අකුසල් සිත්හිම ලැබෙන මේ වීර්ය චෛතසිකය, අපායට පමුණුවන මාර්ගයෙහි අඞ්ගයක් වන බැවින් එයට දුගති මාර්ගාඞ්ගයක් යයි කියනු ලැබේ. සම්‍යග් ව්‍යායාමය වැඩී මෙන් එය දුරුකට යුතු වේ.

**මිච්ඡා සමාධිය**: යනු දෙළොස් අකුසල් සිත්හි යෙදෙන ඒකාග්‍රතා චෛතසිකයයි. අකුසල කර්ම සිදුකිරීමේදී යම් අරමුණක් පිළිබඳව බලවත්වූ අයහපත් ඒකාග්‍රතාවයක් වේ නම් එයට **මිච්ඡාසමාධිය** යයි කියති. සමථ භාවනා වැඩීමෙන් එය දුරු කටයුතු වේ.

මේ සතර දුගති මාර්ගාඞ්ගයන් අතුරෙන් **මිච්ඡා දිට්ඨිය** හෙවත් **දිට්ඨි** චෛතසිකය ඒකාන්ත අකුසල මාර්ගාඞ්ගයකි. ඉතිරි අන්‍ය සමාන චෛතසික තුන් දෙන හෙවත් **විතර්ක, වීර්ය ඒකාග්‍රතා** යන ධර්මයෝ කුසල් සිත්හිද යෙදෙන බැවින් මිශ්‍රක ධර්ම නම් වෙත් මේ ධර්ම තුන, අකුසල් සිත්හි යෙදෙන කල්හි පමණක් **අකුසල** හෙවත් **දුගති මාර්ගාඞ්ග** යයි ව්‍යවහාර කරනු ලැබේ.

දොළොස් අකුසල් සිත් අතුරෙන් දිට්ඨිගත සම්ප්‍රයුක්ත අකුසල් සිත් සතරෙහි පමණක් මේ අපාය මාර්ගාඞ්ගයෝ සතර සතර දෙනා බැගින්ද, අවශෙෂවූ අකුසල් අටෙහි **මිච්ඡා සඞ්කප්ප, මිච්ඡාවායාම, මිච්ඡා සමාධිය** යන අපාය මාර්ගාඞ්ගයෝ තුන්දෙනාද සුදුසු පරිද්දෙන් යෙදෙන බව දතයුතු

තවද, **මිච්ඡාවාචා, මිච්ඡාකම්මන්ත, මිච්ඡා ආජීව, මිච්ඡාසති** යන සතර ධර්ම කෙනෙක්ද දෙශනාවෙහි දක්වා තිබේ. එසේ දක්වන ලද්දේ අකුසල චිත්තොත්පාද වශයෙන් මිස මාර්ගාඞ්ග වශයෙන් නොවේ මේ සතර ධර්මයෝ ඇතුලත් වන චෛතසික ධර්ම නැත. **මිච්ඡාවාචා** යනු මුසාවදාදි සතරවාග් දුශ්චරිතයෝයි. ප්‍රාණඝාතාදි ත්‍රිවිධ කාය දුශ්චරිතයන්ට **මිච්ඡාකම්මන්ත** යයි කියති. සප්තවිධ කාය වාග් දුශ්චරිතයන්හි හැසිරෙමින් සිදුවන අයහපත් ජීවිකාවට **මිච්ඡාජීවය** යයි කියනු ලැබේ. **සම්මාසතියට** ප්‍රතිපක්ෂවූ සිහිමුලා බවට **මිච්ඡාසති** යයි ව්‍යවහාර වේ **සතිය** සොභන සාධාරණ චෛතසිකයකි. එය අකුසල් සිත්හි නොයෙදේ.

### සුගති හා නිර්වාණ මාර්ගාඞ්ග.

**සම්මා දිට්ඨි සම්මා සඞ්කප්ප, සම්මාවාචා, සම්මා කම්මන්ත. සම්මා ආජීව, සම්මාවායාම, සම්මා සති, සම්මා සමාධි** යන ධර්මයෝ අටදෙනා **සුගති මාර්ගාඞ්ග හා නිර්වාණ මාර්ගාඞ්ගද** වෙත්.

1. **සම්මා දිට්ඨිය**: දුක්ඛ, සමුදය, නිරොධ, මාර්ග යන චතුස්සත්‍ය ප්‍රතිවෙධය පිණිස පූර්ව භාග ප්‍රතිපදා වශයෙන් පිළිපන්නාවූ හෙවත් ආර්ය මාර්ගඥානය ලැබීම සඳහා යොග කර්මයෙහි නියුක්ත යොගාවචරයාගේ, අවිද්‍යාව නසන්නාවූද, නිර්වාණය අරමුණු කරන්නාවූද, විද්‍යා නම් වූ ප්‍රඥා චක්ෂුසය **සම්මාදිට්ඨිය** නම්. එය අවිපරීත දැකීම **ලක්ෂණ** කොට ඇත්තේය. චතුස්සත්‍යය ප්‍රකාශ කිරීම එහි **කෘත්‍ය** වේ. අවිද්‍යාන්ධකාරය නැසීම එහි **වැටහෙන ආකාරය** වේ.

මෙසේ මේ සම්මා දිට්ඨි නම් වූ ප්‍රඥා චෛතසිකය ලෝකෝත්තර සිත්හි උපදනා කල්හි, එය නිවන් අරමුණු කරමින් උපදින බැවින් එයට නිර්වාණ මාර්ගාඞ්ගයක් යයි කියති. පූර්වභාග ප්‍රතිපදා සමයෙහි මාර්ග චිත්තක්ෂණයට පෙරටුව උපදනා ගෝත්‍රභූ චිත්තය දක්වා උපදින්නාවූ කාමාවචර මහා කුසල් සිත්හි යෙදෙන ප්‍රඥා චෛතසිකය සුගති මාර්ගාඞ්ගයක්වූ සම්මා දිට්ඨිය වේ. සප්තකාම සුගතියට පමුණුවන මාර්ගයාගේ අඞ්ගයක් වන හෙයිනි.

**2. සම්මා සඞ්කප්පය:** නිර්වාණ මාර්ගාඞ්ගයක්වූ සම්‍යග් දෘෂ්ටියෙන් සම්පූර්ණ වූ දෘෂ්ටි ඇත්තාවූ පුද්ගලයාගේ, ඒ හා සම්ප්‍රයුක්ත වූ, **කාම සඞ්කල්ප, ව්‍යාපාද සඞ්කල්ප, විහිංසා සඞ්කල්ප** වශයෙන් දක්වන ලද **මිථ්‍යාසඞ්කල්පය** ප්‍රහාණය කරමින්, සිත නිර්වාණාලම්බනයෙහි ආරෝපනය හෙවත් නැංවීම කරන්නේ **සම්මාසඞ්කප්ප** යයි. **සම්මා සඞ්කප්පය** සිත මනාව නිවන් අරමුණට නැංවීම **ලක්ෂණ** කොට ඇත්තේය. සිත නිවණෙහි ඇලවීම එහි **කෘත්‍යවේ.** කාම සඞ්කල්පාදි මිථ්‍යා සඞ්කල්පයාගේ ප්‍රහාණය එහි **වැටහෙන ආකාරය වේ.** මෙසේ මාර්ග චිත්තයෙහි උපදනා විතර්ක චෛතසිකය සම්මාසඞ්කප්ප නම්වූ නිර්වාණ මාර්ගාඞ්ගය වේ. මාර්ගඥානය පිණිස පිළිපන් යෝගාවචරයාගේ ගෝත්‍රභූ චිත්තය දක්වා උපදනා මහා කාමාවචර සිත්හි යෙදුනාවූ විතර්ක චෛතසිකය, සප්තකාම සුගතියට පමුණුවන මාර්ගයාගේ අඞ්ගයක් වන බැවින් සම්මාසඞ්කප්ප නම් සුගති මාර්ගාඞ්ගයක්ද වේ.

**3. සම්මාවාචා:** මෙසේ නිර්වාණ මාර්ගාඞ්ගවූ සම්මාදිට්ඨි සම්මා සඞ්කප්පයන්ගෙන් යුක්තවූ යෝගාවචරයාගේ ඒ හා සම්ප්‍රයුක්තවූ, මුසාවාද, පිසුණාවාච, ඵරුෂාවාච සම්ඵප්පලාප යන සතරවාග් දුශ්චරිතයන් ප්‍රහාණය කරමින් මිථ්‍යා වචනයෙන් වැළකීම **සම්මාවාචා** නම්. එය සම්ප්‍රයුක්ත ධර්මයන් මනාකොට නුවණින් ගැණීම **ලක්ෂණ** කොට

ඇත්තේය. මිථ්‍යා වචනයෙන් වෙන්වීම **කෘත්‍ය** කොට ඇත්තේය. මිථ්‍යා වචනයාගේ ප්‍රහාණය **වැටහෙන ආකාරය** වේ. මෙසේ මාර්ග සිත්හි උපදනා සම්මාවාචා නම් වූ විරති චෛතසිකය සම්මාවාචා නම්වූ නිර්වාණ මාර්ගාඞ්ගය නම් වේ. තිවන් මාර්ගය **පිණිස** පිළිපන් යෝගාවචරයාහට ගොත්‍රභූ සිත දක්වා උපදනා කාමාවචර මහා කුසල් සිත් අතුරෙන්, ශීලමය පුණ්‍ය ක්‍රියා වශයෙන් සතරවාග් දුශ්චරිතයෙන් වැළකීමේදී ඇතිවන සම්මාවාචා නම් වූ විරති චෛතසිකය **සම්මාවාචා** නම් වූ සුගති මාර්ගාඞ්ගය වන්නේය.

**4. සම්මාකම්මන්ත**. නිර්වාණ මාර්ගාඞ්ගවූ **සම්මාදිට්ඨි සම්මාසඞ්කප්ප සම්මාවාචා** යන්ගෙන් යුක්තවූ, යෝගාවචර යාගේ ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර යන ත්‍රිවිධ කාය දුශ්චරිත හෙවත් මිථ්‍යා කර්මාන්තය ප්‍රහාණය කරමින් උපදනා විරති චෛතසිකය **සම්මාකම්මන්ත** නම්. එය තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් මනාව නගා සිටුවීම **ලක්ෂණ** කොට ඇත්තේය. මිථ්‍යා කර්මාන්තයෙන් වැළකීම එහි **කෘත්‍ය** වේ. මිථ්‍යා කර්මාන්තය බැහැර කිරීම **වැටහෙන ආකාරය** වේ. මෙසේ මාර්ග චිත්තයෙහි විරති චෛතසිකය වශයෙන් උපදනා සම්මාකම්මන්ත චෛතසිකය **සම්මාකම්මන්ත** නම් වූ නිර්වාණ මාර්ගාඞ්ගයවේ. මාර්ග චිත්තයට පෙරටුව උපදනා ගොත්‍රභූ චිත්තය දක්වා පහළ වන්නාවූ මහා කුසල් සිත් අතුරෙන් ශීලමය පුණ්‍ය ක්‍රියාවක් වශයෙන් උපදින්නාවූද, කුසල් සිත්හි සම්ප්‍රයුක්තවූ ත්‍රිවිධ කාය දුශ්චරිතයන්ගෙන් වැළකීම නම් වූ, සම්මාකම්මන්ත නම් විරති චෛතසිකය, සම්මාකම්මන්ත සුගති මාර්ගාඞ්ගය නම් වේ.

**5. සම්මා ආජීවය**: සම්මාදිට්ඨි ආදිවූ මාර්ගාඞ්ගයන්ගෙන් යුක්තවූ යෝගාවචරයාගේ ඒ සම්මාවාචා සම්මා කම්මන්ත දෙදෙනාගේ විසුද්ධියවූ, ඒ හා සම්ප්‍රයුක්ත වූ, කුහන, ලපන, නෙමිත්තකතා, නිප්පෙසිකතා, ලාභෙන ලාභං නිජිගිංසන

තාදිය ප්‍රහාණය කරමින් මිථ්‍යා ආජීවයෙන් වෙන්වීම නම් වූ යම් විරති චෛතසිකයෙක් වේනම් එය **සම්මා ආජීව** නම් වේ එය සම්ප්‍රයුක්ත ධර්මයන් පිරිසිඳු කිරීම **ලක්ෂණ** කොට ඇත්තේය. මනා ආජීවයාගේ පැවැත්ම එහි **කෘත්‍යය** වේ. මිථ්‍යා ජීවිකාව ප්‍රහාණය කිරීම එහි **වැටහෙන ආකාරය** වේ. මෙසේ මාර්ග සිත්හි උපදනා සම්මා ආජීව නම් වූ විරති චෛතසිකය **සම්මා ආජීව** නම් නිර්වාණ මාර්ගාඞ්ගය වේ ගොත්‍රභූ චිත්තය දක්වා මහා කුසල් සිත් අතුරෙන් ශීලමය පුණ්‍ය ක්‍රියාවක් කරණ කාලයෙහි උපදින්නාවූ ද, සප්තවිධ කායවාග් දුශ්චරිතයෙන් වැළකී යහපත් ආජීවයක් ඇති කල්හි පහළවන්නාවූ මහා කුසල් සිත්හි සම්ප්‍රයුක්ත සම්මා ආජීව නම් විරති චෛතසිකය **සම්මා ආජීව** සුගති මාර්ගාඞ්ගය නම් වේ

**6. සම්මාවායාමය**: සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්පවශයෙන් ප්‍රඥාවෙන් යුක්තව, සම්මාවාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව සඞ්ඛ්‍යාත සීල භූමියෙහි පිහිටා සිටින්නහුගේ කුසීත බව සිඳින්නාවූද උපන් අකුසල් නැසීම ආදී වූ යම් සතර සම්‍යග් ප්‍රධන් වීර්‍ය්‍යී කෙනෙක් වේද එය සම්මා වායාමය නම් වේ. එය උත්සාහ කිරීම **ලක්ෂණ** කොට ඇත්තේය. නූපන් අකුසල් නො ඉපදීම, උපන් අකුසල් පහකිරීම, නූපන් කුසල් ඉපදවීම, උපන් කුසල් වර්ධනය කිරීම එහි **කෘත්‍යය** වේ. මිථ්‍යා ව්‍යායාමය පහකිරීම එහි **වැටහෙන ආකාරය** වේ. මෙසේ මාර්ග සිත්හි උපදනා වීර්‍ය්‍යී චෛතසිකය **සම්මාවායාම** නම් නිර්වාණ මාර්ගාඞ්ගයවේ. ගොත්‍රභූ සිත දක්වා ඒ යෝගාවචරයා හට උපදනා මහා කුසල් සිත්හි සම්ප්‍රයුක්ත වීර්‍ය්‍යී චෛතසිකය **සම්මාවායාම** නම්වූ සුගති මාර්ගාඞ්ගය නම් වේ.

**7 සම්මා සති**: මෙසේ ප්‍රඥා සීලාදීන්ගෙන් යුක්ත වූ සම්මාව්‍යායාමය ඇති යොගාවචරයාට කායානුපස්සනා වෙදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා ආදී වශයෙන් ඇතිවන්නාවූ ද, අසුභාදීන්හි සුභ ආදි වශයෙන්

වැටහෙන ස්වභාවය බැහැර **කරන්නාවූ** චිත්තයාගේ **නුමුලා** බව **සම්මාසති** නම්. එය ආලම්බනයාගේ යථා ස්වභාවය වැටහීම **ලක්ෂණ** කොට ඇත්තේය. නුමුලා බව එහි **කෘත්‍යය** වේ. මිථ්‍යා ස්මෘතිය ප්‍රහාණය **කිරීම** **වැටහෙන ආකාරය** වේ. මෙසේ මාර්ග සිත්හි සම්ප්‍රයුක්ත වූ සති චෛතසික තොමෝ **සම්මා සති** නම් වූ නිර්වාණ මාර්ගාඞ්ගය නම් වේ. ඒ යෝගාවචරයාහට උපදනා භාවනාමය මහා කුසල් සිත්හි සම්ප්‍රයුක්ත සති චෛතසිකය සම්මාසති නම් සුගති මාර්ගාඞ්ගය වේ.

8 **සම්මා සමාධි**: සම්මා දිට්ඨි ආදීවූ අඞ්ග සතකින් යුක්තවූ ඒ යෝගාවචරයාහට ඒ සම්මා සතිය හා සම්ප්‍රයුක්තවූ මිථ්‍යා සමාධිය නසන බලවත් වූ චිත්තෙකාග්‍රතාවය **සම්මා සමාධි** නම්. එය ප්‍රථම ධ්‍යාන ද්විතීයධ්‍යාන, තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යාන වශයෙන් චතුර්විධ වේ. සම්මා සමාධිය අවික්ෂෙපය **ලක්ෂණ** කොට ඇත්තේය. මනාව පිහිටීම එහි **කෘත්‍යය** වේ. මිථ්‍යා සමාධිය ප්‍රහාණය කිරීම එහි **වැටහෙන ආකාරය** වේ මෙසේ මාර්ග සිත්හි සම්ප්‍රයුක්තවූ එකග්ගතා චෛතසිකය **සම්මා සමාධි** නම් වූ නිර්වාණ මාර්ගාඞ්ගය වේ මාර්ගයෙහි පිළිපන් යෝගාවචරයාහට භාවනාමය පුණ්‍ය කර්මයක් වශයෙන් උපදනා මහා කුසල් සිත්හි සම්ප්‍රයුක්ත එකග්ගතා චෛතසිකය සම්මා සමාධි නම් වූ සුගති මාර්ගාඞ්ගය නම් වේ.

මේ සම්මාදිට්ඨි ආදීවූ නිර්වාණ මාර්ගාඞ්ග අට සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන සතර මාර්ගයෙන් ශුෂ්ක විදර්ශක යෝගාවචරයාහට හෝ ප්‍රථම ධ්‍යාන පාදක කර ගැනීම් ආදි වශයෙන් මාර්ගය ලබන්නාවූ සමථයානික යෝගාවචරයාහට හෝ නොඅඩුවම ලැබෙත්. විතීය ධ්‍යානය පටන් අවශෙෂ ධ්‍යානයන් පාදක කිරීම් ආදි වශයෙන් මාර්ගය ලබන සමථ යානික යෝගාවචරයාහට **සම්මා සඞ්කප්ප** නම්වූ මාර්ගාඞ්ගය නො ලැබෙන හෙයින් මාර්ගාඞ්ගයෝ සත් දෙනෙක් පමණක් ලැබෙත්. මෙසේ සෝවාන් ආදී

මාර්ගයන් ලබන යෝගාවචරයන්ගේ මාර්ගාඞ්ග අටදෙනා හෝ සත්දෙනා නිර්වාණ සඞ්ඛ්‍යාත එතරට ගමන් කරන්නාවූ නැවකට බඳු හෙයින් නිර්වාණ මාර්ගාඞ්ගයෝ යයි කියනු ලැබේ. ඒ ඒ පුණ්‍ය කර්මයන් සිදුකරන්නාවූ කාලයේදී උපදනා කාමාවචර මහා කුසල් සිත් අටෙහි, සම්මා දිට්ඨි ආදිවූ මාර්ගාඞ්ග අටෙන් යම් යම් අඞ්ගයෝ යෙදෙත්ද, එකල්හි එය සුගතියට පමුණුවන මාර්ගයාගේ අඞ්ග වන හෙයින් සුගති මාර්ගාඞ්ග නම් වෙත්. ඒ අට දෙනා අතුරෙන් **සම්මා වාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව** යන මාර්ගාඞ්ග තුන ශීලමය පුණ්‍ය ක්‍රියාවන්හි පමණක් ලැබේ.

ආජීව අට්ඨමක ශීලය සමාදන්ව පිළිපදනා කල්හි ප්‍රාණඝාත, අදත්තාදාන, කාම මිථ්‍යාචාර යන ත්‍රිවිධ කාය දුශ්චරිතයන්ගෙන් වෙන්වීමේදී **සම්මා කම්මන්ත** මාර්ගාඞ්ග යද මුසාවාද, පිසුණාවාච, ඵරුසාවාච, සම්ඵප්පලාප යන සතර වාග් දුශ්චරිතයන්ගෙන් වැළකීමේදී, **සම්මා වාචා** නම් මාර්ගාඞ්ගයද, සප්තවිධ කායවාග් දුශ්චරිතයන්ගෙන් වැළකී මිථ්‍යාජීවය පහකොට යහපත්ව දිවිපැවැත්වීමේදී සම්මා ආජීව නම් මාර්ගාඞ්ගයද ලැබෙති ශීලය හැර අන්‍ය වූ දානාදි කුසල් රැස්කරන කාලයෙහිදී, ඒ ඒ කුසල චිත්තයන්හි සුදුසු පරිද්දෙන් ඒ ඒ මාර්ගාඞ්ගයෝ හෙවත් ඉතිරි මාර්ගාඞ්ග පස වෙන් වෙන් වශයෙන් හෝ සමූහ වශයෙන් හෝ ලැබෙත් මාර්ගාඞ්ග අටම එකවර ලැබෙන්නේ ලොකෝත්තර සිත්හි පමණය.

රූපාවචර ප්‍රථම ධ්‍යාන චිත්තයෙහි **සම්මාදිට්ඨි, සම්මා-සඞ්කප්ප, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි** යන මාර්ගාඞ්ගයෝ පස්දෙනා ලැබෙත්. ද්විතියධ්‍යානය පටන් නෙව සඤ්ඤා නාසඤ්ඤායතන අරූප ධ්‍යානය දක්වා මහග්ගත චිත්තයන්හි **සම්මාසඞ්කප්පය** නොලැබේ. එහි යෙදෙන්නේ **සම්මාදිට්ඨි, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි යන** මාර්ගාඞ්ග සතර පමණය. මහග්ගත චිත්තයන්හි **සම්මාවාචා සම්මාකම්මන්ත, සම්මාආජීව** යන විරති සඞ්ඛ්‍යාත

මාර්ගාඞ්ගයෝ නොලැබෙත්. ඒ විරතිත්‍රය ලැබෙන්නේ ශීල විසුද්ධි අවස්ථාවේදීය. චිත්ත විසුද්ධි සඞ්ඛ්‍යාතවූ ධ්‍යාන අවස්ථාවේදී සමාධිය ප්‍රකට වේ.

පරමාර්ථ ධර්ම වශයෙන් ගත්කල්හි මේ මාර්ගාඞ්ග දොළොසෙහි, **ප්‍රඥා, විතර්ක, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මා ආජීව, සති, විරිය, ඒකග්ගතා, දිට්ඨි** යන චෛතසික නවය ලැබෙති. එයින් **දිට්ඨිය** ඒකාන්ත අකුසල ධර්මයකි. **ප්‍රඥා විරතිත්‍රය** සහ **සතිය** ඒකාන්ත කුසල ධර්මයෝයි. **විතක්ක විරිය ඒකග්ගතා** යන තුන අන්‍ය සමාන චෛතසික හෙවත් මිශ්‍රක ධර්මයෝයි.

## ඉන්ද්‍රිය ධර්ම

**ඉන්ද්‍රිය ධර්මයෝ** දෙවිස්සකි එනම්.

1. **චක්ඛු ඉන්ද්‍රිය**
2. **සෝත ඉන්ද්‍රිය**
3. **ඝාණ ඉන්ද්‍රිය**
4. **ජිව්හා ඉන්ද්‍රිය**
5. **කාය ඉන්ද්‍රිය**
6. **ඉත්ථි ඉන්ද්‍රිය**
7. **පුරුෂ ඉන්ද්‍රිය**
8. **ජීවිත ඉන්ද්‍රිය**
9. **මන ඉන්ද්‍රිය**
10. **සුඛ ඉන්ද්‍රිය**
11. **දුක්ඛ ඉන්ද්‍රිය**
12. **සෝමනස්ස ඉන්ද්‍රිය**
13. **දෝමනස්ස ඉන්ද්‍රිය**
14. **උපෙක්ඛා ඉන්ද්‍රිය**
15. **සද්ධා ඉන්ද්‍රිය**
16. **විරිය ඉන්ද්‍රිය**
17. **සති ඉන්ද්‍රිය**
18. **සමාධි ඉන්ද්‍රිය**
19. **පඤ්ඤා ඉන්ද්‍රිය**
20. **අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය**
21. **අඤ්ඤින්ද්‍රිය**
22. **අඤ්ඤාතාවින්ද්‍රිය**

කුසලාකුසල **කර්මයන්** කෙරෙහි කිසිවෙකුගේ ඊශ්වරත්වයක් නැති හෙයින් **කර්මයට ඉන්ද්‍ර** යන නාමය ව්‍යවහාර කෙරේ. ඒ ඊශ්වර භාවය හැඟවීම, දූත්වීම හෝ ප්‍රකාශ කිරීම **ඉන්ද්‍ර ලිඞ්ගය** නම් වේ. **චක්ඛු, සෝත, ඝාණ**

**ජිව්හා, කාය, මන** ආදීහු කුසලාකුසල කර්මය ඇතිබව ප්‍රකාශ කරන හෙයින් හෙවත් දන්වන හෙයින් ඒ ධර්මයන්ට **ඉන්ද්‍ර ලිඞ්ගාර්ථයෙන්, ඉන්ද්‍රියයෝ යි කියත්.**

එමෙන්ම ඒ ඉන්ද්‍ර නම්වූ කර්මය විසින් සකස් කරණලද, උපදවනලද, චක්ෂුරාදී ධර්මයන්ගේ ස්වභාවය හෝ කර්මය විසින් සකස් කරන ලද්දේය, උපදවන ලද්දේය යන අර්ථයෙන් හෙවත් **ඉන්ද්‍ර සුට්ඨාර්ථ** යෙන් ද **ඉන්ද්‍රියයෝ** නම් වෙත්.

තවද, චතුරාර්‍ය්‍යසත්‍යය අවිපරීතාකාරයෙන් අවබොධ කළාවූ ඉන්ද්‍ර නම් වූ පරමෙශ්වර වූ සර්වඥයන්වහන්සේ විසින් දෙශනා කළ **ධර්මයාගේ** ස්වභාවය හෝ **ඉන්ද්‍රදෙසිතාර්ථයෙන් ඉන්ද්‍රිය** නම් වේ.

එමෙන්ම ඉන්ද්‍ර නම් වූ ඒ භාග්‍යවතුන්වහන්සේ විසින් දක්නාලද හෙවත් **ඉන්ද්‍ර දිට්ඨාර්ථයෙන් ද ඉන්ද්‍රිය** නම් වේ.

එසේම, ඉන්ද්‍ර නම් වූ ඒ තථාගතයන්වහන්සේ විසින් සෙවිතාලද, ආසෙවිත නිසෙවිත ධර්මයාගේ ස්වභාවය හෝ **ඉන්ද්‍රජුට්ඨාර්ථයෙන්** ඉන්ද්‍රිය නම් වේ.

තවද, අධිපති භාවය සඞ්ඛ්‍යාතවූ තොහොත් ඉන්ද්‍රිය ප්‍රත්‍යභාවය යයි කියනලද ඊශ්වරාර්ථය ප්‍රකාශ කරන හෙයින් ද මේ චක්ෂුරාදි ධර්මයන්ට ඉන්ද්‍රියයෝ යි කියති.

චක්ෂුරාදී වූ මේ ඉන්ද්‍රිය ධර්මයෝ ඇති තන්හි ඒ ඒ කෘත්‍යයන්හි අධිපති භාවය ප්‍රකාශ කරන්නේය චක්ෂුප්‍රසාදදීන් තීක්ෂණ වූ කල චක්ෂුර්විඥානාදිය ප්‍රසන්න වන්නේත්, එය දුර්වල වූ කල අප්‍රසන්න වන්නේත් මේ ඊශ්වරත්වය බලපවත්නා හැටියටය. මෙසේ ඊශ්වර භාවය හෙවත් පරමාධිපති භාවය කරන ධර්මයෝ දෙවිස්සක් පමණක් ඇති හෙයින් දෙවිසි ඉන්ද්‍රියයන් මෙසේ පිළිවෙළින් දෙශනා කළ සේක.

**1. චක්ඛු ඉන්ද්‍රිය** - දර්ශන කෘත්‍යයෙහිදී චක්ඛු දසක කලාපයෙහි ඇතුළත්වූ පඨවි, ආපො, තෙජෝ, වායො, වර්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිත යන රූපයෝ නවදෙනා චක්ෂු ප්‍රසාද රූපයට අනුව පවත්නා හෙයින්, හෙවත් ඒ රූපයන් නවදෙනා කෙරෙහි චක්ෂුප්‍රසාදය අධිපති භාවය සිද්ධ කරන හෙයින් එයට චක්ෂුරෙන්ද්‍රිය යයි කියති. චක්ඛු විඤ්ඤාණ නම් වූ විපාක සිත ඉපදීමේදී ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් උපකාරවන හෙයින් හෙවත් තමාගේ ආකාරයට පමුණුවන සවභාවය ඇති හෙයින්ද චක්ෂුරින්ද්‍රිය නම් වේ.

භූමි වශයෙන් කාමාවචර භූමියට ඇතුළත් මේ චක්ෂුරේන්ද්‍රිය ය, සෙසු ඉන්ද්‍රියයනට වඩා විදර්ශනාව පිණිස, අධ්‍යාත්ම ධර්මයක් වශයෙන් මූලික වන හෙයින් චක්ෂුරින්ද්‍රියය පළමුකොට දෙශනා කළ බව දතයුතු.

ද්වාර වශයෙන් සලකන කල්හි, යම් යම් සවභාවයක් තෙමේ චක්ෂුද්වාරයෙහි ද අධිපති බව කරවයි ද, චක්ෂුද්වාර සවභාවයෙන් ඒ චක්ෂුද්වාරයෙහි හටගත්තාවූ චිත්ත චෛතසික යන් රූපාලම්බනයන් ගැනීමේදී තමා කෙරෙහි අනුව පවත්වයිද ඒ ද්වාරයෙහි හටගත්තාවූ චිත්ත චෛතසිකයෝ තුමූ ඒ චක්ෂුරින්ද්‍රියට අනුව පවතිත්ද, එහෙයින්ද, එයට චක්ෂුරින්ද්‍රිය යයි කියනු ලැබේ.

සොතින්ද්‍රිය ආදීවූ අනිකුත් ඉන්ද්‍රියයෝද මේ ක්‍රමයෙන්ම දත යුතුය.

**2. සොත ඉන්ද්‍රිය** - නම් සොතප්‍රසාදයයි. ශ්‍රවණ-කෘත්‍යයෙහිදී හෙවත් ශබ්දශ්‍රවණයෙහිදී සොතවිඤ්ඤාණ-යන්ට ඉන්ද්‍රිය ප්‍රත්‍ය භාවය හෙවත් පරමාධිපති භාවය සිද්ධ කරන හෙයින් සොතින්ද්‍රිය නම් වේ. කාමාවචර භූමියට අයත් මේ සොතින්ද්‍රිය, ඉන්ද්‍රිය ධර්මයන් අතුරෙන් දෙවෙනිකොට දක්වන ලද්දේ චක්ඛුන්ද්‍රිය හැරුණුවිට සොතින්ද්‍රිය විදර්ශනාවට අන්‍ය ධර්මයන්ට වඩා ප්‍රධාන වන හෙයිනි.

3. **ඝාණ ඉන්ද්‍රිය** - නම් ඝාණප්‍රසාදය යි. **ආඝ්‍රාණය කෘත්‍යයෙහිදී** හෙවත් ගඳ සුවඳ දැනගැනීමේදී ඝාණ-විඤ්ඤාණයන්ට ඉන්ද්‍රිය භාවය හෙවත් පරමාධිපති භාවය සිද්ධ කරන හෙයින් **ඝාණින්ද්‍රිය** නම් වේ. මෙයද කාමාවචර ය.

4. **ජිව්හා ඉන්ද්‍රිය** නම් ජිව්හා ප්‍රසාදයයි. එය **සායන කෘත්‍යයෙහිදී** හෙවත් රස විඳීමේදී ජිව්හා විඤ්ඤාණයන්ට ඉන්ද්‍රිය භාවය හෙවත් පරමාධිපති භාවය සිද්ධ කරන හෙයින් **ජිව්හින්ද්‍රිය** නම් වේ. මෙයද කාමාවචරය.

5. **කාය ඉන්ද්‍රිය** නම් **කායප්‍රසාදයයි**. ඵුසන කෘත්‍යය හෙවත් ස්පර්ශ කිරීමේදී කාය විඤ්ඤාණයන්ට ඉන්ද්‍රිය භාවය හෙවත් පරමාධිපති භාවය සිද්ධ කරන හෙයින් **කායින්ද්‍රිය** නම් වේ. මෙයද කාමාවචරය.

සත්ත්වයන්ගේ රූප කාය පිළිබඳවූද, ප්‍රකටවූද අධ්‍යාත්ම ආයතනයන් ආත්ම දෘෂ්ටි ආදි වශයෙන් ගැනීමෙන් අනර්ථය සිදුවන බැවින්ද, විදර්ශනා වැඩීමට මේ ප්‍රසාද ඉන්ද්‍රිය පස උපකාර වන බැවින්ද, මේ පිළිවෙලින් චක්ඛුන්ද්‍රිය ආදිකොට ඇති මේ ඉන්ද්‍රිය පස පළමුකොට දේශනා කරණ ලදි. එයට අනතුරුව ස්ත්‍රීය, පුරුෂයාය යන ව්‍යවහාරයට හෙතු වන්නාවූ භාව ඉන්ද්‍රියවය හෙවත් **ඉත්ථින්ද්‍රිය** සහ **පුරුෂින්ද්‍රිය** ද දක්වා වදාළ සේක.

6. **ඉත්ථි ඉන්ද්‍රිය** - යනු ස්ත්‍රී භාව රූපයයි. කම්ම, චිත්ත සෘතු ආහාර යන සතර ප්‍රත්‍යයෙන්ම උපදවනලද රූපයන්ට හෙවත් මුළු පඤ්චසකන්ධයටමත් ප්‍රවෘත්ති කාලයෙහිදී, **ස්ත්‍රී ලිඞ්ග, ස්ත්‍රී නිමිත්ත, ස්ත්‍රී කුත්ත, ස්ත්‍රී ආකල්ප** ආදි වශයෙන් ස්ත්‍රී ආකාරය පහළ කරවීමෙහිදී හෙවත් එකී ස්ත්‍රී ආකාර රචනා කිරීමේදී ඉන්ද්‍රිය භාවය හෙවත් පරමාධිපති භාවය සිද්ධකරන හෙයින් **ඉත්ථින්ද්‍රිය** නම්

වේ. **ස්ත්‍රී ලිඞ්ග** යනු ස්ත්‍රී යයි හැඳිනීමට හැකි ආකාරයයි **ස්ත්‍රී නිමිත්ත** නම් ඔවුන්ගේ පයෝධරාදි අවයවයෝ යි **ස්ත්‍රී කුත්ත** නම් බාල කල සිටම මැහුම් ගෙතුම් ආදියෙන් හා හැලිවලන් ආදියෙන් ක්‍රීඩා කිරීම් ආදිවූ ක්‍රියාවෝ යි **ස්ත්‍රී ආකල්ප** නම් ඇගේ ගමනාදි ආකාරයෝ යි.

ප්‍රතිසන්ධික්ෂණයේදී පහළවන්නාවූ කාය දසක, භාව දසක, වත්‍ථු දසක යන ත්‍රිවිධ කර්මජ රූපකලාපයන්ට අයත් භාවදසක කලාපයෙහි ස්ත්‍රී භාවරූපය පහළවූයේ නම්, ඇය පිළිබඳවූ චතුසමුට්ඨානික රූපකලාප සමූහයම උපදවන්නේ ස්ත්‍රී ආකාරාදියෙන් යුක්තවමය. මෙසේ වන්නේ **ඉත්ථින්ද්‍රිය** ඒ ඒ රූපයන් කෙරෙහි පරමාධිපතිභාවය සිද්ධ **කරන** හෙයිනි.

7. **පුරුෂ ඉන්ද්‍රිය** යනු පුරුෂ භාව රූපයයි කර්මදි චතුසමුට්ඨානික රූපයනට හෝ මූළු පඤ්ච සකන්ධයටම හෝ ප්‍රවෘත්ති කාලයේදී **පුරුෂ ලිඞ්ග, පුරුෂ නිමිත්ත, පුරුෂ කුත්ත** පුරුෂ ආකල්පාදි වශයෙන් පුරුෂ ආකාර දක්වීමේදී හෙවත් රචනා කිරීමේදී ඉන්ද්‍රිය භාවය හෙවත් පරමාධිපති භාවය සිද්ධ කරන හෙයින් **පුරිස ඉන්ද්‍රිය** නම් වේ. ප්‍රතිසන්ධික්ෂණයේදී භාව දසක කලාපයට ඇතුළත්ව පුරුෂ භාව රූපය පහළවූයේ නම්, ප්‍රවෘත්ති කාලයේදී ඔහු පිළිබඳ වූ චතුසමුට්ඨානික රූපයෝ පුරුෂාකාරාදියෙන් යුක්තවම උපදී. මේ කාරණයෙන් මෙතෙමේ පුරුෂයකැයි හැඳිනීමට හැකිවේ. මේ භාවඉන්ද්‍රිය දෙකම කාමාවචරය.

මෙසේ ප්‍රසාද ඉන්ද්‍රිය පසද, එයට අනතුරුව භාව රූප දෙක කරණ කොට ගෙණ සත්ත්වයන් ස්ත්‍රී පුරුෂාදි වශයෙන් බෙදගෙන අනුරාගාදි චේතනා පහළ කරගනිමින් නොමග යා හැකි බැවින්, භාවින්ද්‍රියවයද දක්වා, මේ භාව ඉන්ද්‍රියයන් දෙදෙනා ජීවිතෙන්ද්‍රියය ප්‍රතිබද්ධවම හට ගන්නා බැව් දක්වනු පිණිස එයට අනතුරුව ජීවිතෙන්ද්‍රිය දක්වා වදළ බැව් දතයුතු.

8. **ජීවිතෙන්ද්‍රියය**: සත්ත්වයා ජීව සංඥාව ලබන්නාවූද නාම රූප වශයෙන් විභේදයක් ඇති, සහජාත නාමරූප ධර්මයන්ගේ පරිපාලන කෘත්‍යයෙහිදී ඉන්ද්‍රිය භාවය හෙවත් පරමාධිපති භාවය සිද්ධ කරන්නාවූ යම් ධර්මයක් වේනම් එයට **ජීවිතෙන්ද්‍රිය** යයි කියනු ලැබේ. **නාමජීවිතෙන්ද්‍රියය** යනු සියලුම චිත්තයන්හි සම්ප්‍රයුක්තවූ සබ්බචිත්ත සාධාරණ චෛතසිකයක් වූ **ජීවිතෙන්ද්‍රිය චෛතසිකයයි**. **රූප ජීවිතෙන්ද්‍රිය** යනු කර්මජ රූප කලාපයන්ට ඇතුලත්ව, සහජාත රූපයන් පාලනය කිරීමෙහි සමත් **ජීවිතෙන්ද්‍රිය රූපයයි**. මේ දෙ දනා කරණකොටගෙන නාමරූප ධර්මයෝ ජීවත් වෙත්. එය නැති කල්හි ජීවත්වීමක් නොවන්නේය. **නාම** ජීවිතෙන්ද්‍රියය චාතුර්භූමිකය.

9. **මනින්ද්‍රිය** නම් චිත්තයයි. එය විජානන කෘත්‍ය-යෙහිදී හෙවත් අරමුණු දැනීම් කෘත්‍යයෙහිදී සහජාත ධර්මයන් කෙරෙහි ඉන්ද්‍රිය භාවය හෙවත් ඊශ්වර භාවය සිද්ධකරන හෙයින් මනින්ද්‍රිය නම් වන්නේය. චාතුර්භූමිකවූ මේ මනින්ද්‍රය ය ඇති සැටියෙන් නොදත් බැව් හෙතු කොටගෙන ආත්ම දෘෂ්ටි ගෙන අනර්ථය සිද්ධකරගන්නා හෙයින් රූප ජීවිතින්ද්‍රියට අනතුරුව නාම ඉන්ද්‍රියයන් අතුරෙන් මනින්ද්‍රියය පළමුකොට දක්වන ලදි.

10. **සුඛින්ද්‍රිය** කුසල විපාක සුඛ සහගත කාය-විඤ්ඤාණයෙහි සම්ප්‍රයුක්ත සුඛ වේදනා තොමෝ **සුඛින්ද්‍රිය** නම්වේ. කාය ස්පර්ශවූ ඉෂ්ටාරම්මණයෙහි මිහිරි රසය අනුභව කිරීමේදී තමා හා එක්ව යෙදුනා වූ හෙවත් සහජාත ධර්මයන් කෙරෙහි ඉන්ද්‍රිය භාවය හෙවත් ඊශ්වර භාවය සිද්ධ කරන හෙයින් **සුඛින්ද්‍රිය** නම් වේ. මෙයද කාමාවචරය.

11. **දුක්ඛින්ද්‍රිය** අකුසල විපාක දුක්ඛ සහගත කාය විඤ්ඤාණයෙහි සම්ප්‍රයුක්ත දුක්ඛ වේදනා තොමෝ **දුක්ඛින්ද්‍රිය** නම් වේ. කාය ස්පර්ශවූ අනිෂ්ටාරම්මණයෙහි කටුක රසය අනුභව කිරීමේදී සහජාත ධර්මයන් කෙරෙහි ඉන්ද්‍රිය භාවය හෙවත් ඊශ්වරභාවය සිද්ධ කරන හෙයින් දුක්ඛින්ද්‍රිය නම් වේ. මෙයද කාමාවචරය.

**12. සොමනස්සින්ද්‍රිය** දෙසැටක් සොම්නස් සහගත සිත්හි සම්ප්‍රයුක්ත සොම්නස් වේදනා තුමූ **සොමනස්සින්ද්‍රිය** නම් වේ. සිතට හමු වූ ඉෂ්ටාරම්මණයෙහි මිහිරි රසය අනුභව කිරීමේදී සහජාත ධර්මයන් කෙරෙහි ඉන්ද්‍රිය භාවය හෙවත් ඊශ්වර භාවය සිද්ධ කරන හෙයින් **සොමනස්සින්ද්‍රිය** යයි කියනු ලැබේ මෙය **කාම, රූප, ලොකොත්තර** යන භූමිත්‍රයට ඇතුළත් ය.

**13. දොමනස්සින්ද්‍රිය** දොම්නස් සහගත අකුසල් සිත් දෙකෙහි සම්ප්‍රයුක්ත වේදනා තොමෝ **දොමනස්සින්ද්‍රිය** නම් වේ. ඒ සිතට හමුවන අනිෂ්ටාරම්මණයෙහි අමිහිරි රසය අනුභව කිරීමේදී සහජාත ධර්මයන් කෙරෙහි ඉන්ද්‍රිය භාවය ඊශ්වර භාවය සිද්ධ කරන හෙයින් **දොමනස්සින්ද්‍රිය** නම් වන්නේය. මෙයද **කාමාවචරය**.

**14. උපෙක්ඛින්ද්‍රිය** පස්පනස් උපෙක්ෂා සහගත සිත්හි සම්ප්‍රයුක්ත වේදනා තොමෝ **උපෙක්ඛින්ද්‍රිය** නම් වේ සිතට හමුවූ මධ්‍යස්ථාරම්මණයෙහි මිහිරිද නොවූ අමිහිරිද නොවූ රසය අනුභව කිරීමේදී සහජාත ධර්මයන් කෙරෙහි ඉන්ද්‍රිය භාවය හෙවත් ඊශ්වර භාවය සිද්ධ කරන හෙයින් **උපෙක්ඛින්ද්‍රිය** නම් වේ මෙය චතුර් භූමිකය.

සුඛින්ද්‍රිය ආදිකොට ඇති මේ ඉන්ද්‍රිය ධර්ම පස ආරම්මණ රසානුභවයෙහිදී සහජාත ධර්මයන්ට පරමාධිපතිභාවය සිද්ධ කරත්. ඒ පසම එකම වේදනා චෛතසිකය වේ.

ජීවිතෙන්ද්‍රිය පවත්නාතෙක්ම වේදනාව පවත්නා හෙයින්ද, ඒ සියලු වේදනාවෝ දුක් බව හැඟවීම පිණිසත්, ජීවිතෙන්ද්‍රියයට අනතුරුව සුඛින්ද්‍රියාදී වේදනා පඤ්චකය වදාළහ.

ඉක්බිතිව, ඒ වේදනා ඉන්ද්‍රියයන්ගේ නිරුද්ධ කිරීම පිණිස වැඩිය යුතු ප්‍රතිපත්ති ධර්මයන් දක්වනු සඳහා වේදනා ඉන්ද්‍රියයන්ට අනතුරුව ශ්‍රද්ධාදී පඤ්චෙන්ද්‍රියයෝ දක්වන ලදී.

**15. ශ්‍රද්ධා ඉන්ද්‍රිය** යනු සෝභන සාධාරණ ශ්‍රද්ධා චෛතසිකයයි අශ්‍රද්ධාව නම් වූ ප්‍රතිපක්ෂ ධර්මය මැඩ පැවැත්වීමේදී හා සම්ප්‍රයුක්ත ධර්මයන් ශාන්ත ආකාරාදියට පැමිණවීම නොහොත් බුද්ධාදි අරමුණු ඇදහීමේදී සහජාත ධර්මයන් කෙරෙහි ඉන්ද්‍රිය භාවය හෙවත් පරමාධිපතිභාවය සිද්ධ කරන හෙයින් **සද්ධින්ද්‍රිය** නම් වේ,

**16. විරියින්ද්‍රිය** යනු වීර්‍ය්‍ය චෛතසිකයයි. කටයුත්තෙහි මැලි බව දුරුකොට නොපසුබට කරවීමේ කෘත්‍යයෙහිදී හෙවත් **උපසත්ථම්භක** බවට පැමිණවීමේ දී සහජාත ධර්මයන්ට ඉන්ද්‍රිය භාවය හෙවත් ඊශ්වර භාවය **සිද්ධකරන** හෙයින් **විරියින්ද්‍රිය නම්** වේ.

**17. සතින්ද්‍රිය** යනු සති චෛතසිකය වේ. අරමුණු වටහා ගැණීමේදී හෙවත් සිහිකිරීමේදී සිත ආරක්ෂාකොට ගෙන, සහජාත ධර්මයන්ටද ඊශ්වර භාවය සිද්ධ කරන හෙයින් **සතින්ද්‍රිය** නාම වේ.

**18. සමාධින්ද්‍රිය** යනු එකග්ගතා චෛතසිකයයි. අරමුණෙහි සිත සමව හා මනාව පිහිටුවීමට හෙවත් නන් අරමුණෙහි විසිරයානොදී මොනවට පිහිටි ආකාරයට සිත් පවත්වා ගැනීමේදී සහජාත ධර්මයන්ට ඉන්ද්‍රිය භාවය සිද්ධ කරන හෙයින් **සමාධින්ද්‍රිය නම් වේ.**

**19. පඤ්ඤින්ද්‍රිය** නම් අමෝහ චෛතසිකයයි. ඒ ඒ වස්තූන් පිළිබඳවූ විශෙෂ ලක්ෂණ හා අනිත්‍යාදීවූ සාමාන්‍ය ලක්ෂණ පිළිබඳ දැනීම ඇතිකරන්නාවූ මේ ප්‍රඥාව, අසම්මෝහ නම්වූ නුමුළා බව සිද්ධ කිරීමේදී සහජාත ධර්මයන්ට ඊශ්වර භාවය දක්වන හෙයින් **පඤ්ඤින්ද්‍රිය** නාම වේ.

**සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා** යන මේ පඤ්චේන්ද්‍රියයෝ චාතුර් භූමිකයෝයි.

මෙසේ ප්‍රතිපත්ති දක්වා ඒ ප්‍රතිපත්තිය නොසිස් බව දක්වනු සඳහා අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය ආදී ඉන්ද්‍රියයෝ තුන් දෙනා අවසාන වශයෙන් දක්වන ලදී.

**20. අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය.** මෙය සෝවාන් මාර්ග සිතෙහි යෙදෙන ප්‍රඥාවයි. **ඒ** ප්‍රඥාව අනාදිමත් සංසාරයෙහි පෙර කිසි කලෙක නොදක්නාලද සිව්සස් හා අසඞ්ඛත ධාතු සඞ්ඛ්‍යාත වූ **නිර්වාණ** ධර්මයද, පළමුකොට දක්නා හෙයින්ද, මාර්ග චිත්තයෙහි යෙදුනා වූ සත්තිස් බොධි පාක්ෂික ධර්මයන්ට ඊශ්වර භාවය සිද්ධ කරන හෙයින්ද, **අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය** නම් වන්නේය. සක්කාය දිට්ඨි ආදි ත්‍රිවිධ සංයොජනයන් ප්‍රහාණය කිරීම හා සම්ප්‍රයුක්ත ධර්මයන් ඒ ප්‍රහාණයට අභිමුඛ කිරීම, **අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය** යාගේ කෘත්‍යය වේ.

**21. අඤ්ඤින්ද්‍රිය** යනු සෝවාන් ඵල චිත්තය, සකෘදාගාමි මාර්ග චිත්තය, සකෘදාගාමි ඵල චිත්තය, අනාගාමි මාර්ග චිත්තය, අනාගාමි ඵල චිත්තය අර්හත් මාර්ග චිත්තය යන ලොකොත්තර සිත් සයෙහි යෙදෙන ප්‍රඥාවට නමෙකි. ප්‍රථම මාර්ගයෙන් දක්නාලද චතුරාර්ය සත්‍යය හා නිර්වාණයද, මේ සිත් සයෙහි යෙදෙන ප්‍රඥාව විසින් හාත්පසින්ම දක්නා හෙයින් ද ඒ චිත්තයන්හි යෙදුනාවූ සත්තිස් බොධි පාක්ෂික ධර්මයන්ට ඊශ්වර භාවය සිද්ධ කරන හෙයින්ද **අඤ්ඤින්ද්‍රිය** නම් වේ. **කාමරාග**, ව්‍යාපාදාදි, සංයෝජනයන්ගේ තුනී කිරීමද, ප්‍රහාණය කිරීමද, සහජාත ධර්මයන් තමාගේ වශයෙහි පැවැත්වීමද, මාර්ග සම්ප්‍රයුක්ත අඤ්ඤින්ද්‍රිය යාගේ කෘත්‍යය වේ. ඵලසිත්හි සම්ප්‍රයුක්ත අඤ්ඤින්ද්‍රිය ඒ ඒ සංයොජනයන් පටිප්පස්සද්ධි වශයෙන් ප්‍රහාණය කිරීම කෘත්‍ය කොට ඇත්තේය.

22. **අඤ්ඤාතාවින්ද්‍රිය** යනු අර්හත් ඵල චිත්තයෙහි යෙදුනාවූ ප්‍රඥා චෛතසිකයයි. චතුරාර්ය සත්‍යය හා නිර්වාණය දැනීමේ අවසානයට පැමිණි හෙයින් රහතන් වහන්සේට **අඤ්ඤාතාවී** යයි කියති: ඒ රහතන් වහන්සේ පිළිබඳවූ ඉන්ද්‍රියයට **අඤ්ඤාතාවින්ද්‍රිය** යයි කියනු ලැබේ. මේ **අඤ්ඤාතාවින්ද්‍රිය** ය, **පරිඤ්ඤෙය්‍ය, පහාතබ්බ**, භාවෙතබ්බ, **සච්ඡිකාතබ්බ** ධර්මයන් **පරිඤ්ඤාණ, පහාණ**, භාවනා,

**සාක්ෂාත්කරණ** වශයෙන් සියලු කෘත්‍යයන් කොට නිමවා, නිර්වාණාභිමුඛවීම හා සහජාත ධර්මයන්ගේ නිර්වාණාභිමුඛ භාවයට ප්‍රත්‍යය වීමද කෘත්‍ය කොට ඇත්තේය.

මෙසේ අවසාන වශයෙන් දක්වනලද ලෝකෝත්තර ප්‍රඥ නම්වූ **අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවින්ද්‍රිය** යන තුන්දෙනා ලෝකෝත්තර භූමියටම ඇතුළත් වේ.

## බල ධර්ම

තමාගේ පක්ෂයට අයත් අන්‍ය ධර්මයන්ගේ අධිපති භාවය නොවළක්වා, තමන්ට විරුද්ධව නැග එන්නාවූ ප්‍රතිපක්ෂ ධර්මයන් මැඩලන්නාවූද, විරුද්ධ ධර්මයන් විසින් මැඩලිය නොහැකිවූද, සම්ප්‍රයුක්ත ධර්මයන් කෙරෙහි ස්ථිරභාවයෙන් පවත්නාවූද ධර්මයන්ට **බල ධර්මයෝ** යයි කියනු ලැබේ. එබඳු **බල ධර්ම** නවයකි. එනම්:-

1. සද්ධා බලය
2. විරිය බලය
3. සති බලය
4. සමාධි බලය
5. පඤ්ඤා බලය
6. හිරි බලය
7. ඔත්තප්ප බලය
8. අහිරික බලය
9. අනොත්තප්ප බලය

**සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා, හිරි, ඔත්තප්ප, අහිරික, අනොත්තප්ප** යන මේ ධර්මයෝ නවදෙනා **වීර්‍ය්‍යය** පශ්චිම්කොට ඇති කල්හිම **බල ධර්ම** බවට පැමිණෙත්. වීර්‍ය්‍ය චෛතසිකය නොයෙදෙන සිත්හි පහළවන මේ ධර්මයන්ට බල ධර්ම යයි නොකියති. එබැවින් විරිය නැති දෙපස් විඤ්ඤාණ, මනොධාතු ත්‍රිකය සහ සන්තීරණ ත්‍රිකය යන සොළොස් චිත්තයන්හි යෙදෙන එකග්ගතාවට සමාධි බලය යයි නොකියනු ලැබේ

1. **සද්ධා බලය**- සොභන සාධාරණ චෛතසිකයක්වූ හෙවත් සූවිසි කාමාවචර සොභන සිත්ය, සත්විසි මහග්ගත සිත්ය, ලෝකෝත්තර සිත් අටය යන සොභන සිත් හා සම්ප්‍රයුක්තවූ සද්ධා චෛතසිකය, ශක්තිසම්පන්නව යෙදුන කල්හි එයට ප්‍රතිපක්ෂවූ අශ්‍රද්ධාව නැසීමට හෙවත් මැඩලීමට ශක්තිය ඇති හෙයින් **ශ්‍රද්ධා බලය** නම් වන්නේය. මේ ශ්‍රද්ධා බලය ඒ සිතෙහිම යෙදුනාවූ විරිය, සති, සමාධි, පඤ්ඤා, හිරි, ඔත්තප්පාදී වූ අන්කුත් බල සමුදායගේ බලය නොවළක්වා තමාට සතුරුව නැග එන්නාවූ අශ්‍රද්ධාව පමණක් මැඩලීමෙහි යෙදෙන්නේ වේ මේ ශ්‍රද්ධාව කුසල පක්ෂයට අයත් බල ධර්මයකි.

2. **විරිය බලය**- යනු දෙපනස් චෛතසිකයන අතුරෙන් අඤ්ඤසමාන **විරිය චෛතසික** යයි. එබැවින් කුසලාකුසල අව්‍යාකෘත සිත්හි සුදුසු පරිද්දෙන් යෙදෙන්-නේය. ශක්ති සම්පන්නව බලවත් බවට පැමිණි මේ වීර්‍ය්‍යය, කුසීත බව නම්වූ ප්‍රතිපක්ෂ ධර්මය මැඩලීමට සමත් හෙයින් එයට **වීර්‍ය්‍ය බලය** යයි කියනු ලැබේ. දෙපස් විඤ්ඤාණ, මනොධාතු ත්‍රිකය, සන්තීරණ ත්‍රිකය යන සොළොස් චිත්තයන්හි මේ වීර්‍ය්‍යය නොයෙදෙන බව සැළකිය යුතුයි.

3. **සති බලය**- යනු සියලු සොභන සිත්හි යෙදෙන සති චෛතසික යයි. මේ සති චෛතසිකය ශක්තිසම්පන්නව බලවත් බවට පැමිණි කල්හි සතියට ප්‍රතිපක්ෂවූ සිහි මුලාව හෙවත් මුට්ඨස්සතිය මැඩලීමට සමත් හෙයින් එයට **සති බලය** යයි කියනු ලැබේ.

4. **සමාධි බලය**- යනු එකග්ගතා චෛතසික යයි. මේ එකග්ගතා චෛතසිකය බලවත් බවට පැමිණි කල්හි එයට ප්‍රතිපක්ෂවූ උද්ධච්චය නම් වූ නොසන්සුන් බව මැඩලීමට ශක්ති ඇති හෙයින් එයට **සමාධි බලය** යයි කියති. දෙපස් විඤ්ඤාණ, මනොධාතු ත්‍රිකය, සන්තීරණ ත්‍රිකය යන සොළොස් අහෙතුක චිත්තයන්හිද එකග්ගතාව

යෙදෙත්තේවී නමුත් ඒ සොළොස් චිත්තයන්හි වීර්‍ය්‍ය චෛතසිකය නොයෙදෙන බැවින් ඒ එකග්ගතාවට **සමාධි බලය** යයි **නො** කියනු ලැබේ.

5. **පඤ්ඤා බලය** – යනු අමොහය හෙවත් **පඤ්ඤින්ද්‍රිය** නම් වූ සොභන චෛතසිකයයි. ඤාණ සම්ප්‍රයුක්ත කාම සොභන සිත්හිද, මහග්ගත ලොකොත්තර සිත්හිද, යෙදෙන්නාවූ මේ ප්‍රඥාව, බලවත්වූ කල්හි, අවිද්‍යාව නම්වූ ප්‍රතිපක්ෂ ධර්මය මැඩලීමට සමත් හෙයින් **පඤ්ඤා බලය යයි** කියනු ලැබේ.

6. **හිරි බලය** – යනු සොභන සාධාරණ හිරි චෛතසික යයි එය බලවත් වූ කල්හි අහිරිකය හෙවත් පාපයට පිළිකුල් නොකරණ බව නම් වූ ප්‍රතිපක්ෂ ධර්මය මැඩලීමට සමත් හෙයින් **හිරි බලය** යයි කියනු ලැබ්.

7 **ඔත්තප්ප බලය** – සොභන සාධාරණ චෛතසිකයක් වූ ඔත්තප්පය ද බලවත් බවට පැමිණි කල්හි අනොත්තප්පය හෙවත් පාපයට බිය නැති බව නම් වූ ප්‍රතිපක්ෂ ධර්මය මැඩලීමට සමත් හෙයින් **ඔත්තප්ප බලය** නම් වන්නේය

8. **අහිරික බලය** – දොළොස් අකුසල් සිත්හි යෙදෙන අහිරිකය නම්වූ අකුසල චෛතසිකය බලවත්වූ කල්හි හිරිය නම්වූ ප්‍රතිපක්ෂ ධර්මය මැඩලීමට සමත් හෙයින් එයට අහිරික බලය යයි කියනු ලැබේ.

9. **අනොත්තප්ප බලය** – දොළොස් අකුසල් සිත්හි යෙදෙන අනොත්තප්පය නම් වූ අකුසල සාධාරණ චෛතසිකය බලවත්වූ කල්හි ඔත්තප්පය නම්වූ ප්‍රතිපක්ෂ ධර්මය මැඩලීමට සමත් හෙයින් **අනොත්තප්ප බලය** නම් වේ.

## අධිපති ධර්ම

යම් ධර්මයකෙනෙක් සම්ප්‍රයුක්ත ධර්මයන් කෙරෙහි පරමාධිපති භාවය හෙවත් පරමෛශ්වර භාවය **දක්වත්තේද** ඒ ධර්මයට **අධිපති ධර්මය** යයි කියනු ලැබේ. ඉන්ද්‍රිය ධර්මයෝ

වනාහි තමතමන්ට අයත් කෘත්‍යයන්හි පමණක් සම්ප්‍රයුක්ත ධර්මයන් කෙරෙහි ඊශ්වර භාවය සිද්ධ කරන්නේය. අන්‍ය ධර්මයන්ගේ ඊශ්වර භාවය නොවළක්වයි. අධිපති ධර්මයෝ එසේ නොව අන්‍යවූ අධිපතීන්ගේද ඊශ්වර භාවය වළක්වා තෙමේම පරමේශ්වර භාවය සිද්ධ කරන්නේය එහෙයින් අධිපති ධර්මයෝ ඉන්ද්‍රිය ධර්මයන්ට වඩා ශක්තිසම්පන්නය. අධිපති ධර්ම කීපයක් එකම චිත්තයෙහි යෙදුන කල්හි එයින් එක් ධර්මයක් පමණක් අධිපති වෙයි. අවශෙෂ ධර්මයෝ ඒ ධර්මයට යටත්ව සිටිත්.

**අධිපති ධර්මයෝ** සතර දෙනෙකි. එනම්:–

| | |
|---|---|
| 1. ඡන්දාධිපති | 3. විරියාධිපති |
| 2. චිත්තාධිපති | 4. විමංසාධිපති |

1. **ඡන්දාධිපති** - යනු ඡන්ද චෛතසික යයි ඡන්දය නොයෙදෙන මොහමූල අකුසල් සිත් දෙකය, අහේතුක සිත් අටළොසය යන විසි චිත්තයන් හැර ඉතිරි එකුන් සැත්තෑ (69) සිත් අතුරෙන් යම් චිත්තයක ඡන්ද චෛතසිකය සම්ප්‍රයුක්ත ධර්මයන්ට වඩා බලවත් වූ කල්හි ඒ ඒ සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ නොයෙක් ශක්තීන් වළක්වා තෙමේම අධිපතිභාවය සිද්ධකරන්නේ නම් එයට ඡන්දාධිපතියයි කියනු ලැබේ. යමක් කරණු කැමැත්ත ඇති කල්හි මේ ඡන්ද චෛතසිකය අධිපති භාවය සිද්ධකරන හෙයින් ප්‍රකටව පෙනෙන්නේය.

2. **චිත්තාධිපති**-චිත්තයම සම්ප්‍රයුක්ත ධර්මයන් කෙරෙහි අධිපතිව පවත්නා කල්හි එයට **චිත්තාධිපති** යයි කියති. අධිපති භාවය සිද්ධකරන සිත් දෙපනසෙකි. එනම්:–

| | |
|---|---|
| ද්විහෙතුක අකුසල ජවන් | 10 |
| ද්විහෙතුක කුසලක්‍රියා ජවන් | 8 |
| ත්‍රිහෙතුක කාමකුසලක්‍රියා ජවන් | 8 |
| රූපාවචර කුසලක්‍රියා ජවන් | 10 |
| අරූපාවචර කුසලක්‍රියා ජවන් | 8 |
| ලොකොත්තර මාර්ගඵල ජවන් | 8 |
| | 52 |

ජවන් සිත් අතුරෙන් එකම මෝහ හෙතුව පමණක් ඇති මෝහ මූල දෙසිත හා අහෙතුක හසිතුප්පාද සිතද චිත්තාධිපති භාවය සිද්ධ නොකරන බව දතයුතු.

3. **විරියාධිපති** - වීය්‍ය චෛතසිකය, සම්ප්‍රයුක්ත ධර්මයන් කෙරෙහි අධිපති භාවය දක්වන කල්හි **විරියාධිපති** යයි කියනු ලැබේ. පංචවිඥ්ඥාණයෝය, මනොධාතු ත්‍රිකය සහ සන්තීරණ ත්‍රිකය යන සොළොස් චිත්තයන් හැර ඉතිරි තෙසැත්තෑ (73) චිත්තයන්හි මේ වීය්‍ය චෛතසිකය ලැබේ.

4. **විමංසාධිපති** යනු ප්‍රඥා චෛතසිකයයි. සත්සාළිස් (47) ඥාණ සම්ප්‍රයුක්ත සිත් අතුරෙන් යම් සිතක ප්‍රඥා චෛතසිකය, සම්ප්‍රයුක්ත ධර්මයන් කෙරෙහි අධිපතිභාවය දක්වන්නේ නම්, එයට විමංසාධිපති යයි කියනු ලැබේ.

## ආහාරය

සත්ත්වයන් පිළිබඳවූ අධ්‍යාත්ම සන්තතිය පවත්වා ගැනීමට විශෙෂයෙන් ප්‍රත්‍ය වන්නාවූ ද, ඕජාටඨමක රූප ත්‍රිවිධ වෙදනා, ප්‍රතිසන්ධි විඥ්ඥාණ, නාම රූප ආදීන් ආහරණය කරණ හෙවත් උපදවන ධර්මයන්ට ආහාරයෝ යයි කියනු ලැබේ. මෙබඳු ආහාරයෝ සතර දෙනෙකි එනම්:-

1. කබලීකාරාහාරය
2. ඵස්සා හාරය
3. මනොසඤ්චෙතනාහාරය
4. විඥ්ඥාණාහාරය

**1. කබලීකාරාහාරය.** කනබොන ආහාරපානයන්-ගෙන් නොකොත් පිඩුකොට හෙවත් කබල කොට අනුභව කරන්නාවූ ආහාරයන්ගෙන් හටගන්නා වූ ඕජා සංඛ්‍යාත ආහාර රූපය **කබලීකාරාහාරය** නම් වේ. උතුසමුට්ඨාන වූ මේ ආහාරයන්ගේ පඨවි, ආපො, තෙජො, වායො, වණ්ණ,

ගන්ධ, රස, ඕජා සංඛ්‍යාත **සුද්ධාෂ්ටක** රූපයන් අතුරෙන් ඕජාරූපය, ජීවත්වන සත්ත්වයන්ගේ ශරීරාභ්‍යන්තරයට වත් කල්හි, ආහාරජවූ ඕජාෂ්ටමක රූප කලාප උපදවත්.

පටිසන්ධික්ෂණයේදී උපදනා **කර්මජ** රූප කලාපවූ කාය දසක, භාව දසක, වස්තුදසක යන රූප කලාපයන්හිද මේ ඕජා රූප ඇත්තාහ නමුත් ඒ කර්මජ රූපයන්ගේ සන්තතිය පවත්වා ගැනීමට මේ ආහාරජ රූපයෝ උපකාර වෙත් ආහාරයෝ නොලැබෙත්තේ නම් කර්මජ රූප කලාප සන්තතිය පවත්වා ගැනීම දුෂ්කර වේ. බාහිර ඕජාවන්ගෙන් රුකුල් ලැබීම හේතුකොට ගෙන අභ්‍යන්තර ඕජාවෝද ආහාරජ රූප කලාප උපදවත්. සත්ත්ව ශරීර යෙහි හටගන්නා වූ ඍතුජ රූප සන්තතියටද මේ ආහාරය උපකාර වෙත්. ඍතුජ රූප කලාපයන්හි ඇතුළත් වූ ඕජා රූපයෝද, බාහිර ඕජා රූපයන්ගෙන් රුකුල් ලැබ ආහරජ රූප උපදවත්. මෙසේ සත්ත්වයෙකු පිළිබඳ වූ කර්මජ හෝ ඍතුජ හෝ රූපයන්ගේ පැවැත්මට හා වර්ධනයට මේ කබලීකාරාහාරය නම් වූ ආහාර රූප උපස්ථම්භක වන්නේය. මනුෂ්‍යාදි සත්ත්වයෝ කබලීකා-රාහාරය නොලැබීමෙන් ක්‍රමයෙන් දුර්වලවී මියයන්නේ රූප කායයාගේ පැවැත්මට උපස්ථම්භක වන ආහාර නොලැබෙන හෙයිනි.

**2. ඵස්සාහාරය**. දෙපනස් චෛතසික ධර්මයන් අතුරෙන් පළමුව දක්වන ලද **ඵස්ස** චෛතසිකය සියළුම සිත්හි යෙදෙන්නේය. ඒ **ඵස්සය**, සුඛ, දුක්ඛ, උපෙක්ඛාදි වේදනා-වෝ ආහරණය කරණු ලබන හෙයින් **ඵස්සාහාරය** යන නාමයද ලබන්නේය. ආරම්මණය සහ ඵස්සය එක්වූ කල්හි උපදනා චිත්තයෙහි ඒ ආරම්මණ රසය අනුභව කරන්නාවූ වේදනා චෛතසිකයද උපදවනු ලැබේ මෙසේ උපදනා වේදනාව හෙතුකොටගෙන සත්ත්වයාගේ පැවැත්ම වන්නේය. චක්ඛු, සොත, ඝාණ ජිව්හා, කාය මන යන ෂඩ් ද්වාරයන්ට රූප ශබ්ද ගන්ධ රස පොට්ඨබ්බ ධම්ම යන

අරමුණු හමුවූ කල්හි චක්ඛුසම්ඵස්සජ වේදනා, සෝත සම්ඵස්සජ වේදනා, ඝාණ සම්ඵස්සජ වේදනා, ජිව්හා සම්ඵස්සජ වේදනා, කාය සම්ඵස්සජ වේදනා, මනො සම්ඵස්සජ වේදනා යන ෂට් ආකාර වේදනාවන් ඉපදීමෙන් තෘෂ්ණාව හටගෙන, කම්මවට්ට විපාකවට්ට, කිලෙසවට්ට යන ත්‍රිවිධ වෘත්තයන් පුරමින් සත්ත්වයාගේ ජීවත්වීම ඇතිවන්නේය.

3. **මනො සඤ්චෙතනාහාරය** යනු චෙතනා චෛතසිකයයි. ලොකොත්තර සිත් හැර ඉතිරි එකුන්තිස් (29) කුසලාකුසල ජවන් සිත්හි සම්ප්‍රයුක්ත චෙතනාවට **කර්මය** යයි ද කියති. මේ කුසලාකුසල කර්ම සඞ්ඛ්‍යාත චෙතනාවෝ කාම, රූප, අරූප යන භවත්‍රයෙහිම ප්‍රතිසන්ධි විඤ්ඤාණය ආහරණය කරණ හෙයින් හෙවත් උපදවන හෙයින් **මනොසඤ්චෙතනාහාරය**යයි කියනු ලැබේ. මෙයින් අකුසල චෙතනාවෝ සතර අපායෙහිද, අට මහා කුසල චෙතනාවෝ සප්ත කාම භූමියෙහිද, නව මහග්ගත චෙතනාවෝ විසි බඹ තලයෙහිද පටිසන්ධිය උපදවත්. මේ කුසලාකුසල සංඛාරයන් නැතිකල්හි කර්ම වෘත්තයක් නොවන්නේය. කර්ම වෘත්තය නැතිකල්හි විපාකවෘත්තයද නොවන්නේය. විපාක වෘත්තය නැති කල්හි ක්ලෙශ වෘත්තයක්ද නැත්තේය. එවිට භවයක් ඇති නොවන්නේය. එබැවින් මේ චෙතනාව, මනොසඤ්චෙතනාහාරය වශයෙන් ඇතිවීමෙන් ත්‍රිවිධ භවයන්හි පටිසන්ධිය ගෙනදෙන බව දත යුතු.

4. **විඤ්ඤාණාහාරය** නම් ප්‍රතිසන්ධි විඤ්ඤාණයයි. නාමරූප ධර්මයන් ආහරණය කරන හෙයින් එයට **විඤ්ඤාණාහාරය** යයි කියත්. කුසලාකුසල කර්මයන් හෙතුකොට ගෙණ යම් භවයක ප්‍රතිසන්ධිය ලබන්නේ නම්, ඒ භවයේදී පළමුව හටගන්නාවූ ප්‍රතිසන්ධි සිත හෙවත් ප්‍රතිසන්ධි විඤ්ඤාණය හා සමගම, ඒ සිතට ඇතුළත්ව ඵස්ස, වේදනා, සංඥා, චෙතනාදී වූ **නාම ධර්මයන්ද**, රූප ධර්මයන් අතුරෙන් කායදසක, භාවදසක,

වත්ථුදසක යන **ත්‍රිවිධ රූප කලාපයන්ද** පහළ වෙත්. එකුන්විසි ප්‍රතිසන්ධි විඤ්ඤාණයන් අතුරෙන් ඒ ඒ විඤ්ඤාණයෝ අසඤ්ඤ සත්ත්‍වයෙහි හෙවත් එකවොකාර භවයෙහි රූප මාත්‍රයක්ද, සතර අරූප තලයන්හි හෙවත් චතුවොකාර භවයෙහි නාම මාත්‍රයක්ද, කාමලොක රූප ලොකයන්හි හෙවත් පඤ්චවොකාර භවයන්හි නාමරූප මාත්‍රයක්ද උපදවන හෙවත් පවත්වන අර්ථයෙන් **විඤ්ඤාණාහාරය** යයි කියනු ලැබේ.

## බොධිපාක්ෂික සංග්‍රහය

**බොධි** යනු සොවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන සතර මාර්ග සිත්හි යෙදෙන ප්‍රඥාවම නමෙකි. මේ ආර්ය මාර්ග ප්‍රඥාව විසින් දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරොධ සත්‍යය, මාර්ග සත්‍යය යන චතුරාර්යසත්‍යයන් අවබොධ කරන හෙයින් බොධි යයි කියනු ලැබේ. බොධි නම් වූ ආර්ය මාර්ගයාගේ පක්ෂයෙහි වූ හෙයින් **බොධිපාක්ෂික** නම් වේ. චතුරාර්ය සත්‍යාවබොධය පිණිස උපකාර වන්නාවූ ධර්මයෝ **බොධිපාක්ෂික ධර්ම** නම් වෙත්.

බොධිපාක්ෂික ධර්මයෝ සත්තිස් දෙනෙකි. කොටස් වශයෙන් සතෙකි. එනම් :-

| | |
|---|---|
| 1. සතර සතිපට්ඨාන | 4 |
| 2. සතර සම්මප්පධාන | 4 |
| 3. සතර ඍද්ධිපාද | 4 |
| 4. පඤ්ච ඉන්ද්‍රිය | 5 |
| 5. පඤ්ච බල | 5 |
| 6. සප්ත බොජ්ඣඞ්ග | 7 |
| 7. අෂ්ට ආර්ය මාර්ගාඞ්ග | 8 |
| | 37 |

මේ සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝ සතර මාර්ග චිත්තයන්ගේ උත්පත්ති කාලයෙහි හෙවත් මාර්ගක්ෂණයේදී තමතමන්ට අයත් ඒ ඒ කෘත්‍යයන් සිද්ධකරමින් එක මාර්ග සිතෙහිම ලැබෙත්. ඵලක්ෂණයෙහිදී සතර සම්‍යග් ප්‍රධානයන් හැර ඉතිරි තෙතිස් ධර්මයෝ ලැබෙති. මාර්ග හා ඵල සිත්හි උපදනා බොධිපාක්ෂික ධර්මයෝ නිර්වාණය අරමුණු කරමින් උපදී. නිර්වාණාවබොධය පිණිස සමථ විදර්ශනා වඩන්නාවූ යොගාවචරයා හට ලෞකික විදර්ශනා පවත්නා කල්හි මෙකී ධර්ම නානාක්ෂණිකව හෙවත් මාර්ගයට පෙරටුව පූර්වභාග ප්‍රතිපදා සමයෙහි නොයෙක් ඇසිල්ලෙහි වෙන්වෙන්ව ලැබෙත්. ඥානදර්ශන විසුද්ධියේදී හෙවත් සොවාන් මාර්ගක්ෂණයේදී පරිපූර්ණ බොධිපාක්ෂික භාවය ඇතිවිය යුතු බව විශෙෂ්යෙන් සැලකිය යුතු.

## සතර සතිපට්ඨාන ධර්ම

**සති** යනු අරමුණ සිහිකිරීමය. අරමුණ ෙවත එළඹ විශෙෂ වශයෙන් පිහිටීම හෙවත් අරමුණට බැසගෙන පිහිටානුයි, පවතිනුයි යන අර්ථයෙන් **පට්ඨාන** නම් වේ. සතියම පට්ඨාන වූයේ **සතිපට්ඨාන** නමි. දෙපනස් චෛතසික ධර්මයන් අතුරෙන් සති චෛතසිකය නම් වූ සිහිය, සම්ප්‍රයුක්ත ධර්මයන් අතුරෙන් ප්‍රමුඛව හෙවත් ප්‍රධානව, අන් අරමුණුවල සිත පවත්වන්නට නොදී කායාදි එක් අරමුණෙක්හි සවිරව පැවැත්වීම සතිපට්ඨානය බව දතයුතු.

සතිපට්ඨානයෝ සතර දෙනෙකි. එනම්:-

1. කායානුපස්සනා සතිපට්ඨානය
2. වේදනානුපස්සනා සතිපට්ඨානය
3. චිත්තානුපස්සනා සතිපට්ඨානය
4. ධම්මානුපස්සනා සතිපට්ඨානය

බුදුරජාණන් වහන්සේ විසින් වෛනෙය ජනයන්ට හිත වැඩ පිණිස සතිපට්ඨාන ධර්ම සතරක් කොට වදාළහ. මෙහිදී පුද්ගලයෝ අට කොටසකට බෙදා දක්වනු ලැබේ. එනම්:-

1. මන්දප්‍රාඥ තෘෂ්ණා චරිත පුද්ගලයාය
2. තීක්ෂ්ණප්‍රාඥ තෘෂ්ණා චරිත පුද්ගලයාය.
3. මන්දප්‍රාඥ දෘෂ්ටි චරිත පුද්ගලයාය
4. තීක්ෂ්ණප්‍රාඥ දෘෂ්ටි චරිත පුද්ගලයාය
5. මන්දප්‍රාඥ සමථයානික පුද්ගලයාය
6. තීක්ෂ්ණප්‍රාඥ සමථයානික පුද්ගලයාය
7. මන්දප්‍රාඥ විපස්සනායානික පුද්ගලයාය
8. තීක්ෂ්ණප්‍රාඥ විපස්සනායානික පුද්ගලයාය

මොවුන් අතුරෙන් මෘදුලප්‍රඥෙන්ද්‍රිය ඇති හෙවත් මන්ද ප්‍රාඥවූ තෘෂ්ණාව බහුලකොට ඇති පුද්ගලයාගේ ඖදාරික වූ කායානුපස්සනා සතිපට්ඨානය තෙම විශුද්ධිමාර්ගය හෙවත් අත්‍යන්ත පරිශුද්ධ නිර්වාණ ප්‍රවෙශයට උපාය මාර්ග සඞ්ඛ්‍යාත හෙතුව වන හෙයින් ඔහට හිත වැඩ පිණිස **කායානුපස්සනා සතිපට්ඨානය** දෙශනා කළ සේක.

එපරිද්දෙන්ම තීක්ෂ්ණප්‍රාඥ තෘෂ්ණා චරිත පුද්ගලයාහට සියුම් වූ **වෙදනානුපස්සනා සතිපට්ඨානය ද**

මන්දප්‍රාඥ දෘෂ්ටි චරිත පුද්ගලයාහට වැඩියක් ප්‍රභෙද නැත්තාවූ **චිත්තානුපස්සනා සතිපට්ඨානය ද,**

තීක්ෂ්ණප්‍රාඥ දෘෂ්ටි චරිත පුද්ගලයාහට වැඩියක් ප්‍රභෙද ඇත්තාවූ **ධම්මානුපස්සනා සතිපට්ඨානය ද,**

මන්දප්‍රාඥ සමථයානිකයාහට නිදුකින් පැමිණිය යුතු අරමුණ වූ **කායානුපස්සනා සතිපට්ඨානය ද,**

තීක්ෂ්ණප්‍රාඥ සමථයානිකයාහට ඖදාරික වූ ආරම්මණයෙහි නොපිහිටන හෙයින් **වෙදනානුපස්සනා සතිපට්ඨානය ද,**

මන්දප්‍රාඥ විදර්ශනායානිකයා හට වැඩියක් ප්‍රභේදයට නොපැමිණි අරමුණ වූ **චිත්තානුපස්සනා සතිපට්ඨානය ද,**

තීක්ෂ්ණප්‍රාඥ විදර්ශනායානිකයාහට වැඩියක් ප්‍රභේදයට පත් අරමුණ වූ **ධම්මානුපස්සනා සතිපට්ඨානය ද** විසුද්ධි මාර්ගය වන හෙයින් ඒ ඒ පුද්ගලයන්ට හිත වැඩ පිණිස මෙසේ සතිපට්ඨාන ධර්ම සතරක් කොට වදාළ සේක.

**එපමණක් නොව, සුභය, සුඛය, නිත්‍යය, ආත්මය** යන විපල්ලාසයන්ගේ ප්‍රහාණය සඳහාත් සතරකට අඩුත් නොවූ, සතරකට වැඩිත් නොවූ චතුර්විධ වූ ම සතිපට්ඨාන ධර්ම කෙනෙක් භාග්‍යවතුන්වහන්සේ දෙශනා කළ සේක

**රූප කාය** සුභ වශයෙන් ගත් පුද්ගලාහට එය අසුභ වශයෙන් දැක්වීමෙන් සුභ විපල්ලාසය ප්‍රහීණ වන බැවින් **කායානුපස්සනා සතිපට්ඨානය ද,**

**වෙදනාව** සුඛ වශයෙන් ගත් පුද්ගලයාහට **එය** දුක්ඛ වශයෙන් දැක්වීමෙන් සුඛ විපල්ලාසය ප්‍රහීණ වන බැවින් **වෙදනානුපස්සනා සතිපට්ඨානය ද,**

**චිත්තය** නිත්‍ය වශයෙන් ගත් පුද්ගලයා හට එය අනිත්‍ය වශයෙන් දැක්වීමෙන් නිත්‍ය විපල්ලාසය ප්‍රහීණ වන බැවින් **චිත්තානුපස්සනා සතිපට්ඨානය ද,**

**ධර්මයන්** ආත්ම වශයෙන් ගත් පුද්ගලයා හට එය අනාත්ම වශයෙන් දැක්වීමෙන් ආත්මය යන විපල්ලාසය ප්‍රහීණ වන බැවින් **ධම්මානුපස්සනා සතිපට්ඨානය ද** දෙශනා කරණ ලදි.

තවද, **චතුර්විධ ඕඝය, චතුර්විධ යොගය, චතුර්විධ ආශ්‍රවය, චතුර්විධ ග්‍රන්ථය, චතුර්විධ උපාදානය** යන මොවුන්ගේ ප්‍රහාණය පිණිසත්, **චතුර්විධ ආහාරයන්** පිරිසිඳ දැනීම සඳහාත් **චතුර්විධ සතිපට්ඨාන** ධර්ම කෙනෙක් දක්වා වදාළ සේක.

පඤ්චකාම ගුණයෝ රූප කායයෙහි ලැබෙන හෙයින් ද විශෙෂයෙන් **කාමෞඝයට ද, කාමයොගයට ද කාමාශ්‍රවයට ද** කරුණු වන හෙයින් ද එකී ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස **කායානුපස්සනා, සතිපට්ඨානය ද,**

භවය සුඛයයි වරදවා ගැනීම් වශයෙන් භවය අපේක්ෂා කරන බැවින් වේදනාව **භවෞඝයට ද, භවයොගයට ද, භවාශ්‍රවයට ද** කරුණු වන හෙයින් එහි ප්‍රහාණය පිණිස **වේදනානුපස්සනා සතිපට්ඨානය ද,**

සන්තති ඝන බහල භාවය වරදවා ගැනීම් වශයෙන් චිත්තයෙහි ආත්මාභිනිවෙශය වන හෙයින් චිත්තය **දිට්ඨෞඝයට ද, දිට්ඨියොගයටද, දිට්ඨාශ්‍රවයට ද** කරුණු වන හෙයින් එහි ප්‍රහාණය පිණිස **චිත්තානුපස්සනා සතිපට්ඨානය ද,**

ස්වභාව ධර්මයන්ගේ විනිර්භෝගය හෙවත් වෙන්කිරීමත්, ස්වභාව ධර්මයන්ගේ ධර්ම මාත්‍ර භාවයක් දැනගැනීමට නොහැකි බැවින් සංඥා සංස්කාර ධර්මයෝ **අවිද්‍යෞඝයට ද අවිද්‍යායොගයට ද, අවිද්‍යාශ්‍රවයට ද** කරුණු වන හෙයින්, එහි ප්‍රහාණය පිණිස **ධම්මානුපස්සනා සතිපට්ඨානය ද** දෙශනා කරණ ලදි.

තවද, රූපකාය **අභිජ්ඣා කාය ග්‍රන්ථයට** කරුණු වන හෙයින් එය දුරු කිරීම පිණිස **කායානුපස්සනා සතිපට්ඨානය** දෙශනා කළ සේක.

දුක්ඛ වෙදනාව කරණකොටගෙන පටිඝානුසය, සන්තානයෙහි නැවත නැවත නැග එන්නේවේ ද, එහෙයින් දුක්ඛ දුක්ඛ, විපරිනාම දුක්ඛ, සංඛාර දුක්ඛ වශයෙන් සියලු වේදනාවෝ **ව්‍යාපාද කාය ග්‍රන්ථයට** කරණු වේ. එහි ප්‍රහාණය පිණිස **වෙදනානුපස්සනා සතිපට්ඨානය** දෙසූ සේක.

චිත්තයෙහි ආත්මාභිනිවේශයෙන් නිත්‍ය යයි වරදවා ගෙන, ශාස්වත දෘෂ්ටියත්, තමාගේ සීලයෙන් ශුද්ධිය වේය යන ශීලව්‍රත පරාමර්ශනයක් වේද, එහෙයින් චිත්තය **සීලබ්බත පරාමාශ කායගන්ථයට** කරුණු වේ. එහි ප්‍රහාණය පිණිස **චිත්තානුපස්සනා සතිපට්ඨානය** දෙසූසේක.

නාමරූප **ධර්ම** සඞ්ඛ්‍යාත පරමාර්ථ සත්‍ය ධර්මයන්, පරමාර්ථ සත්‍ය වශයෙන් නොදක්නාහුට ශාස්වත උච්ඡේද දෘෂ්ටි සඞ්ඛ්‍යාත වූ ඉදංසච්චාභිනිවේශය වන හෙයින්, එය ඉදංසච්චාභිනිවේශ කාය ග්‍රන්ථයට කරුණුවේ. එය නැසීම පිණිස **ධම්මානුපස්සනා සතිපට්ඨානය** දෙසූ සේක.

මෙසේම **කාමුපාදාන, දිට්ඨුපාදාන, සීලබ්බතුපාදාන, අත්තවාදුපාදාන** යන සතර උපාදානයන්ගේ ප්‍රහාණය පිණිස ද, පිළිවෙලින් **කායානුපස්සනා, වේදනානුපස්සනා චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා** යන සතර සතිපට්ඨානයන් දෙසූ සේක.

තවද, **කායානුපස්සනා සතිපට්ඨානය** වඩන්නාවූ පුද්ගලයා, කායයාගේ හටගැනීමට හෙතුව වූ **කබලීකාරාහාරය** පිරිසිඳ දනී.

**වේදනානුපස්සනා සතිපට්ඨානය** වඩන්නාවූ පුද්ගලයා වේදනාවගේ හටගැනීමට හෙතුව වූ **ඵස්සාහාරය** පිරිසිඳ දනී.

**චිත්තානුපස්සනා සතිපට්ඨානය** වඩන්නාවූ පුද්ගලයා විඥ්ඥාණයාගේ හටගැනීමට හෙතුව වූ **මනොසඤ්චෙතනාහාරය** පිරිසිඳ දනී.

**ධම්මානුපස්සනා සතිපට්ඨානය** වඩන්නාවූ පුද්ගලයා නාමරූප ධර්මයන්ගේ හටගැනීමට හෙතුව වූ විඥ්ඥාණාහාරය පිරිසිඳ දනී.

ඒකත්තසමොසරණ වශයෙන් හෙවත් ඒකස්වභාව වූ එකත්ව නම් ලද නිර්වාණයෙහි සාක්ෂාත් කිරීම් වශයෙන් අසම්මිශ්‍ර වූ හෙවත් එකලා වූම සතිපට්ඨානය ආලම්බන වශයෙන් සිව්දෙනෙක් වන්නේය.

සිව් දොරක් ඇති නුවරෙක්හි පෙරදිගින් එන්නාවූ වනිග් ජනයෝ හෙවත් වෙළෙන්දෝ පෙරදිග උපදනාවූ විකිණිය හැකි බඩු ගෙන, පෙරදිග පුර දොරින් නුවරට යම්සේ ඇතුල්වේද, එසේම දකුණු දිගින් ද, අපරදිගින් ද, උතුරු දිගින් ද එන්නාවූ ජනයෝ දකුණු දොරටුවෙන් ද, අපරදිග දොරටුවෙන් ද උතුරුදිග් දොරටුවෙන් ද පිළිවෙලින් නුවරට ඇතුල්වේද, එමෙන්ම නිර්වාණ නමැති මහා නගරයට ප්‍රවිෂ්ට වනු කැමැති පුද්ගලයෝ මේ සතර සතිපට්ඨාන ධර්මයන් වඩා එහි ආනුභාවයෙන් නිපයන ලද්දාවූ ආර්ය මාර්ගයෙන් එකම පරිනිර්වාණයටම වදිති.

මෙහි නුවර මෙන් නිර්වාණයද, සතර සතිපට්ඨාන ධර්මයන් වැඩීමෙන් නිපයන ලද්දාවූ ආර්ය මාර්ගයෝ දොරටු සතර මෙන් ද දතයුතු.

## කායානුපස්සනා සතිපට්ඨානය

**කාය** යන පදයෙන් රූප කාය යන අර්ථය ගතයුතු. මේ රූප කාය, අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ගේ ද, කෙශාදී වූ නිස්සත්ත්වනිර්ජීව ස්වභාවයන්ගේද සමූහාර්ථය හේතුකොට ගෙන **කාය** යයි කියනු ලැබේ, එපරිද්දෙන් ම මේ රූප කාය. වැඩියක් පිළිකුල් වූ කෙසාදී කුණපයන්ගේ උප්පත්ති ස්ථාන වන අර්ථයෙන් ද, **කාය** නම් වේ. **අනුපස්සනා** යනු නැවත නැවත ඇති තත්ත්වයෙන් දැකීමයි. මෙසේ රූප කායෙහි රූපකාය ඇති තත්ත්වයෙන් නැවත නැවත බැලීම පිණිස සිහිය මනාකොට පිහිටුවා ගැනීම **කායානුපස්සනා සතිපට්ඨාන** නම් වේ.

මේ රූප කායයෙහි, රූප කායයම නැවත නැවත දක්නා ස්වභාවයෙන් වාසය කරන යොගාවචර තෙමේ, එහි **වෙදනානුපස්සනා** වශයෙන් හෝ **චිත්තානුපස්සනා** වශයෙන් හෝ, **ධම්මානුපස්සනා** වශයෙන් හෝ නැවත නැවත දැකීමක් නො කරන්නේය.

එ පරිද්දෙන් ම, රූප කායයෙහි කුදු මහත් අඞ්ග-ප්‍රත්‍යඞ්ගයන් කෙරෙන් විනිර්මුක්ත වූ අන්‍ය ධර්මයක්හු නැවත නැවත දකිමින් වාසය නො කෙරෙයි.

එසේම කෙසලොමාදීන් කෙරෙන් විනිර්මුක්ත වූ ස්ත්‍රී පුරුෂ කෙනෙකුන් නැවත නැවත දකිමින් වාසය නො කෙරෙයි.

නැවත නැවත රූප කායයෙහි කය අනුව බලන්නා වූ යොගාවචර තෙමේ කෙස් ලොම් ආදි කොට ඇති භූතරූප උපාදාය රූපයන ගේ සමූහ යයි කියන ලද යම් කායයෙක් ඇද්ද, ඒ කායයෙහි ද භූතරූප උපාදාය රූපයන් කෙරෙන් විනිර්මුක්ත වූ අන්‍ය ධර්මයක්හු නැවත නැවත දකිමින් වාසය නො කෙරයි.

සත්‍ය වශයෙන් රථයක් බලන්නාවූ පුරුෂතෙම, රියසක්, රියනැබ ආදීවූ රථ සම්භාරයන් නැවත නැවත බලන්නාක් මෙන්ද, නුවරක් බලන්නාවූ පුරුෂතෙම එහි අවයවයන් නැවත නැවත බලන්නාක්හු මෙන් ද, කායානු-පස්සනා සතිපට්ඨානය වඩන්නා වූ යොගාවචර තෙමේ කෙස්-ලොම් ආදී අවයවයන් නැවත නැවත දිකිමින් වාසය කරයි.

එමෙන්ම කෙසෙල් කඳ පතුවැටි වෙන්කරන්නා වූ පුරුෂයෙක්හු මෙන්ද, භූතරූප උපාදාය රූපයන්ගේ සමුදාය නැවත නැවත දකිමින් ම වාසය කෙරෙයි. මෙසේ සමූහ වසයෙන් ම කාය සඞ්ඛ්‍යාත වූ ආලම්බනය දැකීමෙන්, ඝන විනිර්භොගය හෙවත් සමූහ භූත වූ ධර්මයන් වෙන් කිරීම දක්නා ලද්දේ වේ. මෙසේ කාය දක්නාවූ යොගාවචර තෙමේ

භූතරූප උපාදාය රූපයන්ගේ සමූහය කෙරෙන් විනිර්මුක්ත වූ කයෙක් හෝ ස්ත්‍රියෙක් හෝ පුරුෂයෙක් හෝ අන් කිසි ධර්ම කෙනෙක් හෝ නො දක්නේය. යම් ස්ත්‍රී පුරුෂාදියෙක් හු ඇසින් දකීද, ඒ ස්ත්‍රී පුරුෂාදිය දකිනා ලද්දේ නොවේ. යම් රූපායතනයක්හු ස්ත්‍රී පුරුෂාදී මිථ්‍යා දර්ශනයෙන් දකීද, වරදවා දුටු ඒ ස්ත්‍රී පුරුෂාදිය රූපායතන ද නොවේ රූපායතනය තෙමේ, ස්ත්‍රී පුරුෂාදී ප්‍රඥප්ති සඞ්ඛ්‍යාත ධර්මායතනයද නොවේ. ඒ දක්නා ලද රූපායතනය හෝ කෙසාදී භූතොපාදය සමූහ සඞ්ඛ්‍යාත වූ රූපකාය හෝ නුවණැසින් පරමාර්ථ සත්‍ය වශයෙන්ද නොදකී.

මෙසේ දක්නා හෙතෙම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම. අශුභවූ ම මේ රූප කායයෙහි නිත්‍ය, සුඛ, ආත්ම, සුභ භාවය දකිමින් වාසය නො කෙරෙයි. අනිත්‍යාකාරවූ, දුක්ඛාකාරවූ, අනාත්මාකාරවූ, අසුභාකාරවූ කෙසාදී සමූහය, නැවත නැවත දකිමින්ම වාසය කෙරෙයි.

මෙසේ කායානුපස්සනා සතිපට්ඨානය වඩන්නාවූ භික්ෂු තෙම සප්තවිධ අනුපස්සනා වශයෙන් හෙවත් **අනිච්චානුපස්සනා, දුක්ඛානුපස්සනා, අනත්තානුපස්සනා, නිබ්බිදානුපස්සනා, විරාගානුපස්සනා, නිරොධානුපස්සනා, පටිනිස්සග්ගානුපස්සනා** වශයෙන් වඩන්නේ මේ කෙසාදී වූ නිසත්ත්ව නිජ්ජීව ධර්ම සමූහය අනිත්‍ය වශයෙන් දකී. නිත්‍ය වශයෙන් නොදකී දුක්ඛ වශයෙන් දකී සුඛ වශයෙන් නොදකී. අනාත්ම වශයෙන් දකී ආත්ම වශයෙන් නොදකී. මෙසේ දක්නාවූ හෙතෙම රූපයෙහි කලකිරෙයි. රූපය පැවැත්වීමට උත්සාහ නො කෙරෙයි. ඇල්මෙන් පහ වෙයි නො ඇලෙයි. නිරොධය කෙරෙයි. නො පවත්වයි. ඉවත් කරයි. නොගනී.

කායානුපස්සනාව වඩන්නාවූ යොගාවචර තෙමේ චතුර්විධ ඉරියව්වකින් එකක් ගෙන වාසය කෙරෙයි. හෙතෙම තමාගේ ශරීරය හෙවත් අධ්‍යාත්මික රූපකාය

ගෙන භාවනා කරන්නේ නම් අධ්‍යාත්ම රූප කායයෙහි කෙසාදී භූතොපාදය රූපයන් අරමුණු කරයි. බහිද්ධාකාය - හෙවත් පරසන්තාන ගත රූපකාය ගෙන භාවනා කරන කල්හි බාහිර වූ කෙසාදීන් අරමුණු කරයි. අජ්ඣත්ත - බහිද්ධ වශයෙන් භාවනා කරන කල්හි ඇතැම් විටෙක තමාගේ රූපකාය අරමුණු කරයි. ඇතැම් විටෙක පර සන්තාන ගත රූපකාය අරමුණු කරමින් වාසය කෙරෙයි. එකවර අධ්‍යාත්ම බාහිර ධර්මයන් අරමුණු කිරීමක් නොවන බව දත යුතුයි.

මේ භාවනායෙහි යෙදෙන යොගාවචර තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් සමන්විත කෙනෙකුන් විය යුතු. මෙතෙම සිහිය කරණකොට ගෙන අරමුණ ස්මරණය කරන්නේය. සම්පජඤ්ඤ යයි කියන ලද ප්‍රඥාව කරණකොටගෙන සම්මර්ශනය කරන්නේය. සිහියෙන් තොරවූ යොගාවචරයා හට අනුපස්සනාවක් නම් නොවන්නේය.

භාවනාවගේ ඵලයක් වශයෙන් මේ යොගාවචරයා හට රූපකාය සංඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යා දෞර්මනස්සයන්ගේ තදඞ්ග විෂ්කම්භන වශයෙන් ප්‍රහාණය වන්නේය.

අභිධ්‍යාව හෙවත් දළ ලොභයෙන් කාමච්ඡන්ද නීවරණයද දෞර්මනස්සයෙන් ව්‍යාපාද නීවරණයද දක්වනු ලැබේ. පඤ්ච නීවරණ ධර්මයන් අතුරෙන් ප්‍රබල වූ මේ කාමච්ඡන්ද, ව්‍යාපාද යන නීවරණ දෙක ගත් කල්හි ඉතිරි නීවරණ තුනද එයින්ම ගැණෙනු ලැබේ. අභිධ්‍යාව ගැනීමෙන් රූපකායයාගේ සම්පත්තියට මූලභූත වූ අනුකූලත්වයත්, දෞර්මනස්සය ගැනී- මෙන් රූප කායයාගේ විපත්තියට මූලභූතවූ අනුකූලත්වයත් ප්‍රකාශ වේ. අභිධ්‍යාව ප්‍රහාණය කිරීමෙන් රූප කායයෙහි දැඩි ආලයත්, දෞර්මනස ප්‍රහාණය කිරීමෙන් කායානුපස්සනා භාවනාවෙහි නො ඇලීමත්, අභිධ්‍යාව දුරු කිරීමෙන් රූප කායයෙහි අවිද්‍යමාන වූ සුභත්ව, සුඛත්වයන්ගේ පහ කිරීමත්, දෞර්මනස දුරු කිරීමෙන් රූප කායයෙහි විද්‍යමාන වූ අසුභත්ව අසුඛත්වාදීන්ගේ බැහැරලීමත් ප්‍රහාණයත් වන බව දතයුතු.

**කායානුපස්සනා සතිපට්ඨාන** භාවනාව තුදුස් ආකාරයකින් දක්වා තිබේ ඒ තුදුස් ආකාරය නම්:-

1. ආශ්වාස ප්‍රශ්වාස වශයෙන් ආනාපාන සතිය වැඩීම
2. ඉරියාපථ වශයෙන් සතිය වැඩීම
3. සාත්ථක, සප්පාය, ගොචර, අසම්මොහ වශයෙන් හෙවත් චිතුසම්පජඤ්ඤ වශයෙන් සතිය වැඩීම
4. පටික්කූල මනසිකාර වශයෙන් සතිය වැඩීම
5. ධාතු මනසිකාර වශයෙන් සතිය වැඩීම

6-14. නව සීවථිකාය වශයෙන් සතිය වැඩීම

මේ තුදුස් ආකාරයන් අතුරෙන් පටික්කූලමනසිකාර වශයෙන් කායානුපස්සනාව වඩන්නාවූ පුද්ගල තෙම රූපකාය පිළිකුල් කොට දකී.

මේ රූපකාය වනාහි පත්ලෙන් උඩ, කෙසගින් යට සරසින් සමසීමාකොට ඇති නානාවිධ වූ අශුචීන් පිරුණේ වේ සිරුර තෙමේ අසූචි රැසක් වන හෙයින් පිළිකුල් කට-යුතුවූ, කෙසලොමාදී වූ දෙතිස් කුණප කොට්ඨාසයන් ගේ හා, ඇස් ලෙඩ මුල්කොට ඇති සිය ගණන් රෝගයන්ගේද, උත්පත්තිස්ථාන වන හෙයින් **කාය** යයි කියනු ලැබේ. මේ කුණු රූප කායයෙහි සියළු අයුරින් විමසන්නේ වී නමුත් නුවණැති කිසිවෙක්, යම්කිසි මුතු ඇටයක් හෝ මැණිකක් හෝ වටිනා කිසිවක් හෝ නො දකී. ශුචි භාවයක් නොදකී. ඉතා දුගඳ, පිළිකුල් බව ඇති නානාවිධ වූ කෙශ ලොමාදි ප්‍රභෙද ඇති අශුචි දෙයක්ම දකී

මෙසේ මේ කමටහන වඩා මාර්ගඵලාපධිගමය ලබනු කැමැති කුලපුත්‍ර තෙමේ, මුලදීම චතුර්විධ වූ සීලය පිරිසිඳු කොට, ඉතා පිරිසිදු ශීලයෙහි පිහිටියහු විසින් ආවාස, කුල, ලාභ, ගණ, කම්ම, අද්ධාන, ඤාති, ආබාධ, ගන්ථ, ඉද්ධි යන දසවිධ පළිබොධයන් අතුරෙන් යම් පළිබොධයක්

ඇද්ද, එය දුරුකොට, භාවනා කිරීමට ප්‍රථම කළයුතු සියළු කෘත්‍යයන් කොට නිමවා, පටිකකූලමනසිකාරය නම් කමටහන වැඩීමෙන් ප්‍රථමධ්‍යානය උපදවා, ධ්‍යානය පාදක කොටගෙන විදසුන් වඩා රහත් ඵලයට හෝ, අනාගාමි ඵලාදීන් අතුරෙන් එක්තරා ඵලයකට පැමිණියාවූ හෝ යටත් පිරිසෙයින් අටුවා සහිත පෙළ දහම්හි කරණ ලද අභ්‍යාසය ඇති කල්‍යාණ මිත්‍රයෙක්හුගේ හෝ හමුවෙහි කමටහන ඉගෙනගත යුතු. යථොක්ත ස්වභාවය ඇත්තාවූ කල්‍යාණමිත්‍ර වූ ආචාය්‍ය්‍යවරයෙක් එක් විහාරයක නො ලබන්නාහු නම් ඔහු වසන වෙහෙරට ගොස් ඉගෙණගත යුතු.

කමටහන කියන්නාවූ ආචාය්‍ය්‍යවරයා විසින් තුන් පරිද්දෙකින් කියයුතු.

පෙර ඉගෙනගන්නා ලද කමටහන් ඇති පුද්ගලයෙක් නම් එක් වරක් හෝ දෙවරක් හිඳින කල් හැදූරීම කරවා යැවිය යුතු.

ආචාය්‍ය්‍යවරයා හමුවෙහි වැස උගෙණුු කැමැත්තේ නම් ඔහට ආ ආ කල්හි කමටහන කියවිය යුතු.

යමෙක් කමටහන ඉගෙණ අන් තැනකට යනු කැමැත්තේ නම් ඔහුට වැඩියක් විස්තර නොකොට වැඩියක් ලුහුඬු නොකොට, නිරවුල් කොට ගැටළු තැන් නැතිකොට කමටහන කියවිය යුතු.

තවද, ආචාය්‍ය්‍යවරයා විසින් ඔහට සත්පරිද්දෙකින් වාචොද්ගත කරණාදි වශයෙන් **උග්ගහකොසල්ලය** හෙවත් උගැන්මෙන් නිපයන කෞශල්‍ය සඞ්ඛ්‍යාත ඥානය ද, **මනසිකාර කොසල්ලය** හෙවත් මෙනෙහි කිරීමෙන් නිපයන කෞශල්‍ය සඞ්ඛ්‍යාත ඥානය ද ඇතිකොට දියයුතු.

මේ උද්ග්‍රහ මනස්කාර කෞශල්‍යයන් අතුරෙන්, **බසින, සිතින, වණ්ණවශයෙන, සණ්ඨාන වශයෙන, දිසාවශයෙන, ඕකාසවශයෙන, පරිච්ඡෙද වශයෙන** යි සත් පරිද්දෙකින් වාචොද්ගතකරණාදී වශයෙන් උගැන්මෙන් නිපයන කෞශල්‍ය සඞ්ඛ්‍යාත ඥානය ඇතිකළ යුතුයි. ත්‍රිපිටකධාරී වූ කෙනෙක් වුවද, පළමුකොට බසින් හැදෑරීම කළයුතු වේ. ඇතැම් කෙනෙකුට හදාරමින් සිටියදීම කමටහන පහළ වේ.

ලක්දිව මලය දනව් වැසි මහාදෙව තෙරුන්ගේ සමීපයෙහි උගත් කමටහන් ඇති තෙරුන් දෙනමකට පහළවූවාක් මෙනි. මහාදෙව තෙරුන්වහන්සේ ඒ තෙරුන් දෙදෙනාහු විසින් කමටහන ඉල්වන ලද්දේ, සිව්මසක් මුලුල්ලෙහි මේ කමටහන මේ පරිද්දෙන් හැදෑරීම කරව් යයි දෙතිස් කුණපයන් පිළිබඳ වූ කෙශා ලොමා ආදී වූ පාළිය දුන්නේය. දෙතුන් වරකින් ඒ දෙනමට පාළිය පුහුණුවූවද, ඔහු අනුරූපවශයෙන් ගන්නාසුළු වන බැවින් සිව්මසක් මුලුල්ලෙහිම පිළිකුල් භාවනා පෙළ හදාරමින් සොවාන් වූවාහුය. එහෙයින් ආචාර්‍ය්‍යයා විසින් පළමු කොට බසින් හැදෑරීම කරවයි කිවයුතු.

බසින් හදාරන යොගාවචරයා විසින් තචපඤ්චකාදීන් පිරිසිඳ, අනුලොම් පටිලොම් වශයෙන් හැදෑරීම කටයුතු. **කෙසා, ලොමා, නඛා, දන්තා, තචො** යි හදාරා නැවත පටිලොම් වශයෙන් **තචො, දන්තා, නඛා, ලොමා, කෙසා** යි හදාළයුතු. එයට ඉක්බිති **වක්කපඤ්චකයෙහි මංසං, නහාරු, අට්ඨි, අට්ඨිමිඤ්ජා,** වක්කං යි අනුලොම වශයෙන් කියා නැවත ප්‍රතිලොම වශයෙන් **වක්කං, අට්ඨිමිඤ්ජා, අට්ඨි, නහාරු, මංසං, තචො, දන්තා, නඛා, ලොමා, කෙසා** යි කියයුතු. එයට ඉක්බිතිව **පප්ඵාසපඤ්චකයෙහි හදයං, යකනං, කිලොමකං, පිහකං, පප්ඵාසං** යි අනුලොම වශයෙන් කියා නැවතත් පටිලොම වශයෙන් **පප්ඵාසං, පිහකං,** යකනාදීන් **කෙසා** දක්වා කිවයුතු.

එයට අනතුරුව **මත්ථලුඞ්ග පඤ්චකයෙහි අන්තං, අන්තගුණං, උදරියං, කරීසං, මත්ථලුඞ්ගං** යි අනුලොම වශයෙන් කියා නැවත පටිලොම වශයෙන් **මත්ථලුඞ්ගං** යන තැන් සිට **කෙසා** යන පදය දක්වා කිවයුතු. එයට ඉක්බිතිව **මෙදෙ** ෂට්කයෙහි **පිත්තං, සෙම්හං, පුබ්බො, ලොහිතං, සෙදො, මෙදො** යි කියා නැවත පටිලොම වශයෙන් **මෙදෙ** සිට **කෙසා** දක්වා කියයුතු එයට ඉක්බිතිව **මූත්‍ර ෂට්කයෙහි අස්සු, වසා, ඛෙලො, සිඞ්ඝාණිකා, ලසිකා, මුත්තං** යි අනුලොම වශයෙන් කියා නැවතත් පටිලොම වශයෙන් **මුත්තං** යන පදය සිට **කෙසා** යන පදය දක්වා කිවයුතු මෙසේ මේ දෙතිස් පදයෝ අනුලොම වශයෙන් සියදහස් වර නොව ලක්ෂ ගණන් මුවත් හැදෑරීම කටයුතු යම් හෙයකින් බසින් හැදෑරීම කරණකොට ගෙන ක්‍රමටහන් පෙළ පුහුණු වේද, ඔබ්මොබත් සිත් නොදිවේද, කෙස් ලොම් ආදී කොටස්හු ප්‍රකාශ වූවෝ වෙත්ද, ඉදිරිපත් කළ දෙඅතුල තල ඇඟිලි පෙළක් මෙන් වැටහේද, එතෙක් සජ්ඣායනා කළ යුතු.

බසින් යම් සේ හැදෑරීම කටයුත්තේද එපරිද්දෙන්ම **සිතින්ද** හැදෑරීම කටයුත්තේය. බසින් හැදෑරීම සිතින් හැදෑරීමට ප්‍රත්‍ය වන්නේය. සිතින් හැදෑරීම අශුභ ලක්ෂණ නොහොත් ධාතු ලක්ෂණ ප්‍රතිවෙධයට ප්‍රත්‍ය වේ. ධාතු ලක්ෂණ ප්‍රතිවෙධය මාර්ග ඵල ප්‍රතිවෙධයට ප්‍රත්‍ය වේ.

**වර්ණ වශයෙන්** යනු කෙසාදීන්ගේ කළු සුදු ආදී වර්ණයන් දැක හැඳිනීම ය.

**සණ්ඨාන** යනු කෙසාදී කොට්ඨාසයන්ගේ සටහන සැළකීමය.

**දිසා වශයෙන්** යනු මේ සිරුරෙහි නාභි පෙදෙසින් මතු සිරුර **උපරිම දිසා** හෙවත් උඩදිග නම්. **නැබින්** යට සිරුර **හෙට්ඨිම දිසා** හෙවත් යටදිග **නම්**. එහෙයින් මේ මේ කුණප කොටස් මේ මේ දිග්හි යයි දිශා වශයෙන් සැළකීමය.

**ඔකාස** වශයෙන් යනු - මෙසේ කුණප කොට්ඨාස මෙතම් මෙතම් අවකාශයෙහි හෙවත් ඉඩමෙහි පිහිටියේය යි ඒ ඒ කුණප කොටස් පිහිටි ඉඩම් වශයෙන් සැලකීමය.

**පරිච්ඡේද** වශයෙන් යනු **සභාග පරිච්ඡේද, විසභාග පරිච්ඡේද** යයි විවිධ වේ. තමාගේ කොටසින් පිරිසිඳීම **සභාග පරිච්ඡේද** නම්. සභාග නොවූ කොටසකින් පිරිසිඳීම **විසභාග පරිච්ඡේද** යයි. මේ කුණප කොට්ඨාසයන් යටිනුදු, උඩිනුදු, සරසිනුදු මෙනම් පිරිසිඳීමකින් පිරිසිඳින ලදැයි' මෙසේ තමාගේ කොටසින් පිරිසිඳීම **සභාග පරිච්ඡේද** නම්. කෙස්හු ලොම්හු නොවෙත්, ලොම්හු කෙස්හු නොවෙත්, මේ තයින් මිශ්‍රනොවූවන්ගේ වශයෙන් පිරිසිඳීම **විසභාග පරිච්ඡේද** ය යි.

මෙසේ සප්තප්‍රකාරයකින් උද්ග්‍රහන කෞශල්‍ය සංඛ්‍යාත ඥනය අස්වන්තා වූ ආචාර්‍ය්‍යවරයා විසින් මේ කමටහන අසුවල් සූත්‍රයෙහි ප්‍රතික්කූල වශයෙන්ද, අසුවල් සූත්‍රයෙහි ධාතු වශයෙන්ද දෙශනා කරන ලදැයි කියා දිය යුතුයි.

මේ කමටහන **මහා සතිපට්ඨාන සූත්‍රයෙහි** පටික්කූල මනසිකාර වශයෙන් ද, **මහා හත්ථි පදොපම, මහා රාහුලොවාද, ධාතු විභංග** නම් වූ **පුක්කුසාති සූත්‍රය** යන සූත්‍රයන්හි ධාතු වශයෙන්ද, **කායගතාසති සූත්‍රයෙහි** ධාතු වශයෙන්ද වදාළ කමටහන විදර්ශනා කර්මස්ථාන නම් වේ. පටික්කූල වශයෙන් වදාළ කමටහන සමථ කමස්ථාන නම් වේ.

**සතිපට්ඨාන විභඞ්ගයෙහි දී** ඒ කමටහන සමථ කර්මස්ථාන නම් වේ.

මෙසේ සත් පරිද්දෙකින් උද්ග්‍රහණ කෞශල්‍ය ඇති කොට ඉක්බිතිව දශ ප්‍රකාරයකින් මනසිකාර කෞශල්‍යය ඇතිකල යුතුයි, ඒ දශවිධිය නම්:-

1. **අනුපුබ්බ** වශයෙන් හෙවත් පිළිවෙල නො ඉක්ම වීම වශයෙන්,

2. **නාතිසීඝ්‍ර** වශයෙන් හෙවත් ඉතා දුහුසුළු නොවීම් වශයෙන්,

3. **නාතිසණික** වශයෙන් හෙවත් ඉතා ලස් නොවීම් වශයෙන්,

4. **වික්ඛෙප පටිබාහන** වශයෙන් හෙවත් බහිද්ධා-ලම්බනයන් ගෙන් චිත්තයාගේ වික්ෂෙපය වැළැක් වීම් වශයෙන්,

5. **ප්‍රඥප්ති සමතික්කමන** වශයෙන් හෙවත් කෙස් ලොම් ආදී ප්‍රඥප්තිය ඉක්මවීම් වශයෙන්,

6. **අනුපුබ්බ මුඤ්චන** වශයෙන් හෙවත් නො වැට-හෙන කොටස් ක්‍රමයෙන් මුදවීම් වශයෙන්,

7. **අප්පනා** වශයෙන්,

8. **අධිචිත්ත සූත්‍රය**, වශයෙන්,

9. **සීතිභාව සූත්‍රය** වශයෙන්,

10 **බොජ්ඣඞ්ග කොසල්ල සූත්‍රය** වශයෙන් යනුයි.

1. **අනුපුබ්බ** වශයෙන් මනසිකාරය ඇතිකිරීම නම් බසිනුදු සිතිනුදු පුහුණු කිරීමේදී දෙශනාපාළිය අනුව පිළිවෙල නොඉක්මවා කෙසා, ලොමා, නඛා, දන්තා ආදී වශයෙන් පුහුණු කිරීමය. කෙසා, නඛා, තචො, යනාදී වශයෙන් එකක් හෝ දෙකක් හැර නොකියයුතු. එසේ කියන්නේ නම් අදක්ෂ වූ පුද්ගලයෙක් දෙතිස් පෙත්තක් ඇති හිණකින් නැග යාමේදී පෙති එකක් හැර එකක පා තබා යාමෙන් බොහෝ විඩාවට පත්වන්නාක්මෙන් භාවනා බලයෙන් පැමිණියයුතු යම් සැපතක් ඇත්නම් එයට නොපැමිණ විඩාවට පත්ව කලාන්තව මාගීඵල භාවනාස්වාදයට නො පැමිණෙන්නේ ය.

2. එසේම ඉතා ඉක්මනින් මෙනෙහි නොකට යුතුයි. ඉක්මනින් මෙනෙහි කරන්නාහට කමටහන කෙළවරට ගියත් එය ප්‍රකටව නොවැටහෙන හෙයින් ධ්‍යානාදිය වළක්වන්නේ ය.

3. එමෙන්ම ඉතා සෙමෙනුදු මෙනෙහි කටයුතු නොවේ. නිමාවට යායුතු කල්හි නොහෙන හෙයිනි. එකල්හිද ධ්‍යානාදිය නොලැබේ.

4. කායානුපස්සනාව හැර එයින් අන්‍ය වූ බාහිර අරමුණෙක සිත නොයැවිය යුතු එක් පාදයක් පමණක් තබා යායුතු කුඩා මගක් ඇති ප්‍රපාත මාර්ගයට පිළිපන් අදක්ෂ පුද්ගලතෙමේ නොසළකා ඔබ්මොබ බලා යන්නේ ප්‍රපාතයෙහි වැටී අනතුරට පත්වන්නාක් මෙන් භාවනා අරමුණ හැර අන් අරමුණක් ගන්නේනම් ඔහුගේ භාවනාව පිරිහී ධ්‍යානාදී ඵලයන්ගෙන්ද පිරිහෙන්නේය.

5. කමටහන පුරුදුවූ කල්හි කෙස් ලොම් ආදී වශයෙන් භාවිත කළ ප්‍රඥප්තිය ඉක්මවා කමටහන මෙනෙහි කළයුතු. දිය දුර්ලභ කල මිනිස්සු අරණ්‍යයෙහි ළිඳක් දැක, එහි ජලය පිණිස යනු එනු කැමැතිව, මග නොවරදින ලෙස තල්පත් ආදී සළකුණක් බැඳ, ඒ සළකුණෙන් අවුත් නහද්ද, පැන් බොද්ද, යම් කලෙක්හි ඒ මිනිසුන් නිතර ආගිය පා ලකුණු නිසා මග ප්‍රකටවේද, එවිට බැඳ තිබූ සළකුණ අත්හැර ඒ මගින් කැමති කැමති වේලෙක ඇවිත් නහද්ද පැන් බොද්ද, එපරිද්දෙන් කෙස් ලොම් ආදී වූ ප්‍රඥප්ති වශයෙන් මෙනෙහි කරන්නාහට පිළිකුල් බව ප්‍රකට වූ කල්හි, කෙස් ලොම් යන ප්‍රඥප්තිය ඉක්මවා පිළිකුල් ආකාරයෙහිම භාවනා සිත පිහිටවිය යුතු.

6. තවද යම් යම් කුණප කොටසෙක් නොවැටහේ ද, ඒ ඒ නොවැටහෙන කුණප කොටස් අත්හරිමින් අනුපුබ්බ-මුඤ්චන වශයෙන් වැඩිය යුතුයි. පිළිවෙළින් කෙශයෙන්

පටන්ගෙන මුත්‍රං දක්වා දෙතිස් කුණපයන් අනුලොම ප්‍රතිලොම වශයෙන් මෙනෙහි කරන ආදි කර්මිකයාහට සමහර කොටස් නොවැටහෙත්, සමහර කොටස් වැටහෙත්. වැටහෙන්නාවූ කොටස් අතුරෙන් ද වැඩියෙන්ම වැටහෙන කොටස් දෙකක් ගෙන මෙනෙහි කටයුතු ඒ දෙක අතුරෙන් ද වඩාත් වැටහෙන එක් කොටසක් ගෙණ එය නැවත නැවත මෙනෙහි කරන්නේ නම්, ඔහුගේ සිත අර්පණා බවට පැමිණේ.

තල්ගස් දෙතිසක් ඇති තල් වනයෙක්හි වසන්නාවූ වඳුරකු අල්වාගනු කැමැති එක් වැද්දෙක් පළමු තල් ගසෙහි පත්‍රයට හීයෙන් විද හඬ නගන්නේය එකල්හි ඒ වඳුරු තෙම පිළිවෙළින් ඒ ඒ තල්ගසෙන් තල්ගසට පැන කෙළවර තල්ගසට යන්නේය. වැදිතෙමේද ගසින් ගස තල්පත් හීයෙන් විද කෙළවර ගස දක්වා විදිමින් යන්නේය. එතැන සිටි වඳුරා නැවත ආපසු හැරී ගසින් ගසට පැන ක්‍රමයෙන් පළමු ගස දක්වා එන්නේය වැදි තෙමේද වඳුරා පසුපසුයෙහි ක්‍රමයෙන් විදිමින් පළමු ගස දක්වා යයි. මෙසේ දෙදෙනාම මුල් තල්ගස සිට අග ගස දක්වා ද, අග සිට මුල් ගස දක්වා ද පිළිවෙලින් යන්නාහ, වඳුරුතෙම එක් නොවිදපු තල් ගොබයක් දැඩි කොට අල්වාගෙන ඉදින් විදිනු ලබන්නේවිනමුත් අත් නොහරින්නෙමියි සිතමින් එක්තැන්ව සිටී. මේ උපමාවෙහි තාලවනයෙහි දෙතිස් තල්ගස්හු යම්සේ ද, එමෙන් මේ රූප කයෙහි දෙතිස් කුණපයන් දතයුතු. වානරයා මෙන් චිත්තයද, වැද්දා මෙන් යොගාවචරයා ද, වානරයාගේ දෙතිස් තලක් ඇති තල් වනයෙහි විසීම මෙන් යොගීහුගේ චිත්තයාගේ දෙතිස් කුණප කොටස් ඇති රූප කායයෙහි අරමුණු කිරීම් වශයෙන් නැවත නැවත පැවැත්මද දතයුතු. වැද්දා විසින් මුල පටන් පිළිවෙලින් තල්පත් විදිනු ලබන කල්හි වානරතෙම මුල් ගස සිට අග දක්වා යන්නාක් මෙන් යොගාවචරයාගේ කෙසා යයි මෙනෙහි කරන්නට ආරම්භ කළ තැන් පටන් අග දක්වා මෙනෙහි කිරීම

දතයුතු. වාතරයා වැද්දාගේ හී පහරින් වළකිනු සඳහා ගසින් ගසට ගොස් එක් ගසෙක්හි තදකොට අල්වාගෙන සිටින්නක්හු මෙන් ප්‍රකට වූ එක් අරමුණක් හෙවත් කොටඨාසයක් ගෙන මෙනෙහි කිරීම දතයුතු.

7 **අර්පණා වශයෙන්** යනු කෙසාදීන් අතුරෙන් එකී එකී කොටසෙහි අර්පණාප්‍රාප්ත වීමය.

8 **අධිචිත්ත සූත්‍රයෙහි** වදාළ පරිදි යනු අධිචිත්තය හෙවත් සමථ විදර්ශනා වඩන්නා වූ යෝගාවචරයා විසින් තුන් අරමුණක් කලින් කල මෙනෙහි කිරීමය. එනම් කලින් කල

(1) **සමාධි නිමිත්තය** හෙවත් සමාධියට කරුණු වූ අරමුණු ආවර්ජනා කටයුතු.

(2) කලින් කල **පග්ගහ නිමිත්ත** හෙවත් වීර්‍යයට කරුණු වූ අරමුණ ආවර්ජනා කටයුතු.

(3) කලින් කල **උපෙක්ඛා නිමිත්ත** හෙවත් තත්‍ර මධ්‍යස්ථතා ලක්ෂණයට කරුණු වූ අරමුණු ආවර්ජනා කටයුතු.

ඉදින් **සමාධි නිමිත්තම** ආවර්ජනය කරන්නේ නම් කුසීත බව ඇතිවීමට කරුණු ඇත. **පග්ගහ නිමිත්තම** ආවර්ජනය කරන්නේ නම් **උද්ධච්චය** ඇතිවීමට කරුණු ඇත. **උපෙක්ඛා නිමිත්තම ආවර්ජනය** කරන්නේනම් ඔහුගේ සිත ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම පිණිස සමාහිත නොවීමට කරුණු ඇත. එබැවින් කලින් කල **සමාධි නිමිත්ත ද**, කලින් කල **පග්ගහ නිමිත්ත ද**, කලින් කල **උපෙක්ඛා නිමිත්ත ද** මෙනෙහි කළයුතු.

රන්කරුවෙක් හෝ ඔහුගේ අතවැසියෙක් හෝ කෝවය බැඳ, කෝව මුව දල්වා හඬුවෙන් රන අල්වාගෙන කෝව මුවෙහි බහා කලින් කල පිඹියි. කලින් කල දිය ඉසියි. කලින් කල උපෙක්ෂා වශයෙන් බලා සිටියි.

එසේ නොකොට ඔහු නිතරම පිඹින්නේනම් ඒ රන හුනුවී ද යන්නට කරුණු ඇත නිතරම ජලය ඉසීනම් ඒ රන සීතව නිවී යාමට කරුණු ඇත. නිතරම උපෙක්‍ෂාවෙන් බලා සිටී නම් ඒ රන පැසීමට නොයන්නේය. නමුත් ඔහු සිහියෙන් යුක්තව කලින් කල පිඹිනම් කලින් කල දිය ඉසී නම් කලින්කල උපෙක්‍ෂාවෙන් සිටිනම් ඒ රන කර්මණ්‍ය භාවයට හා පරිශුද්ධ භාවයට පත්වී කැමති කැමති ආභරණ සාදාගැනීමටත් හැකි වන්නේය.

එමෙන්ම සමථ විදර්ශනා වඩන්නාවූ යෝගාවචර තෙමේ කලින් කල සමාධි නිමිත්ත ද, කලින් කල පග්ගහ නිමිත්ත ද කලින් කල උපෙක්ඛා නිමිත්ත ද ආවර්ජනය කරන්නේ නම් ඔහුගේ ඒ අධිචිත්තය, ආශ්‍රවයන්ගේ ක්‍ෂයවීම පිණිස ද, ඍද්ධිවිධාදී අභිඥවන් සාක්‍ෂාත්කර ගැනීමට ද යොග්‍ය බවට පැමිණේ.

9. සීති භාව සූත්‍රයෙහිදී කරුණු සයක් නිර්මාණය නොහොත් කෙලෙශදාහ ව්‍යූපසමය පසක් කරන්නට පොහොසත් බව වදාරා තිබේ. එනම්:-

(1) **නිග්‍රහ කිරීම** නොහොත් භාවනානුයොගී පුද්ගලයා විසින් තම සන්තානයෙහි උද්ධච්ච ථිනමිද්ධාදි නිග්‍රහ කටයුතු ධර්මයන් ඇති කල්හි ඒ සිතට නිග්‍රහ කෙරෙයි.

(2) **ප්‍රග්‍රහ** නොහොත් වීර්‍ය්‍ය කටයුතු කල්හි වීර්‍ය්‍යය කෙරෙයි.

(3) **සම්පහංසනය** හෙවත් සිත තොස පත් කළයුතු හෙවත් පැහැපත් කළයුතු කල්හි පැහැපත් කෙරෙයි.

(4) **අජ්ඣුපෙක්ඛා** නොහොත් සිත අලීනව, අනුද්ධතව, මනාකොට භාවනා වීථියට බැසගත් කල්හි නිග්‍රහ, ප්‍රග්‍රහ, සම්පහංසනාදිය නොකොට මැදහත්ව විසීම කෙරෙයි.

(5) උතුම් මාර්ගඵලයන්හි අදහස් ඇත්තෙක්ද වේ.

(6) නිවන් පතන්නෙක්ද වේ.

10 **බොජ්ඣඞ්ග කෞශල්‍ය** සූත්‍රයෙහි දක්වනලද පරිදි සප්තබෝධ්‍යාඞ්ග ධර්මයන් ද වැඩිවියයුතු වේ.

මෙසේ ආචාර්‍ය්‍යයන් වහන්සේ විසින් සප්තවිධ වූ උග්‍රහ කෞශල්‍යයද, දසවිධ වූ මනසිකාර කෞශල්‍යයද ඇති කරවීමෙන් කමටහන මනාකොට ඉගැන්විය යුතු.

මෙපරිද්දෙන් කමටහන උද්ග්‍රහණය කළ පුද්ගල තෙමේ කමටහන් වැඩීමට හෙවත් භාවනාවට නුසුදුසු වූ සෙනසුන් හැර මහාවාසාදි අටළොස් සෙනසුන් දෙසින් තොර වූ සුදුසු වූ සෙනසුනක වසන්නේ දීඝ කෙස් නිය හරණාදි වශයෙන් කුඩා පළිබොධයන් දුරුකොට රාග චරිත පුද්ගලයෙක් වීනම් ඔහු විසින් පළමුකොට රාගය දුරු කටයුත්තේද, එහෙයින් මෙ පටික්කූල මනසිකාර-යෙහි පරිකර්මය කටයුතු.

පරිකර්මභාවනා කරන්නාවූ යොගාවචරයා විසින් පළමු කොට කෙස්හි අසුභාකාර නිමිත්ත ගතයුතු. ඉක්බිති අනිකුදු කොටස් පිළිවෙළින් ගෙන මෙනෙහි කටයුතු. මෙසේ සියලුම කොටස් **වර්ණය, සටහනය, දිශාය, අව කාශය, පරිච්ඡෙදය** යන මොවුන්ගේ වශයෙන් නිශ්චය කොට, **වර්ණය, සටහනය, ගන්ධය, නිශ්‍රය, අවකාශය** යන මොවුන්ගේ වශයෙන් පස් ප්‍රකාරයකින් පිළිකුල් බැව් නිශ්චය කටයුතු. අනුලොම පටිලොම වශයෙන් මෙසේ මෙනෙහි කරන්නාහට කෙසාදි ප්‍රඥප්තිය ඉක්ම වීම් වශයෙන් යම්සේ ඇස් ඇත්තාවූ පුරුෂයාහට දෙතිස් වැදෑරුම් වර්ණවත්වූ කුසුමයන්ගේ එක්හුයෙහි ගෙතූ මල් දම බලනුවනට සියලු පුෂ්පයෝ පෙරපසුනොව එකවට මෙන් ප්‍රකටවූවාහු වෙද්ද, එපරිද්දෙන්ම මේ කයෙහි කෙස්හු ඇත්තාහ යනාදි වශයෙන් මේ කය බලනුවනට

වර්ණාදි වශයෙන් නිශ්චිතවූ පිළිකුල් ආකාරයෙන් වැටහුනු ඒ කොට්ඨාස ධර්මයන් පෙරපසු නුවූවාක් මෙන් හෙවත් එකවට මෙන් පහළ වෙත් බහිද්ධ සන්තානයෙහි හෙවත් පරසත්ත්වකායයෙහි ප්‍රතිකකුලමනසිකාරය එළ වූ ඒ යොගාවචරයාහට තම සිරුරෙහි පිළිකුල් බව වැටහුනු පරිද්දෙන්, පරසිරුරෙහිද සියලුම කොටසුන් පිළිකුල් වශයෙන් වැටහුණු කල්හි ඇවිදින්නාවූ සියලු මිනිස් තිරිසන් ආදී සත්ත්වයන්, සත්ත්ව පුද්ගල භාවය හැර කුණප කොට්ඨාස රාශියකගේ වශයෙන්ම වැටහෙයි. එසේ වැටහෙන කල්හි අනුපූර්ව මුඤ්චනාදී වශයෙන් හෙවත් නොවැටහෙන නොවැටහෙන කොටසුන් හැරපීම් ආදි වශයෙන් පිළිකුල්යහයි නැවත නැවත කෙසාදි කොට්ඨාසයන් මෙනෙහි කරන්නාවූ යොගාවචර මහණහට පිළිවෙළින් අර්පණා තොමෝ උපදී ඒ අර්පණාවට පළමුව ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ තියුණු බවත් සමබවත් ඇතිවී අශ්‍රද්ධාදීන් දුරුවීමෙන් ශක්තිමත්වූ කල්හි විතර්කාදි ධ්‍යානාඞ්ගයන්ට ඉදුරා ප්‍රතිපක්ෂ භාවයෙන් සිටි නීවරණයෝ ඔවුන් හා එක්ව උපන් පාප ධර්මයන් හා සමග යටපත්වූවාහුම වෙත්. එවිට උපචාර සමාධියෙන් සිත සමථ භාවයට පැමිණෙයි යෝගාවචරතෙමේ එම අරමුණ ආසේවනය කරමින් භාවනා කරමින්, බහුලීකෘත කරමින් අර්පණාවට පැමිණේ. ඒ වර්ණාදී වශයෙන් මෙනෙහිකොට ප්‍රතිකකූල වශයෙන් වැටහීගිය කොටසුන් අතුරෙන් කෙසාදීන්ගේ වර්ණ සටහන් ආදී වශයෙන් වැටහීම උග්ගහ නිමිත්ත නම් හැම අයුරින් පිළිකුල් වශයෙන් වැටහීම ප්‍රතිභාග නිමිත්ත නම්. මේ ප්‍රතිභාග නිමිත්ත නැවත නැවතත් ආවර්ජනය කරන කල්හි, මෙනෙහි කරන කල්හි තර්කයෙන් විතර්කයෙන් පිරිසිඳින කල්හි සතර නාමස්කන්ධයෝ පිළිකුල් බව අරමුණු කරමින් ප්‍රථමධ්‍යාන වශයෙන් අර්පණා සිත උපදී. ප්‍රථමධ්‍යානයට පූර්වකාලයෙහි උපදනා පරිකර්ම උපචාර චිත්තයෝ විතර්ක, විචාර, පීති, සුඛ යන ධ්‍යානාඞ්ගයන් සහිතය. සොමනස්සසහගතය. පිළිකුල් බව අරමුණුකොට

ඇත්තාහ. එයට අනතුරුව උපදනා අර්පණා සිත හෙවත් ප්‍රථම ධ්‍යාන සිතද සවිතක්ක සවිචාරය, සප්‍රීතිය, සොමනස්ස සහගතය, පිළිකුල් බව අරමුණු කොට ඇත්තේය. භූමි වශයෙන් රූපාවචරය, පිළිකුල අරමුණු කරන්නේ වී නමුත් එහි ආනිශංස දක්නා කල්හි සොමනස්සය උපදින බව සැලකියයුතු. එකම අරමුණක්හුගේ බලයෙන්ද සොම්නස උපදී.

මේ කුණප කොට්ඨාස සඞ්ඛ්‍යාත ආරම්මණය ඔළාරිකය. විතර්කයාගේ බලයෙන්ම විතෝතකශගතාවය උපදී එහෙයින් ප්‍රථමධ්‍යානය මුත් විතියධ්‍යානාදිය නූපදී.

කොට්ඨාස වශයෙන් ගෙන භාවනා කරන්නාවූ කල්හි ඇතැම් යෝගාවචරයෙක්හට ඒ ඒ කොට්ඨාස වර්ණ වශයෙන් වැටහෙන්නේය. පෙර භවයන්හිදී වර්ණ කසිණ භාවනා කොට පුරුදු ඇති හෙයින් ඔහට වර්ණයම ප්‍රකටව වැටහේ. ශරීරයෙහි කෙසාදී නිල්වූ කොටස් නීල වර්ණය වශයෙන්ද රන්වන් පැහැ ඇති තැන් පීත වර්ණ වශයෙන්ද, රත්පැහැ ඇතිතැන් ලොහිත වර්ණ වශයෙන්ද යනාදී ක්‍රමයෙන් වර්ණ වශයෙන් ප්‍රකට වෙත්. එවිට ඔහු ඒ වර්ණ කසිණය වඩා පිළිවෙලින් චතුෂ්ක පඤ්චමධ්‍යානාදිය උපදවාගෙන එයම පාදක කොට විදසුන් වඩා මාර්ගඵල පිළිවෙලින් රහත් ඵලයට පැමිණේ.

ඇතැම් යොගාවචරයෙක්හට පෙර පටික්කූල මනසිකාරය කොට පුරුදු ඇති හෙයින් ඒ ඒ කොට්ඨාසයන්හි පිළිකුල් බවම ප්‍රකටව වැටහෙත්. එසේ පිළිකුල් බව අරමුණු කරමින් ප්‍රථම ධ්‍යානය උපදවාගෙන එය පාදක කොට විදර්ශනා වඩා රහත්ඵලයට පැමිණෙන්නේය.

ඇතැම් යොගාවචරයෙකුහට ඒ ඒ කොට්ඨාසයන් ධාතු වශයෙන් වැටහේ. පෙර භවයන්හිද ධාතු මනසිකාර කොට පුරුදු ඇති ඔහු මේ මේ කොටස් පඨවිලක්ෂණ ඇත්තේය. මේ මේ කොටස් ආපො ලක්ෂණ ඇත්තේය යනාදි වශයෙන්

සතර මහා භූත රූපයන් සහ උපාදාය රූපයන්ද රූපස්කන්ධය වශයෙන් මෙනෙහි කරන්නේය. තවද ඔහු බාර ආයතනාදි වශයෙන්ද මෙනෙහි කරන්නේය. එවිට ඔහට ආයතන බාරයන්ගේ වශයෙන් අරූපීවූ ස්කන්ධයෝ අරමුණු වෙත්. මේ රූපාරූප ධර්මයන් අරමුණු කරන කල්හි ඒ නාමරූප ධර්මයන් පඤ්චස්කන්ධ වශයෙන්ද, ඒ පඤ්චස්කන්ධයෝ බාදසායතන වශයෙන්ද, බාදසායතනයෝ අටළොස් ධාතු වශයෙන් ද වැටහෙත්.

නාමරූප ධර්මයන් ව්‍යවස්ථානය කරන ඒ යොගාවචර තෙමේ මේ නාමරූපයෝ හෙතු රහිතව නූපදින්නාහ. ප්‍රත්‍යයෙන් වෙන්ව නූපදී අවිද්‍යා, තණ්හා, කම්ම, ආහාර යන ප්‍රත්‍යයන්ගේ ශක්තියෙන්ම උපදී. අතීතාදී කාලවශ යෙන් බලන කල්හිද මේ ප්‍රත්‍යයෝම වෙත්. මෙහි සත්ත්ව යෙක් හෝ පුද්ගලයෙක් හෝ නැත. මෙයාකාරයෙන් සංස්කාර ධර්මයන් සම්මර්ශනය කොට හෙතෙම බුද්ධශාසන යෙහි ප්‍රතිෂ්ඨාව ලැබ නියත ගතිකවූ හෙවත් නියත සුගති ගති ඇති චුල්ලසොතාපන්න නම් පුද්ගල බවට පැමිණේ. මෙසේ රහත්ඵල ලැබීමට සුදුසු ඍතුසප්පාය, පුද්ගල සප්පාය, භොජන සප්පාය, ධම්ම සවණ සප්පාය ලැබ එක් අස්නෙක හිඳ තිලකුණු නඟා විදසුන් පිළිවෙළින් සංස්කාර ධර්මයන් සම්මර්ශනය කරන්නේ රහත් ඵලය ලබයි.

මෙසේ කායානුපස්සනා සතිපට්ඨානය වඩන්නාවූ යොගාවචර තෙමේ දෙතිස් කුණප කොට්ඨාසයන්හි **එක්සිය සැට නිමිත්තක්** දක්නේය. එනම් එක් කොට්ඨාසයක **වර්ණ නිමිත්තය, සංස්ථාන නිමිත්තය, දිසා නිමිත්තය, ඔකාස නිමිත්තය, පරිච්ඡෙද නිමිත්තය** යන පඤ්ච ප්‍රකාර නිමිති වශයෙන් දෙතිස් කොට්ඨාසයන්හි එක්සිය සැට (160) නිමිති වන්නේය.

**ලක්ෂණ** වශයෙන් බලන්නාවූ ඔහු එක්සිය අටවිස්සක් ලක්ෂණ දකින්නේය. එනම් **එක්** කොට්ඨාසයෙක්හි මේ **තද බවය යි කියනලද ලක්ෂණය, මේ බැඳ ගලපන බවයයි**

කියනලද **ලක්‍ෂණය**, මේ **උණුසුම්** බවයයි කියන ලද ලක්‍ෂණය, මේ **විෂ්ටම්භනය** හෙවත් හම්මවන බව යයි කියන ලද ලක්‍ෂණය යන සතරවිධ ලක්‍ෂණයන්ගේ වශයෙන් දෙතිස් කොට්ඨාසයන්හි එක්සිය අටවිසි (128) ලක්‍ෂණයන් දකිත්.

**ධාතු** වශයෙන් බලන්නාවූ ඔහු විසින් එක්සිය අටවිසි (128) ධාතු කෙනෙක් දක්නා ලැබේ. කෙසාදී එක් එක් කොට්ඨාසයෙක්හි කැකුළු බව, රළු බව, දැඩි බව **පඨවි ධාතු** නම්. බැඳෙන බව **ආපෝධාතු** නම්, උණුසුම් බව තියුණු බව **තෙජෝධාතු** නම්, හම්මන බව, රැකුල් දෙන බව **වායො ධාතු** නම්. මේ ආදි වශයෙන් දෙතිස් කොට්ඨාසයන්හි එක්සිය අටවිසි ධාතු කෙනෙක් දක්නා ලැබේ.

සූන්‍ය වශයෙන් මෙනෙහි කරන්නාවූ ඔහු විසින් එක් එක් කොට්ඨාසෙහි ත්‍රිවිධ සූන්‍යතා වශයෙන් සයානූවක් (96) සූන්‍යතාවෝ දක්නා ලැබේ. එනම් **ආත්ම සූන්‍යතාය, ආත්මිය සූන්‍යතාය, නිත්‍යභාව සූන්‍යතාය** වශයෙන් දෙතිස් කොට්ඨාසයන්හි සයානූවක් සූන්‍යතාවෝ වෙත්.

ස්කන්‍ධාදි වශයෙන් මෙනෙහි කරන්නාවූ යොගාවචර තෙමේ කෙසාදීවූ කොටසුන්හි මෙතෙක් ස්කන්‍ධයෝය මෙතෙක් ආයතනයෝය, මෙතෙක් ධාතූහුය, මෙතෙක් සත්‍යයෝය මෙතෙක් සතිපට්ඨානයෝය යනාදි වශයෙන් මෙනෙහි කරන්නේය.

මෙසේ මේ යොගාවචරතෙමේ කායානුපස්සනා වඩන්නේ අධ්‍යාත්ම රූප කයෙහි ද, පරසන්තානගත රූපකයෙහිද, අධ්‍යාත්මික බාහිර රූප කායයන්හිද පිළිකුල්බවම නිස්සාර බවම නැවත නැවත අරමුණු කරමින් වාසය කරන්නේය. හෙතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන්ද යුක්තව සම්පජඤ්ඤයයි කියන ලද නුවණින් වාසය කරන්නේ සම්මා සතියෙන් යුක්තව භාවනා අරමුණ නොහැර වඩන්නාවූ

කල්හි මේ පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත ලෝකයෙහි යථා තත්ත්ව යෙන් වැටහීම හෙතුකොට ගෙන අභිධ්‍යා දෞමනස්සයන්ගේ තදඞ්ග විෂ්කම්භන ප්‍රහාණ වශයෙන් නැති කිරීමෙන් නීවරණාදී කෙලෙශ ධර්‍මයන් පහව යන්නේය.

මෙපරිද්දෙන් රූ කය නැවත නැවත දක්ණා නුවණ නම් ලද අනුදර්‍ශනා වෙන් කමටහනද, සතර ඉරියව් වැවූමෙන් කමටහනෙහි නියුක්ත යොගාවචර මහණහුගේ ශරීර පරිහරණයද, වීර්‍ය්‍යයෙන් සතර සම්‍යග් ප්‍රධානයද, සමාධි ප්‍රඥවෙන් කමටහන රැක්මට කරුණුවූ උපාමගද, නොහොත් කායානු දර්‍ශනාවෙන් ලබන ලද සමථයද, ප්‍රඥවෙන් ලබනලද විදර්‍ශනාවද, අභිධ්‍යා දෞමනස්සයන් ගේ ප්‍රහාණයෙන් භාවනාවෙන් පැමිණිය යුතු ඵලයද භාග්‍ය-වතුන් වහන්සේ වදාළසේක.

## වෙදනානුපස්සනා සතිපට්ඨානය

**වෙදනානුපස්සනා සතිපට්ඨානය** වඩන්නාවූ යොගා-වචර තෙමේද, කායානුපස්සනා භාවනාවට කී පරිද්දෙන්ම සියලු කටයුතු සම්පූර්‍ණකොට කමටහන විධි ලෙස ඉගෙණ සුදුසු තැනක පහසු ඉරියව්වකින් වාසය කරමින් වැඩිය යුතු. මෙහිදී වෙදනාව, වෙදනාව අනුව නැවත නැවත බලමින්, තමා පිළිබඳවූද, පරසන්තාන පිළිබඳවූද, අධ්‍යාත්ම බාහිර සන්තාන පිළිබඳවූද, වෙදනාව අරමුණු කරමින් වාසය කිරීම දක්වනු ලැබේ.

වෙදනානුපස්සනාවට අරමුණු වන්නාවූ වෙදනාවෝ නවප්‍රකාරයකින් සංග්‍රහ කොට වදාරා තිබේ. එනම්:

1. සුඛ වෙදනා
2. දුක්ඛ වෙදනා
3. අදුක්ඛමසුඛ දෙනා
4. සාමිස සුඛ වෙදනා
5. නිරාමිස සුඛ වෙදනා

6. සාමිස දුක්ඛ වේදනා
7. නිරාමිස දුක්ඛ වේදනා
8. සාමිස අදුක්ඛමසුඛ වේදනා
9. නිරාමිස අදුක්ඛමසුඛ වේදනා

1. **වේදනානුපස්සනාව** වඩන්නාවූ යෝගාවචරතෙම පළමු කොට **"සුඛං වේදනං වේදියමානො සුඛං වේදනං වේදියාමීති පජානාති"** යනාදි වශයෙන් දක්වන ලද පරිද්දෙන් කායික වූ හෝ චෛතසික වූ හෝ සැප වේදනාව විඳින්නා වූ හෙතෙමේ, මම සැප වේදනාව විඳිමියි මෙනෙහි කළ යුතු වේ.

මෙහි **විඳීම** යන්නෙන් හෙවත් වේදනාව දැනීම යන්නෙන් **සත්ත්වය** යන දැනීම නොහොත් **සත්ත්වය** යන ලබ්ධිය අත්හරින්නාවූ ද, **සත්ත්වය යන** සංඥාව උගුලුවා, කමටහනක් වශයෙන්ද, සතිපට්ඨානයක් වශයෙන්ද වේදනාවගේ දැනීම බව දත යුතු. සත්ත්වය යන දැනීම ලබ්ධියය. සංඥාව අත් නොහරින්නා වූ ද, කමටහනක් සතිපට්ඨානයක් වශයෙන් නොපවත්නාවූ ද වේදනාවගේ දැනීම මෙහිදී අදහස් නො කරන ලදී.

අනුපස්සනා වශයෙන් නැවත නැවත වේදනාව බලන්නාවූ හෙවත් මෙනෙහි කරන්නාවූ යෝගාවචර තෙමේ මේ **සුඛ වේදනාව** කිනම් පුද්ගලයෙක් විඳීද, කිනම් පුද්ගලයෙක්හුගේ වේදනාවද, හෙවත් කිනම් කරුණකින් වේදනා නම් වේද යනාදි වශයෙන් නුවණින් මනාකොට විසඳා දතයුතු.

වේදනාවට විඳින්නාවූ සත්ත්වයෙක් හෝ පුද්ගල-යෙක් හෝ නැත. එමෙන්ම මේ වේදනාව සත්ත්වයෙකුගේ හෝ පුද්ගලයෙකුගේ හෝ වේදනාවක් නොවේ. මේ වේදනාව තමාගේ උත්පත්තියට කාරණා වූ අර්ථයෙන් වස්තු නම් ලද අරමුණ ඇත්තී වේ. නොහොත් වස්තු

සඞ්ඛ්‍යාත ආලම්බණය ඇත්තාවූ ධර්ම ජාතියක් වේ. මෙසේ සුඛාදීන්ගේ වස්තුභූතවූ අරමුණ අරමුණුකොට වෙදනාතොමෝ විඳී යයි සලකන්නාවූ යොගාවචර තෙමේ සැප වෙදනාව විඳිමියි කියා දනී.

පෙර එක්තරා තෙරනමක් ගිලන් වූ කල්හි බලවත්වූ දුක්ඛ වෙදනාවෙන් කෙඳිරිගාමින් ඈත මෑත පෙරළෙමින් සිටිනු දැක එක්තරා නවක භික්ෂුවක් 'වහන්ස, නුඹ වහන්සේගේ කවර තැනෙක් රිදේදැයි' ඇසුවේය. එවිට ඒ තෙරහු ඇවැත්නි, වෙන් වශයෙන් රිදෙන තැනෙක් නම් නැත. වෙදනාවට වස්තු වූ අරමුණු අරමුණුකොට වෙදනාතොමෝ විඳී යයි කී කල්හි, වහන්ස, ඉවසීම මැනවැයි කීය. එවිට රෝගය උත්සන්නවී ශස්ත්‍රකවාතය තෙමේ හදවත දක්වා පැලී ඇඳෙහි අතුණුහු රැස්ව සිටි කල්හි නවක භික්ෂුවට එය දක්වා මෙපමණ වූ ඉවසීමක් වටීදැයි ඇසීය. නවක භික්ෂුව නිශ්ශබ්දවිය. ස්ථවිරයන් වහන්සේ වීර්‍ය්‍ය හා සමාධිය වඩා ලොකෝත්තර වූ සිව්පිළිසිඹියාවන් හා සමග රහත් ඵලයට පැමිණ සමසීසීව පිරිනිවන් පෑ සේක හෙවත් අර්හත් මාර්ගඵල පදප්‍රාප්තව ඉත් තැග මාර්ග ප්‍රත්‍යවෙක්ෂණ, ඵල ප්‍රත්‍යවෙක්ෂණ, නිර්වාණ ප්‍රත්‍යවෙක්ෂණ, ප්‍රහීණකෙලශ ප්‍රත්‍යවෙක්ෂණ වාරයට අනතුරු වූ චිත්තවාරයෙහි අනුපාදිශෙෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවී සේක.

රූප කමටහන, අරූප කමටහන යන ද්විවිධ කමටහන් අතුරෙන් අරූප කමටහන දෙශනා කරන්නාවූ භාග්‍යවතුන් වහන්ශස් බොහෝසෙයින් වෙදනාවගේ වශයෙන්ම දෙශනා කළ සේක. ඒ අරූපකමටහන **ස්පර්ශ වශයෙන්ද, වෙදනා වශයෙන් ද, චිත්ත වශයෙන් ද** යන ත්‍රිවිධාකාරයෙන් දක්වනු ලැබේ. -යම් යොගාවචරයෙකු හට රූප කර්මස්ථානය වඩනා කල්හි ඒ කර්මස්ථානභූතවූ ආලම්බනයෙහි චිත්ත චෛතසික-යන්ගේ පළමුව හට්ගැනීමේදී ඒ අරමුණු ස්පර්ශ කරන්නාවූ කල්හි ස්පර්ශය තෙම ප්‍රකට වේ. ඇතැම් යොගාවචරයෙකුහට

ඒ අරමුණු විඳීම් වශයෙන් උපදනා වේදනාව ප්‍රකටව පහළවේ. ඇතැම් කෙනෙකුට අරමුණ මෙනෙහි කරන කල්හි අරමුණ දැනීම වශයෙන් උපදනා විඤ්ඤාණය හෙවත් සිත ප්‍රකට වේ.

ඒ ත්‍රිවිධ පුද්ගලයන් අතුරෙන් යම් පුද්ගලයෙකුහට ස්පර්ශය තෙම ප්‍රකටව පහළවේද ඔහුට **ස්පර්ශය** පමණක් නූපදී. ඒ අරමුණම විඳින්නාවූ **වේදනා තොමෝ ද,** ඒ ස්පර්ශය හා සමගම අරමුණ හඳුනන්නාවූ **සංඥා තොමෝ ද** ආලම්බණග්‍රහණයෙන් යථාරූපවූ සම්ප්‍රයුක්ත ධර්මයන් අරමුණෙහි යොදන්නාවූ නොහොත් කර්ම සිද්ධිය කරන්නාවූ **චේතනා තොමෝ ද,** අරමුණු වෙසෙසින් දන්නාවූ **විඤ්ඤාණය තෙමේ ද** උපදී. මෙසේ ඔහු ඵස්සපඤ්චකය හෙවත් ස්පර්ශය හා යුක්තවූ ධර්මයන් පස්දෙනෙකුන්ම සම්මර්ශනය කෙරෙයි.

එමෙන්ම වේදනාව ප්‍රකටව පහළවන්නාවූ පුද්ගලයාහට ද විඤ්ඤාණය ප්‍රකටව පහළවන්නාවූ පුද්ගලයාහට ද මේ ඵස්සාදී ධර්ම පඤ්චකයම පහළවන බැවින් ඒ ධර්මයන් පස්දෙනෙකුන්ම සම්මර්ශනය කෙරෙයි.

එවිට ඒ යොගාවචරතෙම ඵස්ස පඤ්චක වූ මේ ධර්මයෝ තුමූ කුමක් ඇසුරු කොළෙෝ දැයි ආවර්ජනය කරණුයේ **වස්තුව නම් වූ** මේ කරජකාය ඇසුරු කළහයි නුවණින් දනී. ඒ කරජකායද, සවරූප වශයෙන් භූතොපාදාය රූප සමුදාය බව දනී. මෙසේ වස්තු ස්පර්ශපඤ්චක ධර්මයන් අතුරෙන් වස්තු නම්වූ කරජකාය තෙමේ **රූප ධර්ම** නමැයි ද, ස්පර්ශ පඤ්චක ධර්මයෝ **නාම ධර්මයයි ද** දනී. මේ නාමරූපයම දක්නාවූ හෙතෙම රූපය තෙමේ **රූපස්කන්ධය** යයි ද, නාමය තෙමේ චතුර්විධ වූ **අරූපී වූ ස්කන්ධයෝ** ය යි ද, පඤ්චස්කන්ධ මාත්‍ර වශයෙන් දක්නේය. මේ නාමරූප ධර්මයන් කෙරෙන් විනිර්මුක්ත වූ පඤ්චස්කන්ධයෙක් හෝ පඤ්චස්කන්ධයෙන් විනිර්මුක්ත වූ නාමරූප ධර්මයෙක් හෝ නැත්තේය.

අනතුරුව හෙතෙමේ මේ පඤ්චස්කන්ධයෝ තුමූ කුමක් හේතුකොට ඇත්තාහුදැයි පරීක්ෂා කරනුයේ අවිද්‍යාදිය හේතුකොට ඇත්තාහයි දක්නේය. ඒ ප්‍රත්‍ය දර්ශනයෙන් මත්තෙහි ප්‍රත්‍යයම වූ ද, ප්‍රත්‍යොත්පන්නම වූ ද මේ ධර්ම ස්වභාවය තෙම අන් සත්ත්වයෙක් හෝ අන් පුද්ගලයෙක් හෝ නොවේය, හුදෙක් සංස්කාර ධර්ම සමූහ මාත්‍රයක්මැ යි මෙසේ ප්‍රත්‍යයන් හා එක්ව පවත්නා නාමරූප ධර්මයන් වශයෙන් තිලකුණු නගා විදසුන් නැණ පිළිවෙලින් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යැයි මෙසේ සම්මර්ශනය කරමින් වාසය කෙරෙයි. හෙතෙම ප්‍රතිවේධය හෙවත් මාර්ගාධිගමය අද අද යැයි කැමැති වෙමින් වාසය කරන්නේ එබඳු වූ දිනෙක උතුසප්පාය හෙවත් සත්ප්‍රාය වූ ඍතුවක් හෝ, පුග්ගල සප්පාය හෙවත් සත්ප්‍රායවූ පුද්ගලයෙකු හෝ, භොජන සප්පාය හෙවත් සත්ප්‍රාය වූ භෝජනයක් හෝ, ධම්මසවණ සප්පාය හෙවත් සත්ප්‍රාය වූ ධර්මශ්‍රවණයක් හෝ ලැබ එක් පර්යඞ්කයෙක්හිම හිඳගෙන විදර්ශනා කර්මස්ථානය මුදුන් පමුණුවා අර්හත් ඵලයෙහි පිහිටයි.

ස්පර්ශයාගේ වශයෙන් හෝ විඥානයාගේ වශයෙන් හෝ වදුරණු ලබන්නාවූ අරූප කර්මස්ථානය ප්‍රකට නොවේ. අඳුරු වූවක්හුමෙන් වැටහෙයි. වෙදනාවගේ වශයෙන් වනාහි ප්‍රකට වන්නේය. වෙදනාවගේ ඉපදීම ප්‍රකටවන හෙයිනි. වෙදනාවන් අතුරෙන් ද සුඛ දුක්ඛ වෙදනාවන්ගේ ඉපදීම ප්‍රකටය. යම් කලෙක සුඛ වෙදනාව උපදීද, එකල්හි මුළු ශරීරය කලඹමින්, මඩිමින් පතුරමින් ගල්වන්නක්හු මෙන් හෝ ඉසින්නාක්හුමෙන් සියක්වර හුණුකොට දියෙහි ලා නගාගත් ගිතෙලක් කවන්නක්හුමෙන්, දිය කල දහසකින් නැව්ලිය හෙවත් විඩාව සන්සිඳවීමක් මෙන් ''අහො සුඛං අහො සුඛං'' යි ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කරවමින්ම උපදී.

යම් කලෙක දුක්ඛ වෙදනාව උපදීද, එකල්හි මුළු සිරුර කලඹමින්, මඩිමින්, පතුරමින්, ගල්වන්නක්හු මෙන්,

ඉසින්නක්හු මෙන් කෙරෙමින්, ගිනියම් කළ දම්වැලකින් වෙළන්නාක්මෙන් හුණු තඹ ලෝදියෙන් ඉසින්නක්හු මෙන් වියලි තණ පඳුරු ඇති වනයෙහි දර ගිනිහුළු මිටියක් බහාලන්නක්හු මෙන් "අහො දුක්ඛං, අහො දුක්ඛං"යි නන්දෙඩවමින්ම උපදී.

මෙපරිද්දෙන් සුඛ දුක්ඛ වේදනාවන්ගේ ඉපදීම ප්‍රකට වේ.

**අදුක්ඛමසුඛ** සඞ්ඛ්‍යාත **උපෙක්ෂා වේදනා** තොමෝ වනාහි දැක්වීමට දුෂ්කරය. අඳුරක් මෙන් ප්‍රකාශ නොවේ. උපෙක්ෂා වේදනා තොමෝ සුවදුක් දෙදෙනාගේ පහවීමක් ඇතිකල, සුවදුක් දෙදෙනා ප්‍රතික්ෂෙප කිරීම් වශයෙන් හා උදාසීනාකාර භාවයෙන් වටහා ගන්නාහට ප්‍රකට වේ. වනලැහැබෙක්හි මුවෙකු පසුපස්සෙහි එළවා යන වැදි තෙමේ, මුවාගේ පා සටහන් දැක මුවා ගිය මග යන්නේ, ගල්තලාවක් දැක, එයින් නැග ගිය මුවා ඉන් ඔබ්බෙහි තබනුලැබූ පා සටහනින් ගල්තලාවෙහි මේ මගින් යන්නට ඇතැයි නිශ්චය කරගන්නාක්මෙන් සුඛ දුක්ඛ දෙදෙනාගේ අතර වූ උපෙක්ෂා වේදනාව දැනගනු ලැබේ. මුවා නැග ගිය තැන පා සටහන මෙන් සුඛ වේදනාවගේ ඉපදීම ද බැසගිය තැන පා සටහන මෙන් දුක්ඛ වේදනාවගේ ඉපදීමද ප්‍රකට වේ. මෙතැනින් නැංගේය, මෙතැනින් බැස්සේය, ගල මැදින් මෙසේ ගියේවනැයි වටහා ගැනීම මෙන් සුව දුක් දෙදෙනා පහව ගිය කල්හි සුව දුක් ප්‍රතික්ෂෙප කිරීම් වශයෙන් උදාසීනාකාරයෙන් උපදනා වෙදනාතොමෝ **අදුක්ඛමසුඛ** වේදනා නමැයි වටහා ගන්නහු හට ප්‍රකට වේ.

මෙපරිද්දෙන්ම සාමිසවූ සුඛ, දුක්ඛ, උපෙක්ඛා වේදනා විඳිනා කල්හිද, නිරාමිසවූ සුඛ, දුක්ඛ, උපෙක්ඛා වේදනා විඳිනා කල්හිද ඒ බැව් නුවණින් දනිමින් වාසය කෙරෙයි මෙහි **සාමිසය** යනු පස්කම් සැපත් යයි කියනලද ආමිසයන් ඇසුරුකළාවූ ෂඩ්වාරයන් පිළිබඳ පැවති ෂඩ්විධවූ

වෙදනාවෝයි. **සාමිස සුඛවෙදනා** නම් ෂඩ්වාරයන් පිළිබඳ පැවැති ෂඩ්විධ වූ සොමනස් වෙදනාවෝ යි. **නිරාමිස සුඛ වෙදනා** නම් ෂඩ් වාරයන්හි පස්කම් සැපතින් නික්මීම ඇසුරුකළාවූ ෂඩ්විධ සොමනස් වෙදනාවෝ යි. **සාමිස දුක්ඛ වෙදනා** නම් ෂඩ් වාරයන්හි පස්කම් සැපත් යයි කියනලද ආමිසයන් ඇසුරු කළාවූ ෂඩ්විධ වූ දොම්නස් වෙදනාවෝ යි. **නිරාමිස දුක්ඛ වෙදනා** නම් ෂඩ් වාරයන්හි පස්කම් සැපතින් නික්මීම ඇසුරු කළාවූ ෂඩ්විධ වූ දොම්නස් වෙදනාවෝයි. **සාමිස අදුක්ඛමසුඛ වෙදනා** නම් ෂඩ් වාරයන්හි පස්කම් සැපත් යයි කියනලද ආමිසයන් ඇසුරු කළාවූ ෂඩ්විධ වූ උපෙක්ෂා වෙදනාවෝයි. **නිරාමිස අදුක්ඛම සුඛ වෙදනා** නම් ෂඩ්වාරයන්හි පස්කම් සැපතින් නික්මීම ඇසුරු කළාවූ ෂඩ්විධ උපෙක්ෂා වෙදනාවෝ යි.

මෙපරිද්දෙන් නවවිධ වූ වෙදනාවන් නැවත නැවත නුවණ නම්ලද අනුදර්ශනාවෙන් බලන්නා වූ යොගාවචර තෙමේ අධ්‍යාත්ම සන්තානගත වෙදනාවන් නැවත නැවත අරමුණු කරමින් වාසය කරන්නේය. එසේම පරසන්තානගත හෙවත් පරපුද්ගලයන් පිළිබඳ වෙදනාවන් ද අරමුණු කරමින් වාසය කරන්නේය. එසේම අජ්ඣත්තබහිද්ධ වශයෙන් කිසිකලෙක සවසන්තානය පිළිබඳ වෙදනාවන්ද කිසිකලෙක පරසන්තානගත වෙදනාවන්ද අරමුණු කරමින් වාසය කරයි.

## චිත්තානුපස්සනා සතිපට්ඨානය

චිත්තානුපස්සනා භාවනා වඩන්නාවූ යොගාවචර තෙමේ සොළොස් වැදෑරුම්වූ චිත්තයන් හැඳින විදර්ශනා සඞ්ඛ්‍යාත සම්මර්ශනය කොට අදහස් මුදුන් පමුණුවා ගන්නේය. ඒ සොළොස් වැදෑරුම් චිත්තයෝ නම්

1. සරාග චිත්තය
2. විතරාග චිත්තය
3. සදොස චිත්තය
4. වීතදොස චිත්තය
5. සමොහ චිත්තය
6. වීතමොහ චිත්තය

| | | | |
|---|---|---|---|
| 7. | සංඛිත්ත චිත්තය | 8. | වික්ඛිත්ත චිත්තය |
| 9. | මහග්ගත චිත්තය | 10. | අමහග්ගත චිත්තය |
| 11. | සඋත්තර චිත්තය | 12. | අනුත්තර චිත්තය |
| 13. | සමාහිත චිත්තය | 14. | අසමාහිත චිත්තය |
| 15. | විමුත්ත චිත්තය | 16. | අවිමුත්ත චිත්තය |

1. **සරාග චිත්තය** යනු අෂ්ටවිධ ලොභසහගත සිත්වලට නමෙකි.

2. **වීතරාග චිත්තය** යනු ලෞකික කුසලාව්‍යාකෘත හෙවත් කාමාවචර කුසල, විපාක, ක්‍රියා සිත් සූවිස්සය.

3. **සදෝස චිත්තය** යනු දෙසමූල දෞර්මනස් සහගත අකුසල් දෙසිතය.

4. **වීතදෝස චිත්තය** යනු කාමාවචර කුසල විපාක ක්‍රියා සිත් සූවිස්සය.

5. **සමොහ චිත්තය** යනු මොහමූල විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිත හා උද්ධච්ච සම්ප්‍රයුක්ත සිතද වේ.

මොහය සියලුම අකුසල් සිත්හි උපදනා බැවින් සමොහචිත්තයන් කෙරෙන් අන්‍යවූ දස අකුසල් සිත්ද මෙහි ඇතුළත් වේ.

6. **වීතමොහ චිත්තය** යනු කාමාවචර කුසල විපාක ක්‍රියා සිත් සූවිස්සය.

7. **සංඛිත්ත චිත්තය** යනු ථිනමිද්ධය අනුව ගිය හෙවත් ථිනමිද්ධයෙන් සමන්විත වූ, අරමුණු ගැන්මෙහි හැකිළ ගිය සිතය.

8. **වික්ඛිත්ත චිත්තය** යනු උද්ධච්ච සහගතවූ හෙවත් නානාලම්බණයන්හි වික්ෂිප්ත වූ සිතය.

9. **මහග්ගත චිත්තය** යනු රූපාවචරවූද අරූපාවචර වූද සිතය.

10 **අමහග්ගත චිත්තය** යනු කාමාවචර සිතය.

11. **සඋත්තර චිත්තය** යනු කාමාවචර සිතය.

12. **අනුත්තර චිත්තය** යනු රූපාවචරවූද අරූපාවචර වූද සිතය.

මේ සඋත්තර අනුත්තර චිත්තයන් අතුරෙහිද රූපා-වචර සිත සඋත්තරය, අරූපාවචර සිත අනුත්තරය.

13. **සමාහිත චිත්තය** යනු අර්පණාසමාධියක් හෝ උපචාර සමාධියක් හෝ ඇති සිතය.

14. **අසමාහිත චිත්තය** යනු උපචාර අර්පණා සඞ්ඛ්‍යාත උභය සමාධි විරහිතවූ සිතයි.

15 **විමුත්ත චිත්තය** යනු තදඞ්ග විමුක්ති, විෂ්කම්භන විමුක්තීන්ගේ වශයෙන් නීවරණයන් කෙරෙන් මනාසේ මිදුනු සිතය.

16 **අවිමුත්ත චිත්තය** යනු තදඞ්ග විමුක්ති විෂ්කම්භන විමුක්තීන්ගේ වශයෙන් නීවරණයන් කෙරෙන් නොමිදුනු සිතය.

මෙසේ තමාගේ සන්තානයෙහි උපදනා සොළොස් වැදෑරුම් වූ චිත්තයන්ද, බහිද්ධ සන්තානයෙහි උපදනා එකී චිත්තයන්ද, අජ්ඣත්ත බහිද්ධ වශයෙන් හෙවත් කලෙක තම සන්තානයෙහිද කලෙක පරසන්තානයෙහිද උපදනා එකී චිත්තයන්ද අරමුණු කරමින් සිහිනුවණින් යෙදී වාසය කරන්නාවූ යොගාවචර තෙමේ චිත්තානුපස්සනා වශයෙන් විදර්ශනා වඩා අර්හත් ඵලයට පැමිණෙන්නේය.

## ධම්මානුපස්සනා සතිපට්ඨානය

යට දක්වනලද සතිපට්ඨාන ධර්මයන් අතුරෙන් කායානුපස්සනාව කරණකොටගෙන රූපස්කන්ධ සම්මර්ශනය ද, වේදනානුපස්සනාව කරණකොටගෙන වේදනාස්කන්ධ සම්මර්ශනයද, චිත්තානුපස්සනාව කරණකොට ගෙන විඥානස්කන්ධ සම්මර්ශනයද වදාරණ ලදී. මෙතැන් සිට දක්වනු ලබන ධම්මානුපස්සනාව කරණකොට ගෙන සංඥාස්කන්ධ, සංස්කාරස්කන්ධ සම්මර්ශනය විස්තර කරණු ලැබේ.

මහා සතිපට්ඨානාදි සූත්‍ර දෙශනාවන්හි මේ ධම්මානුපස්සනාව පඤ්චප්‍රකාරවූ ධර්මයන්ගේ වශයෙන් සම්මර්ශනය කිරීම දක්වා ඇත. ඒ පඤ්චප්‍රකාර ධර්මයෝ නම්

1. **පඤ්ච නීවරණ ධර්ම**
2. **පඤ්චුපාදනස්කන්ධ ධර්ම**
3. **ෂඩ්විධ අධ්‍යාත්ම බාහිර ආයතන ධර්ම**
4. **සප්ත බොධ්‍යාඞ්ග ධර්ම**
5. **චතුරාර්‍ය්‍යසත්‍ය ධර්ම**

## නීවරණයන්ගේ වශයෙන් ධම්මානුපස්සනාව

මෙහිදී භාවනාවට අරමුණුවන්නාවූ නීවරණ ධර්ම පසෙකි. එනම් :

1. **කාමච්ඡන්ද නීවරණය**
2. **ව්‍යාපාද නීවරණය**
3. **ථිනමිද්ධ නීවරණය**
4. **උද්ධච්ච කුක්කුච්ච නීවරණය**
5 **විචිකිච්ඡා නීවරණය**

**කාමච්ඡන්ද නීවරණ මනසිකාරය—** කාමච්ඡන්දාදි නීවරණ ධර්මයන් පිළිබඳ විස්තරය අකුසල සංග්‍රහයේදී දක්වන ලදී මෙහිදී ඒ නීවරණ ධර්මයන් අරමුණුකොට භාවනා කරන පිළිවෙල පමණක් දක්වනු ලැබේ.

ධම්මානුපස්සනා වශයෙන් භාවනා වඩන්නාවූ යොගාවචර තෙමේ පළමුකොට තම සන්තානයෙහි අභිණ්හ සමුදාචාර වශයෙන් හෙවත් විටින් විට ඇසිරීම් පැවතීම් වශයෙන් කාමච්ඡන්දය පවත්නේදැයි බලා දැනගනී. එසේම තම සතන්හි නොපැවතීම් වශයෙන් හෝ පහව ගිය බැවින් අවිද්‍යමානවූ හෝ කාමච්ඡන්දය වේ නම් එය ද දනී.

සුභනිමිත්තෙහි අයොනිසොමනසිකාරය කාරණකොට ගෙන කාමච්ඡන්දයාගේ ඉපදීම වන්නේය. මෙහි කාමච්ඡන්ද යත් සුභාරම්මණයත් යන දෙකම සුභනිමිත්ත වේ. උපාය රහිතවූ මනස්කාරයද, අනිත්‍යයෙහි නිත්‍ය කියා හෝ දුකෙහි සුඛය කියා හෝ අනාත්මයෙහි ආත්මය කියා හෝ අසුභ යෙහි සුභය කියා හෝ මෙනෙහි කිරීම අයොනිසො මනසිකාරය නම් වේ. ඒ සුභ නිමිත්තයෙහි බොහෝ සේ සිත පවත්වන යොගාවචරයාහට කාමච්ඡන්දය උපදී. එසේම උපන් කාමච්ඡන්දයාගේ නැවත නැවත වැඩීම පිණිස විපුලත්වය පිණිසද පවතී.

අසුභ නිමිත්තයෙහි යොනිසො මනස්කාරයෙන් ඒ කාමච්ඡන්දයාගේ ප්‍රහාණය හෙවත් පැහීම වේ. මෙහි අසුභ යත්, අසුභාලම්බණයත් යන දෙකම අසුභ නිමිති වේ. උපායමනස්කාරයත්, අනිත්‍යයෙහි අනිත්‍යය කියා හෝ දුක්ඛයෙහි දුකය කියා හෝ, අනාත්මයෙහි අනාත්මය කියා හෝ අසුභයෙහි අසුභය කියා හෝ මෙනෙහි කිරීම යොනිසො මනසිකාරය නම් වේ. ඒ අසුභ නිමිත්තයෙහි බොහෝ සේ පවත්වන යොගාවචරයා හට කාමච්ඡන්දය ප්‍රහීණ වේ එසේම නූපන් කාමච්ඡන්දයාගේ නොඉපදීම පිණිසද පවත්නේය.

එසේම අසුභාලම්බනය ඉගෙණීමය, අසුභ භාවනායෙහි නියුක්තවීමය, චක්ෂුරාදී ෂඩෙන්ද්‍රියයන්හි පියතලද දොර ඇතිබවය, භොජනයෙහි ප්‍රත්‍යවෙක්ෂණ මාත්‍රඥාදී ඥාන ඇති බවය, කල්‍යාණ මිත්‍රයන් ඇති බවය, සත්ප්‍රාය කථා ඇති බවය යන මේ ෂඩ්කාරණයෝ කාමච්ඡන්දයාගේ පැහීම පිණිස පවතිත්.

මේ ෂඩ්විධ ධර්මයන් හෙතුකොට ගෙන ප්‍රහීනවූ කාමච්ඡන්දයාගේ මත්තෙහි නො ඉපදීම රහත් මග හෙතු කොට ගෙන වේ යයිද හෙතෙමේ දනී.

**ව්‍යාපාද නීවරණය** – පටිඝ නිමිත්තයෙහි අයොනිසො-මනසිකාරය කරණකොටගෙන ව්‍යාපාදයාගේ ඉපදීම වේ මෙහි පටිඝය යයි කියන ලද වෙෂයත්, පටිඝයට කාරණවූ ආලම්බනයත් යන දෙකම පටිඝ නිමිත්ත නම් ප්‍රතිඝ නිමිත්තයෙහි අයොනිසො මනසිකාරය බොහෝසේ පුරුදු කිරීම නූපන් ව්‍යාපාදයාගේ ඉපදීම පිණිසද, උපන් ව්‍යාපාදයාගේ නැවත වැඩීම පිණිසද, විපුලත්වය පිණිසද පවතී.

මෛත්‍රී සහගත චෙතොවිමුක්ති නම් ලද අර්පණා සමාපත්තියෙහි යොනිසොමනසකාරය බොහෝසේ පුරුදු කිරීම නූපන් ව්‍යාපාදයාගේ නො ඉපදීම පිණිසත්, උපන් ව්‍යාපාදයාගේ ප්‍රහාණය පිණිසත් නැවත නැවත නො-වැඩීම පිණිසත්, විපුලත්වය නොවන පිණිසත් පවතී. එසේම මෛත්‍රී කර්මස්ථානය ඉගෙනීමය, මෛත්‍රී වැඩීමෙහි නැවත නැවත වැර කිරීමය, කර්මය තමා අයත් කොට ඇතිබව ප්‍රත්‍යවෙක්ෂා කිරීමය, පටිසඞ්ඛානඥනය බහුල කොට ඇතිබවය, කල්‍යාණ මිත්‍රයන් ඇතිබවය, සත්ප්‍රාය කථා ඇතිබවය යන මේ ෂඩ්විධ ධර්මයෝ ව්‍යාපාදයාගේ ප්‍රහාණය පිණිස පවතිත්

ඕදිස්සක හෙවත් පුද්ගලාන්තරයක්හු උදෙසා පතුරණ මෛත්‍රිය, අනොදිස්සක හෙවත් සීමා හෙදය කිරීම් වශයෙන් පුද්ගලාන්තරයක්හු නො උදෙසා පතුරණ මෛත්‍රිය යන මොවුන් අතුරෙන් එක්තරා ක්‍රමයක් ඉගෙන ගන්නා යොගාවචරයා හට ව්‍යාපාදය ප්‍රහීණ වේ. ඕදිස්සකභාවය ගරු කටයුත්තෝය, අප්‍රියවත්හුය, යහළුවෝය, මධ්‍යස්ථ වූවෝය යන මොවුන්ගේ වශයෙන් දතයුතු. අනොදිස්සක භාවය සීමා හෙද කිරීම් වශයෙන් නොව හැමදෙනා කෙරෙහි එකස්වරූපවූ මෛත්‍රීභාවනාව වශයෙන් දතයුතු.

මෛත්‍රිය ගේ ඉගෙනීමද උපචාර සමාධිය දක්වා දතයුතුයි. උපචාර සමාධිය හිම්කොට උගත් මෛත්‍රියගේ නැවත නැවත සෙවනා බව මෛත්‍රි භාවනාව නම්.

තවද මේ මෛත්‍රී භාවනා තොමෝ **ඔධිසො ඵරණ මෙත්තා භාවනාය, අනොධිසො ඵරණ මෙත්තා භාවනාය, දිසා ඵරණ මෙත්තා භාවනාය** කියා ත්‍රිවිධ වේ. ඔවුනතුරෙන් සියලු සත්ත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ, සියලු පුද්ගලයෝ, සියලු ආත්මභාව පර්යාපන්නයෝ යන මොවුන් ගේ වශයෙන් පඤ්චවිධ වූ හෝ, සත්ත්වාදී වූ එකක් එකක් හු කෙරෙහි **අවෙරා හොන්තු, අබ්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු,** යන සතර පරිද්දෙකින් පවත්නා වශයෙන් විංශති විධවූ හෝ මෛත්‍රී භාවනා තොමෝ **අනොධිසො ඵරණ මෙත්තා භාවනා** නම්. සියලු ස්ත්‍රීහු, සියලු පුරුෂයෝ. සියලු ආර්‍ය්‍යයෝ, සියලු අනාර්‍ය්‍යයෝ, සියලු දෙවියෝ සියලු මනුෂ්‍යයෝ, සියලු විනිපාතිකයෝය යන සත්ත්ව සීමා කිරීම් වශයෙන් පැවති හෙයින් සප්තවිධවූ හෝ සප්තවිධ ස්ත්‍රීපුරුෂාදීන් විෂයෙහි අවෙරාහොන්තු යනාදි සතරාකාරයෙන් ගුණිතව අටවිසි වැදෑරුම් වූ හෝ මෛත්‍රි භාවනා තොමෝ **ඔදිසො ඵරණ මෙත්තා භාවනා** නම්. දසදිසාවන් කරණකොටගෙණ දිසාවන් සීමාකිරීම් වශයෙන් පැවති දසවිධ වූ මෛත්‍රි භාවනා තොමෝ **දිසා-ඵරණ මෙත්තා භාවනා** නමි. එක් එක් දික්හි සත්ත්වාදි යොගයෙන් හා අවෙරාදි යොගයෙන් විස්සෙක, ස්ත්‍රී පුරුෂාදී යොගයෙන් හා අවෙරාදියොගයෙන් අටවිස්සෙ කැයි එකතු කළ කල්හි අටසාළිසක් (48) ලැබෙයි. මෙසේ දසදිසාවන්ගේ වශයෙන් සාරසිය අසූවක් (480) ක්වූ මෛත්‍රී භාවනා තොමෝ **අනොධිසාඵරණ ඔදිසො ඵරණ මෙත්තා භාවනා** නම්.

**ථිනමිද්ධ නිවරණය – අරති** හෙවත් උකටලී බවත්, **තන්දි** හෙවත් ශරීරයාගේ මැලි බවත්, **විජම්භිතා** හෙවත්

ශරීරය විවිධාකාරයෙන් නැමුණු බවත්, **භත්තසම්මදො** හෙවත් බත් බුදීම් හෙතුකොට ගෙන මුසපත්වීමත්, **චෙතසො ලීනත්තා** හෙවත් චිත්තයාගේ හැකිළුගිය බවත් යන ආදීන්හි අයොනිසොමනසිකාරය බොහෝ සේ පුරුදු කිරීම නූපන් ථීනමිද්ධයාගේ ඉපදීම පිණිසත්, උපන් ථීන මිද්ධයාගේ නැවත නැවත වැඩීම පිණිසත් විපුලත්වය පිණිසත් පවතී.

**ආරම්භ ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු** යනාදීන් හි යොනිසො මනසිකාරය හෙතුකොට ගෙන ථීනමිද්ධයා ගේ ප්‍රහාණය වේ. ඒ ධාතුත්‍රය අතුරෙන් පළමුවෙන් ඇරඹූ වීර්‍ය්‍යය **ආරම්භ ධාතු** නම් කුසිත භාවයෙන් නික්මගිය බැවින් ඒ ආරම්භ ධාතුවට වඩා අතිශයින් බලවත්වූ වීර්‍ය්‍යය **නික්කම ධාතු** නම්. මතු මත්තෙහි කුසිත බව මඩණා හෙයින් නික්කම ධාතුවට වඩා අතිශයින් බලවත්වූ වීර්‍ය්‍යය **පරක්කම ධාතු නම්.** ආරම්භ ධාතු ආදීන්හි යොනිසොමනසිකාරය බොහෝසේ පුරුදු කිරීම නූපන් ථීනමිද්ධයාගේ නො ඉපදීම පිණිසද, උපන් ථීනමිද්ධයාගේ නැවත නැවත නොවැඩීම පිණිසද, විපුලත්වය නොවන පිණිසද පවතී.

තවද, අධික භොජනයෙහි ථීනමිද්ධයාගේ නිමිති ගැන්මය හෙවත් මෙතෙක් භොජනය වැළඳූ කල්හි ථීනමිද්ධයට කරුණු වෙයි, මෙතෙක් භොජනය වැළඳූ කල්හි ථීනමිද්ධයට කරුණු නොවෙයි කියා ථීනමිද්ධයාගේ කාරණය හා අකාරණය වටහා ගැනීමය, ඉරියව් මනා කොට පිරිවටන බවය හෙවත් යම් ඉරියව්වෙක්හි ථීන මිද්ධය බැසගනීද, ඒ ඉරියව්වෙන් අනික් ඉරියව්වක් ගැනීමය, ආලොක සංඥාවගේ මෙනෙහි කිරීම හෙවත් රාත්‍රි කාලයෙහි සඳඑළි, පහන් එළි, පන්දම් එළි, දහවල සූර්‍ය්‍යාලොකය මෙනෙහි කිරීමය, අභ්‍යවකාශයෙහි හෙවත් එළිමහනෙහි විසීමය, පහවූ ථීනමිද්ධය ඇති කල්‍යාණ මිතුරන් ඇතිබවය, සත්ප්‍රාය කථා ඇති බවය හෙවත්

සිටීම්, හිඳීම් ආදී ඉරියව් වැටුම්හි හා ධූතාඞ්ගාශ්‍රිත කොට පැවති සත්ප්‍රාය කථා ඇති බවය යනාදී ෂඞ්විධ ධර්මයන් කරන කොට ගෙන ථීන මිද්ධයාගේ ප්‍රහාණය වේ. ථීන මිද්ධයාගේ මත්තෙහි නො ඉපදීම රහත් මඟින්ම සිදුවේ.

**උද්ධච්චකුක්කුච්ච නීවරණය** – චිත්තයාගේ නොසන් සුන් බැව්හි අයෝනිසෝමනසිකාරය බොහෝසේ පුරුදු කිරීම නූපන්නාවූ උද්ධච්චකුක්කුච්චයාගේ ඉපදීම පිණිසද, උපන් උද්ධච්චකුක්කුච්චයාගේ නැවත නැවත වැඩීම පිණිසද විපුලත්වය පිණිසද පවතී. සමාධි නම් ලද චිත්ත යාගේ සන්සුන් බව ඇති කල්හි හෙවත් සිත්හුගේ සන් සුන් බැව්හි යෝනිසෝමනසිකාරය හෙතුකොට ගෙන නූපන් උද්ධච්චකුක්කුච්චයාගේ නොඉපදීමත් උපන් උද්ධච්ච කුක්කුච්චයාගේ නැවත නැවත නොවැඩීමත් විපුලත්වයට නොපැමිණීමත් සිදුවන්නේය.

තවද, බහුශ්‍රැතත්වය හෙවත් එක් නිකායක් හෝ දෙනිකායක් හෝ තුන් නිකායක් හෝ සතර නිකායක් හෝ පස් නිකායම හෝ පෙළ හැදෑරීම වශයෙන් හා අර්ථ ඇස්වීම් වශයෙන් බොහෝ ඇසූ පිරූ තැන් ඇති බවය, පරිප්‍රශනකත්වය හෙවත් කැප අකැප පිළිවිසීම් බහුල කොට ඇති බවය, විනය ප්‍රඥප්තියෙහි පුරුදු පුහුණු කිරීමෙන් තතු දැනුම් ඇති බවය, ශීලාදි ගුණයෙන් වැඩි සිටි මහළු තෙරුන් සෙවිනා ලද බවය, විනයධර කල්‍යාණ මිත්‍රයන් සෙවිනා බවය, සිටීම් හිඳීම් ආදී ඉරියව් වැටුම්හි කැප අකැපවත් පිළිබඳ කොට පැවති සත්ප්‍රාය කථා ඇති බවය යන ෂඞ්විධ කරුණු හෙතුකොට ගෙන උද්ධච්චකුක්කුච්චයාගේ ප්‍රහාණය වන්නේය. එයින් උද්ධච්චයාගේ ප්‍රහාණය රහත් මඟින්ද, කුක්කුච්චයාගේ ප්‍රහාණය හෙවත් මත්තෙහි නොඉපදීම අනාගාමි මඟින්ද සිදුවේ.

**විචිකිච්ඡා නීවරණය**— විචිකිච්ඡාවට ප්‍රවෘත්ති ස්ථානවූ ධර්මයන්හි අයෝනිසෝමනසිකාරය බොහෝ සේ පුරුදු කිරීම නූපන් විචිකිච්ඡාවගේ ඉපදීම පිණිසද උපන් විචිකිච්ඡාවගේ නැවත නැවත වැඩීම පිණිසද, විපුලත්වය පිණිසද පවතී

කුසලාකුසල ධර්ම, සාවද්‍ය නිරවද්‍ය ධර්ම, සෙවිය යුතු නොසෙවිය යුතුවූ ධර්ම හීන ප්‍රණීතවූ ධර්ම කළු සුදු බඳුවූ පාප පුණ්‍ය ධර්ම යනාදීන්හි යෝනිසෝමනසිකාරය බොහෝ සේ පුරුදු කිරීම, නූපන් විචිකිච්ඡාවගේ නොඉපදීම පිණිසත් උපන් විචිකිච්ඡාවගේ නැවත• නැවත නොවැඩීම පිණිසත් විපුලත්වය නොවන පිණිසත් පවතී.

තවද බහුශ්‍රැතත්වය හෙවත් බොහෝ ඇසූ තැන් ඇති බවය, පරි ප්‍රශ්නකත්වය හෙවත් තෙරුවන් පිළිබඳ ප්‍රශ්න පිළිවිසීම් ඇති බවය, විනය ප්‍රඥප්තියෙහි පියවි තතු දැනුම් ඇති බවය, තෙරුවන්හි නිශ්චය සඞ්ඛ්‍යාත අධිමොක්ෂය බහුලකොට ඇති බවය හෙවත් ඇදහීම් වශයෙන් රත්නත්‍රය ගුණ සංඛ්‍යාත ආලම්බනයට බැසගන්නා ඔකප්පනීය සද්ධායයි කියන ලද අධිමොක්ෂය බහුල කොට ඇති බවය, ශ්‍රද්ධා අධික කල්‍යාණ මිත්‍රයන් ඇති බවය, තෙරුවන් ගුණ නිශ්‍රිත සත්ප්‍රාය කථා ඇති බවය යන ෂඩ්විධ ධර්මයන් කරණකොට ගෙන විචිකිච්ඡාවගේ ප්‍රහාණය වන්නේය. සෝවාන් මග හේතුකොටගෙන ප්‍රහීණවූ විචිකිච්ඡාවගේ මත්තෙහි නොඉපදීම වන්නේය.

මෙසේ අධ්‍යාත්මයෙහි හෝ පංච නීවරණ ධර්මයන් කෙරෙහි නීවරණ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. පරසන්තානයන් කෙරෙහි පවත්නා නීවරණ ධර්මයන්ද නීවරණ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. කිසි විටෙක තම සන්තානයෙහිද, කිසිවිටෙක පරසන්තානයෙහිද පවත්නා නීවරණ ධර්මයන්, නීවරණ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. එමෙන්ම, නීවරණ ධර්මයන්ගේ උත්පාදයද ප්‍රහාණයද දැන වාසය කරන්නේය.

මෙසේ අනුපස්සනා වශයෙන් දක්නා යෝගාවචරයාගේ ඥානය වැඩීම කරණකොට ගෙන රහත් ඵලයටද පැමිණෙන්නේය.

## උපාදානස්කන්ධයන්ගේ වශයෙන් ධම්මානුපස්සනාව

**රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ** යන පඤ්චුපාදානස්කන්ධයන් අරමුණු කොට විදර්ශනා වඩන්නාවූ යෝගාවචර තෙමේ ඒ රූපාදී ස්කන්ධයන් හා ඒ ස්කන්ධයන්ගේ හටගැනීමත්, ඒ ස්කන්ධයන්ගේ අස්තංගමයත් මෙනෙහි කරමින් වාසය කරන්නේය.

**රූපුපාදානස්කන්ධය** වනාහි අතීතානාගත පච්චුප්පන්න ආදී එකොළොස් තන්හි සිටි භූතොපාදාය භෙදයෙන් අටවිසි වැදෑරුම් රූපයෝ යයිද, ඒ රූපයාගේ විද්‍යමාන ස්වභාවයද දැනගන්නේය. එසේම අවිද්‍යාදී ප්‍රත්‍යය කරණකොට ගෙන රූපයාගේ හටගැනීම වන බවත් අවිද්‍යාදීන්ගේ නිරොධයෙන් රූපයාගේ අස්තංගමය වන බවත් දැන වාසය කරන්නේය.

**වේදනුපාදානස්කන්ධය** වනාහි අතීතානාගත පච්චුප්පන්න ආදී එකොළොස් තන්හි සිටි රූපයන් නිසා පවත්නා සුඛ දුක්ඛ උපෙක්ඛා යයි කියන ලද වේදනාත්‍රය වන්නේය. එසේම අවිද්‍යාදී ප්‍රත්‍ය කරණකොට ගෙන වේදනාවගේ හටගැනීම වන බවත් අවිද්‍යාදීන්ගේ නිරොධයෙන් වේදනාවගේ නිරොධය වන බවත් දැන වාසය කරන්නේය.

**සඤ්ඤුපාදානස්කන්ධය** වනාහි එකොළොස් තන්හි සිටි සංඥාවයයිද, අවිද්‍යාදී ප්‍රත්‍ය කරණකොට ගෙන සංඥාවගේ හට ගැනීම වන බවද, අවිද්‍යාදීන්ගේ නිරෝධයෙන් සංඥා නිරොධය වන බවද දැන වාසය කරන්නේය.

**සංඛාරූපාදානස්කන්ධය** වනාහි එකොළොස් තන්හි සිටි කුසලාදී නොයෙක් ප්‍රභෙද ඇති චේතනාදිවූ සංස්කාර ධර්මයන් යයිද, අවිද්‍යාදි ප්‍රත්‍යයන් කරණකොට ගෙන සංස්කාරයන්ගේ හට ගැනීම වන බවද අවිද්‍යාදීන්ගේ නිරොධයෙන් සංස්කාර නිරොධය වන බවද දැන වාසය කරන්නේය.

**විඤ්ඤාණුපාදානස්කන්ධය** වනාහි එකොළොස් තන්හි පිහිටි චක්ඛුවිඤ්ඤාණාදි නොයෙක් ප්‍රභෙද ඇති විඤ්ඤාණයෝයයිද, අවිද්‍යාදි ප්‍රත්‍ය කරණකොට ගෙන විඤ්ඤාණයාගේ හටගැනීම වන බවද, අවිද්‍යා නිරොධයෙන් විඤ්ඤාණයාගේ නිරොධය වන බවද දැන වාසය කරන්නේය.

මෙසේ අධ්‍යාත්ම සන්තාන වශයෙන්ද, බාහිර සන්තාන වශයෙන්ද, අධ්‍යාත්ම හා බාහිර සන්තාන වශයෙන්ද පවත්නා රූපාදීවූ පඤ්චුපාදානස්කන්ධයන්, උපාදානස්කන්ධයන් අනුව බලමින් වාසය කරන්නේ ඥානයාගේ වැඩීම කරණකොට ගෙන රහත් ඵලයටද පැමිණෙන්නේය.

## ආයතනයන්ගේ වශයෙන් ධම්මානුපස්සනාව

චක්ඛායතන, සොතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, මනායතන යන අධ්‍යාත්මිකවූ ෂඩායතන ධර්මයන් හා රූපායතන, ශබ්දායතන, ගන්ධායතන, රසායතන, පොට්ඨබ්බායතන, ධම්මායතන යන බාහිරවූ ෂඩායතන ධර්මයන් අරමුණු කොට විදශීනා වඩන්නාවූ යොගාවචර තෙමේ චක්ඛු ආදීවූ ඒ ඒ ආයතනයන් යථා ස්වභාව වශයෙන් ද ඔවුනොවුන්ට විෂයවූ ආයතනයන්ගේ එක්වීම හේතුකොට ගෙන උපදනා කාම රාග පටිඝාදී දසවිධ සංයොජනයන්ද, ඒ සංයෝජනයන්ගේ ප්‍රහාණ ක්‍රමයද සොවන් ආදී මාර්ගවලට පැමිණ සංයෝජනයන්ගේ අනුත්පාද නිරොධය වන සැටිද මනා නුවණින් බලා වාසය කරන්නේය.

**චක්ඛායතනය හා රූපායතනය**— **චක්ඛායතනය** වනාහි සම විසම තැන කියා දෙන්නෙකු මෙන් භගවත්නා වූද ඉතා දුරවූ රූපාදී අරමුණු ගන්නාවූද චක්ෂුප්‍රසාද රූපය යයි යථාස්වභාව වශයෙන් දන්නේය. **රූපය** වනාහි විකාරයට පැමිණීම ස්වභාව කොට ඇති චක්ෂුසට ගොචරවූ රූපය බවද දන්නේය. ඒ චක්ඛු රූප දෙදෙනාගේ එක්වීම හෙතු කොට ගෙන ඉෂ්ටාරම්මණවූ රූපයෙහි ලොභ උපදවා කාමාස්වාද වශයෙන් ආස්වාද කරන්නාහට **කාමරාග සංයොජනය** උපදනා බවද, අනිෂ්ටාරම්මණයෙහි නොසතුටුව සිත ගැටීමෙන් කිපෙන්නාහට **පටිඝ සංයොජනය** උපදනා බවද, මා හැර අන් කවරෙක් මේ රූපාරම්මණය වඩන්නට සමර්ථ වන්නේදැයි සිතන්නාහට **මාන සංයොජනය** උපදනා බවද, රූපාරම්මණය නිත්‍ය, සුභ, සුඛ, ආත්ම වශයෙන් ගන්නාහට **දිට්ඨි සංයොජනය** උපදනා බවද, රූපාරම්මණය සත්ත්වයෙක් හෝ වේද සත්ත්වයෙකුට අයත් හෝ වේදැයි සැක ඇති වන්නාහට **විචිකිච්ඡා සංයොජනය** උපදනා බවද, මතු භවයන්හිදී මේ රූප දර්ශනයම පැතීමෙන් **භවරාග සංයොජනය** උපදනා බවද, රූප දර්ශන ලාභය සඳහා සීල ව්‍රත සමාදානයෙහි යෙදෙන්නාහට **සීලබ්බත පරාමාස සංයොජනය** උපදනා බවද, රූප සංදර්ශනය අනිකෙක් නොලදහොත් ඉතා යෙහෙකැයි සිතා ඊර්ෂ්‍යා කරන්නාහට **ඉස්සා සංයොජනය** උපදනා බවද, තමා විසින් දර්ශනයෙහි ආස්වාද ලත් රූපාරම්මණය අනිකක් හට දර්ශනයට අවකාශ නොදී මසුරු කරන්නාහට **මච්ඡරිය සංයොජනය** උපදනා බවද, සහජාත අඥාන භාවය නිසා **අවිද්‍යා සංයොජනය** උපදනා බවද, නුවණින් දැනගෙන වාසය කරන්නේය. එසේම හට ගන්නා වූ සංයොජනයන්ගේ තදඞ්ග විෂ්කම්භන වශයෙන් ප්‍රහාණය වන සැටිත් සෝවාන් ආදී මාර්ග ඥානයෙන් නැවත නූපදනා පරිදි ප්‍රහාණය කළහැකි බවත් දැන වාසය කරන්නා වූ යොගාවචර තෙමේ ක්‍රමයෙන් රහත් ඵලයට පැමිණෙන්නේය.

ශ්‍රොතායතන, සද්දායතන යනාදීන්හිද මේ ක්‍රමයම බව දතයුතු. අධ්‍යාත්ම සන්තානය පිළිබඳවූද, බාහිර සන්තානය පිළිබඳවූ ද අධ්‍යාත්ම බාහිර සන්තානයන් පිළිබඳවූ ද ආයතනයන්ගේ වශයෙන් අනුපස්සනාව පෙරකී නයින් දතයුතු.

## බොජ්ඣඞ්ග ධර්මයන්ගේ වශයෙන් ධම්මානුපස්සනාව

සප්ත බොධ්‍යඞ්ග ධර්මයන්ගේ වශයෙන් විදර්ශනා වඩන්නාවූ යොගාවචර තෙමේ පළමු කොට සතිසම්බොජ්ඣඞ්ගයාගේ විද්‍යමාන බව හෝ අවිද්‍යමාන බව හෝ දැන ගන්නේය. එසේම නූපන් සතිසම්බොජ්ඣඞ්ගයාගේ ඉපදීම වන සැටිත්, උපන්නාවූ සතිසම්බොජ්ඣඞ්ගයාගේ නැවත නැවත වැඩීමත් විපුලත්වයත් වන සැටිත් දැන වාසය කරන්නේය.

### සතිසම්බොධ්‍යඞ්ගය

**සතිසම්බොධ්‍යඞ්ගයාගේ** ප්‍රවෘත්ති ස්ථානවූ ධර්මයන්හි යොනිසොමනසිකාරය බොහෝ සේ පුරුදු කිරීම, නූපන් සති සම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීම පිණිසත්, උපන් සති සම්බොධ්‍යඞ්ගයාගේ නැවත නැවත වැඩීම පිණිසත් විපුලත්වය පිණිසත්, ආසෙවනය පිණිසත්, පරිපූර්ණ භාවය පිණිසත් ප්‍රත්‍ය වන්නේය.

තවද **කරුණු** සතරක් සති සම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීම පිණිස පවත්නාහ. එනම්:

1. **සතිසම්පජඤ්ඤයෙන්** යුක්ත බවය හෙවත් සිහි නුවණ ඇති බවය.

2. **මුට්ඨස්සති පුද්ගල පරිවජ්ජනතා** හෙවත් මුළාවූ සිහි ඇති පුද්ගලයන් දුරු කරන බවය.

3. එළඹ සිටි සිහි ඇති පුද්ගලයන් සෙවිනා බවය.

4. එසට නැමුණු සිත් ඇති බවය.

**මේ චතුර්විධ කාරණයෙන් හෙතුකොට ගෙන උපන්නාවූ ඒ ස්මෘති සම්බොධ්‍යඞ්ගයාගේ භාවනා තොමෝ රහත් මග හෙතුකොට ගෙන පරිපූර්ණ වේ යයි ද හෙතෙම දනී.**

**ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය**

කුසලාදි ධර්මයන්හි යොනිසොමනසිකාරය බොහෝ සේ පුරුදු කිරීම නූපන් **ධම්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ** ඉපදීම පිණිසත්, උපන් ධම්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ නැවත නැවත වැඩීම **පිණිසත්** විපුලභාවය පිණිසත්, ආසෙවනය **පිණිසත්**, පරිපූර්ණ භාවය **පිණිසත්** පවතී

තවද සප්ත විධ ධර්ම කෙනෙක් ධම්ම විචය සම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීම පිණිස පවත්නාහ. එනම්:

1. **පරිපුච්ඡකතා** නම්වූ ස්කන්ධ, ධාතු, ආයතන ඉන්ද්‍රිය, බල, බොධ්‍යඞ්ග, මාර්ගාඞ්ග, ධ්‍යාන, සමථ විදර්ශනාවන්ගේ අර්ථ පිළිබඳ කොට ඇති ප්‍රශ්න පිළිවිසීම් බහුල කොට ඇති බවය.

2 **වත්ථු විසද ක්‍රියතා** නම්වූ අධ්‍යාත්මික බාහිරවූ වස්තූන්ගේ නොකිළිටි බැව් පිරිසිදු බැව් කිරීමය. යම් කලෙක යොගාවචරයාගේ කෙස් ලොම් නියහු දික් වූයේද, ශරීරයෙහි වැඩී ගිය දොස් ඇත්තේ වේද, ඩාදිය මළ වැකී ගියේද එකල්හි අධ්‍යාත්මික වස්තු තෙමේ කිළිටි වූයේ හෙවත් පිරිසිදු නොවූයේ වේ. යම් කලෙක මහණහුගේ සිවුර පැරණි වූයේ, කිළිටි වූයේ, දුගඳ ඇතියේ වේද, සෙනස්නෙහි හෝ කැලි කසල ඇතියේ වේද, එකල්හි බාහිර වස්තු තෙමේ කිළිටි වූයේ හෙවත් පිරිසිදු නොවූයේ වේ. එහෙයින් කෙස් ආදිය සිඳීමෙන්ද, විරෙචනාදිය කොට ශරීරය සැහැල්ලු බව කිරීමෙන්ද, ඇඟ ඉලීම්, නැහැවීම් ආදියෙන්ද, අධ්‍යාත්මිකවූ වස්තූන් පිරිසිදු කටයුතු. එමෙන්ම සිවුරු ගෙත්තම් කිරීම් ආදියෙන් බාහිර වස්තූන්ද පිරිසිදු කටයුතු. එකී අධ්‍යාත්මික බාහිර වස්තූන් අපිරිසිදු වූ

කල්හි උපන්නාවූ චිත්ත චෛතසිකයන් මධ්‍යයෙහිවූ නුවණද, කිළිටි වූයේ, අපිරිසිදු වූයේද වෙයි. පිරිසිදු නුවූ පහන් වැටි තෙල් ආදිය නිසා උපන් පහන්සිළුවගේ ආලෝකය මෙනි.

3. **ඉන්ද්‍රිය සමත්ත පටිපාදනතා** නම්වූ ශ්‍රද්ධෙන්ද්‍රියාදීන් සමවන පරිදි පිළියෙල කිරීමය.

යොගාවචර මහණහුගේ ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත්ව, වීරියෙන්ද්‍රියාදීහු බෙලහීන වෙත්ද, එකල්හි වීරියෙන්ද්‍රිය විසින් කට යුතුවූ ප්‍රග්‍රහ කෘත්‍ය හෙවත් උපසථම්භන කෘත්‍යයද, සතින්ද්‍රිය විසින් කටයුතුවූ අරමුණෙහි වැටහීම් කෘත්‍යයද, සමාධීන්ද්‍රිය විසින් කටයුතුවූ අවික්ෂෙප නම් ලද සන්සිඳීම් කෘත්‍යයද, ප්‍රඥෙන්ද්‍රිය විසින් කටයුතු වූ දර්ශන කෘත්‍යයද කරන්නට නොහැකි වෙයි. එහෙයින් ඒ ශ්‍රද්ධෙන්ද්‍රිය තෙමේ, ධර්ම ස්වභාවය මෙනෙහි කිරීමෙන් හෝ යම් කරුණෙකින් මෙනෙහි කරණුවනට එය බලවත් වේද, ඒ කරුණෙන් මෙනෙහි නොකිරීමෙන් හෝ පිරිහෙළිය යුතුයි.

යම් හෙයකින් වීර්යෙන්ද්‍රිය තෙමේ බලවත් වූයේ වේද, එකල්හි ශ්‍රද්ධෙන්ද්‍රිය තෙමේ අරමුණෙහි නිශ්චයාකාරයෙන් උපදනා අදහන කෘත්‍යය කරන්නට අසමත් වෙයි. එමෙන්ම සතින්ද්‍රියාදීහු අනික් අනික් වැටහීම් ආදී කෘත්‍ය විශෙෂයෙ කරන්නට නොහැකි වෙත්. එහෙයින් ඒ වීරියෙන්ද්‍රිය, පස්සද්ධි සම්බොධ්‍යඞ්ගාදී භාවනා කරණකොට ගෙන පිරිහෙළිය යුතුයි. මේ ක්‍රමයෙන් වීරියෙන්ද්‍රියාදීන් අතුරෙන්ද එක් එක් ඉන්ද්‍රියයක්හුගේ බලවත් බව ඇති කල්හි අනිකුදු ඉන්ද්‍රියයෝ තම තමා අයත් කටයුතුවල යෙදීමට නොසමත්වේ.

මේ ඉන්ද්‍රියයන් අතුරෙන්ද, ශ්‍රද්ධා ප්‍රඥා ඉන්ද්‍රියයන්ගේද සමාධි වීර්‍ය්‍ය ඉන්ද්‍රියයන්ගේද සම බව විශෙෂයෙන් සැලකිය යුතු වේ.

බලවත් ශ්‍රද්ධාව හා මද නුවණ ඇත්තාවූ පුද්ගල තෙමේ මුද්ධප්පසන්නයෙක් හෙවත් මුග්ධ ජනයා කෙරෙහි ප්‍රසන්නවූ නොහොත් මුසවූ ගුණ හීන ජනයා කෙරෙහි ප්‍රසන්න වූවෙක් වෙයි. නොපැහැදිය වස්තුවෙහි පහදී.

බලවත් ප්‍රඥාව ඇත්තාවූ මද සැදැහැ ඇත්තාවූ පුද්ගල තෙමේ කෛරාටික ජනයන්ගේ පක්‍ෂයට යෙයි. බෙහෙත් හේතුකොට ගෙන නැංගාවූ රෝගයක් මෙන් පිළියම් කිරීමට නොහැකි වෙයි. සිත ඉපදුන පමණකින්ම කුසල් වේයයි නොමග ගොස් දානාදිවූ පින් නොකොට නරකයෙහි උපදී.

ශ්‍රද්ධා ප්‍රඥෙන්ද්‍රියයන්ගේ සම බව හේතුකොට ගෙන පැහැදිය යුතු බුද්ධාදි වස්තුත්‍රයෙහිම පහදී.

බලවත් සමාධිය ඇති, මන්ද වීර්‍ය්‍ය ඇති පුද්ගලයා සමාධියගේ කුසීත පක්‍ෂය අයත් වන බැවින්, කුසීතය තෙමෙ මඩියි.

බලවත්වූ වීර්‍ය්‍ය ඇති, මන්ද සමාධිය ඇති පුද්ගලයා වීර්‍ය්‍යයාගේ උද්ධච්ච පක්‍ෂය අයත් වන බැවින් උද්ධච්චය තෙමේ මඩියි.

වීර්‍ය්‍යය හා සමකොට යොදන ලද්දාවූ සමාධි තෙමේ විනාහි කුසීතයෙහි වැටීමට නොයෙයි. සමාධිය හා සමකොට යොදන ලද්දාවූ වීර්‍ය්‍ය තෙමේ උද්ධච්චයෙහි වැටීමට නොයෙයි. යම්සේ වීර්‍ය්‍ය සමාධි දෙදෙනාගේ සමවීම හේතුකොට ගෙන අර්පණාව වේද, එහෙයින් ඒ වීර්‍ය්‍ය සමාධි දෙදෙනාගේ සමබව ඇති කළයුතු.

අර්පණා සමාධි භාවනා කර්මයෙහි නියුක්ත යොගාවචරයාහට බලවත්වූ ශ්‍රද්ධාව වටනේය. එසේ ඇතිකල්හි අර්පණා සමාධි කර්මයෙහි නියුක්ත පුද්ගල තෙමේ අරමුණු අදහන්නේම අරමුණු කරා නැඹුරුව ගොස් අර්පණාවට පැමිණෙන්නේය.

සමාධි ප්‍රඥාවන් හෙවත් සමථවිදර්ශනාවන් අතුරෙන් සමථ භාවනා කර්මයෙහි නියුක්ත පුද්ගලයාහට බලවත්වූ ඒකග්ගතාව වටනේය. එසේ ඇති කල්හි ඔහු අභිඥාවට පැමිණෙයි. විදර්ශනා භාවනා කර්මයෙහි නියුක්ත පුද්ගලයාහට බලවත්වූ ප්‍රඥාව වටනේය. එසේ ඇති කල්හි ඔහු අනිත්‍යාදි ලක්ෂණ ප්‍රතිවෙධය කිරීමට පැමිණෙයි. සමාධි ප්‍රඥාවන් දෙදෙනාගේ සම බව හෙතුකොටගෙන අභිඥාතොමෝ වේමැයි.

**සතිය,** සියලු කටයුතුවලදී බලවත් වියයුතුමය. සියලු සූප ව්‍යඤ්ජනයන්හි ලුණු ලෑමක් මෙන් සතිය සියලු සහපත් සිත්හිම තිබිය යුතු.

4 **දුප්පඤ්ඤපුග්ගල පරිවජ්ජනය** හෙවත් නුවණ නැති පුද්ගලයන් දුරු කිරීම. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වඩන පුද්ගලයා විසින් ස්කන්ධාදී ප්‍රභෙදවත්වූ පර්‍යාප්ති ධර්මයෙහි බැස නොගත්, අඥාන පුද්ගලයන් දුරින් දුරු-කටයුතුයි.

5. **පඤ්ඤවන්ත පුග්ගල සෙවනතා** නම්වූ නුවණැති පුද්ගලයන් සෙවනය කිරීම.

6. **ගම්භීරඤාණචරිය පච්චවෙක්ඛණතා** නම් වූ ගැඹුරු වූ ස්කන්ධාදීන්හි පැවැති ගැඹුරුවූ ප්‍රඥා ප්‍රභෙදයන් ප්‍රත්‍යවෙක්ෂා කිරීමය.

7. සෑම ඉරියව්හිම ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය උපදවා-ලීම පිණිස එයට නැමුනු සිත් ඇති බවය.

මේ කරුණු හේතුකොටගෙන උපන්නාවූ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය රහත්මග හෙතුකොටගෙනා සම්පූර්ණ වන්නේය.

## විරිය සම්බොජ්ඣඞ්ගය

**විරිය සම්බොජ්ඣඞ්ගය.** ආරම්භධාතු, නික්ඛමධාතු, පරක්කමධාතු නම් ලද වීර්‍ය්‍යයෙහි යොනිසොමනසිකාරය

බොහෝසේ පුරුදුකිරීම, නූපන් වීය්‍යීසම්බොධ්‍යාඞ්ගයාගේ ඉපදවීම පිණිසද, උපන් වීය්‍යීසම්බොධ්‍යාඞ්ගයාගේ නැවත නැවත වැඩීම පිණිසද, විපුලත්වය පිණිසද, පරිපූර්ණ භාවය පිණිසද පවතී.

තවද කරුණු එකොළොසක් වීය්‍යීසම්බොධ්‍යාඞ්ගයාගේ ඉපදීම පිණිස පවත්නාහ. එනම් :-

1. **අපාය භය ප්‍රත්‍යවෙක්ෂා කරණ බවය.** එක්සිය සතිස් නිරයයන්හි පඤ්චවිධ බන්ධන තම් ලද කම්කටුල්ලෙහි පටන් ඉමහත් දුක් විඳින කල්හිත්, තිරිසන් යොනියෙහි දැල් කරක් කෙමෙන් ආදින් ගත් කල්හිත්, කැවිටි, කටු කැම්ටි ආදී පහරින් පෙළනලද තිරිසන් බැව්හිදීත්, ගැල් ඉසිලීම් ආදිය කරණ කල්හිත්, ප්‍රේත විෂයෙහි දහස් ගණන් අවුරුදු හෝ බුද්ධාන්තරයක් මුළුල්ලෙහි හෝ සාපිපාසාවෙන් පීඩාවූ කල්හිත් කාලකඤ්ජක අසුරයන් විෂයෙහි සැටරියන් අසූරියන් පමණැත්තාවූ ඇට සම් පමණක් වූ ම ආත්මභාවය කරණකොටගෙන සුලං සූය්‍යී සන්තාපාදියෙන් නොයෙක් දුක් අනුභව කරණ කල්හි වීය්‍යීසම්බොධ්‍යඞ්ගය උපදවන්නට නොහැක්කේය. එබැවින් මේ කාලයේම වීය්‍යී කිරීමට සුදුසු කලැයි දැන මෙසේ සතර අපා බිය ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට වීය්‍යීසම්බොධ්‍යාඞ්ගය උපදී.

2. **වීය්‍යීයාගේ අනුසස් ඵල දක්නාසුළු බවය.** කම්මැලිවූ පුද්ගලයාහට නවලොවුතුරු දහම් ලබන්නට නොහැකි වේ. පටන්ගන්නා ලද වීය්‍යී ඇති පුද්ගලයා විසින්ම ලැබියහැකි වේ. වීය්‍යීයාගේ මේ අනිශංසය යයි. මෙප රිද්දෙන් අනුසස් ඵල දක්නා පුද්ගලයාහට වීය්‍යී සම්බොධ්‍යාඞ්ගය උපදී.

3. **බුදු පසේ බුදු ආය්‍යීශ්‍රාවකයන්ගේ ගමන්මඟ ප්‍රත්‍යවෙක්ෂාකරණ බවය.** බුදු පසේ බුදු මහ සව්වන් විසින්

හිස මග තමා විසින්ද යා යුතුය. කුසීත බව ඇති කල්හි යන්නට නොහැකිය යනාදි වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කරන්නා හටද වීර්‍ය්‍ය සම්බොධ්‍යාඞ්ගය උපදී.

4. **පිණ්ඩපාත භොජනයට ගරුබුහුමන් කිරීමය.** යමෙක් පිණ්ඩපාතාදියෙන් උපස්ථාන කෙරෙත්ද, මේ මිනිස්සු තාගේ නොතෑයෝමය. දසකම් කරන්නෝ ද නොවේ. තා නිසා දිවි පවත්වමුයයි සිතා තට ප්‍රණීතවූ පිණ්ඩපාතාදීන් නොදෙත්. එතකුදු වුවත් තමා අයත් වූ දක්ෂිණාවන්ගේ මහත්ඵල ඇති බව ප්‍රාර්ථනා කරමින්ම දෙත්. මහණතෙම, මේ පිණ්ඩපාතාදි ප්‍රත්‍යයන් පරිභොග කොට කය දැඩි කිරීම බහුලකොට ඇත්තෙක්ව සුවසේ වාසය කරන්නේයයි, මෙසේත් දක්නාවූ ශාස්තෘන් වහන්සේ ඒ පිණ්ඩපාතාදි ප්‍රත්‍යයෝ අනුදැන නොවදාළහ. නමුත් පිණ්ඩපාතාදි ප්‍රත්‍යයන් පරිභොග කොට, මහණදම් පුරා සසර දුකින් මිදෙන්නේයයි මෙනෙහි කරන්නේනම් එය අනුදැන වදාරණලදී. එබැවින් දැන්, කුසීතව වසන්නේනම් ඒ අනුදත් පිණ්ඩපාතය ගරු බුහුමන් නොකරන්නෙහිය. ඇරඹූ වීර්‍ය්‍ය ඇති මහණහටම පිණ්ඩපාත භොජනයට පිදීම නම් වේයයි ප්‍රත්‍යවේක්ෂා කරන්නේ විරිය සම්බොධ්‍යාඞ්ගය උපදී.

පෙර, කස්සක ලෙණ වාසී මහමිත්ත තෙරහු, ගොදුරු ගම්හි එක්තරා උපාසිකාවක් විසින් පුත්‍රයෙකුමෙන් පොෂ්‍ය කෙරෙයි. දිනක් ඈ වනයට යන්නී, දුවට කථා කොට අසුවල් අසුවල් තැන ඇති පැරණි සහල්, කිරි, ගිතෙල් පැණි ආදිය ගෙන බත්පිස මිත්ත සවාමීන් වැඩි කල්හි පිළිගන්වා නී ද අනුභව කරවයි කීය. මැණියන් කුමක් අනුභව කරන්නීදැයි ඇසූ කල්හි තමා ගිල් බතක් අනුභව කළ බැවින් දහවලට තැම්බූ පලාකොළ ගෙන කඩ සහලින් ඇඹුල් කැඳක් පිස තබවයි කීය. තෙරුන්වහන්සේ මෙපුවත් අසා මේ උපාසිකා තොමෝ කෙතක්, වත්තක්, භොජනයක්, වස්ත්‍රයක් නොපතයි. මනුෂ්‍ය දිව්‍ය මොක්ෂ සඞ්ඛ්‍යාත

ත්‍රිවිධ සම්පත්තීන් පතමින්ම දෙති එබැවින් තමා එවැනි සම්පත් ලබාදීමට සුදුසුව සිටින්දැයි විමසන්නේ, මේ පිණ්ඩපාත භොජනය, රාග සහිතයෙක්ව, ද්වේෂ සහිත යෙක්ව, මොහ සහිතයෙක්ව වළඳන්නට නොවටනේයයි සිතා නැවත තම ලෙණටම ගොස් රහත් ඵලයට නොපැමිණ මේසින් නොනික්මෙන්නෙමැයි තරයේ වීයර්‍ය්‍යකොට පෙරවරු කාලයෙහිම රහත් ඵලයට පැමිණ ඉක්බිති පිණ්ඩපාතය පිණිස වැඩමවා දන් පිළිගෙන වැළඳූ සේක.

5. **දායාදය මහත්බව ප්‍රත්‍යවෙක්ෂා කිරීම:**- සප්තාර්‍ය්‍ය ධන සඞ්ඛ්‍යාතවූ ශාස්තෲන් වහන්සේගේ දායාදය කුසීත වූවනු විසින් ලැබගන්ට නොහැක්කේය. වරදවා පිළිපන්නාවූ පුත්‍රයා මව්පියහු විසින් අපගේ පුත්‍රයෙක් නොවේයයි බැහැර කරන ලද්දේ, මව්පියන් ඇවෑමෙන් ඔවුන්ගේ දායාදය නොලබාද, එපරිද්දෙන්ම කුසිතවූ මහණ තෙමේද ආර්‍ය්‍යධන සඞ්ඛ්‍යාත දායාදය නොලබන්නේය ඇරඹූ වැර ඇති මහණ තෙමේම ලබයි. මෙසේ සප්තාර්‍ය්‍ය ධන සඞ්ඛ්‍යාතවූ දායාදයාගේ මහත් බව හෝ උතුම්බව ප්‍රත්‍ය-වෙක්ෂා කරන්නාවූ මහණ හට්ද වීයර්‍ය්‍ය සම්බොධ්‍යාඞ්ගය උපදී.

6. **ශාස්තෲවූ සර්‍වඥයන් වහන්සේගේ මහත් බව ප්‍රත්‍යවෙක්ෂා කිරීම:**- ශාස්තෲන් වහන්සේගේ මව් කුසයෙහි පිළිසිඳ ගැනීම් සමයෙහිද, අභිනික්මන් හිද, සර්‍වඥතා ඥනාධි-ගමයෙහිද, දම්සක් පවත්නා සමයෙහිද, යමාමහ පෙළහර දක්වන සමයෙහිද, දෙව්ලොවින් බස්නා සමයෙහිද ආයුසංස්කාරය හරණා කල්හිද, පිරිනිවන් පානා කල්හිද, දස දහසක් ලෝද කම්පා වූහ. මෙබඳුවූ ශාස්තෲන් වහන්සේගේ සස්නෙහි පැවිදිව, කුසීතයෙකු වන්නට නොවටනේයයි මෙසේ ශාස්තෲන් වහන්සේගේ මහත් බව උතුම් බව ප්‍රත්‍ය වෙක්ෂා කරන්නාවූ මහණ හට්ද වීයර්‍ය්‍ය සම්බොධ්‍යාඞ්ගය උපදී.

7. **ජාතියගේ මහත් බව ප්‍රත්‍යවෙක්ෂා කිරීම**:- මහණහු විසින් තමා නිතිනවූ ජාති ඇත්තෙක් නොවෙති. ජාතිසම්භෙදයක් නැත්තාවූ, මහා සම්මත පරම්පරාවෙන් පැවැත්තාවූ, ඔක්කාක රාජවංශයෙහි ජාතවූ වෙහිය, සිරි සුදෙවුන් මහරජහුගේද, මහාමායා දේවියගේද නෑ වෙහිය, රාහුල භද්‍ර සර්විරයන්ගේ මලනු වෙහිය මෙබඳුවූ බුඩ පුත්‍ර යෙකුව කුසීතව වාසය කරන්නට නුසුදුසුය. මෙපරිද්දෙන් ජාතියගේ උතුම් බව ප්‍රත්‍යවෙක්ෂා කරන්නා හටද වීය්‍ර්‍ය සම්බොධ්‍යාඞ්ගය උපදී.

8. **සබ්‍රහමචාරීන්ගේ මහත්බව ප්‍රත්‍යවෙක්ෂා කිරීම**:- සැරියුත් මහ මුගලන් දෑගසවු මහ තෙරණුවෝද, අසූමහා සව්වෝද, වීය්‍ර්‍යය හෙතුකොට ගෙනම ලොකොත්තර ධර්ම ප්‍රතිවෙධය කළහ මෙසේ ඒ සබ්‍රහ්මචාරීන්ගේ මහත් බව ප්‍රත්‍යවෙක්ෂා කරන්නා හටද වීය්‍ර්‍ය සම්බොධ්‍යාඞ්ගය උපදී.

9. **කුසීත පුද්ගලයන් දුරු කරන බවය.** කුස පුරා ගෙන සිටි පිඹුරන් හා සමවූ, හරණලද කායික, චෛතසික වීය්‍ර්‍ය ඇත්තාවූ අලස පුද්ගලයන් සෙවන, භජන, පයුරු-පාසනයන් දුරලන්නාවූ මහණ හටත් වීය්‍ර්‍ය සම්බොධ්‍යාඞ්ගය උපදී

10 **පටන්ගත් වීය්‍ර්‍ය ඇති පුද්ගලයන් සෙවනා බවය.** ඇරඹූ වැර ඇත්තාවූ කාය ජීවිතයෙහි නො ඇලුනු සිත් ඇත්තාවූ, නිවනට මෙහෙය වූ සිතැත්තා වූ පුද්ගලයන් සෙවනා මහණ හටත් වීය්‍ර්‍ය සම්බොධ්‍යාඞ්ගය උපදී.

11. **ඒ වීය්‍ර්‍ය සම්බොධ්‍යාඞ්ගයෙහි නැමුණු සිත් ඇති බවය.** සිටීම්, හිඳීම් ආදී ඉරියව් වැටුම්හි වීය්‍ර්‍යයාගේ ඉපද වීම පිණිස නැමුණු සිත් ඇති මහණ හටද වීය්‍ර්‍ය සම්බොධ්‍යාඞ්ගය උපදී.

මෙසේ උපන්නාවූ ඒ වීය්‍ර්‍ය සම්බොධ්‍යාඞ්ගයාගේ ආසෙ-විතය තොමෝ අර්හත් මාර්ගය කරණකොට ගෙන සම්පූර්ණ වන්නී වේ යයි යොගාවචර තෙමේ සම්‍යක් ප්‍රකාරයෙන් දනී.

**ප්‍රීති සම්බොධ්‍යාඞ්ගය**— ප්‍රීති සම්බොධ්‍යාඞ්ගයාගේ ප්‍රවෘත්ති ස්ථානවූ ධර්මයන්හි යොනිසොමනසකාරය බොහෝ සේ පුරුදු කිරීම, නූපන් ප්‍රීති සම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීම් පිණිසද, උපන් ප්‍රීති සම්බොධ්‍යාඞ්ගයාගේ නැවත නැවත වැඩීම පිණිසද, විපුලත්වය පිණිසද ආසෙවනය පිණිසද පරිපූර්ණ භාවය පිණිසද පවතී.

තවද, බුද්ධ ගුණයන් නැවත නැවත සිහි කරණ මහණ හටද, ධර්ම ගුණ, සංඝ ගුණ නැවත නැවත සිහිකරණ මහණ හටද, උපචාර ධ්‍යානය දක්වා, සියල් සිරුර පැතිර ගෙන ප්‍රීති සම්බොධ්‍යඞ්ගය තෙම උපදී. දික් රැයක් මුළුල්ලෙහි නොකඩ කොට රක්කාවූ සිව් පිරිසිදු සිල් ගුණ ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ මහණහටද, ගිහිව සිටියදී දසසිල් පන්සිල් ප්‍රත්‍යවෙක්ෂා කරන්නා හටද, දුර්භික්ෂභයාදීන්හි ප්‍රණීතවූ භොජනය සබ්‍රහ්මචාරීන්ට දී මෙබඳු භොජනයක් දුනිමුයි ත්‍යාග ගුණය ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ මහණහටද, ගිහිව සිටියදී තමුදු මෙබඳු දුර්භික්ෂභයාදි කාලයෙහි සිල්වතුන්ට පිරිනැමූ දක්ෂිණාව ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ මහණ හටද, ශ්‍රද්ධාදි ගුණවලින් යුක්තවූ දෙවතාවෝ තුමූ දෙවත්වයට පැමිණියද, එබඳුවූ ගුණයන් මා කෙරෙහි ඇති බව ප්‍රත්‍ය වෙක්ෂා කරන්නාවූ මහණ හටද, සමවත් කරණකොට ගෙන විෂ්කම්භිත කෙලෙසුන්, සැට අවුරුදු මුළුල්ලෙහි, සැත්තෑ අවුරුදු මුළුල්ලෙහි මා කෙරෙහි නොපවත්නාහයි ප්‍රත්‍ය වෙක්ෂා කරන්නාවූ මහණ හටද, චෛත්‍ය දර්ශන, බොධි දර්ශන, ස්ථවිර දර්ශනයන්හි නො සකස්ව කිරීමෙන්, පහළකළ රළු බැව් හෙවත් ලාමකත්වය ඇති බුද්ධාදි වස්තූන්හි පැහැදීමයයි කියනලද ප්‍රේමයක් නැති බැවින් කොටළුවෙකුගේ පිටෙහි රජස් බඳු වූ රළු පුද්ගලයන් දුරු කරන්නාවූ මහණ හටද, බුද්ධාදි වස්තූන්හි පැහැදීම යයි කියන ලද ප්‍රේමය බහුලකොට ඇති මොළොක් සිතැති, සිනිඳුවූ ගුණ ඇති පුද්ගලයන් සෙවනා මහණ හටද, තෙරුවන් ගුණ මොනවට දක්වන්නාවූ තෙරුවන්හි ප්‍රසාදය එලවන සූත්‍රාන්තයන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ මහණ හටද, සිටීම්, හිඳීම් ආදී ඉරියව් වැටුම්හි

ප්‍රීතිය ඉපදවීම පිණිස නැමුණු සිත් ඇත්තාහටද ප්‍රීති-සම්බොධ්‍යාඞ්ගය උපදී. උපන් ප්‍රීති සම්බොධ්‍යාඞ්ගයාගේ ආසෙවනා තොමෝ රහත් මග හේතුකොට ගෙන සම්පූර්ණ වන්නී වේයයි යොගාවචර තෙමේ සම්‍යක් ප්‍රකාරයෙන් දනී.

### පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය

**පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය.** කායපස්සද්ධි චිත්තපස්සද්ධින්හි යොනිසොමනස්කාරය බොහෝ සේ පුරුදු කිරීම නූපන් **පස්සද්ධි** සම්බොධ්‍යඞ්ගයාගේ නැවත නැවත වැඩීම පිණිසද විපුලත්වය පිණිසද, ආසෙවනය පිණිසද, පරිපූර්ණ භාවය පිණිසද පවතී.

තවද, සප්තවිධ ධර්ම කෙනෙක් පස්සද්ධි සම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීම පිණිස පවත්නාහ. එනම්;

1. **ප්‍රණීත භොජනය සෙවනා බවය.** ප්‍රණීතවූ සිනිඳු වූ සත්ප්‍රාය භොජනයක් අනුභව කරණ මහණහට පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය උපදී.

2. **සැපවූ සෘතු ගුණය සෙවනා බවය.**

3. **සැපවූ ඉරියව් සෙවනා බවය.** සභාග විසභාග සෘතු ඊර්යාපථයන් අතුරෙන්, විසභාගවූ සෘතු ඊර්යා-පථයන් දුරුකොට, සභාගවූ සෘතු ඊර්යාපථයන් සෙවනා මහණහටද පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය උපදී.

4. **මධ්‍යස්ථ ප්‍රයොගය ඇති බවය.** තමාගේද අන්‍ය සත්ත්වයන්ගේද කම්මස්සකතා තම්වූ කර්මය ස්වකීය කොට ඇති බව ප්‍රත්‍යවෙක්ෂා කිරීම මධ්‍යස්ථ ප්‍රයොගය යයි කියනු ලැබේ.

5. **නොසන්හුන් කය ඇති පුගුලන් දුරු කරන බවය.** කැට මුගුරු ආදියෙන් අනුන් වෙහෙසවමින්ම හැසිරෙන නොසන්සුන් කයැති පුද්ගලයා දුරු කරන්නාවූ මහණහටද පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය උපදී.

6. **සත්පුන් කයැති පුද්ගලයන් සෙවනා බවය.** සික්මවා ගත් අත් පා ඇති සත්හුන් කයැති පුද්ගලයන් සෙවිනාහටද පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය උපදී.

7. **ඒ පස්සද්ධි සම්බොධ්‍යඞ්ගයෙහි නැමුණු සිත් ඇති බවය.** මේ සත් කාරණය හෙතුකොට ගෙන නූපන් පස්සද්ධියාගේ ඉපදීම වන්නේය. අර්හත් මාර්ගය හේතුකොට ගෙන උපන්නා වූ පස්සද්ධි සම්බොධ්‍යඞ්ගයාගේ භාවනා තොමෝ පරිපූර්ණ වන්නී වේයයි සම්‍යක් ප්‍රකාරයෙන් දනී.

## සමාධි සම්බොධ්‍යාඞ්ගය

සමථ හෙවත් සමාධි නිමිත්තය, අව්‍යග්‍ර හෙවත් අවික්ෂෙප නිමිත්තය යන නිමිත්තයන්හි යොනිසොමනසිකාරය බොහෝ සේ පුරුදු කිරීම නූපන් සමාධි සම්බොධ්‍යාඞ්ගයාගේ ඉපදීම පිණිසද, උපන් සමාධි සම්බොධ්‍යාඞ්ගයාගේ නැවත නැවත වැඩීම පිණිසද, විපුලභාවය පිණිසද, ආසෙවනය පිණිසද, පරිපූර්ණභාවය පිණිසද පවතී.

තවද; එකොළොස් ධර්ම කෙනෙක් සමාධි සම්බොධ්‍යාඞ්ගයාගේ ඉපදීම පිණිස පවත්නාහ. එනම්:

1 **වත්ථු විසද ක්‍රියතා** නම් වූ අධ්‍යාත්මික බාහිර වස්තූන්ගේ නොකිලිටි බැව්, පිරිසිදු බැව් කිරීමය.

2. **ඉන්ද්‍රිය සමත්ත පටිපාදනතා** නම්වූ ඉන්ද්‍රියයන්ගේ සම බව පිළියෙල කිරීමය.

3. **නිමිත්ත කුසලතා** නම්වූ සමාධි නිමිත්තයෙහි දක්ෂ භාවය.

4. **සමයෙ චිත්තස්ස පග්ගහණතා** - නම් වූ යම් කලෙක්හි ඉතා ලිහිල්වූ වීර්‍ය්‍ය ඇති බැවින් සිත මැලිවූයේ හෝ හැකිළ ගියේ හෝ වේද එකල්හි ධම්මවිචය සම්බොධ්‍යාඞ්ගය, වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගය, ප්‍රීති සම්බොධ්‍යඞ්ගය උපදවාලීමෙන් ඒ සිත උපස්ථම්භනය කිරීමය.

5. **සමයෙ චිත්තස්ස නිග්ගහණතා.** නම් වූ යම් කලෙක්හි වැඩියක් ඇරඹූ වැර ඇති බැවි ආදියෙන් සිත උද්ධත වූයේ වේද, එකල්හි පස්සද්ධි සම්බොධ්‍යාඞ්ගය සමාධි සම්බොධ්‍යාඞ්ගය, උපෙක්‍ෂා සම්බොධ්‍යාඞ්ගය උපදවාලීමෙන් ඒ උද්ධත වූ සිත නිග්‍රහ කිරීමයි.

6. **සමයෙ චිත්තස්ස සම්පහංසනතා.** නම් වූ යම් කලෙක්හි සිත, ප්‍රඥා, වීර්‍ය්‍යයන් මඳ බැවින් හෝ සන්සුන් බවත් සුවයත් නොලැබීමෙන් හෝ උපසම නම් ලද සුවය නොවිඳීමෙන් හෝ, නිස්තේජස්ක වූයේ හෝ වේද, එකල්හි අෂ්ට සංවෙග වස්තූන් ප්‍රත්‍යවෙක්‍ෂා කිරීමෙන් සංවෙගයට පමුණුවයිද, රත්නත්‍රය ගුණ නැවත නැවත සිහි කොට පැහැදීම උපදවයිද, එකල්හි ඇති වන්නාවූ සිතෙහි තියුණු බව, සතුටුවන බව කරණකොට ගෙනද, සමාධි සම්බොධ්‍යාඞ්ගය උපදී. අෂ්ට සංවෙග වස්තූහු නම්, ජාති, ජරා, ව්‍යාධි, මරණ, අපාදුක්ඛ, අතීතවට්ටමූලික දුක්ඛය, අනාගත වට්ට මූලික දුක්ඛය, වර්තමාන ආහාර පර්‍යෙෂණ මුල් කොට ඇති දුක්ඛය යන අටය.

7. **සමයෙ චිත්තස්ස අජ්ඣුපෙක්ඛණතා** නම් වූ කලෙක්හි අරමුණෙහි මැදහත් උපෙක්‍ෂා ඇති බවය. යම් කලෙක්හි සම්‍යක් ප්‍රතිපත්තිය කරණු කොට ගෙන සිත මැලි නුවූයේ, නොහැකිළුණේ, උද්ධත නුවූයේ හෝ සන්සුන් වූයේ, තීක්‍ෂණ වූයේ අරමුණෙහි සමව පැවැතියේ, සමාධි සඞ්ඛ්‍යාත විථියට පිළිපන්නේ වේද, එකල්හි මේ යොගාවචර තෙමේ පග්ගහ නිග්ගහ, සම්පහංසන කෘත්‍යයන්හි යත්නය කිරීමට නොපැමිණෙයි. ජවයෙහි සමව පවත්නාවූ අසුන් කෙරෙහි රියැදුරු තෙමේ යත්නය කිරීමට නොපැමිණෙන්නාක් මෙනි. එබැවින් ලීන, උද්ධත භාවයෙන් ඉවත් වූ සිත්හුගේ සමව පවත්නා බව සමාධි සම්බොධ්‍යාඞ්ගයාගේ ඉපදීම පිණිස පවතී.

8 **අසමාහිත පුද්ගල පරිවජ්ජනතා** නම් චිත්තෙකාග්‍රතා විරහිත පුද්ගලයන් දුරලීමය, උපචාර සමාධියට හෝ, අර්පණා සමාධියට හෝ නොපැමිණියාවූ එක් අරමුණෙක නොනැවතී, නොපිහිටි සිත් ඇත්තාවූ පුද්ගලයන් දුරින් දුරු කටයුතු.

9 **සමාහිත පුද්ගල සෙවනතා** නම්වූ චිත්තෙකාග්‍රතා සමන්විත පුද්ගලයන් සෙවිනා බවය උපචාර සමාධියෙන් හෝ අර්පණා සමාධියෙන් හෝ එකඟවූ සිත් ඇති පුද්ගලයන් සේවනය කිරීම භජනය කිරීම, පයුරුපාසනය හෙවත් වෙත එළඹ ඇසුරු කිරීම සමාධියගේ ඉපදීමට උපකාර වේ.

10. **ධ්‍යාන මාර්ගඵල ධර්මයන් ප්‍රත්‍යවෙක්‍ෂා කරන බවය.**

11. **සමාධි සම්බොධ්‍යාඞ්ගය ඉපදීමට නැමුනු සිත් ඇති බවය.**

මෙසේ උපන්නාවූ සමාධි සම්බොධ්‍යාඞ්ගය අර්හත් මාර්ගය හෙතුකොට ගෙන සම්පූර්ණවන්නේයයි යොගාවචර තෙමේ සම්‍යක් ප්‍රකාරයෙන් දනී

**උපෙක්ඛා සම්බොධ්‍යාඞ්ගය.** උපෙක්‍ෂා සම්බොධ්‍යාඞ්ගයාගේ ප්‍රවෘත්තිස්ථානවූ ධර්මයන්හි යොනිසො මනසිකාරය බොහෝසේ පුරුදු කිරීම නූපන් උපෙක්‍ෂා සම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීම පිණිසද, උපන් උපෙක්‍ෂා සම්බොධ්‍යාඞ්ගයාගේ නැවත නැවත වැඩීම පිණිසද, විපුලභාවය පිණිසද, ආසෙවනය පිණිසද පරිපූර්ණ භාවය පිණිසද පවතී.

තවද, පඤ්චවිධ ධර්ම කෙනෙක් උපෙක්‍ෂා සම්බොධ්‍යාඞ්ගයාගේ ඉපදීම පිණිස පවත්නාහ

1 **සත්ත්වයන් විෂයෙහි මැදහත් බවය.** තමාගේ කර්මය හෙතුකොට ගෙන අවුත් තමාගේම කර්මය හෙතුකොට ගෙන යන්නෙහිය අන්‍ය සත්ත්වයෝද, තමන්ගේ කර්ම හෙතුකොට ගෙන අවුත් තමන්ගේ කර්ම හෙතු කොට

ගෙන යන්නාහුය මෙසේ කර්මය සවකීය කොට ඇති බව ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන්ද, පරමාර්ථ වශයෙන් සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැත. එබැවින් සත්ත්ව පුද්ගල නොවූ නමා කවරක්හු ප්‍රියද්‍රිවක්හු කෙරෙයිද යනාදි වශයෙන් නිස්සත්ත භාවය ප්‍රතිවෙක්ෂා කිරීමෙන්ද උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය උපදවා ගන්නේය.

2. **සංස්කාරයන් විෂයෙහි මැදහත් බවය.** මේ මැදහත් බව, අස්වාමික භාවය ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන්ද, තාවකාලික බව ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන්ද සිද්ධකටයුතු. මේ සිවුර ක්‍රමයෙන් පැහැ වෙනස් බවටද, ජීර්ණ භාවයටද. පැමිණ පාපිස්නා පිළිකඩක්වී සැරයටි කොනින් ඉවතලිය යුත්තක් වන්නේය. ඉදින් මේ චීවරයාගේ හිමියෙක් වන්නේ නම්, එසේ හිමියක්හු ඇතිකල්හි මේ සිවුරට වැනසෙන්නට නොදෙන්නේය. මෙහි පරිද්දෙන් අහිමි බව ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන්ද, මේ සිවුර දිගු කලක් නොපවත්නේය, තාවකාලිකය යනාදි වශයෙන් සංස්කාරයන්ගේ තාවකාලික බව ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන්ද එසේම පාත්‍රාදිවූ අන්‍ය පරිෂ්කාරයෝද අස්වාමිකයසිද, තාවකාලිකයසිද ප්‍රත්‍යවෙක්ෂාකරන්නාහට උපෙක්ෂාසම්බොධ්‍යාඞ්ගය උපදී.

3. **සත්ත්ව, සංස්කාර ධර්මයන් විෂයෙහි මමත්වය ඇති පුද්ගලයන් දුරු කිරීමය.** යම් පුද්ගලයෙක් ගිහිවූයේව හෝ, තමාගේම පුත්‍රමිත්‍ර ආදීන් පැවිදිවූයේව හෝ, තමාගේම අතවැසියන් සමානොපාධ්‍යායාදීන් ප්‍රිය වූවන් කෙරෙයිද, සියතින්ම ඔවුන්ගේ කෙස් සිඳීම්, ගෙත්තම් කිරීම්, සිවුරු දෙවීම් ආදිය කෙරෙයිද, මොහොතක් කල් ඔහු නොදක්නේ විනම් අසවල් සාමණේර නම හෝ දහර භික්ෂුව හෝ කොහි ගියේදැයි තැතිගත් මුවෙක්හු මෙන් ඔබමොබ නරඹාද, අන් මහණකු විසින් කෙස්සිඳීම් ආදී කටයුත්තක් පිණිස මොහොතක් කල් අසුවල් හෙරණ හෝ අසුවල් දහර භික්ෂුව මේ විගස එවා වදාළ මැනවැයි යාඥා කරනු ලබන්නේ වී නමුත්, අපිද ඒ හෙරණ හෝ දහර භික්ෂුව

ලවා තමාගේ කටයුත්තක් හෝ නොකරවමුය, නොප ඔහු ගෙන වෙහෙසන්නහුය යනාදි වශයෙන් බැත නොදේද, මෙබඳුවූ පුද්ගලතෙම සත්ත්ව මමත්වය ඇත්තෙක් වේ. යම් පුද්ගලයෙක් සිවුරු පාත්‍ර, සැරයටි ආදීන්හි ප්‍රිය කෙරෙයිද, අන් කෙනෙකුට පහස්නටක් නොදෙයිද. තාවකාලිකව ඉල්වන ලද්දේවී නමුත් අපිදු මේ සිවුරු, පිරිකර ආදිය පරිභොග නොකරන්නෝ වූ අනුන්ට කෙසේ දෙන්නෙමුද යනාදි වශයෙන් කියාද, එබඳු පුද්ගලයන් දුරු කටයුතු.

**4. සත්ත්ව සංස්කාර ධර්මයන් විෂයෙහි මැදහත්වූ පුද්ගලයන් සේවනා බවය.** යම් පුද්ගලයෙක් සත්ත්ව සංස්කාර යන උභය වස්තුන්හි මැදහත් වූයේ වේද, උදාසීන වූයේ වේද, මෙබඳු පුද්ගලයන් සේවනය කිරීම උපෙක්ෂා සම්බොධ්‍යාඞ්ගයාගේ ඉපදීම පිණිස පවතී.

**5. උපෙක්ෂා සම්බොධ්‍යාඞ්ගයාගේ ඉපදීමෙහි නැමුනු සිත් ඇති බවය.**

මේ ආදී කරුණු හෙතු කොට ගෙන උපන්නාවූ උපෙක්ෂා සම්බොධ්‍යාඞ්ගය අර්හත් මාර්ගය කරණ කොටගෙන සම්පූර්ණවන්නීයයි යොගාවචර තෙමේ සම්‍යක් ප්‍රකාරයෙන් දනී. මෙසේ සප්තබොධ්‍යාඞ්ග ධර්මයන්ගේ වශයෙන් ධම්මානුපස්සනාව වඩන්නාවූ යෝගාවචර තෙමේ තමා කෙරෙහි ඇත්තාවූ බොධ්‍යාඞ්ග ධර්මයන් කෙරෙහිද, අනුන් පිළිබඳව ඇත්තාවූ බොධ්‍යාඞ්ග ධර්මයන් කෙරෙහිද, අධ්‍යාත්ම බාහිර වශයෙන් ඇත්තාවූ බොධ්‍යාඞ්ග ධර්මයන් කෙරෙහිද, බොධ්‍යාඞ්ග ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේ. ඒ බොධ්‍යාඞ්ග ධර්මයන්ගේ උත්පාදය හා විනාශයද මෙනෙහි කරන්නේ, ඥාණයාගේ වැඩීම කරණ කොට ගෙන අර්හත්ත්වයට පැමිණෙන්නේය.

# චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන්ගේ වශයෙන් ධම්මානුපස්සනාව

චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් මෙනෙහි කරන්නාවූ යෝගාවචරතෙමේ මේ දුක්ඛාර්‍ය්‍ය සත්‍යයයි කියා තත්වූ පරිද්දෙන් දන්නේය. එසේම මෙය දුක්ඛ සමුදයාර්‍ය්‍ය සත්‍යය යයි කියාද, මේ දුක්ඛ නිරෝධාර්‍ය්‍ය සත්‍යයයි කියාද, මේ දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යයයි කියාද, තත්වූ පරිද්දෙන් දන්නේය.

මේ සතර සත්‍ය ධර්මයන් අතුරෙන් ඒ ඒ සත්ත්ව සමූහයෙක්හි අපරිපූර්ණායතන ඇත්තවුන්ගේ වශයෙන් යම් ඉපදීමක් වේද, පරිපූර්ණායතන ඇත්තවුන්ගේ වශයෙන් යම් හටගැනීමක් වේද, අණ්ඩජ ජලාබුජ සත්ත්වයන්ගේ වශයෙන් උත්පත්තිස්ථානයට යම් ඇතුල්වීමක් වේද, සංසෙදජ, ඕපපාතිකයන්ගේ වශයෙන් ප්‍රකට පහළවීමක් වේද, පරමාර්ථවශයෙන් ඒකවොකාර, චතුවොකාර පංචවොකාර භවයන්හි ස්කන්ධයන්ගේ පහළවීමක් වේද, ඒ ඒ තන්හි ආයතනයන්ගේ ලැබීමක් වේද, එය ජාති දුක්ඛ යයිද,

උපන්නාවූ ඒ ඒ සත්ත්වයන්ගේ යම් ජරාවක් වේද, දිරණ බවක් වේද ඛණ්ඩ දන්තයන් ඇති බවක් වේද, කෙස් ලොම් ආදීන්ගේ පැසීමක් වේද, සම රැලි බවක් වේද, ආයුෂයාගේ ගෙවීමක් වේද, චක්ෂුරාදි ඉන්ද්‍රියයන්ගේ මුහුකුරා ගිය බවක් වේද, එය ජරා දුක්ඛ යයිද,

ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්ව නිකායයෙන් යම් චුතවීමක් වේද, ජීවිතය ගැලවී යන බවක් වේද පරමාර්ථ වශයෙන් ස්කන්ධයන්ගේ යම් බිඳීමක් වේද, රූපස්කන්ධාදීන්ගේ අතුරුදන්වීමක් වේද, සම්මුති මරණයක් හෝ වේද, කාල ක්‍රියාවක් වේද, කලෙබරයාගේ නිඃක්ෂෙපයක් වේද, එය මරණ දුක්ඛ යයිද,

ඥාති ව්‍යසන, රෝග ව්‍යසනාදීන්ගෙන් යුක්ත වූ සත්ත්වයාගේ හෝ එක්තරා දුක්ඛ ස්වභාවයකින් ස්පර්ශ කරනලද්දහුගේ හෝ යම් සෝක කිරීමක් වේද, සෝක කරන ආකාරයක් වේද, සෝක කරන බවක් වේද ඇතුළත සෝක කිරීමක් වේද, ඇතුළත විශේෂයෙන් වියලීමක් වේද එය **සෝකය** යයිද,

ඥාති ව්‍යසනාදීන්ගෙන් යුක්තවූ පුද්ගලයාගේ යම් නම් කියා හැඬීමක් වේද, ගුණ වර්ණනාකොට හැඬීමක් හෝ වේද, නම් කියා හඬන ආකාරයක් වේද, ගුණ කියා හඬන ආකාරයක් වේද එය **පරිදේව දුක්ඛ** යයිද,

කයෙහි හටගත් යම් දුකක් වේද, කයෙහි හටගන්නාවූ නොමිහිරි බවක් වේද, කාය ස්පර්ශයෙන් හටගන්නාවූ දුක්වූ විඳීමක් වේද, අමිහිරි විඳීමක් වේද, එය **කායික දුක්ඛය** යයිද,

සිතෙහි හටගන්නාවූ යම් දුකක් වේද, සිතෙහි හටගන්නාවූ අමිහිරි බවක් වේද, අමනොඥ අරමුණු ස්පර්ශ වීමෙන් සිතෙහි හටගත් දුකක් වේද, සැප නොවූ විඳීමක් වේද, එය **දෞර්මනස්‍ය** යයි කියාද,

ඥාතිව්‍යසනාදි දුක්ඛ ධර්මයන්ගෙන් යුක්තවූ පුද්ගලයාගේ චිත්තක්ලාන්ත ස්වභාවයවූ යම් ආයාසයක් වේද, බලවත් ආයාසයක් වේද, ක්ලාන්තවූ ස්වභාවයක් වේද, දැඩි ක්ලාන්ත ස්වභාවයක් වේද එය **උපායාසය**යි කියා ද,

සසර උපදින බව ස්වභාව කොට ඇති සත්ත්වයන්ට, දුක් ගෙන දෙන්නාවූ මේ ඉපදීම නොලැබෙත් නම් යෙහෙක, ජාතිය නො ආයේ නම් යෙහෙකැයි ආශාවූ පරිද්දෙන් නොලැබීමද, ජරාවෙන් පීඩිතවූ සත්ත්වයාහට ජරාස්වභාවය නොපැමිණෙන්නේ නම් යෙහෙක, ජරාව නොආයේ නම් යෙහෙකැයි ආශාවූ පරිද්දෙන් නොලැබීමද ව්‍යාධි දුකින් පෙළෙන සත්ත්වයාහට, ව්‍යාධිය නැත්තේ වේනම් යෙහෙක, ව්‍යාධිය නොආයේ නම්

යෙහෙකැයි, ආශාවූ පරිද්දෙන් නොලැබීමද, මරණ ධර්මය ස්වභාවකොට ඇති සත්ත්වයාහට, මරණස්වභාවය නැත්නම් යෙහෙක. මරණය නොආයේනම් යෙහෙකැයි, ආශාවූ පරිද්දෙන් නොලැබීමද, එමෙන්ම සොක, පරිදේව, දුක් දොම්නස් උපායාසාදීන් පීඩිත වූ සත්නට එවැනි සොකාදිය නොපැමිණෙන්නේ නම්, නොආයේ නම්, යෙහෙකැයි ආශාවූ පරිද්දෙන් නොලැබීමද, **කැමැති දෙය නොලැබීමෙන් ඇතිවන දුක්ඛය** කියාද,

සංක්ෂෙපයෙන් රූප, වේදනා සංඥා, සංඛාර, විඤ්ඤාණ, යන **පඤ්චුපාදානස්කන්ධයෝම** දුකයයි කියාද විදර්ශනාඥාන යෙන් දැනීම **දුක්ඛාර්‍ය සත්‍යයයි** දත්තේය.

නැවත නැවත භවයෙහි උත්පත්තිය ඇතිකරන්නාවූ නන්දිරාගය හා එක්ව පැවති, රූපශබ්දාදි නොයෙක් අරමුණු ගැනීමෙන් සතුටුවන්නාවූ යම් තෘෂ්ණාවක් වේද, පඤ්චකාම ගුණික රාග වශයෙන් පැවති **කාමතෘෂ්ණාවය,** භවය ශාස්වතය, නිත්‍යයයි ගෙන රූපාරූප භවයන්හි ප්‍රාර්ථනා වශයෙන් හා ධ්‍යාන නිකාන්ති වශයෙන් පවත්නා **භවතෘෂ්ණාය,** උච්ඡෙද දෘෂ්ටි වශයෙන්, මෙයින් මත්තෙහි සත්ත්වයාහට භවයක් නැතැයි ගන්නාලද **විභවතෘෂ්ණාය** යන සියළු තෘෂ්ණාවෝ **සමුදයාර්‍යසත්‍යය** යයි යම්කිසිවක් ප්‍රියවූ ස්වභාවය ඇත්තේවේද, විඳයුතුවූ මධුර ස්වභාවය ඇත්තේවේද, තෘෂ්ණාතොමෝ එහිම උපදනේය, එහිම පවත්නේය, චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය මන යන ෂඩ් අධ්‍යාත්මික ආයතනයන්හිද රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම යන ෂඩ් බාහිර ආයතනයන්හිද, චක්ඛු විඤ්ඤාණ, සොත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ, මනො විඤ්ඤාණ යන ෂඩ් විඤ්ඤාණයන්හිද චක්ඛු සම්ඵස්ස, සොත සම්ඵස්ස, ඝාණ සම්ඵස්ස, ජිව්හා සම්ඵස්ස, කාය සම්ඵස්ස, මනො සම්ඵස්ස යන ෂඩ්විධ ස්පර්ශයන්හිද, චක්ඛුසම්ඵස්සජා වෙදනා සොත සම්ඵස්සජා වෙදනා, ඝාණසම්ඵස්සජා වෙදනා, ජිව්හා

සම්ඵස්සජා වේදනා, කාය සම්ඵස්සජා වේදනා, මනො සම්ඵස්සජා වේදනා යන ෂඩ්විධ වේදනාවන්හිද, රූප සඤ්ඤා, ශබ්ද සඤ්ඤා, ගන්ධ සඤ්ඤා, රස සඤ්ඤා, පොට්ඨබ්බ සඤ්ඤා, ධම්ම සඤ්ඤා යන ෂඩ්විධ සඤ්ඤාවන්හිද, රූප සඤ්චේතනා, ශබ්ද සඤ්චේතනා, ගන්ධ සඤ්චේතනා, රස සඤ්චේතනා, පොට්ඨබ්බ සඤ්චේතනා, ධම්ම සඤ්චේතනා යන ෂඩ්විධ චේතනාවන්හිද, රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, පොට්ඨබ්බ තණ්හා ධම්ම තණ්හා, යන ෂඩ්විධ තෘෂ්ණාවන්හිද, රූප විතක්ක, ශබ්ද විතක්ක, ගන්ධ විතක්ක, රස විතක්ක, පොට්ඨබ්බ විතක්ක, ධම්ම විකක්ක යන ෂඩ්විධ විතර්කයන්හිද, රූප විචාර, ශබ්ද විචාර, ගන්ධ විචාර, රස විචාර, පොට්ඨබ්බ විචාර, ධම්ම විචාර යන ෂඩ්විධ විචාරයන්හිද ප්‍රියවූ ස්වභාවය විඳ යුතුවූ මධුරවූ ස්වභාවය ඇති හෙයින් තෘෂ්ණා තොමෝ එහි තන්හි ඉපිද එහි තැන්හිම පවත්නේයයිද දන්නේය.

පුනර්භවය ඇති කරන්නාවූ කාමතෘෂ්ණාදී වශයෙන් ප්‍රභේද ඇත්තාවූ තෘෂ්ණාවගේ මාර්ග සංඛ්‍යාත විරාගයෙන් යම් නිරවශෙෂ නිරොධයක් වේද, ආලය ඇරීමක් ස්වීකාරයෙන් ආලයාගේ දුරලීමක් වේද, ඒ ආලයාගේ මිදීමක් වේද, යම් නොඇලීමක් වේද, එය **දුක්ඛ නිරොධාර්‍ය සත්‍යය** යයි විදර්ශනාඥානයෙන් දැන ගන්නේය.

එමෙන්ම මේ දුක්ඛයාගේ නිරොධය, තෘෂ්ණාවගේ උත්පත්තිස්ථානවූද, පවත්නා ස්ථානවූද, චක්ඛායතනාදී සැට තැන්හිදීම ඇතිවන බවත්, එහිදීම නිරුද්ධවන බවත් දැන වාසය කරන්නේය.

දුක්ඛනිරොධය පිණිස පිළිපැදියයුතුවූ අංග අටකින් යුත් ප්‍රතිපදාව **දුක්ඛ නිරොධගාමිනී පටිපදා ආර්‍යසත්‍ය** යයිද දැනගන්නේය. ඒ ආර්‍ය මාර්ගාඞ්ග අටදෙනා නම්, මිථ්‍යාදෘෂ්ටියට ප්‍රතිපක්ෂවූ චතුස්සත්‍ය දන්නා නුවණ යයි කියනලද **සම්‍යග් දෘෂ්ටියද,** මිථ්‍යා සඞ්කල්පනාවට ප්‍රති

පක්ෂවූ නෛෂ්ක්‍රම්‍යාදි **කල්පනායයි** කියනලද **සම්‍යග් සඞ්කල්පනාවද,** මිථ්‍යා වචනයට ප්‍රතිපක්ෂවූ වාග් දුශ්චරිතයෙන් වැළකීම **ලක්ෂණකොට** ඇති **සම්‍යග් වචනයද,** මිථ්‍යා **කර්මාන්තයට** ප්‍රතිපක්ෂවූ කාය දුශ්චරිතාදියෙන් වැළකීම **ලක්ෂණකොට** ඇති **සම්‍යග් කර්මාන්තයද,** මිථ්‍යා ජීවයට ප්‍රතිපක්ෂවූ සම්‍යක් ආජීවය **ලක්ෂණකොට** ඇති **සම්මා ආජීවයද,** මිථ්‍යා වීර්‍ය්‍යයට ප්‍රතිපක්ෂවූ වීර්‍ය්‍යාරම්භය **ලක්ෂණකොට** ඇති **සම්‍යග් ව්‍යායාමයද,** මිථ්‍යා ස්මෘතියට ප්‍රතිපක්ෂවූ අවිප්‍රවාසය **ලක්ෂණකොට** ඇති **සම්මා සතියද,** මිථ්‍යා සමාධියට ප්‍රතිපක්ෂවූ අවික්ෂෙපය **ලක්ෂණකොට** ඇති **සම්‍යග් සමාධියද** වෙත්.

චතුස්සත්‍යය ධර්මයන්ගේ වශයෙන් ධම්මානුපස්සනාව වඩන්නාවූ යොගාවචරතෙමේ අධ්‍යාත්මිකවූ චතුස්සත්‍ය ධර්මයන් කෙරෙහි ධර්මානුස්මෘති වශයෙන් ඒ ඒ ධර්මයන් අනුව බලමින් වාසය කරන්නේය. අනුන් පිළිබඳවූද චතුස්සත්‍ය ධර්මයන් කෙරෙහිද ධර්මය අනුව බලමින් වාසය කරන්නේය. කලෙක අධ්‍යාත්මයෙහිද, කලෙක පරසන්තානයෙහිද ඇති චතුස්සත්‍ය ධර්මයන් කෙරෙහි, ධර්මය අනුව බලමින් වාසය කරන්නේය ඒ ඒ ධර්මයන්ගේ උත්පත්තියද, විනාශයද දකිමින් වාසය කරන්නේය. මෙසේ අනුපස්සනා වශයෙන් චතුස්සත්‍ය ධර්මයන් සම්මර්ශනය කරන කල්හි, සිතිය මනාකොට එළඹ සිටි කල්හි ඤාණයාගේ වැඩීම් හෙතුකොටගෙන අර්හත් ඵලයට පැමිණෙන්නේය.

මේ සතර සතිපට්ඨාන ධර්මයන් අතුරෙන් කායානුපස්සනා සතිපට්ඨානය සමථවිදර්ශනා වශයෙන්ද, වෙදනා, චිත්ත ධම්මානුපස්සනා සතිපට්ඨානයෝ ශුද්ධවිදර්ශනා වශයෙන්ද දෙශනා කරනලදී. සුද්ධවිපස්සනා නම් සමථ භාවනා හා මිශ්‍ර නොවූ විදර්ශනා භාවනාවයි.

මේ සතිපට්ඨානයෝ ලොකොත්තර මාර්ගයට පූර්වභාගයෙහිද නානාක්ෂණිකව හෙවත් නොයෙක් සිත්හි ලැබෙත්. අන්‍යවූම් සිතකින් රූපකාය පිරිසිඳ දැනගැනීමද,

අන් සිතෙකින් වේදනා සමූහයද, අන් සිතෙකින් චිත්ත සමූහයද, අන් සිතෙකින් සංස්කාරස්කන්ධ පර්‍යාපන්නවූ නීවරණාදිධර්මයන් පිරිසිඳ දැනගැණීමද වේ. ලොකොත්තරවූ මාර්ග චිත්තක්ෂණයෙහි වනාහි එක් සිතෙක්හිම ලැබෙත්. මුල පටන් රූප කාය හෙවත් කෙසාදී සමූහය පිරිසිඳීම් බවට පැමිණි මහණහුගේ විදර්ශනා ජවන් සිත් සමග යෙදුනාවූ **ස්මෘති** තොමෝ **කායානුපස්සනා** හෙවත් **කායානුදර්ශනා** නම් වේ. ඒ ස්මෘතිය හා යුක්තවූ පෘථග්ජන පුද්ගල තෙමේ **කායානුපස්සී** හෙවත් **කායානුදර්ශී** නම් වේ. විදර්ශනාව වඩා ආර්‍යමාර්ගයට පැමිණි මහණහුගේ මාර්ගක්ෂණයෙහි මාර්ග චිත්තය හා සම්ප්‍රයුක්තවූ ස්මෘති තොමෝ **කායානුපස්සනා** හෙවත් **කායානුදර්ශනා** නම් වේ. ඒ ස්මෘතිය හා යුක්තවූ ආර්‍ය්‍ය පුද්ගලතෙම් **කායානුපස්සී** හෙවත් **කායානුදර්ශී** නම් වේ. එමෙන්ම වේදනා සමූහය, චිත්ත සමූහය, සංස්කාරස්කන්ධ පර්‍යාපන්නවූ ධර්ම සමූහය පිරිසිඳීම් බවට පැමිණි මහණහුගේ විදර්ශනා ජවන් සිත් සමග යෙදුනාවූ ස්මෘති තොමෝ **ධම්මානුපස්සනා** හෙවත් **ධර්මානුදර්ශනා** නම් වේ. ඒ ස්මෘතිය හා යුක්ත වූ පෘථග්ජන පුද්ගලතෙමේ **ධම්මානුපස්සී** හෙවත් **ධර්මානුදර්ශී** නම් වේ. විදර්ශනාව වඩා ආර්‍ය්‍ය මාර්ගයට පැමිණි මහණහුගේ මාර්ගක්ෂණයෙහි මාර්ග චිත්තය හා සම්ප්‍රයුක්ත වූ ස්මෘති තොමෝ **ධම්මානුපස්සනා** හෙවත් **ධම්මානුදර්ශනා** නම් වේ. ඒ සතිය හා යුක්තවූ ආර්‍ය්‍ය පුද්ගල තෙමේ **ධම්මානුපස්සී** හෙවත් **ධර්මානුදර්ශී** නම් වේ.

රූප කායයෙහි **සුභය** යන විපර්‍යාසය දුරුකරන්නාවූ, රූපකාය **පිරිසිඳ** සිහිකරන්නාවූ ස්මෘති තොමෝ ලොකොත්තර මාර්ගය හෙතුකොටගෙන සමෘද්ධවන හෙයින් **කායානුපස්සනා** නම් වේ.

වේදනා සමුදයයෙහි සුඛය යන විපර්‍යාසය දුරු කරන්නාවූ වේදනා සමූහය පිරිසිඳ සිහිකරන්නාවූ ස්මෘති- තොමෝ ලොකොත්තර මාර්ගය හෙතුකොටගෙන සමෘද්ධවන හෙයින් **වේදනානුපස්සනා** නම් වේ.

චිත්ත සමුදායයෙහි නිත්‍යය යන විපයර්‍යාසය දුරු කරන්නාවූ චිත්ත සමූහය පිරිසිඳ සිහිකරන්නාවූ ස්මෘති තොමෝ ලෝකෝත්තර මාර්ගය හෙතුකොටගෙන සමෘද්ධ වන හෙයින් **චිත්තානුපස්සනා** නම් වේ.

සංස්කාරස්කන්ධ පර්‍යාපන්නවූ ධර්මයන්හි ආත්මය යන විපර්‍යාසය දුරු කරන්නාවූ, ධර්මයන් පිරිසිඳ සිහිකරන්නාවූ ස්මෘති තොමෝ, ලෝකෝත්තර මාර්ග චිත්තය හෙතුකොට ගෙන සමෘද්ධවන හෙයින් **ධම්මානුපස්සනා** නම් වේ.

එකලාවූම ලෝකෝත්තර මාර්ගය හා සම්ප්‍රයුක්තවූ ස්මෘති තොමෝ චතුර්විධ කෘත්‍ය සම්පාදනාර්ථයෙන් චතුර්විධවූ නාමයන්ම ලබයි.

## සතර සම්මප්පධාන ධර්ම

**සම්මප්පධානයෝ** නම් බොධිපාක්ෂික ධර්මයන්ට ඇතුළත්වූද, මාර්ග ඵලාධිගමය පිණිස වැඩියයුතු වූද, සතපත් වීර්‍යයෝයි, හෙවත් ඒකාන්තයෙන්ම මාගේ ශරීරයෙහි සම් ඇට නහර ඉතිරිවේවා, මස් ලේ වියළේවා, පුරුෂ ශක්තියෙන්, පුරුෂ පරාක්‍රමයෙන් යම් ගුණයක් ලබාගත හැකිද, එය නොලබා වීර්‍යයාගේ නැවැත්මක් නොවේයයි තදින් ගන්නාලද නොපසුබස්නා වීර්‍යයවේ.

මේ වීර්‍යය සතරාකාර වේ. එනම්:-

1. **උපන් අකුසල් ප්‍රහාණය පිණිස ගන්නා වීර්‍යය**
2. **නූපන් අකුසල් නූපදීම පිණිස ගන්නා වීර්‍යය**
3. **නූපන් කුසල් උපදවාගැනීම පිණිස ගන්නා වීර්‍යය**
4. **උපන් කුසල් වැඩීම පිණිස ගන්නා වීර්‍යය**

සසරින් එතරවනු කැමැතිව විදර්ශනා වඩන්නාවූ යොගාවචර තෙමේ, මේ සතර ධර්මයෝ, බොධිය හෙවත් මාර්ගඥානය ලබාගැනීමට උපකාර වන්නාවූ බොධිපාක්ෂික

ධර්මයන් බව දත සතර සම්‍යග්ප්‍රධානයන්ගේ වශයෙන් චඩා මාගීඵලාධිගමය කරන්නේය.

කාරණාභූතවූ ප්‍රධාන් වීයෘී ධර්ම හෙවත් ප්‍රධාන් වීය්‍ර්‍ය සඞ්ඛ්‍යාත කාරණා වූ ධර්මයන්ට **සම්මප්පධානයෝ** යයි කියනු ලැබේ. යුක්තිභූතවූ හෙවත් අනුරූපවූ ප්‍රධාන් වීයෘී ධර්මයෝ යයි ද උපායභූතවූ ප්‍රධාන් වීයෘී ධර්මයෝ යයි ද නුවණින් ප්‍රධානවීයෘී කිරීම යයිද කියනු ලබන්නේත් මේ සතර සම්මප්පධානයන්ටමය.

මේ බුද්ධශාසනයෙහි භාවනාවට පිළිපන්නාවූ හෙවත් භාවනානුයොගීවූ මහණතෙම, නූපන්නාවූ, ලාමකවූ, නිහීනවූ, කෞශල්‍ය නම් ලද ඥනය හෙතුකොටගෙන නොහටගත්තාවූ, අකුසල ධර්මයන්ගේ නොඉපදීම පිණිස, කත්තුකම්‍යතා සඞ්ඛ්‍යාත කරණු කැමති බව යයි කියනලද කුසලච්ඡන්දය උපදවයි. දැඩි උත්සාහය වූ පරාක්‍රමය කෙරෙයි. කායික චෛතසික වූ වීයෘී කෙරෙයි. ඒ සිත සමග උපන් වීයෘී කාරණකොටගෙනම සිත ඔසවයි. කාරණාභූතවූ වීයෘී කෙරෙයි. නොහොත් නැවත නැවත සේවනය කිරීම්, වැඩි දියුණු කිරීම්, බහුලකොට කිරීම්, නිරතුරුව කිරීම් වශයෙන් වීයෘීය වඩයි. එපරිද්දෙන්ම උපන්නාවූ හෙවත් නූපන්හයි නොකියයුතු බවට පැමිණියාවූ අකුසල ධර්මයන්ගේ දුරලීම පිණිසද, නූපන්නාවූ කෞශල්‍ය යයි කියනලද නුවණ හෙතුකොටගෙන පැවති කුසල ධර්මයන්ගේ ඉපදීම පිණිසද, උපන්නාවූ කුසල ධර්මයන්ගේ ස්ථිතිය පිණිසද, නොනස්නා පිණිසද, නැවත නැවත වීම පිණිසද, විපුලත්වය පිණිසද, වැඩීම පිණිසද, පරිපූර්ණත්වය පිණිසද වීයෘී වඩයි.

නූපන්හයි කියයුතු බවට පැමිණි පාපධර්මයෝ නම්:-

1. **භූමිලබ්ධොත්පන්න ක්ලෙශයෝය**

2. **ආලම්බනාධිගෘහීතොත්පන්න ක්ලෙශයෝය**

3. **අවිෂ්කම්භිතොත්පන්න ක්ලෙශයෝය**
4. **අසමුද්ඝාතිතොත්පන්න ක්ලෙශයෝ** යයි සතරාකාර වේ.

එයින් විදර්ශනාවට භූමිභූතවූ අතීතාදී ප්‍රභෙදවත් වූ පඤ්චස්කන්ධයන්හි අනුසයාවස්ථාවට පැමිණි කෙලෙස්හු, මාර්ගයෙන් නොපහව ගියාහු වෙත්ද, ඒ ක්ලෙශයෝ **භූමිලබ්ධොත්පන්නයෝයි.**

වරක් ඇස් දල්වා අරමුණක්හු නිමිත්තක්හු ගත් කල්හි ආලම්බනාධිගෘහිත වන බැවින්, අනුස්මරණය කළ කළ කෙණෙහි කෙලෙස්හු නූපදනාහයි නොකිය යුත්තාහුද, මාර්ගයෙන් ප්‍රහීණ නොකළ ඒ ක්ලෙශයෝ **ආලම්බනාධි-ගෘහිතොත්පන්නයෝයි.**

සමාපත්තියකින් විෂ්කම්භණය නොකළාවූ මෙනම් කෙලෙස්හු නැවත නූපදින්නාහයි නොකියයුත්තාහුද, ඒ ක්ලෙශයෝ **අවිෂ්කම්භිතොත්පන්නයෝයි.**

මාර්ගයෙන් සමූලඝාතනය නොකළාවූ කෙලෙස්හු, භවයෙහි උපන් පුද්ගලයා හට උපදින්ද, ඒ ක්ලෙශයෝ **අසමුද්ඝාතිතොත්පන්නයොයි.**

මේ සතර සම්‍යග් ප්‍රධන් වීර්‍ය්‍යයෝ **ලෞකික සම්‍යග් ප්‍රධන් වීර්‍ය්‍යයෝය, ලොකොත්තර සම්‍යග්ප්‍රධන් වීර්‍ය්‍යයෝ යයි** දෙයාකාර වේ.

**ලෞකික සම්‍යග්ප්‍රධන් වීර්‍ය්‍යයෝ** සියලු මාර්ගයන්ට පූර්වභාගයෙහි උපදී. ඒ ලෞකිකවූ සම්‍යග්ප්‍රධන් වීර්‍ය්‍යයෝ සතරදෙනා නම්:-

1. මේ සත්හෙති සසර බිය දක්නා මහණතෙමේ ඕහට නූපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයෝ උපදින්නාහු නම් අනර්ථ පිණිස පවත්නාහයි **දුන** වීර්‍ය්‍ය වඩයි.

2. උපන්නාවූ ලාමක වූ අකුසල ධර්මයෝ පහ නො වන්නාහු නම් අනර්ථ පිණිස පවත්නාහයි **දුන** වීර්‍ය්‍යවඩයි.

3. නූපන්නාවූ කුසල ධර්මයෝ නූපදින්නාහු නම් අනර්ථ පිණිස පවත්නාහයි දැන වීර්‍ය්‍යී වඩයි.

4. උපන්නාවූ කුසලධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් අනර්ථ පිණිස පවත්නාහයි දැන වීර්‍ය්‍යී වඩයි.

මෙහි නූපන් කුසල ධර්මයෝ නම් සමථවිදර්ශනාවෝ ය. මොහුට මාර්ගයත්, නූපන් කුසලයකි. උපන් කුසල්හු නම් සමථවිදර්ශනාවෝම වෙති. ආර්‍ය්‍ය මාර්ගය වරක් ඉපිද නිරුද්ධ වන්නේවීනමුත් අනර්ථය පිණිස නොපවතී. ඒ ආර්‍ය්‍ය මාර්ගය තම තමා අයත් ඵලයට ප්‍රත්‍යයව නිරුද්ධවන බැවිනි.

උපන්නාවූ සමථවිදර්ශනාවෝ නිරුද්ධ වන්නාහු නම් අනර්ථය පිණිස පවත්නාහයි දක්වීම පිණිස එක්තර කථා වස්තුවක් දක්වා තිබේ.

එක් රහත් සථවිරයන් වහන්සේ නමක් ලක්දිව රුවන්වැලි මහා සෑයත් ශ්‍රී මහා බෝධීන් වහන්සේත් වඳින්නෙමියි සමාපත්තිලාභිවූ පා සිවුරු ගන්නා සාමණේර නමක් සමග දනව්වෙන් මහා වෙහෙරට අවුත් පියංගණ නම් පිරිවෙනට වැඩි සේක. සවස් වේලෙහි මහා භික්ෂු සංඝයා රුවන්වැලි මහසෑය වඳින කල්හි, මහසෑය වැඳීම පිණිස තෙරුන්වහන්සේ නොනික්මුණු සේක. කවරහෙයිනයත්? යම් හෙයකින් රහත් පුද්ගලයන්ගේ තුනුරුවන්හි මහත්වූ ගෞරවයක්වේද, ඒ හෙයිනි භික්ෂු සංඝයා වැඳ පෙරළා වැඩම කළ කල්හි, මිනිසුන්ගේ රැ බත් කා නිමවූ වේලෙහි සාමණේර යන්ටද නොදන්වා මහසෑය වඳින්නෙමියි තනිවම නික්මුණු සේක. සාමණේරයන් වහන්සේද කවරහෙයකින් නොකල්හි තෙරුන්වහන්සේ තනිවම වඩනාසේක්දෝ දැනගන්නෙමියි උපාධ්‍යායන් වහන්සේගේ පදනුපදිකව හෙවත් පියවර අනුව නික්මුණෝය. තෙරුන්වහන්සේද මෙතෙහි නො-කිරීම හෙතුකොටගෙන ඒ තෙරණුන්ගේ ඒම නොදන්නා සේක් දකුණු දෙරින් මහා චෛත්‍යාඞ්ගනයට නැගි සේක.

සාමණේර නමද පියවර අනුවම චෛත්‍යඞ්ගනයට නැංගේය මහා තෙරුන්වහන්සේද මහා චෛත්‍ය බලාවදුරා බුද්ධාලම්බන ප්‍රීතිය ගන්වා සියල් බුදුගුණ සිතින් ආභොග මනසකාරකොට තුටුපහටු වූයේම මහසෑය වඳිත සේක. සාමණේරයෝද, තෙරුන්වහන්සේ වඳිනසැටි දැක, මාගේ උපාද්ධ්‍යායන් වහන්සේ වැඩියක්ම පහන් සිත් ඇත්තේව වඳිතසේක. කිමෙක්ද, මල් ලැබුනොත් පුදකරන්නේද්‍යෙයි සිතීය. තෙරුන් වහන්සේ වැඳ නැග, මුදුනෙහි ඇඳිලි පිහිටවා මහසෑය මතු බලා වැඩසිටි කල්හි සාමණේරයෝ කාරා තමා පැමිණි බව දැන්වී. තෙරුන්වහන්සේ හැරී බලමින් කවර වේලෙහි ආයේවෙහිදැයි විචාළ සේක. ස්වාමීන්වහන්ස, නුඹවහන්සේගේ සෑය වඳිත කල්හිම ආමි. වැඩියක්ම පහන්වූ මමද මහසෑය වැන්දෙමියයි කීය. කිමෙක්ද මල් ලැබුනොත් පුදකරන්නහුද්‍යෙයි මෙසේ විතාළේය. තෙරුන්වහන්සේ එසේය, පුදන්නෙමි. මේ රුවන්වැලි මහ සෑයෙහි මෙන් අන් සෑයෙක්හි මෙපමණ ධාතු නිධානයක් නම් නැත. මෙබඳු වූ අසදෘශවූ මහසෑය මල් ලැබුනොත් කවර පුද්ගලයෙක් නොපුදන්නේදැයි මෙසේ වදාළසේක. සාමණේරයෝද, ස්වාමීන්වහන්ස, එසේවීනම් ඉවසා වදාළ මැනව. මල් ගෙනෙන්නෙමියි කියා එකෙණෙහිම පාදකධ්‍යානයට සමවැද, සෘද්ධියෙන් හිමවතට ගොස් වණ්ණ ගන්ධයෙන් සමෘද්ධවූ මල් ගෙන පෙරන්කඩ පුරවා මහතෙරුන් වහන්සේ දකුණු දොර පෙදෙසින් පශ්චිම මුව පෙදෙසට නො පැමිණ වදාළ කල්හිම, අවුත් මල් පෙරහන්කඩ අත්ලෙහි තබා වහන්ස, පුදකළ මැනවැයි කීයේය. තෙරුන්වහන්සේද, හෙරණ, මල් ඉතා මද නොවේදැයි වදාළ සේක. වහන්ස, වැඩවදාළ මැනව, භාග්‍යවතුන් වහන්සේගේ ගුණ මෙනෙහි කොට පිදුව මැනවයි කීය. තෙරුන්වහන්සේද පශ්චිම මුව පෙදෙස ඇසුරුකළාවූ හිණෙන් නැඟ ඇතුල් වේදිකා භූමියෙහි මල් පුදන්නට ඇරඹූ සේක. වේදිකා භූමිතොමෝ පරිපූර්ණවූය මලින් පිරි දෙවන වෙදිකා භූමියෙහිද දන

පමණ පිරීගියහ. එසින් අවුත් පාපිට පෙළද පුදනසේක් එයද පිරීගියහ ඒ බව දැක පහත මළුවෙහි විහිරමින් වැඩිසේක. මෙසේ සියලු චෛත්‍යාඞ්ගන පිරී ගියේය. නමුත් මල් ක්‍ෂය නොවෙයි වදාළ සේක. ස්වාමීන් වහන්ස, පෙරහන්කඩ මුව යටිකුරු වූවක් කර වදාළ මැනවැයි කී කල්හි එසේ කළසේක. එවේලෙහි මල් ක්‍ෂය වූහ. තෙරුන්වහන්සේ පෙරහන්කඩ සාමණේරයන්ට දී ඇත් පවුරු වලල්ල වටලාගෙන, සැය තුන් යළක් ප්‍රදක්‍ෂිණා කොට, සතර තැනෙක්හිම වැඳ, පියඞ්ගන නම් පිරිවෙනට වැඩිසේක්, මේ සාමණේරයෝ ඉතා මහත් වූ සෘද්ධි ඇත්තෙක, මේ සෘද්ධ්‍යානුභාවය රක්නට හැකිවන්නේදෝයි මෙසේ සිතූ සේක එවිට නොහැකි වන්නේ යයි දිවැසින් දැක, හෙරණ, නුඹ දැන් මහත් වූ සෘද්ධි ඇත්තෙක් වෙයි. ඒසේ වී නමුත් මෙබඳු වූ සෘද්ධිය නසාගෙන පසු කලෙක එකැස් කණවූ පෙහෙකරු කතකගේ අතින් මැඩගත් කාඩිය බොන්නෙහි යයි සාමණේරයන්ට වදාළසේක. මේ වැරද්ද නම් තරුණ භාවයාගේ වරද යයි ද කිය. සාමණේර තමද තෙරුන් වහන්සේගේ කථාවෙන් නැතිගෙන, වහන්ස, මාහට කමටහනක් වදාළ මැනවැයි සාකච්ඡා නොකෙළේයි. අපගේ උපාධ්‍යායන් වහන්සේ කුමක් වදාරාද, මෙසේ සිතා එය නොඇසූනාක්හුමෙන් සිටියේය. තෙරුවන්වහන්සේ මහසෑයද මහා බොධියද වැඳ හෙරණහු පාසිවුරු ගන්වා පිළිවෙලින් කුම්බලිතිස්ස නම් මහා විහාරයට වැඩිසේක. සාමණේර තෙමේද එසින් පසු උපධ්‍යායයන් වහන්සේගේ පදානුපදිකව පිඬු පිණිස නොවඩිසි. ස්වාමීනි කුම්නම් ගමකට යන්නේදැයි විචාරා දැන නැවතී උපාධ්‍යායයන් වහන්සේ දැන් ගම්දොරට පැමිණ වදාළේ වන්නේ යයි දැන තමාගේත් උපාධ්‍යායයන් වහන්සේගේත් පාසිවුරු ගෙන අහසින් අවුත් තෙරුන් වහන්සේට පාසිවුරු දී පිඬු පිණිස ගමට වදී තෙරුන් වහන්සේද, හෙරණ මෙසේ නොකරාවා, පෘථග්ජනයන්ගේ සෘද්ධිතොමෝ නම් චපලය නියත නොවන්නීය, සත්ප්‍රාය

නොවූ රූපාදි ආලම්බනයක් ලැබීම් හෙතුවෙන් සවල්ප මාත්‍රයකින්ම බිඳෙයි. සත්සිඳුනාවූ සමවතින් පිරිහී ගියහු බඹසර විසීමෙහි අසමර්ථ වෙත්. මෙසේ හැම වේලේම ඔවා දෙනසේක. හෙරණුවෝද මාගේ උපාධ්‍යායයන් වහන්සේ කුමක් වදාරණසේක්දැයි මෙසේ සිතා අසන්නට නොකැමැති වේ. තෙරුන්වහන්සේද පිළිවෙල නොයික්මවා චෛත්‍යවන්දනාව කෙරෙමින් **කම්පෙන්ද** නම් ගම වෙහෙරට වැඩිසේක. එතැන්හිද සාමණේරයෝ එපරිද්දෙන්ම කෙරෙති.

එකල්හි, මනා රූ ඇති, පළමු වියෙහි සිටියාවූ එක්තරා පේෂකම් දුහිතෘවක් එක් දිනෙක කම්පෙන්ද නම් ගමින් නික්ම පියුම් විලකට බැස ගී, කියමින්, පියුම් නෙළයි. එසමයෙහි හෙරණුවෝද පියුම් විල මත්තෙන් යන්නෝ උක්පැණි ලාටුවෙහි ඇලුනු කණ මැස්සකු මෙන් ඇගේ ගීතසවරයෙහි බැඳීත. ඒ ගීතසවරයෙහි බැඳීගිය ඇසිල්ලෙහිම සෘද්ධිය අතුරුදහන් විය. සුත් පියාපත් ඇති කවුඩකු මෙන් වූයේය. සන්හුන් සමවත් බෙලෙන් වනාහි ඒ පියුම් විලෙහිම දිය මතුපිට නොගිලීහී ඉඹුල් පුලුන් පටලක් මෙන් ක්‍රමයෙන් පියුම් විල්තෙර සිටියේය. හෙරණතෙමේ වේගයෙන් ගොස් උපාධ්‍යායයන් වහන්සේගේ පාසිවුරු දී නැවතුනේය. තෙරුන්වහන්සේද, කල්ඇතිවම මේ කරුණ මා විසින් දක්නා ලදය. වළක්වනු ලබන්නෝ විනමුත් නොනවතින්නේය. මෙසේ සිතා කිසි තෙපුලක් නොවදාරා පිඬු පිණිස ගමට වන්සේක. හෙරණුවෝද ගොස් පියුම් විල්තෙර, ඇගේ විලෙන් ගොඩ නැගීම් බලාපොත්තුවෙමින් සිටියේය. ඇද අහසින් යන්නාවූද, නැවත අවුත් සිටියාවූද හෙරණහු දැක, එකාන්තයෙන්ම මෙතෙම මා නිසා කලකිරුණේ වනැයි දැන, හෙරණ ඉවත් වෙවයි කීය. ඔහුද ඉවත්විය. පෙහෙකරුදූ තොමෝ විලෙන් ගොඩට නැග සළුව හැඳ ඒ හෙරණහු වෙත එළඹ වහන්ස, කීමෙක්දැයි විචාළාය. ඔහුද එපවත් සැළකෙළේය. එවිට ඒ පෙහෙකරු දූතොමෝ ගිහිගෙහි වාසයෙහි ආදීනවයද, ශාසන බ්‍රහමචර්යාවෙහි අනුසස්ද

දක්වා ඔවා දෙන්නී නමුත් ඒ හෙරණහුගේ කළකිරීම දුරුකරන්නට නොහැකි වන්නී, මේ හෙරණතෙම මා හේතුකොටගෙන මෙබඳු සෑදියෙන් පිරිහින. දූන් අත්හරින්ට සුදු නැත යනාදීන් සිතා මෙතනම සිටුවයි කියා ගෙට ගොස් මව්පියන්ට එපුවත් සැළකළාය. ඒ මව්පියහුද අවුත් නොයෙක් පරිද්දෙන් අවවාද දුන් නමුත් පිළිනොගන්නාවූ හෙරණහට තුඹවහන්සේ අපි උසස් කුල ඇත්තෝවමුයි සලකන්නෙහිද, අපි පෙහෙකරුවෝ වම්හ. පෙහෙකරුකම් කරන්නට හැකිවන්නෙහිදූයි මෙසේ ඇසීය. හෙරණතෙමේ, උවසුවෙති, ගිහිවූයේනම් පෙහෙ-කරුකම් හෝ කුළුපොතුකම් හෝ කළයුතු වන්නේය. මේ කථාවෙන් කම් නැත. වස්ත්‍ර මාත්‍රයෙක්හි ලෝභ නොකරවයි කීය. පෙහෙකරු තෙමේ ඉනෙහි දවටා තිබූ සළුව දී ගෙට පමුණුවා දුව දින.

හෙතෙම පෙහෙකරු කම් ඉගෙන, අනික් පෙහෙකරුවන් හා සමග කම්හලෙහි කටයුතු කෙරෙයි. අනික් පෙහෙකරු පුරුෂයන්ගේ අඹුවූ අඟනෝ උදෑසනම බත් සපයා දෙන්නා-හුය මොහුගේ අඹුතොමෝ වේලාසනින් නොඑයි. හෙතෙම අනික් පෙහෙකරුවන් වැඩ නවත්වා අනුභව කරන කල්හි තර්කුටිය හෙවත් ටකාව වටමින් හුන්නේය. අඹුතොමෝ පසුව ආය එවිට ඔහු මෙතෙක් ප්‍රමාදවී ආයේ ඇයිදූයි තර්ජනය කෙළේය. ඇද සක්විති රජක්හු පවා තමා කෙරෙහි පිළිබඳ සිතැත්තහුයි දූත දාසයකු මෙන් සලකයි. එබැවින්, ඕ තොමෝ අනික් සැමියන්ගේ ගෙයි දර, පලාපත්, ලුණු, ඈ උපකරණයෝ රැස්කොට තබනලදූය, පිටතින් ගෙනවුත් දෙන්නාවූ මෙහෙකරුකම් කරනුවෝද ඇත. මම වනාහි හුදකලා වෙමි. තුඹද මාගේ ගෙයි මෙනම් දෙයක් ඇත, මෙනම් දෙයෙක් නැතැයි නොදන්නෙහිය. තුදින් කැමති නම් අනුභව කරව. නොකැමැති නම් අනුභව නොකරවයි කීය. ඔහුද නොපමාව බත් නොගෙනීම පමණක් නොව තෙපුලෙන්ද මා ගටන්නේයයි කිපී අත් කිසි ගසන දූයක් නොදූක එම ටකාව සූත්‍රවෙෂ්ටනයෙන්

ලිහා දමා ගැසීය. ඕතොමෝ, එන්නාවූ ඒ ටකාව දැක මදක් නැමුණාය. ටකා දඬුහුගේ කොණ තියුණු මුවැති වේ. ඒ ටකාදඬු කෙළවර, ඇය නැමුණු කල්හි ඇස කෙළවර ඇනී සිටගත ඕතොමෝ දෑතින් වහා ඇස අල්වාගත්තාය. බුන් තැනින් ලේ වැගිරෙන්නට විය. ඒ පුරුෂතෙම එකල්හි උපාධ්‍යායයන් වහන්සේගේ වචනය නැවත නැවත සිහිකෙළේය. මේ කරුණ සඳහා උපාධ්‍යායයන් වහන්සේ මතු කාලයෙහි කණ පෙහෙකරු කතකගේ අතින් මඩනලද කාඩිය බොන්නෙහි යයි වදාළ සේක. මේ කරුණ උපාධ්‍යායයන් වහන්සේ විසින් දක්නා ලද්දේ වන්නේය. මාහිමියන් වහන්සේ දීර්ඝදර්ශි වනසේක. විශ්මයකැයි සිහිකොට මහ හඬින් හඬන්නට පටන් ගත්තේය. අතික් පෙහෙකරුවෝ ඇවිත හැඬි-මෙන් කම් නැත බිඳුනාවූ ඇස හැඬීමෙන් පෙරළා ප්‍රකෘතිමත් වූවක්හු කරන්නට නොහැක්කේයයි කීහ. හෙතෙමේ, මම ඇස් බුන්වගිය කරුණ නිසා නොහඬිමි. මේ කරුණ සඳහා හඬමියි පිළිවෙළින් සියලු ප්‍රවෘත්තිය කීය.

මෙයාකාරයෙන් උපන්නාවූ සමථවිදශීනාවෝ නිරුද්ධ වන්නාහු අවැඩ පිණිස පවත්නාහයි දැන වියයි වඩන්නේය.

තවද, ලෞකික සම්‍යග් ප්‍රධානයන්ගේ වශයෙන් උපන්නාවූ සමථවිදශීනාවෝ නිරුද්ධවන්නාහු නම් අවැඩ පිණිස පවත්නාහයි දක්වීම පිණිස අතිකුදු කථාවසතුවක් දක්වා තිබේ.

තිස් නමක් පමණ වූ භික්ෂූහු කැළණී මහා චෛත්‍ය වැඳ කැලෑ මගින් මහමගට බස්නාහු අතර මග දගිය හෙවත් ගිනිඑෑ හේනක කටයුතු කොට එන්නාහු එක් මිනිසක්හු දුටහ. ඔහුගේ ශරීරය දැලි වැකී ගියේ වේ. දැලි වැකී ගියාවූම එක් කසාවත් පිළිකඩක් කැසපට බැඳ හඳිනා ලද්දේ බලන්නහුට ගිනි ඇවිලගත් කණුවක්

මෙන් වැටහේ. ඒ පුරුෂ තෙමේ දවල් කාලයෙහි කටයුතු කොට අඬක් දැගියාවූ දර මිටියක් ඔසවාගෙන පිට පැත්තෙහි විසුලාවූ කෙශයෙන් යුක්තව අප්‍රසිඬ මාර්ගයකින් අවුත් භික්ෂූන්ගේ හමුවෙහි සිටියේය. හෙරණුහු ඔහු දැක ඔවුනොවුන් බලන්නාහු ඇවැත්නි තාගේ පිය තෙමේයි, මහපිය තෙමේයි තාගේ මයිල් තෙමෙයි මෙසේ කියමින් සිනාසෙමින් ගොස් උපාසකය, නුඹ කිනම් ඇත්තෙක් වෙයිදැයි විචාළහ. ඒ පුරුෂ තෙමේ තම අසන ලද්දේ විපිළිසර ඇත්තේව, දරමිටිය දමා, වස්ත්‍රය මනා ලෙස හැඳ මහ තෙරුන් වැඳ ස්වාමින් වහන්ස, මද වේලාවක් සිටිනු මැනවයි කීයේය. මහ තෙරහු සිටියාහුය. නවක භික්ෂු සාමණේරයෝ අවුත් මහතෙරුන්ගේ ඉදිරියෙහිදු කෙළි කවටකම් කෙරෙත්. උවසු තෙමේ, වහන්ස නුඹ වහන්සේලා මා දැක කෙළි කවටකම් කරව්ය. මෙතෙකින්ම හෙවත් පැවිදකම් ලත් පමණෙකින්ම මසනකයට අපි පැමිණි යෙම්හයි සලකව් දැයි කීය. මමත් පූර්වයෙහි නුඹවහන්සේලා වැනිවූම මහණෙක්වීමි. නුඹ වහන්සේලාට වනාහි චිත්තෙකාග්‍රතා සංඛ්‍යාත සමාධි මාත්‍රයකුදු නැත. මම මේ සස්නෙහි මහා සෘඬි ඇත්තෙක්, මහානුභාවය ඇත්තෙක්වීමි. අහස ගෙන පොළොව කෙරෙමි. පොළොව ගෙන අහස කෙරෙමි. දූර හෝ දූරස්ථයෙකු හෝ කෙරෙමි. සමීපය හෝ සමීපස්ථයෙකු ඇත්හි කෙරෙමි. සක්වළ දහසක් ඇසිල්ලෙකින් සිදුරු කෙරෙමි. මාගේ අත්තල් බලනු මැනව් දැන් වනාහි මාගේ අත්ලයෝ රිළා අත්තල් බඳුය මම මේ අත්තල් වලින්ම මේ මිනිස් ලොවෙහි හුන්නේම සඳ හිරු මඬුල් පිරි මැද්දෙමි. මේ පාතල යන්ගේම, සඳහිරු මඬුල්, පා පුටුවක් කොට හුනිමි. මාගේ මෙබඳු වූ සෘඬි තොමෝ සමෘති විප්‍රවාසය යයි කියන ලද ප්‍රමාදයකින් අතුරුදන් වූය. නුඹ වහන්සේලා නො පමාවව් යම් හෙයකින් ප්‍රමාද හෙතුවෙන් මෙබඳුවූ ව්‍යසනයට පැමිණෙද්ද, සමෘති විප්‍රවාසය යයි කියන ලද

ප්‍රමාදයෙන් තොරවූවෝව වාසය කරන්නෝ ජාති ජරා මරණ දුක්ඛයාගේ අවසානය කෙරෙද්ද, වහන්ස, එහෙයින් නුඹ වහන්සේලා මාම අරමුණුකොට ප්‍රමාද නුවූවහු වව් යයි තැනි ගන්වා අවවාද දින. ඒ භික්ෂූහු ඒ උවසු තෙපලද්දීම සසර කලකිරීමට පැමිණ විදසුන් වඩන්නාහු තිස් දෙනෙක් තෙරහු ඒ පිසෙස්හිම රහත් ඵලයට පැමිණියාහ.

ලොකොත්තර මාර්ගක්ෂණයෙහි එකලාවූම වීර්‍ය්‍ය සඞ්ඛ්‍යාත සම්‍යග් ප්‍රධානය තෙමේ චතුර්විධ සම්‍යග් ප්‍රධානකෘත්‍යය සම්පාදනය කිරීම් වශයෙන් චතුර්විධවූ නාමයන් ලබයි.

මෙහිදී නුපන් අකුසල ධර්ම නම් **අසමුදාචාර වශයෙන්** හෙවත් නොකඩව නොපැවැත්වීම්හුගේ බලයෙන් හෝ **අනනුභූතාරම්මණ වශයෙන්** හෙවත් අනුභව නොකළ විරූ අරමුණු බෙලෙන් හෝ නූපන් අකුසල ධර්මයෝයි.

ඒ **අසමුදාචාර, අනනුභූතාරම්මණ**යන්ගේ වශයෙන් උපන් අකුසල ධර්මයන් අතුරෙන් ඇතැම් මහණෙකුහට **වත්හුගේ** වශයෙන් කෙලෙස් නොකඩව නොපවත්ති. ඇතැම් මහණකුහට, **ග්‍රන්ථ පරිශීලනය, ධූතාංඝ සමාදානය, සමථ කමටහන් වැඩීමය, විදර්ශනා කමටහන් වැඩීමය, නව කර්මයන්හි නියුක්තවීමය** යන මොවුන් අතුරෙන් එක්තරා ධර්මාවරණයක්හුගේ ශක්ති වශයෙන් කෙලෙස්හු නොකඩවා නොපවත්ති.

ඇතැම් මහණෙක් වත් සම්පන්න වේද, ඒ මහණහට දෙඅසූ කුදුවත්ද, තුදුස් මහවත්ද, දාගැබ් මළුවෙහි කළයුතු වත්ද, බෝමළුවෙහි කළයුතු වත්ද, පැන්හළ කළයුතු වත්ද, පොහෝ ගෙයි කළයුතු වත්ද, ආගන්තුක මහණුන්ට කළයුතු වත්ද, ගමික මහණුන්හට කළයුතු වත්ද, කරමින් සිටියදීම කෙලෙස් නූපදිත්. පසු කලෙක වතාංහි වතපිළිවෙත විහිද හිත්තවූ වත් ඇත්තෙක්ව හැසිරෙන්නාවූ ඕහට අයොනිසොමනසිකාරයත්, සමෘති

විප්‍රවාසය නම් ලද ප්‍රමාදයන් කරුණු කොට ගෙන කෙලෙස්හු උපදිති. මේ ක්‍රමයෙන්ද, අසමුදාචාර වශයෙන් හෙවත් නොකඩව නොපත්නා වශයෙන් නූපන්නාවූ කෙලෙස්හු උපදිත්.

ඇතැම් මහණෙක් වනාහි ග්‍රන්ථ ශික්‍ෂාවෙහි නියුක්ත වූයේ වේද, එක් සඟියකුත් ග්‍රහණ ධාරණාදී වශයෙන් ශික්‍ෂාව කෙරේද, දෙනිකාය කෙනෙකුත් තුන් නිකාය කෙනෙකුත් සතර නිකාය කෙනෙකුත් පස් නිකාය කෙනෙකුත් හෙවත් සඟි පසමත් ග්‍රහණ ධාරණාදි වශයෙන් ශික්‍ෂාව කෙරේද, ඒ මහණහට මෙපරිද්දෙන් ත්‍රිපිටක බුද්ධ ධර්මය අර්ථ වශයෙන්ද, පාළි වශයෙන්ද, අනුසන්ධි වශයෙන්ද, පූර්වාපර සම්බන්ධ වශයෙන්ද, ග්‍රහණ ධාරණාදි වශයෙන් ශික්‍ෂාව කෙරෙමින් සිටියදී, හදාරමින් සිටියදී, අර්ථ චින්තනය කරමින් සිටියදී අර්ථ අස්වමින් සිටියදී, අර්ථ දක්වමින් සිටියදී, අර්ථ ප්‍රකාශ කෙරෙමින් සිටියදී කෙලෙස් ඉපදීමට අවසර නොලබත්. පසු කලෙක වනාහි, ග්‍රන්ථ පරිශීලන කර්මය හැර අලස පුද්ගලයෙක්ව හැසිරෙන්නාවූ ඔහට අයොනිසොමනසිකාර ප්‍රමාද සඞ්ඛ්‍යාත කාරණයන් නිසා කෙලෙස්හු උපදිති. මේ ක්‍රමයෙන් ද අසමුදාචාර වශයෙන් නූපන්නාවූ කෙලෙස්හු උපදිති.

ඇතැම් මහණෙක් වනාහි ධුතාඞ්ගධරයෙක් වේද, තෙලෙස් ධුතාඞ්ග ගුණ සමාදන්ව පවතීද, ඒ මහණහට ධුතාඞ්ග ගුණ රකිමින් සිටියදී කෙලෙස්හු ඉපදීමට අවසර නොලබත්. පසු කලෙක වනාහි ධුතාඞ්ගයන් හැර චීවරාදී ප්‍රත්‍ය බහුලත්වය සඳහා පෙරළුනක්හුව හැසිරෙන්නාවූ ඔහට අයොනිසොමනසිකාර ප්‍රමාද සඞ්ඛ්‍යාත කාරණයන් නිසා කෙලෙස්හු උපදිති මෙපරිද්දෙන්ද අසමුදාචාර වශයෙන් නූපන්නාවූ කෙලෙස්හු උපදිත්.

ඇතැම් මහණෙක් වනාහි අෂ්ට සමාපත්තීන්හි පුරුදු කළ වසඟ බැව් ඇත්තේ වේද, ඒ මහණහට ප්‍රථම ධ්‍යානාදීන්හි ආවර්ජන වශිත්වාදීන්ගේ ශක්ති වශයෙන් ඉරියව්

වටමින් සිටියදී කෙලෙස්හු අවසර නොලබත් පසු කලෙක වනාහි දූහැනින් පිරිහුණු කල්හි හෝ පිරිහුණු දූහැන් ඇත්තාවූ හෝ දෙඩමළු බැව් ආදීන්හි නැවත නැවත යෙදුනාවූ ඔහට අයොනිසොමනසිකාර ප්‍රමාද සංඛ්‍යාත කාරණයන් නිසා කෙලෙස්හු උපදිත්. මේ නයින්ද, අසමූදාචාර වශයෙන් හෙවත් නොකඩව නොපවත්නා වශයෙන් නූපන්නාවූ කෙලෙස්හු උපදිත්.

ඇතැම් මහණෙක් වනාහි විදර්ශකයෙක්වේද, අනුදර්ශනා මහා විදර්ශනාවන්හි හෝ කෘත්‍යය කරමින් වේසේද, ඒ මහණ හටද කෙලෙස්හු අවසර නොලබත් පසුකලෙක වනාහි විදර්ශනා වැඩීම් කෘත්‍යය හැර ඇඟ මස් වැඩීමෙහි බහුලවූ උත්සාහ ඇතිව හැසිරෙමින් සිටින්නාවූ ඔහට අයොනිසොමනසිකාර ප්‍රමාද සංඛ්‍යාත කාරණයන් නිසා කෙලෙස්හු උපදිති. මේ ක්‍රමයෙන්ද අසමූදාචාර වශයෙන් නූපන්නාවූ කෙලෙස්හු උපදිත්.

ඇතැම් මහණෙක් වනාහි නව කර්මාන්ත නියුක්තයෙක් වේද පොහෝ ගෙවල්, බොජුන් හල්, ආදීන් කෙරේද, ඒ මහණහට ඒ පොහෝ ගෙවල්, බොජුන් හල් ආදීන්ගේ උපකරණයන් සිතමින් සිටියදී කෙලෙස්හු අවසර නොලබත්. පසුකලෙක නව කම් නිමි කල්හි ඔහට අයොනිසොමනසිකාර ප්‍රමාද සංඛ්‍යාත කාරණයන් නිසා කෙලෙස්හු උපදිති මේ නයින්ද අසමූදාචාර වශයෙන් නූපන්නාවූ කෙලෙස්හු උපදිති.

ඇතැම් මහණෙක් වනාහි බඹලොවින් චුතව, පිළිසිඳීම් වශයෙන් ආවාවූ ශුද්ධ සත්ත්වයෙක් වේද, ඒ මහණහට අකුසල ජවනයන්ගේ ආසෙවන ශක්ති නැති හෙයින් කෙලෙස්හු අවසර නොලබත්. පසු කලෙක වනාහි ලත් අකුසල ජවන යන්ගේ ආසෙවන ශක්ති ඇති ඔහට අයොනිසොමනසිකාර ප්‍රමාද සංඛ්‍යාත කාරණයන් නිසා කෙලෙස්හු උපදිති මේ නයින්ද අසමූදාචාර වශයෙන් හෙවත් නොකඩව නොපවත්නා වශයෙන් නූපන්නාවූ කෙලෙස්හු උපදිත්.

**අනනුභූතාරම්මණ වශයෙන්** හෙවත් ආස්වාදනය නොකළ්විරූ ආලම්බනයන්ගේ වශයෙන්ද කෙලෙසුන්ගේ නූපන් බැව් ඇතිවේ.

මේ සන්තෙහි ඇතැම් මහණෙක් හෝ ඇතැම් පුද්ගලයෙක් ආස්වාදනය නොකළ්විරූ මනාවඩන අරමුණු ආදී අරමුණක් ආස්වාදනය කෙරේද, ඒ මහණහට නොහොත් ඒ පුද්ගලයාහට ඒ අරමුණෙහි අයොනිසොමනසිකාර ප්‍රමාද සඞ්ඛ්‍යාත කාරණයන් නිසා රාගාදීවූ කෙලෙස්හු උපදිති. මෙසේ **අනනුභූතාරම්මණ වශයෙන් නූපන් කෙලෙස්හු උපදිත්.**

ලොකොත්තර මාර්ගක්ෂණයෙහි එකම වීයර්ය, නූපන්නාවූ යම් කෙලෙස්හු උපදින්නාහුද, ඒ කෙලෙස්හු යම් පරිද්දෙකින් නූපදිත්ද, ඒ පරිද්දෙන් ඒ කෙලෙසුන්ගේ අනුත්පාද කෘත්‍යයද, උපන් කෙලෙසුන්ගේ පහානකෘත්‍යයද සාදයි.

මෙහි උපන් කෙලෙස්හු සතරාකාරයකින් දක්වනු ලැබේ. එනම්:

1. **වත්තමානුප්පන්න** හෙවත් ක්ෂණත්‍රයට පැමිණීමව උපන් කෙලෙස්ය.

2 **භූත්වාවිගතුප්පන්න** හෙවත් ආස්වාදනයකොට නිරුද්ධව උපන් කෙලෙස්ය.

3 **ඔකාසකතුප්පන්න** හෙවත් කොට නිමවූ අවසර ඇතිව උපන් කෙලෙස්ය.

4 **භූමිලද්ධුප්පන්න** හෙවත් ඒ ඒ පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත ලබ්ධ භූමින්හි උපන් කෙලෙස්ය යනුයි.

මොවුන් අතුරෙන් යම් කෙලෙස් කෙනෙක් විද්‍යමානවම උත්පාද, ස්ථිති, භඞ්ග සඞ්ඛ්‍යාත ක්ෂණත්‍රයෙන් සමන්විත වෙත්ද, මෙ ක්ෂණත්‍රය සමන්විත කෙලශයෝ **වර්තමානොත්පන්න** කෙලෙස්හු නම් වෙත්.

කර්මය වනාහි ජවන් වශයෙන් පැවැති කල්හි ආලම්බන රසය ආස්වාදනය කොට නිරුද්ධවූ විපාකයතෙමේ **භූත්වාවිගතුප්පන්න** කෙලෙස්හු වෙත්. ඉපිද නිරුද්ධවූ කර්මයද භූත්වාවිගතුප්පන්න කෙලෙස් නම් වෙත්. එබැවින් කර්මයත් විපාකයත් දෙකම එයට ඇතුළත් වේ.

කුසලාකුසල කර්මයතෙමේ අතික් කර්මයන්හුගේ විපාකය මගහරවා තමාගේ විපාකයට අවසර ගනීද, එපරිද්දෙන් අවසර ගෙන උපදනාවූ විපාකයතෙම අවසර දුන් තැන් පටන් උත්පන්න යයි කියනු ලැබේ. මේ උත්පන්නය **ඔකාසකතුප්පන්න** නම් වේ.

පඤ්චස්කන්ධය වනාහි විදර්ශනාවගේ ප්‍රවෘත්තිස්ථානවූ භූමි හෙවත් අරමුණු නමි. අතීතාදි ප්‍රභෙද ඇත්තාවූ ඒ පඤ්චස්කන්ධයන්හි අනුසය බවට පැමිණි කෙලෙස්හු වනාහි හෙවත් සිව්මගින් නොනසන ලදුව පැවැති කෙලෙස්හු වනාහි, අතීතවූ කෙලෙස්හුය කියාත්, අනාගතවූ කෙලෙස්හුය කියාත්, ප්‍රත්‍යුත්පන්නවූ කෙලෙස්හුය කියාත් නොකියයුතු. අතීතස්කන්ධයන්හි අනුසය බවට පත් කෙලෙස්හුද, මාර්ගයකින් ප්‍රහීණ නොකළාහුම වෙත්. අනාගතවූ ස්කන්ධයන්හි, වර්තමානවූ ස්කන්ධයන්හි අනුසය බවට පත් කෙලෙස්හුද මාර්ගයෙකින් ප්‍රහීණ නොකළාහුම වෙත්. මෙසේ වූ කෙලෙසුන්ගේ උත්පන්නය **භූමිලද්ධුප්පන්න** නම් වේ. හෙවත් ලත් ලත් පඤ්චස්කන්ධයෙහි උපදනා කෙලෙස් නම් වෙත්. එබැවින් විදර්ශනාවගේ ප්‍රවෘත්තිස්ථානවූ ඒ ඒ ස්කන්ධයන්හි නොහොත් ඒ ඒ කාම, රූප, අරූප භූමීන්හි චතුර්විධ මාර්ගයෙන් සමූලඝාතනය නොකරනලද්දාවූ කෙලෙස්හු **භූමිලද්ධොත්පන්න** යයි කියන ලදී.

තවද 1. **සමුදාචාරුප්පන්නය**
2. **ආරම්මණාධිගහිතුප්පන්නය**
3. **අවික්ඛම්භිතුප්පන්නය**
4. **අසමුග්ඝාතිතුප්පන්නය**

යයි චතුර්විධ වූ උත්පන්නයෙක්ද ඇත්තේය ඒ චතුර්විධ උත්පන්නයන් අතුරෙන් ක්‍ෂණත්‍රයට පැමිණි උත්පන්නයම **සමුදාචාරුප්පන්න** නම් වේ. හෙවත් ක්‍ෂණත්‍රයට පැමිණීම් වශයෙන් කෙලෙසුන්ගේ උපන් බව නම් වේ.

වරක් ඇස් දල්වා අරමුණෙහි නිමිත්ත ගත් කල, මෙනෙහි කල කෙණෙහි කෙලෙස්හු නූපදින්නාහයි නොකියයුත්තාහ. අරමුණ නිමිති ගැනීම් වශයෙන් අතිශයින් හෝ දැඩිකොට ගත් බැවිනි. කිරි ඇති ගසක් පොරොවෙන් පහළ පහළ තැන කිර නොනික්මෙත්තේ යයි නොකිය-යුත්තේ යම්සේද, එපරිද්දෙන්ම මේ උත්පන්නය **ආරම්මණාධිගහිතුප්පන්න** නම් වේ.

සමාපත්තියකින් විෂ්කම්භනය නොකළ කෙලෙස්හු වනාහි මෙනම් තැන නූපදින්නාහයි නොකියයුත්තාහ. කිරි ඇති රුකක් පොරොවෙන් පහරා නම්, මෙනම් තැන කිරි නො නික්මෙත්තේ යයි නො කියයුත්තේ යම්සේ ද, මෙපරිද්දෙන් මේ උත්පන්නය **අවික්ඛම්භිතුප්පන්න** නම් වේ.

චතුර්විධ මාර්ගයෙන් සමූලඝාතනය නොකළාවූ කෙලෙස්හු වනාහි භවාග්‍රයෙහි හෙවත් නෙවසඤ්ඤා-නාසඤ්ඤායතන භූමියෙහි පහළවූ පුද්ගලයා හටත් නූපදින්නාහයි නොකිය යුත්තාහ. ඒ බැවින් එසේ උපදනා කෙලෙස්හු **අසමුද්ඝාතොත්පන්න** නම් වේ.

මේ උත්පන්නයන් අතුරෙන් **වත්තමානුප්පන්න කෙලෙස්හුද, භුත්වාවිගතුප්පන්න කෙලෙස්හුද, ඔකාසකතුප්පන්න කෙලෙස්හුද, සමුදාචාරුප්පන්න කෙලෙස්හුද** යන චතුර්විධවූ උත්පන්නය ඇති කෙලෙස්හු මාර්ගයෙන් ප්‍රහාණය කළයුතු කෙලෙස්හු නොවෙත්.

**භූමිලද්ධොත්පන්න වූ ද ආරම්මණාධිගහිතුප්පන්න වූ ද, අවික්ඛම්භිතුප්පන්න වූ ද, අසමුද්ඝාතිතුප්පන්න වූ ද** කෙලෙස්හු මාර්ගයෙන් ප්‍රහීණ කළයුතුවේ.

මාර්ගයතෙම උපදනා කල්හිම කෙලෙසුන් දුරු කෙරෙයි. මාර්ගය තෙම යම් කෙලෙසුන් දුරු කෙරෙයිද, ඒ කෙලෙස්හු අතීතය කියා හෝ අනාගතය කියා හෝ වර්තමානය කියාහෝ නොකියයුත්තාහ.

ඉදින් මාර්ගයතෙම අතීතවූ කෙලෙසුන් දුරුකෙරේනම්, ඒ මාර්ගයතෙම් ක්‍ෂයවූ ක්ලේශය ක්‍ෂය කරන්නේ නම්වේ පහවූ ක්ලේශය පහකරන්නේ වේ. විනාශවූ හෙවත් අස්තඞ්ගතවූ ක්ලේශය විනාශ කරන්නේ වේ. අතීත වූ යම් ක්ලේශ ජාතියක් නැත්තේද, ඒ නැත්තාවූ ක්ලේශ ජාතිය දුරු කරන්නේ නම් වේ.

මාර්ගය තෙමේ අනාගතවූ කෙලෙසුන් දුරුකෙරේනම්, එසේ දුරු කිරීමක් ඇතහොත්, නොහටගත් ඒ ක්ලේශ ජාති දුරුකෙරේ නම් වේ නොඋපන් ක්ලේශ ජාතිය, නූපන් ක්ලේශ ජාතිය, පහළනොවූ ක්ලේශ ජාතිය දුරු කෙරේ නම් වේ. අනාගත වූ යම් ක්ලේශයෙක් නැත්ද, නැත්තාවූ ඒ කෙලෙස් මාර්ගය විසින් දුරුකෙළේ නම් වේ.

මාර්ගයතෙමේ ප්‍රත්‍යුත්පන්න කෙලෙසුන් දුරුකෙරේද, එසේ දුරුකිරීමක් ඇතහොත් රාගයෙන් රක්ත පුද්ගල - තෙමේ රාගය දුරුකෙරේ නම් වේ. ද්වේෂයෙන් දුෂ්ට පුද්ගලතෙම ද්වේෂය දුරුකෙරේ නම් වේ මෝහයෙන් මූඪ පුද්ගලතෙම මෝහය දුරුකෙරේ නම් වේ. මානයෙන් බඳනාලද පුද්ගලතෙම මානයද, දෘෂ්ටිපරාමර්ශය ඇති පුද්ගල තෙමේ දෘෂ්ටියද, උද්ධච්චයෙන් වික්ෂේපයට පත් පුද්ගල තෙමේ උද්ධච්චයද නිශ්චයට නොපැමිණි පුද්ගල තෙමේ විචිකිච්ඡාවද බලවත් බවට පත් කෙලෙසුන් ඇති පුද්ගල තෙමේ අනුසය දුරුකෙරේ නම් වේ. කෘෂ්ණ ශුක්ල ස්වභාවය ඇත්තාවූ කුසලාකුසල ධර්මයෝ යුගනද්ධව හෙවත් සමධුරයෙහි ගොනුන් මෙන් යුවල යුවලව යෙදුනෝව පවතිත්. කෙලෙසුන්ම අරමුණු කොට ඇත්තාවූ මාර්ග භාවනාවක්ද වේ. එසේ කෙලෙසුන් අරමුණුකොට ඇති

මාර්ග භාවනාවක් ඇතහොත් එය මග්‍ර භාවනාවක් නම් නොවේ ඵලසාක්ෂාත් ක්‍රියාවක්ද නැත. කෙලෙසුන් ප්‍රහීණ කිරීමක්ද නැත. චතුස්සත්‍යාවබෝධයක්ද නැත.

නමුත් මාර්ග භාවනාවක්ද ඇත. ඵලසාක්ෂාත් කිරීමක්ද ඇත. ක්ලේශප්‍රහාණයක්ද ඇත ධර්මාභිසමයක්ද ඇත. ඒ බව නොහටගත් ඵල ඇති රුකක් හටගත් ඵල ඇති රුක කරණකොටගෙන දක්වීම මෙනි

ඵල ඇති තරුණ අඹ රුකක් ඇද්ද, එහි ඵලයන් මිනිස්සු අනුභව කරන්නාහුය. ඉතිරිවූ ඵලයන් එකතු කොට තබන්නාහ. ඉක්බිති අන්‍ය පුරුෂයෙක් ඒ අඹරුක පොරොවෙන් සිඳින්නේවීනම් ඒ පුරුෂයා විසින් ඒ අඹ රුකගේ පූර්ව ඵලයෝ නොම නස්නාලද්දාහු වෙත්. අනාගතයෙහි වන්නාවූද, දැන් පවත්නාවූද ඵලයෝ නොනස්නාලද්දාහු වෙත් පූර්වයෙහි හටගත් ඵල මිනිසුන් විසින් අනුභව කරනලදී. අනාගතයෙහි හටගන්නාවූ ඵල නොහටගත් බැවින් නස්නට නොහැක්කේය එසේවීනමුත් යම්කලෙක ඒ අඹරුක සිඳදමන ලද්දේද. එකල්හි හටගත් අඹ ඵල නැද්ද, එහෙයින් දැන් පවත්නා ඵලයෝත් නොනස්නා ලද්දාහුය. ඉදින් අඹ රුක නොසිඳින ලද්දේද, එකල්හි ඒ අඹරුකගේ ඵලයෝ පෘථුවි රසයත්, ආපෝ රසයත් ප්‍රත්‍යකොටගෙන යම් ඵල කෙනෙක් උපදින්නාහු නම් එය නස්නාලද්දාහු වෙත්. ඒ ඵලයෝ නොහටගන්නා-හුම නො හටගනිද්ද, නූපන්නාහුම නූපදින්ද, පහළ නුවූවාහුම් පහළ නොවෙත්ද, එපරිද්දෙන්ම මාර්ග තෙමේද, අතීතාදී ප්‍රභෙද ඇති කෙලෙසුන් දුරු නොකෙරෙයි. ආයර්‍ය මාර්ගයෙන් ස්කන්ධයන් පිරිසිඳ නොදත් කල්හි යම්බඳුවූ කෙලෙසුන්ගේ පහළවීමක් වන්නීද, අයර්‍ය මාර්ගය විසින් ස්කන්ධයන් පිරිසිඳ දත් හෙයින් ඒ කෙලෙස්හු නූපන්හුම නූපදිති. පහළ නොවූහුම පහළ නොවෙති. බිළිඳු පුතකු ඇති ස්ත්‍රියක්හු නැවත නොවැදීම පිණිසද ගිලන් වූවන් ලෙඩ සංසිඳීම පිණිසද, බොන බෙහෙත් වලින්ද මේ අදහසම ප්‍රකාශ වන්නේය.

මෙසේ ආයර්‍ය මාර්ගීතෙමේ යම්බඳුවූ කෙලෙසුන් දුර, කෙරෙයිද, ඒ කෙලෙස්හු අතීතය කියා හෝ අනාගතය කියා හෝ නොකියයුත්තාහ. ආයර්‍ය මාර්ගය තෙමේ කෙලෙසුන් දුරු නොකරන්නේ නොවෙයි, දුරු කරන්නේ මැයි ආයර්‍ය මාර්ගීතෙමේ යම් කෙලෙස් කෙනෙකුන් වනාහි දුරු කෙරෙයිද ඒ කෙලෙසුන් සඳහාම "උපන්නා වූ අකුසලයන්" යන වචනය ප්‍රකාශ කරණලදී. හුදෙක් ආයර්‍ය මාර්ගය තෙමේ කෙලෙසුන්ම දුරු නොකරයි. කෙලෙසුන් වනාහි අප්‍රහීණ බැවින් යම් උපාදනයන්ට ගොචර වූ ස්කන්ධ කෙනෙක් උපදින්නාහු නම්, ඒ උපාදන ස්කන්ධයන්ද, දුරු කෙරේමය.

සොවාන් මග නුවණින් අභිසංස්කාර විඥනය නිරුද්ධව ගිය හෙයින් සප්තාත්මභාව කෙනෙකුන් තබා අක්මුල් නැති අනමරාග්‍රවූ සංසාරයෙහි නාමයන් රූපයන් යන යම් ධර්ම කෙනෙක් උපදින්ද, ඒ නාමරූප ධර්මයෝ තුමූ මේ සප්තාත්මභාවයෙහි නිරුද්ධ වෙති.

මෙසේ ආයර්‍ය මාර්ගීතෙමේ උපාදින්නස්කන්ධයන් කෙරෙන්ද අනුපාදින්න ස්කන්ධයන් කෙරෙන්ද නගී. භව වශයෙන් වනාහි, සොතාපත්ති මාර්ගය තෙමේ චතුර්විධ අපාය සඞ්ඛ්‍යාත දුර්ගති භවය කෙරෙන් නගී. සකෘදගාමි මාර්ගය තෙමේ සුගති භවයාගේ එක් දෙසක්හු කෙරෙන් නගී. අනාගාමි මාර්ගය තෙමේ සුගතිකාම භවය කෙරෙන් නගී. අර්හත් මාර්ගය තෙමේ රූපාරූප භවයන් කෙරෙන් නගී. සියලුම භවයන් කෙරෙන්ද නගීමැයි.

නූපන් කුසල ධර්මයන්ගේ උපදවාලීමත්, උපන් කුසල ධර්මයන්ගේ ස්ථිතියත් ආයර්‍ය මාර්ගීයාගේ පැවැත්ම හේතු කොට ගෙනම වන්නේය.

ආයර්‍ය මාර්ගීතෙමේ පවත්නේවීනම්, පැවත්මට පූර්වභාග යෙහි නූපන්වීරූ බැවින් අනුප්පන්න නමැයි කියනු ලැබේ.

යම්සේ නොගියවිරූ තැනට හෝ ගොස් අස්වාදය නොකළ විරූ අරමුණක් හෝ ආස්වාදනකොට, අපි නො ආවිරූ තැනකට ආවාහු වම්හ. ආස්වාදනය නොකළවිරූ අරමුණක් ආස්වාදනය කරම්හ, මෙසේ කියන්නේ වේන්ද, එපරිද්දෙන් ම, අනුප්පන්න නමැයි කියනු ලැබේ. ඒ ආයසී මාර්ගියාගේ යම් පැවැත්මක් ඇද්ද, මේ පැවැත්මම ස්ථිති නම් වේ. එහෙයින් ස්ථිතිය පිණිස වඩායයි කියන්නට හෝ කිම හෝ වටී. මේනයින් ඒ මහණහුගේ ලොකොත්තර මාර්ගයන් පවත්නා ඇසිල්ලෙහි මේ සම්‍යක්ප්‍රධාන සඞ්ඛ්‍යාත වීර්‍ය්‍යය තෙමේ මේ චතුර්විධ වූ නාමයන් හෙවත් නූපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයන්ගේ නොසිපදවීමය, උපන්නා වූ අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය, නූපන් කුසල ධර්මයන්ගේ ඉපදවීමය, උපන් කුසල ධර්මයන්ගේ ස්ථිතියද පිණිස පවත්නේ යයි කියනු ලැබේ.

## සතර ඉද්ධිපාද ධර්ම

යම් ධර්ම ජාතියක් තොමෝ ඉටුවේද, සමෘද්ධවේද, නිපැද්මවේද, නොහොත් යම් ධර්ම ජාතියක් කරුණුකොට ගෙන සෘද්ධිය වූවහු හෙවත් වර්ධනය වූවහු වෙත්ද, නොහොත් සමෘද්ධවූවාහු, වැඩිදියුණු වූවාහු උත්කර්ෂ භාවයට හෙවත් අතිශය භාවයට ගියාහු වෙත්ද, ඒ ධර්ම ජාතිතොමෝ **සෘද්ධි** නම් වේ.

ඍද්ධියම පාද හෙවත් කොටස වේද, නොහොත් සෘද්ධියගේ පිහිටන තැන හෙවත් අධිගමයට කරුණුවේද, එහෙයින් **ඉද්ධිපාද** යයි කියනු ලැබේ. සත්ත්වයෝ ඒ සෘද්ධිපාද ධර්මය කරුණුකොටගෙන මතුමත්තෙහි වූ විශෙෂය යයි කියන ලද සමෘද්ධියට යම්හෙයකින් පැමිණෙත්ද, එහෙයින් ඒ කාරණා වූ ධර්මය තෙමේ පාදනම් වේ.

මේ ඉද්ධිපාද ධර්මයෝ සතරදෙනෙක් වෙත්. එනම්

1. **ඡන්දිද්ධිපාද**
2. **විරියිද්ධිපාද**
3. **චිත්තිද්ධිපාද**
4. **වීමංසිද්ධිපාද**

යන සතර ධර්මයෝයි. මේ සස්නෙහි මහණතෙම බෝධි හෙවත් **මාර්ගඥානය** පිණිස.

**1. ඡන්දසමාධි පධාන සඞ්ඛාර සමන්නාගත ඉද්ධි පාදය** හෙවත් කත්තුකම්‍යතා ඡන්දය අධිපතිකොට ලැබූ සමාධිය හා බලවත් වීර්‍ය්‍යයෙන්ද යුක්තවූ ඉද්ධිපාදය වඩයි.

2. **විරියසමාධිපධාන සඞ්ඛාර සමන්නාගත ඉද්ධි පාදය** හෙවත් වීර්‍ය්‍යය අධිපතිකොට ලැබූ සමාධිය හා බලවත් වීර්‍ය්‍යයෙන්ද යුක්ත වූ ඉද්ධිපාදය වඩයි.

3. **චිත්තසමාධිපධානසඞ්ඛාර සමන්නාගත ඉද්ධි-පාදය** හෙවත් චිත්තය අධිපතිකොට ලැබූ සමාධිය හා බලවත් වීර්‍ය්‍යයෙන්ද යුක්ත වූ ඉද්ධිපාදය වඩයි.

4. **විමංසාසමාධිපධානසඞ්ඛාර සමන්නාගත ඉද්ධි-පාදය** හෙවත් විමංසය අධිපතිකොට ලැබූ සමාධිය හා බලවත් වීර්‍ය්‍යයෙන්ද යුක්තවූ ඉද්ධිපාදය වඩයි.

1. මෙහි **ඡන්ද සමාධිය** නම් කත්තුකම්‍යතා ඡන්දයම හෙතුකොට ඇත්තාවූ ඡන්දයම අධිකකොට ඇත්තාවූ හෙවත් ඡන්දය අධිපති ප්‍රත්‍යයකොට ලත් සමාධියයි.

ප්‍රධානභූතවූ හෙවත් ශ්‍රෙෂ්ඨවූ, වීර්‍ය්‍යයවූ, සංස්කාර ධර්මයෝ **ප්‍රධාන සඞ්ඛාර ධර්ම** නම් වෙත්. එනම් සතර **සම්‍යග්ප්‍රධාන් වීර්‍ය්‍යයෝයි.**

එහෙයින් ඡන්දය අධිපතිකොට ඇති සමාධිය ලබාද, නූපන් ලාමක අකුසල ධර්මයන්ගේ නො ඉපදීම පිණිස කැමැත්ත උපවාද, උත්සාහ කෙරේද, වීර්‍ය්‍ය ආරම්භ

කෙරේද, සිත දැඩිකොට ඔසවයිද, බලවත් ලෙස උත්සාහ කෙරේද, උපන් ලාමක අකුසල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස කැමැත්ත උපදවාද, උත්සාහ කෙරේද, වීර්‍ය්‍ය ආරම්භ කෙරේද, සිත දැඩි කොට ඔසවයිද, බලවත් ලෙස උත්සාහ කෙරේද, නූපන් කුසල ධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදවාද, උත්සාහ කෙරේද, වීර්‍ය්‍ය ආරම්භ කෙරේද, සිත දැඩිකොට ඔසවයිද, බලවත් ලෙස උත්සාහ කෙරේද, උපන් කුසල ධර්මයන්ගේ වැඩීම පිණිස භාවනාවන් සම්පූර්ණ කිරීම පිණිස කැමැත්ත උපදවාද, උත්සාහ කෙරේද, වීර්‍ය්‍ය ආරම්භ කෙරේද, සිත දැඩිකොට ඔසවයිද, බලවත්ලෙය උත්සාහ කෙරේද, එය **ඡන්ද සමාධි පධාන සංඛාර** නම් වේ. හෙවත් ඡන්දය අධිපතිකොට ඇති සමාධිය හා සම්‍යග්ප්‍රධාන වීර්‍ය්‍ය නම් වේ.

යම් කැමැත්තක්, කැමතිබවක්, දක්‍ෂබවක්, ධර්මච්ඡන්ද යක් හෙවත් සවභාවයෙන් කැමැත්තක් ඇද්ද එයට **ඡන්දය** යයි කියනු ලැබේ.

යම් චිත්තයාගේ පැවැත්මක්, විශෙෂ පැවැත්මක්, සිටීමක්, නැවතීමක්, නො විසුරුණු බවක්, නො විසුරුණ සිත් ඇති බවක්, සමථයක්, සමාධින්ද්‍රියක්, සමාධි බලයක්, සම්‍යක් සමාධියක් ඇද්ද එයට **සමාධියයි** කියනු ලැබේ.

යම් චෛතසික වීර්‍ය්‍යාරම්භයක් ඇත්ද, නික්කමයක් පරක්කමයක් උය්‍යාමයක්, වායාමයක්, උත්සාහයක් උත්සාහ බවක්, ථාමයක්, ධෛර්‍ය්‍යයක්, බුරුල් නොවූ පරාක්‍රම ඇතිබවක්, බහා නො තැබූ කැමැත්තක්, බහා නො තැබූ ධෛර්‍ය්‍යයක්, ධෛර්‍ය්‍යය දැඩිව ගැනීමක්, වීර්‍ය්‍යයක්, විරියින්ද්‍රියයක්, විරිය බලයක්, සම්‍යක් ව්‍යායාමයක්, ඇද්ද එය **පධානසංඛාර** නම් වේ. මෙසේ මහණ තෙමේ. මේ ඡන්දයෙන්ද, සමාධියෙන්ද, පධානසඞ්ඛාරයෙන්ද යුක්ත වූයේ වෙයි, සමුපෙතවූයේ වෙයි, උපාගතවූයේ වෙයි, උපසන්නවූයේ වෙයි, සමුපපන්නවූයේ වෙයි, සමන්නාගත වූයේ වෙයි, එහෙයින් ඡන්දසමාධි පධානසඞ්ඛාර සමන්නාගත යයි කියනු ලැබේ.

චතුර්විධ සම්ප්‍රයොග ලක්‍ෂණයෙන් යුක්තවූ ඒ ඡන්‍දාදි ධර්මයන්ගේ යම් ඉටුවන සිදුවන බවක් හෙවත් **ඉද්ධියක්** වේද සම්පූර්ණවූ ඍද්ධියක් හෙවත් **සමෘද්ධියක්** වේද, **ඉජ්ඣනා** නම් වූ වඩනාලද ඉටුවන, සිදුවන සමෘද්ධවන, සම්පූර්ණවන ස්වභාවයක් වේ ද, තමාගේ සකන්‍ධසන්තානයෙහි පහළවීම් වශයෙන් යම් ලැබීමක් වේද, පිරිහුනාවූ ඡන්‍දාදි ධර්මයන්ගේ වීර්‍ය්‍යාරම්භකිරීම් වශයෙන් නැවත ලැබීමක් හෙවත් ප්‍රතිලාභයක් වේද, අධිගමයට පැමිණීමක් වේද, නොපිරිහීම් වශයෙන් මනාකොට අධිගමය හෝ පැමිණීම වේද, ප්‍රතිලාභ වශයෙන් පහස්නා බවක් වේද, ප්‍රතිලාභ සඞ්ඛ්‍යාතවූ සාක්‍ෂාත් කරණයක් නොහොත් ප්‍රතිලාභ වශයෙන් සාක්‍ෂාත් කරණයක් වේද, උපසම්පදා නම්වූ ප්‍රතිලාභ වශයෙන් වැඩියක් එළඹීමක් වේද, එය **ඉද්ධි** නම් වේ.

එබඳුවූ වේදනාසකන්‍ධය, සඤ්ඤාසකන්‍ධය, සඞ්ඛාරස්කන්‍ධය, විඤ්ඤාණසකන්‍ධය **ඉද්ධිපාද** නම් වේ.

ඉද්ධිපාදය වඩන්නාවූ මහණතෙම ඒ ධර්මයන් සෙවනය කරයි, වඩයි, බහුල වශයෙන් කරයි.

2 **විර්ය සමාධිපධානසඞ්ඛාර සමන්නාගත ඉද්ධිපාදය** වඩන්නාවූ මහණතෙම වීර්‍ය්‍යය අධිපති කොට ලැබූ සමාධිය හා බලවත් වීර්‍ය්‍යයෙන්ද යුක්තවූ ඉද්ධිපාදය වඩයි. වීර්‍ය්‍ය අධිපතිකොට ඇති සමාධිය හෙවත් සිතෙහි එකඟ බව **වීර්‍ය්‍යසමාධි** නම් වේ. හෙතෙමේ **වීර්‍ය්‍යසමාධි**යෙන් යුක්තව නූපන් ලාමක අකුසල ධර්මයන්ගේ නො ඉපදීම පිණිසද, උපන් ලාමක අකුසලධර්මයන්ගේ දුරු කිරීම පිණිසද, නූපන් කුසලධර්මයන්ගේ ඉපදීම පිණිසද, උපන් කුසල ධර්මයන්ගේ පැවතීම පිණිසද, වැඩීම පිණිසද, මහත්බව පිණිසද, භාවනාවන් සම්පූර්ණ කිරීම පිණිසද, කැමැත්ත උපදවාද, උත්සාහ කෙරේද, වීර්‍ය්‍ය ආරම්භ කෙරේද, සිත දැඩිකොට ඔසවයිද, බලවත්ලෙස උත්සාහ කෙරේද, එය **පධානසංඛාර** නම් වේ. ඒ සියල්ල එකතුකොට සමගි

කොට, රුස්කොට **විරියසමාධි පධාන සංඛාරයෝ** යයි කියනු ලැබේ. මෙහි වීයර්‍ය දෙතැනක ප්‍රකාශ වේ. එයින් විරියසමාධි යන්නෙන් වීයර්‍ය අධිපති කොට උපදවන ලද සමාධිය දක්වන ලදී. එය සමාධිය වෙසෙසන වීයර්‍ය යයි. පධානසඞ්ඛාර යන්නෙන් දක්වනලද වීයර්‍ය, විරිය සමාධිය හා සම්ප්‍රයුක්ත ධර්මයක් වශයෙන් දක්වනලද වීයර්‍ය යයි.

3. **චිත්ත සමාධි පධාන සංඛාර සමන්නාගත ඉද්ධිපාදය** වඩන්නාවූ මහණතෙම, සිත අධිපතිකොට ලැබූ සමාධිය හා බලවත් වීයර්‍යයෙන්ද යුක්තවූ ඉද්ධිපාදය වඩයි. චිත්තය අධිපතිකොට ඇති සමාධිය හෙවත් සිතෙහි එකඟබව **චිත්තසමාධි** නම් වේ. හෙතෙමේ පළමුපරිද්දෙන් චිත්තසමාධියෙන් යුක්තව සතර සම්‍යග් ප්‍රධන් වීයර්‍ය වඩයි.

4. **වීමංසා සමාධි පධාන සංඛාර සමන්නාගත ඉද්ධිපාදය** වඩන්නා වූ මහණ තෙම වීමංසාව අධිපතිකොට ලැබූ සමාධිය හා බලවත් වීයර්‍යයෙන්ද යුක්තවූ ඉද්ධිපාදය වඩයි. වීමංසාව අධිපතිකොට ඇති සමාධිය හෙවත් සිතෙහි එකඟබව **වීමංසා සමාධි** නම් වේ. හෙතෙමේ වීමංසා සමාධියෙන් යුක්තව සතර සම්‍යග් ප්‍රධාන වීයර්‍ය වඩයි. **වීමංසාව** නම් ප්‍රඥාවට අමොහයට, සම්මාදිට්ඨියට නාමෙකි.

මේ සතර ඉද්ධිපාද ධර්මයන් දක්වීමෙන් භාග්‍යවතුන් වහන්සේ සතර වැදෑරුම්වූ, භික්ෂූන්ගේ මුදුන් පැමිණියා වූ කමටහන වදාළසේක.

එක් මහණෙක් තෙමේ ඡන්දය ඇසුරු කෙරේද, හෙවත් සිහිට කොට පවතීද, කත්තුකම්‍යතා ලක්ෂණ ඇති කුසල ධර්මච්ඡන්දය කරණකොට ගෙන අර්ථනිෂ්පාදනයක්හු ඇති කල්හි මම නවලොකොත්තර ධර්ම නිෂ්පාදනය කරන්නෙමි. ඒ නවලොකොත්තර ධර්මයාගේ නිෂ්පාදනයෙහි මට බරෙක්

නැතැයි මෙසේ ඡන්දය දෙටුකොට, ඡන්දය ඉදිරිපත්කොට, ඡන්දය පූර්වාඞ්ගමකොට නවලොකොත්තර ධර්මය නිෂ්පාදනය කෙරෙයි.

මෙසේ එක් මහණෙක් වීර්‍ය්‍ය ඇසුරුකෙරේද හෙවත් පිහිට කොට පවතීද, එක් මහණෙක් සිත ඇසුරු කෙරේද හෙවත් පිහිට කොට පවතීද, එක් මහණෙක් ප්‍රඥාව ඇසුරු කෙරේද හෙවත් පිහිට කොට පවතීද, ඒ ප්‍රඥාව කරණ කොට ගෙන අර්ථනිෂ්පාදනයක්හු ඇතිකල්හි මම නව ලොකොත්තර ධර්මය නිෂ්පාදනය කරන්නෙමි. ඒ නව ලොකොත්තර ධර්මයාගේ නිෂ්පාදනයෙහි මට බරෙක් නැත, මෙසේ ප්‍රඥාව දෙටුකොට, ප්‍රඥාව ඉදිරිපත්කොට, ප්‍රඥාව පූර්වාඞ්ගම කොට නවලොකොත්තර ධර්මය නිෂ්පාදනය කෙරෙයි.

තනතුරුපතා හැසිරෙන්නාවූ සතර ඇමැති දරුවන් අතුරෙන් එක් ඇමැති දරුවෙක් උපස්ථානය ඇසුරු කෙරේද එක් ඇමැති දරුවෙක් ශූරත්වය ඇසුරු කෙරේද, එක් ඇමති දරුවෙක් ජාතිය ඇසුරු කෙරේද, එක් ඇමැති දරුවෙක් ශිල්ප ශාස්ත්‍රය ඇසුරු කෙරේද එමෙනි.

මෙයින් පළමු ඇමති පුත්තෙමේ උවටැන්හි නොපමාව කරන සුළු බැවින් අර්ථ නිෂ්පාදනයක්හු ඇති කල්හි ලැබීමට නිසිවූ ඒ ස්ථානාන්තරය ලබන්නෙමියි සිතා උපස්ථානය ඇසුරු කෙළේයි දෙවෙනි ඇමතිපුත් තෙම උවටැන්හි නොපමාවූයේ වි නමුත් ඇතැම් රාජ පුරුෂයෙක් සංග්‍රාමයක් එළඹ සිටි කල්හි සිටිනට නොහැකිවේ. අවශ්‍ය යෙන්ම රජුගේ පසල් දනව්ව කිපෙන්නේය. ඒ පසල් දනව්ව කිපි කල්හි රථ ඉදිරියෙහි කම් කොට, රජහු සතුටු කොට ඒ තනතුර පමුණුවාගන්නෙමි සිතා ශූරත්වය ඇසුරු කෙළේයි. තෙවැනිවූ ඇමැති පුත් තෙම ශූරත්වය ඇති කල්හිත් ඇතැම් රාජ පුරුෂයෙක් නීච ජාති ඇත්තෙක්වේ ජාතිය පිරිසිදු කොට තනතුරක් දෙන්නාහු නම් මට දෙන්නාහයි සිතා ජාතිය ඇසුරු කෙළෙයි.

සිව්වෙනි ඇමති පුත් තෙම, ජාති සම්පන්න වූයේ වී නමුත් ඇතැම් රාජ පුරුෂයෙක් හිතාහිත මන්ත්‍රණයෙහි නොනිස්-සෙක් නොහොත් ශිල්ප ශාස්ත්‍රය නොදන්නෙක් වේ. හිතා හිත මන්ත්‍රණයෙන් හෝ ශිල්ප ශාස්ත්‍රයෙන් රජහට කළහැකි කටයුත්තක් උපන් කල්හි ඒ ස්ථානාන්තරය පමුණුවා ගන්නෙමියි සිතා හිත මන්ත්‍රණය හෝ ශිල්ප ශාස්ත්‍රය ඇසුරු කෙළේයි. ඒ සියලුම ඇමති දරුවෝ තුමූ තම තමන් අයත්වූ නිඃශ්‍රයසස්ථාන ශක්තියෙන් හෙවත් ඇසුරු කළ තැන් බලයෙන් තනතුරුවලට පැමිණියහ.

ඒ ඇමැති පුත් සතර දෙනා අතුරෙන් උපස්ථානයෙහි නොපමාවූයේම, තනතුරට පැමිණි ඇමැති දරුවාමෙන් ඡන්දය ඇසුරු කොට, කත්තුකම්‍යතා ලක්‍ෂණ ඇති කුසලධම්මච්ඡන්දය කරණ කොට ගෙන, අර්ථ නිෂ්පාදනයක්හු ඇති කල්හි මම නවලොකොත්තර ධර්මය නිෂ්පාදනය කරන්නෙමි ඒ නවලොකොත්තර ධර්මයාගේ නිෂ්පාදනයෙහි මට බරෙක් නැතැයි සිතා ඡන්දය දෙටුකොට, ඡන්දය ඉදිරිපත්කොට, ඡන්දය පූර්වාඞ්ගමකොට ලොව්තුරා දහම් නිපයන පුද්ගලතෙම දත යුතුයි.

ශූරභාවයෙන් රජහු සතුටුකොට තනතුරට පැමිණි ඇමති දරුවා මෙන් වීය‍ර්‍යය දෙටුකොට, වීය‍ර්‍යය ඉදිරිපත් කොට වීය‍ර්‍යය පූර්වාඞ්ගම කොට ලොව්තුරා දහම් නිපයන පුද්ගල තෙම දත යුතුයි.

ජාති සම්පත් කරුණු කොට ගෙන තනතුරට පැමිණි ඇමැති දරුවා මෙන් සිත දෙටුකොට, සිත ඉදිරිපත්-කොට, සිත පූර්වාඞ්ගම් කොට ලොව්තුරු දහම් නිපයන පුද්ගල තෙම දත යුතුයි.

මන්ත්‍රණය හෝ ශිල්ප ශාස්ත්‍රය පිහිට කොට තනතුරට පැමිණි ඇමති දරුවාමෙන් වීමංසාව හෙවත් ප්‍රඥාව දෙටු කොට වීම සාව ඉදිරිපත්කොට, විමංසාව පූර්වාඞ්ගමකොට ලොව්තුරු දහම් නිපයන පුද්ගල තෙම යුතුයි.

**ඡන්දිද්ධිපාද, විරියිද්ධිපාද, චිත්තිද්ධිපාද, වීමංසිද්ධිපාද,** යන මේ සතර ඍද්ධිපාද ධර්මයෝ තුමූ ලොකොත්තර සිත්හි නිර්වාණය අරමුණු කරමින්ම උපදී. චෛතසික ධර්ම වශයෙන් ඡන්දිද්ධිප්පාදය තෙම ඡන්ද චෛතසිකය වේ. විරියිද්ධිප්පාදය සම්මප්පධාන සඞ්ඛ්‍යාත විරිය චෛතසිකය වේ. චිත්තිද්ධිප්පාදය, ලොකොත්තර චිත්තයම වේ වීමංසිද්ධිප්පාදය ලොකොත්තර සිත්හි යෙදුන ප්‍රඥා චෛතසිකය වේ.

## පංච ඉන්ද්‍රිය ධර්ම

දෙවිසි ඉන්ද්‍රිය ධර්මයන් අතුරෙන්, බොධිපාක්ෂික ධර්මයන්ගේ වශයෙන් සොවාන් ආදි චතුර්විධ මාර්ග සිත්හි ඉන්ද්‍රිය භාවය සිද්ධ කරමින් උපදනා ඉන්ද්‍රිය ධර්මයෝ පස්දෙනෙකි. එනම් :

1. **සද්ධින්ද්‍රියය**
2. **විරියින්ද්‍රියය**
3. **සතින්ද්‍රියය**
4. **සමාධින්ද්‍රියය**
5. **පඤ්ඤින්ද්‍රියය** යන ධර්ම පසය.

යම් ශ්‍රද්ධාවක්, ඇදහීමක්, විශ්වාසයක්, මනා පැහැදීම් බවක්, ශ්‍රද්ධෙන්ද්‍රියයක්, ශ්‍රද්ධා බලයක් වේද එය ශ්‍රද්ධෙන්ද්‍රිය යයි කියනු ලැබේ. ලොකොත්තර සිත්හි යෙදෙන ශ්‍රද්ධා චෛතසිකයද එයම වේ. මිථ්‍යාදෘෂ්ටිය නම්වූ අශ්‍රද්ධාව දුරු කරමන් සසම්ප්‍රයුක්ත ධර්මයන් තමාට අනුකූලකොට අධිපති භාවය දක්වන බැවින් එයට **ශ්‍රද්ධා ඉන්ද්‍රිය** යයි කියන ලදී. එය ඇදහීම **ලක්ෂණ** කොට ඇත්තේය. සම්ප්‍රයුක්ත ධර්මයන් කෙරෙහි පෙරදුරිවැ **පැනීම එහි කෘත්‍යය** වේ. **නො කැළඹීම වැටහෙන ආකාරය** වේ. පැහැදියයුතු වස්තුව පිළිබඳ නිශ්චය හෝ ඇදහියයුතු වස්තුව හෝ **ආසන්න කාරණය** වේ.

යම් චෛතසිකවූ වීර්‍ය්‍යාරම්භයක් ඇද්ද, නික්මීමක්, පරාක්‍රමයක්, උත්සාහයක්, ව්‍යායාමයක්, උසොල්හි බවක්, ථාමයක්, ධෛර්‍ය්‍යයක්, බුරුල් නොවූ පරාක්‍රමයක්, බහා නොතැබූ කැමැත්තක්, බහා නොතැබූ ධෛර්‍ය්‍යයක්, මනාකොට ගත් වීර්‍ය්‍යයක්, විරියින්ද්‍රියයක් විරිය බලයක් වේද, මෙය විරියින්ද්‍රිය යයි කියනුලැබේ. ලොකොත්තර සිත්හි යෙදෙන්නාවූ මේ විරිය චෛතසිකය ථිනමිද්ධය නම්වූ ප්‍රතිපක්‍ෂ ධර්මය මැඩලීමෙහිදි සසම්ප්‍රයුක්ත ධර්මයන් තමන්ට අනුකූලකොට, අධිපති භාවය දක්වන හෙයින් **විරියින්ද්‍රියය** යයි කියනුලැබේ. මේ වීර්‍ය්‍ය චෛතසිකයම, ලොකොත්තර සිත්හි සතර සම්මප්පධානයන් වශයෙන්ද, විරියිද්ධිපාදය වශයෙන්ද, විරියින්ද්‍රියය වශයෙන්ද, විරිය බලය වශයෙන්ද, විරිය බොජ්ඣඞ්ගය වශයෙන්ද, සම්මා වායාම නම්වූ නිර්‍වාණ මාර්ගාඞ්ගය වශයෙන්ද යෙදෙනබැව් සැලකිය යුතු.

යම් සිහියක්, නැවත නැවත සිහිකිරීමක්, පටිස්සති-යක් සතියක්, සරණතාවක්, ධාරණතාවක්, අමතක නොකිරීමක්, සතින්ද්‍රියයක් සතිබලයක්, සම්මා සතියක් වේද, එය **සතින්ද්‍රිය** ය නම් වේ.

ලොකොත්තර සිත්හි යෙදෙන්නාවූ මේ සතිචෛතසිකය ප්‍රමාදය නැසීමෙදී සහජාත ධර්මයන් තමන්ට අනුකූල කොට, අධිපති භාවය දක්වන හෙයින් **සතින්ද්‍රියය** යි කියනු ලැබේ. මේ සති චෛතසිකයම ලොකොත්තර සිත්හි සතර සතිපට්ඨාන ධර්ම වශයෙන්ද, සතින්ද්‍රියය වශයෙන්ද, සතිබලය වශයෙන්ද, සති සම්බොධ්‍යාඞ්ගය වශයෙන්ද, සම්මාසති නම් වූ නිර්‍වාණ මාර්ගාඞ්ගය වශයෙන්ද යෙදෙන බව සැලකිය යුතු

යම් චිත්තයාගේ සිටීමක් මනා සිටීමක්, අවට්ඨිතියක්, අවිසාහාරයක්, අවික්ෂෙපයක් නොකැළඹුන සිත් ඇති බවක්, සමථයක්, සමාධින්ද්‍රියයක් සමාධි බලයක් සම්මා සමාධියක් ඇද්ද එය **සමාධින්ද්‍රිය** ය නම් වේ.

ලොකොත්තර සිත්හි යෙදෙන්නාවූ මේ එකග්ගතා චෛතසිකය වික්ෂෙපය නැසීමේදී, සහජාත ධර්මයන් තමන්ට අනුකූල කොට, අධිපති භාවය දක්වන හෙයින් සමාධින්ද්‍රිය යයි කියනු ලැබේ. මේ එකග්ගතා චෛතසිකය ලොකොත්තර සිත්හි සමාධින්ද්‍රියය, සමාධිබලය, සමාධි සම්බොධ්‍යාඞ්ගය, සම්මාසමාධි නම් වූ නිර්වාණ මාර්ගාඞ්ගය වශයෙන් යෙදෙන බවද සැළකිය යුතු.

යම් ප්‍රඥාවක්, පජානනායක්, විචයක්, පවිචයක්, ධම්මවිචයක්, සල්ලක්ඛණයක්, උප ලක්ඛණයක්, පච්චුපලක්ඛණයක්, පාණ්ඩිත්‍යයක්, කෞශල්‍යයක්, නිපුණ බවක්, විපස්සනාවක් සම්පජඤ්ඤයක්, ප්‍රඥෙන්ද්‍රියයක්, ප්‍රඥාබලයක්, ප්‍රඥාශස්ත්‍රයක්, ප්‍රඥාප්‍රසාදයක්, ප්‍රඥාලොකයක්, ප්‍රඥාඕභාසයක්, ප්‍රඥාපජ්ජෝතයක්, ප්‍රඥාරත්නයක්, අමොහයක්, ධම්මවිචයක්, සම්මාදිට්ඨියක්, වේද්ද එය **ප්‍රඥෙන්ද්‍රිය** නම් වේ.

ලොකොත්තර සිත්හි යෙදන්නාවූ මේ ප්‍රඥා චෛතසිකය සම්මොහය හෙවත් මුළාව නම් වූ ප්‍රතිපක්ෂ ධර්මය දුරුකිරීමේදී සහජාත ධර්මයන් තමන්ට අනුකූලකොට අධිපති භාවය දක්වන හෙයින් **පඤ්ඤින්ද්‍රිය යයි** කියනු ලැබේ. චතුරාර්‍ය්‍යසත්‍යය දක්නාවූ මේ ප්‍රඥා චෛතසිකය, ලොකොත්තර සිත්හි විමංසිද්ධිපාද වශයෙන්ද, පඤ්ඤින්ද්‍රියය වශයෙන්ද, පඤ්ඤා බලය වශයෙන්ද, ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය වශයෙන්ද. සම්මාදිට්ඨි නම්වූ නිර්වාණ මාර්ගාඞ්ගය වශයෙන්ද යෙදෙන බව සැළකිය යුතු.

මේ පඤ්චෙන්ද්‍රිය ධර්මයන්ගේ ඉන්ද්‍රියභාවය දක්වන්නාවූ උපමාවෙක්ද ඇත.

සිවු පුත්‍රයන් සිව්දෙනෙකු සමග රාජ්‍යය ආරක්ෂා කරන රජෙක් තෙම, රාත්‍රි දවස්හි නගරයෙහි තොරතුරු දැන ගන්නා පිණිස නගර සංචාරණයෙහි යෙදුනේය. එසේ නගර සංචාරණය කරන සමයෙහි පළමුවන වර, පළමුවන සිවු පුත්‍රයාගේ ගෙට පස්දෙනම පැමිණියාහ. ඉක්බිති

ඒ ගෙට සවාමිවූ සිටුපුත්‍ර තෙමේ අවශෙෂ සිටු පුත්‍රයන් තුන්දෙන ඇතුළු මහරජහට ද සුවඳ විලවුන් බත් බුලත් ආදියෙන් සංග්‍රහ කරවයි. අවශෙෂ සතරදෙන තුෂ්ණිම්භූතව සිටිති. ඉක්බිති දෙවෙනිවර දෙවෙනි සිටුපුත්‍රයාගේ ගෙට පස්දෙනම පැමිණෙති. එසේ පැමිණි කල්හි ඒ ගෙට සවාමිවූ සිටුපුත්‍රතෙමේ අවශෙෂ සතරදෙනහට සුවඳ විලවුන් බත් බුලත් ආදියෙන් සංග්‍රහ කරවයි. අවශෙෂ සතරදෙන තුෂ්ණිම්භූතව සිටිති. ඉක්බිති තුන්වනවර තුන්වන සිටු පුත්‍රයාගේ ගෙට පස්දෙනම පැමිණෙති. එසේ පැමිණි කල්හිද, ඒ ගෙට සවාමිවූ සිටුපුත්‍ර තෙමේ අවශෙෂ වූ සතරදෙනාහට සුවඳ විලවුන් ආදියෙන් සංග්‍රහ කරවයි. ඉක්බිති එසින් නැගිට සතරවන සිටුපුත්‍රයාගේ ගෙට පස්දෙනම පැමිණෙති. එකල්හි පෙර මෙන්ම ඒ ගෙට සවාමිවූ සිටුපුත්‍ර තෙමේ අවශෙෂ සතරදෙන හට සුවඳ විලවුන් ආදියෙන් සංග්‍රහ කරවයි. ඉක්බිති පස්වන වාරයෙහි සිටුපුත්‍රයන් සතරදෙන සමග රජගෙට ආ කල්හි රජතෙමේ සිටුපුත්‍රයන්ට වඩා සියක් ගුණයකින් අධිකවූ සත්කාර සම්මානයන් සිටුපුත්‍රයන් සතරදෙනාට කරවත්තේ වෙයි. එපරිද්දෙන්ම ලොකොත්තර චිත්තයෙහි යෙදුනාවූ ශ්‍රද්ධා, වීර්‍ය්‍ය, සති, සමාධි යන චෛතසිකයෝ සතරදෙන තම තමන්ට අයත් වූ ඒ ඒ කෘත්‍යයන් මනාකොට සිද්ධ කරවති. ප්‍රඥා චෛතසිකය වනාහි මහරජෙකු මෙන් සියලු කටයුතු මාර්ග චිත්තයෙහි මනා සේ සිද්ධ කරවයි.

## පංච බල ධර්ම

නවවිධ බල ධර්මයන් අතුරෙන් බොධිපාක්‍ෂික ධර්මයන්ගේ වශයෙන් සොවාන් ආදී චතුර්විධ මාර්ග සිත්හි බල ධර්ම වශයෙන් උපදනා ධර්මයෝ පස්දෙනෙකි. එනම්:

1. **සද්ධා බලය**
2. **විරිය බලය**
3. **සති බලය**
4. **සමාධි බලය**
5. **ප්‍රඥා බලය** යන **ධර්ම** පසය.

ලෝකෝත්තර සිත්හි යෙදෙන්නාවූ මේ බල ධර්ම පස් දෙන ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, ප්‍රඥ යන චෛතසික ධර්මයෝම වෙති. මේ බල ධර්මයෝ අන්‍යයන්ගේ අධිපති භාවය නො වලක්වා පංචනීවරණාදී සතුරු පාප ධර්මයන්ට හිංසා කරන අර්ථයෙන් බල ධර්ම නම් වෙති. යුද්ධ කරන්නාවූ භූමියෙහි බල නායකයෝ තුමූ තම තමන්ගේ අධිපති භාවයෙහි පවත්වන යොධ භටයන් මෙහෙයවා සතුරු පක්ෂය විනාශ කරන්නාක් මෙන් සෝවාන් ආදි සතර මාර්ග සිත්හි යෙදුනු බල ධර්මයෝ ඔවුනොවුන්ගේ බලය මැඩ නොපවත්වාම සතුරු පාප ධර්මයන් නසත්. ශ්‍රද්ධා බලය වනාහි සෙසු සතර බලයන්ගේ ශක්තිය මැඩ නොපවත්වාම රාග ද්වේෂ මෝහාදී පාප ධර්මයන්ට හිංසා කරයි අවශෙෂවූ සතර බල ධර්මයෝද, එපරිද්දෙන්ම තමතමාහට සතුරුවූ පාප ධර්මයන්ගේ ශක්තිය විනාශ කෙරෙත්. ලෝකෝත්තර සිත් නමැති යුද්ධ භූමියෙහි සිට ශ්‍රද්ධාදි බල නායකයෝ පස්දෙන ඒ පංචනීවරණාදී කෙලෙස් නමැති සතුරන් හාත්පසින් විනාශ කෙරෙත්.

## සප්ත බොධ්‍යාඞ්ග ධර්ම

සප්ත බොධ්‍යාඞ්ග ධර්මයෝ නම්:-

1. **සති සම්බොධ්‍යඞ්ගය**
2. **ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය**
3. **විරිය සම්බොධ්‍යඞ්ගය**
4. **පීති සම්බොධ්‍යඞ්ගය**
5. **පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය**
6. **සමාධි සම්බොධ්‍යඞ්ගය**
7. **උපෙක්ඛා සම්බොධ්‍යඞ්ගය**

බොධි නම් ලද ධර්ම සාමග්‍රියෙන් අවයවයෝ නොහොත් බොධි නම් ලද පුද්ගලයාගේ කාරණයෝ බොධ්‍යඞ්ග නම්හු වෙත්. ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි උපදනාවූ, ථිනමිද්ධය, උද්ධච්චය, ක්ලෙශ වශයෙන් පිහිටීමය, අභිසංස්කාර

වශයෙන් ආයූහනය හෙවත් වැර කිරීමය, **කාමසුඛල්ලිකානුයොගය**, අත්තකිලමථානුයොගය, උච්ඡේද දෘෂ්ටිය ශාස්වත දෘෂ්ටිය යන මොවුන් ආදිකොට ඇති අනෙකප්‍රකාර වූ උපද්‍රවයන්ට ප්‍රතිපක්‍ෂවූ, **සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා** සංඛ්‍යාත වූ යම් ධර්ම සාමාග්‍රියක් කරණකොටගෙන ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ තිවන අවබෝධ කෙරේද, එහෙයින් **බොධි** නමැයි කියනු ලැබේ. මෙහි කෙලශ වශයෙන් **පිහිටීම** යයි කියන ලද්දේ සසර පැවැත්මට හේතුවූ කෙලශයන්ගේ වශයෙන් පිහිටීමය. **අභිසංස්කාර** වශයෙන් ආයූහනය නම් සසරෙහි පැවැත්මට ව්‍යාපාරයක්වූ කර්‍මයයි.

තවද, කෙලශයන්ගේ සන්තතියයි කියන ලද නිද්‍රාවෙන් නැගී සිටීද, ප්‍රබොධ වේද, නොහොත් චතුරාර්‍ය්‍යසත්‍යයන් ප්‍රතිවෙධ කෙරේද, නොහොත්, නිර්‍වාණයම සාක්‍ෂාත් කෙරේද, ධර්‍ම සාමාග්‍රිය යයි කියනලද ඒ බොධියගේ අඞ්ගයෝ යි, කාරණයෝයි යන අර්ථයෙන්ද **බොධ්‍යාඞ්ග** නම් වෙත්.

යම් ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක් වනාහි, යම් යම්, කියනලද ප්‍රකාර ඇති ඒ ධර්‍ම සාමාග්‍රිය කරණකොටගෙන තිවන් අවබොධ කෙරේද, ඒ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම **බොධි** නමැයි කියනු ලැබේ. එහෙයින් බොධි නම් ලද ඒ ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ කාරණයෝ **බොධ්‍යාඞ්ග** නම් වේ.

එමෙන්ම නිවන් පසක් කිරිම පිණිස, නොහොත් මාර්‍ග ඵල ප්‍රතිවෙධය පිණිස පවතීද, බොධය කෙරෙද්ද, අනුබොධය කෙරෙද්ද, ප්‍රතිබොධය කෙරෙද්ද, සම්බොධය කෙරෙද්ද, මෙකී අර්‍ථ කරණකොටගෙනද **බොධ්‍යඞ්ග** නම් වෙත්.

මේ සස්නෙහි මහණතෙම, උතුම්වූ සිහිය හා ප්‍රඥවෙන් යුක්ත වූයේ, කොට බොහෝ කල් වූ ද, කියා බොහෝ කල්වූ ද, දේ සිහි කරන්නේ, නැවත නැවත සිහි කරන්නේ, සිහි ඇත්තේ වේද මෙය **සති සම්බොධ්‍යඞ්ග** යයි කියනු ලැබේ.

හෙතෙම එසේ සිහියෙන් යුක්තව වාසය කරන්නේ, **ඒ** ධර්මය නුවණින් **අනිත්‍ය, දුක්ඛ, අනාත්ම** වශයෙන් විමසයි. නුවණ **හසුරුවන්නේ** විමසයි. බැලීමට, සෙවීමට පැමිණෙයි. මෙය **ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය** යයි කියනු **ලැබේ.**

ඒ භික්ෂුවගේ ඒ ධර්මය නුවණින් සොයන්නේ, ප්‍රඥාව හසුරුවමින් සොයන්නේ, විමසන්නේ, බැලීයට සෙවීමට පැමිණෙන්නේ, පරිපූර්ණ වූයේ වෙයි. පසුබට නොවූයේ වෙයි. මෙය **විරියසම්බොධ්‍යඞ්ගය** යි කියනු **ලැබේ.**

පටන්ගත් වීර්‍ය්‍ය ඇත්තහුට නිරාමිස වූ ප්‍රීතිය උපදියි. මෙය **ප්‍රීතිසම්බොධ්‍යඞ්ග** යයි කියනු **ලැබේ.**

ප්‍රීති සිත් ඇත්තහුගේ නාම කය, කෙලෙස් විඩා සංසිඳීම් වශයෙන් සංසිඳෙයි. විඥානස්කන්ධයද සංසිඳෙයි මෙය **පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය** යි කියනු ලැබේ.

සංසිඳුන කය ඇති සැපවත් වූවහුගේ සිත නිශ්චල වෙයි. මෙය **සමාධි සම්බොධ්‍යඞ්ගය** යයි කියනු ලැබේ.

ඔහුගේ එසේ නිශ්චලවූ සිත මනාකොට මැදහත් වූයේ වෙයි. මෙය **උපෙක්ඛා සම්බොධ්‍යඞ්ගය** යයි කියනු ලැබේ.

ප්‍රශස්තවූ හෙවත් පසස්නා ලද්දාවූ නොහොත් සුන්දරවූ බොධ්‍යඞ්ගය තෙම **සම්බොධ්‍යඞ්ග** නම්. ස්මෘති තොමෝ ම සම්බොධ්‍යඞ්ගය වූයේ **සති සම්බොධ්‍යඞ්ගය** නම්. මෙසේ ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා සම්බොධ්‍යඞ්ගයන්ගේ අර්ථ දතයුතුයි.

ලක්ෂණ වශයෙන් **සති සම්බොධ්‍යඞ්ගය** තෙමේ **උපට්ඨාන ලක්ඛණ** නම් වූ අරමුණ සිහිකිරීම් ලක්ෂණ කොට ඇත්තේය. හෙවත් අරමුණ වැටහීම් ලක්ෂණකොට ඇත්තේය.

**ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය** තෙමේ **පවිචය ලක්ඛණ** හෙවත් ධර්මයන්ගේ තත්ත්‍ව විමසීම් ලක්ෂණ ඇත්තේය.

**විරිය සම්බොජ්ඣඞ්ගය** තෙම **පග්ගහ ලක්ඛණ** හෙවත් අනුබල දීම් **ලක්ෂණ** ඇත්තේය.

**පීති සම්බොජ්ඣඞ්ගය** තෙම **ඵරණ ලක්ඛණ** නම් වූ ස්ඵරණ ලක්ෂණ හෙවත් පැතිරෙන ස්වභාවය ඇත්තේය.

**පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය** තෙම **උපසම ලක්ඛණ** හෙවත් සංසිදීම් **ලක්ෂණ** ඇත්තේය.

**සමාධි සම්බොජ්ඣඞ්ගය** තෙම **අවික්ඛෙප ලක්ඛණ** නම්වූ අවික්ෂෙප ලක්ෂණය හෙවත් නොවිසිරෙන ස්වභාවය ඇත්තේය.

**උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය** තෙම **පටිසඞ්ඛාන ලක්ඛණ** නම් වූ මැදහත්ව දක්නා ලක්ෂණ ඇත්තේය. හෙවත් යුක්ති වශයෙන් දක්නා ස්වභාවය ඇත්තේය.

ඒ සතිසම්බොධ්‍යඞ්ගාදී සප්තවිධ බොධ්‍යඞ්ගයන් අතුරෙන් සියලු බොධ්‍යඞ්ගයනට උපකාර කරන බැවින් සතිසම්බොධ්‍යඞ්ගය තෙම පළමුකොට වදාළසේක. ඒ ස්මෘති සම්බොධ්‍යඞ්ගයෙන් ඔබ්බෙහි එසේ සිහියෙන් යුක්තව වාසය කරන්නාවූ ඒ පුද්ගල තෙම නුවණින් ධර්මයන්ගේ තත්වය විමසයි. මේ පිළිවෙලින් ඒ බොධ්‍යඞ්ගයෝ නොඅඩු වූ ද, නොවැඩි වූ ද සත්දෙනෙක්ම පිළිවෙලින් වදාළහ. ථිනමිද්ධ, උද්ධච්චයන්ට ප්‍රතිපක්ෂ වන හෙයින්ද, නොහොත් සියලු බොධ්‍යඞ්ග කෘත්‍යයන්හි කැමැති විය යුතු වන හෙයින්ද මෙසේ වදාරණ ලදී.

සප්තවිධ බොධ්‍යඞ්ගයන් අතුරෙන් ත්‍රිවිධ වූ බොධ්‍යඞ්ග කෙනෙක් **ථිනමිද්ධයාගේ** ප්‍රතිපක්ෂ ධර්මයෝයි. යම් කලෙක **ථිනමිද්ධය** හා යෙදුන සිතක් උපදනේ වී නම්, එකල්හි **ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය ද, විරිය සම්බොජ්ඣඞ්ගය ද, පීති සම්බොජ්ඣඞ්ගය ද** වැඩිය යුතු.

ත්‍රිවිධ වූ බොධ්‍යඞ්ග ධර්ම කෙනෙක් **උද්ධච්චයාගේ** ප්‍රතිපක්ෂ ධර්මයෝය. යම් කලෙක **උද්ධච්චය** හා යෙදුන සිතක් උපදනේ වී නම්, එකල්හි **පස්සද්ධි සම්බොධ්‍යඞ්ග-යද, සමාධි සම්බොධ්‍යඞ්ගය ද, උපෙක්ඛා සම්බොධ්‍යඞ්ගයද** වැඩිය යුතු.

ඒ සප්තවිධ බොධ්‍යඞ්ගයන් අතුරෙන් එකලාවූ **සති සම්බොධ්‍යඞ්ගය** වනාහි, සියලු සූප ව්‍යඤ්ජනයන්හි ලුණු කැවීම හෙවත් ලුණු ලෑම කැමති වියයුතු වන මෙන් ද, සියලු රාජ්‍ය කෘත්‍යයන්හි, සමස්ත රාජකාර්‍ය්‍යයෙහි නියුක්තවූ මහ ඇමතියෙක් කැමැති වියයුතු වන මෙන්ද සියලු බොධ්‍යඞ්ගයන්හි කැමැති වියයුතු වන හෙයින් සබ්බත්ථික යයි වදාරණ ලදී සප්ත සම්බොධ්‍යඞ්ගයන් අතුරෙන් පළමු පළමු බොධ්‍යඞ්ගයෝ පසු පසු බොධ්‍යඞ්ගයන්ට විශෙෂ ප්‍රත්‍යයද වේ.

මේ බොධ්‍යාඞ්ග ධර්මයෝ සත්දෙන එකම අරමුණෙක්හි තම තමා අයත්වූ වෙන් වෙන්වූ කෘත්‍යයන් සම්පාදනය කරන්නේය.

මෙ සස්නෙහි විදර්ශනා වඩා මාර්ග ඵලාධිගමයට පැමිණෙනු කැමැති මහණ තෙමෙ සිහියෙන් යුක්තව වාසය කරන්නේ සිහි ඇත්තෙක්ව, සතිසම්පන්නයෙක්වේ. නිර්වාණයද චතුර්විධ මාර්ගයටද අනුලොම වන හෙයින් උතුම්වූ සිහියෙන්ද යුක්තවෙයි. **නෙපක්ක** නම්වූ ප්‍රඥාව හා එක්ව යෙදීමෙන් ඉතා බලවත් වෙයි. තමන්ගේ හෝ මෙරමාගේ හෝ කායද්වාරයෙන් ඉතා අතීතයෙහි කළාවූ වතක් හෝ කසිණ පරි කර්මයක් හෝ, තමා විසින් හෝ මෙරමා විසින් හෝ වාග්ද්වාරයෙන් ඉතා අතීතයෙහි බණන ලද්දවූ බොහෝ වූද, ධර්ම කථාවක් හෝ, කර්මස්ථාන විනිශ්චයක් හෝ, කායවිඥප්ති, වචී විඥප්ති උපදවා පැවැත්තාවූ ඒ නාම ධර්ම කොට්ඨාසය, මෙසේ ඉපිද මෙසේ නිරුද්ධවනැයි සිහි කරන්නේය, නැවත නැවත සිහි කරන්නේය. මෙයාකාරයෙන් උපන්නාවූ, ඒ බොධ්‍යඞ්ගයන්

උපදවන්නාවූ විදර්ශනාඥාන සම්ප්‍රයුක්තවූ මේ **සමෘති** තොමෝ, **සතිසම්බොධ්‍යඞ්ගය** නමැයි වදාරණ ලදි. ඒ **භික්ෂුතෙම**, ඒ අයුරෙන් උපන්නාවූ **සිහියෙන්** සිහි ඇත්තේව **වාසය කරන්නේය.**

ඉතා පූර්‍වයෙහි කයින් කළාවූ කටයුත්තක්, ඉතා පෙර බසින් තෙපළූ, යටකී පරිදි ඇති ධර්‍මයක්, නුවණින් **අනිත්‍යය,** දුක්ඛය, අනාත්මය යයි ප්‍රකාරයෙන් විමසීම කෙරෙයි. අනිත්‍යය, දුක්ඛය, අනාත්ම යයි ඒ ධර්‍මයන්හි නුවණ හසුරුවමින් හැසිරෙයි. ත්‍රිලක්ෂණාවලොකනයට **තිලක්ෂණ** අන්වෙෂණයට පැමිණෙයි. මේ කියනලද ප්‍රභෙද ඇති බොධ්‍යඞ්ගයන් උපදවන්නාවූ විදර්ශනාඥානය **ධම්ම විචය සම්බොධ්‍යඞ්ගය** නමැයි වදාරණ ලදි.

ඒ මහණහුගේ, යට **කියනලද** පරිදි ඇති ධර්‍මයන් පරිපූර්‍ණවූයේ වෙයි. අනුබල දෙන ලදුයේ වෙයි. පරිපූර්‍ණවූ බැවින්ම, අනුබල දුන් බැවින්ම නොහැකිලීම වේ. බොධ්‍යඞ්ගයන් උපදවන්නාවූ, විදර්ශනාඥාන සම්ප්‍රයුක්තවූ මේ වීර්‍ය්‍යතෙමේ **වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගය** නමැයි වදාරනු ලැබේ.

**කාමාමිස, ලොකාමිස, වෘත්තාමිසයන්**ගේ අවිද්‍යා-මානභාවයෙන් නිරාමිස හෙවත් ආමිසරහිතවූ, පිරිසිදුවූ, බොධ්‍යාඞ්ගයන් උපදවන්නාවූ, විදර්ශනාඥාන සම්ප්‍රයුක්තවූ මේ ප්‍රීති තොමෝ **ප්‍රීති සම්බොධ්‍යඞ්ගය** නමැයි වදාරනු ලැබේ. පඤ්චකාම සම්පත් පිළිබඳව පවත්නාවූ රාගය තෙමේද ඒ දෙදෙනාගේ ආලම්බනය තෙමේද **කාමාමිස** නම්. ලොකග්‍රහණ වශයෙන් පැවැත්නාවූ ශාශ්වත, උච්ඡෙද දෘෂ්ටි සහගතවූ රාගය තෙමේද, ඒ දෙදෙනාගේ ආලම්බනය තෙමේද, **ලොකාමිස** නම් අෂ්ටලොකධර්‍මයෝ හෝ ලොකාමිස නම්. සසර ආසාකිරීම් වශයෙන් උපන්නාවූ, සසර උපදවන රාගය තෙමේද, ඒ දෙදෙනාගේ ආලම්බනය තෙමේද **වෘත්තාමිස** නම්.

ප්‍රීති සම්ප්‍රයුක්ත සිත් ඇත්තාහුගේ වේදනා, සඤ්ඤා, සංස්කාර නම් ත්‍රිවිධ ස්කන්ධයන්ගේ සමූහයයි කියන ලද **නාම කාය** තෙමේ, කෙලෙස් විඩාව සංසිඳීම් වශයෙන් සංසිඳෙයි. විඤ්ඤාණස්කන්ධය තෙමේත් එසේ කෙලෙස් විඩාව සංසිඳීම් වශයෙන් ම සංසිඳෙයි. බොධ්‍යාඞ්ගයන් උපදවන්නාවූ විදර්ශනාඥාන සම්ප්‍රයුක්තවූ මේ සංසිඳීම් සඞ්ඛ්‍යාත පස්සද්ධි තොමෝ **පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය** නමැයි වදාරන ලදී.

පස්සද්ධිය හෙවත් සන්හුන් නාමකාය ඇතිව ජනිතවූ ශරීර සුඛයෙන් සුවපත් පුද්ගලයාගේ සිත මනාකොට පිහිටවනු ලැබේ. නිශ්චලව අරමුණෙහි තබනු ලැබේ. අර්පණාවට පැමිණියාක්හු මෙන් වේ. බොධ්‍යඞ්ගයන් උපදවන්නාවූ විදර්ශනාඥාන සම්ප්‍රයුක්තවූ මේ චිත්තෛකාග්‍රතා තොමෝ **සමාධි සම්බොධ්‍යඞ්ගය** යයි වදාරනු ලැබේ.

අර්පණාවට පැමිණියාක් බඳුවූ ඒ සමාධිය කාරණකොට ගෙන මනාකොට අරමුණෙහි පිහිටුවන ලද සිත, මනා-කොට මැදහත්ව හෝ යුක්ති වශයෙන් හෝ බලන්නේ වේ ඒ බොධ්‍යඞ්ග ධර්මයන් අඩුවැඩි කිරීමෙහි අව්‍යාපෘත වූයේව, මැදහත්ව හෝ යුක්ති වශයෙන් බලයි. ෂඩ්විධවූ බොධ්‍යඞ්ගයන්ගේ නොපසුබස්නා බව, නොඉක්මවා-යනබව සාදන්නාවූ, උදාසීනාකාරවූ, තත්‍රමධ්‍යස්ථතාව, **උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය** නමැයි වදාරනු ලැබේ.

මෙසින්, ඉදිරි පසුනොව, එකචිත්තක්ෂණයෙක්හි නා-නා විධ කෘත්‍ය **ලක්ෂණ** ඇත්තාවූ, මාර්ගයාගේ පූර්වභාග-යෙහිවූ, විදර්ශනා සඞ්ඛ්‍යාතවූ, බොධ්‍යඞ්ගයෝ දක්වනු ලද්දාහු වෙත්.

**සප්ත** බොධ්‍යඞ්ග **ධර්මයෝ** අධ්‍යාත්මික, බාහිර ආදී වශයෙන් තුදුස් (14) ප්‍රකාර වේ.

අධ්‍යාත්මික සංස්කාර ධර්මයන් හෙවත් තම සන්තාන යෙහි පැවැති සංස්කාර ධර්මයන් සම්මර්ශනය කරනුවහට

උපන් බොධ්‍යඞ්ගයෝ **අධ්‍යාත්මික බොධ්‍යඞ්ග** නමැයි ද, බාහිර සංස්කාර ධර්මයන් හෙවත් මෙරමා සතන්හි පැවැති සංස්කාර ධර්මයන් සම්මර්ශනය කරනුවහට උපන් බොධ්‍යඞ්ගයෝ **බාහිර බොධ්‍යඞ්ග** නමැයි ද දතයුතු.

යම් බඳුවූ අධ්‍යාත්මික ධර්මයන්හි මනා සිහියක් වේද්ද එබඳුවූ **සති සම්බොධ්‍යාඞ්ගය, අභිඥාව** හෙවත් දතයුතු ධර්මයන්ගේ දැනීම පිණිසද, **සම්බොධි** නම් වූ මාර්ගය පිණිසද, **නිවන්** පිණිසද පවතී. එසේම යම් බඳුවූ බාහිර ධර්මයන්හි මනා සිහියක් වේද්ද එබඳුවූ **සති සම්බොධ්‍යාඞ්ගය** අභිඥාව පිණිසද සම්බොධිය පිණිසද, පවතී. මෙහි, විශිෂ්ටඥානයෙන් දතයුතුවූ ධර්මයන් විශිෂ්ට ඥානයෙන් මනාසේ දැනගැනීම **අභිඥා** නම් වේ. **අභිඥෙය්‍ය ධර්මයෝ** නම්, සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා යන ධර්මයෝද, හෙවත් එකවොකාර, චතුවොකාර, පඤ්චවොකාර යන සියලු භවයන්හි සියලු සත්ත්වයන්ගේ පැවැත්මට හේතුවූ ආහාරසඞ්ඛ්‍යාත ධර්මයන් ද, සඞ්ඛත අසඞ්ඛත වශයෙන්ද දතයුතුවූ **උභය ධාතුහුද,** කාම ධාතු, රූප ධාතු, අරූප ධාතු වශයෙන් දතයුතුවූ **ත්‍රිවිධ ධාතුහුද,** චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයෝද, පඤ්ච විමුත්තායතනයෝද, දස්සනානුත්තරාදිවූ ෂඩ්විධ අනුත්තරිය ධර්මයෝද, සප්තවිධ නිද්දස වස්තුහුද, අෂ්ට අභිභායතනයෝද, නවානුපූර්විහාර යෝද, දසනිර්ජර වස්තුහුද, සියලු ස්කන්ධ, ආයතන, ධාතු ආදියද වෙත්. සම්බොධ්‍යඞ්ගයෝ, මෙසේ දතයුතු ධර්මයන්ගේ **දැනීම** හෙවත් අභිඥාව පිණිස පවතී

යම් බඳුවූ අධ්‍යාත්මික ධර්මයන්හි, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් නුවණින් විමසීමක් වේද, එබඳුවූ **ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය,** අභිඥාව පිණිසද, සම්බොධිය පිණිසද නිවන පිණිස ද පවතී එසේම යම්බඳුවූ බාහිර ධර්මයන්හි අනිත්‍ය දුක්ඛ, අනාත්ම වශයෙන් නුවණින් විමසීමක් වේද, එබඳුවූ **ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය,** අභිඥාව පිණිසද සම්බොධිය පිණිසද, නිවන පිණිසද, පවතී.

**වීය්‍ය්‍ය** වනාහි **කායික වීය්‍ය්‍ය, චෛතසික වීය්‍ය්‍ය** යයි දෙවැදෑරුම් වේ. යම්බඳු වූ කායික වීය්‍ය්‍යයක් වේද, එයම **වීය්‍ය් සම්බොධ්‍යඞ්ගය** නම් වේ. එම වීරිය සම්බොධ්‍යඞ්ගය අභිඥාව පිණිස ද, සම්බොධිය **පිණිස ද,** නිවන **පිණිස ද,** පවතී. යම්බඳු වූ චෛතසික වීය්‍ය්‍යයෙක් ඇද්ද, එයද **විරිය සම්බොධ්‍යඞ්ගය** නම් වේ. එයත් අභිඥාව පිණිසත් සම්බොධිය **පිණිසත්,** නිර්වාණය පිණිසත් පවතී මෙහි, **කායික වීය්‍ය්‍ය** යනු සක්මන් කිරීම අධිෂ්ඨානය කරනුහට උපදින්නා වූ වීය්‍ය් යයි. යම්තාක් කලෙකින් මාගේ සිත උපාදානයන් නැතිව ආශ්‍රව ධර්මයන් කෙරෙන් මිදෙන්නේද, ඒතාක් කල් මම මේ පලඟ නො බිඳින්නෙමි හෙවත් අත්නොහරින්නෙමියි, කයින් වීය්‍ය් කිරීමක් නැතිව උපන් වීය්‍ය්‍ය, **චෛතසික වීය්‍ය්‍ය** නම් වේ.

**ප්‍රීතිය** වනාහි, **සවිතක්ක සවිචාර ප්‍රීතිය ය, අවිතක්ක අවිචාර ප්‍රීතියය** ය යි දෙවැදෑරුම් වේ. යම්බඳු විතර්කය සහිත විචාරය සහිත ප්‍රීතියක් ඇද්ද, එබඳු වූ **ප්‍රීති සම්බොධ්‍යඞ්ගය,** අභිඥාව පිණිසද, සම්බොධිය පිණිස ද, නිර්වාණය පිණිස ද පවතී. යම්බඳු වූ විතර්ක රහිත, විචාර රහිත ප්‍රීතියක් වේද්ද, එබඳුවූ ප්‍රීති සම්බොධ්‍යඞ්ගය, අභිඥාව පිණිසද, සම්බොධිය පිණිසද, නිවන පිණිසද පවතී.

**පස්සද්ධිය** වනාහි, **කාය පස්සද්ධිය චිත්ත පස්සද්ධිය** යයි දෙවැදෑරුම් වේ. **කාය පස්සද්ධිය** නම් වේදනා, සංඥා, සංස්කාර යන ත්‍රිවිධ ස්කන්ධයන්ගේ විඩාවන් සංසිඳීමයි. **චිත්තපස්සද්ධිය** යනු විඥාන ස්කන්ධයාගේ විඩාවන් සංසිඳීමයි යම් බඳුවූ කයෙහි සංසිඳීමක් ඇද්ද, එබඳුවූ, **පස්සද්ධි** සම්බොධ්‍යඞ්ගය අභිඥාව පිණිසද, සම්බොධිය **පිණිසද,** නිවන පිණිසද පවතී. යම්බඳුවූ සිතෙහි සංසිඳීමක් ඇද්ද, එබඳුවූ **පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය,** අභිඥාව පිණිසද, සම්බොධිය පිණිසද නිවන පිණිසද පවතී.

**සමාධියද, සවිතක්ක සවිචාර සමාධිය** ය, **අවිතක්ක අවිචාර සමාධියයි** දෙවැදෑරුම් වේ. යම්බඳුවූ විතර්කය සහිත, විචාරය සහිත සමාධියක් ඇද්ද, එබඳුවූ **සමාධි සම්බොධ්‍යඞ්ගය**, අභිඥාව පිණිසද, සම්බොධිය පිණිසද නිවණ පිණිසද පවතී. යම්බඳුවූ විතර්කය රහිත, විචාරය රහිත සමාධියක් ඇද්ද, එබඳු වූ **සමාධි සම්බොධ්‍යඞ්ගයද** අභිඥාව පිණිස ද, සම්බොධිය පිණිස ද, නිවන පිණිස ද පවතී.

**උපෙක්ෂාව** වනාහි, **අධ්‍යාත්මික ධර්මයන්හි උපෙක්ෂාවය, බාහිර ධර්මයන්හි උපෙක්ෂාවය යයි** දෙ වැදෑරුම් වේ යම්බඳු වූ, අධ්‍යාත්මික ධර්මයන්හි උපෙක්ෂාවක් ඇද්ද, එබඳු වූ **උපෙක්ඛා සම්බොධ්‍යඞ්ගය** අභිඥාව පිණිස ද, සම්බොධිය පිණිස ද, නිවන පිණිස ද, පවතී. යම්බඳු වූ, බාහිර ධර්මයන්හි උපෙක්ෂාවක් ඇද්ද, එබඳු වූ **උපෙක්ඛා සම්බොධ්‍යඞ්ගය** අභිඥාව පිණිස ද, සම්බොධිය පිණිස ද, නිවන පිණිස ද පවතී.

මේ ක්‍රමයෙන් ලෞකික ලොකොත්තර ධර්මයන් හා මිශ්‍ර වූ සප්ත බොධ්‍යඞ්ගයෝ දක්වන ලදී. ඒ මෙසේයි,

අධ්‍යාත්මික වූ බොධ්‍යඞ්ග ධර්මයන් අතුරෙන් **සති ධම්මවිචය, උපෙක්ඛා** යන මේ බොධ්‍යඞ්ග ධර්මයෝ තුමූ, තමාගේ ස්කන්ධයන්ම අරමුණුකොට පැවති හෙයින් ලෞකිකයෝම වෙත්.

මාර්ගභාවයට නොපැමිණි **කායික වීර්‍ය්‍ය** තෙමේ එසේම ලෞකික වේ.

විතක්ක විචාර රහිත වූ **ප්‍රීති සමාධි** දෙක ලොකොත්තරහු වෙත්.

ඉතිරි වූ බොධ්‍යඞ්ග ධර්මයෝ තුමූ ලෞකික ලොකොත්තර ධර්මයන් හා මිශ්‍ර වූවාහු වෙත්.

අධ්‍යාත්මික වූ බොධ්‍යඞ්ග ධර්මයන් අතුරෙන් **සති ධම්මවිචය, උපෙක්ඛා** බොධ්‍යඞ්ග ධර්මයෝ අධ්‍යාත්ම ධර්මයන්ම අරමුණු කොට ඇත්තාහ.

ලොකොත්තර වූ බොධ්‍යඞ්ග ධර්මයෝ වනාහි බහිද්ධාරම්මණවූ නිර්වාණයම අරමුණු කොට ඇත්තාහ එහෙයින් ඒ අධ්‍යාත්මික ධර්මයන්හි පැවැති **සති, ධම්මවිචය, උපෙක්ඛා** බොධ්‍යඞ්ග ධර්මයන් ගේ ලොකොත්තර වන බවක් නො යෙදෙයි.

සක්මන් ප්‍රයොගයෙන් උපන් වීර්‍ය්‍ය තෙමේ ද ලෞකික වේ.

කාමාවචර භූමියෙහි ප්‍රීති සම්බොධ්‍යඞ්ගය තෙම ලැබේ. අවිතක්ක අවිචාර ප්‍රීතිය නොලැබේ. රූපාවචර භූමියෙහි අවිතක්ක අවිචාර ප්‍රීති තොමෝ ලැබේ ප්‍රීති සම්බොධ්‍යඞ්ග තෙම වනාහි නො ලැබේ. අරූපාවචර භූමියෙහි ප්‍රීති සම්බොධ්‍යඞ්ගයත්, අවිතක්ක අවිචාර ප්‍රීතියත් සර්වප්‍රකාරයෙන්ම නොලැබේ. රූපාවචර භූමියෙහි නොලැබෙන්නාවූ ප්‍රීති සම්බොධ්‍යඞ්ගය කරුණුකොටගෙන, ලැබෙන්නාවූ අවිතක්ක අවිචාර ප්‍රීති තොමෝ ද ප්‍රතිසිද්ධය, නොහොත් කාමාවචර භූමියෙහි නොලැබෙන්නාවූ අවිතක්ක අවිචාර ප්‍රීතිය කරුණුකොටගෙන ලැබෙන්නාවූ බොධ්‍යඞ්ග භූතවූ ප්‍රීති තොමෝ ද ප්‍රතිසිද්ධය. මෙකී නයින් අවිතක්ක අවිචාර වූ මේ ප්‍රීති සම්බොධ්‍යඞ්ගය තෙම කාමාවචර ධර්මයන් කෙරෙන්ද, රූපාවචර ධර්මයන් කෙරෙන් ද, අරූපාවචර ධර්මයන් කෙරෙන්ද නික්මෙන්වන හෙයින් ලෞකික බොධ්‍යඞ්ගයන් හා අසම්මිශ්‍ර වූ ලොකොත්තර බොධ්‍යඞ්ගයෝම වෙත් යයි කියන ලදී.

එසේම කාමාවචර භූමියෙහි සමාධි සම්බොධ්‍යඞ්ගය තෙම ලැබේ. අවිතක්ක අවිචාර සමාධිය නොලැබේ රූපාවචර අරූපාවචර භූමින්හි අවිතක්ක අවිචාර සමාධි තෙමේ ලැබේ. සමාධි සම්බොධ්‍යඞ්ගය තෙම වනාහි නො ලැබේ.

මේ රූපාවචර අරූපාවචර භූමින්හි නොලැබෙන්නාවූ, සමාධි සම්බොධ්‍යඞ්ගය කරුණු කොටගෙන ලැබෙන්නාවූ අවිතක්ක අවිචාර සමාධියත් ප්‍රතිසිද්ධය. මේ හෙයින් අවිතක්ක අවිචාරවූ මේ සමාධි තෙමේ කාමාවචර ධර්මයන් කෙරෙන්ද රූපාවචර ධර්මයන් කෙරෙන්ද, අරූපාවචර ධර්මයන් කෙරෙන්ද නිකුත් වන හෙයින් ලෞකික බොධ්‍යඞ්ගයන් හා අසම්මිශ්‍ර වූ ලොකොත්තර බොධ්‍යඞ්ගයක් යයි කියන ලදී.

තවද, බොධ්‍යාඞ්ග ධර්මයන් භාවනා වශයෙන් වඩන්නාවූද, නැවත නැවත සිත්හි උපදවන්නාවූ ද වැඩිවශයෙන් උපදවන්නාවූ ද මහණ තෙමේ, විවේක නිශ්‍රිතව හෙවත් විවේකය ඇසුරුකොට, විරාග නිශ්‍රිතව හෙවත් විරාගය ඇසුරුකොට, නිරොධ නිශ්‍රිතව හෙවත් නිරොධය ඇසුරු කොට, විදර්ශනාක්ෂණයෙහි කෙලෙසුන් නැසීම යයි කියන ලද **වොස්සග්ගය** සඳහා පිරිනැමූ **සති සම්බොධ්‍යඞ්ගය** වඩයි.

මේ විවේකය වනාහි, **තදඞ්ග විවේකය, වික්ඛම්භන විවේකය, සමුච්ඡෙද විවේකය, පටිප්පස්සද්ධි විවේකය, නිස්සරණ විවේකය** යයි පඤ්ච ප්‍රකාර ඇත්තේය. ඒ පඤ්චප්‍රකාර විවේකයන් අතුරෙන් **තදඞ්ග විවේකය** නම් විදර්ශනාතොමෝ යි. **වික්ඛම්භන විවේකය** නම් අෂ්ටප්‍රකාර රූපා රූප සමාපත්තිහුය **සමුච්ඡෙද විවේකය** නම් ආයර්‍ය මාර්‍ගයයි. **පටිප්පස්සද්ධි විවේකය** නම් ශ්‍රාමණ්‍ය ඵලයයි **නිස්සරණ විවේකය** නම් සර්‍වසංස්කාර නිමිත්තයා කෙරෙන් පහවූ නිර්‍වාණයයි. මෙ තැන්හි විවේක නිශ්‍රිත යයි කී කල්හි **තදඞ්ග විවේකය** නම් ලද විදර්ශනාව ඇසුරු කළාවූද, **සමුච්ඡෙද විවේකය** නම් ලද මාර්‍ගය ඇසුරු කළාවූද, **නිස්සරණ විවේකය** නම් ලද නිර්‍වාණය ඇසුරු කළාවූද සති සම්බොධ්‍යඞ්ගය වඩන්නේ යයි අර්‍ථ ගත යුතු. සති සම්බොධ්‍යඞ්ග භාවනානුයොගයෙහි නියුක්ත වූ

යොගාවචර මහණ තෙමේ, විදර්ශනා වඩන කෙණෙහි, කෘත්‍ය වශයෙන් තදඞ්ග විවේකය ඇසුරු කළා වූ අදහස් වශයෙන් නිස්සරණ විවේකය ඇසුරු කළා වූ, මාර්ගකාලයෙහි වනාහි, කෘත්‍ය වශයෙන් සමුච්ඡේද විවේකය ඇසුරු කළා වූ, අරමුණු කිරීම් වශයෙන් නිස්සරණ විවේකය ඇසුරු කළා වූ සති සම්බොධ්‍යඞ්ගය වඩයි.

මෙහි **වොස්සග්ගය** වනාහි, **පරිච්චාග වොස්සග්ගය, පක්ඛන්දන වොස්සග්ගය** යයි ද්විප්‍රකාර වේ. එයින් **පරිච්චාග වොස්සග්ගය** නම් විදර්ශනාක්ෂණයෙහි තදඞ්ග වශයෙන්, මාර්ගක්ෂණයෙහි සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් කෙලශයන් ගේ ප්‍රහාණ යයි. **පක්ඛන්දන වොස්සග්ගය** නම් විදර්ශනාක්ෂණයෙහි ඒ නිවණට නැඹුරුවීම් වශයෙන්, නිවණට ප්‍රවේශවීම් වශයෙන්, මාර්ගක්ෂණයෙහි අරමුණු කිරීම් වශයෙන් නිවණට ප්‍රවේශ වීමයි.

එ බැවින් මේ බොජ්ඣඞ්ග භාවනාවෙහි යෙදුනා වූ මහණ තෙමේ යම් පරිද්දෙකින් මෙසේ කෙලෙසුන් නැසීම වූ පරිච්චාග වොස්සග්ගය සඳහාත්, නිවණට පැමිණීම වූ පක්ඛන්දන වොස්සග්ගය සඳහාත් මුකුරුවා ද, යම් පරිද්දෙකින් මුකුළේවේද ඒ පරිද්දෙන් ඒ සති සම්බොධ්‍යඞ්ගය වඩයි.

එසේම ඒ යොගාවචර මහණ තෙම විවේකය ඇසුරුකොට ඇති, විරාගය ඇසුරුකොට ඇති නිරොධය ඇසුරුකොට ඇති කෙලෙස් දුරු කිරීම පිණිස නැමුණු ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය ද, විරිය සම්බොධ්‍යඞ්ගයද පීති සම්බොධ්‍යඞ්ගය ද, පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය ද, සමාධි සම්බොධ්‍යඞ්ගය ද, උපෙක්ඛා සම්බොධ්‍යඞ්ගය ද වඩයි.

# අෂ්ට ආර්‍ය්‍ය මාර්ගාඞ්ග ධර්ම

අෂ්ට විධ වූ ආර්‍ය්‍ය මාර්ගාඞ්ග ධර්මයෝ නම්:

1. **සම්මාදිට්ඨි**
2. **සම්මා සඞ්කප්ප**
3. **සම්මා වාචා**
4. **සම්මා කම්මන්ත**
5. **සම්මා ආජීව**
6. **සම්මා වායාම**
7. **සම්මා සති**
8. **සම්මා සමාධි** යන අෂ්ට ධර්මයෝ යි.

මහත් වූ දූව දඬු අටක් එක් කොට බැඳගන්නා ලද පසුර, සාගරයෙන් එතර වීමට උපකාර වන්නාක් මෙන් මේ මාර්ගාඞ්ගයෝ අටදෙන, සංසාර සාගරයෙන් එතර වීමට කාරණා වන හෙයින් නිර්වාණ මාර්ගයෙහි අඞ්ගයෝ ය, කාරණයෝය යන අර්ථයෙන් මාර්ගාඞ්ගයෝ යයි කියනු ලැබේ. එය උපාදානස්කන්ධ සඞ්ඛ්‍යාත ලොකයෙන් එතර කරවන ධර්ම සමුදායකි. දුක්ඛ නිරොධ ගාමිණී පටිපදා ආර්‍ය්‍ය සත්‍යය හෙවත් මාර්ග සත්‍යය නම් වූද, මධ්‍යම ප්‍රතිපදා නම් වූ මේ ධර්මයෝ අටදෙන, සොවාන්, සකෘදාගාමි, අනාගාමි අර්හත් යන සතර මාර්ග සිත්හි. එකවර නිර්වාණය අරමුණු කරමින් උපදනා, සත්තිස් බොධි පාක්ෂික ධර්මයන්ට ඇතුළත් වූ ධර්ම අටෙකි.

1. **සම්මාදිට්ඨිය**-නම් දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරොධ සත්‍යය, මාර්ග සත්‍යය යන චතුරාර්‍ය්‍ය සත්‍යයන් මනා ලෙස දන්නා යහපත් ඥණය නම්වූ ප්‍රඥවය, පජානනය, විචය, පවිචය, ධම්ම විචය, සල්ලක්ඛණය, උපලක්ඛණය, පච්චුපලක්ඛණය, පාණ්ඩිත්‍යය, කොසල්ලය, නිපුණය, වෛභව්‍ය චින්තාය, උප පරික්ඛාය, භූරි-මෙධා, පරිනායිකා, විපස්සනා, සම්පජඤ්ඤ, පතොද, පඤ්ඤ, පඤ්ඤින්ද්‍රිය,

පඤ්ඤා බලය, පඤ්ඤාසත්ථය, පඤ්ඤා පාසාදය, පඤ්ඤා ලෝකය, පඤ්ඤා ඔභාසය, පඤ්ඤා පජ්ජෝතය, පඤ්ඤා රතනය, අමෝහය, ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය වේ.

2. **සම්මා සඞ්කප්ප**-නෙක්ඛම්ම සඞ්කප්පය, අව්‍යාපාද සඞ්කප්පය, අවිහිංසා සඞ්කප්පය යන මොවුන් පිළිබඳවූ යම් තර්කයක්, විතර්කයක්, අප්පනාවක්. ව්‍යප්පනාවක්, චිත්තයාගේ නැංවා තැබීමක්, සංකප්පයක්, මාර්ගාඞ්ගයක්, මග්ගපරියාපන්නයක් ඇද්ද, එය **සම්මා සඞ්කප්ප** නම්.

3. **සම්මාවාචා** බොරු කීම, කේලාම් කීම, ඵරුෂ බස් බිණීම, හිස් වචන කීම යන චතුර්විධ වාග් දුශ්චරිත-යන්ගෙන් යම් ඉවත් වීමක් - වෙන්වීමක් - පටිවිරතියක් - විරමණයක් - නොකිරීමක් - අකරණයක් - නොපැමිණීමක් - සීමාව නොඉක්මවීමක් - සේතුඝාතයක් - සම්‍යග් වචනයක් - මාර්ගාඞ්ගයක් - මග්ග පරියාපන්නයක් ඇද්ද, එය **සම්මාවාචා** නම්.

4. **සම්මාකම්මන්ත**-සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම යන ත්‍රිවිධ කාය දුශ්චරිත-යන්ගෙන් යම් ඉවත්වීමක් - වෙන්වීමක් - පටිවිරතියක් - විරමණයක් - නොකිරීමක් - අකරණයක් - නොපැමිණීමක් - සීමාව ඉක්මවීමක් - සේතු ඝාතයක් - සම්මා කම්මන්තයක් - මාර්ගාඞ්ගයක් - මග්ගපරියාපන්නයක් ඇද්ද එය **සම්මා කම්මන්ත** නම්.

5 **සම්මා ආජීව**-මේ ශාසනයෙහි ආර්යශ්‍රාවක තෙම වැරදි දිවි පැවැත්ම හැර දැහැමින් උපන් දෙයින් දිවි පවත්වාද, නොහොත් මිථ්‍යා ආජීවයෙන් යම් ඉවත්වීමක් - වෙන්වීමක් - පටිවිරතියක් - විරමණයක් - නොකිරීමක් - නොපැමිණීමක් - සීමාව නොඉක්මවීමක් - සේතු ඝාතයක් - සම්‍යග් ආජීවයක් - මාර්ගාඞ්ගයක් - මග්ග පරියාපන්නයක් ඇද්ද එය **සම්මා ආජීව** නම්.

6. **සම්මා වායාමය**— මේ ශාසනයෙහි මහණතෙම නූපන් ලාමක අකුසල ධර්මයන් ගේ නූපදීම පිණිස, උපන් ලාමක අකුසල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස, නූපන් කුසල ධර්මයන් ගේ ඉපදීම පිණිස, උපන් කුසල ධර්මයන්ගේ සිටීම පිණිස, විනාශ නොවීම පිණිස, වර්ධනය පිණිස, මහත්බව පිණිස, භාවනාවෙන් සම්පූර්ණ කිරීම පිණිස, කැමැත්ත උපදවා ද, උත්සාහ කරත් ද, වීර්‍ය්‍ය පටන් ගනිත් ද, සිත දැඩි සේ ඔසවයි ද, බලවත් වීර්‍ය්‍ය උපදවා ද, නොහොත් නිවන පිළිබඳ පිරිසිදු කුසල ව්‍යායාමය නම්වූ යම් චෛතසික වීර්‍ය්‍යාරම්භයක්, නික්ඛමයක්, පරක්කමයක්, උය්‍යාමයක්, ව්‍යායාමයක්, උත්සාහයක්, උස්සොල්හි බවක්, ථාමයක්, ඨිතියක්, අසිථිල පරක්කමයක්, අනික්ඛිත්ත ඡන්දතාවයක්, අනික්ඛිත්ත ධුර බවක්, ධුර සම්පත්ත ග්‍රාහයක්, විරියක්, විරියින්ද්‍රියයක්, විරිය බලයක්, සම්මා වායාමයක්, විරිය සම්බොධ්‍යඞ්ගයක්, මාර්ගාඞ්ගයක්, මග්ග පරියාපන්නයක් ඇද්ද, එය **සම්මා වායාම** නම්.

7. **සම්මා සති** — මේ ශාසන යෙහි මහණ තෙම, කෙලෙස්, තවන වීර්‍ය්‍ය ඇත්තේ, සම්‍යග් ප්‍රඥාව ඇත්තේ, සිහි ඇත්තේ මේ පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත ලොකයෙහි, ලොභයද, දෞර්මනස්සයද සංසිඳුවාගෙන, කයෙහි කය අනුව බලමින් වාසය කරයි. වේදනාවෙහි, වේදනාව අනුව බලමින් වාසය කරයි. සිතෙහි සිත අනුව බලමින් වාසය කරයි, ධර්මයන්හි ධර්මය අනුව බලමින් වාසය කරයි එම අරමුණු සිහිකිරීම් නම් වූ සති, අනුස්සති, පටිස්සති, සති, සරණතා, ධාරණතා, අපිලාපනතා, අසම්මුස්සනතා, සතින්ද්‍රිය, සති බලය, සම්මා සතිය, සති සම්බොධ්‍යාඞ්ගය, මාර්ගාඞ්ගය, මග්ගපරියාපන්නය උපදවයි- මෙය **සම්මා සතිය** යයි කියනු ලැබේ.

8. **සම්මා සමාධිය**— මේ ශාසනයෙහි මහණතෙම, කාමයන්ගෙන් වෙන්වම, අකුසල ධර්මයන්ගෙන් වෙන්වම, විතර්ක සහිත වූ, විචාර සහිත වූ විවේකයෙන් උපන්නා වූ

ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වසයි. විතර්ක විචාරයන් ගේ සංසිඳීමෙන්, තමා තුල සිත පැහැදීම කරන්නා වූ, චිත්තයා ගේ එකඟබව වූ, විතර්කරහිත වූ, විචාර රහිත වූ, සිත එකඟ කිරීමෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවන ධ්‍යානයට පැමිණ වසයි. ප්‍රීතියෙහිද නො ඇලීමෙන් මැදහත් සවභාව ඇතිව වාසය කෙරේ. සිහි ඇතිව නුවණැතිව, සැපයද කයින් විඳියි මැදහත්ය, සිහි ඇත්තේය, සැපසේ වෙසේ යයි යමෙකු ගැන ආර්‍ය්‍යයෝ කියත්ද, ඒ තුන්වන ධ්‍යානයට පැමිණ වාසය කරයි. සැප පහකිරීමෙන්ද, දුක් පහකිරීමෙන් පූර්වයෙහි සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැතිවීමෙන් දුක් රහිත, සැප රහිත උපෙක්ෂා සමෘතීන්ගෙන් පිරිසිදු වූ සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. එකල්හි උඩගු බව දුරු කර සිත එකඟ කිරීම නම් වූ යම් චිත්තස්සඨිති, සණ්ඨිති, අවට්ඨිති, අවිසාහාර, අවික්ඛෙප, අවිසාහටමානසතා, සමථ, සමාධින්ද්‍රිය, සමාධි බලය, සම්‍යග් සමාධිය, සමාධි සම්බොධ්‍යඞ්ගය, මාර්ගාඞ්ගය, මග්ගපරියාපන්නයක් වේද, එය සම්මා සමාධි යයි කියනු ලැබේ

මෙය අෂ්ටාඞ්ගික මාර්ගය වේ. ඒ සමග, ලොකොත්තර සිත්හි යෙදුන අවශෙෂ ධර්මයෝ, අෂ්ටාඞ්ගික මාර්ග හා යුක්ත වූවෝය.

**සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝ ජාති** වශයෙන් සතකි. එනම්— **සතිපට්ඨාන, සම්මප්පධාන, ඍද්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මාර්ගාඞ්ග** යන සතය.

**සවභාව ධර්ම** වශයෙන් තුදුසෙකි (14). එනම්, **ඡන්දය, චිත්තය, උපෙක්ඛාය, සද්ධාය, පස්සද්ධිය, පීතිය, සම්මාදිට්ඨිය, සම්මා සඞ්කප්පය, සම්මා වාචාය, සම්මා කම්මන්තය, සම්මා ආජීවය, සම්මා වායාමය, සම්මා සතිය, සම්මා සමාධිය.**

එයින් **එකස්ථානිකයෝ** හෙවත් එක්වර බැගින් ගැණෙන ධර්මයෝ නව දෙනෙකි. එනම්:

**සම්මා සඞ්කප්ප, පස්සද්ධි, පීති, උපෙක්ඛා, ඡන්ද, චිත්ත, සම්මා වාචා; සම්මා කම්මන්තා, සම්මා ආජීව** යන නවයයි.

**නවස්ථානික** හෙවත් නව තැනක ආයේ එකම **වීර්‍ය්‍ය චෛතසිකයයි.**

**අෂ්ටස්ථානික** හෙවත් අට තැනෙක ආයේ එකම **සති චෛතසිකයයි.**

**පඤ්චස්ථානික** හෙවත් පස් තැනෙක ආයේ එකම **ප්‍රඥා චෛතසිකයයි.**

**චතුස්ථානික** හෙවත් සතර තැනෙක ආයේ එකම **සමාධිය** හෙවත් එකග්‍රතා චෛතසිකයයි.

**ද්විස්ථානික** හෙවත් දෙතැනෙක ආයේ එකම **සද්ධා චෛතසිකයයි.**

ප්‍රථම ධ්‍යාන ලෝකෝත්තර මාර්ග සිත්හි මේ බෝධි පාක්ෂික ධර්ම සියල්ලම ලැබේ. විතක්ක, පීති, තැති ලෝකෝත්තර ධ්‍යාන සිත්හි ඒ දෙක නොලැබේ.

සප්ත විසුද්ධීන් අතුරෙන් **ශීල විසුද්ධි, චිත්තවිසුද්ධි, දිට්ඨිවිසුද්ධි, කඞ්ඛා විතාරණ විසුද්ධි, මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධි, පටිපදාඤාණ දස්සන විසුද්ධි** යන ලෞකික ෂට් විසුද්ධීන් පුරුදු කරන්නා වූ යෝගාවචරයාහට ඒ ෂට් විසුද්ධි වශයෙන් උපදනා කුසල චිත්තයෙහි මේ බොධිපාක්ෂික ධර්මයන්, අතුරෙන් එකක්ම එකවර ලැබිය හැක්කේය.

| බොධිපාක්ෂික ධර්ම | | 4 සතිපට්ඨාන | 4 සම්මප්පධාන | 4 ඉද්ධිපාද | 5 ඉන්ද්‍රිය | 5 බල | 7 බොජ්ඣඞ්ග | 8 මග්ගඞ්ග | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. ඡන්දය | – ඡන්ද චෛතසිකය | | | 1 | | | | | 1 |
| 2. චිත්තය | – | | | 1 | | | | | 1 |
| 3. උපෙක්ඛාව | – තත්‍රමජ්ඣත්තතා චෛතසිකය | | | | | | 1 | | 1 |
| 4. සද්ධා | – සද්ධා ,, | | | | 1 | 1 | | | 2 |
| 5. පස්සද්ධි | – පස්සද්ධි ,, | | | | | | 1 | | 1 |
| 6. පීති | – පීති ,, | | | | | | 1 | | 1 |
| 7. සම්මාදිට්ඨි | - ප්‍රඥා ,, | | | 1 | 1 | 1 | 1 | 1 | 5 |
| 8 සම්මාසඞ්කප්ප | – විතර්ක ,, | | | | | | | 1 | 1 |
| 9. සම්මාවාචා | – එම විරති ,, | | | | | | | 1 | 1 |
| 10. සම්මා කම්මන්ත | – එම විරති ,, | | | | | | | 1 | 1 |
| 11. සම්මා ආජීව | – එම විරති ,, | | | | | | | 1 | 1 |
| 12. සම්මා වායාම | – විරිය ,, | | 4 | 1 | 1 | 1 | 1 | 1 | 9 |
| 13. සම්මාසති | – සති ,, | 4 | | | 1 | 1 | 1 | 1 | 8 |
| 14. සම්මා සමාධි | – එකග්ගතා ,, | | | | 1 | 1 | 1 | 1 | 4 |

## සබ්බ සංග්‍රහය

බෝධි පාක්ෂික සංග්‍රහයට අනතුරුව **සබ්බ සංග්‍රහය** දක්වනු ලැබේ. එය වනාහි:-

1. **පඤ්ච ස්කන්ධ**
2. **පඤ්චුපාදාන ස්කන්ධ**
3. **ද්වාදසායතන**
4. **අෂ්ටාදශ ධාතු**
5. **චතුරාර්ය්‍ය සත්‍යය** යයි පඤ්ච විධ වේ.

## පඤ්චස්කන්ධ

**පඤ්ච ස්කන්ධයෝ** නම්:-

1. **රූප ස්කන්ධය**
2. **වේදනා ස්කන්ධය**
3. **සඤ්ඤා ස්කන්ධය**
4. **සංඛාර ස්කන්ධය**
5. **විඤ්ඤාණ ස්කන්ධය** යන පඤ්චවිධ ස්කන්ධයෝයි.

**පඤ්ච ස්කන්ධය** යන පදයෙහි **ඛන්ධ** ශබ්දය තෙම **රාශියෙහි ද, ගුණයෙහි ද, ප්‍රඥප්තියෙහි ද, රූඪියෙහි ද** මෙසේ බොහෝ වූ අර්ථයන්හි වැටේ. **එයින් මහත් වූ** ජලස්කන්ධයකැයි කී කල්හි රාශි අර්ථයෙන් ස්කන්ධය ප්‍රකාශ වේ. එසේම රජස්කන්ධ, **භවස්කන්ධය**, බලස්කන්ධය, පුඤ්ඤස්කන්ධය යනාදී තන්හි ද රාශි අර්ථයම **දක්** වේ.

සීලස්කන්ධය, සමාධිස්කන්ධය යනාදී තන්හි ගුණයෙහි වැටේ. මහත්වූ **දරස්කන්ධයක්** හෙවත් දර කඳක් යයි කී කල්හි ප්‍රඥප්තියෙහි **වැටේ.** චක්ෂුර් විඤ්ඤාණාදිය අතුරෙහි **එක්** අවයවයකුදු ස්කන්ධ ශබ්දය **තෙමේ** එකදෙශොපචාර වශයෙන් **දක්වේ.** මෙකී ස්කන්ධ ශබ්දයාගේ අර්ථ අතුරෙන් රාශි අර්ථය **පමණක්ම** මෙහි ශබ්දාර්ථය වන්නේය. ගුණ

ප්‍රඥප්ති, රූඪි වූ අර්ථයෝ වනාහි සකන්ධ ශබ්දයාගේ විෂය මාත්‍රය මුත් ශබ්දාර්ථයෝ නොවන්නාහ. එබැවින් සකන්ධ ශබ්දයාගේ අර්ථය, මෙහිදී පිණ්ඩාර්ථය, සමුදයාර්ථය පුඤ්ජාර්ථය රාශ්‍යාර්ථය හෙවත් සමූහ සඞ්ඛ්‍යාත අර්ථය ඇති හෙයින්, පඤ්චසකන්ධයෝ රාශි **ලක්‍ෂණය** හෙවත් සමූහ භාවය **ලක්‍ෂණ** කොට ඇති බව දත යුතු. එමෙන්ම කොට්ඨාස භාවයද ලක්‍ෂණ කොට ඇත්තෝය. එසේ හෙයින් බුදුරජාතන් වහන්සේ, **රූපස්කන්ධය** නම් රූප සමූහයක, රූප කොට්ඨාසයකැයි කියාද, **වේදනාස්කන්ධය,** වේදනා සමූහයක, වේදනා කොට්ඨාසයකැයි කියාද, **සංඥාස්කන්ධය,** සංඥා සමූහයක, සංඥා කොට්ඨාසයකැයි කියාද, **සංඛාරස්කන්ධය,** සංසකාර සමූහයක, සංසකාර කොට්ඨාසයකැයි කියාද, **විඤ්ඤාණස්කන්ධය,** විඤ්ඤාණ සමූහයක, විඤ්ඤාණ කොට්ඨාශයකැයි කියාද වදාළහ.

තවද, බුදුරජාණන් වහන්සේ, සතර මහා භූතයෝය, සතර මහා භූතයන් නිසා හටගත්තාවූ උපාදාය රූපයෝද, අතීතානාගත පච්චුප්පන්නා දි වශයෙන් එකොළසක් වූ, අවකාශයන්හි හෙවත් අවස්ථාවන්හි බෙදා දක්වන ලද්දාවූ පස් විස්සක් පමණවූ රූප ධර්ම කොටස්හුය කියාත්, සයානූවක් පමණ වූ රූප ධර්ම කොටස්හුය කියාත්, මෙ බඳු වූ ප්‍රභෙද ඇති යම් රූප රාශියක් ඇද්ද, ඒ සියලු රූප රාශිය හාත් පසින් පිඬුකොට **රූපස්කන්ධය** නමැ යි දක්වා වදාළසේක.

**එකොළොස් අවකාශයෝ** නම්:-

1. **අතීතාවකාශය**
2. **අනාගතාවකාශය**
3. **ප්‍රත්‍යුත්පන්නාවකාශය**
4. **අධ්‍යාත්මාවකාශය**
5. **බාහ්‍යාවකාශය**
6. **ඖදාරිකාවකාශය**
7. **සූක්‍ෂමාවකාශය**
8. **හීනාවකාශය**
9. **ප්‍රණීතාවකාශය**
10. **දූරාවකාශය**
11. **සන්තිකාවකාශය** යන එකොළොස් අවස්ථාවෝ යි.

**පස්විසි රූප ධර්ම කොට්ඨාශයෝ** නම් චක්ඛායතන, රූපායතන, සොතායතන, සද්දායතන, ඝාණායතන, ගන්ධායතන, ජිව්හායතන, රසායතන, කායායතන, පොට්ඨබ්බායතන යන දසායතනයෝද, හදය වස්තු රූපය වර්ජිත කොට ඇති සූක්ෂම රූප පසළොස් දෙනාදැයි යන විසිපස් රූපයෝද, පූර්වෝක්ත දසායතනයන් හා උපචය සන්තති රූප චය එක් කොට ගෙන හදය වස්තු රූපයන් සමග සූක්ෂම රූප පසළොස්දෙනාදැයි යන පස්විසි රූප කොට්ඨාසයෝ වෙත්.

**සයානූවක් රූප කොට්ඨාසයෝ** නම්, **චක්ඛු දසකය, සොත දසකය, ඝාණ දසකය, ජිව්හා දසකය, කාය දසකය,** භාව **දසකය, වස්තු දසකය** යන දසක කලාප සත් දෙන එකතුව රූප සැත්තෑ දෙනෙක, ඍතුජාෂ්ටක කලාපය, චිත්තජාෂ්ටක කලාපය, ආහාරජාෂ්ටක කලාපය යන අෂ්ටක කලාප ත්‍රයට ඇතුළත් සූවිසි රූපයෝද යන රූප ධර්මයෝ සූවානූවක් (94) හා චිත්තජ ශබ්දය, ඍතුජ ශබ්දය යන දෙදෙනාත් සමග සයානූවක් (96) රූප ධර්මයෝ වෙත්.

සුඛා වේදනා, දුක්ඛා වේදනා, අදුක්ඛම සුඛා වේදනා යයි කියා එබඳු සවභාව වූම, එකොළොස් අවකාශයන්හි විභජනය කරන ලද්දා වූ යම් චාතුර්භූමික වේදනා රාශියක් ඇද්ද, ඒ සියලු චාතුර්භූමික වේදනා රාශිය හාත්පසින් පිඩුකොට **වේදනාස්කන්ධය** නමැයි දක්වා වදාළ සේක.

චක්ඛුසම්ඵස්සජාසඤ්ඤා, සොතසම්ඵස්සජාසඤ්ඤාදි වශයෙන් එබඳු සවභාවවූම එකොළොසක් වූ අවකාශයන්හි විභජනය කරන ලද්ද වූ, යම් චාතුර්භූමික සංඥා රාශියක් ඇද්ද, ඒ සියලු චාතුර්භූමික සංඥා රාශිය හාත් පසින් පිඩු කොට **සංඥාස්කන්ධය** නමැයි වදාළ සේක.

චක්ඛුසම්ඵස්සජා චේතනා, සොතසම්ඵස්සජා චේතනාදි වශයෙන් එබඳු සවභාවවූම, එකොළොසක් වූ අවකාශයන්හි

විභජනය කරන ලද්දා වූ යම් චාතුර්භූමික චේතනා රාශියක් ඇද්ද, ඒ සියලු චාතුර්භූමික චේතනා රාශිය හාත්පසින් පිඩුකොට **සංස්කාරස්කන්ධය** නමැයි දක්වා වදාළ සේක

චක්ඛුවිඤ්ඤාණ, සොතවිඤ්ඤාණ, ඝාණවිඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කායවිඤ්ඤාණ, මනොධාතු, මනොවිඤ්ඤාණ ධාතු යයි කියා එබඳු සවභාවවූම එකොළොසක් වූ අවකාශයන්හි විභජනය කරන ලද්දා වූ යම් චාතුර්භූමික චිත්ත රාශියක් ඇද්ද, ඒ සියලුම චාතුර්භූමික චිත්ත රාශිය හාත්පසින් පිඩුකොට **විඤ්ඤාණස්කන්ධය** නමැයි දක්වා වදාළ සේක.

තවද, සියළුම කම්ම, චිත්ත, ඍතු ආහාර යන චතුසමුට්ඨානික රූපයෝ **රූපස්කන්ධය** නමැයි ද,

සියළුම එකුන් අනූවක් පමණ සිත් සමග එක්ව උපදනාවූ වේදනා තොමෝ **වේදනාස්කන්ධය** නමැයි ද,

සියළුම එකුන් අනූවක් පමණ සිත් සමග එක්ව උපදනා වූ සංඥා තොමෝ **සංඥාස්කන්ධය** නමැයි ද,

ස්පර්ශය ආදි කොට ඇති චෛතසික ධර්මයෝ පනස් දෙන **සංස්කාරස්කන්ධය** නමැයි ද,

එකුන් අනූවක් පමණ වූ සිත්හු **විඤ්ඤාණස්කන්ධය** නමැයි ද දක්වා වදාළ සේක.

## රූපස්කන්ධය

යම් හෙයකින් විකාරයට පැමිණේද, නොහොත් විකාරයට පමුණුනු ලැබේද, නොහොත් තුමූම වෙනස් වේද, එහෙයින් **රූප** යයි කියනු ලැබේ.

මේ විකාරයට පැමිණීම නොහොත් පමුණුනු ලැබීම නොයෙක් හෙතුන් කරණකොට ගෙන සිදුවේ. සීත හෙතු වෙනුත් විකාරයට පැමිණේ, නොහොත් සීතයා විසිනුත් විකාරයට පමුණුනු ලැබේ. උෂ්ණ හෙතුවෙනුත්

විකාරයට පැමිණේ, නොහොත් උෂ්ණයා විසිනුත් විකාරයට පමුණනු ලැබේ. **ක්ෂුධා** හෙතුවෙනුත් විකාරයට පැමිණේ, නොහොත් ක්ෂුධාව විසිනුත් විකාරයට පමුණනු ලැබේ. **පිපාසා** හෙතුවෙනුත් විකාරයට පැමිණේ, නොහොත් පිපාසය විසිනුත් විකාරයට පමුණනු ලැබේ. ඩංසමකස වාතාතපසිරිංසපසම්පස්සාදිය හෙවත් **ඩැහැ ලේ බොන මැසිය, මදුරුය, සුලගය, අව්වය, දීඝ ජාතීන්ගේ දෂ්ටසංස්පර්ශය, සර්ප්ප සංස්පර්ශය** යන හෙතුවෙනුත් විකාරයට පැමිණේ නොහොත් ඒ මැසි ආදීන් විසිනුත් විකාරයට පමුණනු ලැබේ.

කිපෙන්නේය, ගට්ටනු ලබන්නේය, පෙළනු ලබන්නේය, විකාරයට පැමිණෙන්නේය, නොහොත් විකාරයට පමුණනු ලබන්නේය. නොහොත් තමාම බිදෙන්නේය යන මෙපමණ වූ භිද්‍යමානාර්ථ හෙවත් බිඳීම දක්වන අර්ථසඞ්ඛ්‍යාතවූ මේ කාරණයෙන් **රූපය** යයි වදාළ සේක.

තවද, රූප්පන සඞ්ඛ්‍යාත විකාර භාවය හෙවත් බිඳීම **ලක්‍ෂණ** කොට ඇති හෙයින්ද **රූප** නම් වේ.

**සීත** හෙතුවෙන් විකාරයට පැමිණීම ලොකාන්තරීය නරකයෙහි ප්‍රකට වේ. චක්‍රවාල හෙවත් සක්වලවල් සම්බන්ධ වූ තුන් තුන් දෙනෙකුගේ අතර යොදුන් අට දහසක් පමණ ඇත්තා වූ එක් එක් ලොකන්තරීය නරකයෙක් නම් වේ. එහි යට භාගයෙහි පෘථිවියක් නැත. මත්තෙහි චන්ද්‍රාලොකයෙක්, සූර්‍ය්‍යාලොකයෙක් ප්‍රදීපාලොකයෙක්, රත්නාලොකයෙක් නැත. හැම කල්හි අන්ධකාරය ඇත්තේ වේ. ඒ ලොකාන්තරීය නරකයෙහි උපන් සත්ත්වයන්ගේ තුන්ගව් පමණැත්තා වූ ආත්මභාවයෙක් වේ. ඒ තිරිසනුන් වවුලන් මෙන් චක්‍රවාළ පර්‍වත පාදයෙහි දිගු පුළුල් වූ නියවලින් බදාගෙන, යට හෙලූ හිස් ඇත්තාහු එල්බෙත්. යම් කලෙක ඇත මෑත යන්නාහු ඔවුනොවුන් ගේ අත් පසට ගියාහු වෙද්ද, එකල්හි අප විසින් භොජනයක් ලබන ලදැයි සිතා ඒ භොජනයෙහි වෑයම

කරන්නාහු, වැරදී, ගිලිහීවුත්, සක්වල ගල උසුලන්නාවූ ජලපොළොවෙහි සුන්බුන්ව පතිත වෙත්. සිහිල් පවන හමන කල්හි විලිකුම් මී පල මෙන්, මූසපත් වීමෙන් ස්ථානයෙන් මුක්තව, අඟපසඟ සිඳීම් වශයෙන සිඳගෙන පෘථුවි සන්ධාරක ජලයෙහි වැටෙත්. පතිත වූ පමණකින්ම අතිශයින් සිහිල් වූ, සීතල ජලයෙන් බිඳෙන්නා වූ, සුන්වූ සම් නහර මස් ඇටවලින් යුක්තව කකාළ තෙලෙහි දැමූ පිටි පිඩක් මෙන් පටපටැ යි හඬ නගමින් පැසි පැසී දියව යෙත්. මෙසේ සීත හේතුවෙන් විකාරයට පැමිණීම ලෝකාන්තරික නරකයෙහි ප්‍රකට වේ. පිනි බෑමෙන් සිහිල්වූ ප්‍රදේශයන්හිත් මේ සීත හේතුවෙන් රුප්පන ස්වභාවයට පැමිණීම නොහොත් සීතත්වය විසින් රුප්පන ස්වභාවයට පමුණුනු ලැබීම ප්‍රකට මැයි ඒ පෙදෙස්හි වසන ඇතැම් සත්ත්වයෝ සීත හේතුවෙන් නොහොත් සීතත්වය විසින් සුන් බුන් සිරුරු ඇත්තෝව ප්‍රාණ හානියටත් පැමිණෙත්.

**උෂ්ණ හේතුවෙන්** නොහොත් උෂ්ණය විසින් විකාරයට පැමිණීම නොහොත් විකාරයට පමුණුනු ලැබීම අවීචි මහා නරකයෙහි ප්‍රකට වේ. ඒ අවීචි මහා නරකයෙහි ගිනියම් වූ ලෝහ භූමියෙහි හොවා පඤ්චවිධ බන්ධනාදි වූ කම් කටුල් කරන කාලයෙහි සත්ත්වයෝ ඉමහත් දුක් අනුභව කෙරෙත්. **ජඨරාග්නි සමාගමයෙන් වූ සාදුක්** හෙයින් විකාරයට පැමිණීම ප්‍රේත ලෝකයෙහි ද, දුර්භික්ෂ කාලයෙහි ද ප්‍රකට වේ. ප්‍රේත ලෝකයෙහි සත්ත්වයෝ දෙතුන් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි කිසිම අහරක් අතින් ගෙන මුවෙහි ලා ගන්නා කෙනෙක් නම් නොවෙත්. ජඨරාභ්‍යන්තරය තෙම ගිනි ඇවිලගත් බිල ඇති රුකක් මෙන් වේ. දුර්භික්ෂ සමයෙහි කැඳිත්තක් පමණකුත් නොලැබ මළාවූ සත්ත්වයන් ගේ ප්‍රමාණයෙක් නැත.

පිපාසා හේතුවෙන් විකාරයට පැමිණීම කාලකඤ්ජික නම්වූ ප්‍රේතාසුර භූමියෙහි ප්‍රකට වේ. ඒ කාලකඤ්ජික නම් වූ ප්‍රේතාසුර භූමියෙහි සත්ත්වයෝ දෙතුන් බුද්ධාන්තර සක් මුලුල්ලෙහි ළය තෙමෙන පමණකුදු දිව තෙමෙන පමණකුදු දිය බිඳක් හෝ ලබන්නට නොහැකි වෙත්. පැන් පානය කරන්නමෝයි ගඟක් බලා ගියා වූ කාල-කඤ්ජික ප්‍රේතාසුරයන්ටද ගඞ්ගා තොමෝ වැලිතලාවෙක් සිද්ධවන්නීය. මහා සමුද්‍රය වෙත පැමිණියා වූ කාලකඤ්ජික ප්‍රේතාසුරයන්ටද, මහා සමුද්‍රය තෙම ගල්තලාවෙක් වේ. ඒ කාලකඤ්ජික නම් වූ ප්‍රේතාසුරයෝ වියලෙන්නෝව, බලවත් දුකින් පෙළෙන්නෝව හැසිරෙත්. එක් කාල-කඤ්ජික වූ ප්‍රේතාසුරයෙක් තෙම පිපාසය ඉවසන්නට නොහැකි වන්නේ ගැඹුර පුළුලින් යොදුනක් පමණ ඇති ගඞ්ගානම් මහා නදියට බැස්සේය ඒ කාලකඤ්ජික ප්‍රේතාසුරයා ගිය ගිය තන්හි ජලය සිඳී යෙයි, දුම මතුවෙයි රත්වූ ගල්තලාවෙක්හි සක්මන් කරන කලක් මෙන් වේ ඒ ප්‍රේතාසුරයාගේ ගඞ්ගා ජලය සම්බන්ධ වූ ශබ්දය අසා ඔබිමොබ ද හැසිරෙමින් සිටියදීම රාත්‍රිතොමෝ අවසන් වූය. එකල්හි ඒ ප්‍රේතාසුරයා උදෑසනම ගොදුරු ගමට යන්නා වූ තිස්නමක් පමණ වූ පිණ්ඩපාතික භික්ෂූහු දැක, සත්පුරුෂය, තෝ කිනම් පුරුෂයෙක් වෙහිදැයි ඇසූහ. ස්වාමිවරුනි මම ප්‍රේතයෙක් වෙමියි කී කල්හි කුමක් සොයන්නෙහිදැයි ඇසූහ. ස්වාමීනි පැන් යොයන්නෙමියි කී කල්හි මේ ගඞ්ගාතොමෝ ජලයෙන් පරිපූර්ණය. තෝ නො දන්නෙහිදැයි ඇසූහ. ස්වාමිවරුනි, පැනක් නොලැබේයි කී කල්හි, එසේවී නම් ගංඉවුරු තලාවෙහි වැදහෙව. තාගේ මුවෙහි පැන් වත්කරන්නෙමු යයි කීහු එවිට ඒ ප්‍රේතාසුර තෙම වැලිතලාවෙහි උඩුකුරුව හොත්තේය. භික්ෂූහු තිසක් පමණ වූ පාත්‍රයන් ගෙන පැන් ගෙනවුත් ඒ ප්‍රේතාසුරයාගේ මුඛයෙහි වත්කළහ. ඒ භික්ෂූන් එපරිද්දෙන් කරද්දීම පිඹූ පිණිස ගම් වදනා වේලා තොමෝ ළඟාවූහ. එහෙයින්, එම්බල පුරුෂය,

දූත් අපට පිඬු පිණිස ගමට වදනා කාලය වේ. කිමෙක්ද, තා විසින් සැනසීම් මාත්‍රයක් ලදුදැයි ඇසූහ. ප්‍රේතාසුර තෙමේ වහන්ස, තිස්නමක් පමණ වූ සවාමීන්‍ද්‍රයන් වහන් සේලාගේ තිසක් පමණ වූ පාත්‍රයන් කරණකොට ගෙන වත්කළාවූ ජලයෙන් අඩපතක් පමණකුදු ඉඳින් බොටුවෙන් තුලට වත්නම්, ප්‍රේතාත්මභාවයෙන් මිදීමක් නොවේවායි මෙසේ කීයේය. මෙපරිද්දෙන් පිපාසා හෙතුවෙන් විකාර යට පැමිණීම ප්‍රේත ලෝකයෙහි ප්‍රකට වේ.

**ඩංසමකසවාතාතප සිරිංසපසම්ඵස්ස** ආදීන් හේතු කොටගෙන විකාරයට පැමිණීම ඩැහැ ලේ බොන මැසි ආදීහු බෙහෙවින් ඇත්තාවූ ප්‍රදෙශයන්හි ප්‍රකට වේ. මෙහි **ඩංසයෝ** නම් පිගුවත් වූ ඩැහැ ලේ බොන මැස්සෝයි. **මකසයෝ** නම් මදුරුවෝය. **වාතයෝ** නම් කුස තුල පවත්නා වාතය, පිට පැතිර පවත්නා වාතය යනාදීන්ගේ වශයෙන් වූ වාතයයි. සිරුරෙහි වාතාබාධය තෙම ඉපිද අත් පිටු පා පිටු ආදින් බිඳින්නේය, **කණ** කරන්නේය, කුදු කරන්නේය, පිළු කරන්නේය. **ආතාප** නම් සූර්‍ය්‍ය සන්තා-පයයි. ඒ සූර්‍ය්‍ය සන්තාප හෙතුවෙන් විකාරයට පැමිණීම වාලුකා කාන්තාරාදීන්හි ප්‍රකට වේ. එක් සත්‍රියක් තොමෝ මරු කතාරෙක රාත්‍රි කාලයෙහි වණිග් ජන සමූහයා කෙරෙන් වෙන්වූවාය. හිරු මතුවන කල්හි අව්වෙන් තැව්තාවූ වැලිතලාවෙහි පතුල් තබන්නට නොහැකි වන්නී හිසින් පැස බහා තබා සිටියාය. ක්‍රමයෙන් රිවි තැව්ලෙන් වැඩියක් හුනුව ගියාවූ පැසෙහි සිටිනට නොහැකි වන්නී ඒ පැස මතුවෙහි සළුව තබා සිටියාය. ඒ සළුවද හුනුව ගිය කල්හි ඇකයෙන් ගන්නා ලද ළදරුවා යටි මුව කොට හොවා හඬන්නාහු ඒ පුත්‍රයා සමග එතැන්හිම උෂ්ණ සන්තාප හෙතුවෙන් කළුරිය කළාය. **සිරිංසපයෝ** නම් සියළුම දීර්ඝ ජාතික ප්‍රාණීහු, වක්‍ර ගතින් හැසිරෙන්නෝව යෙත්ද ඔව්හු වෙති ඒ සත්ත්වයන්ගේ දෂ්ටසපර්ශ, සපෘෂ්ටසපර්ශ හෙතුවෙන් විකාරයට පැමිණීම විස දළ ඇති සර්පාදින් පිළිබඳ වූ දෂ්ට සපර්ශාදීන්ගේ වශයෙන් දතයුතු.

චතුර්විධ වූ **මහා භූතයෝ ද,** චතුර්විධ වූ මහා භූතයන් නිසා පවත්නාවූ **උපාදාය රූපයෝ ද,** අතීතානාගත පච්චුප්පන්න ආදී වශයෙන් එකොළොස් අවස්ථාවන්හි පිහිටි රූප වශයෙන් විභාගය දතයුතු.

**අතීතානාගත පච්චුප්පන්න රූපය තෙම,** සූත්‍ර දෙශනා වශයෙන් හා අභිධම්ම නිර්දෙශ වශයෙනැයි ද්විප්‍රකාර වන්නේය. ඒ අතීතානාගත ප්‍රත්‍යුත්පන්න රූපය, සූත්‍ර දෙශනාවෙහි, භව වශයෙන් පිරිසිඳින ලදී. පිළිසිඳ ගත් තැන් පටන් ඉක්ම ගියාවූ භවයන්හි උපන්විරූ රූපය තෙමේ, අනතුරු ඉකුත් භවයෙහි හෝ උපන්නේ වේවා, කප්කෙළ සිය දහසකින් මත්තෙහි හෝ උපන්නේ වේවා, සියළු රූපය **අතීත රූප** නම් වේ.

චුතවූ තැන් පටන් අසම්ප්‍රාප්ත භවයන්හි, මතු උපදින්නා වූ රූපය තෙමේ අනතුරු වූ අනාගතාසන්න භවයෙහි හෝ උපදින්නේ වේවා, කප්කෙළ සිය දහසකින් ඉදිරියෙහි හෝ උපදින්නේ වේවා, සියළු රූපය **අනාගත රූපය** නම් වේ.

චුති ප්‍රතිසන්ධීන්ට අතර ප්‍රවෘත්තවූ රූපය **ප්‍රත්‍යුත්පන්න රූපය** නම් වේ.

අභිධම්ම නිර්දෙශයෙහි වනාහි **ක්‍ෂණ** වශයෙන් පිරිසිඳින ලද්‍ද.

රූපයාගේ **ක්‍ෂණ**යෝ තුමූ **උත්පාදක්‍ෂණය, ස්ථිතික්‍ෂණය, භඞ්ගක්‍ෂණය** යයි තුනෙකි. මේ ත්‍රිවිධ**ක්‍ෂණයන්**ට පැමිණ නිරුද්ධවූ හෙවත් බිඳී ගියාවූ රූපය තෙමේ අතරක් නැති අත්‍යාසන්න කාලයෙහි නිරුද්ධ වූයේ හෝ වේවා, අතීත කාලයෙහි කප් කෙළ **ලක්‍ෂයකින්** මත්තෙහි හෝ නිරුද්ධ වූයේ හෝ වේවා, සියළු රූපය **අතීත රූප** නම් වේ.

ත්‍රිවිධ**ක්‍ෂණ**යන්ට නොපැමිණියාවූ රූපය තෙම එක් චිත්ත**ක්‍ෂණ** මාත්‍රයෙක්හි හෝ නොපැමිණියේ වේවා අනාගත

කාලයෙහි කප්කෙළ සිය දහසකින් ඉදිරියෙහි හෝ නො පැමිණියේ වේවා, සියළු රූපය **අනාගත රූපය** නම් වේ

මේ ත්‍රිවිධක්ෂණයන්ට පැමිණියා වූ රූපය වනාහි **ප්‍රත්‍යුත්පන්න රූපය** නම් වේ.

තවද මේ රූපය තෙමේ **අද්ධාන** වශයෙන්ද, **සන්තති** වශයෙන්ද, **සමය** වශයෙන්ද, **ක්ෂණ** වශයෙන්ද සිව් පරිද්දෙකින් අතීත නම් වේ.

**එක්** සත්ත්වයෙක්හුගේ **එක්** අත්බැවෙක්හි ප්‍රතිසන්ධියෙන් පූර්වයෙහි **උපන්** රූපය **අතීත** නම්. ච්‍යුතියෙන් මත්තෙහි උපදින්නාවූ රූපය **අනාගත** නම් ප්‍රතිසන්ධි ච්‍යුතීන්ගේ මධ්‍යයෙහි උපදනා රූපය **ප්‍රත්‍යුත්පන්න නම්**. මෙය **අද්ධාන** වශයෙන් පිරිසිඳීමයි.

**සන්තති** වශයෙන් වනාහි, සමාන සවභාව ඇති එක් ඍතු හෙතුවකින් උපදනාවූ රූපයද, පූර්වාපර කාලයන්හි ප්‍රවෘත්ති වශයෙන් පවත්නේවීනමුත් **ප්‍රත්‍යුත්පන්න** නම් වේ. ඒ ප්‍රත්‍යුත්පන්න කාලයෙන් පූර්වයෙහි අසමාන සවභාව ඇති ඍතු හෙතුවෙන් හා ආහාර හෙතුවෙන් උපන්නාවූ රූපය **අතීත** නම් වේ. පසුව උපදින්නාවූ රූපය **අනාගත නම්** වේ.

**එක්** චිත්ත වීථියෙක්හි, **එක්** ජවන වාරයෙක්හි, **එක්** සමාපත්ති වාරයෙක්හි උපදනාවූ චිත්තසමුට්ඨාන රූපය **ප්‍රත්‍යුත්පන්න රූපය නම්** වේ. ඒ ප්‍රත්‍යුත්පන්නයා කෙරෙන් පූර්වයෙහි උපන් චිත්ත සමුට්ඨාන රූපය **අතීත රූපය** නම් වේ. පසුව උපදින්නාවූ චිත්ත සමුට්ඨාන රූපය **අනාගත රූපය** නම් වේ.

**කර්මය** හෙතුකොටගෙන **උපදනා** රූපයාගේ, සන්තති වශයෙන් අතීතාදි ප්‍රභෙදයක් නැත ඍතු, ආහාර, චිත්ත හෙතුවෙන් උපදනාවූ ඒ රූපයන්ටම අනුබල දීම් වශයෙන් ඒ කර්මජ රූපයාගේ අතීතාදී භාවය තෙම දතයුතු.

**සමය** වශයෙන් වනාහි, එක් මොහොතක් කාලය, පෙරවරු කාලය, සවස් කාලය, රාත්‍රි කාලය, දහවල් කාලය යනාදිවූ කාලයන් අතුරෙන් පෙළ සැදී පවත්නා ඒ ඒ කාලය තෙම **ප්‍රත්‍යුත්පන්න** නම්. ඒ ප්‍රත්‍යුත්පන්න කාලයෙන් පූර්වයෙහි පැවති කාලය තෙම **අතීත** නම්. පසුව පවතින කාලය තෙම **අනාගත** නම්.

**ක්ෂණ** වශයෙන් වනාහි, උත්පාද, ඨිති, භඞ්ග සඞ්ඛ්‍යාතවූ ක්ෂණත්‍රයෙහි අන්තර්ගත වූ රූපය තෙම **ප්‍රත්‍යුත්පන්න** නම්. ඒ ප්‍රත්‍යුත්පන්නයෙන් පූර්වයෙහි උපන් රූපය තෙම **අතීත** නම්. පසුව උපදින්නාවූ රූපය තෙමේ **අනාගත** නම්.

ඉක්මගියාවූ හෙතු කෘත්‍යය, ප්‍රත්‍යකෘත්‍යය ඇති රූපය තෙම **අතීත** නම්. නිමාවට ගියාවූ හෙතුකෘත්‍ය ඇති, නො නිමියාවූ ප්‍රත්‍යය කෘත්‍ය ඇති රූපය තෙමේ **ප්‍රත්‍යුත්පන්න** නම්. උභය කෘත්‍යයට නොපැමිණියාවූ රූපය තෙම **අනාගත** නම්.

සවකීය කෘත්‍යක්ෂණ යෙහි නොහොත් කෘත්‍යය හා සමග පවත්නා කෙණෙහි උපදනා රූපය තෙම **ප්‍රත්‍යුත්පන්න** නම්. ඒ සවකීය කෘත්‍යක්ෂණයෙන් පූර්වයෙහි උපන් රූපය තෙම **අතීත** නම්. පසුව උපදින්නාවූ රූපය තෙම **අනාගත** නම්.

මෙකී අද්ධා, සන්තති, සමය ක්ෂණාදීන් අතුරෙන් ක්ෂණ වශයෙන් ගන්නා ලද අතීතානාගත ප්‍රත්‍යුත්පන්න රූපයෝ පමණක් මෙහි දී අදහස් කරන ලද බව දතයුතු.

එබැවින් යම් රූපයක් පසු කාලයට අයත් වූයේද, නිරුද්ධ වූයේද, පහව ගියේද, වෙනසකට පත්වූයේ ද, අස්තයට ගියේද, විනාශ වූයේද, ඉපිද පහව ගියේද, පසු වූයේද, පසුවීම් කොටස් වශයෙන් ගණන් ගැණුනේද, එසේවූ සතර මහා භූතයෝද, සතර මහා භූතයන් නිසා උපන් රූපද, **අතීත රූප** යයි කියනු ලැබේ.

යම් රූපයක් ඇති නොවූයේද, හට නොගත්තේද, නූපන්නේද, පහළනොවූයේද, අපාතු භූතද, අනුප්පන්නද, අසමුප්පන්නද, අනුට්ඨිතද, අසම්මුට්ඨිතද. අනාගතද, අනාගත කොටස් වශයෙන් ගණන් ගැනුනේද, එසේවූ සතර මහා භූතයෝද, සතර මහා භූතයන් නිසා උපදින රූපද **අනාගත යයි** කියනු ලැබේ.

යම් රූපයක් ඇතිවූයේද, වූයේද, හටගත්තේද උපන්නේද, පහළවූයේද, පාතුභූතද උත්පන්නද, සමුප්පන්නද, උට්ඨිතද, සමුට්ඨිතද, වර්තමානවූයේද, වර්තමාන කොටස් වශයෙන් ගණන් ගැණුනේද, එසේවූ සතර මහා භූතයෝද, සතර මහා භූතයන් නිසා උපන් රූපද **ප්‍රත්‍යුත්පන්න රූප** යයි කියනු ලැබේ.

යම් රූපයක් ඒ ඒ සත්ත්වයන්ගේ චිත්ත පරම්පරාගතද, තමා පිළිබඳ ද, ඒ ඒ පුද්ගලයන්ට වෙන් වෙන් වශයෙන් අයත්ද සවකීයද, සමානව ලැබුනේද, තමාගේ යයි සිතාගත්තේද, එසේ වූ සතර මහා භූතයෝද, සතර මහා භූතයන් නිසා උපන් රූපද, **අධ්‍යාත්ම රූප** යයි කියනු ලැබේ.

යම් රූපයක් ඒ ඒ අන්‍යවූ සත්ත්වයන්ගේ, අන්‍ය වූ පුද්ගලයන්ගේ චිත්ත පරම්පරාගතද, ඔවුන් පිළිබඳද, ඒ ඒ පුද්ගලයන්ට වෙන් වෙන් වශයෙන් අයත්ද, ඔවුන්ට සවකීයද, සමානව ලැබුනේද ඔවුන් තමා පිළිබඳයයි සිතාගත්තේද. එසේ වූ සතර මහා භූතයෝද, සතර මහා භූතයන් නිසා උපන් රූපයෝද, **බාහිර රූප** යයි කියනු ලැබේ.

යම් චක්ඛායතන, සොතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, රූපායතන, සද්දායතන, ගන්ධායතන, රසායතන, පොට්ඨබ්බායතනයෙක් වේද මෙය **ඖදාරික රූප** යයි කියනු ලැබේ.

හදය වස්තු රූපය වර්ජිත කොට ඇති සූක්ෂමරූප පසළොස් දෙනාගේ වශයෙන් හෝ, උපචය සන්තති රූපචය එක්කොට ගෙන හදය වත්‍ථු රූපයත් සමගවූ සූක්ෂම රූප පසළොස් දෙනාගේ වශයෙන් හෝ ගණන් ගනු ලබන රූපයෝ **සූක්ෂම රූප** යයි කියනු ලැබේ

යම් රූපයක් ඒ ඒ සත්ත්වයන්ගේ අවමානයට හේතුද, නොගත යුත්තක් කොට හැර දමාද, මෙය කුමක් දැයි වචනයෙන් අපහාස කෙරේද, ගරු නොකෙරේද, ලාමක යයි සිතාද, හීන යයි දක්නා ලදද, පහත්යයි සම්මත වූයේද, අප්‍රිය වූයේද, කැමැති නො වේද, සිතට රුචි නොවේද, එබඳුවූ රූපයෝද, ශබ්දයෝද, ගන්‍ධයෝද, රසයෝද, ස්පර්ශයෝ ද යන මොව්හු **හීන රූප** යයි කියනු ලැබේ.

යම් රූපයක්, ඒ ඒ සත්ත්වයන්ගේ අවමානයට හේතු නොවේද, නින්‍දාවට හේතු නොවේද නොගතයුත්තක් කොට හැර නොදමාද, මෙය කුමක්දැයි වචනයෙන් අපහාස නො කෙරේද, ගරු කෙරේද, ප්‍රණීතද, ප්‍රණීත යයි සිතාද, ප්‍රණීතයයි සම්මතද, ඉෂ්ටවූ, කාන්තාවූ මනාපවූ රූපයෝද, ශබ්දයෝද, ගන්‍ධයෝද, රසයෝද, ස්පර්ශයෝද යන මොව්හු **ප්‍රණීත රූප** යයි කියනු ලැබේ.

මේ හීන ප්‍රණීත රූපයෝ ආරම්මණයාගේ ඉෂ්ටානිෂ්ට භාවය වශයෙන් ගත යුතු. සම්පත්තියෙන් තොරවූ හෙයින් අනිෂ්ටාලම්බන නම්. ඒ අනිෂ්ටාලම්බනය ඒකාන්ත වශයෙන් කර්ම හෙතුවෙන් හටගන්නාවූ රූපයන් අතුරෙන් අකුසල කර්ම හේතුවෙන් හටගන්නා රූපයයි. සුඛයට කාරුණු නොවන හෙයින් අකාන්තය හෙවත් නො කැමැතිය දුක්ඛයට කාරුණු වන හෙයින් අමනාපය හෙවත් මන නොවඩනු ය. එබැවින් අකුසල කර්ම සමුට්ඨාන රූප ධර්මයාගේ වශයෙන් අනිෂ්ටාලම්බනවූ පඤ්ච කාම කොට්ඨාසයෝ බෙදන ලද්දාහ කුසල කර්ම සමුට්ඨාන රූපය තෙම අනිෂ්ටාලම්බන වූවෙක් නම් නොවෙයි. කුසල කර්ම සමුට්ඨාන සියලු රූපය තෙමේ ඉෂ්ටවූ රූපය මැයි. කර්ම

සමුත්ථාන රූපයන්හි ඉෂ්ටානිෂ්ටාලම්බනත්වය යම්සේ ද, එපරිද්දෙන් උතුසමුත්ථානාදීන්හිත් ඉෂ්ටානිෂ්ටාලම්බනත්වය ඇති බව දත යුතු.

මේ ඉෂ්ටානිෂ්ටාලම්බනය විභජනය කරන ලද්දේ මධ්‍යම වූ සත්ත්වයාගේ වශයෙනි. වැඩියක් ඉසුරුමත්වූ නරේශ්වරාදීන්ගේ වශයෙන් විභජනය කරනලද්දේ නොවෙයි. ඒ ඉසුරුමතුන්හට දිව්‍යාලම්බනයක් හා සමානවූ අරමුණක් පමුන් අමනාපව වැටහෙන බැවිනි. වැඩියක් දිළිඳුවූ දුලබ බත් පැන් අහර ඇත්තාවූ සත්ත්වයන්ගේ වශයෙන් ද නොබෙදා, වදාරන ලදය ඒ දුබල බත් පැන් ඇති සත්නට කඩසහල් බත් හුළුද, කුණු මස් රසයද ඉතා මිහිරි වේද, එ හෙයිනි. හීනොත්කෘෂ්ට පුද්ගලයන්ගේ අන්තරයෙහිවූ හෙයින් මධ්‍යමවූ කිසිවිටෙක ඉෂ්ටාරම්මනයක්ද, කිසිවිටෙක අනිෂ්ටාරම්මණයක්ද ලබන්නාවූ සෙනෙවි, ඇමති, සිටු, කෙළෙඹි, වෙළඳ යනාදී පුද්ගලයන්ගේ වශයෙන් බෙදා වදාළහ මෙබඳු මධ්‍යම පුද්ගලයෝ ඉෂ්ටානිෂ්ටාලම්බනවය පිරිසිඳින්ට හැකිවන හෙයිනි ඔවුන්ට ඉෂ්ටාලම්බනය, ඉෂ්ටාලම්බනය යයිද, අනිෂ්ටාලම්බනය; අනිෂ්ටාලම්බනයයිද, ඇති සැටියෙන් ගත හැකිවේ එය එසේ වෙතත්, ඉෂ්ටාලම්බනයෙහි කුසල විපාකයත් අනිෂ්ටාලම්බනයෙහි අකුසල විපාකයත් වන්නේ යයි නිශ්චය කොට දතයුතු. ඉෂ්ටානිෂ්ටාලම්බනය විපාකයාගේ වශයෙන්ම පිරිසිඳින ලදය. ජවන්නුගේ වශයෙන් නොපිරිසිඳින ලදය. ජවනය වනාහි සංඥා විපයර්‍යාස වශයෙන් ඉෂ්ටාලම්බනයෙහිම ඇලෙයි. ඉෂ්ටාලම්බනයෙහිම කිපෙයි. අනිෂ්ටාලම්බනයෙහිම ඇලෙයි. අනිෂ්ටාලම්බනයෙහිම කිපෙයි. විපාකයාගේ වශයෙන්ම ඒ ඉෂ්ටාලම්බන අනිෂ්ටාලම්බනවය එකාන්තයෙන් පිරිසිඳින්නේය. හෙවත් විනිශ්චය කරන්නේය. විපාක වරදන්නට හෝ රවටන්නට නො හැකි වේ.

ඉටු අරමුණෙක් වේ නම්, කුසල විපාක විඥානොත්පාදය නෙම උපදනේය. අනිටු අරමුණක් වේ නම්, අකුසල විපාක

චිත්තොත්පාදය තෙම උපදනේය. මිසදිටුවෝ, බුදුන් හෝ සංඝයා හෝ, චෛත්‍ය හෝ උදාර වූ අරමුණු හෝ, දුක ඇස් පියන් නමුදු, දොම්නසට පැමිණෙත් නමුදු, දහම් දෙසන ශබ්දය අසා කන්සහළු වසත් නමුදු, එසේ වුවද, ඒ මිසදිටු-වන්ගේ ඒ චක්‍ෂුර් විඥාන සෝතවිඥානයෝ කුසල විපාක චිත්තයෝම වෙත්. ගූථභක්‍ෂක සූකර ආදී ප්‍රාණීහු අශුචි ගන්ධය ආඝ්‍රාණය කොට කන්ට ලබන්නෙමුයි හටගත් සොම්නස් ඇත්තාහු වෙත් නමුදු, ඔවුන්ගේ ඒ අශුචි දර්‍ශනයෙහි චක්‍ෂුර් විඥානයද, ඒ අශුචියගේ ගන්ධාඝ්‍රාණයෙහි ඝ්‍රාණ විඥානයද, රසාස්වාදනයෙහි ජිව්හා විඥානයද, අකුසල විපාක චිත්තයම වේ. බැද උතුම් යහනෙක්හි සයනය කරවූ සූකර තෙමේද ඉදින් මොරගසා නමුදු, එසේ වුවද, සංඥා විපර්‍යාසයෙන් ඒ සයනය කරවූ සූකරයාගේ ජවන් සිතෙහිම දොම්නස් වේදනා තොමෝ උපදී. කාය විඥාණය තෙමේ කුසල විපාකම වේ. අරමුණ ඉටු බැවිනි.

තවද ද්වාරයන්ගේ වශයෙන්ද ඉෂ්ටාලම්බන අනිෂ්ටාලම්බ-නතා තොමෝ දතයුත්තීය. සුඛස්පර්‍ශය ඇති අශුචි කර්දමය තෙමේ චක්ඛුද්වාර ඝාණද්වාරයන්හි අනිටු අරමුණක් වේ. සක්විති රජක්හුගේ මාණික්‍ය රත්නය කරණකොටගෙන තාඩනය කරනු ලබන ජනයාගේ ද, සුවර්‍ණශූලයෙහි නගාලූ ජනයාගේද, මාණික්‍යරත්න ශූලයෝ චක්‍ෂුද්වාරයෙහි ඉෂ්ටාලම්බනයෝ වෙත්. කායද්වාරයෙහි අනිෂ්ටාලම්බනයෝ වෙත්. ඉමහත්වූ දුකක් උපදවන හෙයිනි. මේ කියන ලද නයින් නියත වශයෙන් විපාකයා විසින්ම ඉෂ්ටාලම්බන අනිෂ්ටාලම්බනාවය පිරිසිඳිනු ලැබේ යයි දතයුතු.

තවද, තිරිසතුන්ගේ රූපය තෙම කෙළ පැමිණියාවූ හීන නම්. ඒ තිරිසතුන්ගේ රූපය නිසා තිරිසන් ගියවුන් අතුරෙහි නාග ගරුඬයන්ගේ රූපය තෙම ප්‍රණීත නම්. ඒ නාග ගරුඬයන්ගේ රූපය තෙමේද හීන නම් ඒ නාග ගරුඬයන්ගේ රූපය නිසා ප්‍රේතයන්ගේ රූපය තෙම

**ප්‍රණීත** නම්. ඒ ප්‍රේතයන්ගේ රූපයද **හීන** ය. ඒ ප්‍රේතයන්ගේ රූපය නිසා දනව් වැස්සන්ගේ රූපය තෙම **ප්‍රණීත** නම්. ඒ දනව්වැස්සන්ගේ රූපයද **හීන** ය. ඒ දනව් වැස්සන්ගේ රූපය නිසා ග්‍රාමභොජකයන්ගේ රූපයද **හීන** ය ඒ ග්‍රාමභොජකයන්ගේ රූපය නිසා දනව් හිමියන්ගේ රූපය තෙමේ **ප්‍රණීත** ය. ඒ දනව් හිමියන්ගේ රූපයද **හීන** ය ඒ දනව් හිමියන්ගේ රූපය නිසා ප්‍රදෙශ රජුන්ගේ රූපය තෙමේ **ප්‍රණීත** ය. ඒ ප්‍රදෙශ රජුන්ගේ රූපයද **හීන** ය. ඒ ප්‍රදෙශ රජුන්ගේ රූපය නිසා සක්විති රජහුගේ රූපය තෙමේ **ප්‍රණීත** ය. ඒ සක්විති රජහුගේ රූපය ද **හීන** ය. ඒ සක්විති රජහුගේ රූපය නිසා භූමාටු දෙවියන්ගේ රූපය තෙමේ ප්‍රණීතය. ඒ භූමාටු දෙවියන්ගේ රූපය ද **හීන** ය. ඒ භූමාටු දෙවියන්ගේ රූපය නිසා චාතුමමහාරාජික දෙව්ලොව වැසි දෙවියන්ගේ රූපය තෙමේ **ප්‍රණීත** ය ඒ චාතුමමහාරාජික දෙව්ලෝ වැසි දෙවියන්ගේ රූපයද **හීන** ය. ඒ චාතුමමහාරාජික දෙව්ලෝ වැසි දෙවියන්ගේ රූපය නිසා තව්තිසා දෙව්ලෝ වැසි දෙවියන්ගේ රූපය තෙමේ **ප්‍රණීත** ය. මෙසේ ක්‍රමයෙන් බලන කල්හි අකනිට්ඨා බඹලෝ වැසි බඹුන්ගේ වනාහි රූපය තෙමේ මුදුන් පැමිණියාවූ **ප්‍රණීත** නම්.

ඉත්ථින්ද්‍රිය ආදිකොට ඇති සූක්ෂම රූප වූ යම් ඒ අන්‍ය වූ ද ආසන්න නොවූ, ළඟ නොවූ, සමීප නොවූ, දූර වූ, ඈත වූ රූපයක් ඇත්තේද එය **දූරේ රූප** යයි කියනු ලැබේ.

චක්ඛායතනාදී වූ ඖදාරික වූ යම් ඒ අන්‍ය වූ ද, ආසන්නවූ, සමීප වූ නුදුරෙහි වූ, ඈත නොවූ රූපයක් ඇද්ද, එය **සන්තිකෙ රූප** යයි කියනු ලැබේ.

චක්ෂුප්‍රසාදදි ඖදාරික රූපයෝ දස දෙනා විඳගීනා වැඩිමට පහසු බව සලකා **ලක්ෂණ** වශයෙන් **සන්තිකෙ රූප** නම් වෙත්. පසළොස් වැදෑරුම් වූ සූක්ෂම රූපය, **ලක්ෂණ** වශයෙන් **දූරේ රූප** යයි කියනු ලැබේ.

අවකාශ වශයෙන් හෙවත් ස්ථාන වශයෙන් **සන්තිකෙ** **දූර** දක්වන්නේ මෙසේයි: දෙළොස්රියන් හෙවත් ද්වාදස හස්ත ප්‍රමාණය ඇති තැන, ශ්‍රවණොපචාරස්ථාන හෙවත් ඇසීමට සුදුසු වූ තැන වේ. ඒ ද්වාදස හස්ත ප්‍රමාණවත් ප්‍රදේශයාගේ මොබ්බෙහි ප්‍රවෘත්ත වූ රූපය තෙම **සන්තිකෙ රූප** හෙවත් ආසන්නයෙහි වූ රූප නම්. ද්වාදස හස්ත-ප්‍රමාණවත් ප්‍රදෙශයෙන් ඔබ්බෙහි ප්‍රවෘත්ත වූ රූපය තෙමේ **දූරෙ රූප** හෙවත් ඈත්හි වූ රූප නම්. ඒ සූක්ෂ්ම ඖදාරික රූපයන් අතුරෙන් සූක්ෂ්මරූපය තෙමේ දූරස්ථාන යෙහි වතුයේ ලක්ෂණ වශයෙන්ද, අවකාශ වශයෙන්ද, **දූරේ රූප** නම් වේ. ආසන්නයෙහි වතුයේ වතාහි අවකාශ හෙයින්ම **සන්තිකා රූප** නම් වේ. ලක්ෂණ වශයෙන් **සන්තිකරූප** නම් නොවේ. ඖදාරික රූපය ආසන්නයෙහි වතුයේ ලක්ෂණ වශයෙන්ද අවකාශ වශයෙන්ද **සන්තිකෙ රූප** නම් වේ. දූරස්ථානයෙහි වතුයේ අවකාශ හෙයින්ම දූරෙ රූප නම් වේ. ලක්ෂණ වශයෙන් දූරෙ රූප නොවේ.

තවත් ක්‍රමයකින්ද දූරෙ සන්තිකෙ රූප දක්වනු ලැබේ. තමාගේ රූපය තෙම **සන්තික රූප** නම්. තමාගේ කුස තුළ හොත්තාවූ ද මෙරමාගේ රූපය තෙමේ **දූරෙ රූප** නම්. තමාගේ කුස තුළ හොත් ළදරුවාගේ රූපය තෙමේ **සන්තික රූප** නම්. පිටත්හි සිටියහුගේ රූපය තෙම **දූරෙ රූප** නම්. එක් මැස්සෙක්හි හොත්ත හුගේ රූපය තෙමේ **සන්තික රූප** නම්. ආලින්දයෙන් පිටත සිටියහුගේ රූපය තෙමේ **දූරෙ රූප** නම්. පිරිවෙන් තුළ හෙවත් මළුව තුළ සිටියහුගේ රූපය තෙම **සන්තික රූප** නම්. පිරිවෙණෙන් පිටත හෙවත් මළුවෙන් පිටත සිටියහුගේ රූපය තෙම **දූරෙ රූප** නම්. සංඝාරාමා-භ්‍යන්තරයෙහි සිටියහුගේ රූප තෙමේ **සන්තික රූප** නම්. සංඝාරාමයෙන් පිටත සිටියහුගේ රූපය තෙමේ **දූරෙ රූප** නම්. ග්‍රාමක්ෂෙත්‍රය තුළ සිටියහුගේ රූපය තෙමේ **සන්තික රූප** නම්. ග්‍රාමක්ෂෙත්‍රයෙන් පිටත

සිටියහුගේ රූපය තෙමේ **දූරෙ රූප** නම්. දනව් තුළ සිටියහුගේ රූපය තෙමේ **සන්තිකෙ රූප** නම් දනව්වෙන් පිටත සිටියහුගේ රූපය තෙමේ **දූරෙ රූප** නම් රාජ්‍ය සීමාභ්‍යන්තරයෙහි සිටියහුගේ රූපය තෙමේ **සන්තිකෙ රූප** නම්. රාජ්‍ය සීමාවෙන් පිටත සිටියහුගේ රූපය තෙමේ **දූරෙ රූප** නම් සමුද්‍රාභ්‍යන්තරයෙහි සිටියහුගේ රූපය තෙමේ **සන්තිකෙ රූප** නම්. සමුද්‍රයෙන් පිටත සිටියහුගේ රූපය තෙමේ **දූරෙ රූප** නම්. චක්‍රවාලාභ්‍යන්තරයෙහි සිටියහුගේ රූපය තෙමේ **සන්තිකෙ රූප** නම්. චක්‍රවාලයෙන් පිටත සිටියහුගේ රූපය තෙමේ **දූරෙ රූප** නම්.

## වෙදනාස්කන්ධය

අතීත වූ ද, අනාගත වූ ද, ප්‍රත්‍යුත්පන්න වූ ද, අධ්‍යාත්මික වූ ද, බාහිර වූ ද, ඖදාරික වූ ද, සූක්ෂම වූ ද, හීන වූ ද, ප්‍රණීත වූ දූරෙ වූ ද, සන්තික වූ ද යම් සුඛ දුක්ඛ උපෙක්ඛාදි වශයෙන් චාතුර්භූමික වෙදනාවක් වේ නම් එය එකතුකොට ඇති, රැස්කොට ඇති, පිඬුකොට ඇති ඒ වෙදනාවෝ **වෙදනාස්කන්ධය** යයි කියනු ලැබේ.

මේ ත්‍රිවිධ වෙදනාවන් අතුරෙන් **සුඛ වෙදනා** තොමෝ **කායිකවූ සුඛ වෙදනාය, මානසික වූ සුඛ වෙදනාය** කියා විප්‍රකාර වේ. **දුක්ඛ වෙදනාවද** එසේම **කායික වූ දුක්ඛ වෙදනාය, මානසික දුක්ඛ වෙදනා** යයි විප්‍රකාර වේ. **උපෙක්ඛා** හෙවත් **අදුක්ඛමසුඛ වෙදනා** තොමෝ චනාහි චක්ෂුරාදි වූ ප්‍රසාද කායයන් සඳහා උපචාර වශයෙන් **කායික අදුක්ඛමසුඛ වෙදනා ය, මානසික අදුක්ඛමසුඛ වෙදනා** යයි විප්‍රකාර වේ.

සුඛ සහගත කාය විඥානය සමග පැවැති වෙදනාව **කායික සුඛ වෙදනා** නම් වේ.

සුඛ සහගත කාය විඥානයෙන් අන්‍ය වූ සොමනස්ස සහගත දෙසැට සිත් සමග පැවති වෙදනාව **මානසික සුඛ වෙදනාව** නම් වේ.

දුක්ඛ සහගත කාය විඥානය සමග පැවැති වේදනාව **කායික දුක්ඛ වේදනා** නම් වේ.

ද්වේෂ මූල සිත් දෙක සමග පැවති වේදනාව **මානසික දුක්ඛ වේදනා** නම් වේ.

චක්ෂුප්‍රසාද, සෝතප්‍රසාද, ඝ්‍රාණප්‍රසාද, ජිව්හා ප්‍රසාද යන චතුර්විධ ප්‍රසාද රූපයන් ආශ්‍රයකොට උපදනා චක්ෂුර්විඥාන, සෝත විඥාන, ඝ්‍රාණ විඥාන, ජිව්හා විඥාන යන චතුර්විධ චිත්තයන් සමග පැවැති වේදනාව ස්ථානෝපචාර වශයෙන් ගෙන **කායික අදුක්ඛම සුඛ වේදනා** යයි කියනු ලැබේ.

චතුර්විධ වූ චක්ෂුර් විඥානාදීන් හැර ඉතිරි එක් පනසක් වූ උපෙක්ඛා සහගත සිත්හි පැවති අදුක්ඛමසුඛ වේදනා තොමෝ **මානසික අදුක්ඛමසුඛ වේදනා** යයි කියනු ලැබේ.

ඒ වේදනාවන් අතුරෙන් සියළුම කායිකවූ හෙවත් ප්‍රසාද රූපයන් ඇසුරුකොට පවත්නාවූ සුඛ දුක්ඛ උපෙක්ඛා වේදනාවෝ තුමූ කාමාවචරයහ.

මානසික වූ දුක්ඛ වේදනාවෝද එසේම කාමාවචරයහ.

මානසික වූ සුඛ වේදනාතොමෝ කාම, රූප, ලෝකෝත්තර යන ත්‍රිවිධ භූමියෙහි පර්‍යාපන්න හෙයින් ත්‍රෛභූමිකය

අදුක්ඛමසුඛ වේදනාතොමෝ චාතුර්භූමිකය.

**අතීතවූ වේදනාව** — යම් වේදනාවක් පසුගිය කාලයට අයත්වූයේ ද, නිරුද්ධවූයේ ද, පහව ගියේ ද, වෙනසකට පත්වූයේ ද, අස්තයට ගියේද, විනාශ වූයේ ද, ඉපිද පහව ගියේද, පසු වූයේ ද, පසුවීම් කොටස් වශයෙන් ගණන් ගැණුනේද, එබඳුවූ සුඛ වේදනා, දුක්ඛ වේදනා, අදුක්ඛමසුඛ වේදනා තුමූ **අතීත වේදනා** යයි කියනු ලැබේ.

**අනාගතවූ වෙදනාව** — යම් වේදනාවක් ඇති නොවූයේද, නොවූයේද, හට නොගත්තේද, නූපන්නේද, පහළ නොවූයේ ද, අපාතුභූතද, අනුප්පන්නද. අසමුප්පන්නද, අනුට්ඨිතද, අසමුට්ඨිතද, අනාගත කොටස් වශයෙන් ගණන් ගැණුනේද, එබඳු වූ සුඛ වෙදනා, දුක්ඛ වෙදනා, අදුක්ඛමසුඛ වෙදනාතුමූ **අනාගත වෙදනා** යයි කියනු ලැබේ.

**ප්‍රත්‍යුත්පන්න වෙදනාව**—යම් වෙදනාවක් ඇතිවූයේද, හටගත්තේද, උපන්නේද, පහළවූයේද, පාතුභූතද, උප්පන්නද, සමුප්පන්නද, උට්ඨිතද, සමුට්ඨිතද, වර්‍තමාන වූයේද, වර්‍තමාන කොටස් වශයෙන් ගණන් ගැණුනේද, එබඳුවූ සුඛ වෙදනා, දුක්ඛ වෙදනා, අදුක්ඛමසුඛ වෙදනා තුමූ **ප්‍රත්‍යුත්පන්න වෙදනා** යයි කියනු ලැබේ.

සියළු ප්‍රභෙද ඇත්තාවූ ඒ වෙදනාවගේ සන්තති වශයෙන්ද හෙවත් පෙළ සැදී පැවතුම් වශයෙන්ද, ක්‍ෂණාදීන්ගේ වශයෙන්ද අතීතාදී භාවය තෙම දත යුත්තේය. ඒ සන්තති ක්‍ෂණාදීන් අතුරෙහි සන්තති වශයෙන් එක් චිත්ත විථියක, එක් ජවන වාරයක, එක් සමාපත්තියෙක ඇතුළත්වූ ද, එක් ඍතුක්‍ෂණාවස්ථාවක් ඇති ආලම්බනයෙහි නැවත නැවත යෙදීමෙන් පැවැත්තා-වූද, වෙදනා තොමෝ **ප්‍රත්‍යුත්පන්න වෙදනා** නම් වේ. ඉන් මත්තෙහි උපන් වෙදනාවෝ **අතීත වෙදනා** නම් වෙ. පසුව උපදින්නාවූ වෙදනා තොමෝ **අනාගත වෙදනා** නම් වේ.

ක්‍ෂණාදීන්ගේ වශයෙන් කුඩා ක්‍ෂණත්‍රයට ඇතුළත්වූ පූර්‍ව, අපර, මධ්‍ය කොට්ඨාසත්‍රයෙහිවූද, තමා අයත් කිසද කරන්නාවූ වෙදනා තොමෝ **ප්‍රත්‍යුත්පන්න වෙදනා** නම් වේ. එයින් පූර්‍වයෙහි උපන් වෙදනා තොමෝ **අතීත වෙදනා** නම් වේ. එයින් පසුව උපදින්නාවූ වෙදනා තොමෝ **අනාගත වෙදනා** නම් වේ.

මානසික වූ සුඛවේදනාව **ත්‍රෛභූමික යයි** යට දක්වන ලදි. සොමනස්ස සහගත අකුසල් සිත් සතරද, සොමනස්ස සහගත මහා කුසල් සිත් සතරද, සොමනස්ස සහගත මහා ක්‍රියා සිත් සතරද, සොමනස්ස සහගත සෝතාපත්ති මාර්ග චිත්තයන් හැර, සොමනස්ස සහගත ලෝකෝත්තර සිත්ද, අරූප භූමියෙහි පවත්නා නමුදු, කාමාවචර, ලෝකෝත්තර ව්‍යවහාරය අත්නොහරින හෙයින් අරූප භූමිය අත්හැර **ත්‍රෛභූමික** යයි වදාළ බව දතයුතු.

**අධ්‍යාත්මික වේදනාව**— යම් වේදනාවක් ඒ ඒ සත්ත්වයන්ගේ චිත්ත පරම්පරාගත ද, තමා පිළිබඳ ද. ඒ ඒ පුද්ගලයන්ට වෙන් වෙන් වශයෙන් අයත්ද, ස්වකීයද, සමානව ලැබුනේද, තමාගේ යයි සිතා ගත්තේද එබඳු වූ සුඛ වේදනා, දුක්ඛ වේදනා, අදුක්ඛමසුඛ වේදනා තොමෝ **අධ්‍යාත්මික වේදනා** යයි කියනු ලැබේ.

**බාහිර වේදනාව**— යම් වේදනාවක් ඒ ඒ අන්‍යවූ සත්ත්වයන්ගේ අන්‍යවූ පුද්ගලයන්ගේ චිත්ත පරම්පරාගතද, ඔහු පිළිබඳ ද, ඒ ඒ පුද්ගලයන්ට වෙන් වෙන් වශයෙන් අයත්ද, ස්වකීයද, සමානව ලැබුනේද, ඔහු පිළිබඳ යයි සිතා ගත්තේද, එබඳු වූ සුඛ වේදනා, දුක්ඛ වේදනා, අදුක්ඛමසුඛ වේදනා තොමෝ **බාහිර වේදනා** යයි කියනු ලැබේ.

**ඖදාරික වේදනාව සහ සූක්ෂම වේදනාව**—

අකුසල වේදනාව ඖදාරිකය. කුසල අව්‍යාකෘත වේදනාව සූක්ෂමය.

කුසල් වූ ද, අකුසල් වූ ද වේදනාව ඖදාරිකය අව්‍යාකෘත වේදනාව සූක්ෂම ය.

දුක්ඛ වේදනාව ඖදාරිකය. සුඛ වේදනාවද අදුක්ඛමසුඛ වේදනාව ද සූක්ෂම ය.

සුඛදුක්ඛ වෙදනාවෝ ඖදාරිකය. අදුක්ඛමසුඛ වෙදනාව සූක්ෂම ය.

සත්සුන් නොවූවහුගේ වෙදනාව ඖදාරිකය. සත්හුන් වූවහුගේ වෙදනාව සූක්ෂම ය.

කෙලෙස් සහිත වූවහුගේ වෙදනාව ඖදාරිකය. කෙලෙස් රහිතවූවහුගේ වෙදනාව සූක්ෂම ය.

ඒ ඒ වෙදනාවකට සමානකොට ගත් වෙදනා ඖදාරික සුඛුම වශයෙන් ගතයුතු.

මෙකී වෙදනාවන් අතුරෙන්, අකුසල වෙදනාවෝ තුමූ කෙලශාග්නි සන්තාපය හා සම්ප්‍රයුක්ත වන අර්ථයෙන් ද දුක්වූ විපාකයන් එලවන අර්ථයෙන්ද ඖදාරිකය හ. කුසල වෙදනාවෝ තුමූ, කෙලශාග්නි සන්තාපයෙන් ඉවත්වූ අර්ථයෙන්ද, සැප විපාක එලවන අර්ථයෙන්ද සූක්ෂමය හ. අව්‍යාකෘත වෙදනා තොමෝ කාය කර්මාදි ව්‍යාපාර රහිත අර්ථයෙන්ද, විපාකයන් ගෙන නොදෙන අර්ථයෙන්ද, සූක්ෂමය හ.

කුසලාකුසල වෙදනාවෝ තුමූ කාය කර්මාදී ව්‍යාපාර සහිත අර්ථයෙන් ද, විපාකයන් ගෙනදෙන අර්ථයෙන් ද, නොහොත් තමා සතුවූ විපාක ඇති අර්ථයෙන් ද ඖදාරිකයහ. අව්‍යාකෘතවූ වෙදනාවෝ තුමූ දටකී නයින්ම සූක්ෂමය හ.

දුක්ඛ වෙදනා තොමෝ, සුඛ වෙදනාවට විපක්ෂවූ අමධුර, අනිෂ්ට අර්ථයෙන් ද, දුක්ඛාර්ථයෙන් ද ඖදාරිකය. සුඛ වෙදනාවෝ ආස්වාදනාර්ථයෙන්ද, සැප එලවන අර්ථයෙන්ද සූක්ෂමයහ. අදුක්ඛමසුඛ වෙදනා තොමෝ ශාන්තවූ අර්ථයෙන්ද, ප්‍රණීතවූ අර්ථයෙන්ද සූක්ෂමයහ.

සුඛ දුක්ඛ වේදනාවෝ තුමූ, කළඹන අර්ථයෙන් ද, සප්රණාර්ථයෙන් ද, ඖදාරිකය. අදුක්ඛම සුඛ වේදනා තොමෝ ශාන්ත වූ අර්ථයෙන් ද, ප්‍රණීත වූ අර්ථයෙන් ද සූක්ෂමයහ.

සත්හුත් නොවූ හෙවත් සමවතුන් සම නොවන පුද්ගලයාගේ වේදනා තොමෝ අනෙකවිධ වූ ආලම්බනයෙහි වික්ෂිප්ත භාවය හෙතුකොටගෙන ඖදාරිකයහ සත්හුත් හෙවත් සමවතුන් සමවත් පුද්ගලයාගේ වේදනා තොමෝ එම සවභාව ඇති අරමුණෙක්හිම, අරමුණු කිරීම් වශයෙන් පවත්නා හෙයින් සූක්ෂමයහ.

කෙලෙස් සහිත හෙවත් ආශ්‍රව ධර්මයන්ට අරමුණු වූ වේදනා තොමෝ ආශ්‍රවයන්ගේ හටගැනීමට කරුණු වන හෙයින් ඖදාරිකය ආශ්‍රව ධර්මයන්ට අරමුණු නොවූ වේදනා තොමෝ, කියනලද සාශ්‍රව වේදනාවට විපක්ෂ වශයෙන් සූක්ෂමයහ.

නවද, අකුසල වේදනාවෝ, ලොභ සහගත, ද්වේෂ සහගත යයි ද්විප්‍රකාර වේ ඒ දෙදෙනා අතුරෙන් ද්වේෂය සමග පැවති අකුසල වේදනා තොමෝ ඖදාරිකය ලොභය හා එක්ව පැවති වේදනා තොමෝ සූක්ෂමයහ.

ද්වේෂ සහගත වේදනාව ද, නියත වේදනා; අනියත වේදනා යයි ද්විවිධ වේ. පඤ්චානන්තර්‍ය කර්මයන් සම්බන්ධවූ ද්වේෂය සමග පැවැති වේදනාව නියතය ආනන්තර්‍ය කර්මයන් කෙරෙන් අන්‍යවූ ප්‍රාණඝාත කර්මයන් සම්බන්ධවූ ද්වේෂය සමග පවත්නා වේදනාව අනියතය. ඒ දෙදෙනා අතුරෙන් නියත වේදනා තොමෝ ඖදාරකය. අනියත වේදනා තොමෝ සූක්ෂමයහ.

නියත වේදනා තොමෝද, කල්පස්ථායිකවූ හෙවත් කල්පයක් මුළුඳ අවීචිනරකයෙහි දුක් විඳීමට නිසිවූ නියත වේදනාය, කල්පස්ථායික නොවූ හෙවත් කල්පයක් මුළුඳ අවීචි නරකයෙහි දුක් විඳීමට නොනිසිවූ නියත වේදනාය

කියා විවිධ වේ. එ දෙදෙනා අතුරෙන් කල්පස්ථායික වූ නියත වේදනා තොමෝ ඖදාරිකය, කල්පස්ථායික නො වූ නියත වේදනා තොමෝ සූක්ෂමය හ. මෙහි සංඝභේද කර්මය සම්බන්ධ වූ නියත වේදනාව කල්පස්ථායි වේදනාව යයි ද, සඞ්ඝභේද කර්මයෙන් අන්‍යවූ ආනන්තර්‍ය්‍ය කර්මයන් සම්බන්ධවූ නියත වේදනාව අකල්පස්ථායික වේදනාව යයිද දත යුතු.

කල්පස්ථිතික වේදනාවද, අසඞ්ඛාරික, සසඞ්ඛාරික වශයෙන් විවිධ වේ එයින් අසඞ්ඛාරික කල්පස්ථායික වේදනා තොමෝ ඖදාරිකය. සසඞ්ඛාරික කල්පස්ථායික වේදනා තොමෝ සූක්ෂමය හ.

ලෝභය හා එක්ව පැවති වේදනා තොමෝද, දිට්ඨි සම්පයුත්ත, දිට්ඨි විප්පයුත්ත යයි විවිධ වේ. එයින් මිථ්‍යාදෘෂ්ටිය හා සමග පැවති වේදනා තොමෝ ඖදාරිකය මිථ්‍යාදෘෂ්ටිය හා සමග නොපැවති වේදනා තොමෝ සූක්ෂමය හ.

දිට්ඨිසම්පයුත්ත වේදනා තොමෝද, නියත මිථ්‍යා දිට්ඨිය හා එක්ව පැවති වේදනාය, අනියත මිථ්‍ය දිට්ඨිය හා එක්ව පැවති වේදනා යයි විවිධ වේ. එයින් නියත දිට්ඨිසම්ප්‍රයුක්ත වේදනා තොමෝ ඖදාරිකය. අනියත දිට්ඨි සම්ප්‍රයුක්ත වේදනා තොමෝ සූක්ෂමය හ.

ඒ නියත මිථ්‍යා දිට්ඨිය හා පැවති වේදනා තොමෝ ද, අසඞ්ඛාරික, සසඞ්ඛාරික නියත දිට්ඨි සම්පයුක්ත වේදනා වශයෙන් විවිධ වේ එයින් අසංඛාරික වේදනාව ඖදාරිකය. සසඞ්ඛාරික වේදනාව සූක්ෂමය හ.

සංක්ෂෙපයෙන් පාප පක්ෂය කරා පැමිණි යම් වේදනා වක් තොමෝ බොහෝ වූ විපාක දේද, ඒ වේදනා තොමෝ ඖදාරිකය. යම් වේදනාවක් තොමෝ ස්වල්ප විපාක දේද, ඒ වේදනා තොමෝ සූක්ෂමය හ.

කුසල පක්ෂයට පැමිණ ස්වල්ප විපාකයක් ගෙන දෙන්නාවූ වේදනා තොමෝ ඖදාරිකය. බොහෝ වූ විපාකයන් ගෙන දෙන්නා වූ වේදනා තොමෝ සූක්ෂ්මය හ.

සිව් වැදෑරුම් වූ කුසලයෙහි, කාමාවචර කුසල වේදනා තොමෝ ඖදාරිකය රූපාවචර කුසල වේදනා තොමෝ සූක්ෂ්මය හ.

ඒ රූපාවචර කුසල වේදනා තොමෝද ඖදාරිකය. අරූපාවචර කුසල වේදනා තොමෝ සූක්ෂ්මය හ.

ඒ අරූපාවචර කුසල වේදනා තොමෝද ඖදාරිකය. ලොකොත්තර කුසල වේදනා තොමෝ සූක්ෂ්ම ය.

භෙද වශයෙන් වනාහි, කාමාවචර වේදනා තොමෝ දානමය සීලමය භාවනාමය වේදනාවන් ගේ වශයෙන් ත්‍රිවිධ වේ. ඒ ත්‍රිවිධ වේදනාවන් අතුරෙන් දානමය වූ වේදනා තොමෝ ඖදාරිකය. සීලමය වූ වේදනා තොමෝ සූක්ෂ්මය හ ඒ සීලමය වේදනා තොමෝ ද ඖදාරිකය. භාවනාමය වූ වේදනා තොමෝ සූක්ෂ්මය හ.

ඒ භාවනාමය වූ වේදනා තොමෝද, ද්විහෙතුක වේදනාය, ත්‍රිහෙතුක වේදනා යයි ද්විවිධ වේ. ඔවුන් අතුරෙන් ද්විහෙතුක වූ වේදනා තොමෝ ඖදාරිකය. ත්‍රිහෙතුක වූ වේදනා තොමෝ සූක්ෂ්මය හ.

ඒ ත්‍රිහෙතුක වේදනා තොමෝද සසඞ්ඛාරික, අසඞ්ඛාරික වශයෙන් ද්විවිධ වේ. එයින් සසඞ්ඛාරික වූ වේදනා තොමෝ ඖදාරිකය. අසඞ්ඛාරික වූ වේදනා තොමෝ සූක්ෂ්මයහ.

රූපාවචර භූමියෙහි, ප්‍රථමධ්‍යාන කුසල වේදනා තොමෝ ඖදාරිකය. ද්විතියධ්‍යාන කුසල වේදනා තොමෝ සූක්ෂ්මය හ. ඒ ද්විතියධ්‍යාන කුසල වේදනා තොමෝ ද ඖදාරිකය. තෘතියධ්‍යාන කුසල වේදනා තොමෝ සූක්ෂ්මය හ,

ඒ තෘතීයධ්‍යාන කුසල වේදනා තොමෝද ඖදාරිකය, චතුර්ථධ්‍යාන කුසල වේදනා තොමෝ සූක්ෂ්මය හ, ඒ චතුර්ථධ්‍යාන කුසල වේදනා තොමෝද ඖදාරිකය, **අරූපාවචර භූමියෙහි** ආකාසානඤ්චායතන කුසල වේදනා තොමෝ සූක්ෂ්මය හ. ආකාසානඤ්චායතන කුසල වේදනා තොමෝද ඖදාරිකය. විඤ්ඤාණඤ්චායතන කුසල වේදනා තොමෝ සූක්ෂ්මය හ. විඤ්ඤාණඤ්චායතන කුසල වේදනා තොමෝද ඖදාරිකය. ආකිඤ්චඤ්ඤායතන කුසල වේදනා තොමෝ සූක්ෂ්මය හ. ආකිඤ්චඤ්ඤායතන කුසල වේදනා තොමෝ ද, ඖදාරිකය. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන වේදනා තොමෝ සූක්ෂ්මය හ.

ඒ නෙවසඤ්ඤා නාසඤ්ඤායතන වේදනා තොමෝද ඖදාරිකය. විදර්ශනාව හා සමග උපන් වේදනා තොමෝ සූක්ෂ්මය. විදර්ශනාව හා සමග උපන් වේදනා තොමෝද ඖදාරිකය. **ලෝකෝත්තර භූමියෙහි** ශ්‍රොතාපත්ති මාර්ගය හා සමග උපන් වේදනා තොමෝ සූක්ෂ්මය හ. ඒ සොතාපත්ති මාර්ගය හා සමග උපන් වේදනා තොමෝද ඖදාරිකය. සකෘදාගාමි මාර්ගය හා සමග උපන් වේදනා තොමෝ සූක්ෂමය හ. ඒ සකෘදාගාමි මාර්ගය හා සමග උපන් වේදනා තොමෝද ඖදාරිකය. අනාගාමි මාර්ගය හා සමග උපන් වේදනා තොමෝ සූක්ෂමය හ. ඒ අනාගාමි මාර්ගය හා සමග උපන් වේදනා තොමෝද ඖදාරිකය. අරහත්තමාර්ගය හා සමග උපන් වේදනා තොමෝ සූක්ෂ්මය හ.

සිව්වැදෑරුම්වූ විපාකයෙහි කාමාවචර විපාක වේදනා තොමෝ ඖදාරිකය. රූපාවචර විපාක වේදනා තොමෝ සූක්ෂ්මයහ. රූපාවචර විපාක වේදනා තොමෝ ඖදාරිකය. අරූපාවචර විපාක වේදනා තොමෝ සූක්ෂ්මය හ. ඒ අරූපාවචර විපාක වේදනා තොමෝද ඖදාරිකය. ලෝකෝත්තරවිපාක වේදනාතොමෝ සූක්ෂ්මය හ.

හෙද වශයෙන් වනාහි, කමාවචර විපාකයෝ අහෙතුක විපාක, සහෙතුක විපාක යයි විවිධ වේ. ඔවුන් අතුරෙන් අහෙතුක කාමාවචර විපාක වේදනා තොමෝ ඖදාරිකය. සහෙතුක කාමාවචර විපාක වේදනා තොමෝ සූක්ෂ්මය හ.

ඒ සහෙතුක කාමාවචර විපාක වෙදනා තොමෝද විහෙතුක, ත්‍රිහෙතුක වශයෙන් විවිධ වේ. ඔවුන් අතුරෙන් විහෙතුක කාමාවචර විපාක වෙදනා තොමෝ ඖදාරිකය. ත්‍රිහෙතුක කාමාවචර විපාක වෙදනා තොමෝ සූක්ෂ්මය හ.

ඒ ත්‍රිහෙතුක කාමාවචර විපාක වෙදනා තොමෝද සසඞ්ඛාරික, අසඞ්ඛාරික විශයෙන් විවිධ වේ. ඔවුන් අතුරෙන් සසඞ්ඛාරික ත්‍රිහෙතුක කාමාවචර විපාක වෙදනා තොමෝ ඖදාරිකය. අසඞ්ඛාරික ත්‍රිහෙතුක කාමාවචර විපාක වෙදනා තොමෝ සූක්ෂ්මය හ.

එමෙන් ම ප්‍රථමධ්‍යාන විපාක වෙදනා තොමෝ ඖදාරිකය. ද්‍විතියධ්‍යාන විපාක වෙදනා තොමෝ සූක්ෂ්මය හ. ද්‍විතියධ්‍යාන විපාක වෙදනා තොමෝ ඖදාරිකය. තෘතියධ්‍යාන විපාක වෙදනා තොමෝ සූක්ෂ්මය හ. තෘතියධ්‍යාන විපාක වෙදනා තොමෝද ඖදාරිකය. චතුර්ථධ්‍යාන විපාක වෙදනා තොමෝ සූක්ෂ්මය හ. ඒ චතුර්ථධ්‍යාන විපාක වෙදනා තොමෝ ද ඖදාරිකය. ආකාසානඤ්චායතන විපාක වෙදනා තොමෝ සූක්ෂ්මය. මේ ක්‍රමයෙන් අරූපාවචර විපාක වෙදනාවන්ගේ ඖදාරික සුඛුම භාවයද, පිළිවෙළින් සතර ලොකොත්තර ඵලයන් ගේ ඖදාරික සුඛුම භාවයද දතයුතු.

ත්‍රිවිධ ක්‍රියා වෙදනාවන් අතරෙන් කාමාවචර ක්‍රියා වෙදනා තොමෝ ඖදාරිකය. රූපාවචර ක්‍රියා වෙදනා තොමෝ සූක්ෂ්මය හ. රූපාවචර ක්‍රියා වෙදනා තෙමෝද ඖදාරිකය. අරූපාවචර ක්‍රියා වෙදනා තොමෝ සූක්ෂ්මය හ.

කාමාවචර ක්‍රියා වෙදනාවන් අතුරෙන් අහෙතුක ක්‍රියා වෙදනා තොමෝ ඖදාරිකය. සහෙතුක ක්‍රියා වෙදනා තොමෝ සූක්ෂ්මය හ. ඒ සහෙතුක ක්‍රියා වෙදනා අතුරෙන් විහෙතුක ක්‍රියා වෙදනා තොමෝ ඖදාරිකය. ත්‍රිහෙතුක

ක්‍රියා වේදනා තොමෝ සූක්ෂ්මය හ. ත්‍රිහෙතුක කාමාවචර ක්‍රියා වේදනාවන් අතුරෙන් ද සසඞ්ඛාරික ක්‍රියා වේදනා තොමෝ ඖදාරිකය. අසඞ්ඛාරික ක්‍රියා වේදනා තොමෝ සූක්ෂ්මය හ. ප්‍රථමධ්‍යාන ක්‍රියා වේදනා තොමෝ ඖදාරිකය. ද්විතීයධ්‍යාන ක්‍රියා වේදනා තොමෝ සූක්ෂ්මය. මේ ක්‍රමයෙන් රූපාවචර අරූපාවචර ක්‍රියා වේදනාවන්ගේ ඖදාරික සුඛුම භාවය දතයුතු.

**හීන වේදනාව හා ප්‍රණීත වේදනාව**— අකුසල වේදනාව හීනය. කුසල අව්‍යාකෘත වේදනාව ප්‍රණීතය. කුසල් වූද, අකුසල් වූද වේදනාව හීනය. අව්‍යාකෘත වේදනාව ප්‍රණීතය. දුක්වූ වේදනාව හීනය, සුඛ වේදනාව සහ අදුක්ඛමසුඛ වේදනාව ප්‍රණීතය සැපවූද දුක්වූද වේදනා හීනය. අදුක්ඛමසුඛ වේදනාව ප්‍රණීතය. සත්හුන් නොවූවහුගේ වේදනාව හීනය. සත්හුන්වූවහුගේ වේදනාව ප්‍රණීතය කෙලෙස් සහිත වේදනාව හීනය කෙලෙස් රහිත වේදනාව ප්‍රණීතයහ. ඒ ඒ වේදනාවක් හා සමාන කොට හීන ප්‍රණීත වේදනා දතයුතු.

සංක්ෂෙපයෙන් වනාහි යම් වේදනාවක් තොමෝ ඖදාරිකද, ඒ වේදනා තොමෝ හීනය. යම් වේදනාවක් තොමෝ සූක්ෂ්ම වේද, ඒ වේදනා තොමෝ ප්‍රණීතය.

**දූරෙ හෙවත් දුරෙහිවූ වේදනාව**— අකුසල වේදනාව කුසල අව්‍යාකෘත වේදනාවලින් දුරය. කුසල අව්‍යාකෘත වේදනාවෝ අකුසල වේදනාවෙන් දුරය. කුසල වේදනාව අකුසල අව්‍යාකෘත වේදනාවලින් දුරය. අකුසල අව්‍යාකෘත වේදනාවෝ කුසල වේදනාවෙන් දුරය. අව්‍යාකෘත වේදනාව කුසල් වූද, අකුසල් වූද, වේදනාවන්ගෙන් දුරය. කුසල් වූද අකුසල් වූද වේදනාවෝ අව්‍යාකෘත වේදනාවෙන් දුරය. දුක් වූ වේදනාව, සැප වූද, අදුක්ඛමසුඛ වූද වේදනාවන් ගෙන් දුරය. සැප වූද, අදුක්ඛමසුඛ වූද වේදනාවෝ දුක් වූ වේදනාවෙන් දුරය. සැප වේදනාව දුක් වූද, අදුක්ඛමසුඛ වූද වේදනාවන්ගෙන් දුරය. දුක් වූද, අදුක්ඛමසුඛ වූද,

වේදනාවෝ සැප වේදනාවෙන් දුරය. අදුක්ඛමසුඛ වේදනාව සැප හා දුක් ඇති වේදනාවන්ගෙන් දුරය. සැප හා දුක් ඇති වේදනාවෝ සුව දුක් නොවන්නා වූ වේදනාවෙන් දුරය. සත්හුන් නොවූවහුගේ වේදනාව සත්හුන් වූවහුගේ වේදනාවෙන් දුරය. සත්හුන් වූවහුගේ වේදනාව සත්හුන් නොවූවහුගේ වේදනාවෙන් දුරය. කෙලෙස් සහිත වේදනාව කෙලෙස් රහිත වේදනාවෙන් දුරය. කෙලෙස් රහිත වේදනාව කෙලෙස් සහිත වේදනාවෙන් දුරය. මෙය දුරෙහි වූ වේදනාවයයි කියනු ලැබේ.

අකුසල වේදනා තොමෝ විසභාගාර්ථයෙන් හෙවත් අසමාන කොටස්‍යවත් වූ අර්ථයෙන් ද, විසංසට්ඨ හෙවත් අසමාන සවභාව නොහොත් අසමාන කෘත්‍යවත් වූ අර්ථයෙන්ද, කුසලවේදනා අව්‍යාකෘත වේදනා කෙරෙන් දුරෙ වේදනාවන බව දතයුතු. අතිකුදු දූර භාවය මේ නයින්ම දතයුතු.

අකුසලාදි වේදනාවන් හා සමන්විතවූ පුද්ගලයෝ තුමූද, තුන් තුන් දෙන එක මැස්සෙක්හි හුන්නාහු වෙද්ද, එසේවී තමුන් ඒ පුද්ගලයන්ගේද ඒ වේදනාවෝ තුමූ අසමාන කොටස්‍යවත්වූ අර්ථයෙන්ද, අසමාන කෘත්‍යවත්වූ නොහොත් අසමාන සවභාව වූ අර්ථයෙන්ද දූර වේදනාවෝ නම් වෙත්. සමවතට සමවත් වේදනාදියෙන් සමන්විත වූ පුද්ගලයන් කෙරෙහිද මෙකී නය බඳු නය ඇත්තේය.

**සන්තිකෙ වේදනා හෙවත් ළඟවූ වේදනාව**— අකුසල වේදනාව, අකුසල වේදනාවට ළඟය. කුසල වේදනාව, කුසල වේදනාවට ළඟය. දුක්වූ වේදනාව දුක්වූ වේදනාවට ළඟය. සැප වේදනාව සැප වේදනාවට ළඟය. අදුක්ඛමසුඛ වේදනාව අදුක්ඛමසුඛ වේදනාවට ළඟය. සත්හුන් නොවූවහුගේ වේදනාව සත්හුන් නොවූවහුගේ වේදනාවට ළඟය. සත්හුන් වූවහුගේ වේදනාව, සත්හුන් වූවහුගේ වේදනාවට ළඟය. කෙලෙස් සහිත වේදනාව කෙලෙස් සහිත වේදනාවට ළඟය. කෙලෙස් රහිත වේදනාව,

කෙලෙස් රහිත වේදනාවට ලඟය, මෙය ළඟවූ හෙවත් **සන්තිකෙ වේදනාව** යයි කියනු ලැබේ. ඒ ඒ වේදනාවක් හෝ සමකොට බලා දුරෙහි වූ ලඟවූ වේදනා දතයුතු.

අකුසල වේදනා තොමෝ වනාහි අකුසල වේදනාව හා සභාග හෙවත් සමාන කොට්ඨාසවත්වූ අර්ථයෙන්ද, සමාන කෘත්‍යවත්වූ අර්ථයෙන්ද, නොහොත් සමාන සවභාව වූ අර්ථයෙන්ද, **සන්තිකෙ වේදනා** නම් වේ. මෙකී නයින් සන්තික නාවය හෙවත් ආසන්න නාවය දත යුතු.

මෙහි තුන් තුන් දෙනා නම්:

(1) අකුසල වේදනා සමන්විත එකෙක, දුක්ඛ වේදනා සමන්විත එකෙක, සුඛ වේදනා සමන්විත එකෙ කැයි තිදෙනෙකි.

(2) අකුසල වේදනා සමන්විත එකෙක, කුසල වේදනා සමන්විත එකෙක, දුක්ඛ වේදනා සමන්විත එකෙකැයි තිදෙනෙකි.

(3) අකුසල වේදනා සමන්විත එකෙක, කුසල වේදනා සමන්විත එකෙක. සුඛ වේදනා සමන්විත එකෙකැයි තිදෙනෙකි.

අකුසල වේදනාවෙන් සමන්විත වූ තුන් දෙනෙකුන් අතුරෙහි එක් පුද්ගලයෙක් කාම භවයෙහිද, එක් පුද්ගල යෙක් රූප භවයෙහිද, එක් පුද්ගලයෙක් අරූප භවයෙහිද සිටි නමුත්, ඒ පුද්ගලයන්ගේද අකුසල වේදනාවෝ තුමූ සමාන සවභාව වූ අර්ථයෙන්ද සමානකෘත්‍යවත්වූ අර්ථයෙන් ද, ආසන්නයෙහි ම වූවාහු ම වෙත්. කුසල වේදනාදීන් සමන්විත පුද්ගලයන් කෙරෙහි ද මෙකී නය බඳු නය ඇත්තේය.

මෙසේ මේ එකොළොස් තන්හි පිහිටි සියළුම වේදනාවෝ එක්කොට පිඩුකොට **වේදනාසකන්ධය** යයි වදාළ සේක.

## සඤ්ඤාස්කන්ධය

අතීතවූ ද, අනාගතවූ ද, ප්‍රත්‍යුත්පන්නවූ ද, අධ්‍යාත්මික වූ ද, බාහිරවූ ද, ඖදාරිකවූ ද, සූක්ෂමවූ ද, හීනවූ ද, ප්‍රණීත වූ ද, දූරෙහිවූ ද, සන්තිකෙවූ ද යම් චාතුර්භූමිත්හි වූ සංඥා වෙක් වේද එය එකතුකොට ඇති, රැස්කොට ඇති, පිඩු කොට ඇති ඒ සංඥාවෝ **සඤ්ඤාස්කන්ධය** යයි කියනු ලැබේ. මේ **සංඥාවෝ** ෂඩ්විධ වේ. එනම්:–

1. **චක්ඛු සම්ඵස්සජා සඤ්ඤා**
2. **සොත සම්ඵස්සජා සඤ්ඤා**
3. **ඝාණ සම්ඵස්සජා සඤ්ඤා**
4. **ජිව්හා සම්ඵස්සජා සඤ්ඤා**
5. **කාය සම්ඵස්සජා සඤ්ඤා**
6. **මනො සම්ඵස්සජා සඤ්ඤා** යන ෂඩ්විධ සංඥාවෝයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ චාතුර්භූමිකවූ හෙවත් චතුර්විධ භූමිත්හි වූ සංඥාව දක්වා වදාළ සේක. මොවුන් අතුරෙන් චක්ෂුප්‍රසාදය නිශ්‍රයකොට පැවති ස්පර්ශ හේතුවෙන් යම් සංඥාවක් තොමෝ ජාත වූයේද නොහොත් චක්ෂුප්‍රසාදය නිශ්‍රයකොට පැවති ස්පර්ශයෙහි ජාතවූයේද, ඒ චක්ෂුප්‍රසාදය නිශ්‍රයකොට පැවති ස්පර්ශ හේතුවෙන් හෝ ස්පර්ශාධාර යෙහි වූ හෙයින් ඒ සංඥා තොමෝ **චක්ඛු සම්ඵස්සජා සඤ්ඤා** නම් වේ. **සොත සම්ඵස්සජා සඤ්ඤා, ඝාණ සම්ඵස්සජා සඤ්ඤා, ජිව්හා සම්ඵස්සජා සඤ්ඤා, කාය සම්ඵස්සජා සඤ්ඤා, මනො සම්ඵස්සජා සඤ්ඤා** යන තන්හිද මෙකී පිළිවෙළින්ම දතයුතු. මෙකී සංඥාවන් අතුරෙහි පළමු සංඥාවෝ පස්දෙන චක්ෂුප්‍රසාදාදී වස්තු රූපයන් නිශ්‍රයකොට පවත්නාහුම වෙත්. මනොසම්ඵස්ස හෙතුවෙන් හෝ මනොසම්ඵස්සයෙහි හටගත්තා වූ සංඥා තොමෝ හෘදයවස්තු රූපය නිශ්‍රයකොට හෝ අවස්තුකව හෙවත් වස්තු රූපය නිශ්‍රය නොකොට හෝ උපදී. අරූප තලයෙහි මනොසම්ඵස්සජා සංඥාතොමෝ අවස්තුකව උපදී.

**අතීත වූ සංඥාව** - යම් සංඥාවක් පසුගිය කාලයට අයත් වූයේද, නිරුද්ධ වූයේ ද, පහව ගියේ ද, **වෙනසකට පත්වූයේද,** අස්තයට ගියේ ද, විනාශ වූයේද, ඉපිද පහව ගියේද, පසුවූයේද, **පසුවීම්** කොටස් වශයෙන් **ගණන්** ගැණුනේද, එබඳු වූ **චක්ඛුසම්ඵස්සජා සංඥාව** හෙවත් ඇස හා ස්පර්ශයෙන් හටගත් සංඥාවද, **සෝත සම්ඵස්සජා සංඥාව** හෙවත් **කණ** හා ස්පර්ශයෙන් හටගත් සංඥාව ද, **ඝාණ සම්ඵස්සජා සංඥාව** හෙවත් නාසය හා ස්පර්ශයෙන් හටගත් සංඥාව ද, **ජිව්හා සම්ඵස්සජා සංඥාව** හෙවත් දිව හා ස්පර්ශයෙන් හටගත් සංඥාවද, **කාය සම්ඵස්සජා සංඥාව** හෙවත් කය හා ස්පර්ශයෙන් හටගත් සංඥාවද, **මනො සම්ඵස්සජා සංඥාව** හෙවත් මනස හා ස්පර්ශයෙන් හටගත් සංඥාවද යන මෙය අතීත වූ සංඥාව යයි කියනු ලැබේ.

**අනාගත වූ සංඥාව** - යම් සංඥාවක් ඇති නොවූයේද, නොවූයේද, හටනොගත්තේද, නූපන්නේ ද, පහළ නොවූ යේද, අපාතුභූතද, අනුප්පන්නද, අසමුප්පන්නද, අනුට්ඨිතද, අසමුට්ඨිතද, අනාගතද, අනාගත කොටස් වශයෙන් ගණන් ගැණුනේද, **එබඳු වූ** චක්ඛුසම්ඵස්සජා සංඥාව ද, සෝත-සම්ඵස්සජා සංඥාවද, **ඝාණ** සම්ඵස්සජා සංඥාව ද, ජිව්හා සම්ඵස්සජා සංඥාව ද, කායසම්ඵස්සජා සංඥාව ද, මනො සම්ඵස්සජා සංඥාව ද යන මෙය අනාගත වූ සංඥාව යයි කියනු ලැබේ

**ප්‍රත්‍යුප්පන්න වූ සංඥාව** - යම් සංඥාවක් ඇතිවූයේ ද වූයේද, හටගත්තේද, උපන්නේද, පහළවූයේද, පාතුභූතද, උප්පන්නද, සමුප්පන්නද, උට්ඨිතද, සමුට්ඨිතද, වර්තමාන වූයේද, වර්තමාන කොටස් වශයෙන් ගණන් ගැණුනේද, එබඳුවූ චක්ඛු සම්ඵස්සජ සංඥාවද, සෝත සම්ඵස්සජ සංඥා-වද, ඝාණ සම්ඵස්සජ සංඥාවද, ජිව්හා සම්ඵස්සජ සංඥාවද, කාය සම්ඵස්සජ සංඥාවද, මනො සම්ඵස්සජ සංඥාවද යන මෙය ප්‍රත්‍යුප්පන්නවූ සංඥාව යයි කියනු ලැබේ.

**අධ්‍යාත්මික වූ සංඥාව** - යම් සංඥාවක් ඒ ඒ සත්ත්වයන්ගේ චිත්ත පරම්පරාගතද, තමා පිළිබඳ ද, ඒ ඒ පුද්ගලයන්ට වෙන් වෙන් වශයෙන් අයත්ද, ස්වකීයද, සමානව ලැබුනේද, තමාගේ යයි සිතා ගත්තේද එබඳුවූ චක්ඛුසම්ඵස්සජ සංඥාවද, සොත සම්ඵස්සජ සංඥාවද, ඝාණ සම්ඵස්සජ සංඥාවද, ජිව්හා සම්ඵස්සජ සංඥාවද, කාය සම්ඵස්සජා සංඥාවද, මනො සම්ඵස්සජා සංඥාවද යන මෙය අධ්‍යාත්මික වූ සංඥාව යයි කියනු ලැබේ.

**බාහිර වූ සංඥාව** - යම් සංඥාවක් ඒ ඒ අන්‍ය වූ සත්ත්වයන්ගේ අන්‍ය වූ පුද්ගලයන්ගේ චිත්තපරම්පරාගතද, ඔවුන් පිළිබඳ ද, ඒ ඒ පුද්ගලයන්ට වෙන් වෙන් වශයෙන් අයත්ද, ස්වකීයද, සමානව ලැබුනේද, ඔවුන් පිළිබඳ යයි සිතා ගත්තේද, එබඳු වූ චක්ඛු සම්ඵස්සජා සංඥාවද, සොත සම්ඵස්සජා සංඥාවද, ඝාණ සම්ඵස්සජා සංඥාවද, ජිව්හා සම්ඵස්සජා සංඥාවද, කාය සම්ඵස්සජා සංඥාවද, මනො සම්ඵස්සජා සංඥාවද යන මෙය බාහිරවූ සංඥාව යයි කියනු ලැබේ.

**ඖදාරික වූද, සියුම් වූද සංඥාව** - **පටිඝ සම්ඵස්සජා සංඥාව** හෙවත් ක්‍රොධය හා ස්පර්ශයෙන් හටගත් සංඥාව නොහොත් පඤ්චද්වාරික සංඥාව ඖදාරිකය, **අධිවචන සම්ඵස්සජා සංඥාව** හෙවත් අධිවචන ස්පර්ශයෙන් හටගත් සංඥාව නොහොත් මනොද්වාරික සංඥාව සියුම් ය.

අකුසල සංඥාව ඖදාරිකය, කුසල අව්‍යාකෘත සංඥාව සියුම්ය.

කුසල් අකුසල් සංඥාව ඖදාරිකය, අව්‍යාකෘත සංඥාව සියුම් ය.

දුක්වූ වෙදනාව හා යුක්තවූ සංඥාව ඖදාරිකය, සැප වූද අදුක්ඛ මසුඛ වූ හෙවත් සුවදුක් නොවන්නාවූද වෙදනාව හා යුක්තවූ සංඥාව සියුම්ය.

සුවදුක් ඇති වේදනාව හා යුක්තවූ සංඥාව ඖදාරිකය, අදුක්ඛමසුඛ වේදනාව හා යුක්තවූ සංඥාව සියුම් ය.

සන්සුන් නොවූවහුගේ සංඥාව ඖදාරිකය, සන්සුන්-වූවහුගේ සංඥාව සියුම් ය.

කෙලෙස් සහිත සංඥාව ඖදාරිකය. කෙලෙස් රහිත සංඥාව සියුම් ය.

ඒ ඒ සංඥාවක් හා සමකොට ඖදාරික සංඥාවද, සියුම් සංඥාවද දතයුතු.

මෙහි **පටිඝ සම්ඵස්සජා සංඥා** නම් පඤ්චද්වාරයෙහි පැවැත්තාවූ සංඥාවයි. **අධිවචන සම්ඵස්සජා සංඥා** නම් මනොද්වාරයෙහි ප්‍රවෘත්තවූ සංඥාවයි ඒ පඤ්චද්වාරික සංඥා, මනොද්වාරික සංඥාවන් අතුරෙන් පඤ්චද්වාරයෙහි ප්‍රවෘත්තවූ සංඥාවන් බලාද දූනගන්නට හැකි වන්නේය. එහෙයින් ඖදාරිකය. ඇල්මකොට බලන්නහු ඇල්මකොට බලන්නේ යයිද, කිපි බලන්නහු කිපී බලන්නේ යයි ද, අවලොකනය කොටම දනිත්.

නුදුරු ගමක වසන්නාවූ නවක භික්ෂූන් දෙදෙනකු අතුරෙන් ඉදිරියෙහි වසන්නාවූ එක් භික්ෂුවක්, එක් තැනක හිඳ කපු කටින්නාවූ ස්ත්‍රීන් දෙදෙනෙකු අතුරෙන් එක් ස්ත්‍රියක් දෙස බැලීය. අනික් අඟන, කවර හෙයකින් ඒ මහණතෙම තී දෙස බැලීදැයි ඇසුවාය. ඒ මහණ තෙම, මා රාග සිතින් නො නැරඹිය. බාල වූ බුහුණනිය යන සංඥාවෙන් මා බැලීයයි කීය, නවක භික්ෂූන් දෙදෙනාද ගොදුරු ගමෙහි කැසිර දන් හලෙහි වැඩහුන් කල්හි අනික් මහණ තෙමේ ඒ අඟන නැරඹූ මහණහු නුඹවහන්සේ විසින් ඒ කපු කටිමින් හුන් කත නරඹන ලදදැයි විචාළේය නරඹන ලද සැබැවයි පිළිවදන් දින. කුමන ප්‍රයෝජනයක් සඳහා නරඹනලද දැයි මෙසේ විචාළේය. මාගේ බාල බුහුණනියන් හා සමාන වූ බැවින් ඒ අඟන නැරඹිමියි කීයේය. මෙසේ පඤ්චද්වාරික සංඥාතොමෝ බලාද දූනගන්ට

නැක්කේ යයි දතයුතු. ඒ පඤ්චද්වාරික සංඥා තොමෝ චක්ෂුරාදී ප්‍රසාද රූප සංඛ්‍යාත චක්ෂුරාදී වස්තූන් නිශ්‍රය කොට පවත්නීම වේ. පඤ්චද්වාරික ජවනයන්හි පවත්නා සංඥා යයි ද දක්වන ලදී.

මනොද්වාරික සංඥාතොමෝ වනාහි එක් ඇදෙක හෝ එක් පුටුවෙක හෝ හිඳ අන් අරමුණක් සිතන්නාහුද කල්පනා කරන්නෙහිද, කුමක් සිතන්නෙහිද, කුමක් කල්පනා කරන්නෙහිද මෙසේ පිළිවිස ඒ පුද්ගලයාගේ වශයෙන්ම දතයුතු වන හෙයින් ඒ අධි වචන සංඥා තොමෝ සූක්ෂමයහ.

**හීන වූ ද ප්‍රණීත වූ ද සංඥාව** — අකුසල සංඥාව හීනය. කුසල අව්‍යාකෘත සංඥාව ප්‍රණීතය.

කුසල් අකුසල් සංඥාව හීනය. අව්‍යාකෘත සංඥාව ප්‍රණීතය.

දුක්වූ වේදනාව හා යුක්ත වූ සංඥාව හීනය. සැප වූද, සැප දුක් නොවන්නාවූද වේදනාවන් හා යුක්තවූ සංඥාව ප්‍රණීතය.

සැප දුක් වේදනාවන් හා යුක්තවූ සංඥාව හීනය. සුවදුක් නොවූ වේදනාව හා යුක්තවූ සංඥාව ප්‍රණීතය.

සත්පුන් නොවූවහුගේ සංඥාව හීනය සත්පුන් වූවහුගේ සංඥාව ප්‍රණීතය.

කෙලෙස් සහිත සංඥාව හීනය. කෙලෙස් රහිත සංඥාව ප්‍රණීතය. මෙසේ ඒ ඒ සංඥාවක් හා සමකොට හීනවූ ද ප්‍රණීතවූ ද සංඥාව දතයුතුය.

**දුරෙහි වූ සංඥාව**-අකුසල සංඥාව කුසල අව්‍යාකෘත සංඥාවන්ගෙන් දුරය.

කුසල අව්‍යාකෘත සංඥාවෝ අකුසල සංඥාවෙන් දුරය.

කුසල සංඥාව අකුසල අව්‍යාකෘත සංඥාවන්ගෙන් දුරය.

අකුසල අව්‍යාකෘත සංඥාවෝ කුසල සංඥාවෙන් දුරය.

අව්‍යාකෘත සංඥාව කුසල් අකුසල් සංඥාවන්ගෙන් දුරය

කුසලාකුසල සංඥාව අව්‍යාකෘත සංඥාවෙන් දුරය.

දුක් වූ වෙදනාවෙන් යුක්තවූ සංඥාව, සැප වූද, සැප දුක් නොවන්නාවූද වෙදනාවන් හා යුක්තවූ සංඥාවන්ගෙන් දුරය.

සැපවූද, සුවදුක් නොවන්නාවූද වෙදනාවන් හා යුක්තවූ සංඥාව, දුක්වූ වෙදනාව හා යුක්තවූ සංඥාවෙන් දුරය.

සැප වූ වෙදනාව හා යුක්තවූ සංඥාව, දුක් වූද, සුවදුක් නොවන්නාවූ ද වෙදනාවන් හා යුක්ත වූ සංඥාවන්ගෙන් දුරය.

දුක් වූද, සුවදුක් නොවන්නාවූද වෙදනාවන් හා යුක්තවූ සංඥාව සැපවූ වෙදනාව හා යුක්තවූ සංඥාවෙන් දුරය.

සුවදුක් නොවන්නාවූ වෙදනාව හා යුක්තවූ සංඥාව, සැප හා දුක් ඇති වෙදනාවන් හා යුක්තවූ සංඥාවන්ගෙන් දුරය.

සුවදුක් වේදනාවන් හා යුක්තවූ සංඥාව සුවදුක් නොවූ වෙදනාවන් හා යුක්තවූ සංඥාවෙන් දුරය.

සත්පුරුෂ නොවූවහුගේ සංඥාව සත්පුරුෂ වූවහුගේ සංඥාවෙන් දුරය.

සත්පුරුෂ වූවහුගේ සංඥාව සත්පුරුෂ නොවූවහුගේ සංඥාවෙන් දුරය.

කෙලෙස් සහිත සංඥාව, කෙලෙස් රහිත සංඥාවෙන් දූරය.

කෙලෙස් රහිත සංඥාව, කෙලෙස් සහිත සංඥාවෙන් දූරය.

මෙය දූරෙහි වූ සංඥාව යයි කියනු ලැබේ.

**සන්තිකෙ සඤ්ඤා** හෙවත් සමීප වූ සංඥාව-

අකුසල සංඥාව අකුසල සංඥාවගේ සමීපයෙහිය.

කුසල සංඥාව කුසල සංඥාවගේ සමීපයෙහිය.

අව්‍යාකෘත සංඥාව අව්‍යාකෘත සංඥාවගේ සමීපයෙහිය.

දුක්වූ වේදනාවත් හා යුක්තවූ සංඥාව, දුක්වූ වේදනාව හා යුක්තවූ සංඥාවගේ සමීපයෙහිය.

සැප වූ වේදනාව හා යුක්තවූ සංඥාව සැප වූ වේදනාව හා යුක්තවූ සංඥාවගේ සමීපයෙහිය.

සුවදුක් නොවන වේදනාව හා යුක්තවූ සංඥාව, සුවදුක් නොවන වේදනාව හා යුක්තවූ සංඥාවගේ සමීපයෙහිය.

සත්සුන් නොවූවහුගේ සංඥාව, සත්සුන් නොවූවහුගේ සංඥාව සමීපයෙහිය.

සත්සුන් වූවහුගේ සංඥාව, සත්සුන් වූවහුගේ සංඥාව සමීපයෙහිය.

කෙලෙස් සහිත සංඥාව කෙලෙස් සහිත සංඥාවගේ සමීපයෙහිය.

කෙලෙස් රහිත සංඥාව කෙලෙස් රහිත සංඥාවගේ සමීපයෙහිය.

මෙය සමීපයෙහි වූ සංඥාව යයි කියනු ලැබේ.

මෙසේ ඒ ඒ සංඥාවක් හා සමකොට දූරෙහි වූ ද, සමීපයෙහි වූ ද සංඥා දතයුතු.

## සංස්කාරස්කන්ධය

අතීත වූ ද, අනාගත වූ ද, ප්‍රත්‍යුත්පන්න වූ ද, අධ්‍යාත්මික වූ ද, බාහිර වූ ද, ඖදාරික වූ ද, සූක්ෂම වූ ද, හීන වූ ද, ප්‍රණීත වූ ද, දූරෙහි වූ ද, සමීපයෙහි වූ ද යම් චතුර්විධ භූමියෙහි ප්‍රවෘත්තවූ සංස්කාරයෝ වෙත්ද, එය ඒකතුකොට ඇති, රැස්කොට ඇති, පිඩුකොට ඇති, ඒ සංස්කාරයෝ, **සංස්කාර ස්කන්ධය** යයි කියනු ලැබේ. **මේ සංස්කාර ධර්මයෝ** ෂඩ්විධ වේ. එනම්:-

1. **චක්ඛුසම්ඵස්සජා චේතනා**
2. **සොතසම්ඵස්සජා චේතනා**
3. **ඝාණසම්ඵස්සජා චේතනා**
4. **ජිව්හා සම්ඵස්සජා චේතනා**
5. **කායසම්ඵස්සජා චේතනා**
6. **මනොසම්ඵස්සජා චේතනා**

යන ෂඩ්විධ චේතනාවෝ යි.

මෙහි, **චේතනා** යන මේ වචනය යටත්පිරිසෙයින් පාළියෙහි ප්‍රධාන සංස්කාරයාගේ වශයෙන් වදාරන ලදී.

යටත්පිරිසෙයින් පෙළෙහි ආවාවූ චේතනා තොමෝද, ඵස්ස, ඒකග්ගතා, ජීවිතෙන්ද්‍රිය, මනසිකාර යන සංස්කාරයෝ සතරදෙනාද, අන්තිම පරිච්ඡේදයෙන් චක්ෂුර් විඥානය හා සමග උපදිත්. ඒ චේතනාව මුල්කොට ඇති පඤ්චවිධ සංස්කාරයන් අතුරෙහි තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් ස්වකීය ස්වකීය කෘත්‍යයෙහි මෙහෙයන අර්ථයෙන් ප්‍රකටවන බැවින් චේතනා තොමෝ යම් හෙයකින් ප්‍රධාන වූවා වේද, එහෙයින් මේ චේතනා තොමෝ ම ගන්නා ලදි. ඒ චේතනාව හා සම්ප්‍රයුක්තවූ, සංස්කාරයෝ වනාහි, ඒ චේතනාව ගත් කල්හි, ගන්නාලද්දාහුම වෙත්. මෙහි පළමු චේතනාවෝ පස්දෙන චක්ෂුප්‍රසාදදීන් නිශ්‍රයකොට ඇත්තාහුම වෙත්. මනොසම්ඵස්සජා චේතනාතොමෝ

හදයවස්තුව නිශ්‍රයකොටගෙන හෝ, නිශ්‍රයකොට නොගෙන හෝ වේ. සියලු චේතනාවෝ තුමූ චතුර්විධ භූමියෙහි පර්යාපන්නවූ චේතනාවෝ යි.

**අතීත සංස්කාරයෝ** - යම්කිසි සංස්කාරයක් පසුගිය කාලයට අයත්වූයේ ද, නිරුද්ධවූයේ ද, පහව ගියේද, වෙනසකට පත්වූයේද, අස්තයට ගියේද, විනාශ වූයේද, ඉපිද පහව ගියේද, පසුවූයේද, පසුවීම් කොටස් වශයෙන් ගණන් ගැණුනේද, එබඳු වූ චක්ඛුසම්ඵස්සජා චේතනාව හෙවත් ඇස හා ස්පර්ශයෙන් හටගත් චේතනාවද, සොත සම්ඵස්සජා චේතනාව හෙවත් කණ හා ස්පර්ශයෙන් හටගත් චේතනාවද, ඝාණ සම්ඵස්සජා චේතනාව හෙවත් නාසය හා ස්පර්ශයෙන් හටගත් චේතනාවද, ජිව්හා සම්ඵස්සජා චේතනාව හෙවත් දිව හා ස්පර්ශයෙන් හටගත් චේතනාවද, කාය සම්ඵස්සජා චේතනා හෙවත් කය හා ස්පර්ශයෙන් හටගත් චේතනාවද, මනො සම්ඵස්සජා චේතනාව හෙවත් මනස හා ස්පර්ශයෙන් හටගත් චේතනාවද යන මොව්හු අතීත වූ සංස්කාර යයි කියනු ලැබේ.

**අනාගත සංස්කාරයෝ** - යම් සංස්කාරයක් ඇති නොවූයේද, හටනොගත්තේද, නූපන්නේද, පහළ නොවූයේද, අප්‍රාතුභූතද, අනුප්පන්නද, අසමුප්පන්නද, අනුට්ඨිතද, අසමුට්ඨිතද, අනාගතද, අනාගත කොටස් වශයෙන් ගණන් ගැණුනේද, එබඳුවූ චක්ඛුසම්ඵස්සජා චේතනාවද, සොත සම්ඵස්සජා චේතනාවද, ඝාණ සම්ඵස්සජා චේතනාවද, ජිව්හා සම්ඵස්සජා චේතනාවද, කාය සම්ඵස්සජා චේතනාවද, මනො සම්ඵස්සජා චේතනාවද යන මොව්හු අනාගතවූ සංස්කාරයෝ යයි කියනු ලැබේ.

**ප්‍රත්‍යුත්පන්න සංස්කාරයෝ** යම් සංස්කාර කෙනෙක් ඇතිවූයේද, වූයේද, හටගත්තේද, උපන්නේද, පහළ වූයේද, ප්‍රාතුභූතද, උප්පන්නද, සමුප්පන්නද, උට්ඨිතද, සමුට්ඨිතද, වර්තමාන වූයේද, වර්තමාන කොටස් වශයෙන් ගණන්ගැණුනේද, එබඳුවූ චක්ඛුසම්ඵස්සජා චේතනාවද,

සොතසම්ඵස්සජ චෙතනාවද, ඝාණ සම්ඵස්සජා චෙතනාවද, ජිව්හා සම්ඵස්සජා චෙතනාවද, කාය සම්ඵස්සජා චෙතනාවද, මනො සම්ඵස්සජා චෙතනාවද යන මොව්හු ප්‍රත්‍යුත්පන්න වූ සංස්කාරයෝ යයි කියනු ලැබේ.

**අධ්‍යාත්මික සංස්කාරයෝ** - යම් කිසි සංස්කාරයෙක් ඒ ඒ සත්ත්වයන්ගේ චිත්ත පරම්පරාගතද, තමා පිළිබඳ ද ඒ ඒ පුද්ගලයන්ට වෙන් වෙන් වශයෙන් අයත්ද, ස්වකීයද, සමානව ලැබුනේද, තමාගේ යයි සිතාගත්තේද, එබඳු වූ චක්ඛුසම්ඵස්සජා චෙතනාවද, සොත සම්ඵස්සජා චෙතනාවද, ඝාණ සම්ඵස්සජා චෙතනාවද, ජිව්හා සම්ඵස්සජා චෙතනාවද, කාය සම්ඵස්සජා චෙතනාවද, මනො සම්ඵස්සජා චෙතනාවද, යන මොව්හු අධ්‍යාත්මික වූ සංස්කාරයෝ යයි කියනු ලැබේ.

**බාහිර වූ සංස්කාරයෝ** - යම් කිසි සංස්කාරයක් ඒ ඒ අන්‍යවූ සත්ත්වයන්ගේ අන්‍යවූ පුද්ගලයන්ගේ චිත්ත පරම්පරා ගතද, ඔවුන් පිළිබඳ ද, ඒ ඒ පුද්ගලයන්ට වෙන් වෙන් වශයෙන් අයත්ද, ස්වකීයද, සමානව ලැබුනේද, ඔවුන් පිළිබඳ යයි සිතා ගත්තේද, එබඳු වූ චක්ඛුඵස්සජා චෙතනාවද, සොත සම්ඵස්සජා චෙතනාවද, ඝාණ සම්ඵස්සජා චෙතනාවද, ජිව්හා සම්ඵස්සජා චෙතනාවද, කාය සම්ඵස්සජා චෙතනාවද, මනො සම්ඵස්සජා චෙතනාවද, යන මොව්හු බාහිර වූ සංස්කාරයෝ යයි කියනු ලැබේ.

**ඖදාරික වූ ද සියුම් වූ ද සංස්කාරයෝ**-

අකුසල චෙතනාව ඖදාරිකය. කුසල අව්‍යාකෘත චෙතනාව සියුම් ය.

කුසල් අකුසල් චෙතනාව ඖදාරිකය. අව්‍යාකෘත චෙතනාව සියුම්ය.

දුක්වූ වේදනාව හා යුක්තවූ චෙතනාව ඖදාරිකය. සැප වූ ද, සැප දුක් නොවන්නාවූ ද වේදනා හා යුක්තවූ චෙතනාව සියුම්ය.

සුව දුක් ඇති වේදනා හා යුක්තවූ චේතනාව ඖදාරිකය. දුක් නොවූ, සුව නොවූ වේදනාව හා යුක්ත වූ චේතනාව සියුම්ය.

සත්හුන් නොවූවහුගේ චේතනාව ඖදාරිකය. සත්හුන් වූවහුගේ චේතනාව සියුම්ය.

කෙලෙස් සහිත චේතනාව ඖදාරිකය. කෙලෙස් රහිත චේතනාව සියුම්ය.

මෙසේ ඒ ඒ චේතනාවක් හා සමකොට ඖදාරික චේතනාවද, සියුම් වූ චේතනාවද දතයුතු.

අකුසල චේතනාව හීනය. කුසල අව්‍යාකෘත චේතනාව ප්‍රණීතය

කුසල් අකුසල් චේතනාවෝ හීනය. අව්‍යාකෘත චේතනාව ප්‍රණීතය.

දුක්වූ වේදනාව හා යුක්තවූ චේතනාව හීනය. සැප වූද, සැප දුක් නොවන්නාවූ ද, වේදනාව හා යුක්තවූ චේතනාව ප්‍රණීතය.

සැප දුක් වේදනාවන් හා යුක්තවූ චේතනාව හීනය. සුව දුක් නොවූ වේදනාව හා යුක්තවූ චේතනාව ප්‍රණීතය.

සත්හුන් නොවූවහුගේ චේතනාව හීනය. සත්හුන් වූවහුගේ චේතනාව ප්‍රණීතය.

කෙලෙස් සහිත චේතනාව හීනය. කෙලෙස් රහිත චේතනාව ප්‍රණීතය.

මෙසේ ඒ ඒ චේතනාවන් හා සමකොට හීනවූ ද ප්‍රණීතවූද චේතනාවෝ දතයුතු.

**දුරෙහි වූ සංස්කාරයෝ**–

අකුසල චේතනාව, කුසල අව්‍යාකෘත චේතනාවන්-ගෙන් දුරය.

කුසල අව්‍යාකෘත චේතනාවෝ අකුසල චේතනාවෙන් දුරය.

කුසල චේතනාව අකුසල අව්‍යාකෘත චේතනාවන්ගෙන් දුරය.

අකුසල අව්‍යාකෘත චේතනාව කුසල චේතනාවෙන් දුරය.

අව්‍යාකෘත චේතනාව, කුසල් අකුසල් චේතනාවන් ගෙන් දුරය.

කුසල් අකුසල් චේතනාවෝ අව්‍යාකෘත චේතනාවෙන් දුරය.

දුක්වූ වේදනාවෙන් යුක්තවූ චේතනාව, සැප වූද, සැප දුක් නොවන්නාවූද වේදනාවන් හා යුක්තවූ චේතනාවන් ගෙන් දුරය.

සැප වූද, සුවදුක් නොවන්නාවූද වේදනාවන් හා යුක්තවූ චේතනාව දුක්වූ වේදනාව හා යුක්තවූ චේතනා වෙන් දුරය.

සැපවූ වේදනාව හා යුක්තවූ චේතනාව, දුක්වූද, සුව දුක් නොවන්නා වූ ද වේදනාවන් හා යුක්ත වූ චේතනා වෙන් දුරය.

දුක් වූ ද, සුව දුක් නොවන්නාවූ ද වේදනාවන් හා යුක්තවූ චේතනාව සැප වූ වේදනාව හා යුක්ත වූ චේතනා වෙන් දුරය.

සුවදුක් නොවන්නා වූ වේදනාව හා යුක්තවූ චේතනාව සැප හා දුක් ඇති වේදනාවන් හා යුක්තවූ චේතනාවන් ගෙන් දුරය.

සුවදුක් වේදනාවන් හා යුක්තවූ චේතනාව සුවදුක් නොවූ වේදනාව හා යුක්තවූ චේතනාවෙන් දුරය.

සත්පුරුෂ නොවූවහුගේ චේතනාව, සත්පුරුෂ වූවහුගේ චේතනාවෙන් දුරය.

සත්පුරුෂ වූවහුගේ චේතනාව, සත්පුරුෂ නොවූවහුගේ චේතනාවෙන් දුරය.

කෙලෙස් සහිත චේතනාව; කෙලෙස් රහිත චේතනාවෙන් දුරය.

කෙලෙස් රහිත චේතනාව, කෙලෙස් සහිත චේතනාවෙන් දුරය.

මෙය දූරෙහි වූ සංස්කාරයෝයයි කියනු ලැබේ.

**සමීපයෙහි වූ සංස්කාරයෝ-**

අකුසල චේතනාව අකුසල චේතනාවගේ සමීපයෙහිය.

කුසල චේතනාව, කුසල චේතනාවගේ සමීපයෙහිය.

අව්‍යාකෘත චේතනාව, අව්‍යාකෘත චේතනාවගේ සමීපයෙහිය.

දුක්වූ වේදනාවත් හා යුක්තවූ චේතනාව දුක්වූ වේදනාවත් හා යුක්තවූ චේතනාවගේ සමීපයෙහිය.

සැපවූ වේදනාව හා යුක්තවූ චේතනාව, සැපවූ වේදනාව හා යුක්තවූ චේතනාවගේ සමීපයෙහිය.

සුවදුක් නොවක වේදනාව හා යුක්තවූ චේතනාව, සුව දුක් නොවක වේදනාව හා යුක්තවූ චේතනාවගේ සමීපයෙහිය.

සත්පුරුෂ නොවූවහුගේ චේතනාව, සත්පුරුෂ නොවූවහුගේ චේතනාවගේ සමීපයෙහිය.

සත්පුරුෂ වූවහුගේ චේතනාව, සත්පුරුෂ වූවහුගේ චේතනාවගේ සමීපයෙහිය.

කෙලෙස් සහිත චේතනාව, කෙලෙස් සහිත චේතනාවගේ සමීපයෙහිය.

කෙලෙස් රහිත චේතනාව, කෙලෙස් රහිත චේතනාවගේ සමීපයෙහිය.

මෙය සමීපයෙහි වූ සංස්කාරයෝ යයි කියනු ලැබේ. ඒ ඒ චේතනාවක් හා සමකොට දූරෙහි වූ ද, සමීපයෙහිවූ ද චේතනාවෝ දතයුතු.

## විඥානස්කන්ධය

අතීත වූද අනාගත වූද, ප්‍රත්‍යුත්පන්න වූද, අධ්‍යාත්මික වූ ද, බාහිර වූ ද, ඖදාරික වූ ද, සියුම් වූ ද, හීන වූ ද, ප්‍රණීත වූ ද, දූරෙහි වූ ද, සමීපයෙහි වූ ද, යම් චතුර්භූමික විඥ්ඥාණයෝ වෙත්ද, එය එකතුකොට ඇති, රැස්කොට ඇති, පිඩුකොට ඇති ඒ විඥ්ඥාණයෝ, **විඥ්ඥාණස්කන්ධය** යයි කියනු ලැබේ.

මේ විඥ්ඥාණයෝ ෂඩ්විධ වේ. එනම්:-

1. **චක්ඛු විඤ්ඤාණය**
2. **සොත විඤ්ඤාණය**
3. **ඝාණ විඤ්ඤාණය**
4. **ජිව්හා විඤ්ඤාණය**
5. **කායවිඤ්ඤාණය**
6. **මනොවිඤ්ඤාණය**

චතුර්භූමික වූ චක්ඛු විඥානාදීන් අතුරෙන් චක්ඛු විඥාන, ශ්‍රොත විඥාන, ඝාණ විඥාන, ජිව්හා විඥාන, කාය විඥාන යන විඥානයෝ පස්දෙන චක්ඛුප්‍රසාද, සොතප්‍රසාද, ඝාණප්‍රසාද, ජිව්හාප්‍රසාද, කායප්‍රසාද යන ප්‍රසාද රූපයන් නිශ්‍රයකොට ඇත්තාහුම වෙත්. මනොවිඥානය තෙම හදය-වස්තුව නිශ්‍රය කොට හෝ නිශ්‍රය නොකොට හෝ උපදී.

**අතීතවූ විඥානය**- යම්කිසි විඥානයක් පසුගිය කාලයට අයත් වූයේද, නිරුද්ධ වූයේද, පහව ගියේද, වෙනසකට පත්වූයේද, අස්තයට ගියේද, විනාශ වූයේද, ඉපිද පහව ගියේද, පසුවූයේද, පසුවීම් කොටස් වශයෙන් ගණන් ගැණුනේද, එබඳුවූ චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනෝ විඤ්ඤාණය යන මෙය අතීත විඤ්ඤාණ යයි කියනු ලැබේ.

**අනාගත විඥානය** - යම් විඥණයක් ඇතිනොවූයේද, නොවූයේද, හටනොගත්තේද, නූපන්නේද, පහළනොවූ-යේද, අපාතුභූතද, අනුප්පන්නද, අසමුප්පන්නද, අනුට්ඨිතද, අසමුට්ඨිතද, අනාගතද, අනාගත කොටස් වශයෙන් ගණන් ගැණුනේද, එබඳු වූ චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනෝවිඤ්ඤාණය යන මෙය අනාගත විඤ්ඤාණ යයි කියනු ලැබේ.

**ප්‍රත්‍යුත්පන්න විඥානය** - යම් විඥනයක් ඇතිවූයේද, වූයේද, හටගත්තේද, උපන්තේද, පහළවූයේද, පාතුභූතද, උප්පන්නද, සමුප්පන්නද, උට්ඨිතද, සමුට්ඨිතද, වර්තමාන වූයේද, වර්තමාන කොටස් වශයෙන් ගණන් ගැණුනේද එබඳුවූ චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය. ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනෝ විඤ්ඤාණය යන මෙය ප්‍රත්‍යුත්පන්න විඤ්ඤාණයයි කියනු ලාබේ.

**අධ්‍යාත්මික විඥානය**- යම් විඤ්ඤාණයක් ඒ ඒ සත්ත්වයන්ගේ චිත්ත පරම්පරාගතද, තමා පිළිබඳ ඒ ඒ පුද්ගලයන්ට වෙන් වෙන් වශයෙන් අයත්ද, ස්වකීයද, සමානව ලැබුනේද, තමාගේ යයි සිතා ගත්තේද, එබඳු වූ චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනෝ විඤ්ඤාණය යන මෙය අධ්‍යාත්මික විඤ්ඤාණය යයි කියනු ලැබේ

**බාහිර වූ විඥානය**- යම් විඤ්ඤාණයක් ඒ ඒ අන්‍යවූ සත්ත්වයන්ගේ අන්‍යවූ පුද්ගලයන්ගේ චිත්ත පරම්පරාගතද, ඔවුන් පිළිබඳ ද ඒ ඒ පුද්ගලයන්ට වෙන් වෙන් වශයෙන් අයත්ද, ස්වකීයද, සමානව ලැබුනේද, ඔවුන් පිළිබඳ යයි සිතා ගත්තේද එබඳු වූ චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනෝ විඤ්ඤාණය යන මෙය බාහිර වූ විඤ්ඤාණය යයි කියනු ලැබේ.

**ඖදාරික වූ ද සියුම් වූ ද විඤ්ඤාණය**-අකුසල විඥානය ඖදාරිකය. කුසල අව්‍යාකෘත විඥානයෝ සියුම් ය.

කුසල් අකුසල් විඥානයෝ ඖදාරිකය. අව්‍යාකෘත විඥානය සියුම් ය.

දුක්වූ වෙදනාව හා යුක්තවූ විඤ්ඤාණය ඖදාරිකය සැප වූ ද, සුව දුක් නොවන්නාවූද විඤ්ඤාණයෝ සියුම් ය.

සුවදුක් ඇති වෙදනාව හා යුක්තවූ විඤ්ඤාණය ඖදාරිකය. සුව දුක් නොවන්නාවූ වෙදනාව හා යුක්තවූ විඤ්ඤාණය සියුම් ය.

සන්හුන් නොවූවහුගේ විඤ්ඤාණය ඖදාරිකය සන්හුන් වූවහුගේ විඤ්ඤාණය සියුම් ය.

කෙලෙස් සහිත විඤ්ඤාණය ඖදාරිකය. කෙලෙස් රහිත විඤ්ඤාණය සියුම් ය.

ඒ ඒ විඤ්ඤාණයක් හා සම්කොට ඖදාරික වූ විඤ්ඤාණයද, සියුම් වූ විඤ්ඤාණයද දතයුතු.

**හීන වූ ද, ප්‍රණීත වූ ද විඤ්ඤාණය** - අකුසල විඤ්ඤාණය හීනය. කුසල අව්‍යාකෘත විඤ්ඤාණයෝ ප්‍රණීතය

කුසල් අකුසල් විඤ්ඤාණයෝ හීනය. අව්‍යාකෘත විඤ්ඤාණය ප්‍රණීතය.

දුක් වූ වෙදනාව හා යුක්තවූ විඤ්ඤාණය හීනය. සැපවූද, සුව දුක් නොවත්තාවූ ද වෙදනාව හා යුක්තවූ විඤ්ඤාණයෝ ප්‍රණීතය.

සැප දුක් වෙදනාවන් හා යුක්තවූ විඤ්ඤාණයෝ හීනය සුව දුක් නොවූ වෙදනාව හා යුකතවූ විඤ්ඤාණයෝ ප්‍රණීතය.

සත්හුන් නොවූවහුගේ විඤ්ඤාණය හීනය. සත්හුන් වූවහුගේ විඤ්ඤාණය ප්‍රණීතය.

කෙලෙස් සහිත විඤ්ඤාණය හීනය. කෙලෙස් රහිත විඤ්ඤාණය ප්‍රණීතය.

ඒ ඒ විඤ්ඤාණයක් හා සමකොට හීන වූ ද, ප්‍රණීත වූ ද විඤ්ඤාණයෝ දතයුතු.

**දූරෙහි වූ විඤ්ඤාණය**-අකුසල විඤ්ඤාණය කුසල අව්‍යාකෘත විඤ්ඤාණයන්ගෙන් දූරය.

කුසල අව්‍යාකෘත විඤ්ඤාණයෝ අකුසල විඤ්ඤාණයන්-ගෙන් දූරය.

කුසල විඤ්ඤාණය අකුසල අව්‍යාකෘත විඤ්ඤාණයන්-ගෙන් දූරය.

අකුසල අව්‍යාකෘත විඤ්ඤාණයෝ කුසල විඤ්ඤාණයෙන් දූරය.

අව්‍යාකෘත විඤ්ඤාණය කුසල් අකුසල් විඤ්ඤාණයන් ගෙන් දූරය.

කුසලාකුසල විඤ්ඤාණයෝ අව්‍යාකෘත විඤ්ඤාණයන්-ගෙන් දූරය.

දුක්වූ වෙදනාවෙන් යුක්තවූ විඤ්ඤාණය සැප වූ ද, සැප දුක් නොවූ ද වෙදනාවන් හා යුක්තවූ විඤ්ඤාණයන්ගෙන් දූරය.

සැප වූ ද, සුවදුක් නොවන්නා වූ ද වෙදනාව හා යුක්තවූ විඤ්ඤාණය දුක්වූ වෙදනාව හා යුක්තවූ විඤ්ඤාණයෙන් දූරය.

සැප වූ වෙදනාව හා යුක්තවූ විඤ්ඤාණය දුක් වූ ද, සුව දුක් නොවන්නාවූ ද වෙදනාව හා යුක්තවූ විඤ්ඤාණයන්ගෙන් දූරය.

දුක් වූ ද, සුව දුක් නොවන්නා වූ ද වෙදනාව හා යුක්තවූ විඤ්ඤාණය සැප වූ වෙදනාව හා යුක්තවූ විඤ්ඤාණයෙන් දූරය

සුව දුක් නොවන්නාවූ වෙදනාව හා යුක්තවූ විඤ්ඤාණය සැප වූ ද, දුක් වූ ද වෙදනාවන් හා යුක්තවූ විඤ්ඤාණයන්ගෙන් දූරය.

සුව දුක් වෙදනාවන් හා යුක්තවූ විඤ්ඤාණය සුව දුක් නොවන්නාවූ විඤ්ඤාණයන්ගෙන් දූරය.

සත්පුරුෂ නොවූවහුගේ විඤ්ඤාණය සත්පුරුෂ වූවහුගේ විඤ්ඤාණයන්ගෙන් දූරය.

සත්පුරුෂ වූවහුගේ විඤ්ඤාණය, සත්පුරුෂ නොවූවහුගේ විඤ්ඤාණයන්ගෙන් දූරය.

කෙලෙස් සහිත විඤ්ඤාණය, කෙලෙස් රහිත විඤ්ඤාණයන්ගෙන් දූරය.

කෙලෙස් රහිත විඤ්ඤාණය, කෙලෙස් සහිත විඤ්ඤාණයන්ගෙන් දූරය.

මෙය දූරෙහි වූ විඤ්ඤාණය යයි කියනු ලැබේ.

**සමීපයෙහි වූ විඤ්ඤාණය**-අකුසල විඤ්ඤාණය, අකුසල විඤ්ඤාණයාගේ සමීපයෙහි ය.

කුසල විඤ්ඤාණය, කුසල විඤ්ඤාණයාගේ සමීපයෙහි ය.

අව්‍යාකෘත විඤ්ඤාණය, අව්‍යාකෘත විඤ්ඤාණයාගේ සමීපයෙහි ය.

දුක් වූ වේදනාවත් හා යුක්තවූ විඤ්ඤාණය. දුක් වූ වේදනාවත් හා යුක්තවූ විඤ්ඤාණයාගේ සමීපයෙහි ය.

සැප වූ වේදනාවත් හා යුක්තවූ විඤ්ඤාණය, සැප වූ වේදනාව හා යුක්තවූ විඤ්ඤාණයාගේ සමීපයෙහි ය.

සුව දුක් නොවන වේදනාවත් හා යුක්තවූ විඤ්ඤාණය සුව දුක් නොවන වේදනාවත් හා යුක්තවූ විඤ්ඤාණයාගේ සමීපයෙහි ය.

සත්හුත් නොවූවහුගේ විඤ්ඤාණය, සත්හුත් නොවූවහුගේ විඤ්ඤාණය සමීපයෙහි ය.

සත්හුත් වූවහුගේ විඤ්ඤාණය, සත්හුත් වූවහුගේ විඤ්ඤාණය සමීපයෙහි ය.

කෙලෙස් සහිත විඤ්ඤාණය, කෙලෙස් සහිත විඤ්ඤාණයාගේ සමීපයෙහි ය.

කෙලෙස් රහිත විඤ්ඤාණය, කෙලෙස් රහිත විඤ්ඤාණයාගේ සමීපයෙහි ය.

මෙය සමීපයෙහි වූ විඤ්ඤාණය යයි කියනු ලැබේ.

ඒ ඒ විඤ්ඤාණයක් හා සමකොට දුරෙහි වූ ද සමීපයෙහි වූ ද විඤ්ඤාණයෝ දතයුතු.

## පඤ්චස්කන්ධයන්හි ෂොඩශ භේදය

පඤ්චප්‍රකාර වූ ස්කන්ධයන්හි සොළොස් ආකාර වූ භේදය මෙසේ දතයුතු. ඒ සොළොස් ආකාරයෝ නම්:-

1. **සමුග්ගම** වශයෙන් හෙවත් ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චස්කන්ධයන්ගේ හටගැණීම් වශයෙන්ද,

2. **පුබ්බාපර** වශයෙන් ද,

3. **අද්ධාන පරිච්ඡේද** හෙවත් කාලපරිච්ඡේද වශයෙන්ද,

4. **ඒකුප්පාද නානා නිරොධ** හෙවත් එක්ව ඉපදීම් වෙන්ව බිඳීම් වශයෙන්ද,

5. **නානුප්පාද ඒකනිරොධ** හෙවත් වෙන්ව ඉපදීම්, එක්ව බිඳීම් වශයෙන්ද,

6. **ඒකුප්පාද ඒකනිරොධ** හෙවත් එක්ව ඉපදීම්, එක්ව බිඳීම් වශයෙන්ද,

7. **නානුප්පාද නානා නිරොධ** හෙවත් වෙන්ව ඉපදීම් වෙන්ව බිඳීම් වශයෙන්ද,

8. **අතීතානාගත ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ද
9. **අධ්‍යාත්ම බාහිර** වශයෙන් ද,
10. **ඖදාරික සූක්ෂම** වශයෙන් ද,
11. **හීනප්‍රණීත** වශයෙන් ද,
12. **දූරාසන්න** වශයෙන් ද,
13. **ප්‍රත්‍යය** වශයෙන් ද,
14. **සමුට්ඨාන** හෙවත් උත්පත්ති හෙතු වශයෙන් ද,
15. **පරිනිෂ්පන්න** වශයෙන් ද,
16. **සඞ්ඛත** වශයෙන් ද වේ.

මෙසේ සකන්ධයන්ගේ ෂොඩශාකාරය දැක්වීම ප්‍රකීර්ණක කථනය යයි ද, සම්මිශ්‍ර විනිශ්චය යයි ද කියනු ලැබේ.

1. **සමුග්ගම** වශයෙන් වනාහි සකන්ධයන්ගේ ප්‍රතිසන්ධියෙහිදී උත්පාදය නොහොත් ප්‍රථම ප්‍රාදුර්භාවය **ගබ්භසෙය්‍යක සමුග්ගමය, ඕපපාතික සමුග්ගමය** යයි ද්විප්‍රකාර වේ.

**ගබ්භසෙය්‍යක සමුග්ගමය**-මාතෘ ගර්භයෙහි පිළිසිඳ ගැනීම් වශයෙන් හෝනාවූ සත්නට පිළිසිඳගන්නා කෙණෙහි පඤ්චසකන්ධයෝ තුමූ ඉදිරිපසු නොව එක්ව හටගනිත්. ඒ පටිසන්ධික්ෂණයෙහි හට ගත්තාවූ **කලලරූප**

යයි කියනලද රූප සන්තති තොමෝ ඉතා අල්පමාත්‍ර වූවා වේ. කුඩා මැස්සකු විසින් එක්වර පියයුතු බිඳක් පමණ ඇත්තී වේ. ඇතැම් ආචාර්‍යවරු ඒ ප්‍රමාණයද බොහෝය. සියුම්වූ හිදක් තෙලෙහි බහා නගාගත් කල්හි වැගිර හිඳි කෙළවර වැකි තෙල් බිඳ පමණකැයි ද කියති. එයද ඉතා බොහෝය. එක් කෙසක් තෙලෙහි බහා නගාගත් කල්හි ඒ කෙස්හුගේ කෙළවර වැගිර වැකී සිටි තෙල් බිඳ පමණැතැයිද කියති. එයද බොහෝය. මෙහි මිනිසුන්ගේ කෙසක් අට කොටසක් කොට පැළූ කල්හි, ඒ අට කොටස කෙරෙන් උතුරුකුරු දිවයින් වැසි මිනිසුන්ගේ කෙසක් එක් කොටසක් පමණ ඇත්තේය පහන් තලතෙලින් නගාගත් ඒ කෙස්හුගේ කෙළවර වැගිර වැකී සිටි පහන් තලතෙල් බිඳ පමණැතැයිද කියන ලදය. එයද පිළිනොගත් ඇතැම් ආචාර්‍යවරු, ඒ කලලරූපය, හිමවත් පියෙස්හි උපදනාවූ සූක්ෂ්මජාතිමත්වූ එළුවකුගේ ලොම් පිළිබඳවූ පහන් තලතෙලෙහි බහා නගාගත් එක් ලොමයක්හුගේ කෙළවර වැකී සිටි පහන් තලතෙල් බිඳ පමණැතැයිද කියති.

ඒ කලල රූපය වනාහි පහන් වේ. වැඩියක් පහන්වේ. නො කැලඹුනේ වේ. පිරිසිදු වේ. පහන් තලතෙල් බිඳක් බඳු පැහැ සටහන් ඇත්තේ වේ. මෙකී පරිද්දෙන් ඉතා අල්පවූ මේ රූප සන්තතියෙහි වස්තු දසකයද, කාය දසකයද, ස්ත්‍රියහට ස්ත්‍රීන්ද්‍රියගේ වශයෙන් භාව දසකයද, පුරුෂයාහට පුරුෂෙන්ද්‍රියගේ වශයෙන් භාවදසකයද මෙසේ ප්‍රධාන අවයව වූ සන්තති ශීර්ෂයෝ තුනෙක් වෙත්.

ඒ ප්‍රධානාඞ්ග වූ සන්තති රූපයන් අතුරෙහි හදයවස්තු රූපයද, ඒ හදයවස්තු රූපයාගේ නිඃශ්‍රය වූ සතර මහා භූතයෝද, ඒ සතර මහා භූතයන් ඇසුරු කළාවූ වර්ණ, ගන්ධ, රස, ඕජා ද ජීවිතෙන්ද්‍රිය ය ද යන මේ දශ රූපයන්ගේ සමූහය **වස්තු දසක** නම් වේ. කායප්‍රසාදයද, ඒ කායප්‍රසාදයාගේ නිඃශ්‍රයවූ සතරමහා භූතයෝද, ඒ සතර

මහා භූතයන් ඇසුරු කළාවූ වර්ණ, ගන්ධ, රස, ඕජාද ජීවිතෙන්ද්‍රියය ද යන මේ දශ රූපයන්ගේ සමූහය **කාය දශකය** නම් වේ. ස්ත්‍රියගේ ස්ත්‍රී භාවයද, පුරුෂයාගේ පුරුෂ භාවයද, ඒ ස්ත්‍රීභාව පුරුෂභාවයාගේ නිශ්‍රය වූ සතරමහා භූතයෝද, ඒ සතරමහා භූතයන් ඇසුරු කළාවූ වර්ණ, ගන්ධ, රස, ඕජා ද, ජීවිතෙන්ද්‍රියය ද යන මේ දශ රූපයන්ගේ සමූහය **භාව දශකය** නම් වේ.

මෙපරිද්දෙන් ගබ්භසෙය්‍යක හෙවත් ගැබ පිළිසිඳගන්නා සත්නට, ප්‍රතිසන්ධියගේ උත්පාදක්ෂණයෙහි උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් සමත්‍රිංසත් කර්මජ රූපයෝ **රූපස්කන්ධ** නම් වේ. ප්‍රතිසන්ධි චිත්තය හා එක්ව උපදනාවූ වේදනාතොමෝ **වේදනාස්කන්ධ** නම් වේ. ඒ හා එක්ව උපදනා වූ සංඥා තොමෝ, **සංඥාස්කන්ධ** නම් වේ. ඒ හා එක්ව උපදනාවූ සංස්කාරයෝ, සංස්කාරස්කන්ධ නම් වේ. ප්‍රතිසන්ධි චිත්තය තෙමේ **විඥානස්කන්ධ** නම් වේ. මෙපරිද්දෙන්, ගැබ පිළිසිඳ ගන්නා සත්නට ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චස්කන්ධයෝ තුමූ සම්පූර්ණවූවාහු වෙත්. ඉදින් නපුංසක ප්‍රතිසන්ධියක් වේ නම්, භාවදශකය පිරිහෙයි. දෙවැදෑරුම්වූ දශකයන්ගේ වශයෙන් සම විස්සක් කර්මසමුට්ඨාන රූපයෝ තුමූ **රූපස්කන්ධ** නම් වේ. වේදනාස්කන්ධාදීහු කියනලද ප්‍රකාර ඇත්තාහුම වෙත්. මෙපරිද්දෙන්ද, ගබ්භසෙය්‍යක සත්ත්වයන්හට ප්‍රතිසන්ධියගේ උත්පාදක්ෂණයෙහි පඤ්චස්කන්ධයෝ තුමූ සම්පූර්ණ වූවාහු වෙත්.

**ඕපපාතික සමුද්ගමය** – ඕපපාතිකවූ සත්ත්වයන්ට පිළිසිඳ ගන්නා කෙණෙහි යට කියනලද්දවූ ත්‍රිවිධ දශකයෝද, චක්ඛු දශක, සෝත දශක, ඝාණ දශක, ජිව්හා දශකයෝද යන සත්වැදෑරුම් වූ ප්‍රධානාඞ්ග වූ, රූප සන්තති යිම්යෝ පහළ වෙත්. ඒ සත්වැදෑරුම් වූ දශකයන් අතුරෙන් චක්ෂුර්දශකාදීහු කාය දශකය හා සමාන වූවාහුම වෙත්. නපුංසක වූ සත්නට වනාහි භාවදශකය නැත. මෙපරිද්දෙන් පරිපූර්ණායතන ඇති ඕපපාතිකවූ සත්නට සම-

සැත්තෑවක් වූ කර්මජ රූපයෝද, **රූපස්කන්ධ** නම් වේ. වේදනාස්කන්ධාදීහු කියනලද ප්‍රකාර ඇත්තාහුම ය. මෙපරිද්දෙන් ඕපපාතික වූ සත්නට පිළිසිඳ ගන්නා කෙණෙහි පඤ්චස්කන්ධයෝ තුමූ සම්පූර්ණ වූවාහු වෙත්. මේ වනාහි **ඕපපාතික සමුගගම** හෙවත් ඕපපාතික වූ සත්නට ප්‍රථමයෙන් රූපයන් පහළවීම නම් වේ. මෙපරිද්-දෙන් පළමුකොට පඤ්චස්කන්ධයෝ **සමුග්ගම** හෙවත් ප්‍රථමෝත්පත්ති වශයෙන් දතයුත්තාහ.

2 **පුබ්බාපර** වශයෙන් වනාහි ගබ්භසෙය්‍යක සත්ත්ව-යන්ගේ ඉදිරිපසු නොව උපන්නාවූ පඤ්චවිධ වූ ස්කන්ධයන් අතුරෙහි, රූපය තෙමේ රූපය පළමුකොට හටගන්වාද නැතහොත් නාමය තෙම රූපය හටගන්වාද, මෙසේ විචාරීමක් ඇතිකල්හි රූපය තෙමේම රූපය පළමුකොට හටගන්වයි. නාමය තෙමේ නොහටගන්වයි කිවයුතු. එයට හේතුව නම් පටිසන්ධි චිත්තය රූපජනක නොවන බව හෙවත් රූප නොහටගන්වන බැවිනි.

සියළුම සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි චිත්තයද, රහතන් වහන්සේගේ චුති චිත්තයද, දෙපස් විඤ්ඤාණයෝද සතර අරූප විපාක චිත්තයෝද යන මේ සොළොස් විපාක චිත්තයෝ තුමූ රූපය නොහටගන්වත් ඔවුන් අතුරෙන් ප්‍රතිසන්ධි චිත්තය තෙම නිඃශ්‍රයවූ වස්තු රූපයාගේ දුබල බැවින්ද, නොපිහිටි බැවින්ද, ප්‍රත්‍යවෛකල්‍යතායෙන්ද, ආගන්තුග බැවින්ද රූපය නොහටගන්වයි.

ප්‍රතිසන්ධික්ෂණයෙහි සහජාතවූ හෘදයවස්තු රූපය තෙම උත්පාදක්ෂණයෙහි දුබල වේ මෙසේ වස්තු රූපයාගේ දුබල බැවින් රූපය නූපදවයි. ප්‍රපාතයෙහි පතිතවන්නාවූ පුරුෂ යෙක් අන් පුරුෂයකු හට පිටිවහලෙක් වන්නට නොහැකි වන්නේ යම්සේද, එපරිද්දෙන් ඒ ප්‍රතිසන්ධි චිත්තය තෙමේද කර්ම වේගයෙන් බහාලන ලද බැවින් ප්‍රපාතයෙහි ගිලිහෙන්-නක්හු මෙන් නොපිහිටියේ වේ. මෙසේ කර්ම ශක්තියෙන් බහාලන ලද බැවින් නොපිහිටි බැවිනුදු රූපය නූපදවයි.

ප්‍රතිසන්ධි චිත්තය තෙමේද හදයවස්තු රූපය හා සමග පෙර පසු නොව උපන් බැවින්, ඒ ප්‍රතිසන්ධි චිත්තයට හදයවස්තු රූපය තෙම පුරේජාතව හෙවත් පෙරාතුව ඉපිද ප්‍රත්‍ය වන්නට නොහැක්කේය. ඉදින් ප්‍රත්‍යවනු හැක්කේ නම් ප්‍රතිසන්ධි චිත්තය රූපය උපදවන්නේය. පඤ්චවොකාර භවයෙහිදු රහතුන්ගේ චුති චිත්තය තෙම පුරේජාත ප්‍රත්‍යය ලදුයේවි නමුත් භවයෙන් භවය ගැළපීමක් නැති හෙයින් රූපය නූපදවයි. ද්විපඤ්ච විඥ්ඤාණයෝ තුමූ පුරේජාත-ප්‍රත්‍යය ලද්දාහු නමුත් ධ්‍යානාඞ්ග මාර්ගාඞ්ගයන්ගෙන් පිරිහුණු බැවින් රූප නූපදවත්. ප්‍රතිසන්ධි චිත්තය තෙමේ උත්පාද-ක්ෂණයෙහි පුරේජාත ප්‍රත්‍යය නොලත් බැවින් රූපය නූපදවයි. එහි ස්ථිතික්ෂණ භඞ්ගක්ෂණ දෙක්හි උත්පාදක්ෂණ යෙහි වූ වස්තු රූපය කෙරෙන් ලත් පුරේජාත ප්‍රත්‍යය ශක්තිය ඇති බැවින් ස්ථිති භඞ්ගක්ෂණවයෙහි රූපය ඉපැද්විය යුතුයි. නමුත් රූපය නූපදවයි. චිත්තය තෙම ස්ථිතික්ෂණ-යෙහි හෝ භඞ්ගක්ෂණයෙහි හෝ රූපය උපදවන්නේ නම්, පටිසන්ධි චිත්තයද රූපය උපදවන්නේය. එකාන්ත වශයෙන් චිත්තය තෙම ඒ ස්ථිති භඞ්ගක්ෂණවයෙහි රූපය නූපදවයි. හතු කැකුළෙක් පොළොවෙන් මතුවන්නේ, පස්ඳුණු ඔසවාගෙනම මතුවන්නේ යම්සේද, එපරිද්දෙන් චිත්තය තෙම පූර්වයෙහි ජාතවූ වස්තු රූපය නිඃශ්‍රයකොට උත්-පාදක්ෂණයෙහි අටවැදෑරුම්වූ අවිනිර්භොග රූපයන් ගෙනම උපදනේයි. ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහිම හදයවස්තු රූපය තෙමේ පුරේජාතව ඉපිද ප්‍රත්‍යවන්නට නොහැකි වේ. මෙසේ ප්‍රත්‍යයන් විකල බැවිනුදු ප්‍රතිසන්ධි චිත්තය තෙමේ රූපය නොහටගන්වයි.

තවද, ප්‍රතිසන්ධි චිත්තය, ආගන්තුග පුරුෂයෙකු හා සමාන යයි ද කියනු ලැබේ. ආගන්තුග පුරුෂයෙක් තෙමේ නො ආවිරූ ප්‍රදේශයකට ගියේ, අන්කිසිවකුන්හට, පින්වතුනි එව්, ඇතුල්ගම තොපට ආහාර, පැන්, ගඳමල් ආදින් දෙන්නෙම්යි තමහට නුපුරුදු හෙයින් අගොචරස්ථාන බැවිනුදු, අසමර්ථ බැවිනුදු, ආගන්තුග බැවිනුදු කියන්ට

නොහැකි වන්නේ යම්සේද, එපරිද්දෙන්ම ප්‍රතිසන්ධි චිත්තය තෙම ආගන්තුග වේනුයි, තමාගේ ආගන්තුග බැවිනුදු රූපය නූපදවයි. තවද, ඒ සමතිස් කම්ම සමුට්ඨාන රූපයෝ තුමූ, චිත්තසමුට්ඨාන රූපයන්ගේ ස්ථානය ගෙන සිටියහ. එසේ සිටි හෙයිනුදු ප්‍රතිසන්ධි චිත්තය තෙමේ රූපය නූපදවයි.

රහතන් වහන්සේගේ වනාහි චුති චිත්තය තෙම තෘෂ්ණා අවිද්‍යා සඞ්ඛ්‍යාතවූ වෘත්තදුක්ඛමූලය, සන්හුන් බැවින් රූපය නූපදවයි. ඒ රහතන්වහන්සේට සියළු භවයන්හි තෘෂ්ණා අවිද්‍යා සඞ්ඛ්‍යාත වෘත්තදුක්ඛමූලය තෙම සන්සිඳුනේ වේ. අනාගතභව්‍ය වූ උත්පත්ති ඇත්තේ නොහොත් නැවත උපදින්නට නුසුදුසු වනුයේ වේ. පුනර්භව සන්තතියක් නම් නැත. සෝවාන් පුද්ගලයාහට වනාහි අත්බැව් සතක් තිබියදී අටවැනි වූ අත්බැවෙහි තෘෂ්ණා අවිද්‍යා සඞ්ඛ්‍යාත වෘත්ත දුක්ඛ මූලය තෙම සන්හුන් වේ. එහෙයින් ඒ සෝවාන් පුද්ගලයාගේ චුති චිත්තය තෙම සත්වැදෑරුම් වූ අත්බැව්හි රූපය උපදවයි. සකෘදාගාමි පුද්ගලයාගේ චුති චිත්තය තෙමේ විවිධවූ භවයන්හි හෙවත් උභයාත්මභාවයන්හි රූපය උපදවයි. අනාගාමි පුද්ගලයාගේ චුති චිත්තය තෙමේ එක් අත්බැවෙක්හි රූපය උපදවයි. රහත් පුද්ගලයාගේ චුති චිත්තය තෙම සියළු භවයන්හි තෘෂ්ණා අවිද්‍යා සඞ්ඛ්‍යාත වෘත්ත මූලය සන්සිඳීම කළ බැවින් රූපය නූපදවයි.

විපක්ඛව විඤ්ඤාණ චිත්තයන්හි වනාහි ධ්‍යානාඞ්ගයෙක් නැත. මාර්ගාඞ්ගයෙක් නැත. සම්ප්‍රයුක්ත හේතුවෙක් නැත. ඒහෙයින් චිත්තාඞ්ගය තෙමේ දුබල වූයේ වේ. මෙසේ චිත්තාඞ්ග දුර්වලතායෙන් ඒ විපක්ඛව විඤ්ඤාණයෝ තුමූ රූපය නූපදවත්. සතර අරූප විපාක චිත්තයෝ තුමූ ඒ අරූප භවයෙහි ඉපැද්දවියයුතු රූපයක්හුගේ නැති බැවින්, රූපය නූපදවත්. ඒ පමණක් නොව ඒ අරූප භවයෙහි, කාමාවචර කුසල් සිත් අටදෙනද, ද්වේෂමූල සිත් දෙකහැර ඉතිරි අකුසල් සිත් දසදෙනද, ක්‍රියා සිත් නවදෙනද,

අරූපාවචර කුසල් සිත් සතරදෙනද, සෝවාන් මාර්ග සිත හැර ඉතිරි මාර්ග සිත් තිදෙනද, ඵල සිත් සතරදෙනද යන මේ දෙසාළිස් චිත්තයෝ, ඒ අරූප භූමියෙහි නිඃශ්‍රය වූ වස්තු රූපයක්හුගේ නොහොත් ඉපැද්දවියයුතු රූපයක්හුගේ නැති බැවින්ම රූපය නූපදවත්. මෙකියන ලද කයින් ප්‍රතිසන්ධි චිත්තය තෙම රූපය නූපදවන බව දතයුතු.

පිළිසිඳගන්නා කෙණෙහි උපන්නාවූ සමතිස් කර්මසමුට්ඨාන රූපයන්ගේ අභ්‍යන්තරයෙහි වූ තෙජෝ ධාතුවක් ඇත. එයට **ඍතු** යයි කියති. ඒ තෙජෝ ධාතුතොමෝ ප්‍රතිසන්ධියේ ස්ථිතික්ෂණයට පැමිණ, අෂ්ටවිධ අවිනිර්භොග රූපයන් උපදවයි. ඒ ඍතුව හෙවත් තෙජෝ ධාතුව පවත්නා කල්හිම සිත් සොළොසක් ඉපිද නිරුද්ධ වෙත්. ඒ සොළොස් චිත්තයන් අතුරෙන් ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුවූ පළමුවන භවාඞ්ග චිත්තය තෙම උත්පාදක්ෂණයෙහිම අෂ්ටවිධ අවිනිර්භොග රූපයන් උපදවයි. යම් කලෙක්හි ශබ්දයාගේ උපදනා කලෙක් වන්නේද එකල්හි ඍතු චිත්තයෝ තුමූ ශබ්ද නවකය නම් වූ රූපකලාපය උපදවන්නාහුය. කබලීකාරාහාරය තෙමේද චිත්තයාගේ ස්ථිතික්ෂණයට පැමිණ අෂ්ටවිධ අවිනිර්භොග රූපයන් උපදවයි. ඒ මව ගැබ තුළ හොත් ළදරුවාහට කබලීකාරාහාරය මවගෙන් ලැබේ. ඒ මාතෘ ගර්භයෙහි පිළිසිඳගත් ළදරුවාගේ මවුතොමෝ යම් බතකුත් යම් පැනකුත්, යම් භොජනයකුත් අනුභව කරාද, ඒ ආහාරය කරණකොටගෙන මව් කුස පිළිසිඳගත්තාවූ ඒ ළදරු වූ සත්ත්ව තෙමේ, ඒ මාතෘ ගර්භයෙහි යැපෙයි. මෙපරිද්දෙන් මව් කුස පිළිසිඳ ගත්තාවූ ළදරු තෙමේ මව විසින් අනුභව කළාවූ, පානය කළාවූ, ආහාරපාන ඕජාව කරණකොටගෙන යැපේද, ඒ ඕජා තොමෝ ස්ථිතික්ෂණයට පැමිණ, අෂ්ටවිධ අවිනිර්භොග රූපයන් උපදවයි.

මව විසින් අනුභව පානය කළාවූ ආහාරපාන ඕජා තොමෝ මව්කුස හොත් ළදරුවාගේ සිරුරෙහි පිහිටීමට

සප්තාහ එකක් හෝ දෙකක් හෝ එයට අඩුවැඩි කලක් ගතවේ. එසේ ළදරුවාගේ සිරුරෙහි පිහිටි ඒ ඕජා තොමෝ අෂ්ටවිධ අවිනිර්භෝග රූපයන් උපදවයි. ප්‍රකෘතියෙන්ම පිළියෙළවූ ඛාද්‍යභොජ්‍යයන්ගේ ඇති තැන උපන්නාවූ ඒ ඛාද්‍යභොජ්‍යයන් ගෙන අනුභව කරන්නාවූ ඕපපාතිකවූ සත්ත්වයාටද ස්ථිතික්ෂණයට පැමිණියාවූ ඕජා තොමෝ රූප උපදවයි. එක් ඕපපාතික සත්ත්වයෙක් තෙම බත්පැන් නැත්තාවූ වනයෙහි උපදීද, මහත්වූ සාදුක් ඇත්තේවේද, තමාගේ කෙළ, දිව කරණකොටගෙන පෙරළා ගිලීද, එසේ කෙල ගිල බුදින කාලයෙහිත් ඒ ඕපපාතික සත්ත්වයාහට ස්ථිතික්ෂණයට පැමිණියාවූ ඕජාතොමෝ රූපය උපදවයි. මෙසේ පස්විසි වැදෑරුම්වූ රූප කොටස් අතුරෙන් තෙජොධාතු තොමෝද, කබලීකාරාහාරය තෙමේද යන මේ රූපයෝ දෙදෙනහුම රූප උපදවත්.

නාම ධර්මයන් අතුරෙන් චිත්තය තෙමේත්, කර්මය යයි කියනලද චෙතනා තෙමේත් යන මේ ධර්මයෝ දෙදෙනාද රූප උපදවත්.

රූප, චිත්ත, කර්මචෙතනා සඞ්ඛ්‍යාත රූපජනක ප්‍රත්‍යයන් අතුරෙන් රූපය තෙම උත්පාදක්ෂණයෙහිද, භඞ්ගක්ෂණයෙහිද දුබල වේ. ස්ථිතික්ෂණයේදී බලවත් වේ එහෙයින් ස්ථිතික්ෂණයෙහිම රූපය උපදවයි නානාක්ෂණික කර්ම චෙතනා තොමෝ නිරුද්ධවූවාම ප්‍රත්‍යවනුයේ වේ. අතීත කාලයෙහි කප්කෙළ ලක්ෂයකින් මත්තෙහිදු සකස් කරන ලද්දාවූ කර්මය තෙම මේ වර්තමාන භවයෙහිද නොහොත් මේ වර්තමාන භවයෙහි සකස් කරණ ලද කර්මය තෙම අනාගත කාලයෙහි කප්කෙළ ලක්ෂයකින් අවසන්හිද ප්‍රත්‍ය වන්නේ වේ. මෙපරිද්දෙන් පූර්වාපර වශයෙන් පඤ්චස්කන්ධයෝ තුමූ දත යුත්තාහ

3. අද්ධාන පරිච්ඡෙද වශයෙන් වනාහි රූපයතෙම කොපමණ කලක් පවතීද, නාමය තෙම කොපමණ

කලක් පවතීදැයි විනිශ්චය කටයුතු. රූපය තෙම ගරු පරිණාමය හෙවත් ගරුකාවූ ජරා විකෘතිය ඇත්තේය. දන්ධ නිරොධය හෙවත් ලස්වූ බිඳීම් ඇත්තේය. නාමය තෙම ලහුපරිණාම හෙවත් ලඝුවූ ජරා විකෘතිය ඇත්තේය. ඛිප්පනිරොධය හෙවත් නොලස්වූ බිඳීම් ඇත්තේය. රූපය පවත්නා කල්හිම සිත් සොළොස් දෙනෙක් ඉපිද නිරුද්ධ වෙත්. ඒ රූපය තෙම සතළොස්වන සිත හා සමග බිඳෙයි. පුරුෂයෙක් තෙම පල නෙලන්නෙමියි මෙතෙකි කොට මුගුරකින් වෘක්ෂ ශාඛාවට ගසානම් ඵලද පත්‍රයෝ ද එකවරම නටුවෙන් මිදෙන්නාහුය. ඒ ඵල පත්‍රයන් අතුරෙන් ඵලයෝ තුමූ තමාගේ බර බැවින් ඉතා පළමුව පෘථිවියෙහි යම්සේ පතිත වෙත්ද පත්‍රයෝ සැහැල්ලු බැවින් පසුව යම්සේ පතිත වෙත්ද, එපරිද්දෙන්ම පොළු පහරින් පත්‍රයන්ගේ ද, ඵලයන්ගේ ද එකවිටම නටුවෙන් මිදුනු කල මෙන් පිළිසිඳ ගන්නා කෙණෙහි නාමරූප ධර්මයන්ගේ එකවට පහළවීම දතයුතු. ඵලයන්ගේ බර බව කරණ කොට ගෙන වැඩියක් පළමු පෘථිවියෙහි පතිතවීම මෙන් රූපය පවත්නා කල්හිම සොළොස්වැදෑරුම් වූ චිත්තයන්ගේ ඉපිද නිරුද්ධවීම දතයුතු. පත්‍රයන්ගේ සැහැල්ලු බව හේතු කොට ගෙන පසුව පෘථිවියෙහි පතිතවීම මෙන් රූපයාගේ, සතළොස් වැනිවූ සිත හා සමග නිරුද්ධවීම දතයුතු.

ඒ රූප ධර්ම නාම ධර්මයන් අතුරෙන් රූපයතෙම ගරු පරිණාමය හා දන්ධනිරොධය ඇත්තේ වේ ද නාමය තෙම ලහුපරිණාමය හා ඛිප්පනිරොධය ඇත්තේ වේ ද, එසේවී නුමුත් රූපය තෙමේ නාමයද, නාමය තෙමේ රූපයද හැර පවත්නට නොහැකි වෙත්. නාම රූප උභය ධර්මයන්ගේ වශයෙන් සම ප්‍රමාණ ඇත්තාවූම ප්‍රවෘත්ති තොම වේ. එක් පුරුෂයෙක් තෙම ලුහුඬු වූ පා ඇත්තේය. එක් පුරුෂයෙක් තෙම දික්වූ පා ඇත්තේය. ඒ පුරුෂයන් දෙදෙනා එකතුව මගයන කල්හි යම් පමණ කලෙකින් දික්වූ පා ඇති පුරුෂතෙම එක් පියවරක් යන්නේද, එපමණ කාලෙකින් ලුහුඬු පා ඇති පුරුෂතෙම

සොළොස් පියවරන් යෙයි. දික්වූ පා ඇති පුරුෂතෙම ලුහුඬු වූ පා ඇති පුරුෂයාගේ සොළොස් පියවරෙහි තමාගේ පාදය ඇද නගා එකම වූ පියවරක් කෙරෙයි. මෙසේ ඇති කල්හි එක් පුරුෂයෙකුදු එක් පුරුෂයක්හු ඉක්මවා යන්ට නොහැකි වන්නේය. පුරුෂයන් දෙදෙනාගේ වනාහි ගමන සම ප්‍රමාණ ඇත්තේ වේ. එපරිද්දෙන් ලුහුඬු පා ඇති පුරුෂයා මෙන් නාමය තෙම දතයුතු. දික්වූ පා ඇති පුරුෂයා මෙන් රූපය තෙම දතයුතු. දික්වූ පා ඇති පුරුෂයාගේ එක් පියවරක් යන කාලයෙහි අනික් ලුහුඬු පා ඇති පුරුෂයාගේ සොළොස් පියවර යාම මෙන් රූපය පවත්නා කල්හිම නාම ධර්‍මයන්හි අනනාගීත වූ සොළොස් වැදෑරුම් වූ චිත්තයන්ගේ ඉපිද නිරුද්ධ වීම දතයුතු. පුරුෂයන් දෙදෙනා අතුරෙන් ලුහුඬු පා ඇති පුරුෂයාගේ සොළොස් පියවරයෙහි දික්වූ පා ඇති පුරුෂයාගේ තම පය ඇද නගා එක් පියවරක් කිරීම මෙන් රූපයාගේ සතළොස්වැනි වූ සිත හා සමග නිරුද්ධවීම දතයුතු. පුරුෂයන් දෙදෙනාගේ ඔවුනොවුන් නොයික්මවා සම ප්‍රමාණයෙන්ම ගමන මෙන් නාමයාගේ රූපය, රූපයාගේ නාමය නොයික්මවා සම ප්‍රමාණයෙන්ම පැවැත්ම දතයුතු. මෙසේ අද්ධාන පරිච්ඡේද කාලය පිරිසිඳීම් වශයෙන් පඤ්චස්කන්ධයෝ තුමූ දත යුත්තාහ.

4. **එකුප්පාද නානා නිරොධය**-පළමු කොට ප්‍රතිසන්ධි චිත්තය උපදී. දෙවනුව භවාඞ්ග චිත්තය උපදනේය. මෙතැන් සිට තුන්වනුව භවාඞ්ග චිත්තය, සතරවනුව භවාඞ්ග චිත්තය යනාදී ක්‍රමයට සොළොස්වනුව භවාඞ්ග චිත්තයද උපදී. ඒ සොළොස් චිත්තයන් අතුරෙන් එක් එක් සිතක්හුගේ උත්පාද ස්ථිති භඞ්ග වශයෙන් තුන් තුන් ක්ෂණ කෙනෙක් වෙත්. ඒ සොළොස් චිත්තයන් අතුරෙන් එක් එක් සිතක්හුගේ තුන් තුන් වැදෑරුම්වූ ක්ෂණයන්හි සමතිස් සමතිස් කර්‍මජ රූපයෝ තුමූ උපදිත්. ඒ සමතිස් කර්‍මජ රූපයන් අතුරෙහි ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි පහළවූ කර්‍මජ රූපයතෙම සතළොස්වැනිවූ භවඞ්ග

චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ම බිඳෙයි. ප්‍රතිසන්ධි චිත්තයාගේ ඨිතික්ෂණයෙහි පහළවූ කර්මජ රූපය තෙම සතළොස් වැනිවූ භවඞ්ග චිත්තයාගේ ඨිතික්ෂණයෙහිම බිඳෙයි. ප්‍රතිසන්ධි චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි පහළවූ කර්මජරූපය තෙම සතළොස්වැනි වූ භවඞ්ග චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහිම බිඳෙයි. මෙසේ දෙවෙනිවූ භවඞ්ග චිත්තය පටන් කොට, තමතමාගේ සතළොස්වැනිවූ චිත්තය හා සමග යොදා මේ කර්මජ රූපයන්ගේ පහළවීම දතයුතු. මේ ක්‍රමයෙන් සොළසත්‍රිකයෝ තුමූ අටසාළිස්ත්‍රික කෙනෙක් වෙත්. ඒ අටසාළිසක්වූ කර්මජ රූප ප්‍රවෙණිතොමෝ වනාහි රාත්‍රියෙහිද දහවල්හිද කැවිලි ආදිය කන්නවුන්ටත්, බත් ආදිය බුදින්නවුන්ටත්, නිදන්නවුන්ටත්, සිහි මුළාවූවන්ටත්, ගලාබස්නාවූ ගංවතුරක් මෙන් පිළිවෙළ නොසිඳ පවත්නීමැයි. එපරිද්දෙන් එක්ව ඉපදීම් වෙන්ව බිඳීම් හෙවත් එකුප්පාද නානා නිරොධය දතයුතු.

5. **නානුප්පාද එක නිරොධය** – ආයු සංස්කාරාවසාන - යෙහි සොළොස් විධවූ චිත්තයන්ගේ චර පැමිණි කල්හි යට ෂොඩශකය මත්තෙහි ෂොඩශකය යන මේ ෂොඩශකයෝ දෙදෙන එක්කොට ගැළපිය යුතුය අවසානයෙහි උපදනා සිත් සොළොස්දෙන මත්තෙහිවූ ෂොඩශකය නම්. එයට පෙර උපදනා සිත් සොළොස්දෙන යට ෂොඩශකය නම්. යට ෂොඩශකයෙහි ප්‍රථම චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි පහළවූ සමතිස් කර්මජ රූපය තෙම මත්තෙහි වූ ෂොඩශකයෙහි ප්‍රථම චිත්තයාගේ උත්පාදක්ෂණයෙහිම බිඳෙයි. ස්ථිතික්ෂණයෙහි පහළවූ සමතිස් කර්මජ රූපය තෙම ඒ උපරිෂොඩශකයෙහි ප්‍රථම චිත්තයාගේ ස්ථිතික්ෂණයෙහිම බිඳෙයි. භඞ්ගක්ෂණයෙහි පහළවූ සමතිස් කර්මජ රූපය තෙම ඒ උපරිෂොඩශකයෙහි ප්‍රථම චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි බිඳෙයි. යට සිටි ෂොඩශකයෙහි වනාහි දෙවෙනිවූ චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි පහළවූ සමතිස් කර්මජරූපය තෙම ඒ උපරිෂොඩශකයෙහි දෙවෙනි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි බිඳෙයි. මේ පිළිවෙළින් යට

ෂොඩශකයෙහි සොළොස්වනුවූ චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි පහළවූ සමතිස් කර්මජ රූපයතෙම, චුති චිත්තයාගේ උත්පාදක්ෂණයෙහිම බිඳෙයි. යට සිටි ෂොඩශකයෙහි සොළොස්වන චිත්තයාගේ ස්ථිතික්ෂණයෙහි පහළවූ සමතිස් කර්මජ රූපය තෙම චුති චිත්තයාගේ ස්ථිතික්ෂණයේදී බිඳෙයි. එහි භඞ්ගක්ෂණයෙහි පහළවූ සමතිස් කර්මජ රූපය තෙම චුති චිත්තයාගේ භඞ්ගක්ෂණයේදී බිඳෙයි. ඒ කර්මජ රූපනිරොධයෙන් ඔබ්බෙහි කර්මජ රූපයන්ගේ පරම්පරා තොමෝ නොපවතී. ඉදින් කර්මජ රූප ප්‍රවේණි තොමෝ පවත්නී නම් සත්ත්වයෝ ජීවිතක්ෂය නොවන්නෝ විනාශ නොවන්නෝ, නොදිරන්නෝ, නොමැරෙන්නෝ නම් වන්නාහුය. මේ නයින් එක් සිතක්හුගේ උත්පාදක්ෂණයෙහි උපන්නාවූ රූපය තෙම අන් සිතක්හුගේ උත්පාදක්ෂණයෙහි බිඳෙයි.

**කායසංස්කාරය** තෙම චිත්තසමුත්ථානවූ හෙවත් චිත්තය හෙතුකොටගෙන උපදනාවූ ආශ්වාස ප්‍රශ්වාස වාතය නම්. මේ චිත්ත සමුට්ඨාන රූපය චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ඉපිද යම්තාක් කල් අන්‍යවූ සොළොස් සිත් කෙනෙක් උපදිද්ද, ඒ තාක්කල් පවතී. ඒ සොළොස් සිත් අතුරෙන් සියලු සිත්නට පැසුළුව උපන් සිත හා සමග නිරුද්ධ වෙයි. මෙසේ යම් සිතක් හා සමග ඉපදී, ඒ තමාගේ ඉපැද්මට හේතුවූ චිත්තයෙහි පටන් සතළොස් වන සිත සමග බිඳෙයි. කිසියම් සිතක්හුගේ උත්පාදක්ෂණයෙහි හෝ ඨිතික්ෂණයෙහි හෝ නොබිඳෙයි. කිසියම් සිතක්හුගේ ස්ථිතික්ෂණයෙහි හෝ භඞ්ගක්ෂණයෙහි හෝ නූපදී. මෙය චිත්ත සමුට්ඨාන රූපයාගේ ස්වභාවයයි. මෙ පරිද්දෙන් චිත්ත සංස්කාරය හා සමග කාය සංස්කාරයාගේ බිඳීම වන බව දතයුතු.

චිත්තසමුත්ථාන රූපයාගේ යම් ක්ෂණ නියමයෙක් වේද, කම්ම සමුත්ථානාදී රූපයාගේ ද ක්ෂණ නියමය එසේම දතයුතු. එහෙයින් පටිසන්ධි චිත්තය හා සමග

උපන්නාවූ කර්මජ රූපය තෙම ඒ ප්‍රතිසන්ධි චිත්තයෙහි පටන්ගෙන සතළොස්වන සිත හා සමග නිරුද්ධ වෙයි. ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිතික්ෂණයෙහි උපන්නාවූ කර්මජ රූපය තෙම අටළොස්වනුවූ චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි බිඳෙයි. ප්‍රතිසන්ධි චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි උපන්නාවූ කර්මජ රූපයතෙම අටළොස්වනුවූ චිත්තයාගේ ස්ථිතික්ෂණයෙහි බිඳෙයි.

මෙසේ අවසාන වූ හෙවත් පශ්චිම වූ කර්මජරූපයාගේ නිරෝධයෙන් මත්තෙහි චනාභි ඍතුජ රූප පරම්පරා තොමෝම පවතී. ඒ චුතියෙන් මත්තෙහි මෘතදෙහයයි කියන ලද ඍතුජ රූප කලෙබරය ඉවහට ගෙනගොස් ආදාහන කරව් යයි කිවයුතු වේ.

මෙකී නයින් නානුප්පාද ඒක නිරෝධ වශයෙන් පඤ්චස්කන්ධයෝ තුමූ දතයුත්තාහ.

6. **ඒකුප්පාද ඒක නිරෝධය** – **රූපය** තෙම චනාභි රූපය හා සමග සමානවූ ඉපදීම් ඇත්තේය. සමානවූ බිඳීම් ඇත්තේය. **නාමය** තෙම නාමය හා සමග සමානවූ ඉපදීම් ඇත්තේය. සමානවූ බිඳීම් ඇත්තේය මෙපරිද්දෙන් ඒකුප්පාද ඒකනිරෝධ වශයෙන් හෙවත් එක්ව ඉපදීම් එක්ව බිඳීම් වශයෙන් පඤ්චස්කන්ධයෝ තුමූ දතයුතු.

7. **නානුප්පාද නානා නිරෝධය**-පත්ලෙන් මත්තෙහි කෙසගින් යට සම පිරියත්කොට ඇත්නාවූ මේ ශරීරයාගේ ඒ ඒ තන්හි හෙවත් ඒ ඒ අවයවයෙහි චතුර්විධ සන්තති රූපය තෙම සම්පූර්ණ භාවයෙන් පවතී. මෙපරිද්දෙන් පවත්නාවූද ඒ චතුසන්තති රූපයාගේ එකොත්පාදදිභාවය නොසැලකිය යුත්තීය. ගමන් ගත් වේයන් රැසක් හෝ ගමන්ගත් කුහුඹුවන් රැසක් හෝ තරඹනු ලබන්නී ඒකාබද්ධ වූවාක් මෙන් පෙණෙතු ලබන නමුත් ඔව්හු ඒකාබද්ධ වූවා නොවේ. එක් කුහුඹුවන් පෙළකගේ හිස ළඟ එක් කුහුඹුවන් පෙළකගේ හිසද, කුසද, පාදයෝද යම්සේ

වෙත්ද, එක් කුහුඹුවන් පෙළකගේ කුස ලඟ එක් කුහුඹුවන් පෙළකගේ හිසද, කුසද, පාදයෝ ද යම් සේ වෙත්ද, එක් කුහුඹුවන් පෙළකගේ පා ලඟ එක් කුහුඹුවන් පෙළකගේ හිසද, කුසද, පාදයෝද යම්සේ වෙත්ද, එපරිද්දෙන්ම චතුර්විධ සන්තති රූපයන්ගේද, අන්‍ය වූ රූපයක්හුගේ උත්පාදක්ෂණයෙහි අන්‍යවූ රූපයක්හුගේ ඉපදීමද, සිටීසද, නිරුද්ධයද වේ. අන්‍යවූ රූපයක්හුගේ සිටීක්ෂණයෙහි අන්‍ය වූ රූපයක්හුගේ ඉපදීමද, සිටීයද, බිඳීමද වේ. අන්‍යවූ රූපයක්හුගේ භඞ්ගක්ෂණයෙහි අන්‍යවූ රූපයක්හුගේ ඉපදීමද, සිටීයද, බිඳීමද වේ. එපරිද්දෙන් වෙන්ව ඉපදීම්, වෙන්ව බිඳීම් වශයෙන් චතුසන්තති රූපයාගේ නානුප්පාද නානානිරොධතාවය දතයුතු.

අතීතානාගත ප්‍රත්‍යුත්පන්න, අධ්‍යාත්ම බාහිර, ඖදාරික සූක්ෂ්ම, හීන ප්‍රණීත, දූරාසන්න වශයෙන්, පඤ්චස්කන්ධයන්ගේ විභාගය යට දක්වනලද පරිද්දෙන්ම දතයුතු.

ප්‍රත්‍ය වශයෙන් හා සමුට්ඨාන වශයෙන් සකන්ධයන්ගේ විභාගය රූප කාණ්ඩයෙහි විස්තර කරනලදී.

**පරිනිෂ්පන්න** වශයෙන් වනාහි පඤ්චස්කන්ධයෝ ප්‍රත්‍යයන් විසින් පිරිසිඳිනලද්දුව නිෂ්පාදනය කළාහුම වෙත්. අපරිනිෂ්පන්න හෙවත් ප්‍රත්‍යයන් විසින් නොපිරිසිඳිනලද්දුව නිෂ්පාදනය කළාහු නොවෙත්.

**සඞ්ඛත** වශයෙන් වනාහි ප්‍රත්‍යයන් විසින් සකස්කොට කරනලද්දාහුම වෙත්. අසඞ්ඛත හෙවත් ප්‍රත්‍යයන් විසින් සකස්කොට නොකරණ ලද්දාහු නොවෙත්.

පරමාර්ථ ධර්මයන් අතුරෙන් හුදකලාවූ නිර්වාණයම ප්‍රත්‍යයන් විසින් පිරිසිඳ නිෂ්පාදනය නොකළාවූ අර්ථයෙන් අපරිනිප්පන්න නම්ද වේ.

**නිරොධ සමාපත්ති තොමෝ** ලෞකිකය, ලොකොත්තරය කියාත්, සඞ්ඛතය අසඞ්ඛතය කියාත්, පරිනිෂ්පන්නය අපරිනිෂ්පන්නය කියාත් නොකියයුත්තීය. සමවදනා පුද්ගලයා විසින් සමවැද්දයුතු **වන** බැවින් නිෂ්පන්න වූවා නම් වේ. **නාම ප්‍රඥප්ති තොමෝද එසේමැයි.** එහිද ලෞකිකාදී ප්‍රභෙදයක් නැත. යම් හෙයකින් නාමග්‍රහණය ගන්නා තැනැත්තේම ගණිද එහෙයින් නිෂ්පන්න වූවා නම් වේ. අනිෂ්පන්න වූවා නම් නොවේ.

මේ සකන්ධයන්ගේ ප්‍රකීර්ණක කථනය වේ.

තවද පඤ්චවිධ වූ සකන්ධයන්හි **ක්‍රම** වශයෙන් හෙවත් පටිපාටි වශයෙන්ද, එයින් අන්‍යවූ **විශෙෂ** වශයෙන්ද, **අනූනාධික** වශයෙන් ද, **උපමා** වශයෙන් ද විභාගය දතයුතු.

**ක්‍රම වශයෙන්** වනාහි, උත්පත්ති ක්‍රමය, ප්‍රහාණක්‍රමය, ප්‍රතිපත්ති ක්‍රමය, භූමි ක්‍රමය, දෙශනා ක්‍රමය යන ආදී වශයෙන් මේ සකන්ධයන්ගේ විභාගක්‍රමය බොහෝවූ ප්‍රකාර ඇත්තේය.

මේ ක්‍රමයන් අතුරෙන්, ප්‍රථමකොට කලල රූපය වෙයි. ඒ කලල රූපය අර්බුධ අවස්ථාව වෙයි යනාදි ක්‍රමය තෙම **උත්පත්ති ක්‍රමය** නම් වේ.

**දර්ශනයයි** කියන ලද සොවාන් මගින් පැහිය යුතු පාපධර්මයෝය, **භාවනායයි** කියන ලද උපරිමාර්ගත්‍රයෙන් පැහිය යුතු පාපධර්මයෝය යන මේ ආදීවූ ක්‍රමය තෙම **ප්‍රහාණක්‍රමය** නම් වේ.

ශීලවිශුද්ධිය චිත්තවිශුද්ධිය යන මේ ආදී වූ ක්‍රමය තෙම **ප්‍රතිපත්ති ක්‍රමය** නම් වේ.

කාමාවචර භූමිය රූපාවචර භූමිය යන මේ ආදීවූ ක්‍රමය තෙම **භූමි ක්‍රම** නම් වේ.

සතර සතිපට්ඨානයෝය, සතර සම්‍යග් ප්‍රධාන වීය්‍ර්‍යයෝ ය කියා හෝ **දාන කථාය**, ශීල කථාය කියා හෝ මේ ආදී වූ ක්‍රමය **දේශනා ක්‍රමය** නම් වේ.

**කලල**රූපාදීන්ගේ පූර්වාපර **ව්‍යවස්ථානය** මෙන් ස්කන්ධයන්ගේ පූර්වාපර ව්‍යවස්ථාන වශයෙන් උත්පත්ති ක්‍රමයක් නැත්තේය. එසේම කුසල අව්‍යාකෘත ස්කන්ධයන්ද ප්‍රහාණය නොකට යුත්තේය. පාපධර්මයන් පිළිපැදීම් නොකට යුත්තේය. වේදනාදි ධර්මයෝ කාමාදී චතුර්විධ භූමියෙහි ඇතුලත් වේ. එහෙයින් මෙහිදී උත්පත්ති ක්‍රමයද, ප්‍රහාණ ක්‍රමයද, ප්‍රතිපත්ති ක්‍රමයද, භූමි ක්‍රමයද විස්තර කරනු නොලැබේ.

**දේශනා ක්‍රමය**:- පඤ්චස්කන්ධයන් දේශනා කරන්නාවූ භාග්‍යවතුන් වහන්සේ පිළිවෙලින් රූපස්කන්ධයෙන් ආරම්භ කොට වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණස්කන්ධයන් වදාළ සේක.

සාමාන්‍ය වශයෙන් පඤ්චස්කන්ධයන්හි මාසතු ආත්ම භාවයය යි දැඩිව ගැණීමෙහි පතිත වූ, යම් විනෙයජන පුද්ගල සමූහයකු ස්කන්ධයන්ගේ සමූහභූතවූ ඝන බහල භාවය වෙන් කොට දැක්වීමෙන් මා සතු ආත්මභාවයය යි දැඩිව ලබ්ධි ගැනීමෙන් මුදනු කැමති වූ, හිත කැමති භාග්‍යවතුන් වහන්සේ ඒ වෛනෙය ජනයාගේ සුවසේ දැනගැනීම පිණිස චක්ෂුරාදී ද්වාරයන්ටද අරමුණුවූ ඖදාරික වූ **රූපස්කන්ධය** පළමු කොට වදාරණ සේක. ඉක්බිතිව ඉෂ්ටානිෂ්ට රූපය අනුභව කරන්නාවූ **වේදනාස්කන්ධය** වදාරණ සේක. යම් ඉෂ්ටානිෂ්ට රූපයක් වේදනාතොමෝ අනුභව කරයි ද ඒ ඉෂ්ටානිෂ්ට රූපයාගේ ආකාරය හඳුනගන්නාවූ **සඤ්ඤා-ස්කන්ධය** එයට ඉක්බිතිව වදාරණ සේක. සඤ්ඤාවගේ වශයෙන් සකස් කරන්නාවූ සංස්කාරයන් හෙවත් **සංස්කාරස්කන්ධය** එයට අනතුරුව වදාරණ සේක. ඒ වේදනාදීන්ගේ නිඃශ්‍රයවූ ද, අධිපති වූ ද විඤ්ඤාණය හෙවත් **විඤ්ඤාණස්කන්ධය** අවසාන කොට වදාරණ සේක.

**විශේෂ** වශයෙන් වනාහි **ස්කන්ධයන්ගේද උපාදාන ස්කන්ධයන්ගේ** ද වෙනස දතයුතු.

මෙහි **ස්කන්ධයන්**ගෙන් නිර්වාණය හැර සියලු ලෞකික ලොකොත්තර ධර්මයන් දක්වන ලදී.

**උපාදානස්කන්ධ** වශයෙන් චතුර්විධ ආශ්‍රව ධර්මයන්ට හා චතුර්විධ උපාදාන ධර්මයන්ට ආලම්බන භාවයෙන් වෙනස් කොට ලෞකික චිත්ත චෛතසික හා රූපධර්මයෝද දක්වන ලදි.

සියලුම සාශ්‍රව අනාශ්‍රව වූ සකන්ධයන් එක් කොටසක් කොට **ස්කන්ධයෝ** යයි ද උපාදාන ධර්මයන්ට අරමුණුවූ, සාශ්‍රවවූ, සකන්ධයන් පමණක් උපාදාන සකන්ධයෝ යයි ද දත යුතු.

**අන්‍යූනාධික** වශයෙන් වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් අඩුත් නොවූ වැඩිත් නොවූ සකන්ධයන් පස්දෙනෙක්ම වදාරන ලදි. සියලු සංස්කාර ධර්මයන්ට සමාන කොට්ඨාසයන් ගේ වශයෙන් හකුලුවා දක්වන හෙයින්ද මාගේ ආත්ම භාවය, මාගේ සම්පත්ති යයි ගැනීමට හෙවත් ආත්ම ආත්මියාභිනිවේශයට ප්‍රමාණවන හෙයින්ද ඒ පඤ්චස්කන්ධයන් කෙරෙන් අන්‍යවූ ශීලස්කන්ධාදීහු සංස්කාරස්කන්ධයෙහි ඇතුල්වන හෙයින්ද ස්කන්ධයෝ පසක්හුම වදාළ සේක.

නොයෙක් ප්‍රභෙද ඇත්තාවූ සංසකාර ධර්මයන් සමාන කොට්ඨාස වශයෙන් සංග්‍රහ කරනු ලබන කල්හි රූපය තෙම, රූප්පන ලක්ෂණයෙන් සමානවූ කොටස් එක් තැන්හි සංග්‍රහ කිරීම් වශයෙන් එක් ස්කන්ධයක් වේ.

වෙදනා තොමෝ ආලම්බන රසානුභවන සංඛ්‍යාත වෙදයිත සවභාවයෙන් සමානවූ කොටස් එක් තැන්හි සංග්‍රහ කිරීම් වශයෙන් එක් ස්කන්ධයක් වේ.

සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණයන්ද මෙපරිද්දෙන්ම දත යුතු.

රූපය විද්‍යමාන කල්හි, ඒ රූපය නිසා, රූපය ලෙහි පිහිටුවා මේ රූපය තෙම මාගේය, නොහොත් මේ ධනය මාගේය, මේ රූප ධර්මය තෙම මම වෙමි, මේ රූපධර්මය තෙම මාගේ ආත්මය තෙමේයි යනාදි වශයෙන් මිථ්‍යාදෘෂ්ටිය උපදී.

වෙදනාව විද්‍යමාන කල්හිද, සංඥාව විද්‍යමාන කල්හිද, සංස්කාරයන් විද්‍යමාන කල්හිද, විඥානය විද්‍යමාන කල්හිද මමය, මාගේය, මාගේ ආත්මය ය යනාදී වශයෙන් මිථ්‍යාදෘෂ්ටිය උපදී. මෙසේහෙයින් ආත්ම ආත්මීයාභිනිවෙශයට කාරණයාගේ වශයෙන්ද ස්කන්ධයෝ පසක්ම වදාරන ලදි.

ශීලස්කන්ධය ආදිකොට ඇත්තාවූ යම් ධර්මස්කන්ධ සමූහයක් වදාළාහුද, ඒ ධර්මසකන්ධයෝද සංසකාර ස්කන්ධයෙහි ඇතුළත්වන බැවින් මේ පඤ්චස්කන්ධයෙහිම අනතර්ගත භාවයට යෙත්. මෙසේ ස්කන්ධයන්ගේ අනූනාධික භාවය දත යුතු.

**උපමා වශයෙන්** ස්කන්ධයන්ගේ විනිශ්චය මෙසේයි. **රූපූපාදනස්කන්ධය** තෙම ගිලන් හලක් හා සමාන වේ. ගිලන් පුද්ගලයෙකු හා සමාන වූ විඤ්ඤාණූපාදනස්කන්ධයාගේ වස්තු වශයෙන්ද, වාර වශයෙන්ද, ආලම්බන වශයෙන්ද, වාසසථාන හෙවත් ආධාරසථාන වන හෙයිනි.

**වෙදනූපාදනස්කන්ධය** තෙම ගිලන්බැව හා සමානවේ, නොහොත් ගිලන් බැවම උපමා කොට ඇත්තේය. ආබාධ පීඩා කරවන බැවින්ද දුඞ් කොට පෙළන බැවින්ද ගිලන් බව හා සමාන වේ.

**සඤ්ඤූපාදනස්කන්ධය** තෙම ගිලන් බව උපදවන හෙවත් ගිලන් බැවට ආසන්න කාරණ වූ තුන් දෙස හා සමාන වේ. රාගාදීන් හා සම්ප්‍රයුක්ත වූ වෙදනාවගේ හට ගැණීම වන හෙයිනි.

**සඞ්ඛාරූපාදානස්කන්ධය** තෙම අසප්පාය සෙවනය හෙවත් නොසැපවූ ආහාර පාන විහරණාදිය සෙවීමක් හා සමාන වේ. වේදනා සංඛ්‍යාතවූ ගිලන් බැවම මූලකාරණය වන බැවිනි.

**විඤ්ඤාණූපාදානස්කන්ධය** තෙම ගිලන් පුද්ගලයෙකු හා සමානය. වේදනාව අලම්බනරසානුභවය පිණිස සත්ත්වයෝ තුමූ නොහොත් කර්මයෝ තුමූ සකස් කෙරෙත්. අකුසල්වූ කර්මය කළ බැවින්, රැස්කළ බැවින් දුක්ඛ වේදනාව හා එක්ව යෙදුනාවූ කායවිඤ්ඤාණ විපාක චිත්තය තෙම උපදී. කුසල්වූ කර්මය කළ බැවින්, සුඛ වේදනාව හා එක්ව යෙදුනාවූ කායවිඤ්ඤාණ විපාක චිත්තය තෙම උපදී. වේදනා හා ගිලන් බැවින් නොමිදුනු හෙයින් විඤ්ඤාණූපාදාන ස්කන්ධය තෙම ගිලන් පුද්ගලයෙකු හා සමානය.

තවද, මේ පඤ්චස්කන්ධයෝ තුමූ **චාරක, කාරණ, අපරාධ, කාරණකාරක, අපරාධික** යන මොවුන් හා සමානය. රූපූපාදානස්කන්ධය **චාරක** හෙවත් බන්ධනාගාරයක් හා සමානය. වේදනූපාදානස්කන්ධය, **කාරණ** හෙවත් කම් කටුළු හා සමානය. සඤ්ඤූපාදානස්කන්ධය **අපරාධ** හා සමානය. සඞ්ඛාරූපාදානස්කන්ධය **කාරණකාරක** හෙවත් කම්කටුළු කරන්නාවූ වධකයා හා සමානය. විඤ්ඤාණූපාදානස්කන්ධය **අපරාධික** හෙවත් අපරාධ කළාහු සමානය.

එසේම මේ පඤ්චස්කන්ධයෝ තුමූ **භාජන, භොජන, ව්‍යඤ්ජන, පරිවෙසක, භුඤ්ජක** යන මොවුන් හා සමානය. රූපූපාදානස්කන්ධය, **භාජන** හෙවත් බඳුනක් හා සමානය වේදනූපාදානස්කන්ධය, **භොජන** හෙවත් බත හා සමානය සඤ්ඤූපාදානස්කන්ධය, **ව්‍යඤ්ජනය** හෙවත් අවුළු හා සමානය. සඞ්ඛාරූපාදානස්කන්ධය, **පරිවෙසක** හෙවත් භක්තකාරකය හා සමානය. විඤ්ඤාණූපාදානස්කන්ධය, **භුඤ්ජක** හෙවත් අනුභව කරන්නා හා සමානය.

පඤ්චස්කන්ධයෝ **සංක්ෂෙප වශයෙන් ද, විස්තර වශයෙන් ද** යන දෙපරිච්ඡෙදයකින්ම **දතයුත්තාහ.**

**සංක්ෂෙප වශයෙන්,** උපාදානස්කන්ධයෝ පස්දෙන ආශිර්විෂෝපම සූත්‍රයෙහි **දක්වනලද** පරිද්දෙන් ඔසවා ගත් ආයුධ ඇති සතුරන් වශයෙන් නුවණින් **දක්ක** යුතුය. භාර සූත්‍රයාගේ වශයෙන් බරක් මෙන් **දක්ක** යුතුය. ඛජ්ජනීය සූත්‍රයාගේ වශයෙන් භක්ෂක වශයෙන් දක්ක යුතුය. යමක සූත්‍රයාගේ වශයෙන් අනිත්‍ය, දුඃඛ, අනාත්ම, සඞ්ඛත, වධක වශයෙන් ද **දක්ක** යුතුය.

**විස්තර වශයෙන්** වනාහි **රූපය තෙම** හෙවත් රූපූපාදානස්කන්ධය **පෙණ පිඩක්** මෙන් නුවණින් දක්ක යුතුය. **වෙදනා** තොමෝ හෙවත් වෙදනාස්කන්ධය **දිය බුබුළක්** මෙන් දක්ක යුත්තීය. **සංඥා තොමෝ** හෙවත් සංඥාස්කන්ධය **මිරිඟු ජලයක්** මෙන් දක්ක යුත්තීය. **සංස්කාරයෝ** තුමූ හෙවත් සංස්කාරස්කන්ධය **කෙසෙල් කඳක්** මෙන් දක්ක යුතුය. **විඥානය** තෙම හෙවත් විඥානස්කන්ධය **මායාවක්** හෙවත් ඉන්ද්‍රජාලයක් මෙන් දක්ක යුතුය.

**පෙණ පිඩ,** නිස්සාර හෙවත් හර නැත්තේ යම්සේද එපරිද්දෙන්ම රූපය තෙමේද, **නිත්‍යසාර, ධ්‍රැවසාර, ආත්මසාරයන්** කෙරෙන් තොරවීම හේතුකොටගෙන නිස්සාර හෙවත් හර නැත්තේම වේ. **නිත්‍යසාරය** නම් නොනස්නා කරුණෙන් නිත්‍ය යයි ගත් දෘෂ්ටියයි. **ධ්‍රැවසාරය** නම් මිනිසත් බැව් ලත් සැනැත්තේ මිනිසත් බවම ලබන්නේය. තිරිසන් අත්බැව ලත් තැනැත්තේ තිරිසන් බවම ලබන්නේය යනාදී වශයෙන් විනාශයෙන් අන්‍යවූ විපරිණාම අන්‍ය ස්වභාවයක් නැති හෙයින් ශාස්වත ය යි ගත් දෘෂ්ටියයි.

පෙණ පිඩෙන් පාත්‍රයක් හෝ තැටියක් හෝ කරන්නෙමු ය යි ගන්නට නොහැකිය. එසේ ගන්නා ලදුයේවී නමුත් එම අර්ථය සිද්ධ නොවේ. එපරිද්දෙන්ම රූපය තෙමේද, නිත්‍යය කියාත්, ශාස්වතය කියාත්, මමය කියාත්, මාගේය කියාත් ගන්නට නොහැකි වේ. ගත්තේවී නමුත්

එපරිද්දෙන්ම නොපවතී. අනිත්‍ය වූයේ ම වේ. අනාත්ම වූයේ ම වේ. අසුභ වූයේ ම වේ. මෙසේ හෙයින් රූපය තෙම පෙණ පිඬක් හා සමානය ය යි වදාරන ලදී.

තවද, පෙණ පිඩ ලොකු කුඩා සිදුරු ඇත්තේ වේ. නොයෙක් සම්බන්ධස්ථානයන් විසින් ගළපන ලදය. බොහෝ වූ උදක සපි හෙවත් දියබරණුන් ආදිකොට ඇති සත්ත්වයන්ට, පණුවන්ට වාසස්ථාන වූයේ වේ. එපරිද්දෙන්ම රූපය තෙමේද, කුදු මහත්වූ සිදුරු ඇත්තේ වේ. නොයෙක් සම්බන්ධස්ථානයන් විසින් ගළපන ලදය. මේ රූපකාය, කුල වශයෙන් අසූ කුලයක පණුවන්ට වාසස්ථානයක්ද වේ. ඒ රූපකායම ඒකී පණුවන්ට සූතිකාගාරයක් හෙවත් තිඹිරිගෙයක් ද වේ. වැසිකිළියක් ද වේ. ගිලන්හලක් ද වේ. සුසානයක් හෙවත් සොහොනක් ද වේ. ඒකී ප්‍රාණීහු අන් තැනෙක්හි ගොස් ප්‍රසවය කිරීම් ආදී කෘත්‍යයන් නොකෙරෙත්. මේ පරිද්දෙන්ද රූපය තෙම පෙණ පිඩක් හා සමානය.

පෙණ පිඩ මුලින්ම ඩෙබරයක් පමණෑතිව යථාක්‍රමයෙන් පළිත කැටයක් පමණද වන්නේය. එපරිද්දෙන් රූපය තෙමේද පළමුවෙන් කලල රූප මාත්‍රයක්ව යථාක්‍රමයෙන් මිනිසක් බැව් ලද්දවුන්ගේ වශයෙන් බඹයක් පමණෑත්තෝ වේ. ගෙරි සරක් ඇතුන් ආදී වූ තිරිසන් වූ සතුන්ගේ වශයෙන් පළිත කූට ප්‍රමාණවත් වේ. මත්ස්‍ය කැසුබු ආදී තිරිසන් වූ සතුන්ගේ වශයෙන් නොයෙක් යොදුන් සියගණන් පමණෑත්තෝද වේ. මේ නයින්ද රූපය තෙම පෙණ පිඩක් හා සමාන වේ.

තවද, පෙණ පිඩ උපන් ඇසිල්ලෙහිත් බිඳෙයි මඳක් තැන් ගොස් ද බිඳෙයි. මුහුදට පැමිණි කල්හි ඒකාන්තයෙන්ම බිඳෙන්නේ වේ. එපරිද්දෙන්ම රූපය තෙමේද, කලල බැව්හි ද බිඳෙයි, අර්බුද අවස්ථාවන්හි ද බිඳෙයි, අනතුරෙහි නොබිඳී නමුත්, සතවර්ෂායුෂ්ක සත්තට ශත

මණියක් පැමිණි කල්හි නියතයෙන්ම බිඳෙයි. මිරුමුවෙති සුණුවිසුණු වූයේ වේ. මෙසේද රූපය තෙම පෙණ පිඩක් හා සමානය.

දිය බුබුළ අසාර වූයේ හෙවත් හර නැත්තේ යම්සේද, එපරිද්දෙන් වෙදනා තොමෝද හර නැත්තීය, අසාරය. දිය බුබුල නිෂ්ඵලය. අතලා ගන්නට නොහැක්කේය. දිය බුබුළක් ගෙන පුවරුවක් හෝ පලිහක් හෝ අඳුනක් හෝ කරන්නට නොහැක්කේය. ගත් ගත් දිය බුබුල යම්සේ බිඳේද එපරිද්දෙන්ම වෙදනා තොමෝද නිෂ්ඵල වන්නීය. ගන්නට නුසුදුසු වන්නීය නිත්‍යය කියාත්, ශාස්වතය කියාත්, ලබ්ධි ගන්නට නුසුදුසු ය. නිත්‍යාදි වශයෙන් ලබ්ධි ගත් නමුදු ඒ ලබ්ධි ගත් පරිද්දෙන් නොපවත්නීය. මෙසේ නිත්‍යාදී වශයෙන් ලබ්ධි ගැණීමට නුසුදුසු බැවින්ද වෙදනා තොමෝ දිය බුබුලක් හා සමාන වන්නීය. ඒ ඒ දියබිඳෙහි බිබිලෙක් උපදින්නේද වේ, බිඳෙන්නේද වේ. වැඩි කල් පවත්නේද නොවේ. එපරිද්දෙන් වෙදනා තොමෝ ද ඉපිද වහා බිඳී යන්නීය කල් පවත්නී නොවේ. එක් අසුරක් ගසන කෙණෙහි කෙළ ලක්‍ෂ ගණන් ඇත්තාවූ වෙදනා තොමෝ ඉපිද බිඳෙයි.

දිය බුබුළ වනාහි උදක තලය හෙවත් දිය මතුපිටද, උදකබින්දු හෙවත් දිය බිඳුද, උදක ජල්ලක හෙවත් දිය මිදුලුද ගහණ වාතය හෙවත් කැටිකොට ගන්නා බොල් සුළඟත්ය යන සිව් වැදෑරුම් වූ කරුණු නිසා උපදී. එපරිද්දෙන්ම, වෙදනා තොමෝද, වත්‍ථු හෙවත් නිශ්‍රය වූ වස්තු රූපයද, ආරම්මණ හෙවත් අරමුණද, කිලෙසජල්ල හෙවත් කෙලෙස් මලද, ඵස්සසඞ්ඝට්ටනය හෙවත් ස්පර්ශයාගේ සමාගමය ද යන කරුණු සතරදෙනා නිසා උපදී. මෙසේ හෙයින් වෙදනා තොමෝ දිය බුබුලක් හා සමානමය.

සංඥාතොමෝද අසාර හෙවත් නිසරු හෙයින් මිරිඟු ජලය හා සමාන වන්නීය. නිත්‍යාදී වශයෙන් ලබ්ධි ගැනීමට නොනිසිවූ හෙයිනි. මිරිඟු ජලය ගෙන පානය කරන්ට හෝ

ස්නානය කරන්ට හෝ බඳුනක් පුරවන්නට හෝ නොහැක්කේය. මිරිඟු ජලය පොපියන්නේය. හටගත් රළ වේගයක්හු මෙන් වැටහෙන්නේ ය. එපරිද්දෙන් නීල සංඥාදි ප්‍රභේද ඇති සංඥතොමෝ ද නීලාදි ආලම්භන රසාස්වාදය පිණිස සැලෙයි. ඔබ්මොබ සැලෙයි. මිරිඟු ජලය තෙම මහජනයා පොළඹයි. දිය පිරුණු වැවක් මෙන්, ගඟක් මෙන් දක්නා ලැබෙයි. එපරිද්දෙන්ම සංඥතොමෝද පොළඹවයි. නිල්පැහැ ඇති මේ අරමුණ සුභය, සුඛය, නිත්‍යය යනාදි වශයෙන් හඟවන්නේය. පීත වර්ණාදී ආලම්බනයෙහිත් එසේමය. මෙසේ පොළඹවන හෙයින්ද, සංඥතොමෝ මිරිඟු ජලය හා සමානවන්නිය.

**සංස්කාරයෝතුමුද** අසාර හෙවත් නිසරු හෙයින් කෙසෙල් කඳක් හා සමානය. එසේම නිත්‍ය සාරාදී වශයෙන් වරදවා ලබ්ධි ගැනීමට නොනිසිවූ හෙයින්ද කෙසෙල් කඳක් හා සමානය. කෙසෙල් කඳකින් කිසිවක් ගෙන ගොනුැස් ඇ උපකරණයන්ගේ ප්‍රයෝජනය පිණිස එළවන්නට නොහැක්කේය. එලමන ලද්දේ වී නමුත් එළවූ පරිද්දෙන් නොවන්නේය. එපරිද්දෙන් සංස්කාරයෝද නිත්‍යාදී වශයෙන් ලබ්ධි ගන්නට නොහැක්කාහ. නිත්‍යාදි වශයෙන් ලබ්ධි ගත්හු නමුදු ඒ ලබ්ධි ගත් පරිද්දෙන් නොවෙත්. කෙසෙල් කඳ තෙමේ බොහෝ වූ පතුවැටි රැසෙක් වන්නේ යම් සේද එපරිද්දෙන් සංස්කාරස්කන්ධය තෙමේ ද බොහෝවූ චෛතසික ධර්මරාශියක් වේ. කෙසෙල් කඳ තෙමේ අනෙක ලක්ෂණ ඇත්තේය. පිටත්හිවූ පතුරුවැටියගේ වර්ණය අනිකෙක් වේ. එයින් ඇතුල් ඇතුල් පතුරුවැටිවල වර්ණසංස්ථානය තෙම අනිකෙක් ම වේ. එපරිද්දෙන් ම සංස්කාරස්කන්ධය තෙමේ ද අනේක ලක්ෂණ ඇත්තේය. ස්පර්ශයාගේ ස්වභාවය තෙම අනිකෙක්මය. චේතනාදීන්ගේ ස්වභාවය තෙම අනිකෙක්මය. එසේ වෙන් වෙන් වූ ලක්ෂණ ඇත්තේ වී නමුත් එක් රැසක් කොට සංස්කාරස්කන්ධයයි කියනු ලැබේ. එහෙයින් මේ කරුණෙන් ද සංස්කාරස්කන්ධය තෙම කෙසෙල් කඳක් හා සමාන වන්නේය.

විඥානය තෙමේ ද අසාර හෙවත් නිසරු හෙයින් ඉන්ද්‍රජාලාදී මායාවක් හා සමාන වන්නේය. එසේම නිත්‍යාදි වශයෙන් ලබ්බ ගැණීමට නොහිසිවූ හෙයින්ද ඉන්ද්‍රජාලාදී මායාවක් හා සමානය. මායාතොමෝ ලාමකය. විඥානය තෙමේද ඉන්ද්‍රජාලාදී මායාවටත් වඩා අතිශයින් ලාමක වන්නේමය. ඒ සිත්ම පුරුෂ තෙම පැමිණි අයකු මෙන් ද ගිය අයකු මෙන්ද සිටිය අයකු මෙන්ද හුන් අයකු මෙන්ද වේ. එනකල සිත අනෙකක්මය ගමනකාලාදීන්හි සිත අනිකෙක්මය. මෙසේ විඥානය තෙම මායාවක් හා සමාන වන්නේය. තව ද මායාතොමෝ මහජනයා රවටන්නීය. හැම දෙයක්ම ගෙන මෙය රන්ය, රිදීය, මුතුය යනාදි වශයෙන් ගන්වන්නී ය. එපරිද්දෙන්ම විඥානය තෙමේද, මහජනයා රවටන්නේය. එම සිත්ම එන්නක්හු මෙන්ද යන්නක්හු මෙන්ද සිටියක්හු මෙන්ද හුන්නක්හු මෙන්ද දක්වන්නේය. එන ඉරියව්වෙහි සිත අනිකෙක්මය. ගමනාදිවූ ඉරියව්හි සිත අනිකෙක්මය මේ කරුණෙන්ද විඥානය තෙම ඉන්ද්‍රජාලාදී මායාවක් හා සමාන වන්නේය,

විශෙෂ වශයෙන් වනාහි සුභාලම්බනය වූවත් සවසන් තාක ගත රූපය තෙම අනිෂ්ටය යයි දත යුතු. වේදනා තොමෝ දුක්ඛ දුක්ඛය, විපරිනාම දුක්ඛය, සංස්කාර දුක්ඛය යන ත්‍රිවිධ දුක්ඛ සවභාවයන් කෙරෙන් නොමිදුනු හෙයින් දුකයයි දතයුතු සංඥා සංස්කාරයෝ තුමූ තමා වසයෙහි කරන්ට නොහැකි හෙයින්ද, කර්මය විසින් සකස් කල හෙයින්ද, ප්‍රත්‍යයන් හා එක්ව පවත්නා හෙයින්ද අනාත්ම යයි දත යුතු. විඥානය තෙම උදයව්‍යය සවභාවය ඇති හෙයින් හෙවත් ඉපදීම් බිඳීම්, ප්‍රකෘතිය කොට ඇති හෙයින් අනිත්‍යය යි දත යුතු.

සංක්ෂෙප වශයෙන් වනාහි උපාදානස්කන්ධයන් පස්දෙන ඔසවාගත් අසිපත් ඇති වධකාදීන් ගේ සවභාව යෙන් නුවණැසින් දක්නා පුද්ගල තෙම ස්කන්ධයන් විසින් නො පෙළනු ලැබේ.

විස්තර වශයෙන් වනාහි, රූපාදීන් පෙණපිඬු හා සමාන බැවින් නුවණැසින් දක්නා පුද්ගලතෙම නිස්සාරවූ ස්කන්ධයන්හි සාරය යි වරදවා දක්නා සිලි පුද්ගලයෙක් නොවේ.

විශේෂ වශයෙන් වනාහි අධ්‍යාත්මික රූපය අනිෂ්ට වශයෙන් නුවණැසින් දක්නා පුද්ගල තෙම කබලීකාරාහාරය පිරිසිඳ දනී. අසුභයෙහි සුභය යන විපල්ලාසය අත්හරියි. කාමෞඝය තරණය කෙරෙයි. කාමයොගය හා සංයොගයට නොපැමිණෙයි, නොහොත් කාම යොගයෙන් මිදෙයි. කාමාශ්‍රව වශයෙන් ආශ්‍රව රහිතයෙක් වේ. අභිධ්‍යාකාය ග්‍රන්ථය බිඳියි. කාමොපාදානය දැඩිකොට නොගනී. වෙදනාව දුක්ඛ වශයෙන් නුවණැසින් දක්නා පුද්ගලතෙම ස්පර්ශාහාරය පිරිසිඳ දනී. දුක්ඛයෙහි සුඛය යන විපල්ලාසය අත්හරියි. භවෞඝය තරණය කෙරෙයි. භවයොගය හා සංයොගයට නො පැමිණෙයි, නොහොත් භවයෝගයෙන් මිදෙයි. භවාශ්‍රව වශයෙන් ආශ්‍රව රහිතයෙක් වේ. ව්‍යාපාදකාය ග්‍රන්ථය බිඳියි. සීලබ්බතුපාදානය දැඩිකොට නොගනී.

සංඥාවද සංස්කාරයන්ද අනාත්ම වශයෙන් නුවණැසින් දක්නා පුද්ගලතෙම මනොසඤ්චෙතනාහාරය පිරිසිඳ දනී. අනාත්මයෙහි ආත්මය යන විපල්ලාසය අත්හරියි. දෘෂ්ටිඕඝය තරණය කෙරෙයි. දෘට්ඨියොගය හා සංයොගයට නොපැමිණේ, නොහොත් දිට්ඨියොගයෙන් මිදෙයි. දිට්ඨාශ්‍රව වශයෙන් ආශ්‍රවරහිතයෙක් වේ. මෙයම සත්‍යය, සෙස්ස මෝඝය ය යි වරදවා ලෙහි පිහිටුවීම් වශයෙන් ලබ්සි ගැණීම නම්වූ ඉදංසත්‍යාභිනිවෙසකාය ග්‍රන්ථය බිඳියි. අත්තවාදූපාදානය දැඩි කොට නොගනී.

විඥානය අනිත්‍ය වශයෙන් නුවණැසින් දක්නා පුද්ගල තෙම විඥානාහාරය පිරිසිඳ දනී. අනිත්‍යයෙහි නිත්‍යය යන විපල්ලාසය අත්හරියි. අවිද්‍යාඕඝය තරණය කෙරෙයි. අවිද්‍යා යොගය හා සංයොගයට නොපැමිණේ, නොහොත් අවිද්‍යා

යොගයෙන් මිදෙයි. අවිද්‍යාශ්‍රව වශයෙන් ආශ්‍රව රහිතයෙක් වේ. සීලබ්බතපරාමාස කාය ග්‍රන්ථය බිඳියි. දිට්ඨුපාදානය දැඩි කොට නොගනී.

තවද ස්කන්‍ධයන්ගේ එකවිධාදී භේදය දතයුතු.

**රූපස්කන්‍ධය,** සියළුම රූපය හේතුවත් නොවේ. අහෙතුකය, හෙතුවෙන් වෙන්වූයේය, ප්‍රත්‍ය සහිතය, ලෞකිකය, කෙලෙස් සහිතය, බැඳීම් ඇතිකරන්නෙකි, ගෙතීම් ඇතිකරන්නෙකි, කාමාදී ඕඝයන්ගෙන් යුක්තය. කාමාදී යොගයන්ගෙන් යුක්තය, ආවරණ ඇතිකරන්නකි, සිතින් දැඩිසේ ගන්නකි, දැඩිසේ අල්ලාගන්නකි, කෙලෙස් ඇතිකරවන්නකි, විතර්ක සහිත විචාර සහිත නොවේ, අවිතර්ක අවිචාරය, සුඛ සහගත නොවේ, උපෙක්ෂාසහගත නොවේ. දර්ශනයෙන් භාවනාවෙන් ප්‍රහාණය නොකට හැකිය, සවැදෑරුම් විඥානයන්ගෙන් දත යුතුය, අනිත්‍යය, ජරාවෙන් මැඩුනේය. මේ ආදී වශයෙන් රූපස්කන්‍ධය එකවිධ වේ.

තවද උපාදා රූපද උපාදා නොවන රූපද ඇත, උපාදින්න රූපද අනුපාදින්න රූපද ඇත, උපාදින්න හා උපාදානීය රූපද අනුපාදින්න උපාදානීය රූපද ඇත, සනිදස්සන රූපද අනිදස්සන රූපද ඇත, සප්පටිඝ රූපද අප්පටිඝ රූපද ඇත ඉන්‍ද්‍රිය රූපද ඉන්‍ද්‍රිය නොවන රූපද ඇත, මහාභූත රූපද මහාභූත නොවන රූපද ඇත, විඤ්ඤත්ති රූපද විඤ්ඤත්ති නොවන රූපද ඇත. තවද අජ්ඣත්තික බාහිර රූප ඖදාරික සූක්ෂම රූප, දූරාසන්න රූප යනාදී වශයෙන් රූපස්කන්‍ධය විවිධ වේ.

මේ ආදී ක්‍රමයෙන් රූප නිර්දෙශයෙහි විස්තර දක්වන ලද පරිද්දෙන් රූපස්කන්‍ධයාගේ එකවිධාදී භේදය දත යුතු.

**වෙදනාස්කන්‍ධය.** ඵස්ස සම්පයුක්ත වෙදනාවගේ වශයෙන් එක් කොටසක් වේ. වෙදනාව ස්පර්ශය හා සම්ප්‍රයුක්ත වූයේ වේ. සියළුම වෙදනාවෝ චාතුර්භූමිකය.

චාතුර්භූමික **වේදනාවෝ** **සම්ප්‍රයුක්ත** හෙතුන් සමගද පවත්නේය. සම්ප්‍රයුක්ත හෙතු රහිතවූ වේදනාවෝ **කාමාවචරය**

සහෙතුක අහෙතුක වේදනා වශයෙන් විවිධ වේ. ජාති වශයෙන්, සුඛ, දුක්ඛ, උපෙක්ෂා වේදනා යයි ත්‍රිවිධ වේ. භූමි වශයෙන්, **කාමාවචර**, රූපාවචර, අරූපාවචර, අපරියාපන්න වේදනාවෝ ය යි චතුර්විධ වේ.

ඉන්ද්‍රිය වශයෙන්, සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, දෞමනස්සින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය වේදනා ය යි පඤ්චවිධ වේ මේ පඤ්ච **ප්‍රකාර** වේදනෙන්ද්‍රියයන් අතුරෙන් **සුඛෙන්ද්‍රිය හා දුක්ඛෙන්ද්‍රිය ද** කායප්‍රසාදය නිශ්‍රය කොට පවත්නාහ. කාමාවචරම ය. **සොමනස්සින්ද්‍රිය තෙම** සවස්තුකව හෙවත් හදය **වස්තුව** නිශ්‍රය **කොට** හෝ අවස්තුකව **හෙවත්** හදයවස්තුව නිශ්‍රය නොකොට හෝ පවත්නේය එය ත්‍රෛභූමිකද වේ. **දෞමනස්සින්ද්‍රිය** තෙම හදයවස්තු රූපය නිශ්‍රයකොට පවත්නේය. කාමාවචරය, **උපෙක්ඛින්ද්‍රිය** තෙම චක්ඛුප්‍රසාදාදී චතුර්විධ ප්‍රසාදවස්තූන් නිශ්‍රයකොට පවත්නේ වේ. හදය වස්තුව නිශ්‍රය කොටද පවත්නේ වේ අවස්තුකව හෙවත් හදයවස්තුව නිශ්‍රය නොකොට පවත්නේද වේ. චාතුර්භූමික ද වේ.

**නිශ්‍රයස්ථානවශයෙන්** චක්ඛුප්‍රසාදය, ශ්‍රොතප්‍රසාදය, ඝ්‍රාණප්‍රසාදය ජිව්හා ප්‍රසාදය, කාය ප්‍රසාදය, හදයවස්තු රූපය නිශ්‍රයකොට පවත්නා වේදනා ය යි ෂඩ්විධ වේ. මෙයින් චක්ෂුරාදී **පඤ්චප්‍රසාද** වස්තූන් නිශ්‍රය කොට පවත්නා වේදනාවෝ කාමාවචරය. සවැනි වේදනාව අවස්තුකව හෝ සවස්තුකව පවත්නාහ. චාතුර්භූමිකය. මෙසේ චක්ඛු **සම්ඵස්සජා වේදනා සොතසම්ඵස්සජා වේදනා, ඝාණ සම්ඵස්සජා වේදනා, ජිව්හා සම්ඵස්සජා වේදනා, කාය සම්ඵස්සජා වේදනා, මනොසම්ඵස්සජා වේදනාවන්ගේ** වශයෙන් **ෂඩ්විධ** වේ.

මේ ශඩ්විධ නයෙහි මනොසම්ඵස්සජා වේදනාව, **මනොධාතු සම්ඵස්සජා වෙදනා, මනොවිඤ්ඤාණධාතු සම්ඵස්සජා වෙදනා** වශයෙන් ගත් කල්හි වේදනා සප්තවිධ වේ.

මේ සප්තවිධ නයෙහි කායසම්ඵස්සජා වේදනාව, **කායික සුඛ වෙදනා, කායික දුක්ඛ වෙදනා** ය යි දෙකක් කොට ගත් කල්හි වේදනාවෝ අෂ්ටවිධ වේ.

ඒ සප්තවිධ නයෙහි මනොවිඤ්ඤාණ ධාතු සම්ඵස්සජා වේදනාව **කුසල මනොවිඤ්ඤාණ ධාතු සම්ඵස්සජා වෙදනා, අකුසල මනො විඤ්ඤාණධාතු සම්ඵස්සජා වෙදනා, අව්‍යාකත මනොවිඤ්ඤාණධාතු සම්ඵස්සජා වෙදනා** ය යි තුනෙක් කොට ගත් කල්හි වේදනාවෝ නවවිධ වේ.

අෂ්ටවිධ නයෙහි මනොවිඤ්ඤාණධාතු සම්ඵස්සජා වේදනාව කුසල, අකුසල, අව්‍යාකත වශයෙන් තුනෙක් කොට ගත් කල්හි වේදනාවෝ දසවිධ වේ.

මෙසේ බොහෝ වූ කොටස් වශයෙන් වේදනාස්කන්ධය දෙශනා කරණ ලද්දේ පුද්ගලාධ්‍යාශය හා දෙශනා විලාසය වශයෙන් බව දතයුතු.

නවද මේ වේදනාවෝ අටමහා කාමාවචර කුසල් චිත්තයන්ගේ වශයෙන් අටවිධ වේ. දොළොස් අකුසල චිත්තයන්ගේ වශයෙන් දොළොස් ආකාර වේ. අව්‍යාකෘතවූ පඤ්චද්වාරාවජ්ජන සම්පටිච්ඡන යුග්ම සඞ්ඛ්‍යාතවූ මනොධාතුහු තුන්දෙනය, කුසලාකුසල විපාක සන්තීරණ සඞ්ඛ්‍යාතවූ අහේතුක මනොවිඤ්ඤාණධාතුහු තුන්දෙනය, මහා විපාක සිත්හු අටදෙනය, මනොද්වාරාවජ්ජන හසිතොප්පාද, මහා ක්‍රියාචිත්ත සඞ්ඛ්‍යාත කාමාවචර ක්‍රියා සිත්හු දසදෙනය යන සුවිස්සක් වූ චිත්තයන්ගේ වශයෙන් සුවිසි ප්‍රකාර වේ.

ඒ සූවිසි චිත්තයන් අතුරෙන් කාමාවචර කුසල් සිත් අටදෙනද, අකුසල් සිත් දොළොස්දෙනද ජවනකෘත්‍ය වශයෙන් ලැබෙත්.

පඤ්චද්වාරාවජ්ජන සඞ්ඛ්‍යාතවූ ක්‍රියා මනොධාතු චිත්තය තෙම පඤ්චද්වාරයෙහි ආවජ්ජන කෘත්‍ය වශයෙන් ලැබේ.

සම්පටිච්ඡන චිත්ත සඞ්ඛ්‍යාතවූ විපාක මනොධාතුහු දෙදෙන සම්පටිච්ඡන කෘත්‍ය වශයෙන් ලැබෙත්.

සන්තීරණ චිත්ත සඞ්ඛ්‍යාතවූ විපාක මනොවිඤ්ඤාණ ධාතුහු තිදෙන සන්තීරණ තදාලම්බන කෘත්‍ය වශයෙන් ලැබෙත්.

මනොද්වාරාවජ්ජන සඞ්ඛ්‍යාතවූ ක්‍රියා හෙතුක මනොවිඤ්ඤාණධාතු චිත්තය තෙම ව්‍යවස්ථාපන කෘත්‍ය වශයෙන් ලැබේ.

මහා විපාක සිත් අටදෙන තදාලම්බන කෘත්‍ය වශයෙන් ලැබෙත්.

හසිතොත්පාද අෂ්ටමහා ක්‍රියා එකතුව ක්‍රියා සිත්හු නවදෙන ජවන කෘත්‍ය වශයෙන් ලැබෙත්.

චක්ඛු, සොත, ඝාණ, ජිව්හා කායද්වාරයන්හි මෙකී නයෙ බඳු නය ඇත්තේය.

මනොද්වාරයෙහි වනාහි චාතුර්භූමික කුසලයන්ගේ වශයෙන්ද, දොළොස් අකුසලයන්ගේ වශයෙන්ද, අටමහා විපාක සන්තීරණත්‍රය යන එකොළොසක්වූ කාමාවචර විපාකයන්ගේද, මනොද්වාරාවජ්ජන හසිතොත්පාද මහා ක්‍රියා සිත් අටදෙන එකතුව දසයක්වූ කාමාවචර ක්‍රියා චිත්තයන්ගේද, නවයක්වූ රූපාවචර අරූපාවචර ක්‍රියා චිත්තයන්ගේද සතරක්වූ ශ්‍රාමණ්‍ය ඵල සඞ්ඛ්‍යාතවූ ලොකොත්තර ඵල චිත්තයන්ගේද යන සූතිසක්වූ චිත්තොත්පාදයන්ගේ වශයෙන්ද අනෙකප්‍රකාර වේ.

මේ සියළුම චිත්තයෝ චක්ෂුද්වාරයෙහි, **ආදිභූත, අවයව භූත, අනන්‍යභූත උපනිශ්‍රය** ශක්ති වශයෙන්ද, **සමතික්‍රම** හෙවත් ඉක්මවීම් වශයෙන්ද, **භාවනා** වශයෙන්දැයි යන මේ තුන් ආකාරයෙන් ලැබෙත්.

සොතද්වාර, මනොද්වාරයන්හිද චක්ෂුද්වාරයෙහි මෙන්ම ලැබෙත්.

ඝාන, ජිව්හා, කායද්වාරයන්හි වනාහි **සමතික්‍රම** වශයෙන්ද, **භාවනා** වශයෙන්ද යන මේ දෙආකාරයෙන් ලැබෙත්.

මේ සස්නෙහි භික්ෂුතෙම විහාර චාරිකාවෙහි හැසිරෙන්නේ කසිණ මණ්ඩලයක් දැක, මේ කුමක්දැයි විචාරා කසිණ මණ්ඩලයකැයි කී කල්හි, මෙයින් කුමක් කෙරේද්දැයි අසන්නේය. ඒ මහණහට, මේ කසිණ මණ්ඩලය වඩා ධ්‍යානයන් උපදවා සමාපත්තිය පදට්ඨානකොට හෙවත් ආසන්න කාරණා කොට ඇති විදර්ශනා වඩා රහත් ඵලයට පැමිණෙත් යයි අන් මහණක්හු සැලකෙරෙත්. උත්තමධ්‍යාශයෙන් සමෘද්ධවූ ඒ කුලපුත් තෙමේ මේ කටයුත්ත බැරි කමෙකැයි නොසලකා මා විසිනුදු මේ ගුණය උපදවන්නට වටනේ ය යි සිතා මේ ගුණය එක් තැනෙක හිඳ, නිදන්නාවූ මා විසින් උපදවන්නට නොහැක්කේය. මූල පටන්ම චීයණී කරන්ට, ශීලය පිරිසුදු කරන්ට වටනේයයි සිතා සීලය පිරිසුදු කෙරෙයි. ඒ සීලවිසුද්ධියෙන් ඉක්බිති, පිරිසුදුවූ ශීලයෙහි පිහිටා දසවිධ පළිබොධයන් මැඩ තුන් සිවුර පමණකොට ඇති හෙයින් සතුටුව ආචාර්‍ය්‍ය උපාධ්‍යායනට නිසි වත් පිළිවෙත් කොට, කමටහන් උගෙන, කසිණ පරිකර්ම කොට, සමාපත්ති උපදවා, සමාපත්තිභූම ආසන්න කාරණා කොට ඇති විදසුන් වඩා රහත් ඵලයට පැමිණේ.

ඒ වේදනාවන් අතුරෙන් සියලුම පරිකර්ම වේදනා තොමෝ කාමාවචරය. අෂ්ට සමාපත්තියෙහි වූ වේදනා තොමෝ රූපාවචර අරූපාවචරයහ, මාර්ගඵල සිත්හිවූ වේදනා තොමෝ ලෝකොත්තරය.

මේ කියනලද **කසින්** චක්ෂුර්විඥානය තෙම චාතුර්භූමික **වේදනා නිෂ්පත්තියගේ** බලවත් **හේතුවෙක් වේද, එහෙයින්** චාතුර්භූමික වේදනා **තොමෝ** චක්ඛුසම්ඵස්සජා වේදනා **හෙවත්** චක්ෂුප්‍රසාද සම්ස්පර්ශ සඞ්ඛ්‍යාත **හෙතුවෙන්** වූවා නම් වේ

මෙහිදී පරිකර්ම භාවනාවට පෙර ආදිභාවයෙන් උපනිශ්‍රය වීම **ආදිභූත උපනිශ්‍රය** නම් වේ.

**කසිණ** මණ්ඩල **දර්ශනයෙහි** සිට කාමාවචර කුසලාදි වේදනාවන්ට **උපනිශ්‍රයවූ** යම් **කසිණ** මණ්ඩල සඞ්ඛ්‍යාත අවයවයෙක් **වේද** එය **අඞ්ගභූත උපනිශ්‍රය** නම්.

මතු මත්තෙහිදී **කසිණමණ්ඩලය** දර්ශනය **නොවී** අනන්‍ය භාවයෙන් උපනිශ්‍රය වීම **අනඞ්ගභූතවූ උපනිශ්‍රය** නම් වේ.

මෙසේ උපනිශ්‍රය වශයෙන් **ලැබෙන** පරිදි දතයුතු.

**සමතික්කම වශයෙන්** ලැබීම මෙසේයි

**චක්ෂුර්මාර්ගයෙහි** වනාහි, රූපය හමුවූ කල්හි ඉෂ්ටාලම්බන යෙහි මට **රාගය** උපන. අනිෂ්ටාලම්බනයෙහි **ද්වේෂය** උපන. උදාසීනව බැලීමෙහිදී **මොහය** උපන. අරමුණෙහි වෙසෙසින් බැඳුනාවූ මට **මානය** උපන. මිථ්‍යා වශයෙන් ආමර්ශනය කළාවූ මට **දෘෂ්ටිය** උපන. වික්ෂෙපයට පැමිණියාවූ මට **ඖද්ධත්‍යය** උපන. අරමුණෙහි නිශ්චයට නොපැමිණියාවූ මට **විචිකිච්ඡාව** උපන. කෙලෙසුන් බලවත්වූ කල්හි **අනුසය කෙලෙස්හු** උපන. මෙපරිද්දෙන් සම්මර්ශනය **කරමින්** සිටියාවූ කුලපුත්‍රතෙම **තමාගේ** කෙලෙසුන් ඉපැදීම **දැන** මේ කෙලෙස්හු වැඩෙන්නාහු මට ව්‍යසනය **පිණිස**, පවත්නාහුය. එහෙයින් **දැන්** මම ඒ **කෙලෙසුන්** නිග්‍රහ **කෙරෙමියි** සිතා, නිදසිටින්නාවූ මා විසින් **කෙලෙසුන්** නිග්‍රහ **කරන්ට** නොහැක්කේය. මුලින්ම වීර්‍ය්‍ය කටයුතුය. ශීලයද පිරිසිදු **කරන්ට** වටනේය යනාදි **වශයෙන්** යට **කියනලද** පරිද්දෙන් පිළිපැද රහත් ඵලයට පැමිණේ.

ඒ වෙදනාවන් අතුරෙන් සියලුම පරිකර්ම වෙදනාවෝ කාමාවචරය. අෂ්ට සමාපත්තියෙහි පැවති වෙදනාවෝ රූපාවචරය, අරූපාවචරයහ. මාර්ගඵල සිත්හි පැවති වෙදනාවෝ ලොකොත්තරය. මෙපරිද්දෙන් රූපාලම්බනයෙහි උපන්නාවූ රාගාදි කෙලශයන් ඉක්මවා ලන්නේය. එහෙයින් සියලුම චාතුර්භූමික වෙදනා තොමෝ **චක්ඛුසම්ඵස්ස පච්චයා ජාතා** නම් වේ. මේ කියනලද නයින් **සමතික්කම** වශයෙන් හෙවත් ඉක්මවීම් වශයෙන් ඒ කුසලාදීවූ නානාවීථිගත චිත්තයෝ ලැබෙත්.

**භාවනා** වශයෙන් ලැබීම මෙසේයි.

චක්ඛුද්වාරයෙහි වනාහි, රූපයක් හමුවූ කල්හි මේ රූපාලම්බනය තෙම කුමක් ඇසුරු කෙළේද? යනාදී වශයෙන් කරුණු පිරිසිඳීම කරන්නේය. ඉක්බිති ඒ රූපාලම්බනය මහා භූතයන් ඇසුරු කෙළේ වනැයි දැන සතර මහා භූතයෝද, උපාදා රූපයද, **රූපය** යයි පිරිසිඳ දනී. ඒ රූපාලම්බනය අරමුණුකොට ඇත්තාවූ චිත්ත චෛතසික ධර්මයන්, **නාමධර්ම** යයි පිරිසිඳ දනී. ඉක්බිති හෙතුව හා සමග පැවැත්තාවූ නාම රූප ධර්මය පිරිසිඳ දැන, තිලකුණු නගා විදර්ශනා ඥාන පිළිවෙලින් සංස්කාර ධර්මයන් සම්මර්ශනයකොට රහත් ඵලයට පැමිණේ.

ඒ වෙදනාවන් අතුරෙන් සියලු පරිකර්ම වෙදනාවෝ කාමාවචරය. අෂ්ටසමාපත්තීන්හි පැවති වෙදනා තොමෝ රූපාවචර අරූපාවචරය. මාර්ගඵල සිත්හි පැවති වෙදනා තොමෝ ලොකොත්තරය. මෙපරිද්දෙන් රූපාලම්බනය සම්මර්ශනයකොට වෙදනාතොමෝ නිපයන ලද්ද, එහෙයින් මේ වෙදනා තොමෝ **චක්ඛු සම්ඵස්ස පච්චයා ජාතා** නම් වේ. යථොක්ත නයින් භාවනා වශයෙන් ඒ චිත්තයෝ ලැබෙත්.

**සොතද්වාරයෙහි** වනාහි ඒ චිත්තයන්ගේ ලැබීම මෙසේ දතයුතු.

එක්තරා මහණෙක් කසිණ පරිකර්ම කොට ධ්‍යාන සමාපත්ති උපදවා ඒ සමාපත්තිහු පදට්ඨානකොට ඇති විදසුන් වඩා රහත් ඵලයට පැමිණියේයයි යන වචනය කණින් අසා උතුම් අදහස් ඇති කුලපුත් තෙමේ මේ කටයුත්ත දුෂ්කර යයි නො සළකා මා විසිනුදු මේ ගුණය උපදවන්ට වටනේ යයි සිතා පළමු නියායෙන්ම පිළිපැද රහත් ඵලයට පැමිණේ. එහි පරිකර්මාදිවූ වෙදනාවෝ යට කියනලද පරිදි දතයුතු. මේ සොත විඤ්ඤාණය තෙම චාතුර්භූමික වෙදනාවගේ නිෂ්පත්තිය පිණිස බලවත් ප්‍රත්‍යයෙක් වේද, එහෙයින් චාතුර්භූමික වෙදනා තොමෝ **සොතසම්ඵස්ස පච්චයා ජාතා** නම් වේ. මෙසේ උපනිශ්‍රය වශයෙන් ඒ චින්තායෝ ලැබෙත්.

සොතද්වාරයෙහි වනාහි ශබ්දාලම්බනය හමුවූ කල්හි ජවනවාරයෙහිදී කී පරිදි රාගාදි කෙලශයන් උපදින සැටි සම්මශීනය කොට, ඒ රාගාදිවූ කෙලශයන් ඉක්මවා පවත්නා වෙදනාවෝ **සොතසම්ඵස්ස පච්චයා ජාතා** නම් වේ. මෙසේ **සමතික්කම** වශයෙන් ඒ චින්තායෝ ලැබෙත්.

තවද ශබ්දයක් අරමුණුවූ කල්හි මේ ශබ්දය කුමක් ඇසුරු කෙළේද යනාදි වශයෙන් යටකී නයින්ම පිරිසිඳ දනී මෙසේ ශබ්දාලම්බනය සම්මශීනය කොට වෙදනා තොමෝ නිපයන ලද්ද, එහෙයින් **සොතසම්ඵස්ස පච්චයා ජාතා** නම් වේ. මෙසේ සොතද්වාරයෙහි **භාවනා** වශයෙන් ද ඒ චින්තායෝ ලැබෙත්.

**මනොද්වාරයෙහි** වනාහි තුන්ප්‍රකාරයෙන්ම ලැබෙත්.

එක් මහණෙක් ජාතියද, ජරාවද, ව්‍යාධියද, මරණයද භය වශයෙන් දකී. භය වශයෙන් දක ජාති, ජරා, ව්‍යාධි, මරණයන් කෙරෙන් මිදෙන්නට වටනේය, ඒකාන්තයෙන්ම නිදන්නාවූ මා විසින් ජාති ආදියෙන් මිදෙන්නට නොහැක්කේය. මුල පටන්ම වීයර්‍ය කරන්ට, සීලය පිරිසුදු කරන්ට වටනේ යයි සිතා යටකී නයින් පිළිපැද රහත් ඵලයට පැමිණේ.

මෙහිද, පරිකර්මාදි වේදනාවෝ යටකී නයින්ම දතයුතු මෙපරිද්දෙන් ජාති, ජරා, ව්‍යාධි, මරණය තෙම චාතුර්-භූමික වූ වේදනාවගේ නිෂ්පත්තියට බලවත් වූ ප්‍රත්‍යයක් වේද, එහෙයින් ඒ චාතුර්භූමික වේදනා තොමෝ **මනොසම්ඵස්ස පච්චයා ජාතා** නම් වේ. මෙසේ මනො ද්වාරයෙහි උපනිශ්‍රය වශයෙන් ඒ චිත්තයෝ ලැබෙත්.

මනොද්වාරයෙහි වනාහි ධම්මාරම්මණයක් හමුවූ කල්හි යටකී පරිදි රාගාදි කෙලශයන් උපදින සැටි සම්මර්ශනය කොට ඒ රාගාදිවූ කෙලශයන් ඉක්මවා පවත්නා වේදනා වෝද **මනොසම්ඵස්ස පච්චයා ජාතා** නම් වේ. මෙසේ මනොද්වාරයෙහි සමතික්කම වශයෙන් ද ඒ චිත්තයෝ ලැබෙත්.

මනොද්වාරයෙහි වනාහි ධම්මාලම්බනයක් හමුවූ කල්හි මේ ධම්මාලම්බනය කුමක් ඇසුරු කෙළේදැයි මෙසේ පිරිසිඳ දැනීම පිහිටුවයි. එය වස්තුරූපය ඇසුරු කෙළේ යයි දැන, වස්තුරූපය කුමක් ඇසුරු කෙළේදැයි නුවණින් සලකා බලන්නේ මහා භූත රූපයන් ඇසුරුකෙළේ වනැයි දැන ඒ මහණ තෙම සතර මහා භූතයෝද, උපාදා රූපද, රූප ධර්මයයි පිරිසිඳ දනී. ඒ රූප ධර්මයන් අරමුණු කොට ඇති චිත්ත චෛතසික ධර්මයන් නාම ධර්මයයි පිරිසිඳ දනී. ඉක්බිති හෙතු සහිතවූ නාමරූප ධර්මය පිරිසිඳ දැන තිලකුණු නගා විදර්ශනාඥාන පිළිවෙළින් සංස්කාර ධර්මයන් සම්මර්ශනය කොට රහත් ඵලයට පැමිණේ. ඒ වේදනාවන් අතුරෙන් සියළුම පරිකර්ම වේදනා තොමෝ කාමාවචරය. උපචාර-සමාපත්ති වේදනාතොමෝ රූපාවචර අරූපාවචරය. මාර්ගඵල සිත්හි පැවති වේදනාතොමෝ ලොකොත්තරය- මෙසේ ධර්මාලම්බනය සම්මර්ශනය කොට චාතුර්භූමික වේදනාවෝ තිපයන ලද්ද, එහෙයින් මේ වේදනාතොමෝ **මනොසම්ඵස්ස පච්චයා ජාතා** නම් වේ. මෙසේ නාවනා වශයෙන්ද ඒ චිත්තයෝ ලැබෙත්.

මේ නයින්ම සංඥා, සඞ්ඛාර, විඤ්ඤාණයන්ගේ එකාට්ඨාදී වූ භෙදය දතයුතු.

## පඤ්චුපාදානස්කන්ධ

**කාමූපාදාන, දිට්ඨූපාදාන, සීලබ්බතුපාදාන, අත්තවාදූපාදාන** යයි උපාදානයෝ සතරදෙනෙකි. තෘෂ්ණා නමැති රැහැනින් බැඳ ලඟට ඇදගන්නා බව **උපාදාන** නමි. ඒ උපාදානයන්ට විෂයවූ ස්කන්ධ සමූහය **උපාදානස්කන්ධ** නමි.

ස්කන්ධ සඞ්ඛ්‍යාවට වට්ට විවට්ට දෙක්හි පැවති සියළුම ධර්මයෝ ඇතුළත් වෙත්.

**වට්ට** නම් වූ කාමභව, රූපභව, අරූපභව යන භවත්‍රයට ඇතුළත්වූ සියළු ධර්මයෝ උපාදානස්කන්ධයෝයි.

**විවට්ට** නම් නිර්වාණ ධාතුවයි.

කාමාදි උපාදානයන්ට විෂය නොවන බැවින් ලෝකෝත්තර සිත් අට සහ එහි ඇතුළත් චෛතසික ධර්මද උපාදානස්කන්ධ සඞ්ඛ්‍යාවට ඇතුළත් නොවේ.

උපාදානස්කන්ධ පඤ්චකය විදර්ශනා භූමියට අයත් වේ.

නාමස්කන්ධයන් අතුරෙන් සියළුම අසූනවයක් සිත්හි සම්ප්‍රයුක්ත වේදනාවෝ **වේදනාස්කන්ධ** යයිද එම අසූනව සිත්හි සම්ප්‍රයුක්ත සංඥාවෝ **සංඥාස්කන්ධ** යයිද, එම අසූනව සිත්හි සම්ප්‍රයුක්ත ඉතිරි චෛතසික පනස **සංස්කාරස්කන්ධය** යයි ද, එම සිත් අසූනවයම **විඤ්ඤාණස්කන්ධය** යයි ද දතයුතු.

ලෝකෝත්තර සිත් අට හැර ඉතිරි ලෞකික සිත් අසූඑකෙහි සම්ප්‍රයුක්ත වේදනාවෝ **වේදනූපාදානස්කන්ධය** යයි ද, එම අසූ එකක් සිත්හි සම්ප්‍රයුක්ත **සංඥාවෝ**, **සඤ්ඤූපාදානස්කන්ධය** යයිද, එම අසූඑකක් සිත්හි සම්ප්‍රයුක්ත ඉතිරි චෛතසික පනස **සඞ්ඛාරූපාදානස්කන්ධය** යයි ද, එම සිත් අසූ එකම **විඤ්ඤාණූපාදානස්කන්ධය** යයි ද දතයුතු.

## ආයතන

**ආයතනයෝ** දොළොසෙකි. එනම්:-

| | | | |
|---|---|---|---|
| 1. | චක්ඛායතනය | 2. | රූපායතනය |
| 3. | සෝතායතනය | 4. | ශබ්දායතනය |
| 5. | ඝාණායතනය | 6. | ගන්ධායතනය |
| 7. | ජිව්හායතනය | 8. | රසායතනය |
| 9. | කායායතනය | 10. | ඵොට්ඨබ්බායතනය |
| 11. | මනායතනය | 12. | ධම්මායතනය |

මේ දොළොස් ආයතනයෝ පදාර්ථ වශයෙන්ද, ලක්ෂණ වශයෙන්ද, පරිච්ඡේද වශයෙන්ද, ක්‍රම වශයෙන්ද, සංක්ෂෙප වශයෙන්ද, විස්තර වශයෙන්ද දක්ක යුතු හෙවත් දෘෂ්ටව්‍ය වශයෙන්ද දතයුත්තාහ.

**ආයතනයන්ගේ පදාර්ථ:-**

**1. චක්ඛායතනය:** යම් ප්‍රසාද රූපයෙක් තෙම නොහොත් යම් ධර්ම සමූහයෙක් තෙම රූපාලම්බනය රසාස්වාදනයක්හු මෙන් කෙරේද, නොහොත් ප්‍රකාශවූවක්හු මෙන් කෙරේද එහෙයින් ඒ ප්‍රසාද රූපය තෙම නොහොත් ඒ ධර්ම සමූහය තෙම **චක්ෂුස්** නම් වේ. රූපාලම්බනය රස විඳිමක්හු මෙන් කෙරෙයි. ප්‍රකාශවූවක්හු මෙන්ද කෙරෙයි යන අර්ථය වේ.

**2. රූපායතනය**: යම් විකාර රූපයෙක් හෙවත් විකෘතිමත් වර්ණසංස්ථාන සඞ්ඛ්‍යාතවූ යම් රූපාලම්බනයෙක් තෙම ප්‍රකාශ කෙරේද හෙවත් අභිප්‍රාය හඟවාද, ඒ විකාර රූපය තෙම **රූප** නම් වේ. **වර්ණ** විකෘතියට පැමිණෙන්නාවූ වර්ණායතනය තෙමේ හෘදයඞ්ගම භාවය ප්‍රකාශ කෙරෙයි හෙවත් ශරීරවත් කොට දක්වයි යන අර්ථය වේ.

**3. සෝතායතනය:** යම් ප්‍රසාද රූපයෙක් තෙම ශබ්දාලම්බනය ශ්‍රවණය කෙරේද එහෙයින් ඒ ප්‍රසාද රූපය තෙමේ **ශ්‍රොත්‍ර** නම් වේ.

**4. ශබ්දායතනය**: යම් රාවයක් තමහට කාරණවූ ප්‍රත්‍යයන් විසින් ශ්‍රොත්‍ර විඥානයෙන් දතගතයුතු බවට පමුණුවනු ලැබේද, ඒ හෙයින් ඒ රාවය තෙම **ශබ්ද** නම් වේ පමුණුවනු ලැබෙයි යන අර්ථය වේ.

**5. ඝ්‍රාණායතනය**: යම් ප්‍රසාද රූපයෙක් ඝ්‍රාණවිඥානය නිශ්‍රය ස්ථාන කොට ගෙන ගන්ධාලම්බනය ආඝ්‍රාණය කෙරේද, එහෙයින් ඒ ප්‍රසාද රූපය තෙම **ඝ්‍රාණ** නම් වේ.

**6. ගන්ධායතනය**: යම් අරමුණක් තමාගේ නිශ්‍රයස්ථානය ප්‍රකාශ කෙරේද, එහෙයින් ඒ අරමුණ **ගන්ධ** නම් වේ. තමාගේ නිශ්‍රයභූතවූ ද්‍රව්‍යය ප්‍රකාශ කෙරෙයි යන අර්ථය වේ.

**7. ජිව්හායතනය**: යම් ප්‍රසාද රූපයෙක් ජිව්හා විඥානය නිශ්‍රයස්ථාන කොට ගෙන ජීවිතෙන්ද්‍රියය හොහොත් ජීවිතෙන්ද්‍රියට නිමිත්තවූ රසාලම්බනය ආව්හානය කෙරේද, හෙවත් කැඳවාද, ඒ ප්‍රසාද රූපය තෙම **ජිව්හා** නම් වේ.

**8. රසායතනය**: යම් අරමුණක් සත්ත්වයෝ ආස්වාදනය කෙරෙත්ද, එහෙයින් ඒ අරමුණ **රස** නම් වේ. ආස්වාදනය කෙරෙත් යන අර්ථය වේ.

**9. කායායතනය**: යම් ප්‍රසාද රූප කායයෙක් තෙම නින්දිතවූ සාශ්‍රව ධර්මයන්ගේ ප්‍රවෘත්ති කාරණය වේද, එහෙයින් ඒ ප්‍රසාද රූපකාය තෙමේ **කාය** නම් වේ. ආය නම් උත්පත්ති ස්ථානය මෙන් ගන්නා ලද ප්‍රවෘත්ති කාරණයයි.

**10. ඵොට්ඨබ්බායතනය**: යම් රූපයෙක් පහස්නා ලැබේද, එහෙයින් ඒ රූපය තෙම **ඵොට්ඨබ්බ** නමි.

**11. මනායතනය**: යම් නාම ධර්මයෙක් අරමුණ දනීද, එහෙයින් ඒ නාම ධර්මය තෙම **මනස්** නමි.

**12. ධම්මායතනය:** යම් සවභාව ධර්ම කෙනෙක් තමාගේ ධර්මභාව සඞ්ඛ්‍යාත සාධාරණ ලක්‍ෂණය දරත්ද, එහෙයින් ඒ සවභාව ධර්මයෝ තුමූ **ධර්ම** නම්.

සාමාන්‍ය වශයෙන් වනාහි, ප්‍රයත්නය කරන හෙයින්ද, විස්තරවූ නොහොත් ඒ ඒ වාරාලම්බනයන්හි ප්‍රවෘත්තවූ චිත්ත චෛතසික ධර්මයන් විස්තර කරන හෙයින්ද, දීර්ඝවූ සංසාර දුක්ඛයට පමුණුවන හෙයින්ද, **ආයතන** නම් වේ.

චක්‍ෂුරූපාදීන්හි ඒ ඒ වාරාලම්බනයන් ඇති චිත්ත චෛතසික ධර්මයෝ, **සවකීය** සවකීයවූ ආලම්බන රසාසවාදය පෙරදැරිකොට ඇති **කෘත්‍ය** වශයෙන් ප්‍රයත්න කෙරෙත් වෑර කෙරෙත්.

එමෙන්ම විස්තරවූ නොහොත් ඒ ඒ වාරාලම්බනයන්හි ප්‍රවෘත්තවූ චිත්ත චෛතසික ධර්මයන්, ඒ වාදසායතනයෝ ප්‍රසාරණය කෙරෙත් හෙවත් ප්‍රකටවූවන් කෙරෙත්.

එසේම අප්‍රකාශවූ පූර්වාවධිය ඇති හෙවත් අනවරාග්‍රවූ සංසාරයෙහි ප්‍රවෘත්තවූ ඉතාම දික්වූ මේ සසර දුක යම් තාක් කල් නොනවතීද, ඒ තාක් කල් ඒ වාදසායතනයෝ සසර දුකට පමුණුවන්මය. සසර දුක් පවත්වත්මය.

තවද **නිවාසස්ථානාර්ථ**යෙන්ද, **නිශ්‍රයස්ථානාර්ථ**යෙන්ද **සන්නිපාතස්ථානාර්ථ**යෙන්ද, **උත්පත්ති දේශාර්ථ**යෙන්ද, **කාරණ**වූ හෙවත් හේතුවූ අර්ථයෙන්ද, **ආයතන** නම්වේ.

චක්‍ෂුප්‍රසාද රූපාලම්බනාදීන්හි චිත්ත චෛතසිකවූ ඒ ඒ ධර්මයෝ ඒ ඒ වාරාලම්බනයන් අයත් පැවතුම් ඇති හෙයින් චක්‍ෂුරාදීහු ඒ චිත්ත චෛතසිකයන්ගේ **නිවාසස්ථාන** නම් වේ.

චක්‍ෂුරාදීන් කෙරෙහි ඒ චිත්ත චෛතසිකයෝ තුමූ ඒ චක්‍ෂුප්‍රසාදදීන් නිශ්‍රයකොට ප්‍රවෘත්ත බැවින්ද, ඒ රූපාදී ආලම්බනයන් අරමුණුකොට පවත්නා බැවින්ද ඒ චිත්ත චෛතසිකයන්ගේ **නිශ්‍රයස්ථාන** හෙවත් පිහිටන තැනවේ

චක්ඛුරාදීහු, ඒ ඒ චක්ඛුප්‍රසාදාදියෙහි නිශ්‍රයවූ චාරාලම්බන යන්ගේ වශයෙන් සන්නිපාතය වන හෙවත් රැස්වන හෙයින් ඒ චිත්ත චෛතසිකයන්ගේ **සන්නිපාතස්ථානය** හෙවත් රැස්ව ලග්නා තැන ද වේ.

එසේම චක්ඛුරාදීහු **ඒ** චක්ඛුප්‍රසාදාදීන් නිශ්‍රය ආලම්බන යන් කොට ප්‍රවෘත්තභාවයෙන් ඒ චක්ඛුප්‍රසාදාදියෙහිම උපදනා හෙයින්, ඒ චිත්ත චෛතසිකයන්ගේ **උත්පත්ති දේශය** නම් වේ.

චක්ඛුරාදීහු, ඒ චක්ඛුරාදීන්ගේ නොවීමෙහි ඒ චිත්ත චෛතසිකයන් නොවන හෙයින් ඒ චිත්ත චෛතසිකයන්ට **කාරණ** හෙවත් **හෙතුද** වේ.

එහෙයින් යථොක්තවූ අර්ථයෙන් යම් රූපයෙක් චක්ඛුප්‍රසාදයත් වී ද, චක්ඛුස් සඞ්ඛ්‍යාත රූපය තෙම **ආයතනයක්ද** වේ. **එහෙයින් චක්ඛායතන** නම් වේ. මෙසේ ද්වාදසායතනයන්ගේ අර්ථ හා ආයතන භාවය දතයුතු.

ආයතනයන්ගේ **ලක්ෂණාදිය** රූප කාණ්ඩයෙහි දක්වන ලද පරිද්දෙන් දතයුතු.

**පරිච්ඡෙද** වශයෙන් ආයතනයෝ දොළොසකි චක්ඛු-රාදීහුද ධර්මයෝමැයි එසේ ඒ චක්ඛුරාදීන්ගේ ධර්මභාවය ඇති කල්හි භාග්‍යවතුන් වහන්සේ විසින් ආයතනයෝ දොළොසක් කොට වදාරනලදී. මෙසේ දෙශනා කරන ලද්දේ ෂඩ්විධ විඥානකාය යාගේ උත්පත්තිවාරා-ලම්බනයන් පිරිසිඳීම් හෙතුකොට ගෙනය. චක්ඛුර්විඥානය කරණකොට ගෙන හැඳිනගත යුතුවූ වීථියෙහි ඇතුළත්වූ චිත්ත සමූහයාගේ චක්ඛායතනයම උත්පත්තිවාරයයි. රූපායතනයම ආලම්බනයයි. මෙසේම සොතායතනාදීහු සොතායතනාදී වීථීන්හි ඇතුළත් වූ චිත්ත සමූහයාගේ උත්පත්තිවාරයෝයි. ශබ්දාලම්බනාදීහු ආලම්බනයෝයි. සවැනිවූ විඥාන කායයාගේ හෙවත් මනායතනයාගේ

චනාහි භවාඞ්ග චිත්ත යයි කියනලද මනායතනයාගේ එක් කොටසෙක්ම උත්පත්තිචාරයයි. චක්ඛුවිඤ්ඤාණාදීන්ට අරමුණුවීම් වශයෙන් සාධාරණ නොවූ ධර්මායතනය තෙමේද අරමුණ වේ.

මෙකී පරිද්දෙන් ෂඩ්විධ විඥාන සමූහයන්ගේ උත්-පත්තිචාරාලම්බනයන් පිරිසිඳීම් වශයෙන් දොළොස් ආයතන කෙනෙක් වදාරන ලදී.

ක්‍රමාදී වශයෙන් උත්පත්ති ක්‍රමාදීන් අතුරෙන් දේශනා ක්‍රමය විස්තර කරණු ලැබේ.

ආත්මභාවය පිළිබඳව පවත්නා වූ හෙවත් අධ්‍යාත්මික ආයතනයන් අතුරෙන් සනිදස්සන සප්පටිඝ රූපයම අරමුණුකොට පවත්නා බැවින් නොහොත් සනිදර්ශන සප්‍රතිඝ රූපයාගේ ගැටීමට ස්ථාන වන හෙයින් චක්ඛා-යතනයම ප්‍රකටවේද, එහෙයින් පළමුකොට චක්ඛා-යතනය වදාළ සේක. ඒ චක්ඛායතනයට අනතුරුව අනිදස්සන සප්පටිඝ රූපයන් අරමුණු කොට පවත්නාවූ නොහොත් අනිදර්ශන සප්‍රතිඝ රූපයන්ගේ ගැටීමට ස්ථානවූ සොතායතනාදීහු වදාළාහ.

තවද, දර්ශන ශ්‍රවණාදීන්ට හෙතු භාවයෙන් ඉමහත් උපකාර ඇති බැවින් අධ්‍යාත්මික ආයතනයන් අතුරෙන් චක්ඛායතන, සොතායතනයන් පළමුකොට දෙශනා කරණලදහ ඊට ඉක්බිතිව ඝාණායතන, ජිව්හායතන කායායතන පිළිවෙලින් දෙශනා කරණලදහ. චක්ඛායතනය මුල්කොට ඇති පස් ආයතනයන්ගේම ගොචර විෂයකොට ඇති බැවින් මනායතනය අවසානයෙහි දෙශනා කරන ලදහ.

චක්ෂුරාදීන්ට ගොදුරුවූ අරමුණු බැවින් චක්ඛායතනාදී අධ්‍යාත්මික ආයතනයන්ට අනතුරුව බාහිර ආයතනයන් අතුරෙන් රූපායතනාදීහු දෙශනාකරන ලදහ. චක්ෂු-

ප්‍රසාදයත්, රූපාලම්බනයත් නිසා චක්ඛුවිඤ්ඤාණය තෙම උපදනේය. මෙසේ සොතප්‍රසාදයත් ශබ්දාලම්බනයත් නිසා සොත විඤ්ඤාණයද, ඝාණප්‍රසාදයත් ගන්ධායතනයත් නිසා ඝාණ විඤ්ඤාණයද, ජිව්හාප්‍රසාදයත් රසාලම්බනයත් නිසා ජිව්හා විඤ්ඤාණයද, කායප්‍රසාදයත්, පොට්ඨබ්බාලම්බනයත් නිසා කාය විඤ්ඤාණයද, මනසත් ධර්මාලම්බනයත් නිසා මනෝ විඥනයද උපදී.

**සංක්ෂෙප වශයෙන්** වනාහි මනායතනය සහ ධර්මායතනයේ එක් කොටස්ශයක් නාම ධර්ම වශයෙන්ද, එසින් අන්‍යවූ හෙවත් දොළොස් ආයතනයන් අතුරෙන් මනායතනය සහ නාම ධර්මයන්ට ඇතුළත් ධම්මායතන කොටසත් හැර ඉතිරි ආයතනයන් රූප වශයෙන්ද සංග්‍රහ කරනු ලැබේ. මෙසේ මේ දොළොස් ආයතනයෝ නාමරූප මාත්‍රයක්ම වේ.

**විස්තර වශයෙන්** වනාහි, චක්ඛායතනය තෙම ජාති වශයෙන් චක්ෂුප්‍රසාද සංඛ්‍යාත රූපමාත්‍රයක්මය. කර්මාදී ප්‍රත්‍යය නිරයාදී ගතිය, ක්ෂත්‍රිය, බ්‍රාහ්මණාදීවූ ද හස්ති අශ්වාදී වූද නිකාය, ඒ ඒ සත්ත්වයාගේ සන්තති යයි කියන ලද පුද්ගලය යන මොවුන්ගේ ප්‍රභෙද වශයෙන් අප්‍රමාණ වූ ප්‍රභෙද ඇත්තේ වේ.

**සොතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන** යන ආයතනයෝ සතරදෙනද චක්ඛායතනය මෙනි.

**මනායතනය** තෙම, ත්‍රෛභූමික කුසලාකුසල විපාක ක්‍රියා චිත්තයන්ගේ ප්‍රභෙදයෙන් එක් අසූවක් ප්‍රභෙද ඇත්තේ වේ. මෙහිදී ලොකොත්තර සිත් අට හෙවත් ලොකොත්තරවූ ආයතනයන් ඇතුළත් නොකොට ත්‍රෛභූමික කුසලාදි චිත්තයන්ම ගෙන දක්වන ලද බව දතයුතු. එසේම නිශ්‍රය වස්තු ප්‍රතිපදාදී භෙද වශයෙන් අප්‍රමාණවූ ප්‍රභෙද ඇත්තේවේ.

**රූප, ගන්ධ, රසායතනයෝ** තුමූ සමුට්ඨාන ප්‍රභෙද වශයෙන් හෙවත් උත්පත්ති හෙතූන්ගේ වශයෙන් ප්‍රභෙද සතරක් ඇත්තාහ. **ශබ්දායතන** යෙහි ප්‍රභෙද දෙකෙකි සභාග විසභාග වශයෙන් නොහොත් නීලාදිය නීලාදියට සභාගය, පීතාදියට විසභාගය යන මොවුන්ගේ ප්‍රභෙද වශයෙන් වනාහි සියළු ආයතනයෝම අප්‍රමාණවූ ප්‍රභෙද ඇත්තාහ.

**පොට්ඨබ්බායතනය** තෙම පඨවි ධාතු තෙජො ධාතු වායො ධාතු වශයෙන් භෙදත්‍රයක් ඇත්තේය සමුට්ඨාන වශයෙන් හෙවත් උත්පත්ති හෙතු වශයෙන් ප්‍රභෙද සතරෙකි. සභාග විසභාග වශයෙන් නොයෙක් ප්‍රභෙද ඇත්තේය.

**ධර්මායතනය** තෙම ත්‍රෛභූමික ධර්මාලම්බනයාගේ වශයෙන් නොයෙක් ප්‍රභෙද ඇත්තේය.

**සියළුම ආයතනයෝ**: දක්කයුතු ආකාරයෙන් වනාහි **අනාගමන** හෙවත් නොයීම් වශයෙන්ද, **අනිග්ගමන** හෙවත් නොයෑම් වශයෙන්ද දත යුත්තාහ.

යම් හෙයකින් ඒ ආයාතනයෝ ඉපදීමෙන් පූර්වයෙහි කිසි තැනෙකින් නොඑද්ද, භඞ්ගයෙන් මත්තෙහි කිසි තැනෙක්හි නොයත්ද, ඉපදීමෙන් පූර්වයෙහි නොලත් ස්වභාවය ඇත්තාහු වෙද්ද, භඞ්ගයෙන් මත්තෙහි හාත් පසින් බිඳිනු ස්වභාවය ඇත්තාහු වෙද්ද, පූර්ව කොට්ඨාස යන්ගේ මධ්‍යයෙහි ප්‍රත්‍යයන් අයත් පැවතුම් ඇති බැවින් තමා වශයෙහි පැවැත්ම නැත්තාහුව පවතිත්ද, එහෙයින් **අනාගමන** හෙවත් නොයීම් වශයෙන්ද, **අනිග්ගමන** හෙවත් නොයෑම් වශයෙන්ද දක්ක යුත්තාහ.

තවද ආයතනයෝ, චිත්ත ව්‍යාපාර රහිතයන් වශයෙන්ද සපරිස්පන්දක්‍රියා භාවයෙන් උත්සාහ නොකිරීම් වශයෙන්ද දතයුත්තාහ.

චක්ඛුප්‍රසාද රූපාලම්බනාදීන්, අපගේ එක්වීමක් ඇති කල්හි විඥානයෙක් නම් උපදනේද, ඒ ඉපදීම විස්මය කැයි මෙසේ සිතීමක් නොවේ.

එසේම ඒ ආයතනයෝ විඥානොත්පත්තිය පිණිස චක්ෂු ර්ාරාදී ර්ාරභාවයෙන් හෝ චක්ඛුවස්තු ආදි වස්තු භාවයෙන් හෝ රූපාලම්බනාදී ආලම්බන භාවයෙන් හෝ පරිස්පන්දනාදි වශයෙන් නොගැටෙත්, හෙවත් වැර නොකෙරෙත්, උත්සාහ බවට නොපැමිණෙත්.

ඒකාන්තයෙන්ම චක්ඛුරූපාදීන්ගේ එක්වීමක් ඇති කල්හි චක්ෂුර් විඥානාදීහු යම් හෙයකින් හටගනිද්ද, මේ චක්ෂුර් විඥානාදීන්ගේ උත්පත්තිය තොමෝ ධර්මස්වභාව යෙන්ම ලැබේ. එහෙයින් සපරිස්පන්දක්‍රියා භාවයෙන් උත්සාහ නොකිරීම් වශයෙන්ද, චින්තනක්‍රියා භාවයෙන් ව්‍යාපාර රහිත වශයෙන්ද දතයුත්තාහ.

අධ්‍යාත්මික ආයතනයෝ මනුෂ්‍ය වාසයෙන් සූන්‍යවූ ගමක්හු මෙන් දත යුත්තාහ. නිත්‍ය, සුභ, සුඛ ආත්මාදි භාවයෙන් විශුක්ත බැවිනි.

බාහිර ආයතනයෝ ගම් පහරණ සොරුන් මෙන් දත යුත්තාහ. අධ්‍යාත්මික ආයතනයන් පැහැර ගැන්ම කරන බැවිනි.

තවද අධ්‍යාත්මික ආයතනයෝ සර්පාදි ප්‍රාණීන් සදෙනෙකු මෙන් දතයුත්තාහ.

බාහිර ආයතනයෝ ඒ ප්‍රාණීන්ගේ ගොදුරු මෙන් දත යුත්තාහ.

තවද ඒ ර්ාදසායතනයන්ගේ විශෙෂයෙන් දර්ශනය කටයුතුවූ ආකාරයද දතයුතු.

චක්ඛුප්‍රසාදය ඉපිද හෝ පැවත නැතිවන හෙයින් නොහොත් ඉපදීමෙන් මත්තෙහි නොපැවත බිඳෙන හෙයින් **අනිත්‍ය** යයි විදර්ශනා ඥානයෙන් විශෙෂයෙන් දක්නට සුදුසුය.

එසේම **උත්පාද** භඞ්ගවත් හෙයින්ද, **උත්පාද** භඞ්ග යන්ම අවසන් කොට ඇති හෙයින්ද, විපරිණාම භාවය හෙවත් ප්‍රකෘති ස්වභාවය පියන හෙයින්ද, තාවකාලීන හෙයින්ද, නිත්‍යත්වය ප්‍රතික්ෂෙප කරන හෙයින්ද යන මේ හෙතූන් කාරණකොට ගෙන චක්ෂුසය **අනිත්‍ය නම් වේ.**

ඒ චක්ෂුසම, නිත්‍ය පීඩා කරන හෙයින් **දුක්ඛ** නම්. යම් හෙයකින්. උපන්නාවූ ඒ චක්ෂුප්‍රසාදය තෙම ස්ථිති සඞ්ඛ්‍යාත භඞ්ගාභිමුඛ අවස්ථාවට පැමිණේද, ස්ථිති සඞ්ඛ්‍යාත භඞ්ගාභිමුඛ අවස්ථාවෙහිදී, උපන්නා වූ ඒ චක්ෂුප්‍රසාදය තෙම ජරාව කාරණකොට ගෙන කලාන්තත වේද, ජරාවට පැමිණ ඒකාන්තයෙන් බිඳේද, එහෙයින් නිත්‍යයෙන් පීඩා කරණ හෙයින්ද, නො ඉවසිය හැකි හෙයින්ද, දුකට කරුණු වන හෙයින්ද, සුඛයට ප්‍රතිපක්ෂ වන හෙයින්ද, යන මේ හේතූන් කාරණකොටගෙන **දුක්ඛනම්.**

තමාගේ වශයෙහි නොපවත්නා අර්ථයෙන්ද, නොහොත් වශයෙහි පැවැත්ම තමහට නැත්තාවූ අර්ථයෙන්ද **අනාත්ම** නම් උපන්නාවූ ඒ චක්ෂුප්‍රසාදය තෙම ස්ථිති සඞ්ඛ්‍යාත භඞ්ගාභිමුඛ අවස්ථාවට නොපැමිණේවා, ස්ථිති සඞ්ඛ්‍යාත භඞ්ගාභිමුඛ අවස්ථාවට පැමිණියාවූ ඒ චක්ෂු-ප්‍රසාදය තෙම ජරාවට නොපැමිණේවා, ජරාවට පැමිණියා වූ ඒ චක්ෂුප්‍රසාදය තෙම නොබිඳේවා යනාදි වශයෙන් මේ තුන් තැන්හි කිසි පුද්ගලයක්හුගේ වශයෙහි පවත්නා බවෙක් නැත. යම් හෙයකින් ඒ තමා වශයෙහි පවත්නා ආකාරයෙන් ශූන්‍ය වේද, හෙවත් හිස්වේද එහෙයින් ශූන්‍ය වශයෙන් හෙවත් වශයෙහි පවත්නා ආකාර ශූන්‍ය වශයෙන්ද අස්වාමික හෙවත් අහිමි වශයෙන්ද සිය කැමැත්තක් කරගැන්ම නුපුළුවන් වශයෙන්ද නොහොත් සිය කැමැත්තක් කරගැන්ම තමහට නොමැති වශයෙන්ද ආත්මයට ප්‍රතිපක්ෂ වශයෙන්ද හෙවත් අනාත්ම වශ-යෙන්ද යන මේ හේතූන් කාරණකොට ගෙන **අනාත්ම** නම්.

එසේම විනාශයට පැමිණීම් වශයෙනුදු පූර්වාපර වශයෙනුදු භවාන්තරයකින් භවාන්තරයෙක්හි උත්පත්ති කිරීම් වශයෙනුදු ප්‍රකෘති භාවය පියන හෙයිනුදු **විපරිණාම ධර්ම** නම්. මේ විපරිණාම ධර්ම යන වචනය අනිත්‍යය යන පදයාගේ පර්‍යාය වචනයකි.

රූපාදීන්ගේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, විපරිණාම ස්වභාවයන් මේ නයින්ම දතයුතු.

තවද, චක්ෂුප්‍රසාදය හැර ඉතිරි ත්‍රෛභූමික ධර්මයෝ **අනිත්‍ය** නම් වෙති. චක්ෂුස නම් නොවේ. චක්ෂුප්‍රසාදය තෙම වනාහි චක්ෂුසද වේ. අනිත්‍යයද වේ. එපරිද්දේන්ම චක්ෂුස කෙරෙන් අන්‍යවූ ත්‍රෛභූමික ධර්මයෝ දුක් නම් වෙත්. චක්ෂුස නම් නොවේ. චක්ෂුප්‍රසාදය තෙම චක්ෂුස වේ. දුකද වේ. චක්ෂුස කෙරෙන් අන්‍යවූ ත්‍රෛභූමික ධර්මයෝ අනාත්ම නම් වෙත්. චක්ෂුස නම් නොවේ. චක්ෂුප්‍රසාදය තෙම වනාහි චක්ෂුද වේ. අනාත්මද වේ, රූපාදීන්හිද මේ නයම වේ.

විදසුන් වැඩීම් වශයෙන් ආයතනයන් දෙශනා කරන් නාවූ භාග්‍යවතුන් වහන්සේ දොළොස් ආයතනයන්ගේ අනාත්ම ලක්ෂණය දක්වනසේක් අනිත්‍ය පදය කාරණ කොට ගෙන හෝ දක්වා වදාරණ සේක. එසේම දුක්ඛ පදය කාරණ කොටගෙන හෝ අනිත්‍ය දුක්ඛ දෙපදයන් කාරණ කොටගෙන හෝ දක්වා වදාරණ සේක.

චක්ෂුප්‍රසාද සඞ්ඛ්‍යාත වූ ඇස මාගේ ආත්මය යැ යි යම් පුද්ගලයෙක් කියා නම් ඒ පුද්ගලයාගේ ඒ කීම නොවටී. කවර හෙයින්දයත්? චක්ෂුසයාගේ ඉපදීමද බිඳීමද පෙණෙන හෙයිනි. මෙසේ අනිත්‍ය ලක්ෂණයෙන් අනාත්ම ලක්ෂණය දක්වා වදාළ සේක.

රූපයද අනාත්මය ය. මේ රූපය ආත්මයක් වන්නේ නම් ආබාධ සඞ්ඛ්‍යාත වූ දුක්ඛය පිණිස නොවන්නේය. ආත්ම ලබ්ධි ගත්‍ත රූපයෙහි මාගේ රූපය තෙම මෙප-

රිද්දෙත් වේවා, මෙපරිද්දෙන් නොවේවා යි මෙසේ වශ යෙහි පැවැත්මක් ලැබිය යුතු වන්නේමය. යම් හෙයකින් රූපය තෙම අනාත්ම වේද, එහෙයින් රූපය තෙම ආබාධ සඞ්ඛ්‍යාත දුක්ඛය පිණිස ගිලන් බව පිණිස වන්නේය. ආත්ම ලබ්ධිගත් රූපයෙහි මාගේ රූපය තෙම මෙයා කාරයෙන් නොවේවා යි මෙසේ වශයෙහි පැවැත්මක් නොලැබිය හැක්කේය. මෙසේ දුක්ඛ ලක්ෂණයෙන් අනාත්ම ලක්ෂණය දක්වා වදාළ සේක.

මේ රූපය අනිත්‍යය. යම් රූපයෙක් අනිත්‍ය වේද, ඒ රූපය තෙම දුක්ඛය හෙවත් නිතර පීඩා කරන සුළුය. යම් රූපයෙක් දුක්ඛවේද, ඒ රූපය තෙම අනාත්මය ය, ආත්මයෙක් නොවන්නේය. මේ රූපය තෙම මාගේ ධනය නොවේ. මේ ධර්මය තෙම මම නොවෙමි. මේ රූප ධර්මය තෙම මාගේ ආත්මය නොවේ. මෙපරිද්දෙන් නැවත නැවත නුවණැසින් දක්නට සුදුසුය. මෙසේ අනිත්‍ය දුක්ඛ දෙපදයන් කාරණකොටගෙන නොහොත් අනිත්‍ය ලක්ෂණ දුක්ඛ ලක්ෂණ යන් කාරණකොට ගෙන අනාත්ම ලක්ෂණය දක්වා වදාළ සේක. අනිත්‍ය දුක්ඛ ලක්ෂණයන් ප්‍රකට බැවින් මෙසේ දක්වා වදාළ බව දතයුතු. අනාත්ම ලක්ෂණය අප්‍රකටය. එහෙයින් අන්ධකාරය, ප්‍රකටව නොවැටහේ. දුකසේ පිරිසිඳිම කටයුතුය. දුකසේ දැක්විය යුතුය. දුකසේ පැණවිය යුතුය. අනිත්‍ය දුක්ඛ ලක්ෂණයෝ බුදුවරු නැතත් මනාසේ වැටහෙත්. අනාත්ම ලක්ෂණය බුදුවරුන් පාදයකින් තොරව නො වැටහේ. මහත්වූ ඍද්ධි ඇත්තාවූ, මහත්වූ ආනුභාව ඇත්තාවූ සරභඞ්ග ශාස්තෘන් ප්‍රමුඛ කොට ඇති තාපස පරිබ්‍රාජකයෝද අනිත්‍යය දුක්ඛය යයි කීහ. ඉදින් ඔවුහු අනාත්මය යයි කියන්ට සමර්‍ථවීනම් මාර්‍ගඵල ප්‍රතිවේධය වන්නේමය. අනාත්ම ලක්ෂණ පැණවීම් නොහොත් අනාත්ම ලක්ෂණයාගේ අවබෝධය කරවීම සර්‍වඥ බුද්ධවූවන්හු කෙරෙන් අන්‍යවූ කිසිවකුට විෂය නොවේ. සර්‍වඥ වූ බුදුවරයන්ටම විෂය වේ.

**අනිත්‍ය ලක්ෂණය** තෙම, ත්‍රෛභූමික සංස්කාරයන්ගේ උදයව්‍යය සවභාවයන් මෙනෙහි නොකිරීම හේතු කොට ගෙන ප්‍රතිවේධය නොකිරීම හෙතුකොට ගෙන සන්තති වශයෙන් ප්‍රතිච්ඡන්න වූ හෙයින්ද නොවැටහේ.

**දුක්ඛ ලක්ෂණය** තෙම, නිත්‍යයෙන් පීඩාකරන බව, මෙනෙහි නොකිරීම හෙතුකොට ගෙන, ප්‍රතිවේධය නො-කිරීම හෙතුකොට ගෙන ඉරියව්වලින් වැසුනු හෙයින් ද නොවැටහේ.

**අනාත්ම ලක්ෂණය** තෙම, නානා ධාතුන්ගේ වශයෙන් වෙන් වෙන්කොට මෙනෙහි නොකිරීම හෙතුකොට ගෙන ප්‍රතිවේධය නොකිරීම හෙතුකොට ගෙන සන්තති වශයෙන් ප්‍රතිච්ඡන්න වූ හෙයින්ද නොවැටහේ.

උදයව්‍යය සඞ්ඛ්‍යාත ඉපදීම් බිඳීම් මෙනෙහි කොට නුවණැසින් සන්තතියගේ ප්‍රකෘති භාවය බිඳ බැලූ කල්හි අනිත්‍ය ලක්ෂණය තෙම අවිපරීත සවභාවයෙන් වැටහේ.

නිත්‍ය බාධන සවභාවය හෙවත් නිතර පෙළෙන බව මෙනෙහි කොට ඊර්යාපථය ඉගුළු කල්හි දුක්ඛ ලක්ෂණය අවිපරීත සවභාව වශයෙන් වැටහේ.

නානා ධාතුන් නුවණැසින් වෙන් වෙන් වශයෙන් බෙදු ඝනවිනිබ්භාගය කළ කල්හි අනාත්ම ලක්ෂණය අවිපරීත සවභාව වශයෙන් වැටහේ.

මෙසේ සක්න්ධ පඤ්චකය උදයව්‍යය හෙවත් ඉපදීම් බිඳීම් වශයෙන් වෙනස්වන බැවින් අනිත්‍යය, නිතර පෙළෙන බැවින් දුක්ඛය, දුක්වන හෙයින් අනාත්මද වේ.

විදර්ශනා වඩන්නාවූ පුද්ගලයන්ට උපකාර වනු පිණිස භාග්‍යවතුන් වහන්සේ මෙසේ චක්ඛායතන රූපායතනාදි පිළිවෙලින් වාර ආලම්බන යුග්ම වශයෙන් වදාළ සේක. අභිධම්ම දෙශනයෙහි වනාහි ඒ දෙළොස් වැදෑරුම්වූ ආයතන යන් අධ්‍යාත්මික ආයතන, බාහිර ආයතන වශයෙන්

අසම්මිශ්‍රව දක්වීම පිණිස **චක්ඛායතන සොතායතන** යනාදිය වදාළ සේක. මේ දෙශනා ක්‍රමයෙහි චක්ඛායතනාදීන්ගේ විස්තරය යටකී නයින්ම දතයුතු. විශෙෂයෙන් **ධම්මායතනයාගේ** විස්තරය දක්වනු ලැබේ.

වෙදනාසකන්ධය, සංඥසකන්ධය, සංස්කාරසකන්ධය යන සකන්ධත්‍රය හෙවත් දෙපනස් චෛතසික සමූහයද, අනිදස්සන අප්පටිඝ රූප හෙවත් සොළොස් වැදෑරුම් සූක්‍ෂම රූප සමූහයද නිර්වාණ සඞ්ඛ්‍යාත අසඞ්ඛත ධාතුවද යන එකුන් සැත්තෑ (69) ධර්මයෝ **ධම්මායතනය නම් වේ.** මෙම එකුන් සැත්තෑ ධර්මයන් අතුරෙන් දෙපනස් චෛතසික ධර්මයන්ද සූක්‍ෂම රූප සොළොසද යට දක්වන ලදී.

**අසඞ්ඛත ධාතු** යනු අසංස්කෘත ස්වභාවවූ හෙවත් කර්මාදි ජනක ප්‍රත්‍යයන් විසින් නොසකස් කළ ප්‍රකෘති බැව් ඇත්තාවූ නිර්වාණ ධාතුවයි. **අසඞ්ඛත ධාතුව** වදාරණ්නාවූ භාග්‍යවතුන් වහන්සේ **රාගක්ඛය, දෙසක්ඛය, මොහක්ඛය** යයි වදාළ සේක. මේ අසඞ්ඛත ධාතුවෙහි රාගය තෙම ක්‍ෂයවේද එහෙයින් ඒ අසඞ්ඛත ධාතු තොමෝ **රාගක්ඛය** නමි. නිර්වාණයට පැමිණ හෙවත් නිවණ අරමුණුකොට රාගය ක්‍ෂය කරන්නේය යන අර්ථයි. එමෙන්ම නිවණ අරමුණුකොට ද්වෙෂය ක්‍ෂය වේද, එහෙයින් ඒ නිර්වාණයම **දෙසක්ඛය** නමුදුවේ. එසේම නිවණ අරමුණුකොට මොහය ක්‍ෂය වේද එහෙයින් ඒ නිර්වාණයම **මොහක්ඛය** නමුදු වේ. **රාගක්ඛය දෙසක්ඛය මොහක්ඛය** යන නම් තුනම නිර්වාණයාගේම අන්වර්ථ නම්හුය.

**අවිද්‍යාවද, තෘෂ්ණාවද යන** ධර්මවය, නිර්වාණය අරමුණු කොට උපදින්නාවූ මාර්ගඥනයෙහි ක්‍ෂය වන්නාහ. එහිම බිදෙන්නාහ. ඒ නිර්වාණයෙහි රූපාලම්බනාදිවූ කිසි ධර්ම ජාතයෙක් හෙවත් රූපාදිවූ කිසි සකන්ධයෙක් කිසි කලෙකත් නැත.

චාදසායතනයන් අතුරෙන් **චක්ඛායතන, සොතායතන ඝාණායතන, ජිව්හායතන, කායායතන, රූපායතන, ශබ්දායතන, ගන්ධායතන, රසායතන, පොට්ඨබ්බායතන** යන දස ආයතනයෝ කාමාවචරයහ. ආයතනයන් දෙදෙනෙක් හෙවත් **මනායතන, ධර්මායතන** යන දෙදෙන චාතුර්භූමිකයහ. ලෞකික ලෝකෝත්තර මිශ්‍රයහ.

## ධාතු

**ධාතුහු** අටළොසකි. මේ අටළොස් ධාතුහු සූත්‍රාන්තභාජනීයයෙහි ත්‍රිවිධ ෂට්කයන්ගේ වශයෙන් දෙශනාකොට තිබේ. ඒ ත්‍රිවිධ ෂට්කයන් අතුරෙන් **පළමු ෂට්කය** නම්, **පඨවි ධාතු, ආපො ධාතු, තෙජො ධාතු, වායො ධාතු, ආකාශ ධාතු විඤ්ඤාන ධාතු** යන සය වේ.

**දෙවෙනි ෂට්කය** නම්, **සුඛ ධාතු. දුක්ඛ ධාතු, සොමනස්ස ධාතු, දොමනස්ස ධාතු, උපෙක්ඛා ධාතු, අවිජ්ජා ධාතු** යන ධාතු සය වේ.

**තුන්වන ෂට්කය**නම්, **කාම ධාතු, ව්‍යාපාද ධාතු, විහිංසා ධාතු, නෙක්ඛම්ම ධාතු, අව්‍යාපාද ධාතු, අවිහිංසා ධාතු,** යන ධාතු සය වේ.

අභිධර්ම භාජනීයයෙහි වනාහි මේ අටළොස් ධාතුහු

| | |
|---|---|
| **1. චක්ඛු ධාතු** | **10. ජිව්හා ධාතු** |
| **2. රූප ධාතු** | **11. රස ධාතු** |
| **3. චක්ඛුවිඤ්ඤාණ ධාතු** | **12. ජිව්හා විඤ්ඤාණ ධාතු** |
| **4. සොත ධාතු** | **13. කාය ධාතු** |
| **5. සද්ද ධතු** | **14. පොට්ඨබ්බ ධාතු** |
| **6. සොතවිඤ්ඤාණ ධාතු** | **15. කාය විඤ්ඤාණ ධාතු** |
| **7. ඝාණ ධාතු** | **16. මනො ධාතු** |
| **8. ගන්ධ ධාතු** | **17. ධම්ම ධාතු** |
| **9. ඝාණ විඤ්ඤාණ ධාතු** | **18. මනො විඤ්ඤාණ ධාතු** |

වශයෙන් වදාරණ ලදී.

මෙයින් පළමුකොට ත්‍රිවිධ ෂට්කයන් වශයෙන් සුත්‍රාන්ත භාජනීයයෙහි වදාරන ලද ධාතූහු විස්තර කරනු ලැබේ.

**ධාතු** ශබ්දයාගේ අර්ථය **නම් ස්වභාව** සඞ්ඛ්‍යාත අර්ථය වේ. ස්වභාවය නම් ශුන්‍ය බවයි. ශුන්‍යභාවාර්ථය නම් නිස්සත්ත්ව නිජ්ජීව සඞ්ඛ්‍යාත අර්ථය වේ. මෙසේ ස්වභාව වූද ශුන්‍යත්ව වූද, නිස්සත්ත්ව නිජ්ජීවවූද ධර්මයෝ **ධාතු නමි.**

තවද, සම්භව වූ පරිද්දෙන් අනෙකප්‍රකාරවූ සංසාර දුක්ඛය විධානය කරන හෙයින්ද,

බර ගෙන යන්නවුන් විසින් බර මෙන් සත්ත්වයන් විසින් උසුලනු ලැබෙත්ය යන අර්ථයෙන්ද,

තමා වශයෙහි නොපවත්නා හෙයින් ද,

දුක්ඛ විධානය පමණක්ම වන හෙයින් ද,

සසර දුක නැවත නැවත කරනු ලබන හෙයින් ද,

සිද්ධ කරනලද සංසාර දුක්ඛය මොවුන් කෙරෙහි තබනු ලැබේය යන අර්ථයෙන් ද,

ඥෙයය අවයව වූවාහු වන හෙයින් ද, ධාතු නම් වේ.

## පඨවි ධාතුව

**පඨවි ධාතු**— ප්‍රකෘති පොළොව මෙන් පිහිටවූ ධාතුව **පඨවි ධාතු** නමි. සහජාත රූපයන්ගේ පිහිටීමට ආධාර වන ධාතුවයි.

**පඨවිධාතු** තොමෝ **අධ්‍යාත්මික පඨවි ධාතුය, බාහිර පඨවි ධාතුය** යයි විධ වේ.

මේ අධ්‍යාත්මික බාහිර පෘථිවි ධාතූන් අතුරෙන් අධ්‍යාත්මික පෘථිවි ධාතුව යනු සත්ත්වයන්ගේ සන්තානයෙහි අන්තර්ගතවූ හෙවත් ඉන්ද්‍රිය බද්ධවූ, තම තමන් සතුවූ අධ්‍යාත්මික පෘථිවි ධාතු තොමෝ යි.

**බාහිර පෘථිවි ධාතුව යනු** සංස්කාරයන්ගේ සන්තාන යෙහි අනනුගත වූ අනින්ද්‍රිය බද්ධවූ හෙවත් ඉන්ද්‍රියයන් හා අසම්බන්ධවූ පෘථිවි ධාතු තොමෝ යි.

**අධ්‍යාත්මික පඨවි ධාතුව**— යමක් සත්ත්ව සන්තාන ගතවූවාද, පුද්ගලයන්ට වෙන් වෙන්ව ලැබුනේද, **කක්ඛල** හෙවත් තදවූවාද, **ඛරිගත** හෙවත් රළුවූවාද, **කක්ඛලත්ත** හෙවත් කර්කශ බවට පත්වූවාද, **කක්ඛලභාව** හෙවත් කර්කශ ස්වභාවය වේද, **අජ්ඣත්ත උපාදින්න** හෙවත් සත්ත්ව සන්තාන පර්‍යාපන්නවූ ආත්මභාව සඞ්ඛ්‍යාතවූ ශරීරයෙහි පිහිටියාවූ, කෙස්, ලොම්, නිය, දත්, සම, මස්, නහර, ඇට, ඇටමිදුළු, වකුගඩු, හදයමාංශය, අක්මාව, දලබුව, බඩදිව, පපුමස, බඩවැල, කුඩා බඩවැල, නොපැසුණු අහර, පැසුණු අහර ආදී ශරීරයට අයත්වූ ද යම් ඒ අන්‍යවූ, තමා අයත්වූ, සත්ත්වයන්ට වෙන් වෙන් වශයෙන් අයත් වූ, කර්කශවූ, රළු වූ, කර්කශ බවට පත්වූ කර්කශ ස්වභාවය ඇති අධ්‍යාත්මික ශරීරයට අයත් පඨවි ධාතුවක් ඇද්ද, මෝතොමෝ **අධ්‍යාත්මික පඨවි ධාතුවය යි** කියනු ලැබේ.

ශරීරයෙහි පිහිටියාවූ රූපය තෙමේ කම්ම සමුට්ඨාන හෙවත් කර්මය හෙතුකොට ගෙන උපන් රූපයය එසේ කර්මය හෙතුකොට ගෙන නූපන් රූපය යයි විධ වේ. මාගේ ආත්මභාවය ය යි ආකර්ෂණය කරනු ලැබීමය, මාගේ ආත්ම භාවය ය යි ග්‍රහණය කරනු ලැබීමය, මාගේ ආත්ම භාවය ය යි පරාමර්ශනය කරනු ලැබීමය යන මොවුන්ගේ වශයෙන් ශරීරසථවූ ඒ රූප සියල්ලම **උපාදින්න රූප** නම් වේ.

**බාහිර පඨවි ධාතුව**— යමක් සත්ත්ව සන්තානයෙන් බාහිර වූවාද, කර්කශ වූවාද, රළු වූවාද, කර්කශ බවට පත් වූවාද, කර්කශ ස්වභාවය වේද, ශරීරයට අයත් නොවූවාද, එනම් – අයො හෙවත් යකඩය, ලොහය, තිපු හෙවත් සුදු ඊයම්ය, සීසං හෙවත් කළු ඊයම්ය, සජ්ඣු හෙවත්

රිදීය, **මුත්තා** හෙවත් මුතුය, **මණි** හෙවත් මැණික්ය, **වෙළුරිය** හෙවත් වෛඩූර්‍ය්‍යය, **සංඛ** හෙවත් සක්ය, **සිලා** හෙවත් සියලු ගල් වර්ගය, **පවාල** හෙවත් පබළුය, **රජතය**, **ජාතරූප** හෙවත් සවර්ණය, **ලොහිතංක** හෙවත් රතු මැණික්ය, **මසාරගල්ල** හෙවත් කබර මාණික්‍යය, **තිණ** හෙවත් තෘණය, **කඨය** හෙවත් දරය, **සක්ඛර** හෙවත් කැටගල්ය, **කඨල** හෙවත් මැටි බඳුන් කැබලිය, **භූමි** හෙවත් පෘථිවියය, **පාසාණ** හෙවත් සත්රියන් වට ඇති ඇත් බඳ පමණට නොපැමිණි ගල්ය, **පබ්බත** හෙවත් පාසාණයට වඩා විශාලවූ පර්වතය යනාදිය ද, යම් ඒ අන්‍යවූ හෙවත් පුද්ගල සන්තානයට අයත් නොවූ හෙවත් ශරීරගත නොවූ කර්කශවූ රළුවූ කර්කශ බවට පත්වූ, කර්කශ සවභාවය වූ, ශරීරයට අයත් නොවූ පඨවි ධාතුවක් ඇද්ද, ඕතොමෝ බාහිර **පඨවි ධාතු** නම්.

මෙසේ යම් අධ්‍යාත්මික පඨවි ධාතුවක් ඇද්ද, බාහිර පඨවි ධාතුවක් ඇද්ද, ඒ දෙකම එක්කොට ගළපා, කැටිකොට ගත්තීද, මෝනොමෝ **පඨවි ධාතුව** යයි කියනු ලැබේ.

අධ්‍යාත්මික බාහිර පඨවි ධාතූන් අතුරෙන් අධ්‍යාත්ම සන්තානය හෙවත් තම තමන්ගේ ආත්ම භාවය අයත් කොට පවත්නාවූ කර්කශ සවභාවය, කෙශා ලොමාදීන්ගේ වශයෙන් උපාදින්න පඨවි ධාතුව යයි දක්වා වදාළ සේක.

මේ කෙස්හු නම්, ආත්ම භාවය ආධාරකොට පවත්නාහ. උපාදින්නය හෙවත් මාගේ ආත්ම භාවය යයි දැඩිකොට ගන්නා ලදයහ. ශරීරසථයහ, හෙවත් සිරුරෙහි පිහිටියහ. කර්කශ සවභාව ලක්ෂණකොට ඇත්තාහ, මේ සිරුරෙහි ලොමාදීවූ ඉතිරි කොටඨාසයන් කෙරෙන් වෙන්වූ හෙවත් අසම්මිශ්‍රවූ පෘථිවිධාතු කොටසෙක, සත්ත්ව පුද්ගලාදි භාවයෙන් ශූන්‍යවූ පෘථිවි ධාතු කොටඨාස මාත්‍රයෙක්මය, ලොමාදීවූ අනිකුදු කොටසද අසම්මිශ්‍රවූ පෘථිවි ධාතුමය යනාදි වශයෙන් භාග්‍යවතුන් වහන්සේ ධාතු මනසිකාරය දක්වා වදාළ සේක. මේ ධාතු මනසිකාරයෙහි වනානි

භාවනා කර්මය කොට වීර්‍ය්‍යය යොදා, විදර්ශනා වඩා, උත්තමාර්ථය හෙවත් අර්හත් ඵලයට පැමිණෙනු කැමති මහණහු විසින් පළමුකොට චතුපාරිශුද්ධි ශීලය පිරිසිදු කළ යුතුය. සිල්වත් මහණහට කර්මස්ථාන භාවනාව සමෘද්ධවත හෙයිනි. මෙසේ පිරිසිදුවූ සිල් ඇති මහණහු විසින් චතුපාරිශුද්ධි ශීලයෙහි මනාකොට පිහිටා ආවාසාදිවූ පූර්වපරිරෝධයන් සිඳ හළ යුතුය. ඉක්බිතිව දික්වූ කෙස් ආදිවූ අපර පරිරෝධයන්ද දුරුකටයුතුය. මෙසේ සිඳ පියතලද පළිබෝධ ඇති මහණහු විසින් ධාතු මනසිකාර කර්මස්ථානය උගෙනගත යුතු.

ධාතු මනසිකාර කර්මස්ථානය උගන්වන්නාවූ ආචාර්‍ය්‍ය යන් වහන්සේ විසින්ද සත්වැදෑරුම්වූ උද්ග්‍රහණ කෞශල්‍යයද දස වැදෑරුම් වූ මනස්කාර කෞශල්‍යයද ඇස්විය යුතුයි. අන මැස්සහු විසින්ද ආචාර්‍ය්‍යයන් වහන්සේගේ සමීපයෙහි නොයෙක්වර හැදෑරීම කොට, ගැටළු තැන් රහිත වූවක්හුද, අභ්‍යාස වූවක්හුද කොට කමටහන වැඩිය යුතුයි. නවද ඒ මහණහු විසින් අත්‍යාසන්නතා, අතිදූරතාදිවූ අටළොස් සෙනසුන් දොසින් දුරුව, පසඟින් යුක්තවූ සෙනස්නෙහි වැස, තමනුත් කර්මස්ථානාභියෝගීන්ට කරුණුවූ අල්පාබාධය, අසාඨ්‍යය, ශ්‍රද්ධාවය, වීර්‍ය්‍යය, ප්‍රඥාවය යන පඤ්ච ප්‍රධානියඞ්ගයෙන් සමන්විතව, පිණ්ඩපාත පරිභොගයෙන් පසු කාලයෙහි කමටහන මෙනෙහි කටයුතු.

කමටහන මෙනෙහි කරන්නාවූ මහණහු විසින් වර්ණය, සංස්ථානය, දිශාය, අවකාශය, පරිච්ඡේදය යන මොවුන්ගේ වශයෙන් කෙශාදි කොට්ඨාසයන් අතුරෙන් එක් එක් කොටස මෙනෙහි කොට, අවශානයෙහි ධාතු මනසිකාර වශයෙන් මෙසේ ද මෙනෙහි කටයුතු.

මෙ කොස්හු නම් හිස් කබල වසා සිටි සමෙහි හට ගත්හ. ඒ සම් අතුරෙන් තුඹස මතුපිට ඉළුප්තණ හටගත් කල්හි, තුඹස් මත නෙමේ, මා කෙරෙහි ඉළුප්තණ හට

ගත්හ යි යම්සේ නොදනී ද, ඉළුප්තණ ද, අපි තුඹස මතුපිට හටගතුම්හ යි යම්සේ නොදනිත් ද, එපරිද්දෙන්ම හිස් කබල වසා සිටි සම තෙමේ, මා කෙරෙහි කෙස්හු හටගත්හයි නොදනී කෙසේහුද අපි ඉස්කබල වසාසිටි සම්හි හටගතුම් හයි නොදනිත්. කෙස්හුය, හිස් කබල වසා සිටි සමැ යි යන නම් ලද ඒ තිසසත්තව නිර්ජීව සවභාවයෝ ඔවුනොවුන් මෙතෙහි කිරීම් විමසීම් නැත්තාහ. මෙසේ කෙස්හු නම් සිරුරෙහි අසම්මිශ්‍ර වූ කොටසෙක, චෙතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය එහෙයින් තිසසත්තව වනුය, දැඩිබව ලක්‍ෂණ කොට ඇත්තේ ය, එහෙයින් පෘථිවි ධාතු නම් වන්නේය යි කියා මෙතෙහි කටයුතු.

**ලොම්හු** සිරුර වසා සිටි සම්හි හටගත්හ. පැරණි වූ ගම් පියෙස්හි හිතණ හටගත් කල්හි, පැරණි ගම් පියෙස් තෙම මා කෙරෙහි හිතණ හටගත්හ යි යම්සේ නොදනී ද, හිතණ ද, අපි පැරණි ගම් පියෙස්හි හටගතුම්හ යි යම්සේ නො දනිත් ද. එපරිද්දෙන්ම, සිරුර වසා සිටි සම තෙමේ මා කෙරෙහි ලොම්හු හටගත්හ යි නොදනී. ලොම්හුද අපි සිරුර වසා සිටි සමෙහි හටගතුම්හ යි නො දනිත් ලොම, ශරීර චර්ම යන නම් ලද ඒ තිසසත්තව නිර්ජීව සවභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම් විමසීම් නැත්තාහ, මෙසේ ලොම්හු නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර වූ කොටසෙකි, චෙතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය, එහෙයින් තිසසත්තව වනුය, දැඩි බව ලක්‍ෂණ කොට ඇත්තේය, එහෙයින් පෘථිවි ධාතු නම් වන්නේයයි මෙනෙහි කටයුතු

**විසි නියපොත්තෝ** අත් පා ඇඟිලි අග හට ගත්හ බාලදරුවන් දඬු අග මිනි ඇට අමුනාගෙන කෙළනා කල්හි දඬු කඩහු අප අග්හි මිනි ඇට තුබූ හයි යම්සේ නො දනිත් ද, මිනි ඇටද අපි දඬුකඩ අග තුබුම්හ යි යම්සේ නොදනිත් ද, එපරිද්දෙන්ම, අත් පා ඇඟිලිහු අපගේ ඇඟෙහි විසි නියපොත්තෝ හටගත්හයි නොදනිති. විසි නියපොත්තෝ ද, අපි අත්පා ඇඟිලි අග හටගතුම්හයි

නොදනිති. විසි නියපොතු, ඇඟිලි අග් යන නම් ලද නිස්සත්ත්ව නිජ්ජීව සවභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම් විමසීම් නැත්තාහ. මෙසේ විසි නියපොත්තෝ නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි, චේතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය. එහෙයින් නිස්සත්ත්ව වනුය, දැඩි බව ලක්‍ෂණ කොට ඇත්තේය, එහෙයින් පෘථිවි ධාතු නම් වන්නේය යි මෙනෙහි කටයුතු.

**දෙතිස් දත්හු** — උඩුයටි හනු ඇට දෙක් හි හටගත්හ. ගල්වඩුවන් විසින් ගල්වනු වල කිසි ලහවුවෙකින් බැඳ සිටුවූ සථම්භයන් කෙරෙහි ගල්වනුහු අප කෙරෙහි සථම්භයෝ පිහිටියහයි යම්සේ නොදනිත් ද, සථම්භයෝ ද, අපි ගල්වනුවල පිහිටියම්හයි යම්සේ නොදනිද් ද, එපරිද්දෙන්ම හනු ඇට දෙකද අප කෙරෙහි දෙතිස් දත්හු හටගත්හයි නොදනිති. දෙතිස් දත්හුද, අපි හනු ඇට දෙක්හි හටගතුම්හයි නොදනිති. දෙතිස් දත් දෙහනු ඇට යන නම් ලද ඒ නිස්සත්ත්ව නිජ්ජීව සවභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම් විමසීම් නැත්තාහ. මෙසේ දෙතිස් දත්හු නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි, චේතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය, එහෙයින් නිස්සත්ත්ව වනුය, දැඩිබව ලක්‍ෂණ කොට ඇත්තේය, එහෙයින් පෘථිවිධාතු නම් වන්නේය යි මෙනෙහි කටයුතු.

**තච** නම් ලද සිවිතෙමේ මුළු සිරුර හාත්පස වැළඳගෙන, වසාගෙන සිටියේ ය. අළුත් ගෙරි සමින් වළඳනාලද මහා වීණාවෙහි මහා වීණා තොමෝ, මම අළුත් ගෙරි සමින් වළඳනා ලදිම්යි යම්සේ නොදනීද, අළුත් ගෙරිසම් තෙමේ ද, මා විසින් මහා වීණා තොමෝ වළඳනා ලදැයි යම්සේ නොදනීද, එපරිද්දෙන්ම ශරීරය තෙම මම සිවීහු විසින් වළඳන ලදිම්යි නොදනී. සිවි තෙමේ ද, මාවිසින් සිරුර වළඳන ලදැයි නොදනී. සිවි ශරීර යන නම් ලද ඒ නිස්සත්ත්ව නිජ්ජීව සවභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම් විමසීම් නැත්තාහ. මෙසේ සිවීහු නම්, මේ සිරුරෙහි

අසම්මිශ්‍ර කොටසෙකි. චෙතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය, එහෙයින් නිස්සත්ත්ව වතුය. දැඩිබව ලක්‍ෂණ කොට ඇත්තේ ය, එහෙයින් පෘථිවිධාතු නම් වන්නේය යි මෙතෙහි කටයුතු.

**මාංසය** තෙමේ ඇටසැකිළි රුස අලෙව්කොට සිටියේ ය. මහ මැටි පිඩෙන් අලෙව් දුන් බිත්තියෙක්හි, බිත්තිතොමෝ මම මහා මැටි පිඩින් අලෙව්දෙන ලදිම්යි යම් සේ නොදනී ද, මහා මැටිපිඩු ද, මා විසින් මහා බිතුතොමෝ අලෙව් දෙන-ලදූයි යම්සේ නොදනී ද, එපරිද්දෙන් ම ඇටසැකිළි රුස තෙමේ මම නවසියයක් මාංස පෙශීන් සම්බන්‍ධ වූ ප්‍රභෙද ඇති මසින් අලෙව් දෙන ලදිමැයි නොදනී. මාංසය තෙමේ ද, මා විසින් ඇටසැකිළි රුස අලෙව් දෙන ලදූයි නොදනී. මස්, ඇට සැකිළි රුස යන නම් ලද ඒ නිස්සත්ත්ව නිජ්ජීව සවභාවයෝ ඔවුනොවුන් මෙතෙහි කිරීම් විමසීම් නැත්තාහ. මෙසේ මාංසය නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි, චෙතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය, එහෙයින් නිස්සත්ත්ව වතුය, දැඩි බව ලක්‍ෂණ කොට ඇත්තේය, එහෙයින් පෘථිවි ධාතු නම් වන්නේ යයි මෙතෙහි කටයුතු.

ශිරා ස්නායු සංඛ්‍යාත වූ **නහරවැල්හු,** ශරීරය තුළ ඇට වෙළා ගනිමින් සිටියහ. වැලින් වෙළන ලද කුටිකා බිත්ති දඬුහි බිත්ති දඬුහු අපි වැලින් වෙළන ලදුම්හයි යම්සේ නොදනිද් ද, වැල්හුද, අප විසින් බිත්ති දඬු වෙළන ලදහ යි යම් සේ නොදනිද්ද එපරිද්දෙන්ම අසථිහු අපි නහර වැලින් වෙළනලදුම්හ යි නො දනිති. නහර වැල්ද, අප විසින් ඇට වෙළන ලදහයි නොදනිති. නහර, ඇට යන නම් ලද ඒ නිස්සත්ත්ව නිජ්ජීව සවභාවයෝ ඔවු-නොවුන් මෙනෙහි කිරීම් විමසීම් නැත්තාහ. මෙසේ නහර වැල්හු නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි, චෙතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය. එහෙයින් නිස්සත්ත්ව වතුය, දැඩිබව ලක්‍ෂණකොට ඇත්තේය, එහෙයින් පෘථිවි ධාතු නම් වන්නේ යයි මෙතෙහි කටයුතු.

**අස්ථීන්** අතුරෙන් විළුම් ඇට තෙම ගොප් ඇට ඔසවා සිටියේය. ගොප් ඇට තෙම ජඞ්ඝට්ඨිය ඔසවා සිටියේය. දණ ඇට කලවා ඇට ඔසවා සිටියේය. කලවා ඇට තෙම කටි ඇට ඔසවා සිටියේය. කටි ඇට තෙම පිට කටු ඇට ඔසවා සිටියේය. පිට කටු ඇට තෙම ග්‍රීවා ඇට ඔසවා සිටියේය. ගෙලවළු ඇට තෙම හිස් කබලු ඇට ඔසවා සිටියේය. හිස්කබලු ඇට තෙමේ ගෙලවළු ඇට මත්තෙහි පිහිටියේය. ගෙලවළු ඇට තෙමේ පිටිකටු ඇට මත්තෙහි පිහිටියේය. පිටිකටු ඇට තෙමේ කටි ඇට මත්තෙහි පිහිටියේය. කටි ඇට තෙමේ කලවා ඇට මත්තෙහි පිහිටියේය. කලවා ඇට තෙමේ දණ ඇට මත්තෙහි පිහිටියේය. ජඞ්ඝට්ඨි තෙමේ ගොප් ඇට මත්තෙහි පිහිටියේය. ගොප් ඇට තෙමේ විළුඹැට මත්තෙහි පිහිටියේය. **උළු, දර**, ගොම ඇ ගොඩවල් අතුරෙන් යට යට සිටි උළු, දර, ගොම ඇ ගොඩවල් අපි මතු මත්තෙහි සිටි උළු දර ගොම ගොඩවල් ඔසවා සිටගතුම්හයි යම්සේ නොදනීද්ද, මතු මත්තෙහි සිටි උළු, දර, ගොම ඇ ගොඩවල් අපි යට යට සිටි උළු, දර, ගොම ගොඩවල්හි පිහිටියම්හයි යමසේ නොදනිද්ද, එපරිද්දෙන්ම විළුඹැට තෙම මම ගොප් ඇට ඔසවා සිටියෙමියි නොදනී. ගොප් ඇට තෙමේ ද මම ජඞ්ඝට්ඨිය ඔසවා සිටියෙමියි නොදනී. මෙසේ යට යට සිටි ඇට මතු මත්තෙහි පිහිටි ඇට, යට යට පිහිටි ඇට මත්තෙහි සිටියම්හයි නොදනී. ඇට සංඛ්‍යාතවූ ඒ නිස්සත්ත්ව නිජ්ජීව ස්වභාවයෝ ඔවුනොවුන් මෙතෙහි කිරීම් විමසීම් නැත්තාහ. මෙසේ අස්ථිහුතම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි. චේතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය, එහෙයින් නිස්සත්ත්ව වනුය, දුඃඛබව ලක්ෂණ කොට ඇත්තේය. එහෙයින් පෘථිවිධාතු නම් වන්නේ යයි මෙතෙහි කටයුතු.

**ඇට මිදුළු තෙමේ** ඒ ඒ අස්ථීන්ගේ අභ්‍යන්තරයෙහි සිටියේය. හුණ පුරුක් ආදීන්ගේ ඇතුළෙහි බහාලූ තිවූ වේබඩ ආදියෙහි, හුණපුරුක් ආදීහු අප කෙරෙහි තිවූ වේබඩ ආදීහු බහාලූහයි යම්සේ නොදනිද්ද, තිවූ වේබඩ ආදීහු ද

අපි හුනපුරුක් ආදීන්හි සිටගනුම්හයි යම්සේ නොදනිද්ද, එපරිද්දෙන්ම අසළිහු අපගේ ඇතුළෙහි ඇට මිදුළු තෙමේ සිටියේයයි නොදනීත් ඇට මිදුළු තෙමේද, මම අසළින්ගේ ඇතුළෙහි සිටියෙම්හයි නොදනී. ඇට මිදුළු ඇට යයි නම් ලද ඒ නිඝසත්ත්ව නිජ්ජීව සවභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරිම් විමසීම් නැත්තාහ. මෙසේ ඇට මිදුළු නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි, චෙතනාරහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය, එහෙයින් නිඝසත්ත්ව වනුය, දූඪි බව ලක්‍ෂණ කොට ඇත්තේය, එහෙයින් පෘථිවි ධාතු නම් වන්නේයයි මෙනෙහි කටයුතු.

**වකුගඩු තෙමේ,** ගල වලළුවෙන් නිකුත් වූ එක් මුලක් ඇත්තාවූ නොහොත් එක් මුලක් විසින් මදනැත් ගොළු දෙකක්ව බැඳුනාවූ මහා නහරින් බැඳි හදය මාංසය පරික්‍ෂෙප කොට සිටියේය එක් නටුවෙක්හි පිහිටි අඹ ඵල දෙක්හි නටුව තෙමේ මා විසින් අඹ ඵල දෙක පිළිබඳ කොට ගනැයි යම්සේ නොදනී ද, අඹ ඵල දෙකද, මම නැටියෙන් පිළිබඳ කොට ගතිමැයි යම්සේ නොදනිද, එපරිද්දෙන්ම මහා නහර වැල මා විසින් වකුගඩු බඳිනලදූයි නොදනී. වකුගඩු තෙමේද, මම මහ නහරින් බඳිනා ලදිමැයි නොදනී. ඒ වකුගඩු මහා නහරය යන නම් ලද නිඝසත්ත්ව නිජ්ජීව සවභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරිම් විමසීම් නැත්තාහ මෙසේ වකුගඩු නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි. චෙතනා රහිතය, අව්‍යාකෘතය, ආත්මශූන්‍යය, එහෙයින් නිඝසත්ත්ව වනුය, දූඪිබව ලක්‍ෂණ කොට ඇත්තේය, එහෙයින් පෘථිවි ධාතු නම් වන්නේ යයි මෙනෙහි කටයුතු.

**හෘදය මාංසය** තෙමේ සිරුරෙහි ළෙහි ඇට මැදිරියේ මැද ඇසුරුකොට සිටියේය. දිරාපත් රිය මැදිරියක් නිසා තබාලූ මස් පිඩෙහි ඒ දිරාපත් රිය මැදිරිය තොමෝ මා ඇසුරුකොට මස්පිඩ තබන ලදූයි යම්සේ නොදනීද මස්පිඩද මම දිරාපත් රිය මැදිරි මැද ඇසුරුකොට සිටියෙමියි යම්සේ නොදනීද එපරිද්දෙන්ම ළෙහි ඇට

මැදිරි අභ්‍යන්තරය තෙම මා ඇසුරු කොට හෘදය මාංසය තෙම සිටියේයයි නොදනී. හෘදය මාංසය තෙමේද මම ලෙහි ඇට මැදිරි මැද ඇසුරු කොට සිටියෙම් යි නොදනී. ඒ හෘදයමාංස ලෙහි ඇට මැදිරි යයි නම් ලද නිසත්ත්ව නිර්ජීව ස්වභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම් විමසීම් නැත්තාහ. මෙසේ හෘදය මාංසය නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි, චේතනා රහිතය අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය. එහෙයින් නිසත්ත්ව වනුය, දෘඩිබව ලක්‍ෂණකොට ඇත්තේය, එහෙයින් පෘථිවි ධාතු නම් වන්නේයයි මෙනෙහි කටයුතු.

අක්මා නම්වූ එකාබද්ධ මාංස පටල යුග්මය තෙමේ ශරීරාභ්‍යන්තරයෙහි දෙතනයන්ගේ ඇතුලෙහි දකුණු පස ඇසුරුකොට සිටියේය. සැලි කබලු පසෙක්හි මස් පිඩු යුවළක් ලග්න වූ කල්හි, ඒ සැලි කබලු පස තෙමේ මා කෙරෙහි මාංස පිණ්ඩ යුග්මය තෙම ලග්න වනැයි යම් සේ නොදනීද, මාංස පිණ්ඩ යුග්මය තෙමේද, මම සැලිකබලු පසෙහි ලග්න වූයෙම්යි යම්සේ නොදනීද, එපරිද්දෙන්ම දෙතනයන්ගේ ඇතුලෙහි දකුණු පස තෙම, මා ඇසුරු කොට අක්මාව සිටියේයයි නොදනී. අක්මා නම්වූ මාංසපිණ්ඩ යුග්මය තෙමේද මම දෙතනයන්ගේ ඇතුලෙහි දකුණු පස ඇසුරුකොට සිටියෙමියි නොදනී අක්මාව තන දකුණු පසය යන නම් ලද ඒ නිසත්ත්ව නිර්ජීව ස්වභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම් විමසීම් නැත්තාහ මෙසේ අක්මාව නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි, චේතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය, එහෙයින් නිසත්ත්ව-වනුය, දෘඩබව ලක්‍ෂණකොට ඇත්තේය, එහෙයින් පෘථිවි ධාතුව නම් වන්නේයයි මෙනෙහි කටයුතු.

දෙදලබුු අතුරෙන් සැඟවී සිටි දලබුු තෙම හදවතද, වකුගඩුද, පිරිවරා සිටියේය. නොසැඟවී සිටි දලබුු තෙම සිරුර තුළ සමින් යට මාංසය වැළඳගෙන සිටියේය. මාංසය කඩ රෙද්දකින් වැසූ කල්හි මාංසය තෙම මම කඩරෙද්දකින්

වෙළුනලදයෙමියි යම්සේ නොදනීද, එපරිද්දෙන්ම වකුගඩු හදවත්හුද මාංසය තෙමේ මම නොපිළිසත් දලබු වෙන් වසනලදිමැයි නොදනී. පිළිසත් දලබු තෙමේද මා විසින් වකුගඩු හදවත්හුද පිරිවත ලදහයි නොදනී. නොපිළිසත් දලබු තෙමේද මා විසින් සිරුර මාංසයද වසන ලදූයි නොදනී. මෙසේ දලබු වකුගඩු හදවත සිරුරු මස යන නම් ලද ඒ නිස්සත්ත්ව නිර්ජීව සවභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම් විමසීම් නැත්තාහ. මෙසේ දෙදලබු නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි, චේතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය. එහෙයින් නිස්සත්ත්ව වනුය, දෘඪ බව ලක්‍ෂණ කොට ඇත්තේය, එහෙයින් පෘථිවි ධාතුව නම් වන්නේය යි මෙනෙහි කටයුතු.

බඩදිව තෙම හදවතට වම්පසෙහි උදරපටලයාගේ මතු භාගය නිසා සිටියේය කොටුවෙක මතු භාගය ඇසුරු කොට තිබූ ගොම පිඩෙහි, කොටුවෙහි මතු භාගය තෙමේ මා ඇසුරුකොට ගොමපිඩ සිටියාහ යි යම්සේ නොදනී ද, ගොම පිඩ ද මම කොටුවෙහි මතුභාගය ඇසුරුකොට සිටියෙමියි යම්සේ නොදනිද, එපරිද්දෙන්ම උදර පටලයාගේ මතු භාගයතෙම මා ඇසුරුකොට බඩදිව සිටියේය යි නොදනී, බඩදිව ද, මම උදර පටලයාගේ මතුභාගය ඇසුරුකොට සිටියෙමියි නොදනී. බඩදිව උදරපටලයාගේ මතුභාගය යන නම් ලද ඒ නිස්සත්ත්ව නිර්ජීව සවභාවයෝ ඔවුනොවුන් මෙනෙහිකිරීම් විමසීම් නැත්තාහ. මෙසේ බඩදිව නම් සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි, චෙතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය එහෙයින් නිස්සත්ත්ව වනුය, දෘඪබව ලක්‍ෂණකොට ඇත්තේය, එහෙයින් පෘථිවි ධාතුව නම් වන්නේ යයි මෙනෙහි කටයුතු.

පපුමස තෙම සිරුර තුළ දෙතනයන්ගේ මධ්‍යයෙහි හදවත ද, අක්මාව ද මත්තෙහි වසාගෙන එල්බෙමින් සිටියේය දිරැණු කොටුව ඇතුළෙහි එල්බෙන්නාවූ ලිහිණි කැදූල්ලෙහි, දිරැණු කොටුව අභ්‍යන්තර තෙමේ මා කෙරෙහි

ලිහිණි කැදැල්ල තෙම එල්බෙමින් සිටියේය යි යම්සේ නොදනීද, ලිහිණි කැදලි තෙමේ ද, මම දිරුණු කොටුව ඇතුලෙහි එල්බෙමින් සිටියෙමියි යම්සේ නොදනීද, එපරිද්දෙන්ම ශරීරාභ්‍යන්තරය තෙම මා කෙරෙහි පපු මස එල්බෙමින් සිටියේයයි නොදනී. පපු මස තෙමේද මම මෙබඳුවූ ශරීරාභ්‍යන්තරයෙහි එල්බෙමින් සිටියෙමියි නොදනී. ඒ පපු මස, ශරීරාභ්‍යන්තරයෙහි දෙතන මැද යයි කියන ලද නිසත්ත්ව නිර්ජීව ස්වභාවයෝ ඔවුනොවුන් මෙතෙහි කිරීම් විමසීම් නැත්තාහ. මෙසේ පපු මස නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි. චේතනා රහිතය, අව්‍යාකෘතය, ආත්මශූන්‍යය, එහෙයින් නිසත්ත්ව වතුය, දැඩි බව ලක්ෂණ කොට ඇත්තේය, එහෙයින් පෘථිවි ධාතුව නම් වන්නේය යි මෙතෙහි කටයුතු.

අතුණු තෙමේ ගලවළුව පටන්ගෙන මල මග අවසන් කොට ඇති ශරීරාභ්‍යන්තරයෙහි සිටියේය. රුධිරය ලූ දෙනක නමනමා තුබූ හිස්සුන් ගරවිල් සිරුරෙහි, රුධිරය ලූ දෙණ මා කෙරෙහි ගරවිල් සිරුර සිටියේය යි යම්සේ නොදනී ද, ගරවිල් සිරුර තෙමේ ද, මම රුධිරය ලූ දෙණෙහි සිටියෙම් යි යම්සේ නොදනී ද, එපරිද්දෙන්ම ශරීරාභ්‍යන්තරයතෙම මා කෙරෙහි බඩවැල සිටියේය යි නොදනී. අතුණුද මම ශරීරාභ්‍යන්තරයෙහි සිටියෙමියි නොදනී. අතුණු වැටිය ශරීරාභ්‍යන්තරය යන නම් ලද නිසත්ත්ව නිර්ජීව ස්වභාවයෝ ඔවුනොවුන් මෙතෙහි කිරීම් විමසීම් නැත්තාහ. මෙසේ අතුණු නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි, චේතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය. එහෙයින් නිසත්ත්ව වතුය, දැඩි බව ලක්ෂණ කොට ඇත්තේය, එහෙයින් පෘථිවි ධාතුව නම් වන්නේය යි මෙතෙහි කටයුතු.

අතුණු බහන් තෙමේ අතුණු වැටිය හෙවත් බඩවැල අතරෙහි එක්විසි තැනෙක්හි නැමුණු නැමුණු අතුණු මඩුල් බැඳ සිටියේය. පා පිස්නා බිස්සෙහි බාන්දරණ මඩුල්ල අතර ගෙත්තම් කොට සිටියාවූ රැහැන්හි, පා පිස්නා බිස්සෙහි

බාත්දරණ මඬුල් තෙම, රැහැන්හු මා හිවගෙන සිටියහයි යම්සේ නොදනීද, රැහැන්හුද අපි පා පිස්නා බිස්සෙහි බාත් දරණ මඬුල්ල හිවගෙන සිටගතුම්හයි යම්සේ නොදනීද, එපරිද්දෙන්ම, අතුණු තෙම මා අතුණු බහන බැඳගෙන සිටියේය යි නොදනී. අතුණු බහන තෙමේද, මම අතුණු වැටිය බැඳ සිටියෙමියි නොදනී. අතුණු, අතුණු බහන් යන නම් ලද ඒ නිසසත්ත්ව නිර්ජීව සවභාවයෝ ඔවුනොවුන් මෙනෙහිකිරීම් විමසීම් නැත්තාහ. මෙසේ අතුණු බහන නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි, චෙතනා රහිතාය අව්‍යාකෘතය, ආත්ම සූන්‍යය එහෙයින් නිසසත්ත්ව වනුය, දැඩි බව ලක්‍ෂණකොට ඇත්තේය, එහෙයින් පෘථිවි ධාතුව නම් වන්නේය යි මෙනෙහි කටයුතු.

උදරිය තෙමේ උදරයෙහි හෙවත් ආමාශයෙහි සිටියාවූ බත් ඈ වලඳනා ලද්දය, අඹ පැණි ඈ බොනා ලද්දය, කැවුම් ඈ කන ලද්දය, මීපැණි ඈ ආසවාදනය කරන ලද්දය යන මෙයයි එසේ වුව, වලඳනා ලද අමු අහරකුත් ඇත. බොනලද අමු අහරකුත් ඇත. කන ලද අමු අහරකුත් ඇත. අසවාදිත අමු අහරකුත් ඇත. ඒ උදරිය, උදර හෙවත් නොපැසූ අහරය, ආමාශය අතුරෙත් බලු බත් කන හොරුවෙහි තුබූ බලු වමනයෙහි, බලු බත් කන හොරුව මා කෙරෙහි බලු වමනය තෙම සිටියේය යි යම්සේ නොදනීද, බලු වමනය තෙම මම බලු බත් කන හොරුවෙහි සිටියෙම් යි යම්සේ නොදනීද, එපරිද්දෙන්ම, උදරය නොහොත් ආමාශය තෙම මා කෙරෙහි උදරිය නම් ලද අමු අහර තෙම සිටියේය යි නොදනී. උදරිය නම් ලද අමු අහර තෙමේද, මම උදරයෙහි නොහොත් ආමාශයෙහි සිටියෙමියි නොදනී. උදරිය, උදරය යන නම් ලද මේ නිසසත්ත්ව නිර්ජීව සවභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම් විමසීම් නැත්තාහ. මෙසේ උදරිය හෙවත් නොපැසුණු අහර නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි.

චේතනා රහිතය. අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය. එහෙයින් නිස්සත්ත්ව වනුය, දෘඪ බව ලක්‍ෂණ කොට ඇත්තේය. එහෙයින් පෘථිවි ධාතුව නම් වන්නේය යි මෙනෙහි කටයුතු.

**කරීස** හෙවත් **වර්චස්** නම් ලද පක්වාහාර තෙමේ පැසවූ ආහාරයාගේ අශ්‍රයස්ථානයයි කියන ලද අට අඟලක් පමණැති හුණ නලකඩක් වැනිවූ අතුණුවැටි කෙළවර සිටියේය. හුණ නලෙහි මැඩ බහන ලද්දාවූ සිනිඳු පඬුවන් මැටියෙහි හුණ නල තෙමේ මා කෙරෙහි පඬුවන් මැටි තොමෝ සිටියාහයි යම්සේ නොදනීද පඬුවන් මැටි තොමෝද මම හුණ නලෙහි සිටියෙමියි යම්සේ නොදනීද එපරිද්දෙන්ම පක්වාශය තෙමේ මා කෙරෙහි වර්චස් නම්වූ පක්වාහාරය තෙම සිටියේයයි නොදනී. වර්චස් නම්වූ පක්වාහාරය තෙමේද, මම පක්වාශයෙහි සිටියෙමියි නොදනී. ඒ වර්චස් පක්වාශය යන නම් ලද නිස්සත්ත්ව නිර්ජීව ස්වභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම් විමසීම් නැත්තාහ, මෙසේ කරීස හෙවත් වර්චස් නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි චේතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය. එහෙයින් නිස්සත්ත්ව වනුය, දෘඪ බව ලක්‍ෂණකොට ඇත්තේය, එහෙයින් පෘථිවි ධාතුව නම් වන්නේ යයි මෙනෙහි කටයුතු.

**මත්ථලුඞ්ග** හෙවත් **මස්තිෂ්ක** තෙමේ හිස්කබල් අතුරෙහි සිටියේය. පැරණිවූ ලබු කබලෙක්හි බහාලූ පිටි පිඬෙහි ලබු කබල් තෙම මා කෙරෙහි පිටි පිඬ සිටියාහයි යම්සේ නො දනීද, පිටි පිඬද, මම ලබු කබලෙහි සිටිමැයි යම්සේ නො දනීද, එපරිද්දෙන්ම හිස් කබල් තෙම මා කෙරෙහි මස්තිස්කය තෙම සිටියේ යයි නොදනී. මස්තිස්කය තෙමේද මම හිස් කබල තුල සිටියෙම් නොදනී. මේ මස්තිස්ක හිස් කබල තුල යන නම් ලද නිස්සත්ත්ව නිර්ජීව ස්වභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම් විමසීම් නැත්තාහ. මෙසේ මත්ථලුඞ්ගය නම් සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි.

චෙතනා රහිතය. අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය, එහෙයින් නිස්සත්ත්ව වනුය, දූඩ බව ලක්ෂණකොට ඇත්තේය. එහෙයින් පෘථිවි ධාතුව නම් වන්නේය යි මෙතෙයි කටයුතු.

**බාහිර පෘථිවි ධාතුව** නම් අනින්ද්‍රියබද්ධවූ පෘථිවි ධාතුවය. එහි යකඩ හෙවත් **අයො** යනු කෘෂ්ණ ලෝහයයි.

**ලෝහය** වනාහි චතුර්විධ වේ. **ජාතිලෝහ** හෙවත් ප්‍රකෘති ලෝහ, **විජාති ලෝහ** හෙවත් ප්‍රකෘති ලෝහයෙන් ජනිතවූ ලෝහය, **කෘත්‍රිම ලෝහ** හෙවත් ලෝහ වර්ග මිශ්‍ර කිරීමෙන් තනාගත් ලෝහය, **පිසාච ලෝහ** යන සතරය.

ඔවුන් අතුරෙන් කෘෂ්ණ ලෝහ හෙවත් යකඩය, රජතය, සුවර්ණය, සුදු ඊයම්ය, කළු ඊයම්ය, තඹය, වෛකන්තක ලෝහ හෙවත් වානේය යන මේ සත් වර්ගය **ජාති ලෝහ** නම් වේ. ලෝහ සමානවූද, ජාති ලෝහයෙන් ජනිතවූද ලෝහ ජාති **විජාති ලෝහ** නම් වේ. සුදු තඹ හෙවත් සුදු ඊයම්, තඹ මිශ්‍රකොට කරනලද **කංස ලෝහ** හෙවත් **සෙතක ලෝහය** (ලෝකඩ), කළු ඊයම්, තඹ මිශ්‍ර කොට කරනලද **වට්ට ලෝහ** හෙවත් වෙට්ට පිත්තලය, මුඩුලෝ තඹ මිශ්‍රකොට කරන ලද **ආර කූටය** යන මේ ලෝහ විශෙෂ තිදෙන **කෘත්‍රිම ලෝහ** නම්. **මොරකක** නම් ලෝහය, **පුප්ඵක** නම් ලෝහය, **මලිනක** නම් ලෝහය **චපලක** නම්වූ ලෝහය **සෙලක** නම්වූ ලෝහය, **ආටක** නම්වූ ලෝහය, **භල්ලක** නම්වූ ලෝහය, **දූසිලෝහ** නම්වූ ලෝහය යන මේ ලෝහ විශෙෂ අට දෙන **පිසාච ලෝහ** නාම් වේ.

මෙසේ අධ්‍යාත්මික පෘථිවි ධාතු හෙවත් ඉන්ද්‍රිය බද්ධ පෘථිවි ධාතුවත් බාහිර පෘථිවි ධාතු හෙවත් අනින්ද්‍රියබද්ධ පෘථිවි ධාතුවත් යන දෙකම කර්කශ ස්වභාව ලක්ෂණකොට ඇති හෙයින් එකම **පඨවි ධාතුය** යයි දක්වා වදාරන ලදී.

## ආපො ධාතුව

**පඨවි, තෙජෝ, වායො** යන භූතත්‍රය වෙත ආබන්ධන වශයෙන්, ආලිඞ්ගන වශයෙන්, මැලියමක් සේ අල්වා ගැනීම් වශයෙන් පැමිණේනුයි, බැඳ ගනීනුයි **ආප** නම්වේ. මෙහි ද්‍රව භාවයම අභිමතය.

**ආපො ධාතු තොමෝ** අධ්‍යාත්මික හෙවත් ඉන්ද්‍රිය බද්ධ ආපො ධාතුවය, බාහිර හෙවත් අනින්ද්‍රියබද්ධ ආපො ධාතුව යයි විවිධ වේ.

**අධ්‍යාත්මික ආපො ධාතුව.** යමක් සත්ත්ව සන්තාන-ගත වූවාද, පුද්ගලයන්ට වෙන් වෙන්ව ලැබුනේද, යම් ඒ ආබන්ධන සවභාවයක් වේද, ආබන්ධන සවභාවයට ගිය බැවින් ආපො ගත නම් වීද, ආලිඞ්ගන වශයෙන් ස්නෙහ නම්විද. ආලිඞ්ගන බවට ගිය බැවින් ස්නෙහගත නම් වීද, අවිනිබ්භොග රූපය බන්ධන බවක් වේද, අධ්‍යාත්මිකවූ ශරීරයට අයත් වූවාද, පිතය, සෙමය, සැරවය, ලේය, ඩහදියය, මේද තෙලය, කඳුළුය, වුරුණු තෙලය, කෙළය, සෙම්ය, සොටුය, සඳම්දුළුය, මූත්‍රය යන ප්‍රභෙදවත්වූ ආප්-සවභාවයෙක් වේද. යම් ඒ අන්‍යවූද අධ්‍යාත්මිකවූද, පුද්ගලයන්ට වෙන් වෙන්ව අයත් බැඳීම් සවභාවයෙන් **ආප** නම්වූ තෙත් ගති ඇති, තෙත් ගතියට ගිය රූපයාගේ බන්ධන සවභාවයවූ අධ්‍යාත්මිකවූ ශරීරයට අයත් දේද යන මෙය **අධ්‍යාත්මික ආපො ධාතු** නමි.

**බාහිර ආපො ධාතුව.** යම් බාහිරවූ, බැඳීම ඇති, බැඳීම් සවභාවයට ගිය, තෙත් ගතිය ඇති, තෙත් සවභාවයට ගිය රූපයාගේ බන්ධනත්වයට පත්, බාහිරවූ, ශරීරයට අයත් නොවන ආපො ධාතුවක් වේද, මුල් රසය, කඳෙහි රසය, පොත්තේ රසය, කොළ රසය, මල් රසය, ගෙඩි රසය, කිරි, දී, ගිතෙල්, වෙඬරු, මී පැණි, උක් පැණි, බිම හෝ අහසෙහි හෝ ජලයක් ඇද්ද, යම් ඒ අන්‍යවූ, බාහිරවූ,

ආප නම්වූ, ආපගතවූ, සිනෙහවූ, සිනෙහගතවූ, රූපයාගේ බන්ධනත්වයට පත්, ශරීරයට අයත් නොවූ ආපො ධාතුවක් වේද, **මෙය බාහිර ආපො ධාතු** නමි.

යම් අධ්‍යාත්මිකවූ ආපො ධාතුවක් ඇද්ද, බාහිරවූ අපො ධාතුවක් ඇද්ද, ඒ දෙකම එක්කොට ගළපා කැටිකොට ගත්තීද, මෝතොමෝ **ආපො ධාතුව** යයි කියනු ලැබේ.

මෙහි පිත්, සෙම් ආදි වශයෙන් දක්වනලද කොටඨාශයෝද, වර්ණය, සංස්ථානය, දිසාය, අවකාශය, පරිච්ඡේදය යන මොවුන්ගේ වශයෙන් පිරිසිඳ දැන ධාතු වශයෙන් ම මෙනෙහි කටයුත්තාහ.

**පිත්තය** තෙමේ, **බද්ධ පිත්තය, අබද්ධ පිත්තය** ය යි විධ වේ. **අබද්ධ පිත්තය** තෙමේ ජීවිතෙන්ද්‍රිය ය හා පැවති සියළු සිරුර පැතිරගෙන සිටියේය. **බද්ධ පිත්තය** තෙමේ පිත්ත කොෂයෙහි හෙවත් පිත්තාශ්‍රයයෙහි සිටියේය.

කැවුම පැතිර සිටියාවූ තෙලෙහි, ඒ තෙල කැවුම පැතිර සිටි කල්හි, කැවුම තෙමේ මා තෙල පැතිරගෙන සිටියේය යි යම්සේ නොදනීද, තෙලද මම පූවය පැතිරගෙන සිටියෙමියි යම්සේ නොදනීද, එපරිද්දෙන්ම ශරීරය තෙම, මා අබද්ධ පිත්තය තෙමේ පැතිරගෙන සිටියේයයි නොදනී. අබද්ධ පිත්තය තෙමේද මම ශරීරය පැතිරගෙන සිටියෙමියි නොදනී.

වැසි දියෙන් පිරුණාවූ වැටකොළු වසල්ලෙහි, වැටකොළු වසල්ල තෙම, මා කෙරෙහි වැසි දිය සිටියේයයි යම්සේ නො දනීද, වැසිදිය තෙමේද, මම වැටකොළු වසල්ලෙහි සිටියෙමියි යම්සේ නොදනීද, එපරිද්දෙන්ම පිත්ත කොෂය තෙම, මා කෙරෙහි බද්ධ පිත්තය තෙම සිටියේ යයි නොදනී. බද්ධ පිත්තය තෙමේද, මම පිත්ත කොෂයෙහි සිටියෙමියි නොදනී. මේ අබද්ධ පිත්තය, ශරීරය, බද්ධ පිත්තය, පිත්ත කොෂය යන නම් ලද නිසත්ත්ව නිර්ජීව සවභාවයෝ ඔවු

නොයෙක් උපද්‍රවයන්ගේ ප්‍රවෘත්තිස්ථාන වන හෙයින් නින්දිතය, ගර්හිතය, අන්ධ පෘථග්ජන සමූහයා විසින් කල්පනා කොට ගන්නාලද නිත්‍ය, සුභ, සුඛ, ආත්ම භාවයෙන් තොරවූ හෙයින් රික්තය, සිස්ය, එසේ නින්දිත බැවිනුදු, සිස් බැවිනුදු **දුක්ඛ** යයි කියනු ලැබේ.

**සමුදය – සං**– යන්නෙන් එක්වීම, ගැලපීම ප්‍රකාශ වේ. **උ** – ශබ්දයෙන් උත්පත්තිය ප්‍රකාශ වේ. **අය** – ශබ්දයෙන් හෙතුව පළවේ.

තමා කෙරෙන් අවශිෂ්ට වූ ප්‍රත්‍යයන් හා එක්වීමක් ගැලපීමක් ඇති කල්හි දුක්ඛයාගේ උත්පත්ති හෙතුව වේ එබැවින් දුක්ඛයාගේ ඉපදීමට කරුණු වන බැවින් **දුක්ඛ සමුදය** යයි වදාරන ලදී.

**නිරොධය–නි**– යන්නෙන් නාස්ති භාවය හෙවත් නැති බව දැක්වේ. **රොධ** ශබ්දයෙන් පැවැත්ම කියවේ.

මේ අසඞ්ඛත ධාතුව වූ නිර්වාණයෙහි සියලු ගතීන් කෙරෙන් ශූන්‍ය වූ බැවින් සංසාරයෙහි ප්‍රවෘත්තිය යයි කියන ලද හෙවත් සසර සැරිසැරීම යයි කියන ලද දුක්ඛ රොධයාගේ හෙවත් දුක්ඛ ප්‍රවෘත්තියගේ නොවීම වේද නොහොත් ඒ අසඞ්ඛත ධාතුව වූ නිර්වාණය පසක් කළ කල්හි ඒ සංසාර ප්‍රවෘත්ති සඞ්ඛ්‍යාත දුක්ඛ රොධයට ප්‍රතිපක්ෂ වන බැවින් සංසාරයෙහි ප්‍රවෘත්ති යයි කියන ලද හෙවත් සසර සැරි සැරීම යයි කියනලද දුක්ඛ රොධයාගේ නොවීම වේද, එහෙයිනුදු **දුක්ඛ නිරොධ** යයි කියනු ලැබේ. එසේම දුක්ඛයාගේ අනුත්පාදයම නිරොධ–යට ප්‍රත්‍ය වන බැවින් හෙවත් අනාගත භවාදීන්හි අප්‍රවෘත්තියට ප්‍රත්‍යවන බැවින් **දුක්ඛ නිරොධ** යයි කියනු ලැබේ

**දුක්ඛ නිරොධගාමිණී පටිපදා** – යම් හෙයකින් චතුස්සත්‍යය අරමුණු කිරීම් වශයෙන්, ඒ නිරොධ සත්‍යය ඉදිරිපත් කොට පැවති බැවින්, ඒ දුක්ඛ නිරොධය යයි

ඒ ඒ ශරීර ප්‍රදේශයන්හි සිටියෙමි නොදනී. ඒ සැරව ප්‍රභාර ලද පෙදෙස් යන නම් ලද නිස්සත්ත්ව නිර්ජීව ස්වභාවයෝ ඔවුනොවුන් මෙතෙහි කිරීම් විමසීම් නැත්තාහ. මෙසේ සැරව නම් මේ සිරුරෙහි අසම්මිශ්‍ර කොටසෙකි. චේතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය. එහෙයින් නිස්සත්ත්ව වනුය. ආබන්ධන ස්වභාවය ලක්ෂණකොට ඇත්තේය, එහෙයින් **ආපෝ ධාතුව නම්** වන්නේ යයි මෙතෙහි කටයුතු.

**ලෝහිතය** වනාහි **සංසරණ ලෝහිතය** හෙවත් විසිර පවත්නා ලෝහිතය, **සන්නිචිත ලෝහිතය** හෙවත් රැස්ව සිටිනා ලෝහිතය යයි විවිධ වේ. සංසරණ ලෝහිතය තෙමේ අබද්ධ පිත්තය මෙන් මුළු සිරුර පැතිර සිටියේය. සන්නිචිත ලෝහිතය තෙමේ එක් පාත්‍රයක් පිරෙණ පමණ වී වකුගඩුය, හදවතය, අක්මාය, පපු මසය යන කොටස්හන් තෙත් ගන්වමින් සිටියේය. මොවුන් අතුරෙන් සංසරණ ලෝහිතය තෙම අබද්ධ පිත්තයට කී නියායෙන් දතයුතු. සන්නිචිත හෙවත් නොවිසර පවත්නා ලෝහිතය වනාහි දිරූ කබලෙක සිටියාවූ ජලය, කබල යට භාගයෙහි සිටියාවූ මැටි කැට තෙමන කල්හි, මැටි කැටහු අපි ජලය විසින් තෙමනු ලබන්නෝව සිටගතුම්හයි යම්සේ නොදනිද්ද, ජලය තෙමේද මම මැටි කැට තෙමමියි යම්සේ නොදනීද, එපරිද්දෙන්ම, වකුගඩු ආදීහු හෝ මා කෙරෙහි ලෙහෙ සිටියේය යි ද, අපව තෙමමින් සිටියේ යයි ද නොදනිති. ලෙහෙද, මම වකුගඩු ආදීන් තෙමමින් සිටයෙමියි නොදනී. මෙසේ සංසරණ ලෝහිතය, සන්නිචිත ලෝහිතය යන නම් ලද නිස්සත්ත්ව නිර්ජීව ස්වභාවයෝ ඔවුනොවුන් මෙතෙහි කිරීම් විමසීම් නැත්තාහ, චේතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය. එහෙයින් නිස්සත්ව වනුය, ආබන්ධන ස්වභාව ලක්ෂණකොට ඇත්තේය, එහෙයින් **ආපෝ ධාතු** නම් වන්නේයයි මෙතෙහි කටයුතු.

**සේදය** හෙවත් ඩහදිය තෙමේ, වහ්නි සන්තාපාදි කාලයන්හි කේශකූපච්ඡිද්‍ර, ලෝම කූපච්ඡිද්‍රයන් පුරා සිටින්නේද වේමය. වැගිරෙන්නේද වේමය. දියෙන් උඩට

මතුකළ මාත්‍රය ඇති නෙළුම්බුදළුකලප, ඇඹුලදළුකලප්හි නෙළුම්බුදළු ආදී කලප් සිදුරු අප කෙරෙන් ජලය වැහෙන්නේයයි යම්සේ නොදනිද්ද, එකී කලප් සිදුරුවලින් වැහෙන්නාවූ ජලයද, මම නෙළුම්බුදළු ඈ කලප් සිදුරු වලින් වැහෙමියි යම්සේ නොදනීද, එපරිද්දෙන්ම, කෙශකූප, ලොමකූපච්ඡිද්‍රයෝ අප කෙරෙන් ඩහදිය වැහෙන්නේයයි නොදනිති. ඩහදිය තෙමේද, මම කෙශකූප, ලොමකූපච්ඡිද්‍රයෙන් වැහෙමියි නොදනී. ඩහදිය කෙශකූප, ලොමකූප විවර යන නම් ලද නිස්සත්ත්ව නිර්ජීව ස්වභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම් විමසීම් නැත්තාහ චෙතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය. එහෙයින් නිස්සත්ත්ව වනුය, ආබන්ධන ස්වභාවය ලක්ෂණකොට ඇත්තේය, එහෙයින් **ආපො ධාතුව** නම් වන්නේය යි මෙනෙහි කටයුතු.

**මේද තෙල තෙමේ**, ස්ථූල ශරීර ඇත්තහුගේ මුළු සිරුරෙහි පැතිරද, කෘශ ශරීර ඇත්තක්හුගේ කෙණ්ඩා මස් පිඩු ආදීන් ඇසුරුකොට ගෙන සිටියාවූ සංබද්ධ ස්නේහය හෙවත් පැසුනු තෙලයි. පිලිකඩකින් වසනලද මස් රුසෙහි, මස්රුස තෙමේ මා ඇසුරුකොට පිලිකඩ සිටියාහයි යම්සේ නොදනිද්ද, පිළිකඩද, මම මස් රුස ඇසුරුකොට සිටියෙමැයි යම්සේ නොදනීද, එපරිද්දෙන්ම, මුළු සිරුර කෙරෙහි මාංසය තෙම, මා ඇසුරුකොට මේද තෙල සිටියේයයි නොදනී මේද තෙල ද මම මුළු සිරුරෙහි මාංසය ඇසුරුකොට සිටියෙමියි නොදනී මෙසේ මේද තෙල ය, ශරීරය, මාංසය යන නම් ලද නිස්සත්ත්ව නිර්ජීව ස්වභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම්, විමසීම්, නැත්තාහ. චෙතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය එහෙයින් නිස්සත්ත්ව වනුය, ආබන්ධන ස්වභාවය ලක්ෂණකොට ඇත්තේය, එහෙයින් **ආපො ධාතු** නම් වන්නේය යි මෙනෙහි කටයුතු.

**අස්සු** හෙවත් **කඳුළු** තෙමේ, යම් කලෙක උපන්නේද, එකල්හි ඇස් වළ තැන් පුරා සිටින්නේ හෝ වැගිරෙන්නේ හෝ වේ. දියෙන් පිරුණා වූ තරුණ තල් ඇට වළ තන්හි,

ඒ වළ තැන්හු අප කෙරෙහි දිය සිටියේය යි යම්සේ නොදනී ද, තල් දිය තෙමේ ද, මම තරුණ තල් ඇට වළ තැන්හි සිටියෙමියි යම්සේ නොදනී ද, එපරිද්දෙන්ම ඇස් වළ තැන්හු අප කෙරෙහි කඳුලු තෙමේ සිටියේය යි නොදනිති. කඳුළු තෙමේද මම ඇස් වළ තැන්හි සිටියෙමියි නොදනී. ඒ කඳුලු අක්ෂිකූප යයි නම් ලද නිසත්ත්ව නිර්ජීව සවභාවයෝ ඔවුනොවුන් මෙතෙහි කිරීම් විමසීම් නැත්තාහ, චෙතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම සූන්‍යය, එහෙයින් නිසත්ත්ව වතුය, ආබන්ධන සවභාවය ලක්ෂණ කොට ඇත්තේය. එහෙයින් **ආපො ධාතු** නම් වත්තේ යයි මෙතෙහි කටයුතු.

**වසා** හෙවත් වුරුණු තෙල වනාහි අතුල්ය, අත්පිටුය, පතුල්ය, පාපිටුය, නාස්පුටය, නලල් තලය, උරහිසය යන තන්හි සිටියාවූ වුරුණු තෙලයි. වත්කළ තෙල් ඇති නිවුහුළු කැඳෙහි නිවුහුළු කැඳ තෙමේ මා තෙල් වැතිරගෙන සිටියේයයි යම්සේ නොදනී ද, තෙල ද, මම නිවුහුළු කැඳ වැතිරගෙන සිටියෙමියි යම්සේ නොදනී ද, එපරිද්දෙන්ම, හස්ත තලාදී ප්‍රදෙශය තෙමේ මා වුරුණු තෙල වැතිරගෙන සිටියාහයි නො දනී. වුරුණු ද, මම හස්ත තලාදීවූ ප්‍රදෙශයන් වැතිරගෙන සිටියෙමියි නොදනී. වුරුණු තෙලය, හස්ත තලාදීහුය යන නම් ලද නිසත්ත්ව නිර්ජීව සවභාවයෝ ඔවුනොවුන් මෙතෙහි කිරීම් විමසීම් නැත්තාහ. චෙතනා රහිතය. අව්‍යාකෘතය, ආත්ම සූන්‍යය. එහෙයින් නිසත්ත්ව වතුය, ආබන්ධන සවභාවය ලක්ෂණකොට ඇත්තේය, එහෙයින් **ආපො ධාතුව** වත්තේයයි මෙතෙහි කටයුතු.

**කෙළ** තෙමේ, එබඳුවූ කෙළ ඉපදීමට කරුණක් ඇති කල්හි දෙකොපුල් ඇතුල්තල පසින් බැසගෙන දිවෙහි සිටියේය නොසිඳී දිය උනන්නාවූ ගංතෙර කැනූ ලිඳෙහි ලින් පත්ල තෙමේ මා කෙරෙහි ජලය සිටුනේයයි යම්සේ නොදනී ද, ජලය තෙමේද මම ලින් පත්ලෙහි සිටුනෙමියි යම්සේ නොදනීද, එපරිද්දෙන්ම දිවමතු කෙළ, මා කෙරෙහි

දෙකොපුල්, ඇතුල්තල පසින් බැසගෙන කෙළ සිටියේය යි නොදනී. කෙළ තෙමේ ද, මම දෙකොපුල් ඇතුල් තල පසින් බැසගෙන සිටියෙමියි නොදනී. කෙළ, දිව යන නම් ලද නිස්සත්ත්ව නිර්ජීව ස්වභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම් විමසීම් නැත්තාහ. චෙතනා රහිතය, අව්‍යාකෘතය, ආත්මශූන්‍යය. එහෙයින් නිස්සත්ත්ව වත්‍රය, ආබන්ධන ස්වභාවය ලක්‍ෂණකොට ඇත්තේය. එහෙයින් **ආපො ධාතුව** නම් වන්නේ යයි මෙනෙහි කටයුතු.

**සිඞ්ඝාණිකා** හෙවත් මූකුණු, යම් කලෙක හටගනීද, එකල්හි නාස්පුටයෙහි පුරා සිටින්නේ හෝ වැගිරෙන්නේ හෝ වේ. කුණුවූ දියෙන් පිරුණාවූ, බොල්ලෙහි (සිප්පි) බොල්ලා මා කෙරෙහි කුණුවූ දිය සිටියේ යයි යම්සේ නො දනීද, කුණුවූ දියද, මම බොල්ලෙහි සිටියෙමියි යම්සේ නො දනීද, එපරිද්දෙන්ම, නාස්පුඩුහු අප කෙරෙහි මූකුණු (සොටු) සිටියාහයි නොදනිත්, මූකුණුද මම නාස්පුටයන්හි සිටි යෙමියි නොදනී. මූකුණුය, නාස්පුටය යන නම් ලද නිස්සත්ත්ව නිර්ජීව ස්වභාවයෝ ඔවුනොවුන් මෙනෙහි කිරීම් විමසීම් නැත්තාහ, චෙතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය. එහෙයින් නිස්සත්ත්ව වත්‍රය, ආබන්ධන ස්වභාවය ලක්‍ෂණකොට ඇත්තේය, එහෙයින් **ආපො ධාතුව** නම් වන්නේයයි මෙනෙහි කටයුතු.

**ලසිකා** හෙවත් **සඳමිදුළු තොමෝ** අසූ සන්ධීන්ගේ අභ්‍යන්තර කෘත්‍යය සාදමින් එක්සිය අසූවක් සන්ධීන්හි සිටි යාය. තෙල් ගැල්වූ ගැල් අකුරෙහි ගැල් අකුර තෙමේ මා තෙල් ගල්වා සිටියේයයි යම්සේ නොදනීද, තෙලද, මම ගැල් අකුර අභ්‍යන්තරකොට සිටියෙමියි යම්සේ නොදනීද, එපරිද්දෙන්ම, එක්සිය අසූවක් සන්ධීහු සඳමිදුළු තොමෝ අප අභ්‍යන්තරකොට සිටියාහයි නොදනිත්. සඳමිදුළු තොමෝද මම එක්සිය අසූවක් සන්ධීන් අභ්‍යන්තරකොට සිටියෙමැයි නොදනී. මේ සඳමිදුළුය, අසූ සන්ධීහුය යන නම් ලද නිස්සත්ත්ව නිර්ජීව ස්වභාවයෝ ඔවුනොවුන්

මෙහෙහි කිරීම් විමසීම් නැත්තාහ, චේතනා රහිතය, අව්‍යාකෘතය, ආත්මසූන්‍යය එහෙයින් නිස්සත්ත්ව වනුය, ආබන්ධන ස්වභාවය **ලක්‍ෂණ** කොට ඇත්තේය, එහෙයින් **ආපො ධාතු** නම් වන්නේ යයි මෙහෙහි කටයුතු.

**මූත්‍ර** **තෙමේ** මූත්‍රාශය නම්වූ වස්තිපුටයාගේ ඇතුළෙහි සිටියේය. ගවර වළෙහි බහාලූ, මුව සිදුර නැති **රචණසට** නම්වූ හඬනගන කලයෙහි, රචණසටය තෙම, මා කෙරෙහි ගවරවළ දිය සිටියේයයි යම්සේ නොදනීද, ගවරවළ දියද මම රචණසටයෙහි සිටියෙමියි යම්සේ නොදනීද, එපරිද්දෙන්ම **මූත්‍රාශය** තෙමේ මා කෙරෙහි මූත්‍ර තෙම සිටියේයයි නොදනී. මූත්‍ර තෙමේද, මම මූත්‍රාශයෙහි සිටියෙමි යයි නොදනී. මේ මූත්‍ර, මූත්‍රාශය යන නම් ලද නිස්සත්ත්ව නිර්ජීව ස්වභාවයෝ ඔවුනොවුන් මෙහෙහි කිරීම් විමසීම් නැත්තාහ, චේතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම සූන්‍යය. එහෙයින් නිස්සත්ත්ව වනුය, ආබන්ධන ස්වභාවය ලක්‍ෂණ කොට ඇත්තේය, එහෙයින් **ආපො ධාතු** නම් වන්නේ යයි මෙහෙහි කටයුතු.

## තෙජෝ ධාතුව

නිශිත භාවය හෙවත් ශරීර සන්තාපාදි වශයෙන් පැවති තීක්‍ෂණ භාවය **තෙජො** හෙවත් **තේජස්** නමි

මේ **තෙජො ධාතුව ද** පඨවි ආදීන් මෙන් **අධ්‍යාත්මික** හෙවත් ඉන්ද්‍රිය බද්ධ තෙජෝ ධාතුවය, **බාහිර** හෙවත් අනින්ද්‍රිය බද්ධ තෙජෝ ධාතුව යයි විධ වේ.

**අධ්‍යාත්මික තෙජො ධාතුව**. යම් අධ්‍යාත්මිකවූ ද, ඒ ඒ පුද්ගලයන්ට වෙන් වෙන්ව අයත්වූද, තියුණු බවක්, තියුණු බවට ගිය බැවින් තෙජෝගත බවක්, උෂ්ණ බවක්, උණුසුම් බවට ගිය බැවින් උෂ්ණ ගත බවක්, දැඩි උණුසුම් බවක්, දැඩි උණුසුම් බවට ගිය හෙයින් උණුසුම් ගත

බවක් වේද, අධ්‍යාත්මික වූ, ශරීරයට අයත් තෙජො ධාතුවක් වේද, එනම් කිපීම් හෙතුවෙන් මේ රූපකාය තෙම වැඩියක් තැවේද, ජ්වර රොගාදියෙන් හටගත් දැඩි තැවුල් ඇත්තේවේද, යම් තෙජො ධාතුවක් කිපීමෙන් මේ රූපකාය තෙම පැරණි වේද හෙවත් දිරීමට යේද, චක්ෂුරාදී ඉන්ද්‍රියයන්ගේ අපරිපූර්ණ භාවයට හෙවත් විකල බවටද, බෙලහීන බවට ද, ඇඟ රැලිවැටීම්, කෙස් ලොම් පැසීම් ආදී භාවයට ද පැමිණේද, යම් තෙජො ධාතුවක් කිපීමෙන් මේ රූප කාය තෙමේ වැඩියක් දැවේද, නොහොත් කිපියාවූ යම් තෙජො ධාතුවක් විසින් මේ රූප කාය තෙමේ වැඩියක් දවනු ලැබේද, ඒ දැවෙන්නාවූ හෝ දවනු ලබන්නාවූ පුද්ගල තෙමේත් දැවෙමි, දැවෙමියි නොහොත් දනු ලබමි දනු ලබමියි හඬමින් හෝ වැලපෙමින් සිය වරක් හුණුකොට දියෙහි බහා උපුටාගත් ඝෘතයක් ජලය මෙන් අත්‍යන්ත ශීතලවූ රත්සඳුනක් යනාදීවූ ආලෙපන ද්‍රව්‍යයක්, තල්වැට පවනක් පතාද, යම් තෙජො ධාතුවක් හෙතුකොට අනුභව කළාවූ බත් ආදි අහර හෝ පානය කළාවූ අඹ පැණි ආදිවූ අහර හෝ කන ලද්දවූ කැවුම් ආදි අහර හෝ ඉදුනු අඹ, මීපැණි, උක්පැණි ආදි රස බලන හෙවත් ආස්වාදිත අහර හෝ මනාව පැසවීම් බවට පැමිණේද, රස, ශ්‍රොණිත, මේදස්, මාංස, ස්නායු, අස්ථි, අස්ථිමිඥ්ජා වශයෙන් සප්තධාතු භාවයෙන් වෙන්වීමට යේද, මේ අධ්‍යාත්මික තෙජො ධාතුව නම්

තවද, යම් ඒ අන්‍යවූද, සත්ත්ව සන්තානගතවූද, ඒ ඒ පුද්ගලයන්ට වෙන් වෙන්ව අයත් උණුසුම්වූ, උණුසුම් භාවයට ගියාවූ, දැඩි උණුසුම් ඇති, දැඩි උණුසුම් බවට ගියාවූ කර්මයෙන් හටගත් තෙජො ධාතුවක් වේද, මෙයද අධ්‍යාත්මික තෙජො ධාතුවයි කියනු ලැබේ.

**බාහිර තෙජො ධාතුව.** යමක් බාහිරවූ, උණුසුම්වූ, උණුසුම් ස්වභාවයට ගියාවූ, දැඩි උණුසුම ඇති, දැඩි උණුසුම බවට ගියා වූ, කර්මයෙන් හට නොගත් තෙජො

ධාතුවක් වේද, එනම් දරවලින් ඇතිවන ගින්නය. කැලිකසල රැස් කොට දවන ලද්දාවූ ගින්නය, තෘණවලින් ඇතිවන ගින්නය, ගොමවලින් ඇතිවන ගින්නය, ධාන්‍ය පොතුවලින් ඇතිවන ගින්නය, හෙනවලින් ඇතිවන ගින්නය, ගිනි දූල්වලින් හෝ ගිනි අඟුරුවලින් හෝ ඇතිවන තැවීමය, ඉර අව්වෙන් ඇතිවන තැවීමය, දර ගොඩක් එකතුවූ තැන ඇතිවන තැවීමය යනාදි තෙජෝ ධාතුවද, යම් ඒ අන්‍යවූද, බාහිරවූ උණුසුම්වූ, උණුසුම් බවට ගියාවූ, කර්මයෙන් හට නොගත් උණුසුමක් ඇද්ද, මෙයද බාහිර තෙජෝ ධාතුව යයි කියනු ලැබේ.

මෙසේ අධ්‍යාත්මික තෙජෝ ධාතු හෙවත් ඉන්ද්‍රිය බද්ධ තෙජෝ ධාතුවත්, බාහිර තෙජෝ ධාතු හෙවත් අනින්ද්‍රියබද්ධ තෙජෝ ධාතුවත් යන දෙකම තීක්ෂණ සවභාවය ලක්ෂණ කොට ඇති හෙයින් එකම තෙජෝ ධාතුව යයි දක්වා වදාරණ ලදී.

**තෙජෝ ධාතු මනසිකාරය.** යම් තෙජසකින් හෙවත් කිපියාවූ යම් තෙජෝ ධාතු හෙතුවකින් වැඩියක් තැවේද, මේ තෙජස, මේ ශරීරයෙහි පඨවි ධාතු ආදීන් කෙරෙන් වෙන්වූ හෙවත් අසම්මිශ්‍රවූ කොටසෙක චෙතනා රහිත වන්නේය, අව්‍යාකෘත රාශියෙහි ඇතුළත්ය, ආත්ම ශූන්‍ය වනුය. එහෙයින්ම නිස්සත්ත්ව වනුය, පැසවීම් සවභාවය ලක්ෂණකොට ඇත්තේය, එහෙයින් තෙජෝ ධාතු නම් වන්නේයයි මෙනෙහි කටයුතු.

## වායො ධාතු

වේගවත් ගති වශයෙන් නොහොත් සමුදීරණ වශයෙන් හෙවත් වියලෙන, සැලෙන භාවයත් වායු නම් වේ. මේ වායො ධාතුවද, අධ්‍යාත්මික වායො ධාතු හෙවත් ඉන්ද්‍රියබද්ධ වායො ධාතුවය, බාහිර වායො ධාතු හෙවත් අනින්ද්‍රිය බද්ධ වායො ධාතුව යයි විධ වේ.

**අජ්ඣත්තිකා වායෝ ධාතුව.** යම් අධ්‍යාත්මික වූ, පුද්ගලයන්ට වෙන් වෙන්ව අයත් වූ වායුවවූද, වේගවත් ගති භාවයට නොහොත් වියලෙන සැලෙන බවට පැමිණි බැවින් වායොගතවූද, අවිනිර්භොග රූපයාගේ තද බවට පත්වූ අධ්‍යාත්මික රූපය පිළිබඳ කර්මයෙන් හටගත් වායෝ ධාතුව, එනම් වමන, ඉක්කා ආදියගේ පැවැත්ම කරන්නාවූ උඩට නංගාවූ **උද්ධඞ්ගමා වාතයෝය,** මලමූත්‍රාදීන් පහ-කරන්නාවූ යට බලා බස්නාවූ **අධොගමා වාතයෝය,** අන්ත්‍ර පටලයන්ගේ පිටත් සිටි **කුච්ඡිසයා වාතයෝය,** අන්ත්‍ර පටලයන්ගේ මධ්‍යාභ්‍යන්තර සඞ්ඛ්‍යාත කොෂ්ඨය හෙවත් ඇතුල් කුස මැද පෙදෙස ඇසුරු කළ **කොට්ඨාසයා වාතයෝය,** නහරවැල් අනුසරින් මුළු සිරුරෙහි කුදු මහත් අවයවයන් පැතිර පවත්නාවූ වක් කිරීම් දික් කිරීම් ආදිය උපදවන්නාවූ **අඞ්ගමඞ්ගානුසාරිනො වාතයෝය,** සන්ධින්ගේ සටනයන් කතුරකින් කපන්නවුන් මෙන් පැවති **සත්ථකා වාතයෝය,** සර කැත්තෙන් පලන්නාක් මෙන් ලය පළන්නා වූ **ඛුරකා වාතයෝය,** හදය මාංසයම උපුටන්නාවූ **උප්පලකා වාතයෝය,** ඇතුලට වදනා නාසා වාතය නම්වූ **අස්සාස වාතයෝය,** පිටට නික්මෙන නාසාවාත නම්වූ **පස්සාස වාතයෝය,** යන මේ වාතයෝද, මෙසේ අන්‍යවූද, යම් අධ්‍යාත්මික වූ පුද්ගලයන්ට වෙන් වෙන්ව අයත් වායුවවූ, වායුස්වභාවයට ගියාවූ තද බවට පත්වූ, අධ්‍යාත්මික රූපය පිළිබඳ කර්මයෙන් හටගත් වායුවක් වේද, මෝතොමෝ අධ්‍යාත්මික වායෝ ධාතුව යයි කියනු ලැබේ.

**බාහිර වායෝ ධාතුව.** යම් බාහිරවූ, අනින්ද්‍රියබද්ධවූ, වායුවවූ, වායු ස්වභාවයට ගියාවූ, තද බවට පත්වූ, බාහිර රූපය පිළිබඳවූ කර්මයෙන් හටනොගත්තාවූ වායුවක් වේද, එනම්, පෙරදිගින් හමන්නාවූ **පුරත්ථිමා වාතයෝය,** බටහිරින් හමන්නා වූ **පච්ඡිමා වාතයෝය,** උතුරුදිගින් හමන්නාවූ **උත්තරා වාතයෝය,** දකුණුදිගින් හමන්නාවූ **දක්ඛිණා වාතයෝය,** ධූලි සහිත වූ හෙයින් **සරජ**

**වාතයෝය,** ධූලි රහිතවූ හෙයින් පිරිසිදුවූ **අරජ වාතයෝය**, ශීත ඍතු හෙතුවෙන් හටගන්නාවූ සිහිල් වළාවන් අතරෙහි වූ **සීත වාතයෝය,** ඝර්ම ඍතු හෙතුවෙන් හට ගන්නාවූ උෂ්ණ වළාවන් අතරෙහිවූ **උෂ්ණ වාතයෝය,** මඳවූ හෙවත් දුබලවූ තුනීවූ **පරිත්තා වාතයෝය,** බලවත්වූ හෙවත් ඉමහත් වූ **අධිමත්තා වාතයෝය,** කළු වළාවන් අතරෙහි හටගන්නාවූ **කාළ වාතයෝය,** යොදුනකින් උඩ ගමන්නාවූ **වේරම්භ වාතයෝය,** පටක් පිරිසෙයින් මැස්සකුගේ නමුත් පියාපත් සැලීමෙන් හටගන්නාවූ **පක්ඛ වාතයෝය,** ගුරුළුන්ගේ පියාපත් ගැසීමෙන් හටගන්නාවූ **සුපණ්ණ වාතයෝය,** තල් අතු ආදියෙන් නැංගාවූ **තාලපණ්ණ වාතයෝය,** විජිනිපතෙකින් නැංගෑවූ **විධූපන වාතයෝය,** යනාදිවූ වාතයෝද යම් ඒ අන්‍යවූ ද, බාහිර වූ, වායුව වූ, වායුස්වභාවයට ගියාවූ, තද බවට පත්වූ, බාහිර රූපය පිළිබඳ වූ, කර්මයෙන් හට නොගත් යම් වායුවක් වේද, මේතොමෝ **බාහිර වායො ධාතුව** ය යි කියනු ලැබේ.

යම් අධ්‍යාත්මික වායො ධාතුවක් ඇද්ද, යම් බාහිර වායො ධාතුවක් ඇද්ද, ඒ දෙකම එක්කොට ගළපා කැටි කොට ගත්තීද, මේතොමෝ **වායො ධාතුව** ය යි වදාරන ලදී.

**වායො ධාතු මනසිකාරය** – මේ ශාසනයෙහි සසර බිය දක්නා පුද්ගල තෙමේ, උද්ධඞ්ගම වාතාදී ප්‍රභෙද ඇති වායො ධාතූන්, උද්ධඞ්ගම වාතාදීන්ගේ වශයෙන් පිරිසිඳ දැන, උඩට නැංගාවූ වාතයෝ නම් මේ සිරුරෙහි අධොගමාදිවූ සෙසු වාතයන් කෙරෙන් වෙන්වූ හෙවත් අසම්මිශ්‍රවූ කොටසෙක, චෙතනා රහිතය, අව්‍යාකෘතය, ආත්ම ශූන්‍යය. එහෙයින් නිස්සත්ත්ව වනුය, අවිනිර්භාග රූපයන්ගේ ස්ථම්භන ස්වභාවයක් වන්නේය. එහෙයින් **වායො ධාතු** නම් වන්නේයයි මෙතෙහි කටයුතු.

# ආකාශ ධාතුව

**ආකාශ ධාතුව**-අසම්පටිඝට්ටනාර්ථය හෙවත් පැකිළීමක් නැතිහෙයින් විලෙඛනය නොකරනු ලැබේනුයි නොලිය හැක්කේනුයි හෝ **ආකාශ** නම් වේ

මේ **ආකාශ ධාතු තොමෝ ද අධ්‍යාත්මික** හෙවත් ඉන්ද්‍රිය බද්ධ ආකාශ ධාතුවය, **බාහිර** හෙවත් අනින්ද්‍රිය බද්ධ ආකාශ ධාතුව ය යි ද්විධ වේ.

**අධ්‍යාත්මික ආකාශ ධාතුව**- යම් අධ්‍යාත්මික වූ පුද්ගලයන්ට වෙන් වෙන්ව අයත්වූ, ආකාශවූ, විලෙඛනය නොකළහැකි බවට ගිය බැවින් ආකාශගතවූ, හිස්ව අවහිර නොවන බැවින් අඝවූ, නොගැටෙන බවට ගිය බැවින් අඝගත නම්වූ, සිදුරු බැවින් විවරවූ, ඡිද්‍රභාවයට ගිය බැවින් විවර ගත නම් වූ, මස් ලේ වලින් නොගැටුනාවූ, අධ්‍යාත්මිකව කර්මයෙන් උපන් ආකාශ ධාතුව - එනම්, කන් සිදුර, නාස් සිදුර, මුඛයෙහි දොරටුව, යමකින් කන දේද, බොනදේද, කඩා කන දේද, රස බලනදේද, පිහිටා සිටීද, යම් විවරයකින් කන දේද, බොන දේද, කඩා කන දේද, රස බලන දේද, පැසවීමට, කසල බවට පැමිණියේව අධොභාගයෙන් නික්මේද, යම් ඒ අන්‍යවූ ද, අධ්‍යාත්මිකවූ, පුද්ගලයන්ට වෙන් වෙන්ව අයත් ආකාශවූ, ආකාශගතවූ, අඝවූ, අඝගතවූ, විවරවූ, විවරගතවූ, මස් ලේවලින් අසම්පූර්ණවූ අධ්‍යාත්මිකවූ කර්ම-යෙන් උපන් ආකාශයක් ඇද්ද, මෝතොමෝ අධ්‍යාත්මික ආකාශ ධාතුව යයි කියනු ලැබේ.

**බාහිර ආකාශ ධාතුව** - යම් බාහිරවූ, ආකාශවූ, ආකාශ ගතවූ, අඝවූ. අඝගතවූ, විවරවූ, විවරගතවූ, සතර මහා භූතයන් විසින් සපර්ශ නොවූ, බාහිරවූ, කර්මයෙන් නූපන් බිත්තු සිදුර, කවුළු සිදුර, යනාදිවූ යම් ආකාශ කුහර-යෙක් වේද, යම් ආකාශයක් පරිකර්ම කරන්නාහට චතුෂ්ක පඤ්චමධ්‍යානයෝ උපදිද්ද, ඒ මේ ආකාශ කුහරයද බාහිර ආකාශ ධාතුව ය යි කියනු ලැබේ

යම් අධ්‍යාත්මික ආකාශ ධාතුවක් ඇද්ද, යම් බාහිර ආකාශ ධාතුවක් ඇද්ද, ඒ දෙකම එක් කොට ගළපා, කැටි කොට ගත්තීද, මේතොමෝ **ආකාශ ධාතුව** යයි වදාරන ලදී.

## විඤ්ඤාණ ධාතුව

**චක්ඛු විඤ්ඤාණ ධාතු, සෝත විඤ්ඤාණ ධාතු, ඝාණ විඤ්ඤාණ ධාතු, ජිව්හා විඤ්ඤාණ ධාතු, කාය විඤ්ඤාණ ධාතු, මනෝ විඤ්ඤාණ ධාතු** වශයෙන් **විඤ්ඤාණ ධාතු තොමෝ** ෂඩ්විධ වේ

මෙහි චක්ෂුර් විඤ්ඤාණ සඞ්ඛ්‍යාතවූ ධාතුතොම **චක්ඛු විඤ්ඤාණ ධාතු** නම්. සෝත විඤ්ඤාණ සඞ්ඛ්‍යාත ධාතුතොම **සෝත විඤ්ඤාණ ධාතු** නම්. ඝාණ විඤ්ඤාණ සඞ්ඛ්‍යාතවූ ධාතු තොම **ඝාණ විඤ්ඤාණ ධාතු** නම්. ජිව්හා විඤ්ඤාණ සඞ්ඛ්‍යාතවූ ධාතුතොම **ජිව්හා විඤ්ඤාණ ධාතු** නම්. කාය විඤ්ඤාණ සඞ්ඛ්‍යාතවූ ධාතුතොම **කාය විඤ්ඤාණ ධාතු** නම්. මනෝ විඤ්ඤාණ සඞ්ඛ්‍යාතවූ ධාතුතොම **මනෝ විඤ්ඤාණ ධාතු** නම්.

මේ **ෂඩ් ධාතූන්** පිරිසිඳ දත්කල්හි අටළොස් ධාතූහු පිරිසිඳ දත්තාහුම වෙත්.

**පඨවි, තේජෝ, වායෝ** ධාතූන් ගැනීමෙන් **ඵොට්ඨබ්බ ධාතු** තොමෝ ගන්නා ලද්දීම වේ.

**ආපෝ ධාතු, ආකාශ ධාතූන්** ගේ ගැනීමෙන් **ධම්ම ධාතු** තොමෝ ගන්නා ලද්දීම වේ.

**විඤ්ඤාණ ධාතුවගේ** ගැනීමෙන් ඒ විඤ්ඤාණ ධාතුවගේ ඉදිරියෙහි පඤ්චද්වාරාවජ්ජන **චිත්තයාගේ** පැවැත්මද, සන්තීරණ චිත්තයාගේ ඉදිරියෙහි සම්පටිච්ඡන යුග්මයාගේ පැවැත්මද වන හෙයින් **පුරේචාරිකා** වශයෙන්ද, භවඞ්ග පච්ඡේදයාගේ පරභාගයෙහි පඤ්චද්වාරාවජ්ජන චිත්ත-යාගේ පැවැත්මද, විපඤ්ච විඤ්ඤාණයන්ගේ පරභාගයෙහි

සම්පටිච්ඡන යුග්මයාගේ පැවැත්මද වන හෙයින් **පඤ්චද්වාරිකා** වශයෙන්ද, **මනො ධාතු** තොමෝ ගන්නා ලද්දීම වේ.

තවද, චක්ඛුර් විඥාන ධාතුවගේ ගැනීමෙන්, ඒ චක්ඛුර් විඥාන ධාතුවගේ නිශ්‍රයස්ථානවූ චක්ෂුප්‍රසාද රූප සඞ්ඛ්‍යාතවූ **චක්ඛුර් ධාතු** තොමෝද, ආලම්බනයවූ වර්ණායතන සඞ්ඛ්‍යාත වූ **රූප ධාතු** තොමෝ ද ගන්නා ලද්දාහුම වෙත්.

මේ පිළිවෙළින් සොත විඥාන ධාතු ආදීන්ගේ ගැනීමෙන් **ශ්‍රොත්‍ර ධාතු** ආදීහු ගන්නා ලද්දාහුම වෙත්.

මේ අටළොස් ධාතුන් අතුරෙන් දසවැදෑරුම්වූ රූප ධාතුන් කරණකොටගෙන රූප සම්මර්ශනය වේ සත්වැදෑරුම් වූ නාම ධාතුන් කරණකොටගෙන නාම හෙවත් අරූප සම්මර්ශනය වේ. ධර්ම ධාතුව කරණකොටගෙන කිසිවිටෙක රූප සම්මර්ශනයද, කිසිවිටෙක අරූප සම්මර්ශනයද වේ.

මෙපරිද්දෙන් අටළොස් ධාතූහු, රූපාරූප ධර්ම වශයෙන් සම්මර්ශනය කිරීම වේ.

**නාම රූපය** තෙමේ පඤ්චස්කන්ධ නම් වේ. ඒ නාමරූපය තෙමේ **දුක්ඛ සත්‍යය** නමුදු වේ ඒ නාම රූප සඞ්ඛ්‍යාතවූ **දුක්ඛ සත්‍යය** ඉපදවීමට හේතුවූ පූර්ව-භවයෙහි පැවති තෘෂ්ණා තොමෝ **සමුදය සත්‍යය** නම්. දුක්ඛ සමුදය සත්‍යය සඞ්ඛ්‍යාතවූ උභය සත්‍යයන්ගේ නො පැවැත්ම **නිරොධ සත්‍යය නම්** ඒ නිරොධ සත්‍යය අරමුණු කිරීම් වශයෙන් ප්‍රකාරයෙන් දන්නාවූ අෂ්ටාඞ්ගික වූ ආර්‍ය මාර්ග තෙම **මාර්ග සත්‍යය** නම්. මෙසේ මේ චතුස්සත්‍ය යයි කියන ලද කමටහන අටළොස් ධාතුන්ගේ වශයෙන් මෙනෙහි කරන්නාවූ භික්ෂුව හට අතීත් එලය දක්වා මුදුන් පමුණුවා ගතහැකි වේ.

**දෙවෙනි ෂට්කයෙහිද,** ධාතූහු සදෙනෙකු වදාරන ලදී. එනම් – **සුඛ ධාතු, දුක්ඛ ධාතු, සොමනස්ස ධාතු, දොමනස්ස ධාතු, උපෙක්ඛා ධාතු, අවිජ්ජා ධාතු** යන සදෙනය.

**සුඛ ධාතුව** - යම් කායිකවූ සැප විඳගැන්මක් ඇද්ද, කායික සුඛයක් ඇද්ද, කායසම්ඵස්සයෙන් ඇතිවූ, විඳියයුතු, සැප විඳගැන්මක් සුඛයක් ඇද්ද, කය හා සම්ඵස්සයෙන් හටගත් සැප විඳීම් ඇත්තාවූ සුඛ **වේදනාවක්** ඇද්ද, මෝතොමෝ **සුඛ ධාතු** යයි කියනු ලැබේ.

**දුක්ඛ ධාතුව** - යම් කායිකවූ සැප විඳ නොගැන්මක් ඇද්ද කායිකවූ දුකක් ඇද්ද, කායසම්ඵස්සයෙන් හටගත් සැප නොවිඳීමක් විඳියයුතු දුකක් ඇද්ද, කායසම්ඵස්සයෙන් හටගත් සැප විඳීම් නැත්තාවූ දුක්වූ වේදනාවක් ඇද්ද, මෝතොමෝ **දුක්ඛ ධාතු** යයි කියනු ලැබේ.

**සොමනස්ස ධාතුව** - යම් චෛතසිකවූ සැප විඳ ගැන්මක් ඇද්ද චෛතසිකවූ සුඛයක් ඇද්ද, චිත්තසම්ඵස්සයෙන් හටගත් සැප විඳගැන්මක්, විඳියයුතු සැපයක් වේද, චිත්තසම්ඵස්සයෙන් හටගත් සැප විඳීම් ඇති සැපවූ වේදනාවක් ඇද්ද, මෝතොමෝ **සොමනස්ස ධාතු** යයි කියනු ලැබේ.

**දෝමනස්ස ධාතුව** - යම් චෛතසික සැප නොවිඳ ගැන්මක් ඇද්ද, චෛතසිකවූ දුකක් ඇද්ද, චිත්තසම්ඵස්සයෙන් හටගත් සැප විඳීම් නැති, විඳියයුතුවූ, දුක්වූ, වේදනාවක් ඇද්ද, මෙය **දෝමනස්ස ධාතුව** යයි කියනු ලැබේ.

**උපෙක්ඛා ධාතුව** - යම් වූ වේදනාවක් සාත නොවූයේ වේද, අසාත නොවූයේ වේද, චිත්තසම්ඵස්සයෙන් හටගත් විඳිය යුතු සැප නොවූයේ ද, දුක් නොවූයේද, චිත්තසම්ඵස්සයෙන් හටගත් සැප නොවන, දුක් නොවන වේදනාවක් ඇද්ද, මෙය **උපෙක්ඛා ධාතුව** යයි කියනු ලැබේ.

**අවිජ්ජා ධාතුව** - යම් නොදැන්මක්, නොදැක්මක්, අනභිසමයක්, අවබෝධ නොකිරීමක්, මනාව අවබෝධ නොකිරීමක්, ප්‍රතිවේධ නොකිරීමක්, එක්තැන් නො-

කිරීමක්, වටකොට නොගැනීමක්, මනාව නොබැලීමක්, ප්‍රත්‍යවෙක්‍ෂා නොකිරීමක්, ප්‍රත්‍යක්‍ෂ නොකිරීම් කර්මයක් මෝඩ බවක්, බාල බවක්, නොවිමසීමක්, මෝහයක්, පමොහ යක්, සම්මෝහයක්, අවිජ්ජාවක්, අවිජ්ජෝඝයක්, අවිජ්ජා යෝගයක්, අවිජ්ජානුසයක්, අවිද්‍යාවගේ මතුවීමක් අවිද්‍යා අගුලක්, අකුසල මූලයක් ඇද්ද, මෝතොමෝ **අවිජ්ජා ධාතු** යයි කියනු ලැබේ

මේ දෙවෙනි ෂට්කයෙහි, **සුඛ ධාතු දුක්ඛ ධාතු** යන දෙදෙන, කායප්‍රසාදයම වස්තුකොට ඇත්තාවූ, සුඛ වෙදනා, දුක්ඛ වෙදනා දෙදෙනය. එය ප්‍රතිපක්‍ෂ ධර්ම වශයෙන් යුග්මයක් කොට දක්වන ලදී. සුඛ වෙදනාව, දුක්ඛ වෙදනාවට ප්‍රතිපක්‍ෂවූ ස්වභාවයකි. දුක්ඛ වෙදනාවද, සුඛ වෙදනාවට ප්‍රතිපක්‍ෂවූ ස්වභාවයකි. යම් පමණ වූ ශරීරස්ථානයෙක් සුඛ වෙදනාව විසින් ස්ඵරණය කරන ලද්ද, එපමණවූ ශරීරස්ථානය දුක්ඛ වෙදනාව ස්ඵරණය කෙරෙයි. යම් පමණ වූ ශරීරස්ථානයක් දුක්ඛ වෙදනාව විසින් ස්ඵරණය කරණ ලද්ද එපමණවූ ශරීරස්ථානය සුඛ වෙදනාව ස්ඵරණය කෙරෙයි.

**සොමනස්ස ධාතු, දෞමනස්ස ධාතු** යන දෙදෙනද සුඛ ධාතු, දුක්ඛ ධාතු යුග්මය මෙනි.

නාම ධර්ම සඞ්ඛ්‍යාතවූ සුඛ දුක්ඛ වෙදනාවන්ගේ ශරීරස්ඵරණයෙක් නැත නමුත් චිත්ත සමුට්ඨාන සෘතු-හුගේ ශරීරස්ඵරණයෙක් ඇත්තේය. එබැවින් සෘතුහුගේ ශරීරස්ඵරණයට මූල කාරණා භාවයෙන් සුඛ දුක්ඛ වෙදනාවන්ගේ ස්ඵරණ භාවය දතයුතු. සොමනස්ස දෞමනස්ස යන්ගේ ශරීරස්ඵරණ භාවයද එසේමය.

**උපෙක්ඛා ධාතු, අවිජ්ජා ධාතු** යන ධාතු යුග්මය සමාන වශයෙන් යුග්මයක් කොට දෙශනා කරන ලදී. **උපෙක්ඛා ධාතුව** වෙදනාවකි. **අවිජ්ජා ධාතුව** මොහ යයි. මේ දෙදෙනම අප්‍රකට භාවයෙන් හෙවත් නො-වැටහෙන බැවින් සමාන වන්නේය.

මෙහි සුඛ ධාතු, දුක්ඛ ධාතු දෙදෙනාගේ ගැනීමෙන් ඒ සුඛ ධාතු, දුක්ඛ ධාතු දෙදෙනා හා සම්ප්‍රයොග ලක්‍ෂණ වශයෙන් යුක්තවූ **කාය විඥාන ධාතු** තොමෝ ද, සුඛ ධාතු, දුක්ඛ ධාතු දෙදෙනාගේ නිශ්‍රයස්ථානවූ කායප්‍රසාද සඞ්ඛ්‍යාතවූ **කාය ධාතු** තොමෝද, ඒ ධාතු දෙදෙනාගේ ආලම්බනයවූ ඉෂ්ටානිෂ්ට භූතත්‍රය සඞ්ඛ්‍යාතවූ **ඵොට්ඨබ්බ ධාතු** තොමෝද, ගන්නා ලද්දාහු වෙත්.

සොමනස්ස ධාතු, දෞමනස්ස ධාතූන් දෙදෙනාගේ ගැනීමෙන් ඒ හා සම්ප්‍රයොග ලක්‍ෂණයෙන් යුක්තවූ **මනො විඤ්ඤාණ ධාතු** තොමෝ ගන්නා ලද්දී වේ.

අවිජ්ජා ධාතුවගේ ගැනීමෙන් **ධම්ම ධාතු** තොමෝ ගන්නා ලද්දී වේ.

උපෙක්ඛා ධාතුවගේ ගැනීමෙන් **චක්‍ෂුර් විඥාන ධාතු, ශ්‍රොත විඥාන ධාතු, ඝ්‍රාණ විඥාන ධාතු, ජිව්හා විඥාන ධාතු, මනො ධාතු** යන මොව්හුද, ඒ විඥාන ධාතූන්ගේම වස්තු ආලම්බනවූ **චක්ඛු ධාතු, රූප ධාතු** යනාදීහුද ගන්නා ලද්දාහු වෙත් මේ නයින් අටළොසක්වූද ධාතුහු ගන්නා ලද්දාහුම වෙත්.

**තෙවැනි ෂට්කයෙහිද** ධාතුහු සදෙනකු වදාරන ලදී. එනම්- **කාම ධාතු, ව්‍යාපාද ධාතු, විහිංසා ධාතු, නෙක්ඛම්ම ධාතු, අව්‍යාපාද ධාතු, අවිහිංසා ධාතු** යන සදෙනය.

**කාම ධාතුව**-යම්බඳුවූ කාමය හා යෙදීම ඇති තර්කයක්, විතර්කයක්, සිතීමක්, අප්පනාවක්, ව්‍යප්පනාවක්, චිත්තයාගේ ඉදිරිපත් කිරීමක්, වැරදි කල්පනාවක් වේද මෝතොමෝ **කාම ධාතුව** යයි කියනු ලැබේ යටින් අවීචි නිරය කෙළවර කොට ඇති, මතු වශයෙන් පරනිම්මිත වසවර්ති දෙවියන් කෙළවර කොට ඇති, යම්බඳු මේ අතරෙහි හැසිරෙන, එහි ඇතුළත්වූ ස්කන්ධ, ධාතු, ආයතනයෝද, රූප වෙදනා, සංඥා, සඞ්ඛාර, විඤ්ඤාණ යන මොව්හුද **කාම ධාතුව** නම් වේ.

**ව්‍යාපාද ධාතුව** යම්බඳුවූ, ව්‍යාපාදය හා යෙදීම ඇති තර්කයක් විතර්කයක්, සිතීමක්, අප්පනාවක්, ව්‍යප්පනාවක්, චිත්තයාගේ ඉදිරිපත් කිරීමක්, වැරදි කල්පනාවක් වේද, මෝතොමෝ **ව්‍යාපාද ධාතුව** යයි කියනු ලැබේ. ආඝාත වස්තූන් කෙරෙහි චිත්තයාගේ ක්‍රොධයක් ඇද්ද, විශෙෂ ක්‍රොධයක්, කිපීම් බවක්, ප්‍රති විරුද්ධත්වයක්, කොපයක්, ප්‍රකොපයක්, සම්ප්‍රකොපයක්, වෙෂයක්, දූෂණයක්, විශෙෂයෙන් දූෂණවීමක්, කෝපයට පත්වීමක්, චිත්ත දූෂණයක්, ක්‍රොධයක්, කිපීමක්, කිපුණු බවක්, දොසයක්, දූස්සනාවක්, දූස්සිත බවක්, ව්‍යාපත්තියක්, ව්‍යාපජ්ජනාවක්, විරොධයක්, පටි විරොධයක්, චණ්ඩ ගතියක්, ක්‍රොධයෙන් අසුරොපයක්, සිතෙහි නොසතුටු බවක් ඇද්ද, එයද **ව්‍යාපාද ධාතුව** නම් වේ.

**විහිංසා ධාතුව** යම්බඳු වූ විහිංසාව හා යුක්තවූ තර්කයක්, විතර්කයක්, සිතීමක්, අප්පනාවක්, ව්‍යප්පනාවක්, චිත්තයාගේ ඉදිරිපත් කිරීමක්, වැරදි කල්පනාවක් වේද, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් අතින් හෝ ගල් කැටවලින් හෝ දණ්ඩෙන් හෝ ආයුධයෙන් හෝ රැහැණෙන් හෝ, අනික් වෙතින් දෙයකින් හෝ සත්ව යන්ට හිංසා පීඩා කෙරේද, යම්බඳුවූ දුක් ඉපදවීමක්, බලවත් දුක් ඉපදවීමක්, හිංසාවක්, බලවත් හිංසාවක්, ගැටීමක්, බලවත් ගැටීමක්, අනුන් විනාශ කිරීමක් ඇද්ද, එයද **විහිංසා ධාතුව** නම් වේ.

**නෙක්ඛම්ම ධාතුව**. කාමයන්ගෙන් වෙන්වීම හා යුක්තවූ තර්කයක්, විතර්කයක්, සිතීමක්, අප්පනාවක්, ව්‍යප්පනාවක්, චිත්තයාගේ ඉදිරිපත් කිරීමක්, නිවැරදි කල්පනාවක් වේද, මෝතොමෝ **නෙක්ඛම්ම ධාතුව** යයි කියනු ලැබේ. සියළුම කුසල ධර්මයෝ **නෙක්ඛම්ම ධාතු** නම් වෙත්.

**අව්‍යාපාද ධාතුව**. අව්‍යාපාදය හා යුක්තවූ තර්කයක් විතර්කයක්, සිතීමක්, අප්පනාවක්, ව්‍යප්පනාවක්, චිත්තයාගේ ඉදිරිපත් කිරීමක්, නිවැරදි කල්පනාවක් වේද, මෝතොමෝ

**අව්‍යාපාද ධාතුව** යයි කියනු ලැබේ. යම්බඳුවූ සත්ත්වයන් කෙරෙහි මෛත්‍රිය, මෛත්‍රී ආකාරය, මෛත්‍රී කිරීම් බව, මෛත්‍රිය කරණකොටගෙන සිත ව්‍යාපාදයෙන් මිදීමක් වේද, මෙයද **අව්‍යාපාද ධාතු** නම් වේ.

**අවිහිංසා ධාතුව**. අවිහිංසාව හා යුක්තවූ තර්කයක්, විතර්කයක්, සිතීමක්, අප්පනාවක්, ව්‍යප්පනාවක්, චිත්තයාගේ ඉදිරිපත් කිරීමක්, නිවැරදි කල්පනාවක් වේද, මෝතොමෝ **අවිහිංසා ධාතුව** යයි කියනු ලැබේ. යම්බඳුවූ සත්ත්වයන් කෙරෙහි කරුණාවක්, කරුණා ආකාරයක්, කරුණා කිරීම් බවක්, කරුණාව කරණකොටගෙන සිත හිංසාවෙන් මිදීමක් වේද, මෙයද **අවිහිංසා ධාතුව** නම් වේ.

මෙහි **කාම ධාතුව වස්තුකාම, ක්ලේශකාම** වශයෙන් දෙදෙනෙකි. ක්ලේශ කාමය සඳහා කාමරාග සඞ්ඛ්‍යාත කාමය පිළිබඳවූ ධාතු තොමෝ **කාමධාතු** නම් වේ මෙය **කාම විතර්කයාගේ** නාමයකි. වස්තුකාමය සඳහා වස්තු කාමයම සවභාවධාරණාර්ථයෙන් ධාතු වූවා **කාමධාතු** නම් වේ. මෙය **කාමාවචර ධර්මයන්ගේ** නාමයකි.

ආඝාත වස්තුන් කරුණුකොට ඇති නොහොත් ව්‍යාපාදය පිළිබඳවූ ධාතු තොමෝ **ව්‍යාපාද ධාතු** නම් මෙය **ව්‍යාපාද විතර්කයාගේ** නාමයකි. සතුරන්ගේ විපත්තියට කාරණාවූ ව්‍යාපාද සඞ්ඛ්‍යාත මෙයම ධාතුවූවා, **ව්‍යාපාද ධාතු** නම් වේ මෙය **ප්‍රතිඝයාගේ** නාමයකි

විහිංසාව හා සංයුක්තවූ නොහොත් විහිංසාව පිළිබඳවූ ධාතු තොමෝ **විහිංසා ධාතු** නම් වේ මෙය **විහිංසා විතර්කයාගේ** නාමයකි. විහිංසා තොමෝම ධාතු වූවා, **විහිංසා ධාතු** නම් වේ. මෙය පර සත්ත්ව විහිංසාවට කාරණාවූ **චේතනාගේ** නාමයකි. යම් ධර්ම ජාතියක් කරණකොට ගෙන සත්ත්වයෝ, සත්ත්වයන් තසනු කැමැති වෙත්ද, සත්ත්වයන් වෙහෙසීම වේද, එය **විහිංසා** නම් වේ පරසත්ත්ව හිංසාවට නාමෙකි. **ඒ විහිංසාව පර සත්ත්වයන්ට**

හිංසා කිරීම **ලක්‍ෂණ** කොට ඇත්තීය. නොහොත් කරුණාවට ප්‍රතිපක්‍ෂවූ **ලක්‍ෂණ** ඇත්තීය. අන්‍යයන්ගේ සිත් සතන්හි තැති ගැනුම් ඇතිකරවන **කෘත්‍ය** ඇත්තීය, නොහොත් තම සිත් සතන්හි අනුකම්පාව නස්නා කෘත්‍යය ඇත්තීය. දුකට කරුණුව එළඹ සිටින්නීය, නොහොත් දුක් වේදනාවගේ ඇතිවීමම ඵලයකොට ඇත්තීය. පටිඝය ආසන්න කාරණකොට ඇත්තීය.

ලොභය කෙරෙන් නික්ම ගිය බැවින් **අලොභය** තෙමේ **නෙක්ඛම්මය** යයි කියනු ලැබේ. එසේම නීවරණයන් කෙරෙන් නික්ම ගිය බැවින්, ප්‍රථම ධ්‍යානය **නෙක්ඛම්මය** යයි කියනු ලැබේ. සියලු අකුසල්හු කෙරෙන් නික්ම ගිය බැවින් සියලු කුසලය **නෙක්ඛම්මය** යයි කියනු ලැබේ. නෙක්ඛම්මය හා යුක්තවූ ධාතු තොමෝ **නෙක්ඛම්ම ධාතු** නම් වේ. මෙය නෙක්ඛම්ම සංකප්පයාගේ හෙවත් **නෛෂ්ක්‍රම්‍ය විතර්කයාගේ** නාමයකි. නෙක්ඛම්මයම ධාතුවූවා, නෙක්ඛම්ම ධාතු නම්වේ. මෙය සියළුම කුසලයාගේ නාමයකි.

අව්‍යාපාද සඞ්ඛ්‍යාතවූ අද්වේෂය හා යුක්තවූ ධාතු තොමෝ **අව්‍යාපාද ධාතු** නමි. මෙය **අව්‍යාපාද විතර්කයාගේ** නාමයකි. අව්‍යාපාද සඞ්ඛ්‍යාතවූ අද්වේෂයම ධාතුවූවා **අව්‍යාපාද ධාතු** නම් මෙය මෛත්‍රියගේ නාමයයි.

අවිහිංසා සඞ්ඛ්‍යාත **කරුණාව** හා යුක්තවූ ධාතු තොමෝ **අවිහිංසා ධාතු** නමි. මෙය **අවිහිංසා විතර්කයාගේ** නාමයයි අවිහිංසා සඞ්ඛ්‍යාතවූ **කරුණාවම** ධාතුවූවා, **අවිහිංසා ධාතු** නම් වේ. මෙය **කරුණාවගේ** නාමයයි.

**අභිධර්ම** භාජනීයයෙහි ස්වරූප වශයෙන් ම සියලුම ධාතූන් දක්වා වදාරන්නාවූ භාග්‍යවතුන් වහන්සේ, **චක්ඛු ධාතු, රූප ධාතු, චක්ඛු විඤ්ඤාණ ධාතු** යනාදි වශයෙන් අටළොස් ධාතූන් දක්වා වදාළ සේක.

වචනාර්ථ වශයෙන් වනාහි, යම් ප්‍රසාද රූපයෙක්, රූපය ආස්වාදය කරන්නාක් මෙන් වේද, එහෙයින් ඒ ප්‍රසාද රූපය තෙම **චක්ඛුස්** නම්. යම් ආලම්බන රූපයෙක් හෘදයඞ්ගත බව හෙවත් ලෙහි වත් බව ප්‍රකාශ කෙරේද, එහෙයින් ඒ ආලම්බන රූපය තෙමේ **රූප** නම් චක්ඛුස-යාගේ විඥානය තෙමෙ **චක්ඛුර් විඥාන** නම්.

මේ ක්‍රමයෙන් **සොත ධාතු, ශබ්ද ධාතු, සොත විඥාන ධාතු, ඝාණ ධාතු, ගන්ධ ධාතු, ඝාණ විඥාන ධාතු, ජිව්හා ධාතු, රස ධාතු, ජිව්හා විඥාන ධාතු, කාය ධාතු, ඵොට්ඨබ්බ ධාතු, කාය විඥාන ධාතු, මනො ධාතු, ධම්ම ධාතු, මනො විඥාන ධාතුන්ගේ** වචනාර්ථ දතයුතු

ලක්ෂණාදි වශයෙන් වනාහි චක්ඛුරාදීන්ගේ විස්තරය ඌට දක්වන ලදී

ක්‍රම වශයෙන් වනාහි, දෙශනා ක්‍රමය, හෙතුඵල ධර්මයන් ගේ පරිපාටිය නිශ්චය කිරීම් වශයෙන් දක්වන ලදී **චක්ඛුර් ධාතු රූප ධාතු** යන මේ දෙදෙනාගේ එක්කොට ගැනීම **හෙතු** නම්. **චක්ඛුර් විඥාන ධාතුව** යනු **ඵලය** වේ. මේ ක්‍රමයෙන් සොතාදිවූ **සියලුම** ධාතුන් දතයුතු.

තවද, සූත්‍ර අභිධර්ම දෙශනා පාඨයන්හි, **ආභා ධාතුය, ශුභ ධාතුය, ආකාසානඤ්චායතන ධාතුය, විඤ්ඤාණඤ්චායතන ධාතුය, ආකිඤ්චඤ්ඤායතන ධාතුය, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධාතුය, සඤ්ඤා වෙදයිත නිරොධ ධාතුය, කාම ධාතුය, ව්‍යාපාද ධාතුය, විහිංසා ධාතුය, නෙක්ඛම්ම ධාතුය, අව්‍යාපාද ධාතුය, අවිහිංසා ධාතුය, සුඛ ධාතුය, දුක්ඛ ධාතුය, සොමනස්ස ධාතුය, දොමනස්ස ධාතුය, උපෙක්ඛා ධාතුය, අවිජ්ජා ධාතුය, ආරම්භ ධාතුය, නික්කම ධාතුය, පරක්කම ධාතුය, හීන ධාතුය මජ්ඣිම ධාතුය, පණීත ධාතුය, පඨවි ධාතුය, ආපො ධාතුය, තෙජො ධාතුය, වායො ධාතුය, ආකාශ ධාතුය, විඤ්ඤාණ ධාතුය,' සඞ්ඛත ධාතුය, අසඞ්ඛත**

**ධාතුය, අනෙක ධාතුය, නානා ධාතු ලොකය** යනාදී වශයෙන් පන්තිසක් (35) පමණ ධාතුහු දක්වා තිබේ මේ සියලු පන්තිස් ධාතුහුම ඒ අටළොස් ධාතුන්හි ඇතුළත් වේ.

චන්ද්‍රභා සූර්‍ය්‍යාභාදී භාස්වර වර්ණ සඞ්ඛ්‍යාත **ආභා ධාතු** තොමෝ **රූප ධාතුවෙහිම** ඇතුළත් වේ. රාගයාගේ වස්තු භාවයෙන් ආකාර ග්‍රාහ්‍යයවූ සුභ නිමිත්ත සඞ්ඛ්‍යාත සුභ ධාතු තොමෝ රූපාදි ආලම්බනයන් පිළිබඳ වන්නීය. එහෙයින් සුභ නිමිත්ත **සුභ ධාතු** නම්. කුසල විපාක චිත්තොත්-පාදයන්ට අරමුණු වන හෙයින් මේ සුභ ධාතු තොමෝ රූපාදි මාත්‍රයක්මය. අකාසානඤ්චායතනාදි ධාතු සමූහ-යෙහි චිත්ත තෙමේ **මනොවිඤ්ඤාන ධාතු** නම්. අවශෙෂවූ සහජාත ධර්මයෝ තුමූ **ධම්ම ධාතු** නම්. සඤ්ඤාවෙදයිත නිරොධ ධාතු තොමෝ වනාහි පරමාර්ථ වශයෙන් නැත. එය මනොවිඤ්ඤාන ධාතු, ධර්ම ධාතු යන ධාතුවයාගේ නිරුද්ධ කිරීම් මාත්‍රයක්මය.

තවද, **කාමධාතු** තොමෝ ධර්මධාතු මාත්‍රයෝක්ම වේ. යට අවීචි නිරයත්, උඩ පරනිර්මිත වසවර්ති දෙව්ලොවත් ඇතුළත් කොට මේ අතරෙහි පවත්නාවූද, හැසිරෙන්නා-වූද, ඇතුළත්වූද යම් **සකන්ධ ධාතු, ආයතන** කෙනෙක් ඇද්ද, යම් රූප, වෙදනා, සංඥා, සඞ්ඛාර, විඤ්ඤාණයෙක් වේද, මේ ධර්ම සමූහය තෙම කාම ධාතු යයි කියනු ලැබේ.

**නෙක්ඛම්ම ධාතු** තොමෝ ධර්ම ධාතුව මැයි. සියලුම කුසල ධර්මයෝ **නෙක්ඛම්ම ධාතු** නම්.

**ව්‍යාපාද ධාතු, විහිංසා ධාතු, අව්‍යාපාද ධාතු, අවිහිංසා ධාතු, සුඛ ධාතු, දුක්ඛ ධාතු, සොමනස්ස ධාතු, දොමනස්ස ධාතු, උපෙක්ඛා ධාතු, අවිජ්ජා ධාතු, ආරම්භ ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු** යන මොවුහු ධර්ම ධාතු තොමෝ මැයි. හෙවත් **ධර්ම** ධාතුවෙහිම ඇතුළත් වෙත්. **හීන ධාතු, මජ්ඣිම ධාතු, පණීත ධාතුහු** අටළොස් ධාතු මාත්‍රයෙක්මය. ලාමකවූ චක්ඛුරාදීහු **හීන ධාතු** නම්.

මධ්‍යමවූ චක්ෂුරාදීහු **මජ්ඣිම ධාතු** නම් ප්‍රණීතවූ චක්ෂුරාදීහු **ප්‍රණීත ධාතු** නම්. තවත් ක්‍රමයෙකින් අකුසල්වූ ධර්ම ධාතු, මනො විඥාන ධාතුහු **හීන ධාතු** නම්. ලෞකිකවූ කුසල අව්‍යාකෘත වූ උභය ධර්ම ධාතු මනො විඥාන ධාතුහුද චක්ෂුර් ධාතු ආදිහුද **මධ්‍යම ධාතු** නම්. ලොකොත්තරවූ ධර්ම ධාතු මනො විඥාන ධාතුහු වනාහි **ප්‍රණීත ධාතු** නම්.

**පඨවි, තෙජො, වායො** යන ධාතුහු තුන් දෙන **ඵොට්ඨබ්බ ධාතු** තොමෝයි. **ආපො ධාතු, ආකාශ ධාතු** යන දෙදෙන ධර්ම ධාතුවෙහිම ඇතුළත්ය. **විඤ්ඤාණ ධාතු** තොමෝ චක්ෂුර් විඥානාදීවූ සපත විඥාන ධාතුන්ගේ සඞ්ග්‍රහයෙක්මය. ධම්ම ධාතුයෙහි **එක්** කොටසක් හා ඉතිරි සොළොස් ධාතුහුද **සඞ්ඛත ධාතු** නම්. **අසඞ්ඛත ධාතු** තොමෝ වනාහි ධර්ම ධාතුවෙන් **එක්** දෙශයක්මය **අනෙක ධාතු ලොක** තෙමේ වනාහි අටළොස් වැදෑරුම් ධාතුන්ගේ ප්‍රභෙද මාත්‍රයෙක්මය. මෙසේ මේ සියලුම ධාතූන්, අටළොස් ධාතුන්හි ඇතුළත් වන බැවින් ධාතුහු අටළොසක් කොට වදාරන ලදී.

තවද, ආලම්බන විජානන සවභාව ඇත්තාවූ විඥානයෙහි ජීව සංඥා ඇත්තාවූ පුද්ගලයන්ගේ සංඥා විපර්‍යාසය ප්‍රහීණ කිරීම පිණිස ධාතුහු අටළොසක්ම වදාළහ. චක්ඛු විඥාන, සොත විඥාන, ඝාණ විඥාන, ජිව්හා විඥාන, කාය විඥාන යන විඥාන ධාතුහුද මනො ධාතුය, මනො විඥාන ධාතුය යන මොවුන්ගේ ප්‍රභෙද වශයෙන් ඒ විඥානයාගේ අනෙකත්වයද චක්ෂු ප්‍රසාද රූපාලම්බනාදී වූ ප්‍රත්‍යයන් අයත් පැවතුම් ඇති බැවින් අනිත්‍ය භාවයද ප්‍රකාශ කොට, දීර්ඝ කාලයක් මුළුල්ලෙහි සන්තානයෙහි ප්‍රවෘත්තවූ ජීවයෙක යන සංඥාව සමූලඝාතනය කරණු කැමැති හෙයින් මෙසේ වදාළ බව දතයුතු **සංඛ්‍යා වශයෙන්** වනාහි **චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, රූප, ශබ්ද, ගන්ධ, රස** යන ධාතුහු එක් එක් ධර්මයෙක නියා ව්‍යවහාරයට යෙත්.

**ඵොට්ඨබ්බ ධාතු තොමෝ පඨවි, තෙජෝ, වායෝ** යන මොවුන්ගේ වශයෙන් ධර්මයෝ තුනෙකැයි ව්‍යවහාරයට යේ

**චක්ඛුර් විඤ්ඤාන ධාතු තොමෝ** කුසල විපාක අකුසල විපාකයන්ගේ වශයෙන් ධර්මයෝ **දෙදෙනෙකි.**

**සොත, ඝාන, ජිව්හා, කාය විඤ්ඤාන** ධාතුහු ඒ චක්ඛුර්-විඤ්ඤාන ධාතුව මෙන් ධර්මයෝ **දෙදෙනෙක්** වෙති.

**මනොධාතු තොමෝ, පඤ්චද්වාරාවජ්ජන, කුසල විපාකසම්පටිච්ඡන අකුසල විපාක සම්පටිච්ඡනයන්ගේ** වශයෙන් ධර්මයෝ තිදෙනෙක.

**ධම්මධාතු තොමෝ, වෙදනා, සංඥා, සංස්කාර** යන **ත්‍රිවිධ නාමස්කන්ධයන්ගේද, සොළොස්විධවූ සූක්ෂම රූප යන්ගේද අසංඛත ධාතුවගේ ද** වශයෙන් විංශති (20) ධර්ම කෙනෙකි.

මනොවිඤ්ඤාණධාතු තොමෝ අවශෙෂවූ **කුසලචිත්ත, අකුසලචිත්ත, අව්‍යාකෘත චිත්තයන්** ගේ වශයෙන් සැත්තෑ (76) ධර්ම **කෙනෙක්** වේ.

**විශෙෂ වශයෙන්** වනාහි මේ අටළොස් ධාතූන් අතුරෙහි **චක්ඛුර්ධාතු තොමෝ** බෙරතලයක් මෙන් දත යුත්තීය. **රූපධාතු තොමෝ** කඩිප්පුව හෙවත් **දණ්ඩ** මෙන් දතයුත්තීය **චක්ඛුර් විඤ්ඤාන ධාතු තොමෝ** ශබ්දය මෙන් දත යුත්තීය.

එපරිද්දෙන්ම, **චක්ඛුර්** ධාතු **තොමෝ** දර්පණ තලය මෙන්ද, **රූපධාතු** තොමෝ මුහුණ මෙන්ද, **චක්ඛුර් විඤ්ඤාන** ධාතු තොමෝ මුව සටහන මෙන්ද දත යුත්තීය.

එසේම **චක්ඛුර්** ධාතු **තොමෝ** උක්තල මෙන්ද. **රූප** ධාතු තොමෝ යන්ත්‍ර චක්‍රයාගේ යෂ්ටිය මෙන්ද, **චක්ඛුර් විඤ්ඤාන** ධාතු තොමෝ උක්රස තෛලයන් මෙන්ද දත **යුත්තීය.**

එමෙන්ම, **චක්ෂුර්** ධාතු **තොමෝ** යට ගිනිගාන දඬුකඩ මෙන්ද, **රූප** ධාතු **තොමෝ** උඩ ගිනිගාන දඬුකඩ මෙන්ද, **චක්ෂුර් විඥාන** ධාතු තොමෝ අග්නිය මෙන්ද දතයුත්තීය.

**ශ්‍රොත** ධාතු ආදීන්හිද මෙකී නය බඳු නය ඇත්තේය

**මනො ධාතු තොමෝ** ලැබෙන පරිද්දෙන් චක්ෂුර් විඥාන ධාතු ආදීන්ගේ පෙරගමන් ගන්නකු මෙන්ද, පසු ගමන් ගන්නකු මෙන්ද දතයුත්තීය.

**ධම්ම ධාතුවෙහි, වෙදනාස්කන්ධය** තෙමේ ශල්‍යයක්හු මෙන්ද, හුලක් මෙන්ද දතයුතු. **සංඥාස්කන්ධ, සංස්කාර ස්කන්ධයෝ** තුමූ වෙදනා සංඛ්‍යාත ශල්‍ය ශූලයන් හා යෙදීම් හෙතුවෙන් ගිලන් බැව්හු මෙන් දතයුත්තාහ.

පෘථග්ජනයන්ගේ **සංඥාතොමෝ** ආශා විනාශ දුක්ඛය උපදවන හෙවත් රික්ත හස්ත මුෂ්ටිය මෙන් දත යුත්තීය. වරදවා අරමුණු ගන්නා හෙයින්, හෙවත් ඇති සැටි නිමිති නොගන්නා හෙයින් වන මුවකු මෙන්ද දතයුත්තීය.

**සංස්කාරයෝ** තුමූ ප්‍රතිසන්ධියෙහි බහාලන හෙයින් සහළුගුරු වළෙක්හි බහාලන්නාවූ පුරුෂයෙක්හු මෙන්ද, පිළිසිඳගැනීම යයි කියනලද ජාති දුක්ඛයෙන් ලුහුබැඳ පවත්නා හෙයින්, රාජපුරුෂයන් විසින් ලුහුබැඳ ගන්නාලද සොරුන් මෙන්ද, සියලු අනර්ථය එලවන්නාවූ ස්කන්ධ පටිපාටියගේ හේතුව වන හෙයින් විෂ වෘක්ෂ බීජයන් මෙන්ද, දත යුත්තාහ.

**රූපය තෙමේ** නානාප්‍රකාර උපද්‍රවයන්ට නිමිත්ත වන හෙයින් ක්ෂුරචක්‍රයක් මෙන් දතයුතු

**අසංඛත** වූ **නිර්වාණ ධාතු තොමෝ** වනාහි අමෘත හෙවත් මරණ රහිත වශයෙන්ද, ශාන්ත වශයෙන්ද, **ක්ෂෙම** හෙවත් නිර්භය වශයෙන් ද දත යුත්තීය.

**මනොවිඥාන** ධාතු **තොමෝ** තමා විසින් ගත් අරමුණු මුදදා, අන් අරමුණක් ගෙනම පවත්නා හෙයින්, කැලෑ වඳුරකු මෙන්ද, දමනය නොකළ හැකි හෙයින් නැහැඹු අසකු මෙන්ද, යම්කිසි අරමුණෙක්හි සිත්සේ හැසිරෙන හෙයින් අහසට දමාලූ දඬු කඩක් මෙන්ද, ලොභ ද්වෙෂාදී නානාප්‍රකාර ක්ලෙශයන් හා යුක්තවන හෙයින් නැටුම් ගත් නළුවකු මෙන්ද දත යුත්තීය.

# චතුරාර්‍ය සත්‍ය ධර්ම

1. **දුක්ඛාර්‍ය සත්‍යය**
2. **දුක්ඛ සමුදයාර්‍ය සත්‍යය**
3. **දුක්ඛ නිරෝධාර්‍ය සත්‍යය**
4. **දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදාර්‍ය සත්‍යය**

මේ චතුස්සත්‍ය ධර්මයට **ශාසනක්කම** යයිද ව්‍යවහාර කෙරෙති.

මේ දේශනා පද සමූහය **කරණකොටගෙන** භාග්‍යවතුන් වහන්සේ විසින් වෛනෙය ජනයෝ අනුශාසනය කරණු ලැබෙත්ද, එහෙයින් ඒ දේශනා පද සමූහය **ශාසන** නම් වූ ම් දේශනාවක් තොමෝ චතුරාර්‍ය සත්‍යයන්හි පවතීද, එහෙයින් ඒ දේශනා තොමෝ **ශාසනක්කම** හෙවත් **ශාසන ක්‍රම** නම් වේ. එසේම **ශීල, සමාධි, ප්‍රඥා** යන ධර්මත්‍රයාගේ විෂයස්ථානය වූ චතුස්සත්‍යය තෙම **ශාසන ක්‍රම** නමි.

## චතුරාර්‍ය සත්‍යයන්ගේ අර්ථ විභාගය

**දුක්ඛ සත්‍යයාගේ** අර්ථ සතරෙකි. එනම්:

1. **පීළනාර්ථය**
2. **සංඛතාර්ථය**
3. **සන්තාපාර්ථය**
4. **විපරිණාමාර්ථය**

**පීලනාර්ථය.** දුක්ඛ දුක්ඛ භාවයෙනුදු, දුක්ඛ දුක්ඛයට නිමිත්ත භාවයෙනුදු අනිෂ්ට භාවය **පීලනාර්ථය** නම්. නොහොත් දුක්ඛසමඞ්ගී පුද්ගලයාගේ පීඩාවම **පීඩනාර්ථය** නම්.

**සංඛතාර්ථය.** ප්‍රත්‍යයන් එක්ව සකස්කරනලද බැවින් **සඞ්ඛතාර්ථය** නම්.

**සන්තාපාර්ථය.** දුක්ඛ දුක්ඛ භාවයෙනුදු, දුක්ඛ දුක්ඛයට නිමිත්ත භාවයෙනුදු හාත්පසින් තවනු ලැබීම නොහොත් රාගාදී ක්ලෙශදහ සම්ප්‍රයොගයෙන් අතිශයින් තැවීම **සන්තාපාර්ථය** නම්.

**විපරිණාමාර්ථය.** ප්‍රකෘතියගේ අන්‍යතාත්වය **විපරිණාමාර්ථය** නම්.

**දුක්ඛ සත්‍යයාගේ** මේ දුක්ඛාර්ථයෝ **තථය** හෙවත් තත් සවභාවයහ - හෙවත් දුක්ඛාදී සවභාවයමයි. එසේම **අවිතථය** හෙවත් නිබොරුය. **අනඤ්ඤථය** හෙවත් අන්‍යාකාර රහිතය. අන් පරිද්දෙකින් නොවන්නාහ

**සමුදය සත්‍යයාගේ** අර්ථ සතරෙකි එනම්:

1. **ආයුහනාර්ථය**
2. **නිදානාර්ථය**
3. **සංයොගාර්ථය**
4. **පළිබොධාර්ථය**

**ආයුහනාර්ථය.** ඒ ඒ භවයන්හිද, ඒ ඒ ආලම්බනයන්හිද ආයූ නම්වූ දුක් **උපහනය කිරීම** හෙවත් **රැස් කිරීම** දුක් සැපයීම සමුදය සත්‍යයාගේ **ආයූහනාර්ථය** වේ.

**නිදානාර්ථය.** ඒ ඒ දුකයයි ඇර පාන්නාක් මෙන් දුක් ඉපදවීමට මූල කාරණය වූ හෙයින් **නිදානාර්ථය** වේ.

**සංයොගාර්ථය.** සංසාර වෘත්ත දුක්ඛයෙහි සත්ත්වයා මනා කොට යෙදවීම කරන හෙයින් **සංයොගාර්ථය** වේ.

**පළිබොධාර්ථය.** මාර්ග ඵල නිවාරණය කරන හෙයින් වළක්වන හෙයින් පළිබොධාර්ථය වේ.

චතුර්විධවූ, සමුදය සත්‍යයාගේ මේ සත්‍යාර්ථයෝ **තථය** හෙවත් - එම ස්වභාවමය. **අවිතථය** හෙවත් එම ස්වභාවයෙන් වෙනස් නොවේ **අනඤ්ඤථය** හෙවත් අන්‍යාකාර රහිතය, අන් පරිද්දෙකින් නොවත්නාහ.

**නිරොධ සත්‍යයාගේද** අර්ථයෝ සතරෙකි. එනම්:

1. **නිස්සරණාර්ථය** 3. **අසඞ්ඛතාර්ථය**
2. **විවෙකාර්ථය** 4. **අමතාර්ථය**

**නිස්සරණාර්ථය.** සංසාර වෘත්ත දුඃඛයෙන් නිර්ගමනයයි කියනලද නිස්සරණාර්ථය නොහොත් සංසාර වෘත්ත දුඃඛයෙන් සත්ත්වයන්ගේ නිදහස්වීමට නිමිත්තවූ හෙයින් නිරොධ සත්‍යයාගේ **නිස්සරණාර්ථය** වේ.

**විවෙකාර්ථය.** සමුදය ක්ෂය කිරීම් වශයෙන් සමුදය කෙරෙන් වෙන්වීම **විවෙකාර්ථය** නම්.

**අසඞ්ඛතාර්ථය.** ප්‍රත්‍යයන් එක්ව නොසකස් කළ බව අසඞ්ඛතාර්ථය නම්.

**අමතාර්ථය.** මරණ රහිත බව, අමතාර්ථය නම්.

**මාර්ග සත්‍යයාගේද** අර්ථයෝ සතරෙකි. එනම්:

1. **නීයාණාර්ථය** 3. **දස්සනාර්ථය**
2. **හෙත්වාර්ථය** 4. **ආධිපත්‍යාර්ථය**

**නීයාණාර්ථය.** සංසාරයෙන් නිර්ගමනය කිරීම හෙවත් සසරින් එතර කිරීම මාර්ග සත්‍යයාගේ **නීයාණාර්ථය** වේ.

**හෙත්වාර්ථය.** පරිරොධ ධර්ම සමූලඝාතනය කිරීම් වශයෙන් නිර්වාණාධිගමයට නිවණට නිමිත්ත භාවය වන බව **හෙත්වාර්ථය** නම්.

**දස්සනාර්ථය.** මාර්ගය, තමා ප්‍රඥාව ප්‍රධානකොට ඇති බැවින් නිර්වාණයාගේ දර්ශනය නොහොත් චතුස්සත්‍ය **දර්ශනය දස්සනාර්ථය** නමි.

**ආධිපත්‍යාර්ථය.** චතුස්සත්‍ය දර්ශනයෙහිද කෙලශ දුක්ඛ සන්තාප ව්‍යපසමනයෙහිද, සම්ප්‍රයුක්ත ධර්මයන් විෂයෙහි අධිපති භාවය, **ආධිපත්‍යාර්ථය** නමි. විශෙෂ වශයෙන් මාර්ගාඞ්ග ධර්මයන්ගේ ආලම්බනාධිපත්‍යාර්ථ යයි.

මෙහි දක්වනලද නිරොධ සත්‍යයාගේ අර්ථයෝද, මාර්ග සත්‍යයාගේ අර්ථයෝද **තථය, අවිතථය, අනඤ්ඤථය.**

තවද **දුක්ඛ සත්‍යයාගේ** අර්ථ සතර අතුරෙන් **පීඩනාර්ථය** සවභාවයෙන්ම ප්‍රකාශවන ආකාරයයි.

සම්පිණ්ඩනය කරන්නාවූ සමුදය සත්‍යය දර්ශනයෙන් දුක්ඛ සත්‍යයාගේ **සංඛතාර්ථය** දක් වේ.

කෙලශ සන්තාප රහිතවූ මාර්ග සත්‍ය දර්ශනයෙන් දුක්ඛ සත්‍යයාගේ **සන්තාපාර්ථය** ප්‍රකාශ වේ

විපරිණාම සවභාවය නැත්තාවූ නිරොධ සත්‍ය දර්ශනයෙන් දුක්ඛ සත්‍යයාගේ **විපරිණාමර්ථයද** ප්‍රකාශ වේ.

**සමුදය සත්‍යයාගේ** චතුර්විධ අර්ථයන් අතුරෙන් **ආයූහනාර්ථය,** සවභාවයෙන්ම ප්‍රකාශවන ආකාරයයි.

රොග දර්ශනයෙන් රොග නිදානය ප්‍රකාශ වන්නාසේ දුක්ඛ සත්‍ය දර්ශනයෙන් සමුදය සත්‍යයාගේ **නිදානාර්ථය** ප්‍රකාශ වේ.

දුක්ඛ සංයොග රහිතවූ නිරොධ සත්‍ය දර්ශනයෙන් සමුදය සත්‍යයාගේ **සංයොගාර්ථය** දක්වේ.

සංසාර නියඝාණ සවභාවවූ මාර්ගසත්‍ය දර්ශනයෙන් සමුදය සත්‍යයාගේ **පලිබොධාර්ථය** ප්‍රකාශ වේ.

**නිරොධ සත්‍යයාගේ** අර්ථ චතුෂ්කය අතුරෙන් සියලු උපධි පරිත්‍යාග භාවයෙන් **නිස්සරණාර්ථය** ස්වභාවයෙන්ම ප්‍රකාශවන ආකාරයයි.

අවිවෙකීවූ සමුදය සත්‍ය දර්ශනයෙන් නිරොධ සත්‍යයාගේ **විවෙකාර්ථය** ප්‍රකාශ වේ.

නිවන් ලැබීමට හෙතුවුවද, ප්‍රත්‍යාධීන වෘත්ති ඇති මාර්ග සත්‍යයාගේ සඞ්ඛත භාවය දර්ශනයෙන් ප්‍රත්‍ය රහිතවූ නිරොධ සත්‍යයාගේ **අසඞ්ඛතාර්ථය** ප්‍රකාශ වේ.

මරණස්වභාවය ඇති බැවින් **නස්නාවූ** දුක්ඛ සත්‍යය දර්ශනයෙන් **අමරණ** ස්වභාවය වූ නිරොධ සත්‍යයාගේ **අමෘතාර්ථය** ප්‍රකාශ වේ.

**මාර්ග සත්‍යයාගේ** අර්ථ චතුෂ්කය අතුරෙන්

සංසාරයෙන් නිදහස්වීම යයි කියනලද **නිර්‍ය්‍යාණාර්ථය** ස්වභාවයෙන්ම ප්‍රකාශවන ආකාරයයි.

සමුදය සත්‍ය දර්ශනයෙන් නිර්වාණාධිගමයට මේ හෙතු නොවේ. මේ මාර්ගය වනායි නිර්වාධිගමයට හෙතු වේයයි මාර්ග සත්‍යයාගේ **හෙත්වර්ථය** ප්‍රකාශ වේ.

සූක්ෂම රූප දර්ශනයෙන් චක්ෂුස්හුගේ දර්ශනය ප්‍රකාශ වන්නාසේ පරම ගම්භීර වූ අති සූක්ෂම වූ දුර්දර්ශ වූ නිරොධ සත්‍ය දර්ශනයෙන් මාර්ග සත්‍යයාගේ **දර්ශනාර්ථය** ප්‍රකාශ වේ.

නානා රොගාතීවූ **කෘපණ** ජන දර්ශනයෙන් ඉසුරු මත් ජනයාගේ ඖදාර්‍ය්‍යය ප්‍රකාශ වන්නාසේ, දුක්ඛ සත්‍ය දර්ශනයෙන් මාර්ග සත්‍යයාගේ **ආධිපත්‍යාර්ථය** ප්‍රකාශ වේ.

**චතුස්සත්‍යයන්ගේ වචනාර්ථය**

**දුක්ඛ** - දු-යන්නෙන් නින්දිතාර්ථය දැක්වේ. ඛ - යන්නෙන් හිස්වූ අර්ථය ප්‍රකාශ වේ.

නොයෙක් උපද්‍රවයන්ගේ ප්‍රවෘත්තිස්ථාන වන හෙයින් නින්දිතය, ගර්හිතය, අන්ධ පෘථග්ජන සමූහයා විසින් කල්පනා කොට ගන්නාලද නිත්‍ය, සුභ, සුඛ, ආත්ම භාවයෙන් තොරවූ හෙයින් රික්තය, සිස්ය, එසේ නින්දිත බැවිනුදු, සිස් බැවිනුදු **දුක්ඛ** යයි කියනු ලැබේ.

**සමුදය – සං**– යන්නෙන් එක්වීම, ගැලපීම ප්‍රකාශ වේ. **උ** – ශබ්දයෙන් උත්පත්තිය ප්‍රකාශ වේ. **අය** – ශබ්දයෙන් හෙතුව පලවේ.

තමා කෙරෙන් අවශිෂ්ට වූ ප්‍රත්‍යයන් හා එක්වීමක් ගැලපීමක් ඇති කල්හි දුක්ඛයාගේ උත්පත්ති හෙතුව වේ එබැවින් දුක්ඛයාගේ ඉපදීමට කරුණු වන බැවින් **දුක්ඛ සමුදය** යයි වදාරන ලදී.

**නිරොධය–නි**– යන්නෙන් නාස්ති භාවය හෙවත් නැති බව දැක්වේ. **රොධ** ශබ්දයෙන් පැවැත්ම කියවේ.

මේ අසඞ්ඛත ධාතුව වූ නිර්වාණයෙහි සියලු ගතීන් කෙරෙන් ශූන්‍ය වූ බැවින් සංසාරයෙහි ප්‍රවෘත්තිය යයි කියන ලද හෙවත් සසර සැරිසැරීම යයි කියන ලද දුක්ඛ රොධයාගේ හෙවත් දුක්ඛ ප්‍රවෘත්තියගේ නොවීම වේද නොහොත් ඒ අසඞ්ඛත ධාතුව වූ නිර්වාණය පසක් කළ කල්හි ඒ සංසාර ප්‍රවෘත්ති සඞ්ඛ්‍යාත දුක්ඛ රොධයට ප්‍රතිපක්ෂ වන බැවින් සංසාරයෙහි ප්‍රවෘත්ති යයි කියන ලද හෙවත් සසර සැරි සැරීම යයි කියනලද දුක්ඛ රොධයාගේ නොවීම වේද, එහෙයිනුදු **දුක්ඛ නිරොධ** යයි කියනු ලැබේ. එසේම දුක්ඛයාගේ අනුත්පාදයම නිරොධයට ප්‍රත්‍ය වන බැවින් හෙවත් අනාගත භවාදීන්හි අප්‍රවෘත්තියට ප්‍රත්‍යවන බැවින් **දුක්ඛ නිරොධ** යයි කියනු ලැබේ

**දුක්ඛ නිරොධගාමිණී පටිපදා** – යම් හෙයකින් චතුස්සත්‍යය අරමුණු කිරීම් වශයෙන්, ඒ නිරොධ සත්‍යය ඉදිරිපත් කොට පැවති බැවින්, ඒ දුක්ඛ නිරොධය යයි

කියන ලද නිර්වාණයට යේද, දුක්ඛ නිරෝධ සඞ්ඛ්‍යාත වූ නිර්වාණයට පැමිණීහුගේ නොහොත් දුක්ඛ නිරෝධ සඞ්ඛ්‍යාත වූ නිර්වාණයට පැමිණීමට හෙතුවූ ප්‍රතිපදා තොමෝත් වේද, එහෙයින් **දුක්ඛ නිරොධ ගාමිණී පටිපදා තොමෝ** යයි කියනු ලැබේ.

**අරිය සච්ච** – යම් හෙයකින් වනාහි මේ චතුස්සත්‍යයන් බුද්ධාදි **ආර්‍ය්‍යයෝ** ප්‍රතිවේධය කෙරෙද්ද, එහෙයින් **අර්‍ය්‍ය සත්‍යයෝ** යයි කියනු ලැබෙත්.

යම් හෙයකින් තථාගතයන් වහන්සේගේ සත්‍යයෝ වෙත්ද, එහෙයිනුදු **ආර්‍ය්‍ය සත්‍යයෝ** වෙත්.

තථාගතයන් වහන්සේ විසින් මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන් මනාකොට දැන වදාළ බැවින් ආර්‍ය්‍ය භාවය සිද්ධවන හෙයිනුදු **ආර්‍ය්‍ය සත්‍යයෝ** නම් වෙත්.

අවිපරීත වූ සත්‍යයෝ වන හෙයින්ද **අර්‍ය්‍ය සත්‍යයෝ** නම් වෙත්.

මේ සත්‍යයෝ **තථය, අවිතථය, අනඤ්ඤථය** - එහෙයිනුදු **ආර්‍ය්‍ය සත්‍යයෝ** යයි කියනු ලැබෙත්.

**චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ ලක්ෂණාදි ප්‍රභේදය.**

## දුක්ඛ සත්‍යය

**බාධන ලක්ෂණය** – දුක්ඛදුක්ඛය, දුකට නිමිත්තය යයි කියන ලද පීඩාව ලක්ෂණකොට ඇත්තේය. නොහොත්, උදයව්‍යය දෙකින් පෙළණු ලැබීම ලක්ෂණකොට ඇත්තේය, නොහොත් පීඩා කරන ලක්ෂණ ඇත්තේය.

**සන්තාප රසය.** භවාදීන්හි, ජාති ආදි වශයෙන්ද නොයෙක් රෝගාදි වශයෙන්ද, නොයෙක් ආකාරයෙන් දුක්ඛයාගේ පැවත්ම වන හෙයින් පුද්ගලයා වැඩියක් තවන කෘත්‍ය හෙවත් රසය ඇත්තේය.

**පවත්ති පච්චුපට්ඨානා.** සංසාර මෝක්‍ෂ සඞ්ඛ්‍යාතවූ ප්‍රවෘත්ති නිවෘත්ති අතුරෙන් සංසාර ප්‍රවෘත්තියම හෙවත් සංසාර වෘත්ත දුක්ඛයෙහි නැවත නැවත පැවැත්මම වැටහීම්කොට ඇත්තේය.

## සමුදය සත්‍යය

**පභව ලක්‍ෂණය.** පෙර භවයෙන් පසු භවය ගළපනලදුව දුඃඛොත්පාදයට කාරණාවූ ලක්‍ෂණ ඇත්තේය.

**අනුපච්ඡෙදකරණ රසය.** නොකඩව හෙවත් නැවත නැවත දුක් උපදවන කෘත්‍යය ඇත්තේය.

**පළිබොධ පච්චුපට්ඨානය.** භව නිස්සරණයයි කියන ලද මාර්ගඥානය ආවරණය කරන බව, වැටහීම කොට ඇත්තේය.

## නිරොධ සත්‍යය

**සන්ති ලක්‍ෂණය.** රාගක්‍ෂය කිරීම් ආදි භාවයෙන් සියළු දුක් සන්සිඳීම ලක්‍ෂණකොට ඇත්තේය.

**අච්චුති රසය.** අච්චුති හෙවත් චුති රහිත බව කෘත්‍ය කොට ඇත්තේය.

**අනිමිත්ත පච්චුපට්ඨානය.** පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත නිමිත්තයා කෙරෙන් ශූන්‍ය බැවින් අශරීරවත් බව වැටහීම් කොට ඇත්තේය.

## මාර්ග සත්‍යය

**නීයාණ ලක්‍ෂණය.** අනුශය කෙලශයන් සමූලඝාතනය කිරීම් වශයෙන් සංසාර ප්‍රවෘත්තිය කෙරෙන් නික්මෙන උපාය භාවය ලක්‍ෂණ කොට ඇත්තේය.

**කිලෙසප්පහානකරණ රසය.** කෙලෙසුන් ප්‍රහාණය කිරීම කෘත්‍යය කොට ඇත්තේය.

**චුවඨාන පච්චුපට්ඨානය.** සමුදය හෝ පඤ්චුපාදාන ස්කන්ධය යයි කියනලද නිමිත්තයා කෙරෙන්ද දුක්ඛ යයි කියන ලද සංසාර ප්‍රවෘත්තිය කෙරෙන්ද මාර්ග චිත්තයාගේ නැගී සිටීමම වැටහීම් කොට ඇත්තේය.

තවද, මේ ආර්‍ය්‍ය සත්‍යයෝ සතර දෙනාගේ **පවත්ති, පවත්තක, නිවත්ති, නිවත්තක** වශයෙන් පිළිවෙළින් ලක්ෂණ සතරෙක් වේ. එනම් සංසාර දුක්ඛයාගේ පැවැත්ම, දුක්ඛ සත්‍යයාගේ ලක්ෂණයයි. සසර දුක පැවැත්වීම සමුදය සත්‍යයාගේ ලක්ෂණය වේ. සංසාර දුක්ඛයාගේ නිවෘත්තිය නිරෝධ සත්‍යයාගේ ලක්ෂණයයි. සංසාර දුක්ඛයාගේ නිවර්තකය මාර්ග සත්‍යයාගේ ලක්ෂණය වේ.

එසේම, **සඞ්ඛත, තණ්හා, අසඞ්ඛත, දස්සන** යයි ලක්ෂණ සතරෙක්ද වේ.

**සඞ්ඛත** නම් ප්‍රත්‍යයන් එකතුව සකස් කිරීමය එනම්, දුක්ඛ සත්‍යයයි. ආලම්බයෙහි ඇලෙන ස්වභාවය **තණ්හා** නම් එනම්, සමුදයාගේ ලක්ෂණයයි. ප්‍රත්‍යයන් එකතුව සකස් නොකිරීම **අසඞ්ඛත** නම්. එනම්, නිරෝධ සත්‍යයාගේ ලක්ෂණයයි. නිවන් දක්නා බව **දස්සන** නම්. එනම්, මාර්ග සත්‍යයාගේ ලක්ෂණයයි.

## සත්‍යාර්ථය

මේ චතුරාර්‍ය්‍යසත්‍යයන් නුවණැසින් බලන්නාවූ පුද්ගලයා හට ඉන්ද්‍රජාලික මායාවක් මෙන් විපරීත බව හෙවත් අර්ථය වෙනස් වීමක් නොවන්නේය. එසේම මිරිඟු දියක් මෙන් කිසිවක් නොලැබිය හැකි අභූතයෙක්ද නොවේ තීර්ථකයන්ගේ ආත්ම වාදයෙහි මෙන් පරමාර්ථ වශයෙන් නොලැබෙන්නාවූ ස්වභාවයකුදු නොවේ. එකාන්තයෙන්ම බාධන ලක්ෂණය, පභව ලක්ෂණය, සන්ති ලක්ෂණය, නීය්‍යාණ ලක්ෂණය යන සතරවිධ ලක්ෂණයෙන් යුක්තව, අවිතථාදි-භාවයෙන්ද, අනඤ්ඤථා භාවයෙන්ද, සත්‍ය භාවයෙන්ද ආය්‍ය්‍යයන්ගේ මාර්ගඥානයට ගොචර වූයේම වේ. මෙසේ සත්‍යාර්ථය දතයුතු.

**අනූනාධික** වශයෙන් සලකන කල්හි භාග්‍යවතුන් වහන්සේ විසින් **සතරකට** අඩු නොවූ, වැඩි නොවූ ආර්‍ය්‍ය සත්‍යය ධර්මයන් දෙශනා කිරීමට හෙතුව දතයුතු.

චතුස්සත්‍යයන් කෙරෙන් අන්‍යවූ සත්‍යයෙක් නැති බැවින්ද, එයින් එක් සත්‍යයක්වත් නොහළයුතු බැවින්ද, සතරක්ම වදාරන ලදී. එසේ තථාගතයන් වහන්සේ විසින් වදාළ දුක්ඛාර්‍ය්‍යසත්‍යය, දුක්ඛාර්‍ය්‍යසත්‍යය නොවේ යයි ද, අනිකක් දුක්ඛාර්‍ය්‍යසත්‍යය යයි ද, **පණවන්නට** සමත් මහණෙක් හෝ බමුණෙක් හෝ නැත්තේමය.

තවද, දුක්ඛසත්‍යය දක්වා වදාරන්නාවූ භාග්‍යවතුන් වහන්සේ සමුදය සත්‍යය සඞ්ඛ්‍යාත හෙතුව සහිතවූ දුක්ඛ සත්‍යය සඞ්ඛ්‍යාත **ප්‍රවෘත්තිය** දක්වා වදාළ සේක. එසේම නිරොධ සත්‍යය දක්වා වදාරන්නාවූ භාග්‍යවතුන්වහන්සේ මාර්ගසත්‍යය සඞ්ඛ්‍යාත උපාය සහිතවූ නිරොධ සත්‍යය සඞ්ඛ්‍යාත **නිවෘත්තිය** දක්වා වදාළ සේක. මෙසේ සංසාර දුක්ඛයාගේ පැවැත්මත්, නැවැත්මත් යන දුක්ඛ, නිරොධ සත්‍යයන් දෙසනා කරන්නාවූ භාග්‍යවතුන්වහන්සේ දුක්ඛයට හෙතුවත්, නිරොධ මාර්ගයත්, දක්වමින් ආර්‍ය්‍ය සත්‍යයන් සතරක්ම දෙසනා කළ සේක.

එසේම **පරිඤ්ඤෙය්‍ය** හෙවත් පිරිසිඳ දතයුතු වූ ධර්මයෝය, **පහාතබ්බ** හෙවත් ප්‍රහාණ කළයුතු ධර්මයෝය, **සච්ඡිකාතබ්බ** හෙවත් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්මයෝය, **භාවෙතබ්බ** හෙවත් භාවනා වශයෙන් වැඩියයුතු ධර්මයෝය යන මොවුන්ගේ වශයෙන්ද ආර්‍ය්‍ය සත්‍ය ධර්ම සතරක්ම වදාරණ ලදී.

එසේම **තණ්හාවත්ථු** හෙවත් තෘෂ්ණාවගේ **ආලම්බනය තණ්හාව, තණ්හා නිරොධ**, හෙවත් තෘෂ්ණාවගේ නිරොධය, **තණ්හා නිරොධූපාය** හෙවත් තෘෂ්ණා නිරොධයාගේ උපාය මාර්ගය යන මොවුන්ගේ වශයෙන්ද ධර්ම සතරක්ම වදාරන ලදී.

ඒ පරිද්දෙන්ම, **ආලය** හෙවත් පඤ්චකාම ගුණාදී දුක්ඛය, **ආලයරාමතා** හෙවත් පඤ්චකාම ගුණාදී දුක්ඛයෙහි ඇලීම් නම්වූ තෘෂ්ණාවය, **ආලයසමුග්ඝාත** හෙවත් තෘෂ්ණාවගේ සමූලඝාතනය, **ආලයසමුග්ඝාතුපාය** හෙවත් තෘෂ්ණාව සිඳලන්නාවූ උපාය මාර්ගය යන මොවුන්ගේ වශයෙන්ද ධර්මයෝ සතරදෙනෙක්ම දේශනා කරන ලදී.

## සත්‍ය ධර්මයන්ගේ දේශනා ක්‍රමය

ඖදාරික බැවින්ද, සියළුම සත්ත්වයන්ට සාධාරණ බැවින්ද, සුවසේ අවබෝධ කළහැකි බැවින්ද, **දුක්ඛසත්‍යය** පළමුකොට වදාරණ ලදී.

ඒ දුක්ඛසත්‍යයාගේ හෙතුව දක්වනු පිණිස එයට ඉක්බිතිව **සමුදය සත්‍යය** වදාළ සේක.

හෙතුවගේ නිරොධයෙන් ඵලයාගේ නිරොධය වේ යයි දක්වීම පිණිස, සමුදය සත්‍යයට අනතුරුව **නිරොධ සත්‍යය** වදාළ සේක.

අවසානයෙහි, ඒ නිරොධ සත්‍යාධිගමයාගේ උපාය සඞ්ඛ්‍යාත හෙතුව දක්වීම පිණිස **මාර්ග සත්‍යය** වදාළසේක.

තවද, කාම, රූප, අරූප යන තුන්භවයෙහි වූ සුඛයෙහි ආස්වාදයෙන් ඇලුනාවූ සත්ත්වයන්ට සංවේගය ඉපදවීම් පිණිස පළමුකොට **දුක්ඛ සත්‍යය** වදාරන ලදී,

ඒ දුක්ඛය තෙම, නොකරණලදුව නො ආයේය. ඊශ්වර නිර්මාණාදී හේතුවකින්ද නො ආයේය මේ සමුදය සඞ්ඛ්‍යාත හේතුවෙන්ම වේයයි දක්වීම පිණිස දුක්ඛසත්‍යයට අනතුරුව **සමුදය සත්‍යය** වදාළ සේක.

එයට අනතුරුව සමුදය සඞ්ඛ්‍යාත හේතු සහිතවූ දුක්ඛය විසින් මඩනාලද බැවින් කළකිරුණු සිත් ඇත්තෝ, දුකින් මිදීම යයි කියනලද නිවන් සැප සොයන්නවුන්ට දුකින් මිදීම දක්වීමෙන් සැනසීම ලබාදෙනු පිණිස **නිරොධ සත්‍යය** වදාළ සේක.

අවශානයෙහි නිරොධසත්‍යාධිගමය පිණිස නිවණට පමුණුවන්නාවූ මාර්ගය හෙවත් **මාර්ග සත්‍යය** වැදළු සේක

**සත්‍යඥාන.** සත්‍යඥානයෝ දෙදෙනෙකි. එනම්, **අනුබොධ ඥානය** හෙවත් **අනුශ්‍රවණාදීන්ගේ** වශයෙන් චතුරාර්‍යසත්‍යය දන්නා නුවණය. එනම්, පෘථග්ජන සන්තානයෙහි පැවති ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල චිත්ත යන් හා සහජාතවූ **ඥානයයි.**

**ප්‍රතිවෙධඥානය** - හෙවත් එකවර සිව්සස් පිරිසිඳ දන්නා නුවණය එනම්: මාර්ග චිත්ත සම්ප්‍රයුක්තවූ **ඥානයයි.**

මේ සත්‍යඥාන දෙදෙනා අතුරෙන් **අනුබොධඥානය** ලෞකිකය, අනුශ්‍රවණාදීන්ගේ වශයෙන් නිරොධ සත්‍යයෙහිද, මාර්ග සත්‍යයෙහිද අරමුණු කිරීම් වශයෙන් පවතී. **ප්‍රතිවෙධ ඥානය** ලොකොත්තරය. නිර්වාණය අරමුණුකොට දුක්ඛසත්‍යය පිරිසිඳ දැනීම, සමුදය සත්‍යය පහකිරීම, නිරොධ සත්‍යය සාක්ෂාත් කිරීමය, මාර්ග සත්‍යය වැඩීමය යන චතුර්විධවූ **කෘත්‍යයන්** ප්‍රතිවෙධය කරයි.

යම් ආර්‍ය පුද්ගලයෙක් දුක දකීද, හෙතෙම දුක්ඛයාගේ හේතුවද, දුක්ඛ නිරොධයද, දුක්ඛයාගේ නිරොධයට කාරණ වූ ප්‍රතිපදාවද දක්නේය.

චතුර්විධවූ **ලෞකික සත්‍ය ඥානයන්** අතුරෙන් **දුක්ඛ සත්‍යය** පමණක් අනුශ්‍රවණාදි වශයෙන් දන්නා ඥානය පරියුට්ඨාන අවස්ථාව මැඩපීම් වශයෙන් පවත්නේ විසි ආකාරවූ **සක්කායදෘෂ්ටිය** වළක්වයි.

**සමුදය සත්‍යය** පමණක් අනුශ්‍රවණාදි වශයෙන් දන්නා ඥානය **උච්ඡෙද දෘෂ්ටිය** වළක්වයි.

**නිරොධ සත්‍යය** පමණක් අනුශ්‍රවණාදි වශයෙන් දන්නා ඥානය **ශාශ්වත දෘෂ්ටිය** වළක්වයි.

**මාර්ග සත්‍යය** පමණක් අනුශ්‍රවණාදි වශයෙන් දන්නා ඥානය **අකිරිය දෘෂ්ටිය** වළක්වයි.

තවද, **දුක්ඛ සත්‍යය පිළිබඳ ඥානය නිත්‍ය, සුභ, සුඛ, ආත්මභාව** යන මෙයින් තොරවූ ස්කන්ධයන්හි **නිත්‍යභාව, ශුභභාව, සුඛභාව, ආත්මභාව** සංඥා යයි කියන ලද ඵලයෙහි වරදවා පිළිපැදීම් වළක්වයි.

**සමුදය සත්‍යයෙහි පැවති නුවණ** ඊශ්වර නිර්මාණ හේතුය, ප්‍රකෘති නම්ලද අව්‍යක්ත හේතුය, කාල හේතුය, ස්වභාව හේතුය යනාදී හේතු ශක්තීන් කරණකොටගෙන සත්ත්වයා පවත්නේයයි මෙසේ අහේතුවෙහි හේතුවකැයි අභිමාන වශයෙන් වරදවා පිළිපැදීම වළක්වයි.

**නිරෝධ සත්‍යයෙහි පැවති නුවණ** අරූපාවචර භූමිය, අසංඥ සත්ත්වය යනාදී භූමීන්හි සංස්කාර ධර්මයන් මෝක්ෂය යයි ගැනීම්වූ දුක්ඛයාගේ නිරෝධයෙහි වරදවා පිළිපැදීම වළක්වයි.

**මාර්ග සත්‍යයෙහි පැවති නුවණ** කාමසුඛල්ලිකානුයෝග, අත්තකිලමථානුයෝග වශයෙන් නොයෙක් ප්‍රභෙදවූ අනිර්වාණ මාර්ගයෙහි නිර්වාණාධිගමයට උපාය මාර්ගය යයි ලබ්ධි ගැනීම් වශයෙන් පැවති උපාය මාර්ග සඞ්ඛ්‍යාත හේතුවෙහි වරදවා පිළිපැදීම වළක්වයි.

මෙසේ යම්තාක් කල් සත්ත්ව තෙම සත්‍යයන් නොදනීද, ඒතාක් කල් සංස්කාර ලෝකයෙහිද, සංස්කාර ලෝකයාගේ හේතුවෙහිද, සංස්කාර ලෝකයාගේ නිරෝධයවූ නිර්වාණයෙහිද, ඒ නිර්වාණාධිගමයට උපාය මාර්ගයවූ හේතුවෙහි ද මූළාවේ.

## අන්තර්ගත ධර්ම

තෘෂ්ණාවත්, ආනාශ්‍රව ධර්මයනුත් හැර අවශෙෂවූ සියළු ත්‍රෛභූමික ධර්මයෝ **දුක්ඛ සත්‍යයෙහි** ඇතුළත්වේ.

කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා, වශයෙන් දෙළොස් ආයතනයන්හි සතිසක්වූ තෘෂ්ණාවෝ **සමුදය සත්‍යයෙහි** ඇතුළත් වේ.

**නිරොධ සත්‍ය**ය සංස්කාර ධර්ම කිසිවක් සමග මිශ්‍ර නොවේ.

**මාර්ග සත්‍යයෙහි** **වනාහි:—**

**සම්මා දිට්ඨියෙහි වීමංසිද්ධි පාද, පඤ්ඤින්ද්‍රිය පඤ්ඤා බල ධම්මවිචය සම්බොජ්ඣඞ්ග** යන ධර්මයෝද,

**සම්මා සඞ්කප්පයෙහි නෙක්ඛම්ම සඞ්කප්ප, අව්‍යාපාද සඞ්කප්ප, අවිහිංසා සඞ්කප්ප** යන ධර්මයෝද,

**සම්මා වාචායෙහි මුසාවාද විරති, පිසුණාවාච විරති, ඵරුසාවාච විරති, සම්ඵප්පලාප විරති** යන සතර වැදෑරුම් වාග් සුචරිත ධර්මයෝද,

**සම්මා කම්මන්තයෙහි පාණාතිපාත** විරති. **අදින්නා දාන** විරති, **කාමමිච්ඡාචාර** විරති යන ත්‍රිවිධවූ කාය සුචරිත ධර්මයෝද,

**සම්මා ආජීවයෙහි අප්පිච්ඡතා, සන්තුට්ඨිතා** යන ධර්ම යෝද ඇතුලත් වෙත්.

මේ සම්මාවාචා, **සම්මා** කම්මන්ත, සම්මා ආජීවයන්, **ආර්‍ය්‍යයන් විසින්** කැමැතිවන **ලද, ආර්‍ය්‍යයන්ට** ප්‍රියවූ **සිල්** බැවින්ද, සීලයද ශ්‍රද්ධා **හස්තයෙන් පිළිගත** යුතු වන බැවින්ද, ඒ ශ්‍රද්ධෙන්ද්‍රිය, ශ්‍රද්ධා බල, ඡන්දිද්ධිපාදයන් ඇති බැවින්ද ත්‍රිවිධ සීලය විද්‍යමාන හෙයින් **සද්ධින්ද්‍රිය, සද්ධා බල, ඡන්දිද්ධිපාද** යන ධර්මයෝ එහි ඇතුලත් වෙත්.

**සම්මාවායාමයෙහි සතර සම්‍යග් ප්‍රධානය, විරියින්ද්‍රිය, විරිය බලය, විරිය සම්බොජ්ඣඞ්ගය** යන ධර්මයෝ ඇතුළත් වෙත්.

**සම්මා සතියෙහි සතර සතිපට්ඨානය, සතින්ද්‍රිය, සති බලය, පීති සම්බොජ්ඣඞ්ගය** යන ධර්මයෝද,

**සම්මා සමාධියෙහි සවිතක්ක සවිචාරාදිවූ තුන් තුන් වැදෑරුම් වූ සමාධිහුද, චිත්ත සමාධි, සමාධින්ද්‍රිය, සමාධි බලය, පීති සම්බොධ්‍යඞ්ගය, පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය, සමාධි සම්බොධ්‍යාඞ්ගය, උපෙක්ඛා සම්බොධ්‍යඞ්ගය** යන ධර්මයෝද ඇතුළත් වෙත්.

**උපමා වශයෙන්:**

1. **දුක්ඛ සත්‍යය** බරක් මෙන්ද, **සමුදය සත්‍යය**, බර ගැන්මක් හෙවත් බර ඉසිලීමක් මෙන්ද, **නිරොධ සත්‍යය** බර බහා තැබීම මෙන්ද, **මාර්ග සත්‍යය** බර බහා තබන උපාය මෙන්ද දතයුතු.

2. **දුක්ඛ සත්‍යය** රොගයක් මෙන්ද, **සමුදය සත්‍යය** රොග නිධානයක් මෙන්ද, **නිරොධ සත්‍යය** රොග සංසිඳීමක් මෙන්ද, **මාර්ග සත්‍යය** බෙහෙතක් මෙන්ද දතයුතු.

3. **දුක්ඛ සත්‍යය,** දුර්භික්ෂයක් මෙන්ද, **සමුදය සත්‍යය** නියඟයක් මෙන්ද, **නිරොධ සත්‍යය සුභික්ෂයක්** මෙන්ද, **මාර්ග සත්‍යය** යහපත් වූ වැස්සක් මෙන්ද දතයුතු.

4 **දුක්ඛ සත්‍යය** සතුරෙකු මෙන්ද, **සමුදය සත්‍යය** වෛරය මෙන්ද, **නිරොධ සත්‍යය** වෛරයාගේ සංසිඳීම මෙන්ද, **මාර්ග සත්‍යය** වෛරය සංසිඳවන උපාය මෙන්ද දතයුතු.

5 **දුක්ඛ සත්‍යය**, විස රුකක් මෙන්ද, **සමුදය සත්‍යය** විස රුකෙහි මූල මෙන්ද, **නිරොධ සත්‍යය** විස රුකෙහි මූල විනාශය මෙන්ද, **මාර්ග සත්‍යය** විස රුක් මූල විනාශ කිරීමේ උපාය මෙන්ද දතයුතු.

6. **දුක්ඛ සත්‍යය** භයක් මෙන්ද, **සමුදය සත්‍යය** භයට හේතුව මෙන්ද, **නිරොධ සත්‍යය** නිර්භය භාවය මෙන්ද, **මාර්ග සත්‍යය** භය රහිත බවට පමුණුවන්නාවූ උපාය මෙන්ද දත යුතු.

7. **දුක්ඛ සත්‍යය** මෙතෙර මෙන්ද, **සමුදය සත්‍යය** සැඩ වතුර පාරක් මෙන්ද, **නිරොධ සත්‍යය** එතෙර මෙන්ද, **මාර්ග සත්‍යය** එතෙරට පමුණුවන වෑයම මෙන්ද උපමා වශයෙන් දතයුත්තාහ.

**චතුෂ්කය වශයෙන්—**

**දුක්ඛ සත්‍යය** පිළිබඳව නය සතරෙකි.

1. **ආර්‍ය්‍ය සත්‍යය නොවූ දුක්ඛය**
2. **දුක නොවූ ආර්‍ය්‍ය සත්‍යය**
3. **දුක්වූද, ආර්‍ය්‍ය සත්‍යයවූද ධර්මය**
4. **දුක් නොවූ ආර්‍ය්‍ය සත්‍යය නොවූ ධර්මය**

1. **ආර්‍ය්‍ය සත්‍යය නොවූ දුක්ඛය.** මාර්ගාඞ්ග ධර්මයන් හා එකුප්පාද, එකනිරොධ, එකාලම්බන, එකවත්ථුක වශයෙන් චතුර්විධ සම්ප්‍රයොග ලක්‍ෂණයෙන් යුක්තවූ චිත්ත චෛතසික ධර්මයෝද, චතුර්විධ ශ්‍රාමණ්‍ය ඵල චිත්තොත්පාදයෝද සංස්කාර දුක්ඛය වන බැවින් දුක් නම් වේ. නුමුත් දුක්ඛාර්‍ය්‍ය සත්‍යය නොවේ.

2. **දුක නොවූ ආර්‍ය්‍ය සත්‍යය.** නිර්වාණය හෙවත් දුක්ඛ නිරොධ, දුක නොවේ, නමුත් ආර්‍ය්‍ය සත්‍යයක්ම වේ.

3. **දුක්වූද, ආර්‍ය්‍යසත්‍යයවූද ධර්මය.** නිවණ හැර සමුදය මාර්ග සඞ්ඛ්‍යාත ආර්‍ය්‍ය සත්‍ය දෙක අනිත්‍ය භාවයෙන් දුක නම් වන්නේය. (යම් ආර්‍ය්‍ය සත්‍යයක් පිරිසිඳ දැනීම පිණිස බුදු සසුන් වැද, බ්‍රහ්මචර්‍ය්‍යය රකීද, ඒ සත්‍යයාගේ පරිච්ඡෙද්‍ය භාවයෙන් ආර්‍ය්‍යසත්‍ය නම් නොවේ) තණ්හාව හැර උපා-දානස්කන්ධ පඤ්චකයම දුක්ද වේ, ආර්‍ය්‍ය සත්‍යයද වේ.

4. **දුක් නොවූ, ආර්‍ය්‍යසත්‍යය නොවූ ධර්මය.** චතුර්විධ මාර්ග චිත්තයන්හි යෙදුනාවූ මාර්ගාඞ්ගයන් හා සම්ප්‍රයුක්තවූ චිත්තොත්පාද ධර්මයෝද, චතුර්විධ ශ්‍රාමණ්‍ය ඵල චිත්තොත්-පාදයෝද, යම් ආර්‍ය්‍ය සත්‍යයක් පිරිසිඳ දැනීම පිණිස බුදු

සසුන් වැද බඹසර රකිද්, ඒ සත්‍යයාගේ පරිඥෙය්‍ය කෘත්‍ය භාවයෙන් දුක්ද නොවන්නේය. ආය්‍යී සත්‍යයද නොවන්නේය.

**සමුදය සත්‍යය** පිළිබඳවද නය සතරෙකි.

1. **සමුදයවූ ආය්‍යී සත්‍යය නොවූ ධම්ය**
2. **සමුදය නොවූ ආය්‍යී සත්‍යය**
3. **සමුදයවූ ආය්‍යී සත්‍යය**
4. **සමුදය නොවූ ආය්‍යී සත්‍යය නොවූ ධම්ය**

**1. සමුදය වූ ආය්‍යී සත්‍යය නොවූ ධම්ය.** තෘෂ්ණාවෙන් ඉවත්වූ කෙලශයෝද, ඒ තෘෂ්ණාව හා සම්බන්ධවූ අවශෙෂවූ අකුසල චිත්තොත්පාදයෝද සමුදය නම් වේ. ආය්‍යීසත්‍ය නොවේ. ලෞකික කුසල චිත්තොත්පාදයෝද එයට ඇතුළත් වේ.

2. **සමුදය නොවූ ආය්‍යී සත්‍යය.** සමුදය නම් නොවූ **දුක්ඛ සත්‍යය** සමුදය නොවේ. ආය්‍යීසත්‍යය වේ.

3. **සමුදය වූ ආය්‍යී සත්‍යය.** තෘෂ්ණාව සමුදයත් වේ. ආය්‍යීසත්‍යයද වේ.

4. **සමුදය නොවූ ආය්‍යීසත්‍යය නොවූ ධම්ය.** මාග්‍ගී සම්ප්‍රයුක්ත ධම් සහ ශ්‍රාමණ්‍ය ඵල චිත්තොත්පාදයෝ සතරදෙන සමුදයත් නොවේ. ආය්‍යීසත්‍යයත් නොවේ.

**නිරොධ සත්‍යය** පිළිබඳවද නය සතරෙකි.

1. **නිරොධය වූ ආය්‍යීසත්‍යය නොවූ ධම්ය**
2. **නිරොධය නොවූ ආය්‍යීසත්‍යය**
3. **නිරොධයවූ ආය්‍යීසත්‍යය**
4. **නිරොධය නොවූ ආය්‍යීසත්‍යය නොවූ ධම්ය**

1. **නිරොධය වූ ආය්‍යීසත්‍යය නොවූ ධම්ය.** සංස්කාර ධම්යන්ගේ ක්ෂණභංග නිරොධය, නිරොධ සමාපත්තිය යන මොව්හු නිරොධය වූ, ආය්‍යීසත්‍යය නොවූ ධම්යෝයි.

2. **නිරෝධය නොවූ ආර්‍යසත්‍යය** – දුක්ඛ, සමුදය, මාර්ග යන සත්‍යත්‍රය සාක්ෂාත් කිරීමේ කෘත්‍ය වශයෙන් නිරෝධසත්‍ය නොවේ. නමුත් ආර්‍ය සත්‍යයෝ වෙත්.

3. **නිරෝධය වූ ආර්‍යසත්‍යය** – නිර්වාණ ධර්මය නිරෝධ යත් වේ, ආර්‍යසත්‍යයත් වේ.

4. **නිරෝධය නොවූ ආර්‍ය සත්‍යය නොවූ ධර්ම** – මාර්ග සම්ප්‍රයුක්ත ධර්ම සහ ශ්‍රාමණ්‍ය ඵල චිත්තෝත්පාද ධර්මයෝද නිරෝධයත් නොවේ, ආර්‍යසත්‍යයත් නොවේ.

**මාර්ග සත්‍යය** පිළිබඳවද නය සතරෙකි.

1. **මාර්ගයවූ ආර්‍යසත්‍යය නොවූ ධර්ම**
2. **මාර්ගය නොවූ ආර්‍යසත්‍යය**
3. **මාර්ගයවූ ආර්‍යසත්‍යය**
4. **මාර්ගය නොවූ ආර්‍යසත්‍යය නොවූ ධර්ම**

1. **මාර්ගය වූ ආර්‍යසත්‍යය නොවූ ධර්ම** – ආර්‍ය මාර්ගාඞ්ගයන් කෙරෙන් අන්‍ය වූ මිථ්‍යා මාර්ගාඞ්ගයෝ මාර්ග වූ ආර්‍යසත්‍යය නොවූ ධර්ම වෙත්.

2. **මාර්ගය නොවූ ආර්‍යසත්‍යය** – දුක්ඛය, සමුදය, නිරෝධ යන සත්‍යත්‍රය භාවයිතව්‍ය හෙවත් වැඩීම් කෘත්‍යයෙන් මාර්ග නොවන හෙයින් මාර්ගය නොවූ ආර්‍ය **සත්‍යයෝ වෙත්.**

3. **මාර්ගය වූ ආර්‍යසත්‍යය** – ආර්‍ය මාර්ගාඞ්ගයෝ අටදෙන මාර්ගය වූ ද, ආර්‍යසත්‍ය වූ ද, ධර්මයෝ යි.

4. **මාර්ගය නොවූ ආර්‍යසත්‍යය නොවූ ධර්ම** – මාර්ග සම්ප්‍රයුක්ත ධර්ම සහ ඵල චිත්තෝත්පාදයෝ සතරදෙන මාර්ගත් නොවූ ආර්‍යසත්‍යයත් නොවූ ධර්මයෝ වෙත්.

**ශූන්‍යතා වශයෙන්** –

විඳියුතුවූ දුකෙක් ඇත. විඳියුතුවූ දුක්ඛයට පැමිණි හෙවත් දුක් විඳින්නාවූ කිසි පුද්ගලයෙක් හෙවත්

**වේදකයෙක්** නැත ක්‍රියාවක් ඇත ක්‍රියා සම්පාදකවූ කිසි පුද්ගලයෙක් හෙවත් **කාරකයෙක්** නැත දුක්ඛයාගේ ව්‍යුපසම සවභාවයක් හෙවත් දුක් සංසිඳීමක් ඇත. ව්‍යුපසම සවභාවයට පැමිණි කිසි පුද්ගලයෙක් හෙවත් **නිබ්බුතයෙක්** නැත. යායුතු මාර්ගයක් ඇත. ඒ මග යන්නාවූ කිසි පුද්ගලයෙක් හෙවත් **ගමකයෙක්** නැත.

මෙපරිද්දෙන්, **වෙදක** හෙවත් විඳින්නාවූ සත්ත්ව පුද්ගලයෙක් හෝ, **කාරක** හෙවත් කරන්නාවූ සත්ත්ව පුද්ගලයෙක් හෝ, **නිබ්බුත** හෙවත් නිවන් පත් සත්ත්ව පුද්ගලයෙක් හෝ **ගමක** හෙවත් නිවනට යන්නාවූ සත්ත්ව පුද්ගලයෙක් හෝ අවිද්‍යමාන බැවින් **වෙදක, කාරක, නිබ්බුත, ගමක** සත්ත්ව පුද්ගලාන්තරයන් කෙරෙන් ශූන්‍යහයි දතයුතු.

තවද, **දුක්ඛ සත්‍යය. සමුදය සත්‍යය** යන සත්‍ය දෙක **ධ්‍රුව** හෙවත් නිත්‍ය සවභාවය, **සුභ** හෙවත් සුභ සවභාවය, **සුඛ** හෙවත් සුඛ සවභාවය, **අත්ත** හෙවත් ආත්ම සවභාවය යන මොවුන් කෙරෙන් ශූන්‍යහ.

**නිරොධ සත්‍යය, ආත්ම** සවභාවයෙන් ශූන්‍යහ.

**මාර්ග සත්‍යය, ධ්‍රුව, සුඛ, ආත්ම** යන සවභාවයන් කෙරෙන් ශූන්‍යය.

තවද, **දුක්ඛ, සමුදය, මාර්ග** යන සත්‍යත්‍රය **නිරොධ සත්‍යය** කෙරෙන් ශූන්‍යහ.

**නිරොධ සත්‍යය දුක්ඛ, සමුදය, මාර්ග** සත්‍යයන් කෙරෙන් ශූන්‍යහ.

ඵලභූතවූ **දුක්ඛසත්‍යය** හෙතුභූතවූ සමුදය සත්‍යය කෙරෙන් ශූන්‍යහ.

ඵලභූතවූ **නිරොධ සත්‍යය** හෙතුභූතවූ මාර්ගසත්‍යය කෙරෙන් ශූන්‍යහ.

ඵලභූතවූ **දුක්ඛ, නිරෝධ** යන සත්‍යද්වය, හේතුභූතවූ **සමුදය, මාර්ග** සත්‍යයන් කෙරෙන් සූක්‍ෂ්ම.

**ඒකවිධාදි වශයෙන්,**

**දුක්ඛ සත්‍යය**

සියළුම දුක් සසර පැවැත්වීම් වශයෙන් **ඒකවිධ** වේ.

**නාම රූප** වශයෙන් **ද්විධ** වේ.

කාම, රූප, අරූප භවයන්හි උත්පත්ති භවයාගේ හෙද වශයෙන් **ත්‍රිවිධ** වේ.

සතර වැදෑරුම් ආහාරයන්ගේ හෙද වශයෙන් **චතුර්විධ** වේ.

පඤ්චුපාදානස්කන්ධයන්ගේ හෙද වශයෙන් **පඤ්චවිධ** වේ

**සමුදය සත්‍යය.**

සසර දුක් පැවැත්වීම් වශයෙන් **ඒකවිධ** වේ.

දිට්ඨි සම්ප්‍රයුක්ත, දිට්ඨි විප්‍රයුක්ත වශයෙන් **ද්විධ** වේ.

කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා වශයෙන් **ත්‍රිවිධ** වේ.

සතර මාර්ගයන් විසින් පහකළයුතු හෙයින් **චතුර්විධ** වේ.

ස්කන්ධ පඤ්චකයෙහි පවත්නා තණ්හාවගේ වශයෙන් **පඤ්චවිධ** වේ.

රූප තණ්හාදි ෂඩ්විධ ප්‍රභෙදයන්ගේ වශයෙන් **ෂඩ්විධ** වේ.

**නිරෝධ සත්‍යය,**

නිර්වාණය අසඞ්ඛත බැවින් **ඒකවිධ** වේ.

පර්‍යාය වශයෙන් සොපාදිශෙස, අනුපාදිශෙස යන ප්‍රභෙදයන්ගේ වශයෙන් **ද්විධ** වේ.

භවත්‍රය කෙරෙන් සංසිඳීම් වශයෙන් **ත්‍රිවිධ** වේ.

චතුර්විධ මාර්ගයෙන් පැමිණිය යුතු වන හෙයින් **චතුර්-විධ** වේ.

රූපාභිනන්දනාදී පඤ්චාභිනන්දනයන් කෙරෙන් ව්‍යුපසම වශයෙන් **පඤ්චවිධ** වේ.

රූප තණ්හාදි ෂඩ්විධ තෘෂ්ණාවන්ගේ ප්‍රහීන භෙද වශයෙන් **ෂඩ්විධ** වේ.

**මාර්ග සත්‍යය** වැඩියයුතු හෙයින් **එකවිධ** වේ.

**සමථ, විදර්ශනා** භෙද වශයෙන් **ද්විධ** වේ.

මාර්ගක්ෂණයේදී සමථ විදර්ශනා දෙක යුගනද්ධව පවතී. යමෙකුගේ **ප්‍රඥෙන්ද්‍රියය** අධිකවී නම් ඔහුගේ මාර්ගය **විදර්ශනා** නම්. යමෙකුගේ **සමාධින්ද්‍රිය** අධිකවී නම් ඔහුගේ මාර්ගය **සමථ** නම්

**සීලස්කන්ධ, සමාධිස්කන්ධ, ප්‍රඥාස්කන්ධ** යන ස්කන්ධ-ත්‍රයාගේ ප්‍රභෙද වශයෙන් **ත්‍රිවිධ** වේ.

**සම්මාවාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව** යන මාර්ගාඞ්ගයෝ තිදෙන **සීලස්කන්ධය** නම්.

**සම්මා වායාම, සම්මාසති, සම්මාසමාධි** යන මාර්ගා-ඞ්ගයෝ තිදෙන **සමාධිස්කන්ධය** නම්.

**සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්ප** යන මාර්ගාඞ්ගයෝ දෙදෙන **ප්‍රඥාස්කන්ධ** නම්.

**සීලස්කන්ධය** යනු විරති සීලයයි. සමාන ජාති වශයෙන් සම්මාවාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන තුන්දෙන එක් කොට සීලස්කන්ධය යයි සංග්‍රහ කරණ ලදී.

**සමාධිස්කන්ධය** නමින් දක්වෙන සම්මාවායාමාදි ත්‍රිවිධ මාර්ගාඞ්ගයන් අතුරෙන් **සමාධිය** තමාගේ ස්වභාව වශයෙන්ම ආලම්බනයෙහි පිහිටන්නට නොහැකි වේ. වීර්‍ය්‍ය

යෙන් අනුබල ලැබීම් වශයෙන් ස්මෘතියෙන් සිහිකිරීම් වශයෙන් උපකාර ලත් කල්හි අරමුණෙහි එකඟවීම් වශයෙන් පිහිටන්නට හැකි වේ. එයට උපමාවෙක් මෙසේයි.

සැණකෙළි පිණිස උයනට ගිය තුන් යහළුවන් අතුරෙන් එකෙක් මතාසේ මල් හටගත්තාවූ සපු ගසක් දැක අත ඔසවා මල් නෙලාගන්නට උත්සාහ කොට නො හැකිවූ බව දුටු දෙවන යහළුවා ඉදිරියට නැමී පිට දෙන්නේය. ඒ පළමු යහළුවා දෙවන යහළුවාගේ පිටෙහි සිට වෙව්ලන්නේ මල් නෙලාගන්නට නොහැකිව සිටින බව දුටු තුන්වන යහළුවා තමාගේ උරහිස එලවන්නේය, එවිට පළමු යහළුවා එක් යහළුවකුගේ පිටෙහි එක් පයක්ද අනික් යහළුවාගේ උර හිසෙහි දෙවන පයද තබා කැමැති පරිද්දෙන් මල්නෙලා ගෙණවුත් පැලඳ සැණකෙළි යෙහි යෙදෙන්නේය.

එපරිද්දෙන් එක්ව උයනට වන් තුන් යහළුවන් මෙන් එක්ව උපන් **සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි** යන **මාර්ගාඞ්ගත්‍රය** දත යුත්තාහ. මල් පිපි සල් ගස මෙන් **අරමුණ** දත යුත්තේය. අත ඔසවා මල් නෙලාගන්නට **නොහැකිවූ** යහළුවා මෙන් තමාගේ ප්‍රකෘති ශක්තියෙන් අරමුණෙහි එකඟව පිහිටන්නට අසමත් **සම්මා සමාධිය** දතයුතුයි. ඉදිරියට නැමී පිට දුන් දෙවන යහළුවා මෙන් **සම්මා වායාමය** දතයුතුයි. මෙසේ සම්මා වායාමයෙන් අනුබලදීම් කෘත්‍යයද, සම්මා සතියෙන් සමරණ කෘත්‍යයද සිදුකරන කල්හි සම්මා සමාධිය අරමුණෙහි එකඟව පිහිටන්නට සමත් වේ.

**ප්‍රඥාස්කන්ධය** වශයෙන් දක්වන ලද **සම්මා දිට්ඨි, සම්මා සඞ්කප්ප** යන මාර්ගාඞ්ගයන් දෙදෙනා අතුරෙන් **සම්මාදිට්ඨිය** තමාගේ ශක්තියෙන්ම **අනිත්‍යය, දුක්ඛය, අනාත්මය** යයි සංස්කාර ධර්ම සඞ්ඛ්‍යාත ආලම්බනය නිශ්චය කරන්නට අසමර්ථ වේ. විතර්කය විසින් පෙරළ පෙරළා දෙන කල්හි **නිශ්චය** කරන්නට සමත් වේ.

රන් කරුවෙක් කහවණුවක් අත්ලෙහි තබා හොඳ හැටි බලනු කැමති වූයේවී නමුත්, ඇසින්ම කහවණු පෙරළා දෙන්නට නොහැකි වේ. අතෙහි ඇඟිලි පුරුක් වලින් පෙරළ පෙරළා දෙන කල්හි සෑම ආකාරයක්ම බැලීමට හැකි වේ. එපරිද්දෙන්ම සම්මා දිට්ඨි නම්වූ ප්‍රඥාවද, තමාගේ ප්‍රකෘති සවභාවයෙන් අනිත්‍යාදි ලක්‍ෂණ වශයෙන් අරමුණ නිශ්චය කරන්නට අසමත් වේ. අරමුණට නගාලන ලක්‍ෂණ ඇති විතර්කයා විසින් අරමුණ පෙරළ පෙරළා දුන් කල්හි අරමුණ නිශ්චය කරන්නට සමත් වේ මෙසේ තුන් වැදෑරුම්වූ ශීල, සමාධි, ප්‍රඥා-සකන්ධයන්ගේ වශයෙන් මාර්ගය තෙම තුන් වැදෑරුම් වන බව දතයුතු.

**මාර්ගය** තෙම සෝවාන්, සකෘදාගාමි, අනාගාමි අර්හත් යන සතර මාර්ගයන්ගේ වශයෙන් **චතුර්විධ** වේ.

තවද, මේ **සතර සත්‍යයෝම** අවිපරීත වූ සත්‍යතාව යෙන්ද ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දතයුතු බැවින්ද, විශිෂ්ට-ඥානයෙන් දතයුතු බැවින්ද, **ඒකවිධය.** ලෞකික ලොකොත්තර වශයෙන්ද, සඞ්ඛත, අසඞ්ඛත භාවයෙන්ද **ද්විප්‍රකාර** වේ. සෝවාන් මාර්ග සඞ්ඛ්‍යාත **දර්ශනය** හා සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන මාර්ගත්‍රය සඞ්ඛ්‍යාත **භාවනා** යෙන්ද, ප්‍රහාතව්‍ය වශයෙන්ද, අප්‍රහාතව්‍ය වශයෙන්ද, ප්‍රහාතව්‍ය අප්‍රහාතව්‍ය නොවීම් වශයෙන්ද **ත්‍රිවිධ** වේ. **පරිඥෙය්‍ය, පහාතව්‍ය, සච්ඡිකාතව්‍ය, භාවෙතව්‍ය** ධර්මයන්ගේ වශයෙන් **චතුර්විධ** වේ.

**සභාග විසභාග වශයෙන්**

සියළුම සත්‍යයෝ අවිපරීත සත්‍ය භාවයෙන්ද, ආත්ම සවභාවයෙන් සූන්‍ය හෙයින්ද, ප්‍රතිවෙධයට දුෂ්කර වන හෙයින්ද, ඔවුනොවුන් සභාගය හෙවත් සමානය.

මේ චතුරාර්‍ය සත්‍යයේ සවලක්‍ෂණ ව්‍යවස්ථාන නම් වූ බාධක, ප්‍රභව, ශාන්ති, නියර්‍යාණ ලක්‍ෂණයන්ගේ වශයෙන් පිරිසිඳීමේදී විසභාගය හෙවත් අසමානය.

**දුක්ඛ සමුදය** සත්‍යයෝ දෙදෙන ඖදාරිකය. පීඩනාදි වශයෙන්ද, ආයූහනාදී **වශයෙන්ද,** මේ දුකය. මේ දුකට කාරණය යයි ඇති සැටි බැස ගැනීමට නොහැකිවන බැවින් ගම්භීරයහ එසේ ගම්භීර වන බැවින්ද, ලෞකික වන බැවින්ද, ආශ්‍රව සහිත බැවින්ද, සභාග හෙවත් සමාන ස්වභාවය ඇත්තාහ.

ඵලහේතුන්ගේ භෙදයෙන්ද, පරිඥෙයාදය ප්‍රහාතව්‍ය ධර්මයන්ගේ භෙදයෙන්ද විසභාග හෙවත් අසමාන ස්වභාවය ඇත්තාහ

**නිරොධ මාර්ග** යන සත්‍යයෝ දෙදෙන, ස්වභාවයෙන්ම ගැඹුරු වන බැවින්ද, අධිගමය දුෂ්කර හෙයින්ද, ලොකොත්තර වන බැවින්ද, ආශ්‍රව රහිත වන බැවින්ද සභාග හෙවත් සමාන ස්වභාව ඇත්තාහු වෙත්.

ආලම්බන ආලම්බනිකයන්ගේ භෙද වශයෙන්ද සාක්ෂාත් කළ යුතු, වැඩිය යුතු ධර්මයන්ගේ භෙද වශයෙන්ද, විසභාග හෙවත් අසමාන වෙත්.

**දුක්ඛ, නිරොධ** යන සත්‍යයෝ දෙදෙන ඵල වශයෙන් සලකනු ලබන හෙයින් සභාග වෙති. සඞ්ඛත, අසඞ්ඛත ධර්මයන්ගේ වශයෙන් විසභාග හෙවත් අසමාන වෙති.

**සමුදය, මාර්ග** යන සත්‍යයෝ දෙදෙන හේතු වශයෙන් සලකනු ලබන හෙයින් සභාගය, නියත අකුසල, නියත කුසලයන්ගේ වශයෙන් විශභාගය.

**දුක්ඛ, මාර්ග** යන සත්‍යයෝ දෙදෙන ප්‍රත්‍යයන් විසින් සකස් කළ හෙයින් සභාගය. ලෞකික ලොකොත්තර වශයෙන් විසභාග වෙත්.

**සමුදය, නිරොධ** සත්‍යයෝ දෙදෙන නෙවසෙක්ඛ නාසෙක්ඛ භාවයෙන් සභාගය. අරමුණු ගැනීම්, අරමුණු නොගැනීම් වශයෙන් අසමානය.

සංක්ෂෙප වශයෙන් චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ විභාග සට දක්වනලද ආකාරයෙන් දතයුතු. මෙතැන් සිට දුක්ඛාර්‍ය්‍ය සත්‍යාදීන්ගේ විස්තර දක්වනු ලැබේ.

## දුක්ඛාර්‍ය්‍යසත්‍යය

**දුක්ඛය** වනාහි නොයෙක් ප්‍රකාර ඇත්තේය. **එනම්:-**

1. **දුක්ඛ දුක්ඛය**
2. **විපරිනාම දුක්ඛය**
3. **සංස්කාර දුක්ඛය**
4. **ප්‍රතිච්ඡන්න දුක්ඛය**
5. **අප්‍රතිච්ඡන්න දුක්ඛය**
6. **පර්‍ය්‍යාය දුක්ඛය**
7. **නිෂ්පර්‍ය්‍යාය දුක්ඛය**

1. **දුක්ඛ දුක්ඛය** - කායික චෛතසිකවූ දුක්ඛ වේදනාවෝ, ස්වභාව වශයෙන්ද, නාම වශයෙන්ද, දුක වන බැවින් **දුක්ඛ දුක්ඛ** යයි කියනු ලැබේ.

2. **විපරිණාම දුක්ඛය** - කායචෛතසික වූ ද, අන්‍ය වූ ද, සුඛ වේදනාවෝ, ස්වභාවයෙන් දුක් නොවෙතත්, පෙරළීමෙන් දුක් ඉපදීමට හෙතුවන බැවින් **විපරිණාම දුක්ඛ** නම් වේ.

3. **සංස්කාර දුක්ඛය** - උපෙක්ෂා වේදනාව ද, මෙහි තොකී අනිකුදු ත්‍රෛභූමික සංස්කාරයෝද උදයව්‍යය සඞ්ඛ්‍යාත උත්පාද භඞ්ගත්වය විසින් පෙළන ලද බැවින් **සංස්කාර දුක්ඛය** නම් වේ.

4. **ප්‍රතිච්ඡන්න දුක්ඛය** හෙවත් **අප්‍රකට දුක්ඛය**- කන් කැක්කුම, දත් කැක්කුම, රාගයෙන් වූ සිත් තැවිල්ලය ද්වෙෂයෙන් වූ සිත් තැවිල්ලය යනාදී වූ කායික වූ ද, චෛතසික වූ ද ආබාධය, අසාම දැනගත යුතු බැවින් ද, ඊට හෙතුව අප්‍රකට බැවින්ද, **ප්‍රතිච්ඡන්න දුක්ඛය** නම් වේ.

5. **අප්‍රතිච්ඡන්න දුක්ඛය** හෙවත් **ප්‍රකට දුක්ඛය** - දෙතිස් කම්කටුලු ආදියෙන් හටගන්නා වූ පීඩාව, නොඅසාම දතහැකි බැවින්ද, ඒ දුකට හේතුව ප්‍රකට බැවින්ද, **අප්‍රතිච්ඡන්න දුක්ඛය** නම් වේ.

6. **පර්‍යාය දුක්ඛය** - දුක්ඛ දුක්ඛය හැර ඉතිරිවූ ජාත්‍යාදිවූ සියළුම දුක් සමූහය, ඒ ඒ දුකට කරුණු වන බැවින් **පර්‍යාය දුක්ඛ** නම් වේ.

7. **නිෂ්පර්‍යාය දුක්ඛය**- දුක්ඛ දුක්ඛය පමණක් නිෂ්පර්‍යාය දුක්ඛය නම් වේ. මෙසේ **සියළුම දුක්, පර්‍යාය දුක්ඛ, නිෂ්පර්‍යාය දුක්ඛ** යන දෙකෙහි ඇතුළත් වේ.

අභිධර්ම දේශනායෙහි දුක්ඛාර්‍යසත්‍යය දක්වන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දොළොස් පදයකින් දුක්ඛසත්‍යය වදාරා තිබේ. ඒ දොළොස නම්:-

1. ජාති දුක්ඛය
2. ජරා දුක්ඛය
3. මරණ දුක්ඛය
4. සොක දුක්ඛය
5. පරිදෙව දුක්ඛය
6. දුක්ඛ දුක්ඛය
7. දොමනස්ස දුක්ඛය
8. උපායාස දුක්ඛය
9. අප්‍රිය සම්ප්‍රයොග දුක්ඛය
10. ප්‍රිය විප්‍රයොග දුක්ඛය
11. කැමති දෙය නොලැබීම් සඞ්ඛ්‍යාත දුක්ඛය
12. සැකෙවින් පඤ්චුපාදානස්කන්ධ දුක්ඛය

සූත්‍ර දේශනාවන්හි බුදුරජාණන් වහන්සේ **දුක්ඛාර්‍ය-සත්‍යය** පද අටෙකින් දක්වා ඇත. එනම්:- **ජාති දුක, ජරා දුක, මරණ දුක, ව්‍යාධි දුක, අප්‍රියසම්ප්‍රයොග දුක,**

ප්‍රිය විප්‍රයොග දුක, පැතූ දෑ නොලැබීමේ දුක, පඤ්චුපාදනස්කන්ධ දුක යනුයි. මෙහි ව්‍යාධි දුක්ඛය යන්නෙන් කායිකවූද මානසික වූ ද ආබාධයෝ දක්වන ලදී. මනුෂ්‍ය ලොකයෙහි ව්‍යාධිය ප්‍රකට බැවින්ද සොක, පරිදෙව, දුක්ඛ, දෞමනස්ස, උපායාසයන් එහි ඇතුලත් වන බැවින්ද මෙසේ ව්‍යාධි දුක්ඛය දක්වා වදාරා තිබෙන බව දතයුතු. දෙවියන් කෙරෙහි ව්‍යාධිය අප්‍රකට බැවින් ව්‍යාධිය අත්හැර සොක, පරිදෙව, දුක්, දෞර්මනස්, උපායාසයන් දක්වන ලදී.

## ජාති දුක්ඛය

ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්ව සමූහයෙහි යම් ඉපදීමක්, සංජාතියක්, බැසගැන්මක්, විශෙෂ ඉපදීමක්, ස්කන්ධයන්ගේ පහළවීමක්, ආයතනයන්ගේ ප්‍රතිලාභයක් වේද මෙය ජාති යයි කියනු ලැබේ

යම් සත්ත්වයෙකු පිළිබඳව යම් භවයෙක්හි පළමුව පටිසන්ධි විඤ්ඤාණයන් සහිතවූ පඤ්චස්කන්ධයන්ගේ පහළ වීමක් වේද, එය ඒ සත්ත්වයාගේ ජාතියයි ද, ඉපදීමයයි ද කියනු ලැබේ. මෙය සත්ත්වයන්ගේ සාමාන්‍ය ඉපදීම හෙවත් පිළිසිඳ ගැන්ම වේ සම්පූර්ණ ආයතනයන් ඇතිව, මොනවට ඉපදීමක් වේනම් එයට සංජාත යයි කියනු ලැබේ. මේ දෙයාකාරයෙන්ම අණ්ඩජාදි යොනි වශයෙන් සත්ත්වයන්ගේ ඉපදීම දක්වන ලදී.

අණ්ඩජ, ජලාබුජ වශයෙන් සත්ත්වයෝ අණ්ඩ කොෂයෙහිද, වස්ති කොෂයෙහිද පිළිසිඳගැනීම් වශයෙන් බැස ගැනීමක්, ප්‍රවෙශ වීමක් වේද එයට අවක්‍රාන්ති යයි කියනු ලැබේ.

සංසෙදජ, ඕපපාතික වශයෙන් සත්ත්වයන්ගේ යම් ප්‍රකටවූ පහළවීමක් වේද, එයට අභිනිබ්බත්ති හෙවත් විශෙෂ ඉපදීමකැයි කියනු ලැබේ.

මෙහි දක්වන ලද ජාති ආදිවූ ඉපදීම්, සම්මුති හෙවත් ව්‍යවහාර මාත්‍රයකි.

පරමාර්ථ වශයෙන් වනාහි, ස්කන්ධයන්ගේ පළමු පහළ වීමම **ජාති** නම්. මේ ස්කන්ධයන්ගේ පහළවීම එකවොකාර, චතුවොකාර, පඤ්චවොකාර භවයන්ගේ වශයෙන් වෙනස් වේ. එකවොකාර භවයෙහි එකම රූපස්කන්ධයකින් ද, චතුවොකාර භවයෙහි සතර නාමස්කන්ධයකින් ද, පඤ්ච වොකාර භවයෙහි නාම රූප හෙවත් පඤ්චස්කන්ධයකින්ද පහළවීම හෙවත් ඉපදීම වන්නේය.

ආයතනයන්ගේ ප්‍රතිලාභය වනාහි එකවොකාර භව- යෙහි හෙවත් අසංඥසත්ත්වයෙහි රූපායතන ධර්මායතන දෙදෙනාගේ වශයෙන්ද, චතුවොකාර භවයෙහි මනායතන ධර්මායතන දෙදෙනාගේ වශයෙන්ද, පඤ්චවොකාර රූප භවයෙහි උත්පත්තික්ෂණයෙහි චක්ඛු, සොත, මන, රූප, ධම්මායතන පස්දෙනාගේ වශයෙන්ද, පඤ්චවොකාර කාම ධාතුවෙහි ප්‍රතිසන්ධික්ෂණයෙහි අපරිපූර්ණ, පරිපූර්ණ ආයතන ඇති සත්ත්වයන්ට විකල අවිකල ඉන්ද්‍රියයන්ගේ වශයෙන් ඒ ඒ ආයතනයන්ගේ ප්‍රතිලාභය ද වන බව දතයුතු.

ඒ **ජාතිය** වනාහි ඒ ඒ භවයෙහි පළමුව ඉපදීම් ලක්ෂණ කොට ඇත්තීය. පළමු උපන් ආත්ම භාවය එළවාදීමක් බඳු **කෘත්‍යය** ඇත්තීය. පෙර භවයෙන් මේ වත්මන් භව යෙහි ස්කන්ධ සන්තතියගේම මතුවීම වැටහීම කොට ඇත්තීය. නොහොත් එලයාගේ වශයෙන් දුක්ඛ රාශියගේ විචිත්‍රතාවය වැටහීම කොට ඇත්තීය.

**ජාතියගේ දුක්ඛාර්ථය**

මේ ජාතිය හෙවත් ඉපදීමම දුක් නොවෙතත්, දුක්ඛ වේදනාවගේ උත්පත්තියට වස්තු හෙවත් කාරුණු වන බැවින් දුක් වන බව වදාරන ලදී. අපාය භූමියෙහි උපන් සත්ත්වයෝ ආඝාතක වූ අපාදුක් විඳිති. සුගති භවයක්වූ

මනුෂ්‍ය ලෝකයෙහි උපන් සත්ත්වයෝ ගර්භාවක්‍රාන්ති මූලික දුක්ඛාදී නොයෙක් ප්‍රභෙදවත්වූ දුක් විඳිති මේ සියලුම දුක්ඛයන්ට, ජාතියම හෙතු වෙයි.

මව්කුස උපදනා සත්ත්වයන්ගේ දුක් අතුරෙන් **ගර්භාවක්‍රාන්ති මූලක දුක්ඛය,** පළමුව විඳිනා දුක් නම් වේ. සත්ත්ව තෙම මව් කුස උපදනා කල්හි උපුල්, රත් පියුම්, හෙළ පියුම් ආදීන්හි නූපදී. ඒකාන්තයෙන්ම ගර්භයාගේ යට භාගයෙහි පක්වාශයාගේ මතුභාගයෙහි, අතුනු වැටි, පිටකටුවලට මැද තන්හි අතිශයින් අවහිරවූ, අපිරිසිදුවූ, දුගඳින් ගැවසුනු, වැඩියක් පිළිකුල් බව ඇත්තාවූ මව් කුසෙහි, කුණු මස්ය, පිළිනිවූ කුල්මාෂය, ගවරවළ යනාදී තන්හි පණුවකු මෙන් උපන්නාවූ ඒ සත්ත්ව තෙම, දස මසක් මුළුල්ලෙහි මව් කුස හටගත්තාවූ තෙජෝ ධාතුවෙන් තැවෙමින්, පිටි පිඩක් මෙන් පැසෙමින්, අත්පා ආදී අවයවයන්ගේ හැකිලීම් දිගු කිරීම් ආදියෙන් තොරව දැඩි දුකක් විඳියි. මෙයට **ගර්භාවක්‍රාන්ති මූලක දුක්ඛය** යයි කියනු ලැබේ මේ දුක්ඛය වනාහි අන් කිසිවෙක්හුගේ ප්‍රයොගයකින් තොරව මාතෘ ගර්භයෙහි පිළිසිඳ ගැනීම් හෙතුවෙන් වන්නාවූ දුක්ඛ යයි.

**ගර්භ පරිහරණ මූලක දුක්ඛය** හෙවත් ගර්භාරක්‍ෂාව නිදාන කොට ඇති දුක්ඛය- මව් කුස උපන් සත්ත්වතෙම, මව්ගේ පැකිළීමය, නැමය, හිඳීමය, නැගී සිටීමය, පෙරළීමය යනාදී ක්‍රියා විශෙෂයන්හි රාසොඬුන්ගේ අතට පත්වූ එළුවකු මෙන්ද, අහිකුණ්ඩිකයන්ගේ අතට පත්වූ සර්ප පැටවකු මෙන්ද, ඉදිරියට ඇදීමය, ඔබිමොබ ඇදීමය, යටිකුරුකොට සෙලවීමය, ඈත මෑත සෙලවීමය යනාදීවූ උපක්‍රමයෙන් ඉතා වැඩි දුකක් අනුභව කෙරේද, මවගේ ඇල්දිය බොන කල්හි ශීත නරකයෙහි උපන්නෙක්හු මෙන්ද, උණු කැඳ බත් ආදිය අනුභව කරණ කාලයෙහි සහළුගුරු වැස්සෙන් දැවෙන්නාක්හු මෙන්ද, ලුණු ඇඹුල් ආදිය අනුභව කරණ කාලයෙහි ශරීරය සැස කාරම් දිය

ඉස්නා **කම්කටුලට** පැමිණි පුරුෂයෙක්හු මෙන්ද දැඩිවූ යම් **දුකක්** විඳිද, එය **ගර්භපරිහරණමූලක** වූ හෙවත් **ගර්භාරක්‍ෂාව නිදානකොට ඇත්තාවූ දුක්ඛය** වේ.

**විජායන මූලක දුක්ඛය**- ප්‍රසවය **කරන්නාවූ** මවගේ **කර්මජ** වාතයෙන් පෙරළා නරක ප්‍රපාතයකට හෙළනු ලබන්නාක් මෙන්, වැඩියක් බිහිසුණුවූ යොනි මාර්ගයට හෙළනු ලබන්නාවූ පුද්ගලයා හට අතිශයින් අවහිර වූ යොනි මුව සිදුරෙන් පිටකරනු ලබන්නාවූ පුද්ගලයා හට, දොර යතුරු සිදුරකින් පිටකරනු ලබන හස්තියෙක් හට උපදනා දුක මෙන්ද, සඞ්ඝාත පර්වතයෙන් සුණු කරනු ලබන්නාවූ තිරි සතෙක් හට මෙන් යම් දුකෙක් උපදනේද, ඒ දුක්ඛය **විජායන මූලක දුක්ඛය** නම් වේ.

**බහිනික්ඛමණ මූලක දුක්ඛය**- අළුත උපන්නාවූ, අළුත හටගත් වණයකට බඳුවූ සියුමැලි සිරුර ඇත්තහුට **අතින්** ගැනීමය, නැහැවීමය, සේදීමය, පිළිකඩින් පිරිමැදීමය යන මේ ආදිය කරන කල්හිද හිඳිකටු පිහිතුඩු ආදියෙන් විදින පලන කාලක් බඳුවූ යම් දුකෙක් උපදීද එය මව් කුසින් පිටවීම නිදාන කොට ඇත්තාවූ **බහිනික්ඛමණ මූලක දුක්ඛය** නම් වේ.

**අත්තූපක්කම මූලක දුක්ඛය**- ප්‍රවෘත්ති කාලයෙහි තෙමේම, තමා **තසන්නාහටද**, අචේලක ව්‍රතාදී වශයෙන්, හිරු දිසාවට මුහුණ ලා පැවැත්මෙන් තැවීමය. ගිනිතෙන් තැවීමය යනාදියෙහි නැවත නැවත යෙදෙන්නාහටද, ක්‍රොධයෙන් අනුභව නොකරන්නාහටද, බෙල්ලෙහි වැලලා මිය යන්නා හටද, යම් දුකෙක් උපදිද එය **අත්තූපක්කම මූලක දුක්ඛය** හෙවත් ස්වකීය උපක්‍රම නිදාන කොට ඇත්තාවූ දුකයි.

**පරූපක්කම මූලක දුක්ඛය** අනුන් කෙරෙන් වධබන්ධනාදීන් විඳින්නා හට යම් දුකෙක් උපදීද, එය **පරෝපක්‍රම මූලක දුක්ඛය** හෙවත් අනුන්ගේ උපක්‍රම නිදාන කොට ඇත්ත වූ දුකයි.

ජාතිය මේ සියළු දුක්ඛයන්ටම හෙතු වේ. එහෙයින් මෙසේ වදාරන ලදී.

සත්ත්වතෙමේ නරකයන්හි ඉදින් නූපදී නම්, ඒ නරක යන්හි ගින්නෙන් දනු ලැබීම් ආදීවූ නොවැලක් විය හැකි දුකෙක් කොයින්ද? ජාතියගෙන් තොරව ඒ දුක්ඛයාගේ පිහිටීමක් පැවැත්මක් නැත්තේමය. මෙයින් නිරය ප්‍රති සන්ධිය දුකයයි වදාළසේක.

තිරිසනුන් කෙරෙහි, කසය, කැව්ටිය, දඬුය යන මෙයින් පහර ලත් කල්හි හටගන්නාවූ අනෙකප්‍රකාරවූ දුක්ඛයෙක් වේද, තිරිසන් භවයෙහි ඉපදීමක් නොවූ කල්හි කෙසේ නම් වන්නේද? නොවන්නේමය. මෙය තිරච්ඡාන ප්‍රතිසන්ධි දුක නම් වන්නේය.

ප්‍රෙතයන් විෂයෙහි ක්ෂුද පිපාසය, වාතය, සූර්‍ය සන්තා පය යනාදිවූ හෙතුවෙන් හටගත්තාවූ නානාප්‍රකාරවූ යම් දුක්ඛයෙක් වේද, ඒ දුක්ඛය ප්‍රෙතයන් විෂයෙහි නූපන්නහුට නැත්තේමය, මෙය ප්‍රේතාත්මභාව ප්‍රතිසන්ධි දුක්ඛය නම් වේ.

ඝනාන්ධකාරය ඇති සීතයෙන් නොවැළැක්විය හැක්කා වූ ලොකාන්තර්‍ය නරකයෙහිද, විනිපාත අසුරයන් විෂයෙහිද යම් දුක්ඛයෙක් උපදීද, ඒ ලොකාන්තරික නරක, විනිපාතික අසුරයන් විෂයෙහි ප්‍රතිසන්ධියක් නො-වන්නී නම්, ඒ දුක්ඛය නැත්තේමය. එයින්ද මේ ජාති සඞ්ඛ්‍යාත ප්‍රතිසන්ධිය දුක් වන්නීය.

ගූථ නරකයෙහි මෙන් මව් කුසයෙහි බොහෝ කලක් වාසය කරන්නාවූ සත්ත්ව තෙම ඒ මව් කුසින් බැහැර නික්මෙන්නේ යම් ගර්භාවක්‍රාන්ති මූලක, විජායන මූලකාදී වූ දුක්ඛයකට පැමිණේද, ඉතා දරුණුවූ මේ දුක්ඛයද පිළිසිඳ ගැන්මක් නැති කල්හි නොවේමය. එයින්ද මව් කුස පිළිසිඳීමද දුක් වන්නීය.

මේ සත්ත්ව ලෝකයෙහි කිසි තැනෙකත් යම්කිසි දුකෙක් ඇද්ද, ඒ දුක්ඛයද කිසි කලෙකත් ප්‍රතිසන්ධියෙන් වෙන්වීමක් ඇතිකල්හි නොමැත්තේය.

මෙසේ සියළු දුක්ඛ ධර්මයන්ට පලමුව ප්‍රතිසන්ධිය දුක් වන්නීයයි වදාළ සේක.

## ජරා දුක්ඛය

ඒ ඒ සත්ත්ව නිකායෙහි උපන්නාවූ ඒ ඒ සත්ත්වයන්ගේ යම් ජරාවක් ජීරණතා හෙවත් දිරණ බවක්, ඛණ්ඩිච්චං හෙවත් දත් නියපොත්තන්ගේ කැඩුණු බිඳුනු බවක්, පාලිච්චං හෙවත් කෙස ලොමයන්ගේ පැසුණු බවක්, වලිත්තචතා හෙවත් මස වියලීම් සම රැලිවැටීම් බවක්, ආයුෂයාගේ පිරිහීමක්, චක්ඛුරාදී ඉන්ද්‍රියයන්ගේ පරිපාක බවක් හෙවත් මිහිකිරීම් බවක් වේද එය **ජරාව** යයි කියනු ලැබේ

මෙහි ජරා යන පදයෙන් ජරාවගේ හෙවත් දිරීමේ ස්වභාවයද ජීරණතා යන්නෙන් ජරාවගේ ආකාරයද දක්වේ. ඛණ්ඩිච්චං යන පදයෙන් කල් ඇවෑමෙන් දත් හා නියපොත්තන්ගේ කැඩුනු වැටුනු බව ප්‍රකාශ වේ පාලිච්චං යන පදයෙන් කෙශ ලොමයන්ගේ පැසුනු බව කරන කෘත්‍ය පළවේ. වලිත්තචතා යන්නෙන් මාංසය වියලවා සමෙහි රැලි නගන කිස දක්වේ.

මේ ඛණ්ඩිච්චං, පාලිච්චං, වලිත්තචතා යන තුන් පද-යෙන් කල්යාමෙන් පවත්නා කෘත්‍යය දක්වනු ලැබේ මේ විකෘති ස්වභාවයට ප්‍රකට ජරාව යයිද කියනු ලැබේ.

ජලය, වාතය, ගින්න යන මොවුන් කරණකොටගෙන තෘණ වෘක්ෂාදීන්ගේ හාත්පසින් බිඳගිය බවක් හෝ අවටින් සිඳ බිඳ ගිය බවක් හෝ දැගිය බවක් හෝ ප්‍රකට වේද දිය සුලන් වැද බිඳ ගියාවූ, ගින්නෙන් දැගියාවූ ඒ මාර්ගීය තෙම, යම්සේ දිය, සුලං, ගිනිම නොවේද, එසේම දත් නිය ආදීන්

ගේ කැඩීම්, බිඳීම් ආදියෙන් ජරාව ගිය මගම ප්‍රකාශ වන්නේය ජරාව ඇසින් හෙවත් චක්ෂුර්විඥානයෙන් දතහැකි වූවක් නොවන්නීය.,

ආයුෂයාගේ පිරිහීමය, ඉන්ද්‍රියයන්ගේ මිහිකිරීමය යන දෙපදයෝ කල් ඉකුත්වීමෙහිදී අතිශයින් ප්‍රකට වන්නාවූ ආයුෂයාගේ පිරිහීමද, චක්ෂුරාදී ඉන්ද්‍රියයන්ගේ මුහුකුරායාමද යන සවභාව වශයෙන් ජරාව දක්වන ලදී. ජරාවට පැමිණියාවූ සත්ත්වයාගේ ජීවිතෙන්ද්‍රියතෙම යම්හෙයකින් පිරිහේද, එහෙයින් ජරා තොමෝ ආයුෂයාගේ පිරිහීමයයි ඵලොපචාර වශයෙන් වදාරන ලදී. ලදරු කාලයෙහි ප්‍රසන්නවූද සියුම්වූද ගොදුරුවූ රූපාදීවූ අරමුණු පහසුවෙන්ම ගැනීමට සමර්ථ වූ චක්ෂුරාදි ඉන්ද්‍රියයෝ, ජරාවට පැමිණියාවූ සත්ත්වයාට, මිහිකිරීම් බවට, නොපහන් වූ බවට පත්වන හෙයින් ඖදාරිකවූ අරමුණු ගන්නට යම් හෙයකින් අසමර්ථ වෙත්ද, එහෙයින් ජරා තොමෝ ඉන්ද්‍රියයන්ගේ මිහිකිරීම යයිද ඵලොපචාර වශයෙන් වදාරන ලදී.

මේ සියලුම ජරා තොමෝ වනාහි-

1. **පාකට** හෙවත් ප්‍රකට වූ **ජරාය**
2. **පටිච්ඡන්න** හෙවත් **අප්‍රකටවූ ජරාය** යි විධ වේ.

දත් නිය ආදීවූ කොටඨාශයන්හි කැඩුනු බිඳුනු බැව් දක්නා හෙයින් රූප ධර්මයන්හි පැවති ජරා තොමෝ **ප්‍රකට ජරා** නම් වේ නාම ධර්මයන්හි වනාහි එබඳු වෙනසක් නො **දක්නා** හෙයින් එය **පටිච්ඡන්න** හෙවත් **අප්‍රකට ජරා** නම් වේ. ඒ දත්වැටීම් ඈ බව යයි කියන ලද වර්ණ සංස්ථානය ඇසින් හෙවත් චක්ෂුර් විඥානයෙන් දැක මනොචාරයෙන් සිතා මේ දත්හු ජරාව විසින් මඩනා ලදූයි ජරාව දැන ගනී. දිය පිහිටි තැන්හි බැන්දවූ සළකුණු බලා යට ජලය ඇති බව දැනගන්නා මෙනි.

තවද, මේ ජරාව

1. **අවීචි** හෙවත් අතර පිරිසිඳීමක් නැති ජරාවය

2. **සවීචි** හෙවත් අතර පිරිසිඳීමක් ඇති ජරාවයයි ද්විධ වේ.

මැණික්, රන්, රිදී, පබළු, සඳ, හිරු ආදී වස්තූන්ගේ අතරතුර පැවති ජරා තොමෝ, සත්ත්වයන්ගේ මන්දදස කාදී කල්හි ජීවිතෙන්ද්‍රිය රහිතවූ වෘක්ෂාදීන්ගේ ජරාව මෙන්ද, වර්ණ විශෙෂාදීන් නොදත හැකි බැවින් අතර පිරිසිඳ නො දත හැකි වූ **අවීචි ජරා** නම් වේ.

ඒ මැණික් රන් රිදී ආදි වස්තූන් කෙරෙන් අන්‍යවූ දත් ආදි වූ වස්තූන්හි අතරතුර පැවති ජරා තොමෝ වර්ණ විශෙෂාදීන්ගේ වශයෙන් පහසුවෙන් දතහැකි බැවින් අතර තුර පිරිසිඳ දතහැකි වූ **සවීචි ජරා** නම් වේ.

මේ **සවීචි ජරාවද,**

1. **උපාදින්නක**

2. **අනුපාදින්නක** යන දෙපරිද්දෙන් දතයුතුය.

ළදරු කුමරුවන්ට පළමුකොට කිරි දත් පහළ වෙත්. ඒ කිරි දත් ස්ථිර නොවෙත්. ඒ කිරි දත් වැටුණු කල්හි නැවත දත් මතුවෙත්. ඒ දත් පළමුකොට සුදුපාට වෙත්, ජරාවෙන් මඩනා ලද කල්හි කල් යාමෙන් කලු වූවාහු වෙත්. කෙශයන්ගේද පළමු වර්ණය ජරාව විසින් මඩනා ලද කල්හි වෙනස් බවට පැමිණෙයි. ඡවි වර්ණයද, වැඩෙන්නාවූ සත්ත්ව යන් කෙරෙහි මනාව වැටහේ. ජරා සඞ්ඛ්‍යාත වාතය විසින් මඩනා ලද කල්හි සිවියෙහි රැළි වැටේ. මේ කියන ලද්දේ **උපාදින්නක සන්තානයෙහි** පැවැති **සවීචි ජරා වයි.**

මේ **ජරා** තොමෝ වනාහි, පඤ්චස්කන්ධයන්ගේ මිහිකිරීම් **ලක්ෂණ** ඇත්තිය. මරණයට පැමිණවීම් **කෘත්‍ය** ඇත්තීය. යොවුන් බව නැසීම් වශයෙන් **වැටහීම්** ඇත්තීය.

**ජරාවගේ දුක්ඛාර්ථය**

**ජරාවම දුක් නොවෙතත්, කායික දුක්ඛයන්ගේද දෞමනස්ස දුක්ඛයන්ගේද හේතුව වන හෙයින් හෙවත් දුකට කරුණු වන හෙයින් දුක් නම් වන්නීයයි වදාරණ ලදී.**

ජරාවට පැමිණි සත්ත්වයාගේ ආත්මභාවය දිරාපත් වූ ගැළක් මෙන් දුර්වල වූයේ වේ. සිටීමට හෝ ගමන් කිරීමට හෝ හිඳිනට වෑයම් කරන්නා හට බලවත්වූ කායික දුක්ඛයක් උපදී. දූ දරුවෝද, පෙර පරිද්දෙන් ගරු කිරීම් උවටැන් කිරීම් ආදියෙන් නොසලකන කල්හි දෞර්මනස උපදී. මෙසේ කායික මානසික වශයෙන් දෙපරිද්දෙකින්ම දුක්ඛයන් ගේ ඉපදීමට කරුණුවන හෙයින් ජරාව දුක යයි දතයුතු.

අත්පා ආදී අවයවයන්ගේ දුර්වල භාවයෙන්ද චක්ෂු-රාදි ඉන්ද්‍රියයන්ගේ වෙනස්වීම් වන බැවින්ද, යෞවන භාවයාගේ විනාශය වන හෙයින්ද, ශක්තිය පිරිහෙණ හෙයින්ද ස්මෘති, ශ්‍රැත, වීර්‍ය, ප්‍රඥාදීවූ ගුණයන්ගේ වියොග භාවයෙන්ද, ඇතැම් කලෙක තම දූ දරුවන් විසින් අව මන් කරනු ලබන හෙයින්ද බෙහෙවින් බාල දාරක භාවයට පැමිණීම වන හෙයින්ද සත්ත්ව තෙමේ යම් දුක්ඛයකටද, මානසිකවූ දෞර්මනසටද පැමිණේද, ඒ සියළුම දුක ජරාව කරුණු කොට ඇති හෙයින් ජරාව දුක් වන්නී යයි වදාරන ලදී.

## මරණ දුක්ඛය

**ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්ව නිකායයෙන් යම් ච්‍යුතියක් චවනතා හෙවත් චුත වන බවක්, භේදයක් හෙවත් බිඳීමක්, අන්තර්ධානයක්, මෘත්‍යු මරණයක් හෙවත් මියයාමක්, කාලක්‍රියාවක්, ස්කන්ධයන්ගේ බිඳීමක් කලෙබරයාගේ හෙවත් ශරීරයාගේ බහා තැබීමක්, ජීවි-තෙන්ද්‍රියයාගේ උපච්ඡේදයක් හෙවත් සිඳීමක් වේද මෙය මරණ යයි කියනු ලැබේ.**

මෙහි **චුති චවනතා,** යන දෙපදයෙන් ප්‍රත්‍යක්ෂ ආත්ම භාවයෙන් චුතවන **ස්වභාවයත්,** මරණයාගේ ලක්ෂණයත් දක්වේ. **භෙදය** යන්නෙන් ස්කන්ධයන්ගේ භඞ්ගක්ෂණය ප්‍රකාශ වේ බිඳුනු කලයාගේ පැවැත්මක් නැතිවන මෙන් ස්කන්ධයාගේ බිඳීමක් ඇති කල්හි පැවැත්මක් නැති බව දක්වීමට **අන්තර්ධාන** යන පදය ප්‍රකාශ කරන ලදී භවයෙන් මියයාම දක්වීම සඳහා **මෘත්‍යු මරණයයි** කියන ලදී. කාල නම් ලද මරුවාගේ ක්‍රියාව දක්වීම සඳහා **කාලක්‍රියා** යයිද කියන ලදී. මේ කියන ලද පද සමූහයෙන් **සම්මුති මරණය** ප්‍රකාශ කරන ලදී.

පරමාර්ථ වශයෙන් වනාහි ස්කන්ධයන්ගේ බිඳීමම **මරණ** නම් වේ. මැරෙන්නාවූ සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් නම් නැත ස්කන්ධයන්ගේ බිඳීම ඇති කල්හි සත්ත්ව තෙමේද මැරෙයි. මේ පදයෙන් චතුවොකාර පඤ්චවොකාර භවයන් ගේ වශයෙන් ස්කන්ධයන්ගේ බිඳීම ප්‍රාකශ වේ. කලෙබරයාගේ බහා තැබීම යන පදයෙන් එකවොකාර භවයාගේ වශයෙන් ආත්මභාවය බහා තැබීම හෙවත් මරණය ප්‍රකාශ වේ.

චාතුර්මහාරාජිකාදී වූ භූමින්හි පහළවන සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිය ඕපපාතික බැවින් චුතවීම් හා සමගම මළ සිරුරුද අන්තර්ධාන වන්නාහ. නිරය භූමින්හිද එමෙනි. තිරිසන් භූමින්හි සංසේදජ, ජලාබුජ ප්‍රතිසන්ධිය ගන්නා හෙයින් චුතවන සත්ත්වයෝ මළසිරුර බහා තබා චුත වන්නාහ මිනිස් භූමින්හිද මළසිරුර බහා තැබීම කරන හෙයින් **මරණය** කලෙබරයාගේ නික්ෂෙපය හෙවත් බහා තැබීම යයි වදාරන ලදී.

තවද මේ මරණය යන වචනය ඉන්ද්‍රියබද්ධවූ හෙවත් ඉන්ද්‍රියයන් පිළිබඳව පැවති සත්ත්වයන්ගේ නැතිවීම දක්වීමට ව්‍යවහාර වන වචනයකි. අනින්ද්‍රියබද්ධ සන්තාන යෙක්හි මෙබඳුවූ මරණයක් නම් නැත. අනින්ද්‍රියබද්ධ

වස්තූන්ගේ විනාශයෙහිද මේ වචනය යෙදීම ව්‍යවහාර මාත්‍රයක් පමණය. ශස්‍ය තෙම මළේය, වෘක්ෂය තෙම මළේය යන කීම ඒ ශස්‍යාදීන්ගේ ක්ෂය වැය ලක්ෂණය දැක්වීම සඳහා ව්‍යවහාර මාත්‍රයකි. ජීවිතෙන්ද්‍රියයාගේ උච්ඡේදය යයි කියන ලද්දේ ඒ හෙයිනි.

මේ මරණය-

1. **ක්ෂණික මරණය**
2. **සම්මුති මරණය**
3. **සමුච්ඡෙද මරණය** යයි ත්‍රිවිධ වේ.

ප්‍රවෘත්තික්ෂණයෙහි වූ නාම රූප ධර්මයන්ගේ යම් බිඳීමක් වේද එය **ක්ෂණික මරණය** නම් වේ.

ස්කන්ධ පරම්පරාවගේ මුල් සිඳීමක් නොවන බැවින් අසුවල් අසුවල් නම් ඇති සත්ත්වයා මළේයයි කීම සම්මුතියක් වන බැවින් එය **සම්මුති මරණ** නම් වේ.

රහතන් වහන්සේගේ පුනර්භව ප්‍රතිසන්ධියක් නැති හෙයින් ඒ භවයාගේ අවශානය වූ මරණය හෙවත් අනුපාදිශෙෂ පරිනිර්වාණයට ආසන්න කාරණා වූ මරණය **සමුච්ඡෙද** නම් වේ. එය ස්කන්ධ පරම්පරාවගේ සමුච්ඡෙද සද වේ.

මේ ත්‍රිවිධ මරණයෙන් අතුරෙන් **සම්මුති මරණයම** මෙහිදී දුක්ඛ සත්‍යය වන බව අදහස් කරන ලදී.

තවද, ඒ **සම්මුති මරණය**

1. **ජාතික්ඛය මරණය**- හෙවත් ජීවිතෙන්ද්‍රිය උපච්ඡේදයෙන් වන මරණය,
2. **උපක්කම මරණය**- හෙවත් උපක්‍රමයෙන් වන මරණය,

3. **සරස මරණය**- හෙවත් තමාගේ ස්වභාව-
යෙන් වන මරණය,

4. **ආයුක්ඛය මරණය**- හෙවත් ආයු ක්ෂය
වීමෙන් වන මරණය,

5. **පුඤ්ඤක්ඛය මරණය**- හෙවත් පුණ්‍ය ක්ෂය
වීමෙන් වන මරණය යයි පඤ්චවිධ වේ.

එක් කර්මයකින් උපන් ජීවිතෙන්ද්‍රිය පරම්පරාව සිඳ පියන බැවින් සම්මුති මරණයම, **ජාතික්ෂය මරණය** නම් වේ.

මේ **ජාතික්ෂය මරණයද, උපක්‍රම මරණය, සරස මරණය** යයි විධ වේ.

**සරස මරණයද, ආයුක්ඛය මරණය, පුණ්‍යක්ෂය මරණය** යයි දෙවැදෑරුම් වේ.

මෙයින් **උපක්‍රම මරණයට, අකාල මරණය** යයිද **සරස මරණයට, කාල මරණ** යයිද කියනු ලැබේ.

**මරණය** වනාහි චුතවීම් **ලක්ෂණය** ඇත්තේය, හෙවත් ප්‍රත්‍යක්ෂ ආත්මභාවයෙන් ගිලිහීම් ස්වභාවය ඇත්තේය. **වියෝග රසය** හෙවත් සම්ප්‍රාප්ත භවයෙහි ස්කන්ධයන් කෙරෙන් වෙන්වීම් කෘත්‍යය ඇත්තේය. **විප්‍ර-වාසය** හෙවත් පූර්ව භවයෙන් හෝ පූර්ව භවය හා වෙන්ව විසීම වැටහීම් කොට ඇත්තේය

**මරණයාගේ දුක්ඛාර්ථය**- මේ මරණය තෙමේම දුක් නොවෙතත් දුකට හේතු වන බැවින් දුකයයි වදාළ සේක. මරණය ආසන්නවූ කල්හි, ශරීරයෙහි උපන්නාවූ වේදනාවෝ, සුළඟින් වැඩියක් ඇවිළිගත් තණ පඳුරක් මෙන් හාත්පසින් දවත්, නරක නිමිති ආදීන් වැට-හෙන කල්හි බලවත් දෞර්මනසක් උපදනේයි, මෙසේ මේ කායික චෛතසික උභය දුක්ඛයන්ටම කරුණු වන බැවින් දුකයයි දතයුතු.

**පාපකර්‍ම**, පාපකර්‍ම නිමිත්ත, පාප ගති නිමිත්ත යයි කියන ලද අලම්බනය අරමුණු කරන්නාවූ, ලාමක පාපකර්‍ම ඇත්තාවූ, මරණය ලංවූ සත්ත්වයා හටද, ප්‍රිය කටයුතු වස්තු වූ පුත්‍ර කලත්‍රාදීන් කෙරෙන් වෙන්වීම නො ඉවසන්නාවූ, කල්‍යාණ කර්‍ම ඇත්තාවූ මරණය ලංවූ සත්ත්වයාහටද මානසිකවූ යම් දුකක් වේද, සාමාන්‍ය වශයෙන් පෙළෙනු ලබන මර්‍මස්ථාන ඇති සියළු සත්ත්වයන්හටත් අත් පා සන්ධි බන්ධන, සන්ධි සිඳීම් ආදියෙන් උපන්නාවූ, කායිකවූ පිළියම් කළ නොහැක්කාවූ යම් දුකක් වේද, ඒ දුක්ඛ සමූහයාගේ, යම් හෙයකින් මේ මරණය තෙම හේතුව වූයේද, එහෙයින් මේ මරණය තෙම දුකැයි වදාළ සේක.

**ජාති, ජරා, මරණයෝ**, මේ සත්ත්වයන් හට වධකයන් මෙන් අවකාශයක් සොයන්නෝව හැසිරෙත්

යම්සේ පුරුෂයකුගේ පසමිතුරන් තුන් දෙනකුන් අවකාශයක් සොයමින් හැසිරෙන කල්හි, එක් පසමිතුරෙක් මම අසුවල් අරණ්‍යයාගේ ගුණ කියා මේ පුරුෂයා ගෙන එහි යන්නෙමි, එම කටයුත්ත මට දුෂ්කර නැතැයි කියන්නේය. දෙවෙනි පසමිතුරාද, නුඹ ඒ පුරුෂයා අරණ්‍යයට ගෙන ආ කල්හි ඔහු තළා දුබල වූවෙකු කරන්නෙමි. එසේ තළා දුබල කිරීම මට දුෂ්කර කාරණයක් නොවේ යයි කියන්නේය. තුන්වන පසමිතුරාද තව්සින් ඒ පුරුෂයා තළා දුබල කළ කල්හි තියුණු මුවහත්වූ කඩුවෙකින් ඔහුගේ හිස සිඳින්නෙමි. එය මට දුෂ්කර කාරණයක් නොවේ යයි කියන්නේය ඒ පසමිතුරෝ තුන්දෙනම ඒ කී පරිද්දෙන්ම කරන්නාහුය. ඒ උපමාවෙහි ඒ පසමිතුරන් අතුරෙහි පළමුවූ පසමිතුරාගේ වන වරුණ තෙපලා ඒ පුරුෂයා ගෙන ඒ වනයට පැමිණි කළ මෙන් ඤාති මිත්‍ර සමූහයා කෙරෙන් බැහැර කොට යම් කිසි තැනෙක්හි ඉපදවීම නම් ජාතියගේ කෘත්‍යවේ. දෙවෙනි පසමිතුරාගේ තළා දුබල බව කිරීම මෙන් හටගත් ස්කන්ධයන් කෙරෙහි හෙව පරාධීන හෙවත්

අනුන් අඟන් පැවතුම් ඇති බව කිරීමය, මඬුව පරායනය හෙවත් ඇඳ පිහිට කොට ඇති බව කිරීමය, යන මෙය ජරාවගේ කෘත්‍යයෝ වෙත්. තුන්වනුවූ පසමිතුරාගේ තියුණු මුවහත් කඩුවෙන් හිස සිඳීම මෙන් ජීවිතෙන්ද්‍රියො-පච්ඡේදයට පැමිණවීම **මරණයාගේ** කෘත්‍යය වේ

තවද, **ජාති දුක** හෙවත් ජාති හෙතුවෙන් වන දුක මහා කාන්තාරයකට පිවිසීමක් මෙන් දතයුතු **ජරා දුක** හෙවත් ජරා හෙතුවෙන් වන දුක, ඒ දෙස් සහිතවූ මහා කාන්තාරයෙහි බත් පැන් නැතිව දුබලවූ පුරුෂයා මෙන් දතයුතු **මරණ දුක** හෙවත් මරණ හෙතුවෙන්වන දුක, ඉරියව් පැවැත්වීමෙහි ශක්තිය නැතිව දුබලවූ පුරුෂයාගේ චණ්ඩ මෘගාදීන් විසින් අනයව්‍යසනයට පැමිණවීම මෙන් හෙවත් අවෘද්ධියටත් විනාශයටත් පැමිණවීම මෙන් දතයුතු.

## ශොක දුක්ඛය

**ඤාති ව්‍යසන** හෙවත් නෑයන්ගේ හිත සුව විනාශය, නෑයන්ගේ විනාශවීම, සොර භය රොග භය ආදි හෙතු-වෙන් නෑයන්ගේ පිරිහීම යනාදියෙන් මැඩගෙන ගිය පුද්ගලයාගේද, **භොග ව්‍යසන** හෙවත් භොග සම්පත්තීන් පිරිහීම, රාජ චෞරාදීන් විසින් පැහැරගැන්ම යනාදියෙන් මැඩගෙනගිය පුද්ගලයාගේද, **රොග ව්‍යසන** හෙවත් නිරොගි බව විනාශ කරමින් රොගයෙන් මැඩගෙන ගිය පුද්ගලයාගේද, **සීල ව්‍යසන** හෙවත් සීල විපත්තිය නොහොත් දුශ්සීල භාවයෙන් මැඩගෙන ගිය පුද්ගලයාගේද. **දිට්ඨි ව්‍යසන** හෙවත් සම්‍යග්දෘෂ්ටිය විනාශ කරමින් මිථ්‍යාදෘෂ්ටි-යෙන් මැඩගෙනගිය පුද්ගලයාගේද, මෙසේ නොයෙක් ව්‍යසනයන් අතුරෙන් එක්තරා ව්‍යසනයකින් යුත් පුද්-ගලයාගේ නොයෙක් දුක් සවභාවයන් අතුරෙන් එක්තරා දුක් සවභාවයකින් මඩනාලද පුද්ගලයාගේ යම් ශොකයක් ශොකයාගේ ආකාරයක්, ශොක කරන්නහුගේ සවභාවයක් අභ්‍යන්තරයෙහිවූ ශොකයක්, අභ්‍යන්තරයෙහි වියලවත්-

නෑක්හු මෙන් ඇතිවන ශොකයක්, චිත්තයාගේ දවන ආකාරයක්, දුකට පත් සිතක් හෙවත් දෞර්මනසක්, ශොකසල්ලයක් හෙවත් ශොක නමැති හුලක්වේද මෙය **ශොකය** යයි කියනු ලැබේ.

මෙහි දක්වන ලද **ඥාති, භොග, රොග, සීල, දිට්ඨි,** යන පඤ්චවිධ ව්‍යසනයන් අතුරෙන් පළමුවූ ඥාති ව්‍යසන, භොග ව්‍යසන යන දෙදෙන ප්‍රඥප්තිමාත්‍රවූ ඥාති භොග සම්පත්තින් නිසා ඇතිවන ව්‍යසනයන් බැවින් **අනිෂ්පන්න නම්හු** වෙත් රොග ව්‍යසන, සීලව්‍යසන දිට්ඨි ව්‍යසනය යන තිදෙන අතුරෙන් රොග ව්‍යසනය කායික දුක්ඛ වෙදනාව වන හෙයින්ද, ශීල ව්‍යසනය ප්‍රාණාති පාතාදි චෙතනාව වන හෙයින්ද, දෘෂ්ටි ව්‍යසනය මිථ්‍යාදෘෂ්ටිය වන හෙයින්ද පරමාර්ථ ධර්ම වන බැවින් **නිෂ්පන්න නම්හු** වෙත් එමෙන්ම **ඥාති, භොග, රොග** යන තිදෙන කුසල් හෝ අකුසල් හෝ නොවෙත්. **ශීල, දෘෂ්ටි** ව්‍යසනයෝ අකුසල්හු වෙත්.

මේ ශොකය ඇතුළතම තැවීම් **ලක්ෂණය** ඇත්තේය. චිත්තයාගේ දැවීම කෘත්‍යය කොට ඇත්තේය. ඒ ඒ ගුණ දෙස් අනුගමත් කොට පසුතැවීම වැටහීම් කොට ඇත්තේය.

**ශොකයාගේ දුක්ඛාර්ථය- ශොකය,** ප්‍රකෘතියෙන්ම දුක් වන බැවින්ද, දුක්ඛයාගේ හේතුව වන හෙයින්ද දුකැයි වදාරන ලදී මේ ශොකය කායික දුක්ඛයාගේද මානසික දුක්ඛයාගේද හේතුව වේ. ශොක වේගයෙන් හෘදයෙහි මහ හඬක් හටගෙන පැසවා බිඳෙන්නේය. මුඛයෙන් හෝ කළුපැහැ ලේ නික්මෙන්නේය බලවත්වූ ශාරිරික දුක්ඛයෙක් උපදින්නේය. මාගේ මෙතෙක් නෑයෝ පිරිහීමට ගියහ විනාශයට ගියහ මාගේ මෙතෙක් භොග සම්පත්හු පිරිහීමට ගියහ. විනාශයට ගියහ. මෙසේ සිතන්නා හටද බලවත්වූ දෞර්මනසෙක් උපදින්නේය. මෙසේ මේ උභය දුක්ඛයන්ට හේතු වන බැවින් ශොකය දුක යයි වදාරන ලදී.

මේ **ශෝකය** **සත්ත්වයන්ගේ** හෘදයෙහි හුලක් මෙන් පීඩා කෙරෙයි. ගිනියම් කළ හුල නැවත නැවත දවයි. ශෝකය යම් හෙයකින් **ව්‍යාධි**, **ජරා**, **මරණ** සඞ්ඛ්‍යාත ප්‍රභෙද ඇති දුක්ඛයටත් පමුණුවාද, අන්‍යවූ වෙෂාදි අනෙක ප්‍රකාර දුක්ඛයන් එළවාද, එහෙයින් දුකයයි වදාළ සේක.

## පරිදෙව දුක්ඛය

**ඤාති** ව්‍යසනයෙන් හෝ භොග ව්‍යසනයෙන් හෝ රොග ව්‍යසනයෙන් හෝ, **සීල** ව්‍යසනයෙන් හෝ දිට්ඨි ව්‍යසනයෙන් හෝ මැඩගෙන ගිය පුද්ගලයාගේ, මෙසේ නොයෙක් ව්‍යසනයන් අතුරෙන් එක්තරා ව්‍යසනයකින් යුත් පුද්ගලයාගේ, නොයෙක් දුක් සවභාවයන් අතුරෙන් එක්තරා දුක් සවභාවයකින් මඩනාලද පුද්ගලයාගේ යම් **ආදෙවයක්** හෙවත් මගේ දුව, මගේ පුතා ආදී වශයෙන් කියකියා කඳුළු වගුරුවමින් හඬත්ද, **පරිදෙවය** හෙවත් ඒ ඒ ගුණ කියකියා උපකාරාදිය කියකියා විලාප ගසත්ද, **ආදෙවනා** හෙවත් නම් කියා හැඬීම් සවභාවයක් **පරිදෙවනා** හෙවත් ගුණ කියා හැඬීම් සවභාවයක්, **ආදෙවිතත්ත** හෙවත් නාම කියා හඬන බවෙක් **පරිදෙවිතත්ත** හෙවත් ගුණ කියා හඬන බවක්, **වාචා පලාප** හෙවත් බොල් වී ආදිය මෙන් හිස්වූ නිශ්ඵල වචන බිණීමක්, **විප්පලාප** හෙවත් තෙපුලෙන් අඩක් බිණීමය, අසම්පූර්ණ කොට බිණීමය යනාදීන්ගේ වශයෙන් අශොභනවූ ඵල නැති බස් බිණීමය, **ලාලප්ප** හෙවත් නැවත නැවත තෙපලීමය, **ලලප්පනා** හෙවත් නැවත නැවත තෙපලන සවභාවයක්, **ලාලප්පිතත්ත** හෙවත් නැවත නැවත තෙපලන බවක් වේද මෙය **පරිදෙව** යයි කියනු ලැබේ.

මේ **පරිදෙවය**, ලාලප්පන ලක්ෂණය හෙවත් නැවත නැවත තෙපලීම ලක්ෂණයකොට ඇත්තේය. ගුණ දොස් හඟවන කෘත්‍ය ඇත්තේය. නොනැවතී, නොපිහිටි බවක්ව

වැටහෙන්නේය, හෙවත් ඤාති ව්‍යසනාදි ශෝක වස්තූන් නොතැසූ හෙයින් නොනැවතී නොපිහිටි බව වැටහීම කරවන්නේය.

**පරිදේවයාගේ දුක්ඛභාවය** - වැලපීමම දුක් නොවෙතත් කායික චෛතසික දුක්ඛයන්ගේ හෙවත් දුක් දොම්නස් දෙදෙනාගේ හේතුව වන බැවින් **දුක්** නම් වන්නේය. වලප්නා තැනැත්තේ තමාගේ කයට හෝ මිටින් තලයි, දෑතින් ළය පහරයි, හිස බිත්තියේ හපයි එයින් වලප්නාහට බලවත් **කායික දුකක්** උපදී. නෑයෝ මෙතෙක් දෙනා පිරිහිනු, විනාශයට ගියහ, භෝගයෝ මෙතෙක් පිරිහිනු, විනාශයට ගියහ යනාදි සිතිවිලි නිසා **දොම්නස** උපදී. ශෝක සඞ්ඛ්‍යාත හුලින් මඩනාලදුව වලප්නා වූ පුද්ගලයා බොටුවය, දෙතොලය, තල්ලය, යන තැන් වියලීමෙන් හටගන්නාවූ ඉවසිය නොහැක්කාවූ දුකට පැමිණේ. එයින් අධිකතර කායික චෛතසික දුක්ඛයට පැමිණෙන්නේය.

## දුක්ඛ දුක්ඛය

යම් කායික දුකක්, කායික අපහසුවක්, කය හා සපශී වීමෙන් උපන්නාවූ අපහසුවූ වෙදනා ආකාරවූ දුකක් වේද, කය හා සපශීවීමෙන් හටගත් ඒ දුක්වූ අපහසුවූ වේදනාවෝ **දුක්ඛය** යයි කියනු ලැබේ.

## දෞමනස්සා දුක්ඛය

දුක්වූ, අමධුරවූ යම් චෛතසික දුකක් වේද, දුක්වූ, අමධුරවූ විඳියයුතුවූ සිත හා සපශීයක් වේද, සිත හා සපශීවූ අමධුරවූ දුක්වූ වෙදනාව **දෞමනස්ස** යයි කියනු ලැබේ.

මේ දුක් දොම්නස් දෙදෙනාගේ සමූහයද, තුමූත් දුක් වන බැවින්ද, කායික චෛතසික දුක්ඛයන්ටත් හේතු වන බැවින්ද දුක යයි වදාරන ලදී.

අත් පා කන් නාසාදිය සිඳීමෙන් උපන් දුක කරණ-කොට ගෙන දුක්පත්වූ අසරණ ජනයා වසන අම්බලමෙක වැදහොත් පුද්ගලයාහට වණ මුව සිදුරුවලින් පණුවන් නික්මෙන කල්හි බලවත්වූ කායික දුක්ඛය උපදී. නොයෙක් වස්ත්‍රාභරණාදියෙන් සැරසී නැකත් කෙළි කෙළනාවූ මහාජනයා දක බලවත්වූ දෞම්නස උපදී. මෙසේ දුක් දෞම්නස් දෙදෙන නොයෙක් කායික චෛතසික දුක්ඛයන්ට හේතුවන බව දතයුතු.

කායික දුක්ඛයෙන් මඩනාලද පුද්ගලයාහට පිළියම් කිරීම් වශයෙන් ප්‍රයොග කරන කල්හි කායික දුක්ඛයට කායික දුක්ඛය උපනිශ්‍රය වන බව දතයුතු.

චෛතසික දුක්ඛයෙන් මඩනාලද පුද්ගලතෙම කෙස් විදහාගෙන පපුවට ගසාගනියි, පෙරළෙයි, ප්‍රපාතයෙහි හෙළූ ටැඹක් මෙන් ඇත මෑත පෙරළෙයි, මුල් සුන් රුකක් බර අතට ඇදවැටෙන්නාක් මෙන් ඇදවැටෙයි. ආයුධයෙන් පහරා ගනියි, විෂ කයි, බෙල්ලෙහි වැල ලා ගනියි. ගින්නට පනියි මෙසේ නොයෙක් ආකාරයෙන් කළකිරුණු සිත් ඇති පුද්ගලයෝ දවනු ලබන සිත් ඇති කල්හි විපරීත භාවයට පත්ව ඒ ඒ දේ සිතත්. මේ පරිද්දෙන් දෞම්නසද, කායික චෛතසික උභය දුක්ඛයන්ටම හේතු වන බව දතයුතු. දෞම්නස සිතත් කයත් පෙළන හෙයින් දුක් නම් වන බව වදාරන ලදී.

## උපායාස දුක්ඛය

ඤාති ව්‍යසනයෙන් හෝ, භොග ව්‍යසනයෙන් හෝ, රොග ව්‍යසනයෙන් හෝ, සීල ව්‍යසනයෙන් හෝ, දිට්ඨි ව්‍යසනයෙන් හෝ මැඩගෙන ගිය පුද්ගලයාගේ මෙසේ නොයෙක් ව්‍යසනයන් අතුරෙන් එක්තරා ව්‍යසනයකින් යුත් පුද්ගලයාගේ නොයෙක් දුක්ඛස්වභාවයන් අතුරෙන් එක්තරා දුක්ඛ ස්වභාවයකින් මඩනාලද පුද්ගලයාගේ යම් **ආයාසයක්** හෙවත් සිත්හි වෙහෙසීමක්, කලාන්තක බවක්,

**උපායාසයක්** හෙවත් බලවත් කලාතන බවක්, **ආයාසිතත්ත** හෙවත් කලාතන බවක්, **උපායාසිතත්ත** හෙවත් දුඞි කලාතන බවක් වේද, මෙය උපායාසය යයි කියනු ලැබේ.

මේ උපායාසය වනාහි **බ්‍යාසනන්‍ති ලක්ෂණ** හෙවත් විරූප වූ අවයව ඇති බව ලක්ෂණකොට ඇත්තේය. **නිත්ථුනන රසය** හෙවත් නැතනුම් කරන කෘත්‍ය ඇත්තේය. **විසාද පච්චුපට්ඨානය** හෙවත් සිතේ යටපත්වන බවක්ව වැටහෙන්නේය.

**උපායාසයාගේ දුක්ඛාර්ථය** – මේ උපායාසය, තෙමේම දුක් නොවෙතත් කායික චෛතසික දුක්ඛයන්ට හෙතුවන බැවින් දුක් නම් වන බව වදාරන ලදී.

දුකසේ හිඳීම් සිටීම් ආදී ඉරියව් පවත්වනු වන්ගේ දූඞි ආයාසය කායික දුක්ඛයට හේතු වේ. ඤාතිව්‍යසන ආදීන් ගේ වශයෙන් සිතනවුන් හට මේ උපායාසය දෞමනස්‍ය දුක්ඛයට හෙතු වේ. සිත දූඞිව දවන හෙයින්ද, ශරීරය කෘශ කරන හෙයින්ද, මේ උපායාසය දුක් දෞර්මනස් දෙක උපදවයි.

මෙහි දක්වන ලද **ශොක, පරිදෙව, උපායාස** යන ත්‍රිවිධ දුක්ඛයන් අතුරෙන්, මදගින්නෙන් ඇතුළු බඳුනෙහිම තෙලාදීන්ගේ පැසීමක් මෙන් **ශොකය** දතයුතු. තියුණු ගින්නෙන් පැසෙනු ලබන්නාවූ තෙලයාගේ බඳුනෙන් බැහැර නික්මීමක් මෙන් **පරිදෙවය** දතයුතු. බැහැර නික්ම ඉතිරිවූ තෙලයාගේ ඇතුළු බඳුනෙහිම අවශානය දක්වා පැසීමක් මෙන් **උපායාසය** දතයුතු.

## අප්‍රිය සම්ප්‍රයොග දුක්ඛය

මේ ලොකයෙහි යම්බඳු යමෙකුට **අනිෂ්ටවූ** හෙවත් මන නොවඩන්නාවූ, ශ්‍රද්ධාදිය ඇති නොකරන්නාවූ, **අකාන්තවූ** හෙවත් සිත්හි නොවදින, සිත නොවඩන්නාවූ, **අමනාපවූ** රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයෝ වෙත්ද, ඔහුට **අනත්ථකාමී** හෙවත් ශ්‍රද්ධාදි ධර්මයන්ගේ අභිවෘද්ධිය යයි කියනලද අර්ථය නොකැමැති වන හෙයින් ඒ ශ්‍රද්ධාදි ධර්මයන්ගේම පිරිහීමයයි කියනලද අනර්ථයම කැමති වන්නාවූ, **අහිතකාමී** හෙවත් ශ්‍රද්ධාදී ධර්මයන්ගේම උපායභූතවූ අභිවෘද්ධිය නොකැමැතිවන හෙයින් සැදැහැ පිරිහීම් ආදීන්ගේ උපායභූතවූ අනභිවෘද්ධියට කැමැති වන්නාවූ, **අඵාසුකාමී** හෙවත් පහසු විහරණය නො කැමැතිවන හෙයින් නොපහසු විහරණයම කැමැති වන්නාවූ, **අයොගක්ඛෙමකාමී** හෙවත් නිර්භය වූවක් නොකැමැතිවන හෙයින් භය සහිත වූවක්ම කැමැති වන්නාවූ යන මොවුන් හා යම් **සඞ්ගතියක්** හෙවත් සමග ගොස් එක්වීමක් **සමාගමයක්** හෙවත් ආවාවූ දතන් සමග එක්වීමක්, **සමොධානයක්** හෙවත් හිඳීම්, සිටීම් ආදියෙහිද, භොජනාදි කෘත්‍යයන්හිද එකතුවීමක් **මිශ්‍රීභාවයක්** හෙවත් සියළු වැඩවලට එකතු කර ගැන්මක් වේද, මෙය අප්‍රියයන් හා එක්වීම යයි කියනු ලැබේ.

මේ අප්‍රිය සත්ත්වයන් හා සම්ප්‍රයොගය නොහොත් අප්‍රිය සංස්කාරයන් හා සම්ප්‍රයොගය, අනිෂ්ට රූපාදීන් හා එක්වීම **ලක්ෂණ** කොට ඇත්තේය. චිත්තයාගේ කලාන්ත භාවය කරණ **කෘත්‍ය** ඇත්තේය. අනර්ථ භාවයෙන් හෙවත් උපද්‍රව භාවයෙන් **වැටහීම** වන්නේය.

මේ අප්‍රිය සම්ප්‍රයොගය, ස්වරූප වශයෙන් එක් ධර්මයක් නොවේ. අප්‍රිය වස්තූන් හා සඞ්ගතිය, සමාගමය, සමොධානය, මිශ්‍රීභාවය යන මොවුන්ගේ වශයෙන් එක්ව යෙදුනාවූ සත්ත්වයාගේ කායික චෛතසික උභය දුක්ඛයන්ගේ වස්තු භාවය හෙවත් හෙතුව වන බැවින් දුකැයි

වදුලසේක නොකැමැතිවූ වස්තූන් හා එක්වීම ඇති තල්ති බිඳීමය. සිඳීමය, පැළීමය යනාදීන් කරණකොටගෙන කායිකවූ දුකද, තැති ගන්වන හෙයින් මානසිකවූ දුකද උපදවත්.

## ප්‍රිය විප්‍රයොග දුක්ඛය

මේ ලොකයෙහි යම්බඳු යමෙකුට **ඉෂ්ටවූ** හෙවත් මන වඩන්නාවූ, ශ්‍රද්ධාදිය ඇති **කරන්**නාවූ, **කාන්තවූ** හෙවත් **සිත්හි** වදින, සිත් වඩන්නාවූ, **මනාපවූ** රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයෝ **වෙත්ද**, ඔහුට **අර්ථකාමී** හෙවත් ශ්‍රද්ධාදි **ධර්ම** යන්ගේ අභිවෘද්ධිය කැමැති වන්නාවූ **හිතකාමි** හෙවත් අභිවෘද්ධියට කැමති වන්නාවූ, **ඵාසුකාමි** හෙවත් පහසු විහරණය කැමැති වන්නාවූ, **යොගක්ඛෙමකාමි** හෙවත් භය රහිත වූවක්ම කැමති වන්නාවූ, මව හෝ, පියා හෝ, සහෝදරයා හෝ, සහෝදරිය හෝ, මිත්‍රයෝ හෝ සියළු කෘත්‍යයන්හි සහාය වන්නෝ හෝ, **ඥාතීහු** හෝ, සහලේ නෑයෝ හෝ යන මොව්හු වෙද්ද, ඔවුන් හා යම් **අසඞ්ගතියක්** හෙවත් සමග ගොස් එක් නොවීමක්, **අසමාගමයක්** හෙවත් ආවාවුත් සමග එක් නොවීමක්, **අසමොධානයක්** හෙවත් හිඳීම්, සිටීම්, ආදියෙහිද භොජනාදි කෘත්‍යයන්හිද එකතු නොවීමක්, **අමිශ්‍ර භාවයක්** හෙවත් වැඩවලට එකතුකර නොගැනීමක් වේද, මෙය **ප්‍රිය විප්‍රයොග** හෙවත් ප්‍රියයන් හා වෙන්වීමේ දුකයයි කියනු ලැබේ.

**ප්‍රිය විප්‍රයොගය** ප්‍රිය මනාප වස්තූන් කෙරෙන් වෙන් කිරීම් **ලක්ෂණ**කොට ඇත්තේය. ශොකය ඉපදවීම කෘත්‍ය කොට ඇත්තේය. ඥාති ව්‍යසනාදිය ඇත්තෝව වැටහෙන් නේය.

ස්වරූප වශයෙන් ප්‍රිය විප්‍රයොගය එක් ධර්මයක් නොවේ. නියමයෙන් ප්‍රියමනාප වස්තූන් හා විප්‍රවාසයට පැමිණි පුද්ගලයන්ගේ විප්‍රකාරවූද, කායික චෛතසික දුක්ඛයාගේ හෙතුවද වන බැවින් දුක නම් වන්නේය.

# කැමති දෑ නොලැබීමේ දුක්ඛය

පිළිසිඳ ගැනීම හෙවත් ජාතිය ස්වභාව කොට ඇති සත්ත්වයන්ට මෙසේ තෘෂ්ණාවක් උපදී. අපි ජාතිය හෙවත් උත්පත්තිය ස්වභාව කොට ඇත්තෝ නොවෙමු නම් ඉතා මැනව. ප්‍රහීණවූ සමුදය සත්‍යය සංඛ්‍යාත තෘෂ්ණාව ඇති ආයර්‍ය පුද්ගලයන් විෂයෙහි විද්‍යමානවූ, නූපදනා බවකුත්, පිරිනිවන් පා වදාළාවූ පුද්ගලයන් විෂයෙහි විද්‍යමානවූ ජාතිය ගේ යම් නොපැමිණීමකුත් ප්‍රාර්ථනා කරද්දීත්, මාර්ග භාවනාවෙන් තොරව නොපැමිණිය හැකි වන හෙයින්, ප්‍රාර්ථනා නොකරද්දීත් මාර්ග භාවනාවෙන් පැමිණිය හැකිවන හෙයින් ප්‍රාර්ථනාවෙන් පැමිණිය යුත්තක් නොවේ. ඒ ඉච්ඡාව හෙවත් කැමති දෙය නොලැබීමද ඉච්ඡිතාලාභ දුක හෙවත් කැමති දෑ නොලැබීමේ දුක නම් වේ. නොලැබිය හැකි වූ වස්තුවක් ප්‍රාර්ථනා කරන්නාවූ පුද්ගල තෙම, ඒ වස්තුව නොලබාද ඒ නොලැබිය හැකි වස්තුන් පැතීම දුක යයි දතයුතු.

මෙපරිද්දෙන් ජරාව ස්වභාව කොට ඇති සත්ත්වයන්ටද, ව්‍යාධිය ස්වභාවකොට ඇති සත්ත්වයන්ටද, මරණය ස්වභාව කොට ඇති සත්ත්වයන්ටද, සොක, පරිදෙව, දුක්ඛ, දෞර්මනස්ස උපායාසයන් ස්වභාවකොට ඇති සත්ත්වයන්ටද මෙසේ ආශාව උපදී. මේ ජරා, ව්‍යාධි, මරණ සොක, පරිදෙව, දුක්ඛ, දෞර්මනස්ස, උපායාස ඇත්තෝ නොවමු නම් ඉතා මැනවි. අපට ජරා, ව්‍යාධි, මරණාදිය නොපැමිණෙත්තේ නම් ඉතා මැනවි. ප්‍රහීණවූ සමුදය සත්‍යය සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ඇති ආයර්‍ය පුද්ගලයන් විෂයෙහි විද්‍යමානවූ අජරාමර සඞ්ඛ්‍යාත ධර්මයන් ප්‍රාර්ථනාවෙන් පැමිණිය යුත්තක් නොවන්නාහ. මාර්ග භාවනාවෙන්ම පැමිණිය යුතුමය. මෙසේ ප්‍රාර්ථනාවෙන් නොලද හැකි වස්තූන් ප්‍රාර්ථනා කිරීමත්, ප්‍රාර්ථනා කොට නොලැබීමත් ඉච්ඡිතාලාභ දුක්ඛය හෙවත් කැමති දෑ නොලැබීමේ දුක නම් වන්නේය.

මේ **ඉච්ඡාව** නොලද හැකි වස්තූන් පැතීම **ලක්ෂණ** කොට ඇත්තීය. ඒ නොලද හැකි වස්තූන් සෙවීම **කෘත්‍යය** කොට ඇත්තීය. ඒ නොලද හැකි වස්තූන් නොලැබීමම **වැටහීම්** කොට ඇත්තීය.

නවද, මේ ඉච්ඡාව කායික චෛතසික දුක්ඛයන්ට හේතු වන බැවින්ද, දුක නම් වන්නීය.

## පඤ්චුපාදනස්කන්ධ සඞ්ඛ්‍යාත දුක්ඛය

ජාති දුක්ඛය මුල්කොට ඇති යම් දුකෙකුත් භාග්‍ය වතුන් වහන්සේ වදාළ සේක්ද, එසේ නොවදාළාවූ යම් දුකෙකුත්වේද, ඒ සියලුම දුක් සමූහය, මේ රූප, වේදනා සංඥා සංඛාර විඤ්ඤාණුපාදනස්කන්ධයන් හැර යම් හෙයකින් විද්‍යමාන නො වේද, එහෙයින් සැකෙවින් මේ උපාදනස්කන්ධයෝ පස්දෙනම දුකයයි වදාළ සේක.

දර පෙණෙල්ල පෙළන්නාවූ ගින්න මෙන්ද, ඉලැක්කිය පෙළන්නාවූ චාපාදී ආයුධයන් මෙන්ද, ගව සමූහය පෙළෙන්නාවූ ඩැහැ ලේ බොන පිඩගල මැසිය, විද ලේ බොන මදුරුය යනාදීන් මෙන්ද. කෙත පෙළන්නාවූ ගොයම් කපන්නවුන් මෙන්ද, ගම පෙළන්නාවූ ගම් පහරන්නවුන් මෙන්ද, මේ ජාති ආදී දුක්ඛයෝ නොයෙක් පරිද්දෙන් උපාදනස්කන්ධ පඤ්චකයම පෙළන්නාහුය. භූමියෙහි හටගන්නාවූ තෘණ ලතාදීන් මෙන්ද, වෘක්ෂ යන්හි හටගන්නාවූ මල්පල පලුපත් ආදීන් මෙන්ද, මේ ජාති ආදී දුක් සමූහය උපාදනස්කන්ධයන්හිම හට ගනිත්.

උපාදනසකන්ධයන්ගේද මුල්වූ දුක, **ජාති දුක** නම්. මැදවූ දුක **ජරා දුක** නම්. අවසන්වූ දුක **මරණ දුක** නම්. මරණාසන්න දුක්ඛය විසින් පහරන ලද සෙයින් සිත් තැවී මෙන් වන දුක **ශෝක දුක** නම් ඒ සෝකය නොසිඳීම් හේතුවෙන් වලප්නා දුක **පරිදෙව දුක්ඛය** නම්.

**ඒ වලප්නා** දුකෙන් මත්තෙහි බොටුව විසැලීම්, හන්දි බැඳුම්, හන්දි සිඳීම් උපදවන ධාතූන්ගේ කැළඹීමයයි කියන ලද අනිෂ්ට ස්ප්‍රෂ්ටව්‍යාලම්බනය හා එක්ව සෙදුන හෙයින් ශරීරය පෙලෙන දුක, **දුක්ඛ** නම්. ඒ කායික දුක්ඛය විසින් පෙළනු ලබන්නාවූ පෘථග්ජනයන්ට ඒ කායික දුක්ඛයෙහි වෛෂය උපදනා හෙයින් සිත පෙළන දුක **දෞමනස්ස දුක්ඛය** නම් ශොකාදීන්ගේ වැඩිවීමෙන් හටගත් චිත්ත පීඩා ඇත්තවුන්ගේ නැතතිම් දුක **උපායාස දුක්ඛ** නම්. අදහස් මුදුන් නොපැමිණිය වූන්ගේ නොලද හැකි වස්තූන් පැතීමයයි කියනලද කැමැත්ත නොසිදු වීමෙන් වන දුක **ඊප්සිතාලාභ දුක්ඛ** නම්. මෙසේ නොයෙක් ආකාරයෙන් පඤ්ච උපාදානස්කන්ධයෝම දුකයයි වදාළසේක.

මහ මුහුදෙන් ගන්නාලද එක්දිය බිඳෙක්හි මුළු මහ මුහුදු දිය රස අභවන්නාක් මෙන්, සියළු සත්ත්වයන්ගේ පඤ්චවිධවූ උපාදානසකන්ධයන් විෂයෙහි දුක් සමූහය සංග්‍රහ කොට දක්වනු පිණිස මෙසේ සංක්‍ෂෙපයෙන් පඤ්චුපාදානසකන්ධයෝම දුක්ඛයයි වදාළ බව දතයුතු.

## සමුදයාර්‍ය්‍ය සත්‍යය

**පුනර්භවය** හෙවත් නැවත නැවත සත්ත්වයාගේ ඉපදීම ඇති කරන්නාවූ, **නන්දිරාගය** හා යුක්තවූ හෙවත් ඇලීම් සහගතවූ, ඒ ඒ උපන් ආත්මභාවයෙහි ඇලෙන්නාවූ **කාම තෘෂ්ණා, භව තෘෂ්ණා,** විභව **තෘෂ්ණා** සඞ්ඛ්‍යාතවූ යම් තෘෂ්ණාවක් වේද, එය **සමුදය සත්‍යය** යි වදාරන ලදී.

පුනර්භවය ඇති කිරීම තෘෂ්ණාවගේ ස්වභාවය හෙයින් තෘෂ්ණාවට **පොනොභවිකා** යයි කියනු ලැබේ. යම් තෘෂ්ණාවෙක් චෙතනාව හා සමග ඉපිද පුනර්භවය දේද, යම් තෘෂ්ණාවක් කර්මය සහාය කොට ඇත්තීව පුනර්භවය පිණිස පවතීද, මිප්‍රකාරවූ ඒ තෘෂ්ණා තොමෝ පුනර්භවය උපදවාද, ඒ කාරණයෙන්ද **පොනොභවිකා** නම් වන්නීය.

තවද, පුනර්භවය දෙන්නාවූ තෘෂ්ණාවය, පුනර්භවය නො දෙන්නාවූ තෘෂ්ණාවය, පුනර්භවය පිණිස පවත්නාවූ තෘෂ්ණාවය, පුනර්භවය පිණිස නොපවත්නාවූ තෘෂ්ණාවය, අන්‍ය කර්මයකින් ප්‍රතිසන්ධිය දුන් කල්හි උපධි නම්ලද ප්‍රවෘත්‍යාත්ම භාවයෙහි විපාකගන්වන කර්ම මාත්‍රයක් ඇති තෘෂ්ණාවය යනාදි වශයෙන් තෘෂ්ණාව නොයෙක් ප්‍රකාර වේ මේ සියළුම තෘෂ්ණාවෝ **පොනොභවිකා** යන නාමය ලබන්නාහුය.

චිත්තයාගේ නන්දනයයි කියනලද බැඳෙන බව හෝ ඉපිලෙන බව හෝ පොපියන බව **නන්දි** නම්. චිත්තය අන්‍ය තත්වයකට පමුණුවානුයි, රමණය කරවානුයි **රාග** නම් මේ කියනලද නන්දිරාගයෙන් යුක්තවනබැවින් තෘෂ්ණා තොමෝ **නන්දිරාගසහගතා** නම් වේ. ආලම්බන-යෙහි දැඩි බන්ධනය හා සමග වූ තෘෂ්ණාවය යන අර්ථය වේ.

මේ තෘෂ්ණාව, රූප, ශබ්ද ගන්ධ රස, පොට්ඨබ්බ, ධම්ම යන **ආලම්බනයන්හි** දැඩිව ඇලෙන ස්වභාවය ඇත්තීය.

තවද මේ **තෘෂ්ණාව කාම තෘෂ්ණා, භව තෘෂ්ණා, විභව තෘෂ්ණා** යයි ත්‍රිවිධ වේ

පඤ්චකාම ගුණයෙහි පැවති තෘෂ්ණා තොමෝ **කාම තෘෂ්ණා** නම්. මෙය පඤ්චකාම කොට්ඨාසයන්හි පැවති රාගයාගේ නාමය වේ. රූපාරූප භවයෙහි පැවති තෘෂ්ණා තොමෝ **භව තෘෂ්ණා** නම්. එය භව ප්‍රාර්ථනා වශයෙන් උපන්නාවූ ශාස්වත දෘෂ්ටිය හා සමග පැවැත්තාවූ රූපාරූප භවයන්හි පැවති රාගයාගේද, ධ්‍යාන නිකාන්තිය-ගේද නාමය වේ. කාම, රූප, අරූප භවයෙන් අපගමයෙහි පැවති තෘෂ්ණා තොමෝ **විභව තෘෂ්ණා** නම් මෙය උච්ඡේද දෘෂ්ටිය හා සමග පැවැත්තාවූ රාගයාගේ නාමය වේ.

මේ තෘෂ්ණාව උපදිනු ලබන්නේ කවර තැනෙක්හි උපදී ද, පවතිනු ලබන්නේ කවර තැනෙක්හි පවතීද? ලොකයෙහි යමක් ප්‍රිය ස්වභාව ඇත්තේ ද, සැප ස්වභාව ඇත්තේද, එහි උපදිනු ලබන්නා වූ මේ තෘෂ්ණාව උපදියි. පවතිනු ලබන්නාවූ මේ තෘෂ්ණාව පවතී.

මේ ලොකයෙහි චක්ෂුරාදීන්හි මමත්වයෙන් හෙවත් තමා අයත් බැවින් වරදවාගෙන මූලාවූ සැප සම්පත් ඇති දෙව් මිනිස් භවයන්හි පිහිටි සත්ත්වයෝ චක්ෂුප්‍රසාද සහිතවූ මාංස පිණ්ඩය නම් වූ මේ ඇස, කැටපත් ආදියෙන් බලා පිරිසිදුවූ නිල්, රන්, රතු, කළු, සුදු පැහැ ඇත්තාවූ රන් විමනෙක විවෘත කළ මිණි සී මැදුරක් මෙන් හඟින්නාහුය. එපරිද්දෙන්ම සොතප්‍රසාද සහිතවූ කර්ණ පිණ්ඩය රිදී නළ සිදුරක් මෙන්ද රන් හවඩි පටක් මෙන්ද හඟින්නාහුය, උස් වූ, දික් වූ නැහැය ඇති සත්ත්වයෝ ඝ්‍රාණප්‍රසාද සහිතවූ මාංස පිණ්ඩය හෙවත් නැහැය, වටා තුබූ හිරියල් වැටියක් මෙන්ද, ජිව්හා ප්‍රසාද සහිතවූ දිව, රක්ත වර්ණ කම්බල වස්ත්‍ර පටලයක් මෙන්ද, මොළොක්, සිනිඳු, මිහිරි රස විඳින්නෙකු මෙන්ද, කාය ප්‍රසාද සහිතවූ ශරීරය තරුණ සල් රුකක් මෙන්ද, රන් තොරණක් මෙන්ද, හඟින්නාහුය. සිතද, අනිකෙකුගේ සිත හා නොසමකොට, උදාරවූවක් කොට හඟියි. රූපාලම්බනය, ස්වර්ණ කර්ණිකාර පුෂ්පාදීන්ගේ වර්ණයක්හු මෙන්ද, ශබ්දාලම්බනය, මත්වූ කුරවී කොවුල් හඬ මෙන්ද, මඳ හඬින් පිඹිනලද රුවන් වස්දඬු හඬක් මෙන්ද, චතු සමුට්ඨානික ගන්ධ රස, පොට්ඨබ්බාදි ආලම්බනයෝ අන්‍යවූ කවරෙකුහට ඇද්දැයි යනාදී වශයෙන් හඟින්නාහුය. මෙසේ හඟින්නාවූ ඒ සත්ත්වයන්ට, ඒ චක්ෂුරාදිහු ප්‍රිය ස්වභාව ඇත්තාහු වශයෙන් ද, සැප ස්වභාව ඇත්තාහු වශයෙන්ද හැඟීමක් ඇති කල්හි ඒ චක්ෂුරාදීන්හි නූපන්නාවූ තෘෂ්ණාව උපදී. උපන්නාවූ තෘෂ්ණාවද, නැවත නැවත පැවතීම් වශයෙන් බැස ගනී. එහෙයින් යමක් ප්‍රිය ස්වභාව ඇත්තේද,

සැප සවභාව ඇත්තේද, එහි උපදිනු ලබන්නාවූ මේ තෘෂ්ණාව උපදියි. පවතිනු ලබන්නාවූ මේ තෘෂ්ණාව පවතියයි වදාරන ලදී.

මෙසේ, **චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, මන** යන ෂඩ්විධ අධ්‍යාත්මායතනයන්හිද,

**රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම** යන ෂඩ්විධ බාහිර ආයතනයන්හිද,

**චක්ඛු විඤ්ඤාණ, සොත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ, මනො විඤ්ඤාණ** යන ෂඩ්විධ විඤ්ඤාණයන්හිද,

**චක්ඛු සම්ඵස්ස, සොත සම්ඵස්ස, ඝාණ සම්ඵස්ස, ජිව්හා සම්ඵස්ස, කාය සම්ඵස්ස, මනො සම්ඵස්ස** යන ෂඩ්විධ සම්ඵස්සයන්හිද,

**චක්ඛු සම්ඵස්සජා වෙදනා, සොත සම්ඵස්සජා වෙදනා ඝාණ සම්ඵස්සජා වෙදනා, ජිව්හා සම්ඵස්සජා වෙදනා, කාය සම්ඵස්සජා වෙදනා, මනො සම්ඵස්සජා වෙදනා** යන ෂඩ්විධ වෙදනාවන්හිද,

**රූප සංඥා, ශබ්ද සංඥා, ගන්ධ සංඥා, රස සංඥා, ඵොට්ඨබ්බ සංඥා, ධම්ම සංඥා** යන ෂඩ්විධ සංඥාවන්හිද,

**රූප සඤ්චෙතනා, ශබ්ද සඤ්චෙතනා, ගන්ධ සඤ්චෙතනා, රස සඤ්චෙතනා, ඵොට්ඨබ්බ සඤ්චෙතනා, ධම්ම සඤ්චෙතනා** යන ෂඩ්විධ චෙතනාවන්හිද,

**රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා ඵොට්ඨබ්බ තණ්හා, ධම්ම තණ්හා** යන ෂට්විධ තණ්හාවන්හිද,

**රූප විතක්ක, ශබ්ද විතක්ක, ගන්ධ විතක්ක, රස විතක්ක, ඵොට්ඨබ්බ විතක්ක, ධම්ම විතක්ක** යන ෂඩ්විධ විතක්කයන්හිද,

**රූප විචාරය, ශබ්ද විචාරය, ගන්ධ විචාරය, රස විචාරය, පොට්ඨබ්බ විචාරය, ධම්ම විචාරය** යන ෂඩ්විධ විචාරයන්හිද,

යන සැට තැන්හි ප්‍රිය ස්වභාවය, **සැප** ස්වභාවය **ඇත්තේ** යයි ගත් කල්හි **උපදිනු ලබන්නාවූ** තෘෂ්ණාව **ඒ** සැට තැන්හි උපදී. පවතිනු **ලබන්නාහු** තෘෂ්ණාව **ඒ** සැට තැන්හි පවතී.

මෙපරිද්දෙන් සෑම තැනෙක්හි උපදින්නාවූද, පවතින් නාවූද පුනර්භවය ඇති කරන්නාවූද, **නන්දිරාගය** හා යුක්තවූද, ඒ ඒ උපන් ආත්ම භාවයෙහි ඇලෙන්නාවූද, කාම තෘෂ්ණා භව තෘෂ්ණා, විභව තෘෂ්ණා වශයෙන් ත්‍රිවිධවූ මේ තෘෂ්ණා තොමෝ සමුදයාර්‍ය්‍ය සත්‍යය යයි වදාරන ලදී.

## දුක්ඛ නිරොධාර්‍ය්‍ය සත්‍යය

**කාම තෘෂ්ණා,** භව **තෘෂ්ණා,** විභව **තෘෂ්ණා** වශයෙන් ත්‍රිවිධවූ තෘෂ්ණාවගේම යම් **අශෙෂ විරාග නිරොධයක්** හෙවත් නිවණට පැමිණ, අරමුණුකොට, ඉතිරි නොවී **ක්‍ෂයවීම්** වශයෙන් පහ **කිරිමක්,** නිරුඩ කිරීමක් **වේද, ත්‍යාගය** හෙවත් තෘෂ්ණාව **අනපෙක්‍ෂ** භාවයෙන් අත්හරිනු **ලැබේද, පටිනිස්සග්ගය** හෙවත් **නැවත** නො පවත්නා පරිද්දෙන් දුරලීම් වශයෙන් බැහැර **ලනු ලැබේද, මුක්තිය** හෙවත් බන්ධන භූතවූ තෘෂ්ණාව කෙරෙන් මිදේද, නිදහස් වේද, **අනාලය** හෙවත් නිකාන්ති වශයෙන් නො ඇලේද, මෙය **දුක්ඛ නිරොධාර්‍ය්‍ය සත්‍යය නම් වේ**

චක්ඛු, සොතාදී වූ සැට තැනෙක්හි, ප්‍රිය **ස්වභාව** වශයෙන්ද, සැප **ස්වභාව වශයෙන්ද** ගත් කල්හි යම් **තෘෂ්ණාවක් උපදීද,** යම් **තෘෂ්ණාවක් පවතීද,** ඒ සැට **තැන්හිම, පහවනු ලබන්නාවූ** මේ **තෘෂ්ණාව** පහ **වේ.** නැතිවනු **ලබන්නාවූ** මේ **තෘෂ්ණාව නැති** වේ.

යම් රුකක්හුගේ මූල උපද්‍රව රහිතවූ කල්හි, තහවුරුවූ කල්හි ඒ වෘක්ෂය මතුභාගයෙහි සිඳිනලද්දේ වීනමුත් නැවත යම්සේ වැඩේද, එපරිද්දෙන් තෘෂ්ණා සඞ්ඛ්‍යාතවූ අනුසය කෙලශය, රහත්මග නුවණින් සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් දුරු නොකළ කල්හි ජාති ආදි ප්‍රභෙදවත්වූ මේ දුක නැවත නැවත උපදී.

එහෙයින් දුක්ඛ නිරොධය හෙවත් දුක් නැති කිරීම් දක්වා වදාරන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුක් උපදවන හේතුව වූ තෘෂ්ණාව නැති කිරීමෙන් දුක්ඛ නිරොධය වන බව දැක්වීම පිණිස තෘෂ්ණාවගේ අශෙෂ විරාග නිරොධාදී වශයෙන් දෙශනාකරනලද බව දතයුතු.

තථාගතවූ බුදුවරයෝ සිංහයන් බඳු පැවතුම් ඇතියහ. සිංහ තෙමේ විදින්නාවූ වෙධකයා කෙරෙහි පිළිපදනේය. හීය කෙරෙහි නො පිළිපදනේය. බුදුවරයෝද දුක නැති කරන්නාහු, දුක් නැති කිරීමත් දක්වා වදාරන්නාහු හේතුවෙහි පිළිපදිති ඵලයෙහි නො පිළිපදිති. ශාසනයෙන් බාහිරවූ අන්‍ය ලබ්ධි ගත් තීර්ථකයෝ වනාහි ශුනකයන් බඳු පැවතුම් ඇතියහ ශුනක තෙමේ කැටගල්හි පිළිපදනේයි පහර දෙන්නහු කෙරෙහි නො පිළිපදනේයි. එමෙන්ම ඒ අන්‍ය තීර්ථකයෝ දුක් නැති කරන්නාහු දුක් නැති කිරීමත් හෙන ඇර දක්වන්නාහු, ආත්මකලමථානුයොගයෙන්ද ඒ ආත්මකලමථානුයොග සඞ්ඛ්‍යාත ඵලයම දෙශනා කිරීමෙන්ද, ඵලයෙහි පිළිපදිති හේතුවෙහි නො පිළිපදිති.

දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යය සඞ්ඛ්‍යාතවූ මේ නිර්වාණ ධර්මය එකම ධර්මයක් වූවද, ඒ නිර්වාණයාගේ පර්‍ය්‍යාය වචනයෝ සියළු සඞ්ඛත ධර්මයන්ගේ නාමයන්ට ප්‍රතිපක්ෂ වශයෙන් අනෙකප්‍රකාර වේ. එනම්; **අසෙසවිරාග නිරොධය, ත්‍යාගය පටිනිස්සග්ගය, මුත්තිය, අනාලය, රාගක්ඛය, දොසක්ඛය, මොහක්ඛය, තණ්හක්ඛය, අනුප්පාදය, අප්පවත්තය, අනිමිත්තය, අප්පණිහිතය, අනායූහනය, අප්පටිසන්ධිය,**

**අනුප්පන්තිය, අගතිය, අජාතය, අජරය, අබ්‍යාධිය, අමතය, අසොකය, අපරිදෙවය, අනුපායාසය, අසංකිලිට්ඨය** යනාදීහුය.

පුරුෂයෙක් කෙතෙහි හටගත් තිත්ත ලබු වැලක් දැක අග සිට මුල සොයා සිඳින්නේ නම් ඒ තිත්ත ලබු වැල පිළිවෙලින් මැලවී තිත්ත ලබු වැල ඇතැයි යන ව්‍යවහාරය නැතිවීමට යන්නීය. එසේ තිත්ත ලබු වැල ඇතැයි යන ව්‍යවහාරය නැතිවීමට ගිය කල්හි, ඒ කෙතෙහි තිත්ත ලබු වැල නිරුද්ධවූය, ප්‍රහීනවූය යන මේ වචනය යම්සේ කියනු ලබන්නේද, එපරිද්දෙන්ම තිත්ත ලබු වැල මෙන් චක්ෂුරාදීන්හි යම් තෘෂ්ණාවක් උපදීද ඒ තෘෂ්ණාව චතුර්විධ ආර්‍ය්‍ය මාර්ගයෙන් මුලින් සිඳින ලද්දී නිර්වාණය නිසා නොපැවැත්මට යේ. මෙබඳු ස්වභාවයට පැමිණියාවූ ඒ තෘෂ්ණාව වනාහි ඒ චක්ෂුරාදී වස්තූන්හි කෙතෙහි තිත්ත ලබු වැල නොපැණෙන්නාක් මෙන් නොපැණේ. මෙහි තිත්ත ලබු වැලගේ නොපැවැත්ම කැමති පුරුෂයා මෙන් ආර්‍ය්‍ය මාර්ගය දතයුතු. තිත්ත ලබු වැල නොපැවැත්මට තැඹුරු සිත් ඇති පුද්ගලයාගේ මුලින් සිඳීම මෙන් නිවන් අරමුණුකොට ඇති ඒ ඒ ආර්‍ය්‍ය මාර්ගයාගේ තෘෂ්ණා ප්‍රහාණය දතයුතු. ඒ තිත්ත ලබු වැලගේ නොපැවැත්ම මෙන් තෘෂ්ණාවගේ අප්‍රවෘත්තිභූතවූ නිර්වාණය දතයුතු.

තවද, වනයෙහි සැඟවී සිටි සොරුන් අල්වාගෙනවුත් නගරයාගේ දකුණු වාසල් දොරෙහි සිටුවා නසන්නාහුය. එසේ නැසීමෙන් පසු වනයෙහි සොරු මළහයි කියා හෝ මරවන ලදහයි කියා හෝ කියනු ලබන්නාහුය එපරිද්දෙන්ම, වනයෙහි සොරුන් මෙන් චක්ෂුරාදි වස්තූන්හි හටගත්තාවූ යම් තෘෂ්ණාවක් ඇද්ද, ඒ තෘෂ්ණාව දකුණු වාසල් දොරෙහි මළාවූ සොරුන් මෙන් නිර්වාණයට පැමිණ, නිවණ අරමුණු කොට නිරුද්ධව ගිය බැවින් නිර්වාණයෙහි නිරුද්ධ වූවාය. මෙපරිද්දෙන් නිරුද්ධවූ තෘෂ්ණාව වනාහි ඒ චක්ෂුරාදි වස්තූන්හිම තෘෂ්ණාවගේ නිරොධය වන බව දක්වා වදාරන ලදී.

# දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදා
## ආර්‍ය්‍ය සත්‍යය

අඞ්ග අටකින් යුත් මේ එකම ආර්‍ය්‍ය මාර්ගය, දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදා ආර්‍ය්‍ය සත්‍යය නම් වේ. ඒ අඞ්ග අට නම්:

1. **සම්මා දිට්ඨි**
2. **සම්මා සඞ්කප්ප**
3. **සම්මා වාචා**
4. **සම්මා කම්මන්ත**
5. **සම්මා ආජීව**
6. **සම්මා වායාම**
7. **සම්මා සති**
8. **සම්මා සමාධි**

මෙයටම **මධ්‍යම ප්‍රතිපදා** යයිද; **ආර්‍ය්‍ය මාර්ග** යයිද, **මාර්ග සත්‍යය** යයිද කියනු ලැබේ. සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන සතර මාර්ගයන් විසින් ප්‍රහීණ කටයුතුවූ කෙලෙශයන් කෙරෙන් දුරුවන බැවින්ද, පුද්ගලයාගේ ආර්‍ය්‍ය භාවය සිද්ධ කරන බැවින්ද, ආර්‍ය්‍ය ඵලය ලබාදෙන බැවින්ද මේ මාර්ගාඞ්ගයෝ අට දෙනාම ආර්‍ය්‍ය මාර්ගාඞ්ගයෝ යයි කියනු ලැබේ. එහෙයින් අඩුත් නොවූ වැඩිත් නොවූ අඞ්ග අටකින්ම යුත් මේ මාර්ගයට **ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය** යයි ව්‍යවහාර කරන බව දතයුතු. නිවන් කැමැති පුද්ගලයන් විසින් යම් ධර්මයක් සොයනු ලැබේද, නොහොත් නිර්වාණය සොයාද, නොහොත් කෙලෙසුන් නසමින් නිවණට යේද, එහෙයින් ඒ ධර්මය තෙම **මාර්ගය** නම් වේ. මේ අඞ්ග හෙවත් අවයවයන් ගෙන් විනිර්මුක්තවූ නිර්වාණ මාර්ගයක් නම් නැත්තේය

**ලක්ෂණ** වශයෙන් වනාහි මේ මාර්ගාඞ්ග අටදෙනා අතුරෙන්:

**සම්මාදිට්ඨිය**- සම්මාදස්සන ලක්ෂණ හෙවත් ඇති සැටි දැකීම් ලක්ෂණ ඇත්තීය.

**සම්මාසඞ්කප්පය**- අභිනිරොපන ලක්ෂණ හෙවත් මොනවට අරමුණු කරා නගන ලක්ෂණ ඇත්තීය.

**සම්මා වාචා**- සම්මා පරිග්ගහ ලක්ෂණ හෙවත් තමා අයත් කළ දනන්ද, සම්ප්‍රයුක්ත ධර්මයන්ද මොනවට තමා අයත් කොට ගන්නා ලක්ෂණ ඇත්තීය.

**සම්මා කම්මන්තය**- සම්මා සමුට්ඨාපන ලක්ෂණ හෙවත් සහජාත ධර්මයන් මොනවට නිපදවීම් ලක්ෂණ ඇත්තීය

**සම්මා ආජීවය**- සම්මා වොදපන ලක්ෂණය හෙවත් කාය වාග් කර්මාදීන් මොනවට පිරිසිදු කරවන ලක්ෂණ ඇත්තේය.

**සම්මා වායාමය**- සම්මා පග්ගහ ලක්ෂණ හෙවත් සම්ප්‍රයුක්ත ධර්මයන්ට මොනවට අනුබල දීම් ලක්ෂණ ඇත්තේය.

**සම්මා සතිය**- සම්මා උපට්ඨාන ලක්ෂණ හෙවත් අරමුණ මොනවට වැටහීම් ලක්ෂණ ඇත්තීය.

**සම්මා සමාධිය**- සම්මා සමාධාන ලක්ෂණ හෙවත් අරමුණෙහි මොනවට පිහිටීම් ලක්ෂණ ඇත්තීය.

**කෘත්‍ය** වශයෙන් වනාහි ඒ සම්මාදිට්ඨි ආදීවූ මාර්ගාඞ්ග යන් අට දෙනා අතුරෙන් එක් එක් මාර්ගාඞ්ගයක්හුගේ කෘත්‍යයෝ තුන් තුන් දෙන බැගින් වෙති.

**සම්මා දිට්ඨිය**- 1. තමහට ප්‍රතිපක්ෂවූ කෙලෙසුන් සමග මිථ්‍යා දෘෂ්ටිය දුරු කෙරෙයි

1. නිර්වාණය අරමුණ වූවක් කෙරෙයි.

2 තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන්ද නිවන් මුවහ කරන මුළාව පහකිරීම් හේතුවෙන් නුමුළා වශයෙන් දකී.

සම්‍යක් සඞ්කල්පාදීහුද එසේම තම තමන්ට ප්‍රතිපක්‍ෂවූ කෙලෙශයන් හා සමග මිථ්‍යා සඞ්කල්පාදීන්ද දුරු කෙරෙත්. නිර්වාණයත් අරමුණු වූවක්හු කෙරෙත්. විශෙෂ වශයෙන් චතාහි **සම්‍යක් සඞ්කල්පය** සහජාත ධර්මයන් අරමුණට මොනවට නගයි **සම්‍යග් වාග් විරතිය** මනාකොට නමා අයත් කොට ගන්නීය. **සම්‍යක් කර්මාන්තය** මනාකොට නිෂ්පාදනය කෙරෙයි. **සම්‍යක් ආජීව විරතිය** මනාකොට පිරිසිදු කරවයි. **සම්‍යක් ව්‍යායාමය** මනාකොට අනුබල දීම කෙරෙයි **සම්‍යක් ස්මෘතිය** මනාකොට වටහාගනී. **සම්‍යක් සමාධිය** මනාකොට පිහිටීම කෙරෙයි.

එසේම මේ **සම්‍යග් දෘෂ්ටිය** ආර්‍ය්‍ය මාර්ගයට පූර්වවූ කාලයෙහි නොයෙක් චිත්තක්‍ෂණයන්හි නොයෙක් අරමුණු ඇත්තී වේ. මාර්ග සිත උපන් ඇසිල්ලෙහි එකම චිත්තක්‍ෂණයෙහි එකම අරමුණක් ඇත්තී වේ. මේ මාර්ග ඥානය දුක්ඛ සත්‍යය පිරිසිඳ දැනීම සමුදය සත්‍යය පහකිරීම, නිරොධ සත්‍යය සාක්‍ෂාත් කිරීම, මාර්ග සත්‍යය වැඩීම යනාදි වශයෙන් චතුර්විධ කෘත්‍යයන් සිද්ධ කරන හෙයින් දුක්ඛෙ ඤාණං, දුක්ඛ සමුදයෙ ඤාණං, දුක්ඛ නිරොධෙ ඤාණං, දුක්ඛ නිරොධගාමිනි පටිපදාය ඤාණං යන චතුර්විධ නාමයන් ලබයි. **සම්‍යක් සඞ්කල්පාදීහුද** ආර්‍ය්‍ය මාර්ගයට පූර්වවූ කාලයෙහි නොයෙක් චිත්තක්‍ෂණයන්හි, නොයෙක් අරමුණු ඇත්තාහු වෙත්. මාර්ග චිත්තය උපන් ඇසිල්-ලෙහි එකම චිත්තක්‍ෂණයෙහි එකම අරමුණක් ඇත්තාහු වෙත්.

මේ මාර්ගාඞ්ගයන් අතුරෙන් **සම්‍යග් සඞ්කල්පය** කෘත්‍ය වශයෙන් කාම සඞ්කල්ප, ව්‍යාපාද සඞ්කල්ප, විහිංසා සඞ්කල්පාදීන් ප්‍රහාණය කරන හෙයින් නෙක්ඛම්ම සඞ්කප්ප, අව්‍යාපාද සඞ්කප්ප, අවිහිංසා සංඞකප්ප යන ත්‍රිවිධ නාම යන් ලබයි.

**සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව** යන මාර්ගාඞ්ගයෝ තිදෙන ආර්‍ය්‍යමාර්ගයට පූර්වවූ කාලයෙහි

නොයෙක් චිත්තක්ෂණයන්හි නොයෙක් අරමුණු ඇත්තාහු වෙත්. එසේම විරතීහුද වෙත්. චේතනාවෝද වෙත්. එසේ නමුදු මාර්ග චිත්තය උපන් ඇසිල්ලෙහි විරතීහුම වෙත්. බොරුකීම් ආදියෙන් වළක්නා කල්හි විරතීහු වෙත්. සුභාෂිතාදී වූ බස් බිණීම් ආදි කල්හි චේතනාවෝ වෙත්. මාර්ගක්ෂණයෙහි මාර්ග භාවයෙන් විරතීහුම වෙත්. මාර්ගක්ෂණයෙහි වූ චේතනාවගේ සම්‍යග් වචන, සම්‍යග් කර්මාන්ත, සම්‍යග් ආජීව යන කෘත්‍යයන් සම්පාදනය කරන ස්වභාවයක් නැති බැවින්ද, චේතනාවගේ සම්‍යග් වචනාදී භාවය සිද්ධ නොවන හෙයින්ද, එසේ සිද්ධ බවක් ඇති කල්හිත් ඒ ත්‍රිවිධ අඞ්ග භාවයම සිද්ධ නොවන හෙයින්ද චේතනාවගේ සම්‍යග් වචනාදී භාවයක් නැතැයි දක්වන ලදී.

**සම්මා වායාමය,** සතර සම්‍යග් ප්‍රධන් වීර්‍ය්‍යයන්ගේ වශයෙන් සතර කෘත්‍යයන් සිද්ධ කරන බැවින් ඒ සතර නාමයම ලබන්නේය.

**සම්මා සතියද** සතර සතිපට්ඨානයන්ගේ වශයෙන් සතර කෘත්‍යයක් සිද්ධකරන හෙයින් ඒ සතර නාමයන්ම ලබයි.

**සම්මා සමාධිය** වනාහි මාර්ගයාගේ පූර්වභාගයෙහිද, මාර්ගක්ෂණයෙහිද සම්‍යග් සමාධිය වේමැයි. සමාධියට උපකාර වූ අරමුණට නැඟීම් ආදි වශයෙන් කෘත්‍ය ඇති විතර්ක විචාර, ප්‍රීති, සුඛ, උපෙක්ඛා වශයෙන් ධ්‍යාන සතෙරකින් සම්‍යග් සමාධි තෙම බෙදුනේවී නමුත්. ව්‍යායාමය, නූපන් අකුසල් නො ඉපිදවීම් ආදී සතර වීර්‍ය්‍යයන් සිදුකරන්නාසේ, සමෘතිය, අසුභවූ, අසුඛවූ, අනිත්‍යවූ අනාත්මවූ කාය වේදනා චිත්ත ධර්මයන්හි සුභ, සුඛ, නිත්‍ය ආත්ම සංඥාවන් පහකිරීමැයි කියනලද සතර කිච්චයන් කිස සිදුකරන්නාසේ සමාධිය ධ්‍යාන චතුෂ්කයාගේ සමාධාන කෘත්‍ය සිද්ධ නොකෙරේ. එහෙයින් මාර්ගයට පූර්වභාගයෙහි ප්‍රථමධ්‍යාන සමාධි චිත්තයෙහිවූ

සමාධිය ප්‍රථමධ්‍යාන සමාධිය වේමය, මාර්ගක්ෂණයෙහිද ප්‍රථමධ්‍යාන සමාධි චිත්තයෙහිවූ සමාධිය ප්‍රථමධ්‍යාන සමාධිය වේමය. පූර්ව භාගයෙහි විතීය, තෘතීය, චතුර්ථ ධ්‍යානසමාධීන්හිද මාර්ගක්ෂණයෙහිද මේ අනුසාරයෙන්ම දතයුතු.

අටවැදෑරුම්වූ මේ මාර්ගාඞ්ග ධර්මයන් අතුරෙහි, භාග්‍ය වතුන් වහන්සේ විසින්, නිවන් පසක් කිරීම පිණිස පිළිපන් යොගාවචර පුද්ගලයා හට බොහෝවූ උපකාර ඇති බැවින් පළමුකොට සම්‍යක් දෘෂ්ටිය වදාරන ලදී. මේ සම්මාදිට්ඨියට ප්‍රඥපජ්ජෝතය, ප්‍රඥ ශස්ත්‍රය කියාද වදාරණ ලදී. එහෙයින් මාර්ගයට පූර්වභාගයෙහි විදර්ශනා ඥනය යයි කියන ලද මේ සම්‍යග් දෘෂ්ටිය කරණකොට ගෙන අවිද්‍යාන්ධකාරය හෙවත් මොහය නසා, කෙලෙස් සොරුන්ද විනාශ කරමින්, කෙලෙස් බිය නැති හෙයින් නිර්භීයව, යොගාවචර පුද්ගලතෙම නිවණට පැමිණේ එහෙයින් නිවන් පසක් කිරීම පිණිස පිළිපන් යොගාවචර පුද්ගලයා හට බොහෝවූ උපකාර ඇති බැවින් පළමුකොට සම්මාදිට්ඨිය වදාරන ලදැයි දතයුතු.

**සම්මා සඞ්කල්පය** වනාහි යම්හෙයකින් ඒ සම්‍යග් දෘෂ්ටියට බොහෝවූ උපකාර ඇත්තේද, එහෙයින් සම්මාදිට්ඨියට අනතුරුව සම්මාසඞ්කල්පය වදාරන ලදී. රන් කරුවෙක් කහවණුවක් අතින් ගෙන පෙරළ පෙරළා ඇසින් බලා මේ කහවණුව සැබෑ කහවණුවෙක, මේ කහවණුව බොරු කහවණුවෙක යනාදි වශයෙන් දැන-ගන්නාක් මෙන්, යොගාවචර තෙමේද මාර්ගයට පූර්වභාග-යෙහි විතර්කය කරණ කොටගෙන කල්පනාකොට විදර්ශනා ඥනයෙන් බලන්නේ මේ ධර්මයෝ කාමාවචරය, මේ ධර්මයෝ රූපාවචරය යනාදී වශයෙන් දනී.

එමෙන්ම පුරුෂයෙකු විසින් කෙළවර අල්වාගෙන පෙරළ පෙරළා දෙනලද මහරුක, වඩු තෙම වැයෙන් සැස කැමැතිවූ කටයුත්තෙහි එළවන්නාක් මෙන් විතර්කයා විසින් කල්පනා කොට අරමුණට නංවා දෙනලද ධර්මයන් යෝගාවචර පුද්ගල තෙම විදර්ශනා ඥානයෙන් මේ ධර්මයෝ කාමාවචරය යනාදී වශයෙන් පිරිසිඳ දැන විදර්ශනා භාවනා කර්මයෙහි යෙදෙන්නේය.

සම්‍යග් සඞ්කල්පය, යම්සේ සම්‍යග්දෘෂ්ටියට උපකාර වේද, එපරිද්දෙන්ම සම්‍යග් වචනයටද උපකාර ඇත්තේ වේ. පළමුව කල්පනා කොට, පරීක්ෂා කොට පසුව වාග් භේදය කරන හෙයින් සම්මා සඞ්කප්පයට අනතුරුව සම්‍යග් වචනය වදාරන ලදී එමෙන්ම යම්හෙයකින් මෙනම් මෙනම් කටයුත්ත කරන්නෙමුයයි පළමුකොට වචනයෙන් නියමකොට ගෙන කර්මාන්තයන්හි යෙදේද, එහෙයින් සම්‍යග් වචනය සංඛ්‍යාත වූ විරතිය කායික ක්‍රියා සංවිධායක වූ සම්‍යග් කර්මාන්තයට බොහෝවූ උපකාර ඇත්තීය. එහෙයින් සම්‍යග් වචනයට අනතුරුව **සම්‍යග් කර්මාන්තය** වදාරන ලදී.

චතුර්විධවූ වාග්දුශ්චරිතයන් හා ත්‍රිවිධවූ කාය දුශ්චරිතයන් දුරු කරමින් විප්‍රකාරවූ වාග් සුචරිතයන් පුරන්නාහටම යම් හෙයකින් ආජීවට්ඨමක ශීලය හෙවත් ආජීවය අටවැනි කොට ඇති ශීලය සම්පූර්ණ වේද, වාග් සුචරිත කාය සුචරිත නොපුරන්නාහට එය සම්පූර්ණ නොවේද, එහෙයින් සම්මා වාචා, සම්මා කම්මන්ත යන අඞ්ග දෙකට අනතුරුව **සම්මා ආජීවය** වදාරන ලදී.

මෙපරිද්දෙන් පිරිසිදුවූ ආජීවය ඇති පුද්ගලයා විසින් මේ මාගේ ආජීවය දැන් පිරිසිදු වීය, මෙපමණකින් මා සතුටු

නොවිය යුතුය, නිද සිටින්නෙකු මෙන්ද පමාවන්නකු මෙන්ද වාසය කිරීම නුසුදුසුය, ඒකාන්තයෙන්ම සතර ඉරියව් වෙහිම වීර්‍ය්‍ය කටයුතුයයි මෙනෙහි කොට සතර සම්‍යග් ප්‍රධන් වීර්‍ය්‍ය ආරම්භ කරන්නේය. එහෙයින් සම්මා ආජීවයට අනතුරුව **සම්මා වායාමය** වදාළ සේක.

මෙසේ පටන්ගන්නාලද වීර්‍ය්‍යය ඇති පුද්ගලයා විසින් රූපකාය මුල් කොට ඇති සතර වස්තූන්හි හෙවත් චතුර්විධ නිශ්‍රයස්ථානයන්හි ස්මෘති මනා කොට පිහිටුවා ගතයුතු බව දක්වීම පිණිස සම්මා වායාමයට අනතුරුව **සම්මා සතිය** වදාරන ලදී.

යම්හෙයකින් සම්මා සතියෙහි වශයෙන් මනාකොට පිහිටුවාගත් සිහි ඇති පුද්ගලයා විසින් සමාධියට උපකාරවූද උපකාර නොවූද ධර්මයන් මනාකොට සළකා එකම අරමුණෙක්හි නොහොත් නිර්වාණාලම්බනයෙහි සිත පිහිටුවා ගැනීමට පොහොසත් වන හෙයින් සම්මා සතියට අනතුරුව **සම්මා සමාධිය** වදාරන ලදී.

මෙසේ සම්මාදිට්ඨිය ආදිකොට ඇති මාර්ගාඞ්ගයෝ අටදෙනා මේ පිළිවෙලින් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනාකොට වදාරනලද බව දතයුතු.

**සම්මා දිට්ඨිය** දක්වා වදාරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ දුක්ඛෙ ඤාණං, දුක්ඛ සමුදයෙ ඤාණං, දුක්ඛ නිරොධෙ ඤාණං, දුක්ඛ නිරොධගාමිණී පටිපදාය ඤාණං යනාදි වශයෙන් සිව්සස් පිළිබඳ ඤාණය සම්මා දිට්ඨිය යයි දක්වන ලද්දීය ඒ චතුස්සත්‍යයන් අතුරෙන් දුක්ඛ සමුදය යන පළමු සත්‍යයෝ දෙදෙන වට්ට හෙවත් වෘත්ත සඞ්ඛ්‍යාත ලෞකික ධර්මයෝ වෙත්. පැසුළුවූ නිරොධ මාර්ග සත්‍යයෝ

දෙදෙන විවට්ට හෙවත් විවෘතාන සඞ්ඛ්‍යාත ලොකොත්තර ධර්මයෝ වෙත්. මේ වට්ට විවට්ට යයි කියනලද ලෞකික ලොකොත්තර ධර්මයන් අතුරෙන් වට්ටයයි කියනලද ලෞකික ධර්මයන් විෂයෙහි භික්ෂුවගේ කර්මස්ථානාභිනිවෙශය හෙවත් කර්මස්ථානයට ප්‍රවේශය වන්නේය. විවට්ට නම් ලද ලොකොත්තර ධර්මයන් විෂයෙහි කර්මස්ථානාභිනිවෙශයක් නැත. දුක්ඛ සමුදය සත්‍යයන් අතුරෙන් පඤ්චස්කන්ධයෝ දුක්ඛ සත්‍යය යයිද, තෘෂ්ණාව සමුදය සත්‍යය යයිද, මෙසේ සංක්ෂෙප වශයෙන්ද, විස්තර වශයෙන්ද ආචාර්‍ය්‍යයන් වහන්සේ වෙතින් උගෙන නැවත නැවත වාචොද්ගත කරන්නාවූ යොගාවචර පුද්ගලතෙම භාවනා කර්මය හෙවත් කමටහන වැඩීම කෙරෙයි. නිරොධ, මාර්ග සත්‍යයන් දෙදෙනා අතුරෙන් නිරොධ සත්‍යය ඉෂ්ටය, කාන්තය, මනාපය. මාර්ග සත්‍යයද ඉෂ්ටය, කාන්තය මනාපය කියා ඇසීමෙන්ම භාවනා කර්මය කෙරෙයි. හෙතෙම මෙපරිද්දෙන් අර්ථ උගෙනීමෙන්, අර්ථ ඇසීමෙන් කමටහන් වඩන්නේ චතුස්සත්‍යයන් එක් ප්‍රතිවෙධඥානයකින් ප්‍රතිවෙධයකෙරෙයි. එක් අභිසමය ඥානයකින් අභිසමය හෙවත් විශිෂ්ටාවබොධය කෙරෙයි. දුක්ඛ සත්‍යය පිරිසිඳීම් වශයෙන් ප්‍රතිවෙධ ඥානයෙන් ප්‍රතිවෙධය කෙරෙයි. සමුදය සත්‍යය ප්‍රහාණය කිරීම් වශයෙන් ප්‍රතිවෙධ ඥානයෙන් ප්‍රතිවෙධය කෙරෙයි. නිරොධ සත්‍යය සාක්ෂාත් කිරීම් වශයෙන් ප්‍රතිවෙධ ඥානයෙන් ප්‍රතිවෙධය කෙරෙයි. මාර්ග සත්‍යය භාවනා හෙවත් වැඞීම් වශයෙන් ප්‍රතිවෙධ ඥානයෙන් ප්‍රතිවෙධ කෙරෙයි. එසේම දුක්ඛ සත්‍යය පිරිසිඳීම් වශයෙන් පැවති අභිසමය ඥානයෙන් අභිසමය හෙවත් මනාකොට අවබොධය කෙරෙයි. සමුදය සත්‍යය ප්‍රහාණය කිරීම් වශයෙන් පැවති අභිසමය ඥානයෙන් මනාකොට අවබොධය කෙරෙයි.

නිරොධ සත්‍යය පසක් කිරීම් වශයෙන් පැවති අභිසමය ඥානයෙන් මනාකොට අවබොධය කෙරෙයි. මාර්ගසත්‍යය වැඩීම් වශයෙන් පැවති අභිසමය ඥානයෙන් මනාකොට අවබොධය කෙරෙයි. මෙසේ ඒ භික්‍ෂුවගේ පූර්වභාග ප්‍රතිපදා සමයෙහි හෙවත් මාර්ගයෙන් පූර්වකාලයෙහි දුඃඛ සමුදය යන උභය සත්‍යයන්හි උගෙනීමය, පිළිවිසීමය, ඇසීමය, දැරීමය, විමසීම යයි කියනලද ප්‍රතිවෙධ ඥානය වේ. නිරොධ මාර්ග යන උභය සත්‍යයන්හි ශ්‍රවණය කිරීම් වශයෙන්ම ප්‍රතිවෙධය වේ. මාර්ග චිත්තයාගේ උත්පාදක්‍ෂණ යෙහිදී වනාහි දුඃඛ, සමුදය, මාර්ග යන ත්‍රිවිධ සත්‍යයන්හි පරිඥා, ප්‍රහාන, භාවනා කෘත්‍ය වශයෙන් ප්‍රතිවෙධය වේ. නිරොධ සත්‍යයෙහි අරමුණු කිරීම් වශයෙන් ප්‍රතිවෙධය වේ.

දුඃඛ සත්‍යය තෙම උත්පත්ති වශයෙන් ප්‍රකටය. සමුදය සත්‍යයද කණු කැමැති බව බුදිනු කැමති බව යන මේ ආදීන්ගේ වශයෙන් උපදනා හෙයින් ප්‍රකටය නමුත් ලක්‍ෂණ ප්‍රතිවෙධ වශයෙන් දුඃඛ සමුදය සත්‍යයන් දෙදෙනම ගම්භීරය. නිරොධ මාර්ග යන උභය සත්‍යයන්ගේ දක්ම පිණිස කරනු ලබන ප්‍රයත්නය, භවාග්‍රය හෙවත් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන තලය ගැනීම පිණිස අත දිගු කිරීම මෙන්ද, අවීචි නිරය පහස්නා පිණිස පා දිගු කිරීම මෙන්ද, සියක්වර පැළූ අස්ලොමක්හුගේ කෙළවරින් කෙළවර ගැලපීම මෙන්ද වේ. එහෙයින් ඒ නිරොධ මාර්ග සත්‍ය දෙදෙන දක්නට අති දුෂ්කරයහ. මෙසේ දක්නට දුෂ්කරවූ ගැඹුරුවූ චතුස්සත්‍යයන්හි උගෙනීම් පිළිවිසීම් ආදි වශයෙන් පූර්වභාග ප්‍රතිපදා සමයෙහි චතුස්සත්‍ය ඥානයාගේ උත්පත්තිය ඇතිවන බැවින් "දුක්ඛෙඤාණං" ආදි වශයෙන් වදාරන ලදි. ප්‍රතිවෙධක්‍ෂණයෙහි හෙවත් මාර්ගක්‍ෂණයෙහි එකම මාර්ග ඥානයම වේ.

**සම්මා සඞ්කප්පය** වනාහි **නෙක්ඛම්ම සඞ්කප්ප, අව්‍යාපාද සඞ්කප්ප, අවිහිංසා සඞ්කප්ප** වශයෙන් ත්‍රිවිධ වේ. කාමකොට්ඨාසයන් කෙරෙන් යම් විතර්කයෙක් නික්ම ගියේද, ඒ විතර්කය **නෙක්ඛම්ම සඞ්කප්ප** හෙවත් නෛෂ්ක්‍රම්‍ය සඞ්කප්පය නම් වේ. ද්වේෂයා කෙරෙන් යම් විතර්කයක් නික්ම ගියේද, ඒ විතර්කය **අව්‍යාපාදසඞ්කප්ප** නම් වේ. විහිංසා හෙවත් සත්ත්ව හිංසාවෙන් යම් විතර්කයක් නික්ම ගියේද ඒ විතර්කය **අවිහිංසා සඞ්කප්ප** නම් වේ මේ ත්‍රිවිධ විතර්කයන් අතුරෙන් නෛෂ්ක්‍රම්‍ය විතර්කය, කාම විතර්කයාගේ ප්‍රතිපක්ෂ ධර්මයක්ව කාම විතර්කයාගේ උත්පත්ති හේතු විනාශය කෙරෙමින් උපදී. අව්‍යාපාද විතර්කය ව්‍යාපාද විතර්කයාගේ ප්‍රතිපක්ෂ ධර්මයක්ව ව්‍යාපාද විතර්කයාගේ උත්පත්ති හේතූන් විනාශය කෙරෙමින් උපදී. අවිහිංසා විතර්කය, විහිංසා විතර්කයාගේ ප්‍රතිපක්ෂ ධර්මයෙක්ව විහිංසා විතර්කයාගේ උත්පත්ති හේතූන් විනාශය කෙරෙමින් උපදී.

කාම විතර්කයාගේ උත්පත්ති හේතු විනාශය පිණිස කාම විතර්කය හෝ අන්කිසි සංස්කාර ධර්මයක් හෝ සම්මර්ශනය කරන කාලයෙහි ඒ යොගාවචර පුද්ගලයාගේ විදර්ශනා වඩන කෙණෙහි ඒ විදර්ශනා ජවන් සිත් සමග යෙදුනාවූ විතර්කය තදඞ්ග ප්‍රහාන වශයෙන් කාමවිතර්කයාගේ උත්පත්ති හෙතු විනාශය කෙරෙමින් උපදී. විදර්ශනාව සම්පූර්ණව කෙලෙස් සංසිඳුනු කල්හි සොවාන් ආදි ආර්‍ය්‍ය මාර්ගයට පැමිණීමේදී ඒ මාර්ග චිත්තය හා යෙදුනාවූ විතර්කය තෙම සමුච්ඡෙද ප්‍රහාන වශයෙන් කාම විතර්කයාගේ උත්පත්ති හේතු විනාශය කෙරෙමින් උපදී. එපරිද්දෙන්ම ව්‍යාපාද විතර්කයාගේද විහිංසා විතර්කයාගේද උත්පත්ති

හේතු විනාශය පිණිස ව්‍යාපාද විතර්කය හෝ විහිංසා විතර්කය හෝ අන්කිසි සංස්කාර ධර්මයක් හෝ සම්මර්ශනය කරන කල්හි විදර්ශනා ජවන් සිත්හි යෙදුන විතර්කය ඒ ව්‍යාපාද විහිංසා විතර්කයන් තදඞ්ග ප්‍රහාන වශයෙන්ද මාර්ගක්ෂණයේදී සමුච්ඡේද ප්‍රහාන වශයෙන්ද ව්‍යාපාද විහිංසා විතර්කයන්ගේ උත්පත්ති හේතු විනාශය කෙරෙමින් උපදින්.

කර්මස්ථාන භාවනානුයෝගි පුද්ගල තෙමේ අශුභ කර්මස්ථාන වඩා ප්‍රථම ධ්‍යානයට සමවත් කල්හි ඒ ප්‍රථම ධ්‍යාන චිත්තය හා යෙදුනාවූ විතර්කය තෙම කාම විතර්කයාගේ ප්‍රතිපක්ෂ ධර්මයෙක්ව ඉපිද විෂ්කම්භන ප්‍රහාන වශයෙන් කාම විතර්කය නසයි. ධ්‍යානය පාදක කොටගෙන විදර්ශනා වඩනා කෙණෙහි විදසුන් ජවන් සිත් සමග යෙදුනාවූ විතර්කය තෙම තදඞ්ග ප්‍රහාන වශයෙන් කාම විතර්කයාගේ ප්‍රතිපක්ෂ ධර්මයෙක් වී උපදී. විදර්ශනාව මුදුන් පැමිණ කෙලෙසුන් සංසිඳුනු කල්හි සෝවාන් ආදිවූ මාර්ග චිත්තය උපදී ඒ මාර්ගක්ෂණයේදී මාර්ග සිත හා යෙදුනාවූ විතර්කය තෙම සමුච්ඡේද ප්‍රහාන වශයෙන් කාම විතර්කයාගේ ප්‍රතිපක්ෂ ධර්මයෙක්වී උපදී. මෙය නෙක්ඛම්ම සඞ්කප්ප යයි කියනු ලැබේ මෙසේම මෛත්‍රී බ්‍රහ්ම විහාර කර්මස්ථානයෙහි පැවැති තෘතීය චතුර්ථධ්‍යානයෝ ව්‍යාපාද විතර්කයාගේ ප්‍රතිපක්ෂයෝය කරුණා බ්‍රහ්ම විහාර කර්මස්ථානයෙහි පැවති තෘතීය චතුර්ථධ්‍යානයෝ විහිංසා විතර්කයාගේ ප්‍රතිපක්ෂයෝය. මෙසේ මෛත්‍රී කරුණා බ්‍රහ්ම විහාර කර්මස්ථාන භාවනා කොට ධ්‍යාන උපදවා ඒ ධ්‍යානයන් පාදක කොට ගෙන විදසුන් වඩා මාර්ග චිත්තය උපදවන කල්හි යටකී නයින් අව්‍යාපාද සඞ්කප්ප, අවිහිංසා සඞ්කප්ප

යන් උපදනා බව දතයුතු. පූර්වභාග ප්‍රතිපදා සමයෙහිදී වෙන් වෙන්ව උපදනා මේ විතර්කයෝ මාර්ගක්ෂණයේදී එක්ව ඉපිද **සම්මා සඞ්කප්ප** යන නාමය ලබයි.

**සම්මාවාචා** යනු සතර වාග් දුශ්චරිතයන්ගෙන් වැළකීමය. මුසාවාද, පිසුණාවාච, ඵරුසාවාච, සම්ඵප්පලාප යන මේ සතර දුශ්චරිතයන්ගෙන් වෙන්වීම පූර්වභාග ප්‍රතිපදා සමයෙහිදී වෙන් වෙන්වූ සිත්වලින්ම සිදුවන හෙයින් භින්නයහ මාර්ගක්ෂණයෙහිදී වනාහි මිථ්‍යා වචනයයි කියන ලද සිව්වැදෑරුම්වූ, අකුසලවූ, දුශ්ශීල භාව සඞ්ඛ්‍යාත චේතනාව ගේ උත්පත්ති හේතුව සිඳින හෙයින් අපුනරුත්පත්තිය සිදු කිරීම වශයෙන් මාර්ගාඞ්ගය සම්පූර්ණ කරමින් අභින්නව සම්‍යග්වචනය යයි කියන ලද කුසල චිත්ත සම්ප්‍රයුක්ත විරතිය උපදී. මේ විරතිය **සම්මා වාචා** නම්.

ත්‍රිවිධ කාය දුශ්චරිතයන්ගෙන් වැළකීම **සම්මා කම්මන්ත** නම්. ආයර්‍ය මාර්ගයාගේ පූර්ව කාලයෙහි පාණාතිපාතයෙන් හෙවත් සත්වඝාතනයෙන් වැළකීම, අදත්තාදානයෙන් හෙවත් අනුන් අයත් දෑ සොරා ගැනීමෙන් වැළකීම, කාම මිථ්‍යාචාරයෙන් වැළකීම යන මේ ත්‍රිවිධ විරතීන් වෙන් වෙන්වූ සිත්වලින්ම සිදුවන හෙයින් භින්නයහ. මාර්ගක්ෂණයෙහි වනාහි මිථ්‍යාකර්මාන්තය යයි කියන ලද ත්‍රිවිධ වූ අකුසලවූ දුශ්ශීලභාව සඞ්ඛ්‍යාත චේතනාවගේ උත්පත්ති හේතුව සිඳින හෙයින් අපුනරුත්පත්තිය සිදු-කිරීම වශයෙන් මාර්ගාඞ්ගය සම්පූර්ණ කරමින් අභින්නව සම්‍යග් කර්මාන්තයයි කියනලද කුසල චිත්ත සම්ප්‍රයුක්ත විරතිය උපදී. මේ විරතිය **සම්මාකම්මන්ත** නම්,

මේ ශාසනයෙහි කල්‍යාණ පෘථග්ජන පුද්ගලයා සහිතවූ සප්ත ශෛක්‍ෂ පුද්ගල සඞ්ඛ්‍යාතවූ බුද්ධ ශ්‍රාවක තෙම ලාමකවූ දිවි පැවැත්ම හැර බුදුන් විසින් පසස්නා ලද්දාවූ නිරවද්‍යවූ ජීවිකාවෙන් දිවිපැවැත්ම කෙරෙයි. මොහුගේ දිවි පැවැත්ම කාරණු කොට ඇති ප්‍රාණඝාතාදිවූ ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන් වැළකීමය, දිවිපැවැත්ම කාරණුකොට ඇති චතුර්විධ වාග් දුශ්චරිතයෙන් වැළකීමය යන මෙය ආය්‍ය්‍ර මාර්‍ගයට පූර්‍ව කාලයෙහි වෙන්වෙන්වූ සිත්වලින්ම හෙවත් නානාක්‍ෂණිකව උපදී. මාර්‍ගක්‍ෂණයෙහි වනාහි කාය වාග්වාරයන්හි සප්තවිධ කර්‍ම පථයන්ගේ වශයෙන් උපන්නාවූ මිථ්‍යා ආජීවය නම් ලද දුශ්ශීල භාව සඞ්ඛ්‍යාත චෙතනාවගේ උත්පත්ති හේතුව නසන හෙයින් අපුන-රුත්පත්තිය සිදුකිරීම් වශයෙන් මාර්‍ගාඞ්ගය සම්පූර්‍ණ කරමින් අභින්නව **සම්මා ආජීවය** යයි කියන ලද කුසල චිත්ත සම්ප්‍රයුක්ත විරතිය උපදී. මේ විරතිය **සම්මා ආජීව** නම්.

**සම්මා වායාම** යනු සතර සම්‍යග්ප්‍රධාන් වීය්‍ය්‍ර යි. ආය්‍ය්‍ර මාර්‍ගයාගේ පූර්‍වකාලයෙහි මේ සතරදෙන නොයෙක් සිත්හි ලැබෙයි. අනාගතවූම සිතෙකින් නූපන්නාවූ ලාමකවූ අකුසල ධර්‍මයන්ගේ නොඉපදීම පිණිස වීය්‍ය්‍රකෙරෙයි. අන් සිතෙකින්ම උපන්නාවූ ලාමක අකුසල ධර්‍මයන්ගේ ප්‍රහාණය පිණිස වීය්‍ය්‍ර කෙරෙයි. අන් සිතෙකින්ම උපන්නාවූ කුසල ධර්‍මයන්ගේ ඉපදීම පිණිස වීය්‍ය්‍ර කෙරෙයි අන් සිතෙකින්ම උපන්නාවූ කුසල ධර්‍මයන්ගේ චිරස්ථිතිය පිණිස වීය්‍ය්‍ර කෙරෙයි මාර්‍ගක්‍ෂණයෙහි වනාහි එක් සිතෙක්හිම ලැබේ එකලාවූම මාර්‍ග චිත්තය හා යෙදුනාවූ වීය්‍ය්‍ර තෙම මේ චතුර්විධ කෘත්‍යයන් සාදන හෙයින් චතුර්විධ නාමයන්ම ලබයි.

**සම්මා සති** යනු සතර සතිපට්ඨානයෝයි. ආර්ය්‍ය මාර්ගයට පූර්ව කාලයෙහි මේ සතර සතිපට්ඨානයෝ නොයෙක් සිත්හි ලැබෙත්. අන් සිතෙකින්ම රූප කායය පිරිසිඳ දනී. වේදනා චිත්ත ධම්ම අනුපස්සනාවන් අන් අන් සිත්වලින්ම පිරිසිඳ දනී. මාර්ගක්ෂණයෙහි වනාහි එක් සිතෙහිම ලැබේ. මාර්ග චිත්තය හා යෙදුනාවූ සමෘති තොමෝ සතර කිස සපයන අර්ථයෙන් චතුර්විධ නාමයන් ලබයි.

**සම්මා සමාධියෙහි** වනාහි චතුර්විධවූ ධ්‍යානයෝ ආර්ය්‍ය මාර්ගයාගේ පූර්ව කාලයෙහිද භින්නයහ. ආර්ය්‍ය මාර්ගක්ෂණ යෙහිද භින්නයහ. ආර්ය්‍ය මාර්ගයට පූර්වකාලයෙහි සමාපත්තීන්ගේ වශයෙන් භින්නයහ. ආර්ය්‍ය මාර්ගක්ෂණයෙහි නොයෙක් මාර්ග වශයෙන් භින්නයහ. එක් පුද්ගලයෙකුගේ පළමුවන සෝවාන් මග ප්‍රථම ධ්‍යානය හා සමාන ස්වරූප ඇත්තේ වේ. සකෘදාගාමි, අනාගාමි, අර්හත් මාර්ගයෝදීහුද ප්‍රථම ධ්‍යානය හා සමාන ස්වරූප ඇත්තාහු වෙත්, නො හොත් ද්විතීයධ්‍යානාදීන් අතුරෙන් එක්තරා ධ්‍යානයක් හා සමාන ස්වරූප ඇත්තාහු වෙත්. එමෙන්ම එක් පුද්ගල යෙකුහුගේ සොවාන්මග ද්විතීය ධ්‍යානාදීන් අතුරෙන් එක්තරා ධ්‍යානයක් හා සමාන ස්වරූප ඇත්තේ වේ. සකෘදාගාමි ආදි මාර්ගද ද්විතීයධ්‍යානාදීන් අතුරෙන් එක්තරා ධ්‍යානයක් හා සමාන ස්වරූප ඇත්තාහු වෙත්. මෙසේ චතුර්විධවූ ආර්ය්‍ය මාර්ගයෝ ධ්‍යාන වශයෙන් සමානවූවාහු හෝ වෙත්. අසමාන වූවාහු හෝ වෙත්. ඇතැම් ධ්‍යාන යන් හා සමාන වූවාහු හෝ වෙත්. ඒ මාර්ගයාගේ සමාන අසමානාදි භාවය පාදක ධ්‍යානයාගේ නියමයෙන් වේ. ප්‍රථමධ්‍යානලාභීව ප්‍රථමධ්‍යාන සමාපත්තියෙන් නැග විදසුන් වඩන්නාවූ යොගාවචරයාහට උපන්නාවූ ආර්ය්‍ය මාර්ගය තෙම ප්‍රථම ධ්‍යානය හා සමාන වූයේ වේ මේ ප්‍රථම ධ්‍යාන

හා සදෘශ්‍යවත්ව උපන් ආර්ය්‍ය මාර්ගයෙහි වනාහි මාර්ගාඞ්ගයෝ සම්පූර්ණවූවාහුම වෙත්. ද්විතීය ධ්‍යාන සමාපත්තියෙන් නැග විදසුන් වඩන්නාවූ යොගාවචරයා හට උපන් ආර්ය්‍ය මාර්ගය තෙම ද්විතීය ධ්‍යානය හා සමාන වූයේ වේ. මේ ද්විතීයධ්‍යානය හා සදෘශවත්ව උපන් ආර්ය්‍ය මාර්ගයෙහි වනාහි මාර්ගාඞ්ගයෝ සම්‍යක් සඞ්කල්පය රහිතවූ සත් දෙනෙක් වෙත්. තෘතීය ධ්‍යාන සමාපත්තියෙන් නැග විදසුන් වඩන්නාවූ යොගාවචරයා හට උපන් ආර්ය්‍ය මාර්ගය තෙම තෘතීය ධ්‍යානය හා සම වූයේ වේ. මේ තෘතීයධ්‍යානය හා සමානව උපන් ආර්ය්‍ය මාර්ගයෙහි වනාහි මාර්ගාඞ්ගයෝ සත් දෙනෙක් හා බොධ්‍යාඞ්ගයෝ සදෙනෙක් වෙත්. චතුෂ්කා නයින් තෘතීය ධ්‍යානයෙහි ප්‍රීති සම්බොධ්‍යඞ්ගය නොයෙදේ. චතුර්ථ ධ්‍යානයාගෙන් පටන් ගෙන නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය දක්වා මේ නයම පැමිණවිය යුතු. ප්‍රථම ධ්‍යානාදීන් අතුරෙන් යම් ධ්‍යානයකින් නැග සොවාන් මග ලැබ අරූපාවචර සමාපත්තීන් වඩා අරූතලයෙහි යම් පුද්ගලයෙක් උපන්නේ වේද, ඒ පුද්ගලයාගේ ඒ අරූතලයෙහි උපරි මාර්ගයෝ තුන්දෙන ඒ ප්‍රථම ධ්‍යානාදීන් හා සමාන වූවාහුම උපදිති. මෙකී නයින් පාදක ධ්‍යානය තෙමේම ආර්ය්‍ය මාර්ග ධ්‍යානයන්ගේ ව්‍යවස්ථානය කෙරෙයි. යම් ධ්‍යානයන්හි යම් එකාග්‍රතාවයක් ඇද්ද මේ එකාග්‍රතාවය ආර්ය්‍ය මාර්ගයට පූර්ව කාලයෙහි ලෞකික වේ. මාර්ගක්ෂණයෙහි ලොකොත්තරවූ සම්‍යක් සමාධිය නමැයි වදාරනු ලැබේ. මෙසේ ලෞකික ලොකොත්තර වශයෙන් භාග්‍යවතුන් වහන්සේ මාර්ග සත්‍යය දෙශනා කළ සේක.

මේ ලෞකික ලොකොත්තර මාර්ගයන් අතුරෙන් ලෞකික මාර්ගයෙහි සියලු මාර්ගාඞ්ගයෝ ඒ ඒ මාර්ගාඞ්ග ධර්මයන්ට සුදුසු පරිද්දෙන් ෂඩ්විධ වූ ආලම්බනයන් අතුරෙන්

එක්තරා අරමුණක් ඇත්තාහු වෙත්. ලොකොත්තර මාර්ගයෙහි වනාහි සිව්සස් පිළිබඳ දැනීම් වශයෙන් පැවැත්තාවූ ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ නිර්‍වාණම අරමුණුකොට ඇත්තාවූ අවිද්‍යානුශය නිරවශෙෂ කොට නසන්නාවූ ප්‍රඥාචක්‍ෂුෂය හෙවත් නුවණැස **සම්මා දිට්ඨිය** නම් එබඳුවූ සම්මාදිට්ඨියෙන් යුත් පුද්ගලයාගේ ඒ හා සම්ප්‍රයුක්තවූ ත්‍රිවිධවූ මිථ්‍යා-සංකල්පය නිරවශෙෂ කොට නසන්නාවූ විතර්කය නිර්‍වාණ පදයට නගන්නා **සම්මා සඞ්කප්ප** නම්. එබඳුවූ සම්මා දිට්ඨියෙන් හා සම්මාසඞ්කප්පයෙන් යුත් පුද්ගලයාගේ ඒ හා සම්ප්‍රයුක්තවූ චතුර්විධ වාග් දුශ්චරිතය නිරවශෙෂ කොට නසන්නාවූ මිථ්‍යා වචනය කෙරෙන් වැළකීම **සම්මා වාචා** නම්. එබඳුවූ චතුර්විධ වාග් දුශ්චරිතයෙන් වළක්නා පුද්ගල-යාගේ ඒ හා සම්ප්‍රයුක්තවූ මිථ්‍යා කර්මාන්තය නිරවශෙෂ කොට නසන්නාවූ ත්‍රිවිධකාය දුශචරිතයන් කෙරෙන් වැළකීම **සම්මා කම්මන්ත** නම්. ඒ සම්‍යග් වචන සම්‍යග් කර්මාන්තයන්ගේම පිරිසිදු බවවූ ඒ හා සම්ප්‍රයුක්තවූ කුහන ලපනාදීන් නිරව-ශෙෂ කොට නසන්නාවූ මිථ්‍යා ජීවයෙන් වැළකීම **සම්මා ආජීව** නම්. මේ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යයි කියන ලද ශීල නමැති පොළොවෙහි පිහිටන්නාවූ පුද්ගලයාගේ ඒ ශීලයට සුදුසුවූ ඒ හා සම්ප්‍රයුක්තවූ කුසීත බව නිරවශෙෂ කොට නසන්නාවූ, නූපන්නාවූද, උපන්නාවූද අකුසල, කුසලයන්ගේ නොඉපදීමය, පැහීමය, ඉපදීමය, පිහිටීමය යන මේ කෘත්‍ය සපයන්නාවූද වීර්‍ය්‍යාරම්භය තෙම **සම්මා වායාම** නම්. මෙපරිද්දෙන් වෑයම් කරන්නාවූ පුද්ගලයාගේ ඒ හා සම්ප්‍රයුක්තවූ මිථ්‍යා සම්‍ෘතිය නිරවශෙෂ කොට නසන්නාවූ කාය, වෙදනා, චිත්ත ධර්මයන්හි කායානුදර්ශනාදිය සාධන්නාවූ චිත්තයාගේ නුමුළාවන සවභාවයවූ සිහිය **සම්මා සති** නම්. ලොකොත්තර

වූ මේ සමාධිය **විසින්** මනාකොට කරනලද චිත්තයාගේ **ආරක්ෂාව** ඇති **පුද්ගලයාගේ** ඒ හා **සම්ප්‍රයුක්තවූ** මිථ්‍යා සමාධිය නිරවශේෂ කොට නසන්නාවූ චිත්තෛකාග්‍රතා තොමෝ **සම්මා සමාධි නම්.**

මෙසේ මේ මාර්ගය තෙම ලොකොත්තරවූ ආර්‍ය්‍යවූ අඞ්ග අටක් ඇත්තාවූ මාර්ගය හෙවත් **ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය නම්** වේ. යම් ලොකොත්තරවූ මාර්ගයෙක් **ලෞකිකවූ මාර්ගය** හා සමග දුක්ඛනිරොධගාමිණී ප්‍රතිපදාවය යන ව්‍යවහාරයට ගියේද, ඒ මාර්ගය තෙම වනාහි සම්මාදිට්ඨි සම්මා සඞ්කල්පයන් විද්‍යාවෙන්ද, ඉතිරි මාර්ගාඞ්ග ධර්මයන් චරණයෙන්ද හකුළුවා ගත් බැවින් **විද්‍යා** නමුදු වේ, **චරණ** නමුදු වේ. එමෙන්ම ඒ සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පයන් දෙදෙනා විපස්සනා ඥානයෙන්ද ඉතිරි මාර්ගාඞ්ග ධර්මයන් සමථඥානයෙන්ද හකුළුවා ගත් බැවින් **සමථ** නමුදු වේ, **විදර්ශනා** නමුදු වේ.

තවද ඒ **සම්මා දිට්ඨි සම්මා සඞ්කල්පයන්** දෙදෙනා **ප්‍රඥා ස්කන්ධයෙන්ද, සම්මා වාචා සම්මා කම්මන්තා, සම්මා ආජීව** යන තිදෙන **ශීලස්කන්ධයෙන්ද, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි,** යන තිදෙනා **සමාධි ස්කන්ධයෙන්ද, අධිප්‍රඥා ශික්ෂා, අධිශීල ශික්ෂා, අධිචිත්ත ශික්ෂාවන්** කරණකොට ගෙනද හකුළුවාගත් බැවින් **ස්කන්ධත්‍රය** නමුදු වේ, **ශික්ෂාත්‍රය** නමුදු වේ.

යම් ආර්‍ය්‍ය මාර්ගයක් හා යුක්තවූ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම නිවන් පසක් කෙරේද, ඒ ආර්‍ය්‍ය මාර්ගය කරණකොට ගෙන දක්නට සමත්වූ ඇසිනුදු, ගමනට සමත්වූ දෙපයිනුදු යුක්තවූ මගියකුහු මෙන් විද්‍යාචරණයෙන් සමන්විතවූ

පුද්ගලයෙක්වී, විදර්ශනාමය ඥානයෙන් කාමසුඛල්ලිකානුයොගයද, සමථමයවූ ඥානයෙන් අත්තකිලමථානුයොගයද යන මේ අන්ත දෙක හැර මධ්‍යම ප්‍රතිපදාවට පිළිපන්නේව, ප්‍රඥාස්කන්ධයෙන් මොහස්කන්ධයද, සීලස්කන්ධයෙන් ද්වෙෂ ස්කන්ධයද, සමාධි ස්කන්ධයෙන් ලොභ ස්කන්ධයද, පළන්නේව අධිප්‍රඥා ශික්ෂාවෙන් ප්‍රඥා සම්පත්තියටද. අධිශීල ශික්ෂාවෙන් ශීල සම්පත්තියටද, අධිචිත්ත ශික්ෂාවෙන් සමාධි සම්පත්තියටද යන ත්‍රිවිධ සම්පදාවන්ට පැමිණ අමෘතවූ නිර්වාණය සාක්ෂාත් කෙරෙයි. ආදි මධ්‍යාවසානයෙහි සුන්දරවූ සත්තිස් බොධි පාක්ෂික ධර්ම රත්නයෙන් විසිතුරුවූ සම්මත්ත නියාමය යි කියනලද ආර්ය භූමියටද නොහොත් ශීලාදී ස්කන්ධත්‍රයෙන් සඞ්ගෘහිත මාර්ගඵල සඞ්ඛ්‍යාත ශාසනයටද බැසගත්තේ වේ.

මේ සර්ව සංග්‍රහයෙහි ස්කන්ධ, ආයතන, ධාතු, සත්‍යය වශයෙන් බෙද දක්වන ලදී. ඒ ඒ සත්ත්වයන්ගේ ධර්මාවබොධයට උපකාරවන පරිදි ස්කන්ධ වශයෙන්ද, ආයතන වශයෙන්ද, ධාතු වශයෙන්ද මේ ධර්මය දෙශනා කළ සේක. සංසාරගත සත්ත්වයෝ තුන් කොටසකට බෙදනු ලැබේ. නාම සම්මූල්හයෝය, රූප සම්මූල්හයෝය, නාමරූප සම්මූල්හයෝය කියායි.

නාම සම්මූල්හයෝ නම් නාමයෙහි මුළාවූ සත්ත්වයෝයි. මොවුන් පිණිස රූපය එකක් වශයෙන් ද, නාමය සතරක් වශයෙන්ද බෙද ස්කන්ධ දෙශනාව කළසේක. ඒ ස්කන්ධ සඞ්ඛ්‍යාත භූමියෙහි විදර්ශනා ප්‍රඥා සඞ්ඛ්‍යාත වෘක්ෂය රොපනය කිරීමෙන් නොබෝ කලකින්ම සතර මග සතර ඵලය හා නිර්වාණ සඞ්ඛ්‍යාත අමාඵලය ලැබිය හැකියි.

**රූපසම්මූල්හයෝ** නම් රූපයෙහි මුළාවූවෝය. මොවුන් උදෙසා ආයතන දේශනාව කරනලදී. මෙහි නාමය එක් ආකාරයකින්ද රූපය නොයෙක් ආකාරයෙන්ද බෙදා දක්වන ලදී.

**නාමරූප සම්මූල්හයෝ** නම් නාමයෙහිත් රූපයෙහිත් මුළාවූවෝය මොවුන් උදෙසා ධාතු දේශනාව වදාළ සේක. මෙහි රූපය එකොළොස් ආකාරයකින්ද නාමය සත් ආකාරයකින්ද බෙදා වදාරන ලදී.

**නිමි.**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.

May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

**NAMO AMITABHA**

**南無阿彌陀佛**

《斯里蘭卡文：ABHIDHARMARTHA PRADIPIKA Vol. II,
阿毗達摩 第二冊》
財團法人佛陀教育基金會 印贈
台北市杭州南路一段五十五號十一樓
Printed and donated for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website: http://www.budaedu.org
Mobile Web: m.budaedu.org
**This book is strictly for free distribution, it is not for sale.**
නොමිලයේ බෙදාදීම පිණිසයි.
Printed in Taiwan
1,500 copies; October 2015
SR042 - 13513